323 වන කාණ්ඩය - 05 වන කලාපය
தொகுதி 323 - இல. 05
Volume 323 - No. 05

2025 නොවැම්බර් 20 වන බ්‍රහස්පතින්දා
2025 நவம்பர் 20, வியாழக்கிழமை
Thursday, 20th November, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 931-943]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
මුස්ලිම් කාන්තා හෙදියන්ට කලිසම් ඇඳීමට අවසර ලබා දීම [තීරුව 943]

**2025.11.19 දින "අරුණ" පුවත් වාර්තාව:**
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 946]

**විසර්ජන පනත් කෙටුම්පත, 2026 – [එකොළොස්වන වෙන් කළ දිනය]:**
[ශීර්ෂය 119 (බලශක්ති)] - කාරක සභාවේදී සලකා බලන ලදී [තීරු 959-1126]

**ශ්‍රී ලංකා විදුලිබල පනත:**
නියෝග [ තීරුව 1127]


# பிரதான உள்ளடக்கம்


**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 931-943]

**தனி அறிவித்தல் மூல வினா:**
முஸ்லிம் பெண் தாதியர்கள் காற்சட்டை அணிய அனுமதித்தல் [ப: 943]

**2025.11.19ஆம் திகதிய "அருண" செய்தி அறிக்கை:**
சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று [ப: 946]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 - [ஒதுக்கப்பட்ட பதினோராம் நாள்]:**
[தலைப்பு 119 (வலுசக்தி)] – குழுவில் ஆராயப்பட்டது [ப: 959-1126]

**இலங்கை மின்சாரச் சட்டம்:**
ஒழுங்குவிதிகள் [ப: 1127]


# PRINCIPAL CONTENTS


ORAL ANSWERS TO QUESTIONS [Cols. 931-943]

QUESTION BY PRIVATE NOTICE:
Grant of Permission for Muslim Female Nurses to Wear Trousers [Col. 943]

"ARUNA" NEWS REPORT OF 19.11.2025:
Statement by Minister of Health and Mass Media [Col. 946]

APPROPRIATION BILL, 2026 - [Eleventh Allotted Day]:
Considered in Committee - [Head 119 (Energy)] [Cols. 959-1126]

SRI LANKA ELECTRICITY ACT:
Regulations [Col. 1127]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 නොවැම්බර් 20වන බ්‍රහස්පතින්දා***
*2025 நவம்பர் 20, வியாழக்கிழமை*
*Thursday, 20th November, 2025*

**පූ.භා. 9.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.00 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Annual Report of the National Apprentice and Industrial Training Authority for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජෙෂකර්ම සහ ඇඟලුම් ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු කථානායකතුමනි, මීගහතැන්න, ජම්බලගහවත්ත, අංක 242 යන ලිපිනයෙහි පදිංචි ජීවන් ප්‍රසන්න විජේගුණවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுவைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petition ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -680/2025- (1), ගරු හෙක්ටර් අප්පුහාමි මහතා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)
ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, මට පොඩි අදහසක් ප්‍රකාශ කරන්න විනාඩියක කාලයක් ලබා දෙන්න පුළුවන්ද? මම කවදාවත් මෙතැනදී ඔබතුමාගෙන් කාලය ඉල්ලලා සටන් කරලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා එතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන අවස්ථාවේ ඉතාම වැදගත් කාරණාවක් සඳහන් කළා. ඒ, පාස්කු ඉරිදා ප්‍රහාරය හා සම්බන්ධ පරීක්ෂණ කටයුතු ගැනයි. ඊට පෙර එතුමා කිව්වේ, මේ අවුරුද්දේ අප්‍රේල් 21 දිනට පෙර මෙය විසඳා අවසාන කරනවා කියලායි. හැබැයි, ඊට පසුව එතුමා ප්‍රකාශ කළා, පාස්කු දින ප්‍රහාරය සම්බන්ධව පරීක්ෂණ කටයුතුවලට අදාළ ලියවිලිවල කොටස් කණ්ඩායමක් විසින් ඉරාගෙන ගිහින් තිබෙනවා කියලා. එසේ කොතැනින් හෝ යම්කිසි ලියවිල්ලක් ඉරාගෙන ගිහින් තිබෙනවා නම්, ඒක එම පරීක්ෂණ කටයුතුවලට බාධාවක් වෙනවා. පාස්කු දින ප්‍රහාරයෙන් ජනතාව මැරුවාට වඩා භයානක වැඩක් ඒ කරලා තිබෙන්නේ.

එතකොට ඒක කොහොමද හොයන්නේ? ඒක කොහොමද සාධාරණීකරණය කරන්නේ? මේ ආණ්ඩුව පිහිටුවා දැන් අවුරුද්දක් ගතවෙලා තිබෙනවා. අප කියන්නේ මේකට තනිවම ඔබතුමන්ලා විතරක් නොව අප සියලුදෙනාත් සම්බන්ධ කර ගන්න කියලායි. මොකද, මේක අප සියලුදෙනාගේ වගකීමක්. මේක, මේ ආණ්ඩුවේත්, මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා ප්‍රමුඛ අප සියලුදෙනාගේත් වගකීමක්. හැබැයි, කවුරු හරි එහෙම ඒවායේ කොළ කඩාගෙන ගිහිල්ලා තිබෙනවා නම්, ඒක බරපතළ වරදක්. ඒ විතරක් නොවෙයි. එහෙම නම්, එතැන තමයි වරද තිබෙන්නේ. ඒක සොයන ආකාරය ගැන පිළිතුරක් රටේ සමස්ත ජනතාව වෙනුවෙන් මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ලබා දෙන්න කියා මම ඉල්ලා සිටිනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2, ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා.

### සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීමේ සහ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය: විස්තර
### சப்புகஸ்கந்த எரிபொருள் சுத்திகரிப்பு நிலையத்தை விரிவுபடுத்தி, நவீனமயமாக்கும் கருத்திட்டம்: விபரம்
### SAPUGASKANDA OIL REFINERY EXPANSION AND MODERNIZATION PROJECT: DETAILS

740/2025

**2. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කර, නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ අරමුණු කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට සහ ශක්‍යතා අධ්‍යයනය සඳහා මේ වන විට වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත ව්‍යාපෘතිය මේ වන විට ක්‍රියාත්මක නොවන බව දන්නේද;

(v) එසේ නම්, එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරි සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சப்புகஸ்கந்த எரிபொருள் சுத்திகரிப்பு நிலையத்தை விரிவுபடுத்தி, நவீனமயமாக்கும் கருத்திட்டம் ஆரம்பிக்கப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) அக்கருத்திட்டத்தின் நோக்கங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி கருத்திட்டத்துக்காகக் காணிகளை சுவீகரிப்பதற்கும் சாத்தியவள ஆய்வுக்குமாக இதுவரை செலவிடப்பட்டுள்ள தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி கருத்திட்டம் தற்போது இயங்கு நிலையில் இல்லையென்பதை அவர் அறிவாரா என்பதையும்;

( v) ஆமெனில், அக்கருத்திட்டம் தொடர்பான அடுத்தகட்ட திட்டங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) the date on which the Sapugaskanda Oil Refinery Expansion and Modernization - SOREM - Project was commenced;

(ii) the objectives of the project concerned;

(iii) the expenditure that has been incurred on the acquisition of land and the feasibility study of the project, as of now, separately;

(iv) whether he is aware that the said project is not in operation at present; and

(v) if so, the future plans regarding the project referred to above?

(b) If not, why?

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සපුගස්කන්ද පිරිපහදු සංකීර්ණය සංවර්ධනය හා ධාරිතාව ඉහළ නැංවීමේ නව ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩලය 2025.02.20 වැනි දින අනුමැතිය ලබා දී ඇත.

එම අනුමැතිය අනුව, ව්‍යාපෘතිය සඳහා අභිලාෂ - Expressions of Interest, EOIs - කැඳවීම 2025.09.26 සම්පූර්ණ කර ඇත.

දැනට අභිලාෂ ඇගයීමේ අවසාන අදියරේ පවතින අතර, ඉන්පසුව රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව යෝජනා - Requests for Proposal - නියමිතය. අභිලාෂ ලිපි 20කට ආසන්න ප්‍රමාණයක් ලැබී තිබෙනවා. ඒ අනුව සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කර නවීකරණය කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු දැනටමත් ආරම්භ කර ඇත.

(ii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා දේශීය වෙළඳ පොළ සම්පූර්ණ අවශ්‍යතා සැපිරීම, බන්කරින් - bunkering - සේවා සැපයීම, අපනයනය හා කලාපීය ඛනිජ තෙල් (පෙට්‍රෝලියම්) අපනයන මධ්‍යස්ථානය ලෙස ශ්‍රී ලංකාව ස්ථාපිත කිරීමේ අරමුණින් සපුගස්කන්ද තෙල් පිරිපහදුව සංකීර්ණය සංවර්ධනය සහ ධාරිතාව ඉහළ නැංවීම හා පවතින පිරිපහදුව නවීකරණය කිරීම සහ/හෝ නව පිරිපහදුවක් Build -Operate-Transfer - BOT - මාදිලිය යටතේ ඉදිකිරීම, ප්‍රසම්පාදනය තුළින් තෝරා ගනු ලබන සුදුසුම යෝජනාව යටතේ ක්‍රියාත්මක කිරීම.

(iii) a. ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රුපියල් මිලියන 785,837,500.00

b. ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අත්තිකාරම් රුපියල් මිලියන 510,000,000.00

c. ශක්‍යතා අධ්‍යයනය සඳහා (2022) ඇ.ඩො. ලක්ෂ 600,000 - රුපියල් මිලියන 171,837,628.00

(iv) ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

(v) ව්‍යාපෘතියේ කටයුතු දැනට ක්‍රියාත්මක වන අතර එම අභිලාෂ - Expressions of Interest, EOIs - කැඳවීම 2025.09.26 දින සම්පූර්ණ කර ඇත. අභිලාෂ ඇගයීම් ක්‍රියාවලිය දැන් අවසාන අදියරට ළඟා වී ඇති අතර, ඊළඟ අදියර ලෙස රජයේ ප්‍රසම්පාදන ක්‍රමය අනුව Requests for Proposal - RFPs - යටතේ සිදු කෙරෙනු ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඉන්දියානු අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා ලංකාවට ඇවිල්ලා අපේ රටේ සූර්ය බලශක්තිය නිපදවීම සඳහා සාම්පූර් ව්‍යාපෘතියේ inauguration එක කළා. මේ රටේ ප්‍රධාන ආයෝජනයක් හැටියට තමයි සූර්ය බලශක්තිය නිෂ්පාදනය කරන සාම්පූර් ව්‍යාපෘතියට මුල් ගල තැබීම කළේ. ගරු අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා ලංකාවටත් ඇවිල්ලා අපේ ජනාධිපතිතුමා එක්ක මේ inauguration එක කළාට පස්සේ දැන් මාස ගණනාවක් ගත වෙලාත්, ගරු කථානායකතුමනි, තවම මේ ටෙන්ඩරය දාන්න කටයුතු කරලා නැහැ. ගරු ඇමතිතුමනි, මේ සඳහා CEB එකෙන් infrastructure හදන්න ඕනෑ, transmission lines හදන්න ඕනෑ. මේ දේවල් සිදු වෙනවා අපි දකින්නේ නැහැ. ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය හැටියට මම ඔබතුමාගෙන් අහන්නේ ඇයි, මේ ටෙන්ඩරය call කරන්න ප්‍රමාද?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, මේක මුල් ප්‍රශ්නයට අදාළ නොවන ක්ෂේත්‍රයක්. කමක් නැහැ. සාම්පූර් විදුලි බලාගාරයේ ප්‍රශ්නය ගත්තොත්, ඒක 1988/89 ඉඳලාම පැවතගෙන එන ප්‍රශ්නයක්. ගරු මන්ත්‍රීතුමනි, වැරදියි ඔබතුමාගේ ප්‍රකාශය. ඒ ගිවිසුම අත්සන් කළාට පස්සේ සම්ප්‍රේෂණ මාර්ගය සාම්පූර්වල ඉඳලා කප්පල්තුරෙට දක්වා ඉදි කරන්න තිබෙනවා. ඒකට අවශ්‍ය ටෙන්ඩරය කැඳවලා තිබෙන්නේ. Evaluation process එකේ දැනට එය පවතිනවා. ඔබතුමාට ඒ තොරතුරු හරියට ලැබිලා නැහැ මම හිතන හැටියට.

ඒ වාගේම, ඔබතුමා බලාපොරොත්තු වෙන ඔය solar panels ටික සවි කිරීමට අදාළ ටෙන්ඩරය අපි පොඩ්ඩක් ප්‍රමාද කරගෙන ඉන්නවා. මොකද, තාක්ෂණයත් එක්ක දිනෙන් දින ඒවායේ මිල අඩු වෙන නිසා. Transmission එකට අවුරුදු 3කට ආසන්න කාලයක් යනවා. අපට අවුරුදු එකහමාරකින් විතර solar panels සවි කරලා ඒ plant එක හදන්න පුළුවන්. හැබැයි අවුරුදු 3කට කලින් සම්ප්‍රේෂණයට අදාළ වැඩ ටික කරලා ටිකක් දුර ගිහිල්ලා ටෙන්ඩරය call කළාම තමයි අපට benefit එකක් ගන්න පුළුවන්. ඉන්දියාව පවා ඒ ගැන අවබෝධයෙන් ඉන්නේ, ඔබතුමන්ලාට අවබෝධයක් නැතුවට.

අපි ඒ ඔක්කොම ready කරලා තිබෙන්නේ. Grid substation එකේත් land filling එකක් තිබෙනවා. ඒකත් අපි දැන් කරගෙන යනවා. මම ඒක නිරීක්ෂණය කරලාත් තිබෙනවා. ඒ මූලික වැඩ කරලා තිබෙනවා. අපි උපක්‍රමශීලීව යම් යම් දේවල් ලාභදායී වෙන්න කරගෙන යනවා. අවුරුදු 3ක් යන එක ඉස්සෙල්ලා කරලා ඊට පස්සේ තමයි අවුරුදු එකහමාරක එක අපට කරන්න

[ගරු කුමාර ජයකොඩි මහතා]

වෙන්නේ. එහෙම නැත්නම් ඒ එන difference එකට ලොකු මුදලක් වැය වෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඉතිරි වෙන මුදලින් battery storage එකක් එතැන ඇති කරන්න. ඒ සඳහා ඉන්දියානු සමාගමත් එක්ක එකඟ වෙලා තිබෙනවා. උපරිම ඉතිරි කරගෙන තමයි අපි ඒ කටයුතු කරන්නේ. මොකද, අද ගන්න මිලට නොවෙයි ලබන අවුරුද්දේ solar panels සහ inverters ගන්න වෙන්නේ. ඒ යන ගණන අඩු වෙනවා. අන්න ඒ අවබෝධයෙන් තමයි අපි ඒවා කරගෙන යන්නේ. Transmission line එක අපට අත්‍යවශ්‍යයි. ඒක අනිවාර්යයෙන් කරන්න ඕනෑ. මොකද, විදුලි බලය නිෂ්පාදනය කළාට ඒක ගෙනියන්න විධියක් නැති නිසා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇමතිතුමා කියන කථාව කොළේ වහලා කියන්නේ. CEB එක දමන tender එක එකක්. Solar power project එක හදන ව්‍යාපෘතිය තව එකක්. CEB එකේ transmission line එකේ වැඩ මන්දගාමීව සිදු වෙනවා කියන එක සහ අනෙක් tender එක තවම දාලා නැහැයි කියන එකයි අපි කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ඒක තමයි. මේ අහන්නයි යන්නේ. ඔව්, අපි දන්නවා දැන් ඔබතුමන්ලා මේ solar power projectsවලට මන්දගාමියි. ඒක ප්‍රශ්නයක් නැහැ. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ ගරු කථානායකතුමනි, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ. මේ වෙනකොට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආදායම සියයට 26කින් අඩු වෙලා තිබෙනවා කියන එක මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් වුණා. අපට තිබෙන ප්‍රශ්නය මෙයයි. දැන් මිනිස්සු තෙල් ගහන්නේ වැඩි මිලට. එදාට වඩා වැඩි මිලකට මිනිස්සු තෙල් ගහනවා. කවුරුවත් ණයට තෙල් ගහන්නේ නැහැ. කංචනට දැන් රුපියල් 50ක කොමිස් එක යන්නෙත් නැහැ. ඒ විතරක් නොවෙයි. තෙල් බෙදා හැරීම ඇතුළු සියල්ලම කරන්නේ රජයෙන්. එහෙම තිබියදී ඛනිජ තෙල් සංස්ථාව පාඩු ලබන්නේ ඇයි කියන ප්‍රශ්නය තමයි මම අහන්නේ.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, හැම මාධ්‍යයෙන්ම දකින්න ඇති, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මේ දක්වා බිලියන 32ක ලාභයක් ලබලා තිබෙනවාය කියන කාරණය. එය පාඩු ලබනවා කියලා මන්ත්‍රීවරයාම හඳාගත්ත පදනමක් මත මේ තර්ක කරන්නේ. ඒ වැඩිපුර මුදල් අපි ප්‍රසිද්ධියේ මහ භාණ්ඩාගාරයට ලබා දෙමින් පවතිනවා. හැබැයි මතක තියාගන්න ඕනෑ, මෙගොල්ලන් පෙට්‍රල් ෂෙඩ් 600ක් විතර පෞද්ගලික අංශයට විකුණා තිබෙන බව. එහෙම කරලා තමයි දැන් අපෙන් අහන්නේ. ඒගොල්ලන් ගිවිසුම් ගහලා ආයතන තුනකට දුන්නා. එක ආයතනයක් කරගන්න බැරිකමට දාලා ගියා. ඒවා කරලා තමයි අපෙන් අහන්නේ, පාඩු ලබන්නේ ඇයි කියලා. CPC එක handle කරපු ෂෙඩ් 600ක් පෞද්ගලික විදේශීය සමාගම්වලට වික්කාම ලාභය අඩු වෙනවා තමයි. ඒක තමයි කොළේ වහලා ගැහිල්ල. ෂෙඩ් 600ක් කියන්නේ භාගයකට වැඩියි. ඒක තේරෙන්නේ නැත්නම් ඉතින් හෝඩියේ ඉඳන්ම ඉගෙන ගන්න වෙනවා. ඒක තමයි කොළේ වහලා ගැහිල්ල. මේ ගරු සභාවට මම කියන්නේ, ඒ වාගේ කොළේ වහලා ගහපු ඒවා හෙළිකරන්න ඕනෑ කියලායි. ෂෙඩ් 600කට ආසන්න ප්‍රමාණයක් දැනටමත් සම්පූර්ණයෙන් ආයතන තුනකට දීලා තිබෙනවා. ෂෙඩ් 665ක් දීලා තිබුණා. එයින් 65ක් දාලා ගියා. එහෙම වුණාම ආදායම අඩු වෙන්නේ නැද්ද? ආදායම අඩු වෙනවා. හැබැයි අපි එහෙම කියලා අතහැරලා නැහැ. අපි ලාභය වැඩි කරලා තිබෙනවා. ඒකත් මතක තියාගන්න.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ඒ කියන්නේ, ආදායම අඩු වුණාද, ඇමතිතුමා?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
නැහැ, නැහැ. ඔය ඔබතුමා කියන එක නේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ඔබතුමා කියන්නේ ආදායම අඩු වෙලා කියලාද, වැඩි වෙලා කියලාද?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
මෙහෙමයි, ගරු මන්ත්‍රීතුමා. අපි වෙනත් ක්ෂේත්‍රවලින් ආදායම වැඩි කරගෙන තිබෙනවා. ෂෙඩ්වලින් විතරක් ලැබෙන ආදායම සාපේක්ෂව ප්‍රතිශතයක් විධියට අඩු වෙනවා. මොකද, ෂෙඩ් 600ක් පෞද්ගලික ආයතනවලට දුන්නාම එහෙම **වෙනවා.** එහෙමයි කියලා අර වචනය විතරක් අල්ලා ගන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3-812/2025- (1), ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

## 2020 සිට වාර්තා වී ඇති සයිබර් මූල්‍ය අපරාධ පැමිණිලි: විස්තර

2020 தொடக்கம் நிதிக் கணினிக் குற்றச்செயல்கள் தொடர்பாகக் கிடைத்துள்ள முறைப்பாடுகள்: விபரம்

FINANCIAL CYBERCRIME COMPLAINTS RECEIVED FROM 2020: DETAILS

1011/2025

**4. ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා පොලිසියට වාර්තා වී ඇති මුළු සයිබර් මූල්‍ය අපරාධ පැමිණිලි සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා උතුරු පළාත තුළ ශ්‍රී ලංකා පොලීසියට වාර්තා වී ඇති මුළු සයිබර් මූල්‍ය අපරාධ පැමිණිලි සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) උතුරු පළාතේ සෑම දිස්ත්‍රික්කයකම නිල සයිබර් අපරාධ වාර්තා කිරීමේ වේදිකා හෝ පොලිස් සයිබර් අපරාධ ඒකක හරහා ලැබුණු අන්තර්ජාල බැංකු වංචා, තතු බෑම - phishing - සහ අනවසර විද්‍යුත් අරමුදල් හුවමාරු කිරීම් වැනි මූල්‍ය වංචාවලට අදාළ පැමිණිලි සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ග්‍රාමීය හා අවම පහසුකම් සහිත ප්‍රදේශවල, විශේෂයෙන්ම උතුරු පළාතේ සිදුවන සයිබර් මූල්‍ය අපරාධ පිළිබඳව වාර්තා කිරීමට මහජනතාවට ඇති ප්‍රවේශය පුළුල් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை நிதிக் கணினிக் குற்றச் செயல்கள் தொடர்பாக இலங்கைப் பொலிசுக்குக் கிடைத்துள்ள முறைப்பாடுகளின் மொத்த எண்ணிக்கை ஆண்டுவாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) 2020ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை நிதிக் கணினிக் குற்றச் செயல்கள் தொடர்பாக வட மாகாணத்தில் இலங்கைப் பொலிசுக்குக் கிடைத்துள்ள முறைப்பாடுகளின் மொத்த எண்ணிக்கை ஆண்டுவாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iii) வட மாகாணத்தின் ஒவ்வொரு மாவட்டத்திலும் உத்தியோகபூர்வ கணினிக் குற்றச்செயல்களை அறிக்கையிடும் தளங்கள் அல்லது பொலிஸ் கணினிக் குற்றப் பிரிவுகளில் இணையவழி வங்கி மோசடிகள், போலி மின்னஞ்சல்களை அனுப்புதல் - phishing - மற்றும் அங்கீகரிக்கப்படாத இலத்திரனியல் பணப்பரிமாற்றம் போன்ற குறிப்பிடும்படியான நிதி மோசடிகள் தொடர்பில் கிடைக்கப்பெற்றுள்ள முறைப்பாடுகள் மாவட்ட வாரியாக வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iv) கிராமிய மற்றும் பின்தங்கிய பகுதிகளில், குறிப்பாக வடமாகாணத்தில் நிலவும் நிதிக் கணினிக் குற்றச்செயல்கள் தொடர்பில் முறைப்பாடு செய்வதற்கான பொதுமக்களின் அணுகலை மேம்படுத்துவதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) the total number of financial cybercrime complaints reported to the Sri Lanka Police in each year from 2020 to date, separately;

(ii) the total number of financial cybercrime complaints reported to the Sri Lanka Police from the Northern Province in each year since 2020 to date, separately;

(iii) the number of complaints specifically related to financial frauds such as online banking scams, phishing and unauthorized electronic fund transfers received through official cybercrime reporting platforms or police cybercrime units in each district of the Northern Province, separately; and

(iv) the measures taken to enhance public access to reporting financial cybercrimes in rural and underserved areas, particularly in the Northern Province?

(b) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| වර්ෂය | වාර්තා වී ඇති මුළු සයිබර් මූල්‍ය අපරාධ සම්බන්ධ පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| 2020 | 24 |
| 2021 | 577 |
| 2022 | 654 |
| 2023 | 472 |
| 2024 | 1539 |
| 2025.10.31 දක්වා | 2368 |
| එකතුව | 5634 |

(ii)

| වර්ෂය | වාර්තා වී ඇති මුළු සයිබර් මූල්‍ය අපරාධ සම්බන්ධ පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| 2020 | - |
| 2021 | 02 |
| 2022 | 03 |
| 2023 | 02 |
| 2024 | 03 |
| 2025.10.31 දක්වා | 41 |
| එකතුව | 51 |

[ගරු ආනන්ද විජේපාල මහතා]

(iii)

| දිස්ත්‍රික්කය | අන්තර්ජාල බැංකු වංචා සම්බන්ධව පැමිණිලි සංඛ්‍යාව | තතු බෑම (phishing) සම්බන්ධව පැමිණිලි සංඛ්‍යාව | අනවසර විද්‍යුත් අරමුදල් හුවමාරු කිරීම සම්බන්ධව පැමිණිලි සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|
| යාපනය | 39 | - | 03 | 42 |
| මන්නාරම | - | - | - | - |
| කිලිනොච්චිය | 04 | - | - | 04 |
| මුලතිව් | 01 | - | - | 01 |
| වව්නියාව | 04 | - | - | 04 |
| එකතුව | | | | 51 |

(iv) උතුරු පළාත ආවරණය වන පරිදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පරිගණක අපරාධ විමර්ශන උප ඒකකයක් යාපනය මූලස්ථාන පොලිස් ස්ථානයේ 2025.04.25 දින සිට ස්ථාපිත කර ඇත. එයට අමතරව බස්නාහිර පළාත ආවරණය වන පරිදි පරිගණක අපරාධ විමර්ශන මූලස්ථානය ස්ථාපිත කර ඇති අතර, මධ්‍යම පළාත ආවරණය වන පරිදි මහනුවර උප ඒකකය ද, දකුණු පළාත ආවරණය වන පරිදි මාතර උප ඒකකය ද, නැඟෙනහිර පළාත ආවරණය වන පරිදි මහඔය උප ඒකකය ද, වයඹ පළාත ආවරණය වන පරිදි වාරියපොළ උප ඒකකය ද, උතුරුමැද පළාත ආවරණය වන පරිදි අනුරාධපුර උප ඒකකය ද වශයෙන් පරිගණක අපරාධ විමර්ශන උප ඒකක ස්ථාපිත කර විමර්ශන කටයුතු සිදු කරයි.

(ආ) පැන නොනඟී.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக கேள்வியைக் கேட்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, இலங்கையில் குறிப்பாக, வடக்கு மாகாணத்தில் நிதிக் கணினிக் குற்றச் செயல்கள் தொடர்பாகப் பல்வேறு முறைப்பாடுகள் எங்களுக்குத் தொடர்ச்சியாகக் கிடைக்கப் பெறுகின்றது. அந்த வகையில், அண்மைக் காலத்தில்தான் யாழ்ப்பாணம் பிரதான பொலிஸ் நிலையத்தில் cybercrime பிரிவு நிறுவப்பட்டது. இன்று வழங்கப்பட்ட தரவுகளின் அடிப்படையில் 2020-2024ஆம் ஆண்டு காலப்பகுதியில் கிடைக்கப்பெற்ற குற்றச் சாட்டுக்களின் எண்ணிக்கை குறைவாக இருப்பதற்கான காரணம், அங்கு குறித்த பிரிவு சரியாக இயங்கவில்லை என்பதுதான். வங்கிக் கணக்குகள் மற்றும் WhatsAppஇனை hack பண்ணுதல் மற்றும் வெளிநாட்டுக்கு அனுப்புவதாகக் கூறி பணம் பெறுதல் போன்ற பல்வேறு மோசடிகள் அங்கு நடைபெறுகின்றன. அந்த வகையில், அது தொடர்பாகப் பல விடயங்கள் வங்கிகளுக்குத் தெரிந்திருந்தாலும் வங்கியிலிருந்து சரியான தகவல்களைப் பெற முடியாதுள்ளது.

அதேபோன்று பொலிஸ் நிலையத்தில் தகவல்களைக் கேட்டாலும்கூட, அந்த விடயம் court நடவடிக்கைக்கு கொண்டுசெல்லப்படுவதாகத் தெரிவிக்கப்படுகின்றது. வழக்கு நடவடிக்கைகள் நீண்ட காலம் நடைபெறுவதால், பாதிக்கப் பட்டவர்கள் அச்சுறுத்தலுக்கும் மன உளைச்சலுக்கும் உள்ளாவதுடன், சிலர் தற்கொலைகூட செய்திருக்கின்றார்கள். எனவே, இவ்வாறான நிதிக் குற்றங்கள் தொடர்பாகச் சட்டத்தை வலுப்படுத்தி, இதுபோன்ற குற்றங்கள் இடம்பெறாது தடுக்க நடவடிக்கை எடுக்க வேண்டும். அந்த வகையில், எதிர்காலத்தில் எடுக்கப்படவிருக்கின்ற நடவடிக்கைகள் தொடர்பாக கௌரவ அமைச்சர் அவர்கள் பதில் தருவாரா? எனக் கேட்கின்றேன்.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මේ සම්බන්ධව මම පැහැදිලි කළා, මෙම ප්‍රශ්නයේ මුල් කොටසට උත්තර දෙනකොටම. පරිගණක අපරාධ පිළිබඳව යාපනය දිස්ත්‍රික්කයේ ඒකකය ස්ථාපිත කළේ මේ අවුරුද්දේ හතරවෙනි මාසයේ. මීට පෙර එවැනි ඒකකයක් යාපනය දිස්ත්‍රික්කයේ තිබුණේ නැහැ. පරිගණක අපරාධ පිළිබඳව දැනට CID එක යටතේ තිබෙන පරිගණක අපරාධ ඒකකය "පරිගණක අපරාධ කොට්ඨාසය" බවට පත් කරලා ඒක නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් යටතේ ක්‍රියාත්මක කරන තත්ත්වයක් දක්වා උසස් කිරීමට අපි තීන්දු කරලා තිබෙනවා. ඒ වාගේම යාපනයේ උප ඒකකය මේ අවුරුද්දේ අපි ආරම්භ කරලා තිබෙනවා. දැනට එම ඒකකයට පැමිණිලි ලැබෙමින් පවතිනවා. මම හිතන විධියට, ඊට පෙර මේ සම්බන්ධව පැමිණිලි ලැබීමේ අවම තත්ත්වයක් තිබුණේ. කොහොම වුණත්, මේ පැමිණිලි සම්බන්ධ පර්යේෂණ, නැත්නම් විමර්ශන ටිකක් සංකීර්ණයි. ඒ සඳහා යම් කාලයක් ගත වනවා. මේ විමර්ශන හැකි අයුරින් කාර්යක්ෂම කරන්නත්, කඩිනම් කරන්නත් අපි අවශ්‍ය පියවර ගන්නවා. ඒ වාගේම මේ සකස් කර තිබෙන උප ඒකක සඳහා පුහුණු නිලධාරින් යොදවන්නත් අපි ඉදිරියේදී කටයුතු කරනවා. ඒ වාගේම මේ පරිගණක අපරාධ පිළිබඳ විමර්ශන අවසන් වෙලා අධිකරණයට තමයි කරුණු ඉදිරිපත් කරන්නේ. අධිකරණයෙන් තමයි මේ සම්බන්ධව තීන්දු තීරණ ගන්නේ.

දවසකට දළ වශයෙන් පරිගණක අපරාධ පිළිබඳ පැමිණිලි 25ක් පමණ වාර්තා වනවා. ඒ හැම එකක් පිළිබඳවම විමර්ශන ආරම්භ වනවා. හැබැයි, ඒ විමර්ශන ටිකක් සංකීර්ණයි. විමර්ශන කඩිනම් කරන්න; කාර්යක්ෂම කරන්න අවශ්‍ය පියවර අපි ගන්නවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ சபாநாயகர் அவர்களே! என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, "Ministry of Digital Economy, Sri Lanka" என்ற பெயரில் அரசாங்கத்தினுடைய logoஇனைப் பயன்படுத்தி, குறிப்பிட்ட நபர் ஒருவரின் வங்கி மற்றும் ஏனைய விபரங்கள் தொடர்பாகக் கேட்டறிந்து, பாரிய நிதி மோசடி ஒன்றைச் செய்வதற்காக மேற்கொள்ளப்பட்ட முயற்சி தொடர்பான ஓர் ஆதாரம் என்னிடம் இருக்கின்றது. இந்த ஆவணத்தில் 0760625797 என்ற தொலைபேசி numberஉம் குறிப்பிடப்பட்டிருக்கின்றது. அதை நான் ***ஹன்சாட்*** பதிவுக்காகச் ****சமர்ப்பிக்கின்றேன்.***

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

இதுபோன்று பல்வேறு முறைப்பாடுகள் மக்களிடமிருந்து கிடைக்கப் பெறுகின்றது. இந்த விடயம் தொடர்பாகவும் கௌரவ பாதுகாப்பு அமைச்சர் அவர்கள் கரிசனையில் எடுப்பாரா? என்று கேட்கின்றேன்.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු මන්ත්‍රීතුමනි, ලැබෙන පැමිණිලි පරිගණක අපරාධ අංශයට යොමු කරන්න. මහජනයා සමහර විට මහජන නියෝජිතයන්ට පැමිණිලි යොමු කරනවා. දීර්ඝ කාලයක් ගත වී තිබෙන පැමිණිලි සම්බන්ධව ඔබට වාර්තා වෙලා තිබෙනවා නම්, ඒ පිළිබඳ තොරතුරු අපට නිශ්චිතව ලබා දෙන්න පුළුවන් නම්, ඒ පිළිබඳව වෙනම විමර්ශනයක් කරන්න පුළුවන්.

මොකද, අපි කිව්වා උප ඒකකය ආරම්භ කළේ මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේ කියලා. ඔබතුමන්ලා ඒ ජනතාව දැනුවත් කරන්න, මහජන නියෝජිතයින් වන ඔබතුමන්ලාට ලබා දෙන ඒ පැමිණිලි නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට පැමිණිලි හැටියට භාර දෙන්න කියලා. අපි ඒ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ සහාය අවශ්‍ය පරිදි ලබා ගන්නවා. සමහර විමර්ශන ඒකාබද්ධව සිද්ධ කරන එක අපි දැනටත් කරනවා. ඒ නිසා එම කටයුතු නිසියාකාරයෙන් කිරීමට අපට හැකියාව ලැබෙනවා.

## යෝජිත අධ්‍යාපන සභාව අධ්‍යයනය කිරීම සඳහා වන කමිටුව: විස්තර
### உத்தேச கல்விச் சபை தொடர்பில் ஆராய்வதற்கான குழு: விபரம்
### COMMITTEE TO LOOK INTO PROPOSED EDUCATION COUNCIL: DETAILS

1300/2025

**5. ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව ස්ථාපිත කිරීමට යෝජිත අධ්‍යාපන සභාව සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පත් කර ඇති කමිටු සාමාජිකයන්ගේ නම් කවරේද;

(ii) එම කමිටුවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් විස්තර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் மற்றும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) புதிய கல்வி மறுசீரமைப்புக்கு அமைவாக தாபிப்பதற்கு உத்தேசிக்கப்பட்டுள்ள கல்விச் சபை தொடர்பிலான நடவடிக்கைகளை மேற்கொள்வதற்கு கல்வி அமைச்சினால் நியமிக்கப்பட்டுள்ள குழு அங்கத்தவர்களின் பெயர்கள் யாவை;

(ii) மேற்படி குழுவின் செயற்பாடுகள் பற்றிய விபரங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) names of the committee members appointed by the Ministry of Education to look into the proposed Education Council that is to be established under the new educational reforms; and

(ii) details regarding the functioning of that committee?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| නම | තනතුර |
|---|---|
| මහාචාර්ය ඕ.ජී. දයාරත්න මයා | විශ්වවිද්‍යාල ආචාර්ය |
| දර්ශන විජේසිංහ මයා | සහකාර අධ්‍යක්ෂ (විදේශ භාෂා ශාඛාව) |
| ටී.එම්.ඒ.කේ. ගුණසේකර මයා | විදුහල්පති |
| ආචාර්ය පූජ්‍ය දමන සුගතධම්ම හිමි | ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය |
| එම්.ඒ. ප්‍රදීප් පුෂ්ප කුමාර මයා | ශ්‍රී ලංකා විදුහල්පති සේවය |
| සුජීවන් ප්‍රියන්ත චන්ද්‍රසේකර මයා | ගුරු උපදේශක |
| ඩබ්ලිව්.ජී.එස්.කේ. ප්‍රේමසිරි මයා | ශ්‍රී ලංකා ගුරු සේවය |
| ටී.එම්. ප්‍රේමවර්ධන මයා | විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සුබ්‍රමනියම් රාජේන්ද්‍රන් මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය |
| අමීර් මිහ්රාජ් මයා | ගුරු අධ්‍යාපනඥ සේවය |
| වී.එස්. තුෂාරි මිය | සහකාර නීති කෙටුම්පත් සම්පාදක |

(ii) අධ්‍යාපන සේවාවන්හි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ සහිතව අධ්‍යාපන සභාව පිහිටුවීමට අදාළ නිර්දේශ ඇතුළත් කමිටු වාර්තාව ඉදිරිපත් කර ඇත. එම කමිටු වාර්තාව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට දැන් ඉදිරිපත් කරලා තිබෙන්නේ. එම කමිටුවේදී සාකච්ඡා කරලා, ඒ නිර්දේශ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතයි.

(ආ) අදාළ නොවේ.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ பிரதம அமைச்சர் அவர்களே! நேற்றைய தினம் இடம்பெற்ற கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் கல்வி மறுசீரமைப்புத் தொடர்பான விஷயங்களை நீங்கள் தெரிவித்திருந்தீர்கள். அது தொடர்பாகப் பாராளுமன்ற உறுப்பினர்களான நாமும் பேசியிருந்தோம். ஆனால், உண்மையில் கடந்த காலத்திலிருந்து கல்வி மறுசீரமைப்புக் குழுவில் எங்களுடைய முஸ்லிம் சமூகத்தைச் சேர்ந்த எவரும் இணைத்துக் கொள்ளப்படவில்லை என்பதற்காகத்தான் நான் அந்தக் கேள்விகளைக் கேட்டிருந்தேன். இப்போது அந்தக் குழுவில் அமீர் என்கின்ற கல்விமான் ஒருவரை இணைத்துக் கொண்டிருக்கிறீர்கள். அதற்காக எமது மக்கள் சார்பில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 3 -812/2025- (1), ගරු මුජිබුර් රහුමාන් මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය, ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### මුස්ලිම් කාන්තා හෙදියන්ට කලිසම් ඇඳීමට අවසර ලබා දීම
### முஸ்லிம் பெண் தாதியர்கள் காற்சட்டை அணிய அனுமதித்தல்
### GRANT OF PERMISSION FOR MUSLIM FEMALE NURSES TO WEAR TROUSERS

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27(2)இன்கீழ் சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரிடம் எனது கேள்வியை நான் கேட்க விரும்புகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, முஸ்லிம் பெண் தாதியர்களின் ஆடை தொடர்பாகக் கடந்த சில நாட்களாகப் பல்வேறுபட்ட கருத்தாடல்கள், சமூக மட்டத்திலும் ஊடகங் களிலும் இடம்பெற்று வருவதை அவதானிக்க முடிகிறது. இது தொடர்பாகச் சில கருத்துகளை வழங்கலாமென நினைக்கின்றேன்.

அரச மருத்துவ மனைகளிலும் தனியார் மருத்துவ மனைகளிலும் பணியாற்றுகின்ற முஸ்லிம் பெண் தாதியர்கள் - nurses - அவர்களுடைய சீருடைக்கு மேலதிகமாகக் காற்சட்டை அணிவதற்கு அனுமதி வழங்கப்படாத நிலையிலேயே, 1992ஆம் ஆண்டு ஓகஸ்ட் மாதம் 07ஆம் திகதி இந்தப் பாராளுமன்றத்தில் அது தொடர்பாக ஒரு தனிநபர் பிரேரணையை நான் கொண்டுவந்தேன். அந்தப் பிரேரணையில் நான் பின்வரும் விடயங்களைச் சுட்டிக் காட்டியிருந்தேன்:

" இன்று தாதிமார் தொழில் என்பது சகல மக்களுக்கும் தேவையான, சகல மக்களும் பங்குபற்றக்கூடிய, சகலரும் நம்பியிருக்க வேண்டிய ஒரு பொதுவான தொழிலாக இருக்கின்றது. அப்படியானதொரு பொதுவான தொழிலிலே சகல சமூகத்தைச் சேர்ந்தவர்களும் தங்களுடைய கலாசாரங் களுக்கும் சமய அனுஷ்டானங்களுக்கும் ஏற்ற வகையில், சமயம் அனுமதிக்கக்கூடிய வகையில் ஈடுபடுவதற்கான வழிவகைகளைச் செய்ய வேண்டியது அரசாங்கத்தின் கடமையாகும். முஸ்லிம் பெண்கள் காற்சட்டையின்றி, மேலாடை மாத்திரம் அணிவதை இஸ்லாம் மார்க்கம் அனுமதிக்காத காரணத்தினால், அந்தத் தொழிலில் பெருமளவில் ஈடுபட முடியாத நிலையில் பெண்கள் இருக்கின்றார்கள். எனவே, முஸ்லிம் தாதியர்கள் தங்களின் மார்க்கம், கலாசாரம் ஏற்றுக்கொள்ளக்கூடிய வகையில் சீருடை அணிவதற்கு வழிசெய்ய வேண்டும்"

என்று அந்தப் பிரேரணையை முன்வைத்து, மேற்படி காரணங்களுக்காக முஸ்லிம் பெண் தாதியர்களுக்கு காற்சட்டை அணிவதற்கான அனுமதியை வழங்க வேண்டுமெனக் கோரியிருந்தேன்.

குறித்த பிரேரணைக்கு ஆதரவாக அப்போதிருந்த சகல இனங்களையும் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்களும் உரையாற்றியதுடன், அன்றைய கௌரவ சபாநாயகரான மர்ஹூம் அல்ஹாஜ் எம்.எச். முஹம்மட் அவர்களும் அக்கிராசனத்திலிருந்தே, "முஸ்லிம் தாதியர்கள் அவர்களின் கலாசார முறைப்படி சீருடை அணிய இந்தப் பிரேரணை ஏற்றுக்கொள்ளப்பட வேண்டும்" எனப் பேசியிருந்தமை குறிப்பிடத்தக்கது. அதன் பிரகாரம் இறுதியில் அன்றைய சுகாதார அமைச்சராக இருந்த கௌரவ ரேணுகா ஹேரத் அவர்களின் அனுமதியுடன் குறித்த எனது தனிநபர் பிரேரணை பாராளுமன்றத்தில் ஏகமனதாக ஏற்றுக் கொள்ளப்பட்டு, "Motion agreed" என்று சபாநாயகரால் குறிப்பிடப்பட்டு, அங்கீகாரம் வழங்கப்பட்டது.

இவ்வாறான பின்னணியில் அன்றிலிருந்து இன்றுவரை சுமார் 33 வருடங்கள் இலங்கையின் எல்லா அரச மற்றும் தனியார் மருத்துவமனைகளிலும் முஸ்லிம் தாதியர்கள் அவர்களுடைய சீருடைக்கு மேலதிகமாகக் காற்சட்டை

அணிவதற்கு அனுமதி வழங்கப்பட்டு, அவர்கள் அதனை அணிந்து வந்ததுடன் இது தொடர்பில் எந்தவொரு பிரச்சினையும் இடம்பெற்றிருக்கவில்லை. இதன் காரணமாக ஆயிரக்கணக்கான முஸ்லிம் பெண்கள் தாதியர்களாகக் கடமைகளைப் பொறுப்பேற்று இன்றுவரை நாடு முழுவதும் கடமையாற்றி வருவதைத் தாங்கள் அறிவீர்கள். ஆனால், கடந்த சில மாதங்களாக தேசிய தாதியர் பயிற்சிப் பாடசாலை - National Nurses Training School- மற்றும் வேறு சில வைத்தியசாலைகளில் இதற்கு அனுமதி மறுக்கப்படுகின்ற ஒரு சூழ்நிலை ஏற்பட்டுள்ளதை நாம் அறிகின்றோம்.

ஆகவே, கௌரவ சுகாதார அமைச்சர் அவர்களே! நீங்கள், சகல மக்களும் ஒற்றுமையுடன் வாழுகின்ற களுத்துறை மாவட்டத்தின் மக்கள் பிரதிநிதி என்ற வகையிலும் சகல இன மக்களுடனும் மிகவும் அன்பாகப் பழக்கக்கூடிய ஒருவர் என்ற வகையிலும் அதேபோன்று, அனைத்து இன மக்களும் மதிக்கின்ற ஒரு கௌரவ அமைச்சர் என்ற வகையிலும் இது தொடர்பாகத் தங்களது அமைச்சினூடாக ஒரு சுற்று நிருபத்தைச் சம்பந்தப்பட்ட திணைக்களங்கள், நிறுவனங் களுக்கு அனுப்பி, முஸ்லிம் பெண் தாதியர் எமது கலாசாரத்தைப் பாதுகாக்கும் வகையிலான ஆடைகள் அணிவதை முழுமையாக நடைமுறைப்படுத்துவதற்கு நடவடிக்கை எடுப்பீர்களா? என இந்தச் சந்தர்ப்பத்தில் கேட்க விரும்புகின்றேன். நன்றி!

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මැතිතුමා විසින් සඳහන් කර ඇති පරිදි, හෙද නිලධාරින්ගේ නිල ඇඳුම සම්බන්ධයෙන් එතුමා විසින් පාර්ලිමේන්තුව වෙත 1992 අගෝස්තු මස 07වැනි දින සිදු කරන ලද පෞද්ගලික යෝජනාවට අනුමැතිය ලද බව ප්‍රකාශ කර ඇතත්, හෙද නිලධාරින්ගේ නිල ඇඳුමට අදාළව එවැනි අනුමැතියක් ලද ලියවිල්ලක් අප අමාත්‍යාංශය සතුව නැත.

ඒ වාගේම ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ යෝජනාව ඉදිරිපත් කරලා දැන් අවුරුදු 33ක් ගත වෙලා තිබෙනවා; අවුරුදු 34කටත් ආසන්නයි. ඊට පසු රජයන් කිහිපයක් පැවතුණා. ගරු විපක්ෂ නායකතුමාත් සෞඛ්‍ය නියෝජ්‍ය ඇමති හැටියට යම් කාලයක කටයුතු කළා. ඒ වාගේම, සෞඛ්‍ය ඇමතිවරු ගණනාවක් සිටියා. මේ යෝජනාව අවුරුදු 32ක් ඇතුළතදී ඒ ආකාරයට ක්‍රියාත්මක වුණාය කියලා කොහේවත් සඳහනක් නැහැ.

රජයේ සෞඛ්‍ය සේවයේ තනතුරුවලට අදාළ නිල ඇඳුම් පිළිබඳ තීරණය කරනු ලබන්නේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන නිල ඇඳුම් කමිටුව මඟින් වන අතර, පෞද්ගලික අංශයේ රෝහල්වල සේවය කරන හෙද නිලධාරින්ගේ නිල ඇඳුම සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙම කමිටුවට අදාළ කරුණක් නොවේ. හෙද නිලධාරින්ගේ නිල ඇඳුම වෙනස් කිරීම සම්බන්ධයෙන් රජය මෙතෙක් කිසිදු තීරණයක් ගෙන නොමැති අතර, යම් කිසිවෙකුට එසේ නිල ඇඳුම වෙනස් කළ යුතු බවට - ඒ කියන්නේ ක්ෂේත්‍රයේ නිරත වන අයට හෝ ඊට අදාළ වෘත්තීය කණ්ඩායමකට හෝ එහෙම නැත්නම් ඕනෑම අයෙකුට - යෝජනාවක්, අදහසක් පවතිනවා නම් නිල ඇඳුම් කමිටුවට ඒ සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කරන්න පුළුවන්. සාමාන්‍යයෙන් වෘත්තීය ගරුත්වය, යුනිෆෝම් එකක අදාළ වැදගත්කම, ඒ වාගේම - විවිධ කාලවලදී ඇඳුම් වෙනස් කර තිබෙනවා - ඒ සම්බන්ධයෙන් තිබෙන ප්‍රායෝගික තත්ත්වය යන සියල්ල සලකා බලා නිල ඇඳුම් කමිටුවට ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ගන්න පුළුවන්. නමුත්, රජය මෙතෙක් ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ගෙන නැති බව කියන්න පුළුවන්.

බොහොම ස්තුතියි.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

கௌரவ அமைச்சர் அவர்களே, இதற்கு முன்னர் இந்த விடயம் தொடர்பில் பிரச்சினை ஏற்படவில்லை. உண்மை யிலே, கடந்த காலங்களில் இது தொடர்பாக கிழக்கு மாகாணம் உட்பட நாட்டில் உள்ள எல்லா வைத்தியசாலைகளிலும் பணிபுரிகின்ற முஸ்லிம் nurses, காற்சட்டை - trouser - அணிந்து செல்வதற்கான அனுமதியிருந்தது; இதுவொரு பிரச்சினையாக இருக்கவில்லை. அண்மைக் காலங்களில்தான், அதுவும் சில இடங்களில் மாத்திரம் இவ்வாறான பிரச்சினைகள் இருப்பதாக நாங்கள் அறிந்தோம். எனவே, கௌரவ அமைச்சர் அவர்களே, இது தொடர்பில் உரிய நடவடிக்கை எடுக்குமாறு நான் உங்களைக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, එවැනි සිදුවීම් සම්බන්ධව තවමත් අමාත්‍යාංශයට තොරතුරු වාර්තා වෙලා නැති බව මම කියන්නට ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදනය, ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා.

## 2025.11.19 දින "අරුණ" පුවත් වාර්තාව: සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## 2025.11.19ஆம் திகதிய "அருண" செய்தி அறிக்கை: சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று

## "ARUNA" NEWS REPORT OF 19.11.2025: STATEMENT BY MINISTER OF HEALTH AND MASS MEDIA

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ජනමාධ්‍ය අමාත්‍යවරයා හැටියට මම මේ වෙලාවේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි, ඊයේ දවසේ "අරුණ" පුවත් පතේ ඉදිරිපත් කරපු මේ ප්‍රධාන

[ගරු නලින්ද ජයතිස්ස මහතා]

ප්‍රවෘත්තිය කෙරෙහි. ඔබතුමා මෙය බැලුවාට පස්සේ පෙනේවි, මේ ප්‍රවෘත්තිය වෙනුවෙන් කොතරම් ඉඩක් වෙන් කරලා තිබෙනවාද කියලා. එහි මේ ආකාරයට සඳහන් වෙනවා:

"ග්‍රාම නිලධාරි සහතිකය මදි.

පොලිස් වාර්තා ගන්න මහජන කමිටු ප්‍රධානිගේ අනුමැතියත් ඕනෑ"

"...අනුමැතියත් ඕනෑ" කියලා බොහොම අවධාරණය කරලා; තහවුරු කරලා ප්‍රවෘත්තියක් වාර්තා කරලා තිබෙනවා. මෙම ප්‍රවෘත්තියට පදනම් වෙන මූලාශ්‍රය මොකක්ද, ගරු කථානායකතුමනි? මූලාශ්‍රයක් කියන්නෙත් නැහැ. ඊයේ ගරු මහජන ආරක්ෂක අමාත්‍යතුමා මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කළාට පස්සේ අද එම පුවත් පතේ බොහොම පොඩි තැනක, මුල් පිටුවේ නමුත් ප්‍රධාන ප්‍රවෘත්ති කිහිපයකට යටින් "ආරක්ෂක කමිටු සභාපතිගේ අනුමැතිය ගැන කිව්වේ ග්‍රාම නිලධාරින්" කියලා නිවැරදි කිරීමක් ආකාරයට දාලා තිබෙනවා. නිවැරදි කිරීමක්ම නොවෙයි, ඔවුන්ගේ ප්‍රවෘත්තිය සාධාරණීකරණය කර ගන්නයි එය දාලා තිබෙන්නේ. මේ කියලා තිබෙන්නෙත් මොකක්ද? අනුරාධපුරයේ නැඟෙනහිර නුවරගම් පළාතේ ග්‍රාම නිලධාරින් කිහිපදෙනෙකු මේ ලියපු කෙනාට කිව්වාය කියලා, මෙය ප්‍රධාන ප්‍රවෘත්තිය බවට පත් කරගෙන තිබෙනවා. මම බොහොම වගකීමෙන් කියනවා, අනුරාධපුරයේ, නැඟෙනහිර නුවරගම් පළාතේ කිසිම තුලානක ග්‍රාම නිලධාරිවරයෙක් මෙහෙම කියලා නැති බව. කවුරු හරි කියපු එකක් ප්‍රාදේශීය වාර්තාකරුවෙකු කිව්වා කියලා, සාලිය කුමාර ගුණසේකර කියලා නමක් දාලා, එය ප්‍රධාන ප්‍රවෘත්තියක් බවට පත් කරලා මේ රටේ කැලඹීමක් හදන්න උත්සාහ කරපු බව පෙනෙනවා. මේ ප්‍රවෘත්තියේ අරමුණ ඒකයි.

ගරු කථානායකතුමනි, "අරුණ" පුවත්පත මීට කලිනුත් අවස්ථා කිහිපයකදී මෙවැනි ප්‍රවෘත්ති පළ කරලා තිබෙනවා. අපි ඒවා පාර්ලිමේන්තුවේ කියලාත් තිබෙනවා. 2025 ජනවාරි 03 දින පළ කර තිබෙනවා, "ක්ලීන් ශ්‍රී ලංකා යටතේ පාරේ කොස් විකුණන්න බැහැ. කොළ කැඳ විකිණූ අයටත් අතුරුගිරිය පොලීසියෙන් නඩු දාලා" කියලා. ජනවාරි 01වැනි දා "ක්ලීන් ශ්‍රී ලංකා" ව්‍යාපෘතිය ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රකාශයට පත් කරලා දින දෙකක් ගත වෙන්නට මත්තෙන් "අරුණ" පුවත්පත ප්‍රධාන ප්‍රවෘත්තියක් දමනවා, පාරේ කොළ කැඳ විකුණූ අයටත්, කොස් කපපු අයටත් නඩු දාලා කියලා. මේ කියන්න හදන්නේ මොකක්ද? පාරේ කිසිම වෙළෙඳාමක් කරන්න බැහැ, අතුරුගිරිය පොලීසිය නඩු දාලා කියලායි. මේ ප්‍රවෘත්තියත් සාවද්‍යායි කියලා අපි කිව්වා. කොහේද එහෙම නඩු දැම්මේ, එහෙම කට්ටිය අයින් කරලා තිබෙන්නේ කොහේද කියලා අපි ඇහුවා. මාර්ග අනතුරු වැළැක්වීම සඳහා පොලීසිය කටයුතු කරන අතරේ මේ විධියට ප්‍රවෘත්තියක් පළ කළේ කොහොමද කියලා අපි ඇහුවා. බලන කොට පොලීසිය එහෙම එකක් කියලාත් නැහැ. තනි පුද්ගලයෙකු කිව්වා කියලා එය පත්තරේ ප්‍රධාන ප්‍රවෘත්තියක් බවට පත් කරගෙන තිබෙනවා. මේකට කරපු නිවැරදි කිරීම මොකක්ද? ඒත් නිවැරදි කිරීමක් හරියට කළේ නැහැ. කෙනෙක් කිව්වා කියන එක විතරයි සඳහන් කළේ.

තවත් ඒ වාගේම කාරණයක් මම කියන්නම්. මේ නොවැම්බර් මාසය නේ. දැන් ප්‍රවෘත්තිය හදාගෙන ඇති, නොවැම්බර් 25, 26, 27 විතර වනකොට උතුරේ සැමරුම් ගැන කියන්න. ගිය සැරේත් මේ වැඩේ කළා. මේ තිබෙන්නේ 2024 නොවැම්බර් 26 දින පළ කරපු ප්‍රවෘත්තියක සිරස්තලයක්. "එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් සැමරීමට බාධාවක් නැහැ. බැනර්, ලාංඡන, ඡායාරූප ප්‍රදර්ශනය කළ හැකියි" කියා මහජන ආරක්ෂක ඇමති අපේ ආනන්ද විජේපාල මැතිතුමා කිව්වා කියලා - එතුමා ඒ ගැන මොකක්වත් කියලා නැති තත්ත්වයක් යටතේත් - ඉතාම සාවද්‍ය ප්‍රවෘත්තියක් පළමුවැනි පිටුවේ වම් අත පැත්තේ දාලා තිබුණා. ඒ කියන්නේ, නොවැම්බර් 26වැනි දා හෝ ඒ දිනවලට අදාළව රටේ ජනතාව අතර කැලඹීමක් හදන්න, සාමය කඩන්න මෙහෙම ප්‍රවෘත්ති පළ කරනවා. මම මේ කිව්වේ කිහිපයක් ගැන විතරයි.

මේ පත්තරේ මෙහෙම ප්‍රවෘත්ති දාලා නිකම් ඉන්නවා නොවෙයි නේ. කෙනෙක් පත්තරය බලලා පැත්තකින් තියනවා නොවෙයි නේ. ඒ අයගේම රූපවාහිනී නාළිකාවේ උදේට පුවත් පත් විස්තර ඉදිරිපත් කරන වෙලාවේදී මේ ප්‍රවෘත්තියත් විස්තර කර කර කියනවා. මම ඇත්තටම කනගාටු වෙනවා, චතුර ගැන. චතුරට මේවා කරන්න සිදු වෙලා තිබෙනවා. ඒගොල්ලන්ගේ පත්තරේ මෙහෙම ප්‍රවෘත්තියක් පළ කළාම මාධ්‍යවේදියාට මෙය රස කර කර, විස්තර කර කර කියන්න සිදු වෙලා තිබෙනවා; source එකක් - මූලාශ්‍රයක් - නැති මේ ප්‍රවෘත්තිය කියන්න සිදු වෙලා තිබෙනවා. ඇයි, පත්තරේ ඒ විධියට පළ කරලා තිබෙනවා නේ. ඒක FM නාළිකාවේත් කියනවා ඇති. දැන් මේ ප්‍රවෘත්තිය වචනවා. වචලා රටේ මහජනතාව අතර කැලඹීමක් හදන්නයි උත්සාහ කරන්නේ.

ගරු කථානායකතුමනි, මේකේ අරමුණ මොකක්ද? මේක තනිකරම කඩාකප්පල්කාරී ක්‍රියාවක්; රටේ ජනතාව අතර එක්කෝ ආගම පැත්තෙන්, එහෙම නැත්නම් ජාතිය පැත්තෙන් කැලඹීමක් හදලා රටේ කටයුතු කඩාකප්පල් කරන්න, රටේ ඉදිරි ගමන නතර කරන්න හදන වැඩක්. ඒගොල්ලන්ට මේ සඳහා තිබෙන උත්තරය මොකක්ද? උත්තරය තමයි, "කවුරුහරි ප්‍රාදේශීය මාධ්‍යවේදියෙක් කොළඹට කථා කරලා කිව්වා, එතකොට අපි පළ කළා" කියන එක. නයි කථාවට කිව්වේත් ඕකම නේද? නයි කථාවට කිව්වේත් ඕකම තමයි. "කැලණියේ වාර්තාකාරයා කිව්වා, කිව්වාම අපට කරන්න දෙයක් නැහැ, අපි පළ කළා" කිව්වා. ගරු කථානායකතුමනි, මාධ්‍ය ලෝකයේ එහෙම කොහොමද වාර්තා කරන්නේ? මේක බරපතළ සිදුවීමක්; පොලිස් වාර්තාවක් ගැනීම පිළිබඳ කාරණයක්. අඩුම තරමින් මේ ගැන මහජන ආරක්ෂක ඇමතිතුමාගෙන් අහන්න තිබුණා; නියෝජ්‍ය ඇමතිවරයෙක් ඉන්නවා, එතුමාගෙන් අහන්න තිබුණා; අමාත්‍යාංශ ලේකම් ඉන්නවා, එතුමාගෙන් අහන්න තිබුණා; පොලිස් මාධ්‍ය ප්‍රකාශක ඉන්නවා, එතුමාගෙන් අහන්න තිබුණා; නැත්නම් Senior DIG කෙනෙකුගෙන් අහන්න තිබුණා. ඒ මොකවත් කරලා නැහැ නේ. මෙහිදී නැඟෙනහිර, නුවරගම් පළාතේ කවුරු හරි පුද්ගලයෙකු කිව්වා කියලා ග්‍රාම නිලධාරිවරයෙකු - ග්‍රාම නිලධාරිවරුන් නොවෙයි, ග්‍රාම නිලධාරිවරයෙකු - අල්ලලා ඒ ප්‍රවෘත්තිය පළ කරලා තිබෙනවා. ඒ ප්‍රවෘත්තිය ඉදිරිපත් කරපු කෙනාට කියන්නකෝ, මේ සම්බන්ධ තොරතුරු ටික හරියට කියන්න කියලා. ඒ වාගේම ප්‍රාදේශීය ලේකම්ට කියන්නකෝ, ඒ තොරතුරු ටික හරියට කියන්න කියලා. නුවරගම් පළාතේ ප්‍රාදේශීය ලේකම්ගෙන් අහලා බලන්න, මෙහෙම සිදුවීමක් වුණා කියලා මොන ග්‍රාම නිලධාරිවරයාද ප්‍රාදේශීය ලේකම්ට කිව්වේ කියලා. එහෙම වෙලා නැහැ. එහෙම වෙලා නොතිබියදී ඉතාම සාහසිකව සහ සාවද්‍ය ආකාරයෙන් මේ විධියට කටයුතු කරනවා.

ගරු කථානායකතුමනි, මම මේවා කියන්නේ ඇයි? මෙවැනි කාරණා සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ Sri Lanka Press Council එකට හෝ ඊට අදාළ වෙනත් ආයතනයකට පැමිණිල්ලක් ඉදිරිපත් කළාට පස්සේ, ඔන්න කියන්න පටන් ගන්නවා, "මාධ්‍ය මර්දනය කරනවා" කියලා. මේක මාධ්‍ය මර්දනයක් නොවෙයි. ජනතාවට අයිතියක් තිබෙනවා, ඇත්ත තොරතුරු දැන ගන්න. ජනතාවට තොරතුරු දැන ගැනීම සඳහා තිබෙන අයිතියට මුවා වෙලා මෙවැනි ආකාරයේ විකෘති සහගත, සාවද්‍ය ප්‍රවෘත්ති පළ කිරීම ගැන ලජ්ජා වෙන්න ඕනෑ. මා

කියන්නේ මේකයි. මේ මාධ්‍යවේදීන් හැමදාම "අරුණ" පත්තරේ වැඩ කරන්නේ නැහැ නේ. ඒ අය කවදා හෝ දවසක එතැනින් අයින් වෙලා වෙනත් ආයතනයකට වැඩ කරන්න ගියාට පසුව, කලින් වැඩ කළේ "අරුණ" පත්තරේ කියලා ලජ්ජා වෙන්න අවශ්‍ය නැහැ නේ. ලජ්ජා නොවන ආකාරයට වැඩ කරන්න ඕනෑ. මාධ්‍ය ආයතනයේ අයිතිකරුවාට ඕනෑම දේශපාලනයක් තිබෙන්න පුළුවන්. නමුත්, එම ආයතනයේ වැඩ කරන මාධ්‍යවේදීන්ට වගකීමක් තිබෙනවා. තමන් කලින් වැඩ කළේ කොහේද කියලා ඇහුවාම ලජ්ජාවක් නැතුව ඒ පත්තරේ නම කියන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. එම නිසා මම මේ කාරණය කෙරෙහි පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරවනවා. මේ ගැන කථා කරන්න මෙතැන තමයි හොඳම තැන. ඒ, මේකට අදාළ කරන පුද්ගලයා මෙතැන සිටින නිසායි.

ගරු කථානායකතුමනි, ආණ්ඩුව විවේචනය කළාට කමක් නැහැ. ඒ ඕනෑම දෙයක් කරන්න පුළුවන්. නමුත්, විකෘති හා සාවද්‍ය ප්‍රවෘත්ති පළ කරලා ජනතාව අතර කැලඹීමක් හදන්න කරන මේ උත්සාහය සම්බන්ධයෙන් අදාළ අමාත්‍යවරයා, නැත්නම් අදාළ අය අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගන්නවා; මේ සම්බන්ධයෙන් පැමිණිලි කරන්න ඕනෑ තැන්වලට පැමිණිලි කරනවා. අපට ඕනෑකම තිබෙන්නේ, මාධ්‍ය නිදහස ආරක්ෂා කර ගනිමින් ජනතාවට ඇත්ත තොරතුරු දැනගන්න තිබෙන අයිතිය ආරක්ෂා කර ගන්නයි.

බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order. - *[Interruption.]* Sir, මේ document එක -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, බාධාවකින් තොරව කාරණාවක් ඉදිරිපත් කරන්න මට විනාඩි 3ක කාලයක් ලබා දෙන්න කියලා.

ගරු ඇමතිතුමනි, මේක කඩාකප්පල්කාරී ක්‍රියාවක් නොවෙයි. ඒ වාගේම මේක සාවද්‍ය ක්‍රියාවකුත් නොවෙයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාම කිව්වා, මේ ගැන කථා කරන්න හොඳම තැන මෙතැනයි කියලා. ඒ නිසා මම මේ ගැන කථා කරනවා. මේකේ මූලාශ්‍රය, සජිත් ප්‍රේමදාස. මහජන ආරක්ෂක ඇමතිතුමා ඊයේ දිනයේ හෝ පෙරේදා දිනයේ - මට දිනය හරියට මතක නැහැ - කිව්වා, පොලීසියෙන් චරිත සහතික ලබා ගන්න ප්‍රජා පොලිස් කමිටුවල සභාපතිවරුන්ගේ නිර්දේශය අවශ්‍ය නැහැ කියලා.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට ගෞරවයෙන් මේ තොරතුරු ඉදිරිපත් කරන්න කැමැතියි. මාතර, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹල්ගොඩ ග්‍රාම නිලධාරි වසමේ, කංකානම් පතිරණගේ අනුරාධ මධුශංක පෞද්ගලික අංශයේ රැකියාවක් ලබා ගැනීම සඳහා හක්මන පොලිස් ස්ථානයෙන් පොලිස් වාර්තාව -චරිත සහතිකය- ඉල්ලන්න කටයුතු කරන කොට එයාට උපදෙස් දීලා තිබෙනවා, ග්‍රාම නිලධාරි වාර්තාවට අමතරව ප්‍රජා පොලිස් කමිටුවේ සභාපතිවරයාගෙන් චරිත සහතිකය අවශ්‍යයි කියලා. ඒ සභාපතිවරයාගේ නම පී. රාමවික්‍රම. ඒ චරිත සහතිකය ලබා දුන්නාට පසුවයි මේ කියන පුද්ගලයා වන කංකානම් පතිරණගේ අනුරාධ මධුශංකට පොලිස් වාර්තාව ලබා දීලා තිබෙන්නේ. ඒක පළමුවැනි උදාහරණය. මම දැන් කිව්වේ, හක්මන පොලීසියට අදාළ එකක්.

මා දෙවනුව කියනවා, කඹුරුපිටිය පොලීසියට අදාළ එකක්. මාතර, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලේනබටුව ග්‍රාම නිලධාරි වසමේ, 317 'සී' ලිපිනයේ පදිංචි, ඩී.ජී. දෙනෙත් යන අය පොලිස් වාර්තාව ඉල්ලුම් කරන කොට ප්‍රජා පොලිස් කමිටුවේ සභාපති සම්පත් වික්‍රමසිංහ මහත්මයාගෙන් ගත් චරිත සහතිකයක් ඉල්ලා තිබෙනවා. මම මේවා වගකීමෙන් කියන්නේ. ඔහු තමයි ඒ ගමේ NPP එක නියෝජනය කරන අර කියපු සභාපතිතුමා. කඹුරුපිටිය පොලීසියෙන් පොලිස් වාර්තාව ලබා ගන්න ඉල්ලීමක් කරන කොට, ප්‍රජා පොලිස් කමිටුවේ සභාපති සම්පත් වික්‍රමසිංහගෙන් චරිත සහතිකයක් ඉල්ලා තිබෙනවා. මම මේවා කියන්නේ, අදාළ පුද්ගලයන්ගේ, පොලිස් ස්ථානවල, ග්‍රාම නිලධාරි වසම්වල නම්, ගම් සහිතව. හැබැයි තවම Police Certificate එක දීලා නැහැ. ඒ දෙනෙත් කියන පුද්ගලයා ගමේ NPP සාමාජිකයෙකු වන සම්පත් වික්‍රමසිංහ මහත්මයා සභාපතිත්වය දරන ප්‍රජා පොලිස් කමිටුවේ - ඒ සභාපතිගේ - සහතිකයත් ඉදිරිපත් කරලා තිබෙනවා. කඹුරුපිටිය පොලීසියත් ඔහුට කියලා තිබෙනවා, එහෙම සහතිකයක් අරගෙන එන්න කියලා. ඇත්ත වශයෙන්ම මම මේ කාරණාව ගරු කථානායකතුමාට ඉදිරිපත් කරන්නේ, කරුණු ඉදිරිපත් කරන්න හොඳම තැන මෙතැනයි කියලා ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා කියපු නිසා. ඔව්, මෙතැන තමයි හොඳම තැන. විශේෂයෙන්ම මම අහන්න කැමැතියි, මේ මුල පුරන්නේ ව්‍යවස්ථාපිත ඒකාධිපතිත්වයකටද, මේ මුල පුරන්නේ පොලිස් රාජ්‍යයක් ක්‍රියාත්මක කරන්නටද කියලා. මේ මුල පුරන්නේ මරණාධාර සමිතියේ, කුලහන සමිතියේ, ගොවි සමිතියේ, ධීවර සමිතියේ, කාන්තා සමිතියේ, ප්‍රජා සංවර්ධන සමිතියේ, ග්‍රාම සංවර්ධන සමිතියේ ඉඳලා හැම තනතුරක්ම එක පක්ෂයකට සම්බන්ධ කර ගෙන,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, අවසන් කරන්න. විනාඩි තුන ඉවරයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඉක්මනින් අවසන් කරන්නම්. මම අවසන් කරන්නම්. පොඩ්ඩක් ඉන්නකෝ. ඉවර කරන්නම්. මම තොරතුරු, දත්ත සහිතවයි මේ කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට විනාඩි 3ක් ලබා දුන්නා. ඒ විනාඩි 3 ඉවරයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒකාධිපතිත්වයක් නිර්මාණය කරන්න නේද මේ හදන්නේ? මා අහන්නේ ඒකයි. මම මේ සාක්ෂි එක්කයි කියන්නේ. මූලාශ්‍රය වෙන කවුරුත් නොවෙයි. මූලාශ්‍රය, සජිත් ප්‍රේමදාස.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ වාගේම, වතුර ගැන කිව්වා, වමුදිත ගැන කිව්වා. *[බාධා කිරීමක්]* ඒගොල්ලෝ හොඳ කියන කොට හොඳයි; වැරදි පෙන්වා දෙනකොට නරකයි. එහෙම නොවෙයි, දෙකම හොඳින් භාර ගන්න.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට එකක් කියන්න කැමැතියි. *[බාධා කිරීමක්]* මට ආරංචියක් ලැබුණා, ඔබතුමාගේ කාමරයටත් නයෙක් ඇවිල්ලා කියලා. එම නිසා විශේෂයෙන්ම,- *[බාධා කිරීමක්]* නැහැ, මේක විහිළුවක් නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මෙය ඇත්තටම පාරිසරික සංවේදී ප්‍රදේශයකට තදාසන්නව සිටින නිසා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමනි. ඔබතුමාට ලබා දුන් විනාඩි 3 ඉවරයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේක විහිළුවක් නොවෙයි. පොඩ්ඩක් අහගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට ලබා දුන් විනාඩි 3 ඉවරයි. ඔබතුමා විනාඩි 3ක් ඉල්ලා ගත්තා. ඒ විනාඩි 3 ඉවරයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමාට දෂ්ට කළොත් ඒක ලොකු ප්‍රශ්නයක්. මම දන්නේ නැහැ, මෙහේ anti-venom ගෙනැල්ලා තිබෙනවාද කියලා. මෙහේ anti-venom ගෙනැල්ලා තිබෙනවාද? *[බාධා කිරීමක්]* ඔබතුමා පොඩ්ඩක් ඒ ගැන සොයා බලන්න. *[බාධා කිරීමක්]* විශේෂයෙන්ම පාරිසරික සංවේදී කලාපයක මේ පාර්ලිමේන්තුව පිහිටා තිබෙන නිසා *[බාධා කිරීමක්]* මේ සර්පයින්ගෙන් ඔබතුමා පරිස්සම් වෙන්නත් ඕනෑ, මේ පාර්ලිමේන්තුවේ අපිත් පරිස්සම් වෙන්න ඕනෑ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, පෙරේදා සභාගත කරපු ලේඛනයක් ගැනයි මම මේ කථා කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේ තිබෙන්නේ ඒ සභාගත කරපු ලේඛනය. මේක ආරක්ෂක බලකාය එක්ක- *[බාධා කිරීමක්]* ඇමෙරිකා එක්සත් ජනපදයත් එක්ක අත්සන් කරපු ගිවිසුම. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අදාළ නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, නැහැ. පොඩ්ඩක් ඉන්න, ගරු කථානායකතුමනි. පොඩ්ඩක් ඉන්න. මේ, table කරපු එකක්. ගරු කථානායකතුමනි, මේ කියන එක පොඩ්ඩක් අහන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඔබතුමාට,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේක පෙරේදා table කළා - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඕවා ගැන දැන් කථා කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට මේක කියන්න විනාඩියක් දෙන්නකෝ. පෙරේදා,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේක කියන්න දෙන්නකෝ. මොකක්ද මේ වෙන්නේ? මේ, සභාගත කරපු ලේඛනයක් පිළිබඳ කාරණයක්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මෙතුමාට අවස්ථාව දීලා ඉන්න, ගරු කථානායකතුමනි. පව්!

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඇමති කෙනෙක් සභාගත කරපු document එකක් වැරදියි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මෙතුමාට අවස්ථාව දීලා ඉන්න, ගරු කථානායකතුමනි. මගේ කාරණාව කියන්න අමාරුයි නේ මෙහෙම. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක නඟන Standing Order එක මොකක්ද? *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මෙහෙම කථා කරන්න ගියාම අවුල් වෙනවා, ගරු කථානායකතුමනි. ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව දීලා ඉන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව දුන්නාම ඔබතුමා,- *[බාධා කිරීමක්]* ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා රීති ප්‍රශ්නය නඟන්නේ මොන Standing Order එක යටතේද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ස්ථාවර නියෝග 92(2) යටතේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එතුමාට අවස්ථාව දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට පොඩ්ඩක් මයික් එක දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේක අහන්න අවස්ථාව දෙන්න, ගරු කථානායකතුමනි. මේ මොන්ට්‍රියෝල් ගිවිසුම අත්සන් කරපු එකේ කොපියක් පෙරේදා ඉදිරිපත් කළා, ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා. මේක තිබෙන්නේ සිංහලෙන්. මේකේ අත්සන් කරලා නැහැ, කවුරුවත්. අපි කියන්නේ මේකේ ඇත්ත ගිවිසුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා. ගරු කථානායකතුමනි, එතුමා කිව්වා, "මේ මොන්ට්‍රියෝල් ගිවිසුම දැන් සභාගත කරනවා" කියලා. මේ වෙන එකක් සභාගත කරලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point එක පැහැදිලියි. *[බාධා කිරීමක්]* ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමන්ලා මේ සභාවට කරන ප්‍රකාශ ගැනත්, එතුමන්ලා ඉදිරිපත් කරන වාර්තා ගැනත් ඒ මන්ත්‍රීවරුන්ට තමයි වගකීම තිබෙන්නේ. ඒවා නිවැරදිද, වැරදිද කියන එක වෙනම ඔප්පු කරන්න පුළුවන්, වෙන තැනක. නැත්නම් හැම මන්ත්‍රීවරයෙක්ම ඉදිරිපත් කරන ඒවා- *[බාධා කිරීම්]* ඒ නිසා - *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, *[බාධා කිරීම්]* ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා *[බාධා කිරීම්]* එතුමාගේ කැමැත්තෙන් -කවුරුත් අහලා නොවෙයි- ඒක ඉදිරිපත් කළේ. *[බාධා කිරීම්]* එතුමා ඔබතුමාගෙන් වෙනම වෙලාවක් අරගෙන ඒක ඉදිරිපත් කළේ. ඒ නිසා ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. *[බාධා කිරීම්]* ඉදිරිපත් කරන ලේඛනවල නිවැරදිභාවය තහවුරු කරන්න පාර්ලිමේන්තුවට වෙනම ක්‍රමයක් නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මාර වැඩක් නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමාට වෙනම ක්‍රමයක් තිබෙනවාද? මෙතැන ක්‍රමයක්-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේක ආරක්ෂක නියෝජ්‍ය ඇමති ඉදිරිපත් කළේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා කාගේවත් ඉල්ලීමකට නොවෙයි, එතුමාමයි ඒක ඉදිරිපත් කළේ. ඒ නිසා අවස්ථාවක් ආවාට පස්සේ අවශ්‍ය නම් එතුමා මේකට උත්තර දෙයි. *[බාධා කිරීම්]* ලේඛනවල නිරවද්‍යතාවය පිළිබඳ වගකීම භාරගන්න තිබෙන්නේ මන්ත්‍රීවරුන්ට. *[බාධා කිරීම්]*

ඒ නිසා මම ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, විපක්ෂ නායකතුමා හදිසියේ මතු කරපු දේට උත්තර දෙන්න ආනන්ද විජේපාල ඇමතිතුමාට අවස්ථාව දෙන්න කියලා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහජන ආරක්ෂක අමාත්‍යතුමා. *[බාධා කිරීම්]*

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, *[බාධා කිරීම්]* ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කරපු කාරණය පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. ගරු විපක්ෂ නායකතුමනි, ඒ දිනය මොකක්ද කියනවාද? ඔබතුමා ඒ කියපු වාර්තාවේ දිනය මට කියනවාද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාට ඉදිරිපත් කළේ ඒ නම් ගම් සහිත කමිටු වාර්තා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ඒ දිනය, දිනය?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ දිනය මා සතුව නැහැ.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ප්‍රජා පොලිස් කමිටු තිබුණේ-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක මහ ලොකු දෙයක් නොවෙයි. ඔබතුමා ඔබතුමාගේ නිලධාරීන් ලවා හක්මන පොලීසිය-

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මම ඒ දිනය මොකක්ද කියලා ඇහුවේ. ඔබතුමා කලබල වෙන්න එපා. *[බාධා කිරීම්]* ඔබතුමා කලබල වෙන්න එපා. දිනය මොකක්ද කියලා ඇහුවේ. කලබල වෙන්න එපා. *[බාධා කිරීම්]* දිනය ඇහුවේ. ඔබතුමාගේ ළඟ දිනය නැත්නම් දිනය නැහැ කියන්න. කමක් නැහැ, ප්‍රශ්නයක් නැහැ.*[බාධා කිරීම්]*

ගරු කථානායකතුමනි, අපි මේ වෙනකොට පිහිටුවලා තිබෙන්නේ මහජන ආරක්ෂක කමිටු. එතුමා කියපු ප්‍රජා පොලිස් කමිටුවලින් කලින් ඒක ගන්න ඇති. ඒකයි මම දිනය මොකක්ද කියලා ඇහුවේ. මොකද, අපි මහජන ආරක්ෂක අමාත්‍යාංශය හැටියටත්, පොලිස් දෙපාර්තමේන්තුව හැටියටත් කිසිම ආකාරයකින් චක්‍රලේඛයක් නිකුත් කර නැහැ, මහජන ආරක්ෂක කමිටුවලින් චරිත සහතික දෙනකොට එවැනි සහතිකයක් ගන්න කියලා. සාමාන්‍යයෙන් ග්‍රාම නිලධාරීගේ සහතිකයක් ගැනීම පොලිස් වාර්තාවට අදාළ කාරණයක්. මහජන ආරක්ෂක කමිටු පිහිටෙව්වාට පසුව එහෙම දෙයක් නැහැ. ඔබතුමා මට කරුණු ඉදිරිපත් කළේ ප්‍රජා පොලිස් කමිටු ගැන. ප්‍රජා පොලිස් කමිටු මීට පෙර පැවති ආණ්ඩු යටතේ තිබුණා. ඒ කාලයේ ඒ සහතික ගත්තාද නැද්ද මම දන්නේ නැහැ. මම ඒකයි ඔබතුමාගෙන් ඒ දිනය ගැන ඇහුවේ, මේ සිද්ධිය වුණේ කවදාද කියලා. නමුත්, යම් පොලීසියක එහෙම සිද්ධ වෙලා තිබෙනවා නම් මම පරීක්ෂා කර බලන්නම්. ඔබතුමා කියපු පොලිස් ස්ථාන ගැන මම සොයා බලන්නම්. කිසිදු අවශ්‍යතාවක් නැහැ මහජන ආරක්ෂක කමිටුවේ සභාපති හෝ වෙනත් කෙනෙකුගේ සහතිකයක්. ග්‍රාම නිලධාරීගේ සහතිකය මත පදනම්ව සාමාන්‍ය විධියට පොලිස් චරිත සහතිකයක් ගන්න අපි කටයුතු සලස්වා තිබෙනවා. මේ පිළිබඳව මහජන ආරක්ෂක අමාත්‍යාංශයෙන්වත්, පොලිස්පතිවරයාවත් කිසිදු චක්‍රලේඛයක් නිකුත් කරලා නැහැ. නැවත නැවතත් ඒක අපි මේ සභාවට අවධාරණය කරනවා. මේ රට නොමඟ යවන ප්‍රවෘත්ති ප්‍රකාශයක් ඊයේ සිදු වුණා පසුව ඔබතුමා උත්සාහ කරනවා, ඒ ප්‍රවෘත්තිය සත්‍යයි කියලා නැවත තහවුරු කරන්න. *[බාධා කිරීම්]*

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා මීට පෙරත් *[බාධා කිරීම්]* මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, මහජන ආරක්ෂක කමිටු දේශපාලනීකරණය කරලා කියලා. ඔබතුමා දන්නවාද, මහජන ආරක්ෂක කමිටුවේ ලේකම්වරයා හැටියට කටයුතු කරන්නේ ග්‍රාම නිලධාරිවරයා කියලා? ප්‍රජා පොලිස් කමිටුවේ හිටපු ප්‍රජා පොලිස් නිලධාරියා තමයි මහජන ආරක්ෂක කමිටුවේ කැඳවුම්කරු. ඒ සභාපතිවරයා පත් කරන්නේ මෙහෙමයි. මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න කැමතියි කියලා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාට ඉල්ලුම්පත්‍ර දාපු අයගෙන් පිළිගත් පුද්ගලයෙක් ඡන්දයෙන් තෝරා ගෙන සභාපති කරගන්නවා. එහෙම නැතුව මේකේ කිසිදු ආකාරයක දේශපාලනීකරණයක් නැහැ. ඔබතුමා පෙර දවසේත් මේ කථාව කිව්වා. *[බාධා කිරීම්]* නමුත් නැවත නැවතත් මේ කථාව තමයි අපට අවධාරණය කරන්න වෙලා තිබෙන්නේ. මහජන ආරක්ෂක කමිටු කිසිදු ආකාරයකින් දේශපාලනීකරණය කරලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, දැන් අවසන් කරන්න.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
යම් කෙනෙක් මොනවා හරි සමිතියක තනතුරු ගන්නවා නම්, ඒ තනතුරුවලට පත්වෙන්නේ, බහුතර කැමැත්තෙන්. ඔබතුමා ඒක දන්නවා. ඒක මාලිමාවට ලැබෙනවා නම් ඒ පිළිබඳව කිසි

ගැටලුවක් නැහැ. නමුත් අපි මහජන ආරක්ෂක කමිටු හදලා තිබෙන්නේ, විධිමත් චක්‍රලේඛයක් පරිදියි කියන එක අවධාරණය කරන්න කැමතියි.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
චමින්ද විජේසිරි මැතිතුමා, දැන් ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92 (2) යටතේ මම මේ කරුණ ඉදිරිපත් කරන්නේ. මම පහදන්න ඕනෑ ස්ථාවර නියෝග 22 (9) ගැන. ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, ඔබතුමා මම ගරු කරන ඇමතිවරයෙක්. අමාත්‍යාංශ නිවේදනයකින් අමාත්‍යාංශය ඇතුළේ තිබෙන යම් කාර්යභාරයක් පිළිබඳව තමයි මේ සභාව දැනුවත් කරන්න ඕනෑ. එතුමා පාර්ලිමේන්තුව අවභාවිත කළා. එතුමන්ලාට ගහන මඩ ටික හෝදන්න උත්සාහ කරන්න දෙන්න එපා මේ න්‍යාය පත්‍රය තුළින්. අමාත්‍යාංශ නිවේදනයක් නොවෙයි එතුමා කළේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා බැවින් එතුමාට,-*[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එතුමා පත්තරේ ගෙනැත් පත්තරේ කියවනවා, එතුමාගේ කාරණා ටික කියන්න. ඒක වරප්‍රසාද කමිටුවටයි යන්න ඕනෑ. ගරු කථානායකතුමනි, -*[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ජනමාධ්‍ය ඇමතිවරයා හැටියට මම අමාත්‍යාංශ නිවේදනයක් කළේ. මට ඒකට අයිතියක් තිබෙනවා. එකක්, මේ රටේ මාධ්‍ය නිදහස ආරක්ෂා කර ගැනීම වෙනුවෙන්. දෙවැනි එක, ජනතාවගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය ආරක්ෂා කරගැනීම වෙනුවෙන්. දැන් මම කියන්නම්කෝ,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක වැරදියි කියලා පිළිගන්නවාද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මොකක්ද වරද? *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, කිසි වරදක් නැහැ. මම කළේ හරිම දේ. ඔබතුමා මේගොල්ලන්ගෙන් උපදෙස් ගන්න එපා. *[බාධා කිරීම්]* මෙහෙමයි. නයාට කිරි පොවන්න එන අයගෙන් ගන්න එපා.

ගරු කථානායකතුමනි, මම මේකට උත්තරයක් දෙන්නම්. *[බාධා කිරීම්]* දැන් මේ රටේ police reports කීයක් ගන්නවාද? මේ රටේ දවසකට දහස් ගණනක් police reports ගන්නවා. ඇමතිතුමා කිව්වා නේ, පොලීසිය පැත්තෙන් කිසිම ආකාරයක උපදෙසක්, චක්‍රලේඛයක් නිකුත් කරලා නැහැ කියලා, මේ මහජන ආරක්ෂක කමිටුවලින්, ඒ සභාපතිගෙන් අනුමැතියක් ගන්න ඕනෑ කියලා. හැබැයි, දැන් දිගටම සංවිධානාත්මකව මහජන ආරක්ෂක කමිටුවලට ගහන්න හදන්නේ ඇයි? මේවාට ගහන්නේ වෙන මොකුත් නිසා නොවෙයි. එදා ජනාධිපතිතුමා කිව්වා වාගේ, මේ කුඩු ව්‍යාපාරය මර්දනය කරන්න උපයෝගී කරගන්නා හැම උපාංගයකටම මේ අය බාධා කරන්නයි හදන්නේ. මහජන ආරක්ෂක කමිටු ගැන දුර්මතයක් හදන්න යන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි. *[බාධා කිරීම්]* කුඩු ව්‍යාපාරය මර්දනය කරන්න වැඩ කටයුතු කරනකොට ඔන්න මේගොල්ලන් කලබල වෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, ස්ථවර නියෝග 92 (2) යටතේ මම මේක අහන්නේ.

අපේ සභානායකතුමා ගෙනාපු මේ ප්‍රශ්නයයි, පොලීසිය භාර ඇමතිතුමා කියපු දේයි ගත්තාම, ඇත්තටම ගරු කථානායකතුමනි, අපේ ප්‍රදේශවලත්, කොළඹ නගරයේත් මේ මහජන ආරක්ෂක කමිටු සභාපතිවරයාගෙන් මේ ලියුම අරගෙන එන්න කියනවා. අවශ්‍ය නම් මම ඔබතුමාට පෞද්ගලිකව දෙන්නම්,- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැන point of Order එකක් නැහැ, ගරු මන්ත්‍රීතුමා.

අපි දැන් ප්‍රධාන වැඩකටයුතුවලට යමු.

අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් වී නොමැති බැවින්, 2025 සැප්තැම්බර් 11වැනි දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ තීරණය ප්‍රකාරව අපර භාග 6.00 සිට අපර භාග 6.30 දක්වා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව විවාද කිරීමට වෙන් කර ඇති කාලය ද විසර්ජන පනත් කෙටුම්පත කාරක සභා අවස්ථාවේ විවාදය සඳහා සභාවේ අවසරය ඇතිව යොදා ගන්නා බව දැනුම් දීමට කැමැත්තෙමි.

ප්‍රධාන වැඩකටයුතු. න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2026, කාරක සභා අවස්ථාව, එකොළොස්වන වෙන් කළ දිනය.

# විසර්ජන පනත් කෙටුම්පත, 2026
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
## APPROPRIATION BILL, 2026

*කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය: නොවැම්බර් 19]*
*[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]*

*குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: நவம்பர் 19]*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered further in Committee.- [Progress: 19th November]*
*[HON. SPEAKER in the Chair.]*

**119 වන ශීර්ෂය. - බලශක්ති අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 670,000,000

**தலைப்பு 119.- வலுசக்தி அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 670,000,000

HEAD 119.- MINISTER OF ENERGY

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 670,000,000

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

පළමුවන උපලේඛනය, බලශක්ති අමාත්‍යාංශය - වැය ශීර්ෂය අංක 119, සලකා බැලීම පූර්ව භාග 10.30 සිට අපර භාග 6.30 දක්වා.

කපා හැරීමේ යෝජනාව, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 25ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 9.55]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු සභාපතිතුමනි, "2026 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.11.20 බ්‍රහස්පතින්දා විවාදයට ගැනෙන අමාත්‍යාංශයට අදාළ අංක 119 දරන වැය ශීර්ෂයෙන් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්හි සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, අද මේ සභාව ආරම්භයේ මතු වුණු කරුණක් පිළිබඳව මා පළමුව ප්‍රකාශ කළ යුතුයි. අපේ මිත්‍ර, (වෛද්‍ය) නලින්ද ජයතිස්ස ඇමතිතුමාට අද රනිල් වික්‍රමසිංහ ආරූඪ වුණා. මීට කලින්, මේ රටේ යහපත් මාධ්‍යකරණයේ නිරත වන චතුර අල්විස්ට, චමුදිත සමරවික්‍රමට ඔවුන්ගේ නම් කියලා මේ සභාව තුළ තර්ජනය කළේ, බලපෑම් කළේ කවුද? ඒ, රනිල් වික්‍රමසිංහගේ ක්‍රමය. ඒ කාලයේ රනිල් වික්‍රමසිංහ කරන දේ වැරැදියි කියලා මේ සභාව තුළ බොහොම ලස්සනට තර්කානුකූලව පැහැදිලි කරපු නලින්ද ජයතිස්ස ඇමතිතුමා මන්ත්‍රී ධුරයේ ඉඳලා ඇමති ධුරයට පත් වෙලා, පාර්ලිමේන්තුවේ වග කිව යුතු ධුරයක් දරනකොට, මේ රටේ ප්‍රධාන පෙළේ මාධ්‍යවේදීන් පුවත් පත්වල පළ වන දේ මත පදනම්ව මාධ්‍යකරණයේ යෙදෙන එක විවේචනය කරන එක ගැන මට පුදුමයි. ඒක නම් ලොකු වෙනසක්, අපේ නලින්ද ඇමතිතුමා. ඒක හුඟක් ලොකු වෙනසක්. ඔබතුමාගේ ඒ ලස්සන සිනහව මට කියන්නේ, ආණ්ඩුවක් ගත්තාට පස්සේ මොන තරම් අසරණ වෙනවාද කියලා නේද? මාර වැඩේ ලංකාවට වුණේ. රනිල් වික්‍රමසිංහ, බිමල් රත්නායකට ආරූඪවීම කමක් නැහැ. රනිල් වික්‍රමසිංහ, නලින්ද ජයතිස්සට ආරූඪවීම නම් ලොකුම ප්‍රශ්නයක්. ඒක ලොකු ප්‍රශ්නයක්.

ගරු සභාපතිතුමනි, දැන් මම අද දිනට අදාළ විෂය ගැන කථා කරන්නම්. ගරු ඇමතිතුමනි, විදුලි බලය හා සම්බන්ධව ප්‍රධානම නෛතික වෙනස්කමක් පසුගිය වසරක කාලය තුළ සිද්ධ වුණා. පසුගිය රජයත්, වර්තමාන රජයත්, ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව උනන්දුවක් දක්වනවා. ඒ ප්‍රතිපත්තිය අඛණ්ඩව ගෙන යනවා. ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් විපක්ෂය හැටියට අපේ පූර්ණ සහයෝගය ලබා දෙනවා. ඒ ගැන කිසිම සැකයක් තියාගන්න එපා. ඒක ජනන වෙන්න පුළුවන්, සම්ප්‍රේෂණ වෙන්න පුළුවන්, බෙදා හැරීම වෙන්න පුළුවන්, පද්ධති පාලනය වෙන්න පුළුවන්. ඒ වාගේම ඒ පරිපාලනයට අවශ්‍ය කරන තවත් උප සමාගම් වෙන්න පුළුවන්. පරිපාලනය අපහසු දැවැන්ත සමාගමක් පාලනය කළ හැකි ව්‍යුහයන්වලට කොටස් කරලා, ඒ කොටස් නිසි ලෙස පාලනය කරලා අවසාන විග්‍රහයේදී ගුණාත්මක විදුලිය සාධාරණ මිලකට අඛණ්ඩව ගෘහස්තයන් වෙත සහ කර්මාන්තකරුවන් වෙත ලබාදීම සහ රටේ ආර්ථික සංවර්ධනය උදෙසා අවශ්‍ය දායකත්වය ලබාදීමට ඉඩකඩ සැලසීම අපි අගය කරනවා. ඒ නිසා මේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාදාමයට අපි හදවතින්ම සහයෝගය පළ කරනවා. අපි දැක්වීමට හැකි හැම සහායක්ම දක්වලා තිබෙනවා. ඉදිරියේදීත් සහයෝගය දක්වනවා. වැදගත්ම දේ තමයි, මෙය ප්‍රතිව්‍යුහගත කිරීමට මීට දශක දෙකකට කලින් විරුද්ධ වෙච්ච අය මේ ප්‍රතිව්‍යුහගත කිරීමට දැන් කැමති වීම. ඒක වැදගත් ලක්ෂණයක්. ලෝකය වෙනස් වෙනවා; අදහස් වෙනස් වෙනවා. විපක්ෂයේ ඉන්නකොට විරුද්ධ වුණත්, ආණ්ඩු පක්ෂයට ආවාට පස්සේ වගකීම් දරනකොට ඒ කළ යුතු දේ මොකක්ද; නිවැරදි දේ කුමක්ද කියලා දැනෙනවා, තේරෙනවා. එම නිසා රජය ඒ ප්‍රතිපත්තියට ආපු එක වැදගත්.

දැන් ඉතිරිවෙලා තිබෙන ප්‍රශ්නය මොකක්ද? එකක්, මේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාදාමය තුළ බලාපොරොත්තු වන වැදගත් දෙයක් තිබෙනවා. ඒ තමයි, පෞද්ගලික අංශයේ දේශීය සහ විදේශීය ආයෝජන මේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාදාමය හරහා අපේ පද්ධතියට අරගෙන එන එක. රජය මෑතකදී කරපු සංශෝධනය හරහා ඒ පෞද්ගලික අංශයේ විදේශීය හෝ දේශීය ආයෝජන මෙම ක්ෂේත්‍රයන් තුළට අරගෙන ඒම වළක්වා තිබෙනවා. සියයට සියයක්ම මේ ආයතන රජයේ අයිතිය තුළ තබා ගන්නවා කියන ඒ ප්‍රතිපත්තියේ අඩු පාඩුවක් තිබෙනවා. රාජ්‍යයට පාලනයක් තිබිය යුතුයි කියන කාරණය පිළිගන්නවා. සේවක සුරක්ෂිතතාව පිළිබඳ කාරණයත් අපි පිළිගන්නවා. හැබැයි, සම්ප්‍රේෂණ වෙන්න පුළුවන්, විදුලිය ජනනය කිරීම වෙන්න පුළුවන්, පද්ධති පාලනය වෙන්න පුළුවන්, විදුලිය හා සම්බන්ධ වෙනත් ක්ෂේත්‍රයක් වෙන්න පුළුවන්; රාජ්‍ය හෝ පෞද්ගලික, දේශීය හෝ විදේශීය ආයෝජන අරගෙන ආවේ නැත්නම් අපේ පද්ධතිය smart grid එකක් බවට පත් කරන්න බැහැ.

ගරු ජනාධිපතිතුමා, මුදල් ඇමතිතුමා හැටියට එතුමාගේ අය වැය කථාවේ කියනවා, අපේ පද්ධතිය සුහුරු පද්ධතියක් කරන්න ඕනෑ කියලා. හරියටම හරි. ඒක අපි කවුරුත් පිළිගන්නවා. හැබැයි, සුහුරු පද්ධතියක් කරන්න අවශ්‍ය කරන ඩොලර් බිලියන 8ක්, 10ක් පමණ වෙච්ච ඒ දැවැන්ත මුදල් ප්‍රමාණය අපට රාජ්‍යයෙන්

සොයා ගන්න හැකියාවක් නැහැ. ඒ තත්ත්වය තුළ අනිවාර්යයෙන්ම අනාගතයේ නෛතික සංශෝධනයක් විය යුතුයි. මේ තිබෙන ආරවුල් සහගත තත්ත්වය සමථයකට පත් වෙලා, විශේෂයෙන්ම සේවකයන්ට සහ පාරිභෝගිකයන්ට යම් අවබෝධයක් ඇති වුණු අවස්ථාවේදී ඊළඟ ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරණවලට, නෛතික ප්‍රතිසංස්කරණවලට යයි කියලා මම විශ්වාස කරනවා. ඒ සඳහා මම සුභ ප්‍රාර්ථනා කරනවා. එතැනදීත් අපි ඉන්නවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම දැන් මතු වෙලා තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි මේ ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව රජය අරගෙන යන වැඩපිළිවෙළ මෙහෙයවීම සඳහා, ඒ කියන්නේ ප්‍රතිව්‍යුහගත කිරීම කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය කරන වෘත්තීමය කණ්ඩායමක් නොමැතිවීම. මේ සඳහා තනි පුද්ගලයෙකුගේ මූලිකත්වයෙන් සුළු කණ්ඩායමක් වැඩ කරනවා. ලංකා විදුලිබල මණ්ඩලයේ ඉන්න සේවකයන් මේකට යොදා ගන්න පුළුවන්කමක් නැහැ. ඔවුන් දැන් සමාගම්වලට වෙන් කරමින් තිබෙනවා. ඔවුන්ට විශේෂ වගකීම් පැවරිලා තිබෙනවා. ඒ නිසා ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාදාමය, restructuring වැඩේටම විශේෂිත අත් දැකීම් තිබෙන පළපුරුදු වෘත්තීමය භාවයක් තිබෙන සමාගමක් යොදා ගන්න ඕනෑ.

අපේ විදුලිබල ඇමතිතුමා දන්නවා, මීට කලින් PricewaterhouseCoopers - PwC - කියන ලෝකය පිළිගත්ත ඒ විගණන ආයතනට මේ වගකීම් යම් ප්‍රමාණයකට පවරපු බව. සම්පූර්ණ වගකීම නොවෙයි. හැබැයි, අද වෙනකොට PwC ආයතනය මේ කථාවෙන් එළියට ගිහිල්ලා තිබෙනවා. PwC ආයතනය ලෝකයේ ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ පළපුරුද්දක් තිබෙන ආයතනයක්. මම කියන්නේ නැහැ, PwC ආයතනයම එන්න ඕනෑ කියලා. ඒක KPMG වෙන්න පුළුවන්; ඒක E&Y වෙන්න පුළුවන්; වෙනත් ඒ පිළිබඳ අත් දැකීම් තිබෙන පළපුරුදු සමාගමක් වෙන්න පුළුවන්. නිසි ක්‍රියාදාමයක් හරහා මේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාදාමය කළමනාකරණය කරන්න අවශ්‍ය කරන පළපුරුදු කණ්ඩායමක් ආවොත්, මේක අපට පැහැදිලිව කර ගන්න පුළුවන්.

මොකද, අපේ විදුලි බල පද්ධතිය ඩොලර් බිලියන ගණනක් වටිනවා. මගේ අවබෝධය හැටියට අපේ රටේ තිබෙන වටිනාම සම්පත්වලින් එකක්. අපේ තිබෙන වාරිමාර්ග පද්ධතිය ඇරුණාම, වටිනාම සම්පත තමයි අපේ විදුලි බල පද්ධතිය කියලා මම විශ්වාස කරනවා. අපි හැම ගමකටම, හැම නිවසකටම සියයට සියයක් විදුලිය සපයන්න සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම අපි සාපේක්ෂව ගුණාත්මක භාවයෙන් -හොඳ - ඉහළ විදුලිය සපයනවා. ඒ වාගේම අපේ සම්ප්‍රේෂණ පද්ධතිය, අපේ බෙදා හැරීමේ පද්ධතිය, ලෝකයේ වෙනත් රටවලට සාපේක්ෂව හොඳ තැනක තිබෙනවා. ඒ නිසා මොකුත් වෙලා නැහැයි කියලා කියන්න බැහැ. අර 76 අවුරුද්දටම මොකුත් වුණේ නැහැ; විදුලි බල පද්ධතියට මොනවාද කළේ කියලා අහන්න පුළුවන් කමක් නැහැ. මේ රටේ විදුලි බල පද්ධතියට මෙගාවොට් 6,000ක් installed capacity එක එකතු කළේ වර්තමාන ආණ්ඩුව නොවෙයි නේ. මේ ආණ්ඩුව බලයට පත් වෙන්න කලින් මෙගාවොට් 6,000ක installed capacity එකක් අපේ පද්ධතියේ තිබුණා. මුළු රටටම සියයට 100ක් විදුලිය ලබාදීම 2018දී සානාථ කරලා සහතික කළා. ඒ නිසා මේ තිබෙන පද්ධතිය හොඳට අරන් යන්න, තිබෙන පද්ධතියේ මිල අඩු කර ගන්න, වඩාත් ගුණාත්මකභාවයෙන් යුතු විදුලිය සැපයීම තහවුරු කිරීම අවශ්‍යයි. ඒ සඳහා මේ ප්‍රතිව්‍යුහගතකරණ වැඩපිළිවෙළ කළමනාකරණය කිරීමට අත් දැකීම් තිබෙන ආයතනයකට දෙන්න. මම ඔබතුමාගෙන් බැගෑපත්ව ඉල්ලනවා. මේ ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි. තනි පුද්ගලයෙක් මත පදනම් වෙලා, කුඩා කාර්යාලයක් මත පදනම් වෙලා මේක කරන්න බැහැ. ලෝකයේ ප්‍රතිව්‍යුහගතකරණය එහෙම කරලා නැහැ. එදා PwC වෙත ගියා. මම කියන්නේ නැහැ, ඔවුන්ට දෙන්න කියලා. එහෙම නම් වෙනත් මේ පිළිබඳව අත් දැකීම් තිබෙන, කළමනාකරණය පිළිබඳව අත් දැකීම් තිබෙන ආයතනයකට ඒ මුදල ගෙවලා, වියදම් කරලා කරන්න. එහෙම නැතුව ලාභෙට, බාල විධියට, හිඟන විධියට මේ ආයතන ප්‍රතිව්‍යුහගත කරන්න බැහැ. ඒකට ආයෝජනයක් තිබෙන්න ඕනෑ. Billion-dollar company එකක් restructure කරනකොට, ඒක එක්කෙනෙකුට, දෙදෙනෙකුට එකතු වෙලා තමන්ගේ හිතු මනාපයට කරන්න බැහැ. ජීවිතයේ කවදාවත් restructure එකක් කරපු නැති අයට ඒවා කරන්න බැහැ. ආශාවන් තිබෙන්න පුළුවන්, කැක්කුමක් තිබෙන්න පුළුවන්, උනන්දුවක් තිබෙන්න පුළුවන්. හැබැයි, restructuring කියන්නේ වෘත්තීමය - professional - වැඩක්. ඒ professional experience එක තිබෙන ජාත්‍යන්තර ආයතනයක් ඒ සඳහා ගෙන්වා ගන්න. ඒවාට වියදම් කරන්න. ඒ වියදම පාඩුවක් නොවෙයි. ඒ වියදම, ඒ ආයෝජනය හරහා රටට යහපතක් වනවා කියන කාරණය මම කියන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, සූර්ය බල සංග්‍රාමය හරහා මේ රටේ සූර්ය විදුලි බල පද්ධතිය ශක්තිමත් වුණු බව අපි දන්නවා. අද වනකොට මෙගාවොට් 2,000කට ආසන්න ප්‍රමාණයක් සූර්ය විදුලි බලය අපේ පද්ධතිය තුළ තිබෙනවා. 2016 සැප්තැම්බර් මාසයේ 06වැනි දා සූර්ය බල සංග්‍රාමය පටන් ගන්නකොට, අපි Net Plus, Net Metering, Net Accounting කියා ක්‍රම 3ක් ආරම්භ කළා. පසුව Net Plus Plus කියලා ක්‍රමයක් අරගෙන ආවා. ඒ ක්‍රමය දැන් ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ, Net Plus Plus කියන ක්‍රමය අයුතු විධියට භාවිත වුණා කියන තර්කය මම යම් ආකාරයකින් පිළිගන්නවා. මොකද, රටේ සෑම පුරවැසියෙකුටම සූර්ය විදුලි බලයේ ඒ හයිය ලබා ගන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. නමුත් හැකියාව තිබෙන කිහිප දෙනෙක් පද්ධතිය තුළ තිබෙන grid capacity එක තමන් වෙත ඉක්මනින් නතු කර ගත්තොත්, සාමාන්‍ය මිනිස්සුන්ට තමන්ගේ ගෘහයට, තමන්ගේ කර්මාන්තයට සූර්ය විදුලි බලය එකතු කර ගැනීමට තිබෙන අයිතිය අහිමි වනවා. අද අර්ථයෙන් ගත්තොත්, ඒක මූලික අයිතියක් වන්න ඕනෑ. ඒ මූලික අයිතිය අහිමි වනවා, මුලින් එන කෙනා grid එකේ තිබෙන සම්පූර්ණ capacity එක අත්පත් කරගෙන තිබුණොත්, ඒ ප්‍රදේශයේම. ඒ නිසා ඒ Net Plus Plus පිළිබඳ තිබෙන විවේචනයේ යම් සත්‍යතාවක් තිබෙනවා.

අනෙක් අතට, ප්‍රාග්ධනය තිබෙන බොහෝ දෙනෙකුට සූර්ය විදුලි බලය සම්පාදනය කරන්න දායක වෙන්නත් ඒක හේතු වුණා. ඒ නිසා සූර්ය බල සංග්‍රාමයට මූලික වෙච්ච, දායක වෙච්ච ඒ සියලුදෙනාටම මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පිරිනමනවා. ඒ වාගේම සූර්ය විදුලි බලය පිළිබඳ ඒ ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යෑමට මේ රජයට ධෛර්යය ලැබෙන්න කියා මා ප්‍රාර්ථනා කරනවා. හැබැයි, සූර්ය විදුලි බලය මෙගාවොට් 2,000ක් විතර එකතු වුණත්, නිවාඩු දිනයන්හි පද්ධතියට තිබෙන ඉල්ලුම අඩු වනකොට අපට ලොකු ප්‍රශ්නයක් මතු වුණා. ඒ වාගේම ආර්ථික අර්බුදයත් එක්ක විදුලි බලයට තිබුණු ඉල්ලුම අඩු වුණා. අපි බලාපොරොත්තු වුණු වර්ධනයක් මෙහි තිබුණා. පසුව ඒ වර්ධනය නැති වුණා; තවමත් නැහැ. ඒ වාගේම අපේ කර්මාන්තත් තවම නැවත ආරම්භ කර නැහැ. ආර්ථික අර්බුදය තුළ වාගේම කොරෝනා වසංගත තත්ත්වය තුළ වසා දමන ලද සුළු, මධ්‍ය සහ මහා පරිමාණ කර්මාන්තශාලා අතිවිශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවා වසා දැමීම හෝ ඒවායේ ධාරිතාව අවම කිරීම තුළ අද විදුලි බලය පිළිබඳ තිබෙන ඉල්ලුම වැඩි නොවන තත්ත්වයක් තිබෙනවා. නමුත් අනාගතයේදී එම ඉල්ලුම වැඩි වෙයි.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

දැන් මේ තත්ත්වය තුළ අපේ පද්ධතිය පාලනය කිරීම සඳහා එම පද්ධතිය smart grid එකක් බවට පත් කරන්න අවශ්‍යයි. ඒ ගැන කිසිම සැකයක් නැහැ. නමුත් smart grid එකක් බවට පත් කිරීම දක්වා යන ගමනේදී එක පැත්තකින් අපි සම්ප්‍රේෂණ පද්ධතිය දියුණු කරන්න ඕනෑ. ඒ වාගේම බෙදා හැරීමේ පද්ධතිය දියුණු කරන්න ඕනෑ. ඒ වාගේම අපි සතුටු වනවා, 2018දී අපි ආරම්භ කරපු අපේ පද්ධති පාලන මධ්‍යස්ථානය ගැන. 2015දී අපි බලයට එනකොට Kent Road එකේ ඉතාම ප්‍රාථමික මට්ටමක තමයි මේ රටේ ජාතික පද්ධතියේ පාලන මධ්‍යස්ථානය තිබුණේ. 2016දී අපේ පද්ධතිය හදිසියේ බිඳ වැටුණා. මම සතුටු වනවා, එදා ඇති වුණු කම්පනයත් එක්ක මම මූලික වෙලා අවුරුදු එකහමාරක් ඇතුළත මේ පාර්ලිමේන්තුව ආසන්නයේ තිබෙන ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානය, එවකට ලෝකයේ තිබුණු ඉහළම ප්‍රමිතියට හදලා ඉවර කරන්න අපට පුළුවන් වීම පිළිබඳව. සමහරු අපෙන් අහනවා, මොනවාද කළේ කියලා. විදුලි බලය ගැන කථා කරනකොට මගෙන් අහනවා, ඔබතුමා මොනවාද කළේ කියලා. 2015දී මේ රටේ ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානයක් තිබුණේ නැහැ. ඉතාම ප්‍රාථමික, යල් පැනගිය මධ්‍යස්ථානයක් තමයි කෙන්ට් පාරේ තිබුණේ. මේ පාර්ලිමේන්තුව ආසන්නයේ තිබෙනවා, ඕනෑම මන්ත්‍රීවරයෙකුට ගිහිල්ලා බලන්න පුළුවන්. එතැන අපි state-of-the-art මට්ටමේ පද්ධති පාලන මධ්‍යස්ථානය ආරම්භ කළා. හැබැයි ඒක තවත් දියුණු වෙන්න ඕනෑ. විශේෂයෙන්ම පුනර්ජනනීය බලශක්තිය පිළිබඳව කටයුතු කරන්න හැකි වන ආකාරයට එම මධ්‍යස්ථානය වැඩිදියුණු කරන්න ඕනෑ. මා දන්නවා, ඒ පිළිබඳව යමක් කෙරෙනවා කියලා. ඒ කටයුතු සාර්ථක වන්න කියා අපි ප්‍රාර්ථනා කරනවා.

නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, මේ grid එක දියුණු කිරීමේ කටයුත්තේදී උපාය මාර්ගය වෙන්න ඕනෑ මොකක්ද කියන එකයි. ලෝකයේ බැටරි තාක්ෂණය දියුණු වන බව ඇත්ත. නමුත් බැටරිවල මිල අඩු වන්නේ ඉතාම හෙමින්. මීට අවුරුදු 10කට කලින් අපි බලාපොරොත්තු වුණා, බැටරිවල මිල ඉතාම වේගයෙන් අඩු වෙයි කියලා. නමුත් එහෙම වුණේ නැහැ. ඉදිරියටත් එම බැටරිවල මිල අඩු වීම සිද්ධ වන්නේ ඉතාම සුළු ගණනකින්. අඩු වෙයි, අඩුවෙන්. එතකොට ලංකාවේ සූර්ය බලයෙන් නිපදවන විදුලිය වැඩි වැඩියෙන් පද්ධතියට එකතු කර ගන්න නම්, ඒ වාගේම සුළං බලයෙන් නිපදවන විදුලිය වැඩි වැඩියෙන් පද්ධතියට එකතු කර ගන්න නම්, අපි මොකක්ද කළ යුත්තේ? පුනර්ජනනීය බලශක්තියෙන් නිපදවන විදුලිය සියයට 70ක් අපේ බලශක්ති අවශ්‍යතාව වෙනුවෙන් පාවිච්චි කරනවාය කියන ඉලක්කයට යන්න නම්, අපේ පද්ධතිය තුළ බලශක්තිය ගබඩා කිරීම පිළිබඳව තිබෙන ප්‍රශ්නය විසඳා ගන්න අවශ්‍යයි, ගරු සභාපතිතුමනි. ඒ සඳහා අපට තිබෙන උපාය මාර්ග මොනවාද? අපි අතිවිශාල වශයෙන් අපේ රටේ වාරිමාර්ග, ජලාශ ආශ්‍රිත ව්‍යාපෘතිවලට ආයෝජනය කරලා තිබෙනවා. එක පැත්තකින් ජල විදුලි බලාගාර පද්ධතිය, අනෙක් පැත්තෙන් මහවැලි සංවර්ධන ව්‍යාපාරය හා සම්බන්ධ පද්ධතිය බලන්න. ඇතැම් ජලාශ වාරි කර්මාන්තය සඳහාත්, ඇතැම් ජලාශ විදුලිබලය නිපදවීම සඳහාත් අපි නිර්මාණය කරලා තිබෙනවා. විමලසුරේන්ද්‍ර මැතිතුමාගෙන් පටන් අරගෙන මෛත්‍රීපාල සිරිසේන මහතා දක්වා මේ රටේ හිටපු නායකයෝ, මේ රටේ දේශපාලනය තුළ මේ රටේ අනාගතය ගැන කල්පනා කරපු නායකයෝ මේ සම්බන්ධව කටයුතු කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ රටේ තිබෙන වටිනාම සම්පත, ජල සම්පතයි. ඒ වාගේම අපේ රටේ පිහිටීම බලන්න. ඒ කියන්නේ, රට මැද්දේ කඳුකරය. ඒ වාගේම ඒ කඳුකරය වටේට වගා කරන්න පුළුවන්, සංවර්ධනය කරන්න පුළුවන්, ජීවත් වන්න පුළුවන්, ඉතාම ලස්සන දර්ශනීය සශ්‍රීක භූමි භාගයක් තිබෙනවා. මේ වටිනා භූමිය සංවර්ධනය කරන්න, ඒ වාගේම ගුණාත්මක වශයෙන් ඉහළ ජීවිතයක් ගත කරන්න අවශ්‍ය ජලය, ඉඩම් සහ විදුලිය වෙනුවෙන් දැවැන්ත ආයෝජනයක් කර තිබෙනවා. මේ 76 අවුරුද්දත් ගත කරලා තිබෙන්නේ ඒ දේවල්වලට. මොකුත් වෙලා නැහැයි කියන අයට කියන්න තිබෙන්නේ, මේ රටේ ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය ඉඩම් ප්‍රමාණය දැනටමත් අස්වද්දලා තිබෙන්නේ, මේ රටේ ආහාර නිෂ්පාදනය කිරීමට අවශ්‍ය ජලය දැනටමත් සපයා තිබෙන්නේ කියන එකයි. අදටත් විදුලි බලයෙන් සියයට 50ක් උත්පාදනය කර ගන්නේ ජල විදුලියෙන්. ඒ වාගේම අපට තිබෙන සූර්ය විදුලි බලයත්, සුළං විදුලි බලයත් කියන මූලාශ්‍ර දෙක එකතු කරගෙන අපේ රටේ අනාගතය දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය වන අවකාශය දැන් අපට විවෘතව තිබෙනවා.

මෙතැනදී අපට pump storage කියන විසඳුමට යන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, මේ pump storage විසඳුමේදී මහ ඔය මූලික කරගත් අරණායක ප්‍රදේශයේ මෙගාවොට් 600ක pump storage ව්‍යාපෘතියට තමයි ප්‍රමුඛත්වය දීලා තිබෙන්නේ. මේ ගැන ස්වාධීනව කථා කරන, විදුලිබල මණ්ඩලයෙන් එළියේ ඉන්න, අපේ රට ගැන දන්නා දේශීය සහ ජාත්‍යන්තර විශේෂඥයන්ගේ අදහස තමයි, මහ ඔය ආශ්‍රයෙන් අරණායක ඉදිවන pump storage ව්‍යාපෘතිය ඉතා මිල අධිකයි කියන එක. ඔබතුමාත් හොඳටම දන්නවා, ඔය ප්‍රදේශය අපි අලුතින්ම සංවර්ධනය කරන්න ඕනෑය කියලා. ඒ ප්‍රදේශයේ දැවැන්ත ජලාශ දෙකක් ඉදිකිරීමට නියමිතයි. එහෙම ජලාශ අලුතින් ඉදි කරනකොට පරිසරයට හානි වනවා, අලුතින්ම සම්ප්‍රේෂණ පද්ධති ගොඩ නඟන්න සිද්ධ වනවා. එහිදී දැවැන්ත අර්බුදයක් මතු වනවා. ඒක කරන්නම ඕනෑ නම් අපි කරමු. හැබැයි, ඒ සඳහා අධික මුදලක් වැය වනවා. එහිදී රුපියල්වලින්, ඩොලර්වලින් ගෙවන්න ඕනෑ මිලක් තිබෙනවා. ඩොලර්වලින් ගත්තොත්, ඩොලර් බිලියනයකට වඩා වැඩි මුදලක්. අනෙක් අතට, ඒ වෙනුවෙන් පරිසරය පැත්තෙන් ගෙවන්න තිබෙන මිලත් අධිකයි. හැබැයි, මේ රටේ pump storage එකකට කරන්න පුළුවන් දේ මෙයයි.

මේ සම්බන්ධව සාමාන්‍ය අවබෝධයක් නැති අයටත්, රටේ පුරවැසියන්ටත්, ඔබටත් මම කියනවා, pump storage එකක් හරහා අපට එක පැත්තකින් සූර්ය විදුලි බලය ගබඩා කර ගන්නත්, ඒ වාගේම සුළං විදුලි බලය ගබඩා කර ගන්නත් පුළුවන් බව. ඒ විතරක් නොවෙයි. රාත්‍රියේ සහ පාන්දර කාලයේ ගල් අඟුරුවලින් උත්පාදනය කරන, භාවිතයට නොගෙන අපතේ යන විදුලිය මඟින් මේ pump storage එක ක්‍රියාත්මක කරන්නට පුළුවන්. සාමාන්‍යයෙන් එක බැටරියක් විතරයි එහිදී ක්‍රියා කරන්නේ. ඒ කියන්නේ දහවල් කාලයේ අපට පුළුවන්, වතුර ඉහළට අරන් යන්න. ඒ හරහා රාත්‍රි කාලයේ, peak එක වෙලාවට අපට විදුලිය උත්පාදනය කරගන්න පුළුවන්. ඒ වාගේම විදුලි බල පරිභෝජනය අවම පාන්දර කාලයේ ගල් අඟුරුවලින් නිපදවන විදුලි බලයෙන් අපට වතුර ඉහළට අරගෙන යන්න පුළුවන්. ඒ හරහා නැවත වරක් රාත්‍රියේ peak එකේදී අපට විදුලිය උත්පාදනය කර ගන්න පුළුවන්. මෙකයි ඒකේ මූලධර්මය. හැමෝම ඒක දන්නවා. එතකොට මොකක්ද මෙතැන තිබෙන ප්‍රශ්නය. මෙතැන තෝරා ගැනීම ගැන ගැටලුවක් තිබෙනවා.

2009දී JICA එක කරපු ශක්‍යතා අධ්‍යයනයකදී තේරුම් ගත්තා, වික්ටෝරියා ජලාශය පුළුල් කිරීම හරහා ආකාර 3කින් විදුලි උත්පාදනය වැඩි කරගන්න පුළුවන් කියලා. ඒකේ තුන්වෙනි විසඳුම මෙයයි. ඒ පද්ධතිය තුළ, වික්ටෝරියා සහ රන්දෙනිගල ජලාශ අතර මීටර් 190ක විතර head එකක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, වික්ටෝරියා සහ රන්දෙනිගල ජලාශ ආශ්‍රිතව pump storage ව්‍යාපෘතියකට අපට යන්න පුළුවන් නම් ඒක තමයි ලාභම. මොකද, transmission grid එක තිබෙනවා. පරිසරය

පිළිබඳ ප්‍රශ්න එන්නේම නැහැ. ඒ වාගේම කැලය කපන්නේ නැතිව, ගොඩබිම නාස්ති කර ගන්නේ නැතිව floating solar විධියට සූර්ය විදුලි බලය උත්පාදනය කර ගන්න පුළුවන් විශාල ඉඩකඩක් අද තිබෙනවා. අද floating solar මිල ඉතාම අඩු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, pump storage රටට ඕනෑය කියන එකට ඔබතුමාත් එකඟ වෙයි. ඔබතුමාත් ඒ පිළිබඳව හොඳට දන්න කෙනෙක්.

කරුණාකරලා pump storage ව්‍යාපෘතියේදී වික්ටෝරියා-රන්දෙනිගල කියන විසඳුමට ප්‍රමුඛතාව දෙන්න. ඔබතුමා සතුව නැති වුණත් 2009 වසරේ JICA එකෙන් කළ ශක්‍යතා අධ්‍යයනයේ වාර්තාව මා සතුව තිබෙනවා. එහි විසඳුම් තුනක් යෝජනා කරලා තිබෙනවා. අපි ඒ සඳහා දැන් යොමු වීම වැදගත්. මොකද, 2009දී solar විසඳුම තිබුණේ නැහැ. 2009දී solar විසඳුම නොතිබුණු නිසා එවකට එය සලකා නොබැලීම මට තේරුම් ගන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි. මම පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ වගකීම දරපු 2018දී නැවත වරක් මේ පිළිබඳව සලකා බැලුවා. එහිදීත් JICA එක තමයි අපට උදවු කළේ. 2018දී වික්ටෝරියා - වැව තැන්න කියන විසඳුමට ගියා. වික්ටෝරිය - වැව තැන්න කියන්නේ, ඉහළ ජලාශය වික්ටෝරියා, පහළ ජලාශය වැව තැන්න. ඒකත් වියදම අඩුයි. ඒ වාගේම grid එක ළඟ තිබෙනවා. ඒ හරහා මෙගාවොට් 350ක බලාගාර 4ක් සඳහා අවකාශ තිබෙනවා. අපේ රටේ pump storage අවශ්‍යතාව වික්ටෝරියා ජලාශය පදනම් කරගෙන විසඳා ගැනීමට හැකියාව තිබෙනවා. මම වික්ටෝරියා ජලාශය පදනම් කර ගත්ත විසඳුම ගැන කථා කරන්නේ, පරිසර දූෂණය අවම වන නිසා, කැලෑ කැපීම අවම වන නිසා, පවතින transmission grid එක එලෙසම පාවිච්චි කරන්න පුළුවන් නිසා විතරක් නොවෙයි, ඩොලර් බිලියන ගණනක් අපට ඉතුරු කර ගන්න පුළුවන්කම ලැබෙන නිසායි. මොකද, සමහරු කැමැතියි වියදම් අධික වැඩ කරන්න. ඒවාට කැමැත්තෙන් ඉන්න පිරිසක් ඉන්නවා. නමුත්, අපට පුළුවන්කමක් නැහැ, කරුණු දැන-දැනම එහෙම කරන්න. එම නිසා 2009දී JICA අධ්‍යයනයේ වික්ටෝරියා - රන්දෙනිගල විසඳුම, ඒ වාගේම 2018 අධ්‍යයනයේ වික්ටෝරියා - වැව තැන්න විසඳුම ගැන ප්‍රමුඛතාව දෙන්න. ඒ පිළිබඳව අපි සාකච්ඡා කරමු. ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන්න අපි සූදානම්. ඒ හරහා අපේ පද්ධතියේ ස්ථායීතාව ඇති කර ගන්න පුළුවන්.

මොකක්ද අද වනකොට වෙලා තිබෙන්නේ? සූර්ය විදුලි බලය සඳහා ගිය ආයෝජකයන් අද වනකොට ලොකු අමාරුවක වැටිලා තිබෙනවා. මොකද, අද ඇති වෙලා තිබෙන අධික සැපයුම සහ ඉල්ලුම පහළ යෑමත් එක්ක විශේෂයෙන්ම සති අන්තයන්හි සමහර දවස්වල, සතියේ දවස්වල පවා දවල් විදුලිය ලබා ගැනීම curtail කරලා තිබෙනවා. ඒ නිසා ආයෝජකයන් අධෛර්යවත් වෙලා තිබෙනවා. මොකද, අවසානයේ ලංකා විදුලිබල මණ්ඩලය සහ ආයෝජකයන් අතර ඇති කර ගන්න ගිවිසුම බැංකුවලට පිළිගන්න බැරි තත්ත්වයක් ඇති වුණොත්, bankable නොවුණොත් ඒකේ ගැටලුවක් මතු වනවා. එම නිසා මම කියා සිටින්නේ අපි මේ pump storage විසඳුමට යමු කියන එකයි. ඒ වාගේම බැටරිත් අපට විසඳුමක් තමයි. විශේෂයෙන්ම මධ්‍යම පන්තියේ තිබෙන ශක්තිය පාවිච්චි කරලා අපි දෙයාකාරයකින් මේ ප්‍රශ්නයට විසඳුම් හොයමු කියන යෝජනාව මම කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, සපුගස්කන්ද තෙල් පිරිපහදුව පිළිබඳ ප්‍රශ්නය ඉතා වැදගත්. 1969දී සපුගස්කන්ද තෙල් පිරිපහදුව ආරම්භ කළා. අද වනකොට එම තෙල් පිරිපහදුව බොහොම නරක තත්ත්වයක තිබෙන්නේ. අවුරුදු 50ක් විතර ගත වනකොට ලෝකයේ කිසිම දෙයක් එලෙසම තිබෙන්නේ නැහැ. හොඳම දෙයක් වුණත් අපි අලුතින් හදා ගන්න ඕනෑ. එක්කෝ එය වැඩිදියුණු කරන්න ඕනෑ නැත්නම් අලුතින් බලාගාරයක් හදන්න ඕනෑ. අපි අසාර්ථක වෙලා තිබෙනවා, සපුගස්කන්ද තෙල් පිරිපහදුව පිළිබඳ ප්‍රශ්නය විසඳා ගන්න. දැන් මේකත් එක්ක පරස්පරතාවක් ඇති වෙලා තිබෙනවා, Sinopec එක. දැන් Sinopec එක මඟින් ලැබෙන ඩොලර් බිලියන 3.7ක ආයෝජනය මේ අවුරුද්දේ ආයෝජනයක් හැටියට දාලා ආඩම්බරයෙන් ගණන් හදනවා. හැබැයි, Sinopec එකත් සමඟ අත්සන් කළ ගිවිසුමේ මූලිකව තිබෙන්නේ, සියයට 20ක් දේශීය පරිභෝජනය සහ සියයට 80ක් අපනයනය කියන එකඟතාව කියලා අපි දන්නවා. Sinopec එක දිගින් දිගටම කියනවා, අපට වැඩි පංගුවක් ඕනෑ කියලා. හැබැයි, ඒ වැඩි පංගුව දුන්නොත් රට තුළ අස්ථාවරභාවයක් ඇති වෙන්න පුළුවන්, මේ තෙල් සැපයුම පිළිබඳ කාරණයේදී. ඒක Ceylon Petroleum Corporation එකේ පැවැත්ම පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. ඒක පොදුවේ රටේ බලශක්ති සුරක්ෂිතතාව පිළිබඳ ප්‍රශ්නයක් බවට පත් වනවා. ඒ ගිවිසුමට මම එකඟයි. එතැනදී Sinopec එක සමඟ තිබෙන මේ ගිවිසුම ඉදිරියට ගෙන යන්නේ කොහොමද කියන කාරණය ඉතා වැදගත් වනවා. Sinopec එක සමඟ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඔවුන්ගේ ව්‍යාපෘතියට අවශ්‍ය ජලය නැති ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම ඔවුන් සමඟ එකඟ වෙලා තිබෙන ඉඩම් පිළිබඳ ප්‍රශ්නය විසඳලා නැහැ. ඒ නිසා අපි Sinopec එකත් සමඟ අත්සන් කළ ගිවිසුම පවත්වාගෙන යා යුතුයි. මොකද, එම ව්‍යාපෘතිය රටට වැදගත්. හැබැයි, රටට හිතකර විධියට, රටට අවාසියක් නොවන ආකාරයට, රටේ බලශක්ති සුරක්ෂිතතාව තහවුරු වන ආකාරයට එම ගිවිසුම ඉදිරියට පවත්වාගෙන යා යුතු වනවා කියන කාරණයත් මම කියන්න කැමැතියි.

සපුගස්කන්ද තෙල් පිරිපහදුව සම්බන්ධයෙන් පවතින ප්‍රශ්නයේදී, ඊට විකල්පව එක්කෝ අලුත් පිරිපහදුවක් ඉදිකිරීම එහෙම නැත්නම් එම පිරිපහදුව දැවැන්ත ප්‍රතිසංස්කරණයකට ලක් කිරීම හරහා අපේ බලශක්ති සුරක්ෂිතතාව ඇති කර ගත යුතුයි.

ගරු සභාපතිතුමනි, අපි දන්නවා සභාවා ගෙන ඉන්න ඉන්දු - ශ්‍රී ලංකා ගිවිසුම් ගැන. එම ගිවිසුම් ඔබතුමා ඉදිරිපත් කළේත් නැහැ, ආණ්ඩුව ඉදිරිපත් කළේත් නැහැ. නමුත්, අපි ළඟ එම ගිවිසුම් තිබෙනවා. ඔබතුමන්ලා සභාවාගෙන හිටියාට ඒ පිළිබඳව සඟවන්න ඉන්දියාවට වුවමනාවක් නැහැ. නමුත්, තිබෙන ප්‍රශ්නය මෙයයි. ත්‍රිකුණාමලයේ energy hub එකක් කරනවා කිව්වාට ඇමතිතුමා අපි මොනවාද කළේ? එක හිතින් ඒක කරන්න ඕනෑ. ඉන්දියාව අපේ මිත්‍රයා, ඉන්දියාව අපේ වැඩිහිටියා. ඉන්දියාව නැතුව මේ රටට අනාගත ආර්ථික පැවැත්මක් නැහැ. ඒ නිසා win-win විධියට, දෙරටටම ජය ලැබෙන ආකාරයට ත්‍රිකුණාමලය සහ ඒ අවට මේ energy hub එක සංවර්ධනය කරන්න ඕනෑ. ඒ වාගේම ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර තිබෙන මේ සබඳතාව - connectivity එක - අපට අවශ්‍යයි. ඒක energy වෙන්න පුළුවන්, digital වෙන්න පුළුවන්, physical වෙන්න පුළුවන්. ඒ නිසා රහසේ සභාවාගෙන ඉඳලා, ලජ්ජාවෙන් වාගේ වැඩ කරලා මේ රටට ඉස්සරහට යන්න බැහැ. එම නිසා ඉන්දියාවෙන් ලබා ගන්නා ආයෝජන කොහොමද, ඉන්දියාවට අමතරව UAE වෙන්න පුළුවන්, වෙන රටක් වෙන්න පුළුවන්, අපි කොහොමද ඒ ආයෝජන තුළින් ඉස්සරහට යන්නේ? මම ඉතාම ගෞරවයෙන් කියා සිටින්නේ මේ කාරණා පිළිබඳව සොයා බලා කරුණාකරලා ත්‍රිකුණාමලය සංවර්ධනය ආරම්භ කරමු කියන එකයි. මොකද, ජනතා විමුක්ති පෙරමුණ - JVP එක - ඉන්දියානු විරෝධය පිළිබඳ පන්ති පැවැත්වුවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, ගරු සභාපතිතුමනි. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මට තව විනාඩි 10ක් දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඔබතුමාට විනාඩි 5ක් දෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හොඳයි.

ජනතා විමුක්ති පෙරමුණ ඉන්දීය විරෝධය පිළිබඳ පන්ති පවත්වපු කණ්ඩායමක්. ඇමතිතුමන්ලාගේ පරම්පරාවේ JVPකාරයෝ ඒ පන්තිවලට සහභාගි වෙලා තිබෙනවා. ඉන්දියානු විරෝධය හිතේ තියාගෙන මේක කරන්න බැහැ. අද ඉන්දියාව වෙනස් වෙලා. ඉන්දියාවේ ව්‍යාපාර කරන්නේ ව්‍යාපාරිකයෝ, ආණ්ඩුව නොවෙයි. ආණ්ඩුව ව්‍යාපාරවලින් පල්ලෙහාට යනවා. ඉන්දියාවේ පෞද්ගලික අංශය දියුණු වෙලා. අද ලෝකයේ පෞද්ගලික අංශයේ විශාලතම ව්‍යවසායකයින් ඉන්දියාවේ ඉන්නවා. අපිට ඉස්සර ප්‍රශ්නයක් තිබුණා, ඉන්දියානු ව්‍යාපෘති, ඉන්දියානු වාහන ගුණාත්මක නැහැ, ඉන්දියාවේ ඇම්බියුලන්ස් එක ගුණාත්මක නැහැ කියලා. අන්තිමට අද අපට ඒවායෙන් හොඳ සේවයක් ලබා දීලා තිබෙනවා. අද වනකොට ලෝකයේ හොඳ තාක්ෂණය ඉන්දියාවේත් තිබෙනවා. ඒ නිසා ඉන්දියාවත් එක්ක ගනුදෙනු කිරීම ගැන භය වෙන්න එපා. හැබැයි, අපි ඉන්දියාවත් එක්ක සමානව, කරට කර සාකච්ඡා කරලා ඉන්දියාවේ තිබෙන අවස්ථා උකහා ගන්න කටයුතු කරන්න ඕනෑ. Win-win කියන තත්ත්වයට අපි යන්න ඕනෑ කියන කාරණය මම කියන්න කැමැතියි.

2025 අය වැයේදී බලශක්ති අංශය ගැන කියනකොට කිව්වා, ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි 99ක් තිබෙනවා, ඒකෙන් IOC එකටයි, Ceylon Petroleum Corporation එකටයි වෙන් කරලා තිබෙන ඒවාට අමතරව තෙල් ටැංකි 66ක් තිබෙනවා කියලා. ගරු සභාපතිතුමනි, පසුගිය අවුරුද්දේ මේ තෙල් ටැංකි 66 ගැන මොනම දෙයක්වත් වුණේ නැහැ. යනවා, බලනවා, පින්තූර දානවා, කථා පවත්වනවා; මොකුත් වුණේ නැහැ. ත්‍රිකුණාමලයේ ඉතුරු වෙලා තිබෙන මේ තෙල් ටැංකි 66 පිළිබඳව තිබෙන ඒ අයිතිය, ඒ අවස්ථාව අපි පාවිච්චි කරන්න ඕනෑ. ඒ වාගේම ඉන්දියානු ආයෝජකයින් මේකට එන්නේ නැත්නම් අපි ඒ අයගේ එකඟතාවෙන් වෙනත් ආයෝජකයින් එක්ක වැඩ කරන්න ඕනෑ, හවුල් ව්‍යාපාරවලට යන්න ඕනෑ. මොකද, ත්‍රිකුණාමලය වරාය සංවර්ධනය නොවීම ඉතාම බරපතළ ප්‍රශ්නයක්. කොළඹ වරාය සංවර්ධනය වෙනවා ඉහළින්ම. ඒ වාගේම හම්බන්තොට වරාය සංවර්ධනය වෙනවා. නමුත්, ත්‍රිකුණාමලය වරාය අපි පොඩි කාලයේ - පාසල් ගිය කාලයේ - තිබුණු මට්ටමෙන් තවමත් තිබෙන්නේ. මේක ප්‍රශ්නයක්. නමුත් ඒක ඉන්දියාවත් එක්ක තිබෙන ප්‍රශ්නයක් හැටියට දකින්න නරකයි.

ගරු සභාපතිතුමනි, ටෙන්ඩර් දැන්වීම් පිළිබඳ කාරණය ගැන බලමු. ගරු ජනාධිපතිතුමාගේ 2025 අය වැය කථාවයි, 2026 අය වැය කථාවයි දෙකම එක විධියයි. අදානි සමාගම සමඟ තිබුණු ඇමෙරිකානු ඩොලර් ශත 8.26 ඉවත් කර ගැනීම ගැන එතුමාට තවමත් සන්තෝෂයි; මටත් සන්තෝෂයි. මම තමයි පළමුවෙනියා අදානි සමාගමට විරුද්ධව කථා කළ. අදානි සමාගමට විරුද්ධව කථා කළේ අදානි සමාගමේ මිල ගැන. ඒ කියන්නේ, unsolicited හෝ G-to-G වශයෙන් සලකලා, රජයන් - රජයන් වශයෙන් සලකලා, තරගකාරි ටෙන්ඩර් නැතුව අදානි සමාගමට දීපු එකට විරුද්ධයි. හැබැයි, අපි ඉන්දියාවටවත්, අදානිටවත් විරුද්ධ නැහැ. නමුත්, අදානි සමාගම තද ස්ථාවරයක ඉඳලා මේ ක්ෂේත්‍රයෙන් යන්න ගියා. හැබැයි, අද වෙනකොට ටෙන්ඩර් හරහා අපට ඇමෙරිකානු ඩොලර් ශත 3.77ට ලබා ගන්න පුළුවන් වෙලා තිබෙනවා. ඔව්, ඒක ජයග්‍රහණයක්. ඒ ජයග්‍රහණය කොච්චරද කිව්වොත් green hydrogen දක්වා යන්න පුළුවන් විධියේ මිලක් අපට ලැබිලා තිබෙනවා.

මම ඒ ගැන සතුටු වන කාරණයක් තිබෙනවා. ඒ තමයි, 2016දී යාපනයේ මෙගාවොට් 20ක පළමු සුළං විදුලි බලාගාරයට ටෙන්ඩර් දැම්මේ මම. ඒ වෙලාවේ මට මරණීය තර්ජනත් එල්ල වුණා. මාව නියෝජ්‍ය ඇමතිකමෙන් අයින් කරන්නත් තර්ජනය කළා. ඒ තරම් ඒ ආයෝජකයෝ බලවත් වෙලා තිබුණා. හැබැයි, පළමු ටෙන්ඩරය දැම්මා. එදා -2016- ඒ ටෙන්ඩරයෙන් අපට පුළුවන් වුණා, රුපියල් 12.29කට විදුලි ඒකකයක් ගන්න. ඒ වාගේම, ආපසු සැරයක් ඔබතුමන්ලාට ලොකු දුෂ්කරතාවක් තිබෙනවා, මන්නාරමේ සංවර්ධනයට. මන්නාරමේ මෙගාවොට් 100ක බලාගාරය හදනකොට අද වාගේම උද්ඝෝෂණ ආවා; ආණ්ඩුව ඇතුළෙන් උද්ඝෝෂණ ආවා. එවකට හිටපු විදුලිබල ඇමතිතුමාට මෙම බලාගාරය ඉදිකිරීම වෙනුවෙන් ඉදිකිරීමේ ටෙන්ඩරය අනුමත කිරීම සඳහා වන රැස්වීමට සහභාගි නොවන ලෙස බලපෑම් ආවා. එතුමා විදේශගත වුණා. මම වැඩබලන ඇමතිවරයා වශයෙන් Cabinet එකට ගිය නිසා ඒ ඉදිකිරීමේ ටෙන්ඩරය අනුමත කරගන්න එදා මට පුළුවන්කම ලැබුණා, ගරු සභාපතිතුමනි. එහි ප්‍රතිඵලයක් හැටියට ලෝකයේ තිබෙන හොඳම බලාගාරයක් ඉහළම ප්‍රමිතියෙන් යුතුව ඉදිකරලා, ආසියානු සංවර්ධන බැංකුවෙන් දීපු මුදල් ඉතුරු කරගෙන, ඒ ඉතුරු වෙච්ච මුදලින් මන්නාරමේ තවත් බලාගාරයක් හදන්න අපට පුළුවන්කම ලැබුණා.

ඒ නිසා අපි ආඩම්බරයෙන් කියනවා, අපේ ධුර කාලය තුළ දූෂණය බින්දුවයි - zero corruption - කියන එක. ඕනෑ කෙනෙකුට අපි අභියෝග කරනවා, ඒ ගැන එක වචනයක්වත් කියන්න පුළුවන්ද බලන්න කියලා. අපි විදුලිබලය පිළිබඳ වගකීම දරපු කාලයේ දූෂණයට තිබෙන අවස්ථාව නැති කළා. කිසිවෙකුට දූෂණයට ඉඩ දුන්නේ නැහැ. ඒ වාගේම දූෂණය අනාගතයේ සිදු නොවෙන්නත් අවශ්‍ය කරන යහපත් ක්‍රියාමාර්ග ආරම්භ කළා, විශේෂයෙන්ම පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ. ගරු සභාපතිතුමනි, අපි ඒක ආඩම්බරයෙන් කියන්නේ.

මේ රජය යටතේ අනාගතයේදී සිදුවන බලශක්ති නිෂ්පාදනය පිළිබඳ ඕනෑම ව්‍යාපෘතියක් තරගකාරි ටෙන්ඩර් ක්‍රියාදාමය තුළ සිදුවිය යුතුමයි. Unsolicited යෝජනා කිසිවක් පිළිගන්න එපා. අපේ රටේ බලශක්ති ක්ෂේත්‍රය තුළ අවශ්‍ය කරන ඒ ජයග්‍රහණ ලබා ගැනීමට රට දියුණු කිරීම අත්‍යවශ්‍යයි. මොකද, කර්මාන්ත දියුණුව සඳහා බලශක්තියේ මිල අඩු වෙන්න ඕනෑ, බලශක්තියේ සුරක්ෂිතතාව තිබෙන්න ඕනෑ. රටේ කර්මාන්ත දියුණුව සහ රැකියා ඇති කිරීම සඳහා ඕනෑ කරන ඒ ලොකු පිම්ම පනින්න අවශ්‍ය කරන ශක්තිය, ධෛර්යය දෙන්න විපක්ෂය හැටියට අපි සූදානම්. මොකද, මේක තාක්ෂණික ප්‍රශ්නයක්. මේක අනාගතය පිළිබඳ ප්‍රශ්නයක්, ගරු සභාපතිතුමනි. ඒ නිසා අපි මොන වාද විවාද කර ගත්තත්, බලශක්තිය පිළිබඳ කාරණයේදී රජය සමඟ සහයෝගයෙන් ක්‍රියා කරන්න කැමැතියි. හැබැයි, වැරදි දෙයක් සිද්ධ වෙනවා නම් තදින් ඒ වරද පෙන්වා දෙන්නත් අපි සූදානම්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Kumara Jayakody. You have 15 minutes.

[පූ.භා. 10.26]

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු සභාපතිතුමනි, මුලින්ම අපේ විපක්ෂය නියෝජනය කරන අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා, අපේ සමහර කාර්යයන් ගැන එතුමාට අවබෝධයක් තිබීම ගැන. ඒ වාගේම අපි මේක දේශපාලනිකව ගන්නවාට වඩා තාක්ෂණයත් එක්ක ගත්තාම, එතුමන්ලා ඒ දවස්වල හීන දැකපු, කරගන්න බැරි වෙච්ච ගොඩක් දේවල් දැන් අප ආරම්භ කර තිබෙනවා; ඒ වාගේම එම කටයුතු කරගෙන යනවා; ඉස්සරහට කරන්න හදනවා. මේක ඇත්තටම දේශපාලන කාරණාවකට වැඩිය රටේ බලශක්ති ක්ෂේත්‍රය දියුණු කිරීම පිළිබඳ කාරණාවක්. මම හිතනවා එතුමාට බොහොම සමීපව බලාගෙන ඉන්න පුළුවන් අපි මොකක්ද කරන්නේ, අපි කොතැනටද යන්නේ කියන එක. මම ඒ කාරණාව මතක් කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, 2026 වසර සඳහා වූ අප රජයේ අය වැයට අදාළව බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ඉදිරිපත් කරමින් මෙම උත්තරීතර සභාව ඇමතීමට අවස්ථාව ලබා දීම ගැන මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම සමාගම් 12කට කඩලා විකිණීමට නියමිතව තිබූ ලංකා විදුලිබල මණ්ඩලය, කැබිනට් මණ්ඩලයෙන් අනුමැතිය අරගෙන සේවකයන් 12,000ක් ගෙදර යවන්න නියමිතව තිබූ ලංකා විදුලිබල මණ්ඩලය රටේ අනාගත පරම්පරාව වෙනුවෙන් ආරක්ෂා කර ගැනීමේ කටයුත්ත අපි අගෝස්තු මාසයේ ලංකා විදුලිබල මණ්ඩල පනත සංශෝධනය කිරීමෙන් ආරම්භ කළා. ඇත්තටම මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ සේවකයන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම වෙනුවෙන් බලශක්ති අමාත්‍යවරයා ලෙස මා උපරිම මැදිහත්වීමක් කළා. මා හිතනවා ඒ ගැන හැමෝටම අවබෝධයක් ඇති කියලා. සේවක සංගම් සමඟ පැවැති ඉතා සාර්ථක සාකච්ඡා වට කිහිපයකින් අනතුරුව අද වන විට සේවකයන් අතිබහුතරයක් නියෝජනය කරන සේවක සංගම් -ලංකා විදුලිබල මණ්ඩලයේ සේවක සංගම් 42ක් තිබෙනවා. ප්‍රධාන සේවක සංගම් 25ක් තිබෙනවා- සමඟ අන්‍යෝන්‍ය එකඟතාවකින් පසුව ප්‍රතිසංස්කරණවල අවසන් වටයට අප අවතීර්ණ වී තිබෙනවා.

ශ්‍රී ලංකා විදුලිබල ක්ෂේත්‍රයේ මීළඟ පිම්ම ගැනීමට නවීන මානව සම්පත් කළමනාකරණ සැලසුම්, ආයතනික උපාය මාර්ග සහ සාධාරණ අයක්‍රම ප්‍රතිපත්තියක් ඇතුළත් ජාතික විදුලිබල ප්‍රතිපත්තිය මේ වන විට සූදානම් කර ඇති අතර, ඒවා ඉතා ඉක්මනින් මහජන අදහස්වලට යොමු කරනු ලබනවා. දැන් ඒවා legal consultationවලට අපි යොමු කරලා, ඊට පස්සේ public consultationවලට යොමු කරන්න අවශ්‍ය වටපිටාව හදාගෙන යනවා. එහිදී ලැබෙන ප්‍රතිචාර සලකා බලා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට අප කටයුතු කරනවා. එළැඹෙන ජනවාරි මාසයේ අග වන විට ලංකා විදුලිබල ක්ෂේත්‍රය රජයේ පූර්ණ හිමිකාරීත්වය ඇති ජනන සමාගමක්, රජයේ පූර්ණ හිමිකාරීත්වය ඇති සම්ප්‍රේෂණ සමාගමක්, රජයේ පූර්ණ හිමිකාරීත්වය ඇති බෙදා හැරීමේ සමාගමක්, රජයේ පූර්ණ හිමිකාරීත්වය ඇති පද්ධති පරිපාලකයෙක් ලෙස ප්‍රධාන වශයෙන් සමාගම් හතරකින් මෙහෙයවීමට නියමිතයි. මේ සංකීර්ණ වූත්, සංවේදී වූත් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලයේ සහ රජයේ නිලධාරි මහත්ම මහත්මීන් මෙන්ම ස්වේච්ඡාවෙන් අපි සමඟ සම්බන්ධ වී සිටින ප්‍රතිපත්ති කමිටු සාමාජිකයින්, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, දේශීය විදේශීය උපදේශකයන්, විදේශගතව සිටින ශ්‍රී ලාංකීය විද්වතුන්, උගතුන් බොහෝ දෙනෙක් අපිට ස්වේච්ඡාවෙන්ම උදව් උපකාර කරනවා. ඒ අය දිවා රෑ නොබලා වෙහෙසෙමින් තවදුරටත් කටයුතු කරනවා. ඒ සියලු දෙනාට රජයේ කෘතඥතාව ප්‍රකාශ කිරීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම මම ලංකා විදුලිබල මණ්ඩලයේ වෘත්තීය සමිතිවලට විශේෂ ස්තුතියක් කරනවා. අවසාන මොහොතේ හෝ අපි මේ කරන කාර්යයේ සද්භාවය, -මොකටද අපි මෙය කරන්නේ, කවුරු වෙනුවෙන්ද මෙය කරන්නේ, කොයි පැත්තටද අපි මේක ඇදගෙන යන්නේ කියලා- තේරුම් අරගෙන, තමන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ග අනවශ්‍ය විධියට මතු කිරීම නවත්වලා අපි එක්ක එකඟතාවෙන්, අපි එක්ක සහයෝගයෙන් කටයුතු කරනවා. පක්ෂ, විපක්ෂ කියලා නැහැ, මම හැමෝම එක්ක එක විධියට ගනුදෙනු කරනවා. ඒ හැමෝම එක්කම අපි ඉස්සරහට යනවා. ඒ දෙන සහයෝගයටත් මම ස්තුතිවන්ත වෙනවා.

අප විසින් ගෙන යන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට විරුද්ධව ඇත්තටම කඳවුරු දෙකක් ඉන්නවා. ඒ අතර බොහෝ දෙනා මේ වනවිට අප සමඟ එකඟතාවට පැමිණ ඇතත්, එම විරෝධතාවලට පිළිතුරක් දීමටත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා. එක පිරිසක් අහනවා, ලංකා විදුලිබල මණ්ඩලය සතු වත්කම් විකුණන්නේ නැතුව ක්ෂේත්‍රයට අවශ්‍ය ආයෝජන ගෙනෙන්නේ කොහොමද කියලා. තව පිරිසක් අහනවා, තනි ආයතනයකින් විදුලිය නිෂ්පාදනය කර බෙදා හරිනවාට වඩා ආයතන හයකින් ඒ කාර්යය කළාම, විදුලි බිල අඩු වෙන්නේ කොහොමද කියලා. මම ඒ කඳවුරු දෙකටම එකවර පිළිතුරු දෙන්නම්. ආයතන හයකින් විදුලිබල මණ්ඩලයේ කාර්යයන් කරන විට අනිවාර්යයෙන්ම පඩිනඩි සහ මෙහෙයුම් ඇතුළු ආයතනික වියදම් තාවකාලිකව ඉහළ යාමට ඉඩ තිබෙනවා. නමුත් එම වැඩිවීම විදුලි බිලට දැනෙන්නේ සියයට එකකටත් අඩුවෙන්. ඒ මොකද, අපේ විදුලිය බිලෙන් ආයතනික වියදම්, සම්ප්‍රේෂණ වියදම්, බෙදා හැරීමේ වියදම්, පද්ධති පරිපාලනයට අදාළ වියදම්වලට යන්නේ සියයට 20කට අඩු ප්‍රමාණයක්. හැබැයි, විදුලි බිලෙන් සියයට 80කට වැඩි ප්‍රමාණයක් වෙන් වෙන්නේ විදුලිය ජනනය සඳහා. අපි හැමදාම කියන්නේ ජනන වියදම ක්‍රමයෙන් අඩු කරගත යුතුයි කියන එකයි.

පසුගිය දශක ගණනාව පුරා විදුලිබල මණ්ඩලය තුළ ඇතැම් ක්‍රියාදාමයන් සිදු වුණේ, සේවක මහත්ම මහත්මීන් අතර, ආයතනයේ උන්නතිය උදෙසා සද්භාවයෙන් සකස් කර ගත් එතරම් නොනිල එකඟතා සහ ක්‍රියාමාර්ග, එහෙම නැත්නම් synergies මත. ජනන වියදම අඩු කර ගැනීමට අදාළ රෝග විනිශ්චය කර ගැනීමට අවශ්‍ය විනිවිදභාවය මේ තත්ත්වය යටතේ වැසී යනවා. ආරම්භයේදී ආයතනික වියදම් සුළු වශයෙන් වැඩි වෙන්නට ඉඩකඩ තිබුණත්, මේ ප්‍රතිසංස්කරණ මඟින් ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයේ ඇති ඇත්ත රෝගය හොයාගෙන බෙහෙත් කරන්න පහසු වෙනවා. අනෙක් කාරණය තමයි, ආයෝජන කුමන ආකාරයෙන් විදුලිබල ක්ෂේත්‍රයට ආවත් ඒ ආයෝජනවල ප්‍රතිලාභ ලබාගන්නට වෙන්නේ මිලියන 22ක් වන අපේ රටේ ජනතාවට. ඒ නිසා ජනතා දේපළ විකුණා ආයෝජන කැඳවා ගන්නවා වෙනුවට විදුලිබල ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම සහ පද්ධති පරිපාලනයට අවශ්‍ය ආයෝජන පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධව -public-private partnership ආකාරයට - ගෙන්වා ගැනීමට අපි විවෘතව වී සිටිනවා. මේ සිදු කරන ජනතාවාදී ප්‍රතිසංස්කරණ හරහා එවැනි ආයෝජනවලට අපේ විදුලි ක්ෂේත්‍රය විවෘත වෙනවා. විනිවිදභාවය වැඩි වෙනවා. තරගකාරීත්වය වැඩි වෙනවා. එමඟින් ක්‍රම ක්‍රමයෙන් පාරිභෝගිකයාට ගෙවන්නට සිදුවන මිල අඩු වෙනවා.

[ගරු කුමාර ජයකොඩි මහතා]

අපේ විරුද්ධවාදීන් අපට නඟන ප්‍රධාන චෝදනාවක් තමයි, අපි පුනර්ජනනීය විදුලියට වැට බඳිනවා කියන එක. මේක දැන් සුළු මොහොතකට කලිනුත් කිව්වා. පුනර්ජනනීය විදුලියේ නාමයෙන් අනිසි ලාභ ලබන්න දත කන අතළොස්සක් ඊනියා ව්‍යාපාරිකයන්ට අපි වැට බඳිනවාම තමයි. 2024 සැප්තැම්බර් මාසයේ අපි බලයට පත්වන විට ජනතාවට පොරොන්දු වුණා, සූර්ය පැනල මඟින් පමණක් ඉදිරි වසර පහේදී අපි මෙගාවොට් 2,000ක් පද්ධතියට එකතු කර ගන්නා බවට. 2025 අවුරුද්දේ ඔක්තෝම්බර් මාසය වනවිට මෙගාවොට් 800ක් පද්ධතියට එකතු කරගෙන තිබෙනවා. ඒ කියන්නේ, වහල මත සූර්ය පැනල සහ පොඩි ප්‍රමාණයක් ground-mounted solar panelsවලින් ලබාගෙන තිබෙනවා. ඒක 2024 අවුරුද්දේ මෙගාවොට් 533ක්. මම හිතන විධියට, මේ ඉන්න හැමෝටම තේරෙනවා ඇති, අපි එය අධෛර්යවත් කරලාද, අපි අඩු කරලාද, වැඩි කරලාද කියලා. මෙගාවොට් 533ක් තිබුණු එක මේ අවුරුද්දේ ඔක්තෝබර් මාසය වනවිට මෙගාවොට් 800 පන්නලා තිබෙනවා. තවත් ඉදිරියට කාලය තිබෙනවා. මම හිතනවා මේ අවුරුද්ද අවසන් වෙනකොට අපට බොහෝ විට මෙගාවොට් 900ක, 1,000ක ආසන්නයට යන්න පුළුවන් වෙයි කියලා.

ඉදිරි අවුරුදු හතරේදී අපි මෙගාවොට් 1,200ක් සම්පූර්ණ කරනවා. ඒ කියන්නේ, වසරකට මෙගාවොට් 300ක් එකතු කර ගත්තත් අපේ target එකට යන්න පුළුවන්. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ -අපි ජනතාව එක්ක ගහපු ගිවිසුමේ- කියපු දේ අපි සම්පූර්ණ කරනවා. හැබැයි, අපේ විශේෂත්වය මොකක්ද? අපි මේ සූර්ය විදුලිය මිලට ගන්නේ නිවැරැදි මිල ගෙවලා. ඒ කියන්නේ ආයෝජකයාට ද, සපයන්නාට ද සාධාරණ මිලක් ලබා දෙන අතරේ ජනතාවට ද සාධාරණ මිලක් ලැබෙන විධියට අපි විදුලිය මිලදී ගන්නවා.

අප බලාපොරොත්තු වන්නේ ඉදිරි වර්ෂ කිහිපය තුළ මිල දී ගන්නා සෑම විදුලි ඒකකයක්ම තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවලින් මිල දී ගන්නයි. ලොකු කුඩා සියලු ආයෝජකයන්ට ඉතා පහසුවෙන් මෙම තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමයට සහභාගි විය හැකි online කවුළුවක් ඇති කිරීමටත් අපි කටයුතු කරගෙන යනවා. මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමාත් කිව්වා වාගේම අපි මෙගාවොට් 50 සුළං විදුලි බලාගාර ව්‍යාපෘති දෙකක් සිලාවතුර, මුල්ලිකුලම්වල හදන්න ටෙන්ඩර් කැඳවා තිබෙනවා. එම ටෙන්ඩර්වලින් ඒකකයක් ඩොලර් ශත 3.77ක් වැනි ඉතා තරගකාරී මිලකට මිල දී ගන්න දැන් අපට අවස්ථාව ලැබී තිබෙනවා.

එකම බොරුව නැවත නැවත කීමේ මිනීමරු ගොබෙල්ස් න්‍යායෙන් අපට අවලාද නඟන අයටත්, තමන් බලශක්ති විශේෂඥයින් යැයි සිතාගෙන සිටින ඊනියා විශ්ලේෂකයන්ටත් අපි ආරාධනා කරනවා, අපේ ඇත්ත අඩු පාඩු පෙන්වා දෙන්න එකතු වෙන්න සහ අපට අවලාද නැඟීම දැන්වත් නවත්වන්න කියලා.

මේ වසරේ මුලදී වාගේම ලබන වසරේ මුලත් අඩු ඉල්ලුම සහ වැඩි සූර්ය බලශක්තිය නිෂ්පාදනය නිසා විදුලිබල පද්ධතිය යම් අස්ථායී තත්ත්වයකට පත් විය හැකි බවට අපට අනතුරු ඇඟවීම් ලැබී තිබෙනවා. අප විසින් කැඳවන ලද බැටරි ටෙන්ඩරය පසු ගිය දා අවසන් වුණා. අපි පළමු වතාවට මෙගාවොට් 160ක් සඳහා battery storage ටෙන්ඩරයක් කැඳෙව්වා. ඇත්තටම, වාර්තාගත අන්දමින් අපට ලන්සු 153ක් ලැබුණා. මා හිතන විධියට ලංකා විදුලිබල මණ්ඩලයේ සහ මේ scale එකේ procurements ගත්තොත්, ඒක වාර්තාවක්. අපට ලන්සුම 153ක් ලැබුණා. බැටරියකින් නැවත charge කරලා දීමට අදාළව අපට රුපියල් 17කට ආසන්න මිලක් ලබා ගන්න අපට පුළුවන්. ඒකට අදාළ evaluation එක තවම සිදු වෙමින් යනවා. ඒකේ හරිම මිල දැන්ම ඉදිරිපත් කරන්න අපට අමාරුයි. එකී බැටරි පද්ධතියේ සමතුලිතතාව වැඩි කර ගැනීමට අපි මූලිකවම භාවිත කරනවා.

ඒ වාගේම ආසියානු සංවර්ධන බැංකුවේ සහයෝගිතාවෙන් අපි smart meters, smart grid එකක් ඇති කරගෙන යනවා. මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමාත් ඒ ගැන කිව්වා. එතුමන්ලා දැකපු හීන අපි දැන් සැබෑ කරගෙන යනවා. Smart meters ලක්ෂ 2ක් රට පුරා ස්ථාපිත කිරීමටත් අපි කටයුතු කරනවා. විශේෂයෙන්ම 2026 මාර්තු මාසය වන විට මෙගාවොට් 650කට අදාළ smart meters 2,000ක් සවි කරලා ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු දැනටමත් ආරම්භ කරලා තිබෙනවා. ඊට අදාළ ව්‍යාපෘති නිලධාරින් ලහි ලහියේ ඒ කටයුතු ටික කරගෙන යනවා. ඇත්තටම එහිදී ස්ථායිතාවට අවශ්‍ය දත්ත පුරෝකථන සහ මෙහෙයුම් කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

ගරු ජනාධිපතිතුමාගේ දේශපාලන නායකත්වයත්, අප විසින් පුහුණු කරන ලද දේශපාලන විනයත්, අප වටා එකතු වී සිටින අවංක, දක්ෂ විද්වතුන් පිරිසගේ මහ පෙන්වීමත් හරහා අපේ රටේ විදුලිබල ක්ෂේත්‍රයේ නව පිම්මක් ලබන වසරේ සිට ගැනීමට අපි සියල්ල සූදානම් කරමින් ඉන්නවා. අප විසින් තෝරා ගන්නා ලද ඉලක්කවලට වේගයෙන් යෑමට අපට positively සහයෝගය දෙන මෙන් සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා.

මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය නිසා ඛනිජ තෙල් ක්ෂේත්‍රය පිළිබඳව කරන කථා බහ බොහෝ විට අඩු වෙනවා. මට මතක විධියට, අද දින වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයකුත් ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් වුණා. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව පසුගිය ඔක්තෝබර් මාසය වන විට රුපියල් බිලියන 32ක ලාභයක් ලබා තිබුණා. යම් යම් තැන්වල ආදායම අඩු වුණත්, අපි අපේ අනෙකුත් ආදායම් අංශ දියුණු කරලා මේ ලාභය ලබාගෙන තිබෙනවා. ගෙවිය යුතු සියලු බදු මුදල් නිසි කලට රජයට ගෙවා දමන අතරම, ලාභයෙන් රුපියල් බිලියන 5ක් මහා භාණ්ඩාගාරයටත් මේ වන විට භාර දී තිබෙනවා. ඒ සියල්ල අතර, හැකි සෑම විටම ලෝක වෙළෙඳ පොළේ මිල අඩු වීමේ වාසිය ජනතාවට ලබා දෙන්න අපි කිසි විටෙක පැකිළුණේ නැහැ, අපි එය නොකර සිටියේත් නැහැ. බලශක්ති අමාත්‍යාංශයත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවත් එක්ව කටයුතු කිරීම නිසා රජයක් ව්‍යාපාර කිරීම නුසුදුසුයි කියන වදන් නොතකා රාජ්‍ය ව්‍යවසායන්ට ආදර්ශයක් ලබා දෙන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

තෙල් පිරිපහදුව ගැන මෙතැනදී බොහෝ දෙනෙකුගෙන් ප්‍රකාශ වුණා. තෙල් පිරිපහදුව නවීකරණය කරන්න අපි Expressions of Interest කැඳෙව්වා. ඒකට ප්‍රතිචාර නොලැබෙයි කියලා ගොඩක් අවලාද නැඟුණා. නමුත්, ජාත්‍යන්තර ආයතන 20කින් තමන්ගේ උනන්දුව පිළිබඳ ලිපි මේ වන විට අපට ලැබී තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය evaluations ටික කරලා, Requests for Proposal කැඳවීමට අපි කටයුතු කරගෙන යනවා.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි 24ක් තිබෙනවා. තෙල් ටැංකි 99න් 14ක් ඔබතුමන්ලාගේ ආණ්ඩු විසින් IOC එකට සින්නක්කරවම දීලා තිබෙනවා. ඉතිරි තෙල් ටැංකි 85න් 61ක්, CPC එක සහ IOC එක අතර joint venture එකක් යටතේ පවතිනවා. අපට තෙල් ටැංකි 24ක් ඉතිරි වෙලා තිබෙනවා. අපි දැන් ඒ 24න් සංවර්ධන කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒවායෙන් 2ක් අලුත්වැඩියා කරලා අවසන් කරලා තිබෙනවා. තවත් දෙකක අලුත්වැඩියා කටයුතු පටන්ගෙන තිබෙනවා. ඒකට අවශ්‍ය pipeline එක, වරායේ ඉඳලා construct කරන්න අවශ්‍ය කැබිනට් අනුමැතිය අරගෙන ඒකේ procurement එක මේ දවස්වල කරගෙන යනවා. අපි අනිවාර්යයෙන්ම ඒ අවශ්‍යතාව ඉදිරියේදී සපයනවා. ඒකත් ඔබතුමන්ලාගේ තවත් හීනයක් කියලා මම හිතනවා.

ඒ වාගේම, ගුවන් යානාවලට තෙල් සැපයීමේ සේවාව අපි වේගයෙන් දියුණු කරමින් සිටිනවා. එහි මිල ගණන් වර්තමානයේ සිංගප්පූරු හා ඩුබායි මිල ගණන් දක්වා අඩු කිරීම නිසා මේ වන

විට ජාත්‍යන්තර ගුවන් යානා තෙල් සැපයුම් ගිවිසුම් 13ක් අපි අත්සන් කරලා තිබෙනවා. ඒ වාගේම නාවික තෙල් සැපයුම් අංශයත් වේගයෙන් දියුණු කිරීමට අපි අපේක්ෂා කරනවා.

මේ වසර තුළ ලිහිසි තෙල් ව්‍යාපාරයේ සියයට 55ක වර්ධනයක් පෙන්නුම් කර තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටේ ධීවර ජනතාවට අඩුම මිලට ලිහිසි තෙල් සපයන්න අපි ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ වාගේම කොළඹ වරායේ සිට කොලොන්නාව දක්වා දිවෙන, වසර 80කට වඩා පැරණි නළ මාර්ගය නැවත ඉදි කිරීමට අවශ්‍ය කැබිනට් අනුමැතිය අරගෙන ඒ සඳහා අවශ්‍ය කටයුතු දැන් කරගෙන යනවා. ඒ වාගේම අපි මුතුරාජවෙල සිට කටුනායක දක්වා ගුවන් තෙල් ඉන්ධන සැපයීමට කිලෝමීටර 21ක් දිග නළ මාර්ගයක් ඉදි කිරීමට අවශ්‍ය ටෙන්ඩරය මේ මාසයේ 17වැනි දා අපි විවෘත කළා. දැන් ඒකට අවශ්‍ය කටයුතු කරගෙන යනවා.

දේශපාලන මැදිහත්වීම් මත පුරවා තිබූ අනවශ්‍ය සේවක සංඛ්‍යාව අවම කරමින් විද්‍යාත්මක ක්‍රමවේදයක් මත පිරිස් බල සැලැස්ම ප්‍රතිසංවිධානය කර තිබෙනවා. අප ප්‍රතිපත්ති ප්‍රකාශයනට අනුව ඉලක්ක සපුරා ගැනීමට ක්‍රියාකාරි සැලැස්ම සකසා ඇති අතර, එය සපුරා ගැනීමට KPIs හඳුන්වා දී තිබෙනවා.

ඒ වාගේම තවත් වැදගත් කාරණාවක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, your time is over.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු සභාපතිතුමනි, මට තවත් විනාඩියක කාලයක් දෙන්න.

ජනාධිපති විශේෂ විමර්ශන කමිටුවෙන් CPSTL වෘත්තීය සමිති සාමාජිකයින් 18 දෙනෙකුට දින 17ක් දක්වා වෘත්තීය සමිති ප්‍රවර්ධන කටයුතු සඳහා සේවයෙන් නිදහස් කොට අනීතික ලෙස රුපියල් 1,067,000ක වැටුප්, අතිකාල හා වෙනත් දීමනා ගෙවා ඇති බව අනාවරණ වී තිබෙනවා. එය වැඩිදුර විමර්ශනය සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කර ඇති බව ප්‍රකාශ කරමින් මම නවතිනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Sajith Premadasa, please. You have ten minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 10.42]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු සභාපතිතුමනි, මේ ගරු සභාවේදී කියැවුණා, දැකපු හීන ඉටු කරනවා කියලා. ඇත්ත වශයෙන්ම ජනාධිපතිවරණය, මහ මැතිවරණය, පළාත් පාලන මැතිවරණය සමයේ ජනතාවත් හීන දැක්කා. ඒ හීන ටික ජනතාවට මේ රජය නිර්මාණය කර දුන්නා. මම අහන්න කැමැතියි, ජනතාව දැකපු ඒ හීන සැබෑ කරනවා නම්, රුපියල් 9,000 විදුලි බිල රුපියල් 6,000 නොවෙන්නේ ඇයි, රුපියල් 3,000 විදුලි බිල රුපියල් 2,000 නොවෙන්නේ ඇයි, සියයට 33කින් විදුලි බිල අඩු නොවෙන්නේ ඇයි කියලා. මේවා අපි කියපු දේවල් නොවෙයි, අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා කියපු දේවල්. ජනතාවට ලබා දුන් පොරොන්දු ටික දැන් ඉටු කරනවාද? ඇයි, ඒවා ඉෂ්ට සිද්ධ වෙන්නේ නැත්තේ? සියයට 33කින් විදුලි බිල අඩු කරනවාය කියලා, මහජන උපයෝගිතා කොමිසමට කියනවා වැඩි කිරීමේ යෝජනාවක් දෙනවා කියලා. ඒක සාධාරණද? මේ රටේ සමස්ත පාරිභෝගිකයින් ලක්ෂ 75ක් ඉන්නවා. ගෘහ පාරිභෝගිකයින් ලක්ෂ 57ක් ඉන්නවා. මේ විධියට පාරිභෝගික ජනතාව රවටන එක හරිද? ඒ ජනතාවට බොරු කියන එක හරිද? ඒ ජනතාව අන්දවන එක හරිද? අපි අහන්න කැමැතියි, අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා ද ඇතුළුව විෂය භාර ඇමතිවරයාගෙන්, සියයට 33කින් විදුලි බිල අඩු කරනවා කියපු පොරොන්දුව ඉටු කළාද කියලා. එය අඩු වෙලා නැහැ.

ඒ වාගේම, එදා ඉන්ධන සම්බන්ධයෙන් ඇහුවා, වරායෙන් ගොඩ බාන කොට එක මිලක්, පාරිභෝගිකයාට අළෙවි කරන කොට තව මිලක් වෙන්නේ කොහොමද කියලා. අමුතුම style එකකට, අමුතුම රංගනයක් කරමිනුයි ඇහුවේ. එහෙම වෙන්නේ කොහොමද? ඒ මොකද, වරායට ගොඩ බාලා, ඇමතිට කොමිස් දෙනවා කිව්වා, නිලධාරින්ට කොමිස් දෙනවා කිව්වා, භාණ්ඩාගාරය - Treasury එක - ඉන්ධනවලට බද්දක් ගහනවා කිව්වා, ඒ ඔක්කෝම ඉවත් කරලා වරායේ ගොඩ බාන මිලටම පාරිභෝගික ප්‍රජාවට ඉන්ධන ලබා දෙනවා කිව්වා. හීන දැකපු දේවල් කරනවාය කියපු ඇමතිවරයාගෙන් මම දැන් අහන්න කැමැතියි, ඒකත් කඩ වුණු පොරොන්දුවක් නේද? ඒකත් රැවටිල්ලක් නේද? ඒකත් බොරුවක් නේද? ඒකත් වංචාවක් නේද? ඇමතිගේ කොමිස් එක නතර කරනවා කිව්වා, නිලධාරින්ගේ කොමිස් එක නතර කරනවා කිව්වා, බදු නැති කරනවා කිව්වා. අපි බලශක්ති ඇමතිවරයාට කියන්න කැමැතියි, කරුණාකරලා රටේ ජනතාවට කියපු දේවල් ටික ක්‍රියාත්මක කරන්න කියලා.

දැන් බලන්න, ඔබතුමන්ලා කරන අලුත්ම ප්‍රෝඩාව. ඒක තමයි "සහස්දනව්" ව්‍යාපෘතිය. ඔබතුමන්ලා ඒ වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ combined cycle power project එකක් හැටියට. ඒ කියන්නේ ඉන්ධන සහ LNG. සහස්දනව් එක ගැන කථා කරන්නට පෙර, ඔබතුමා යුගදනවි එක ගැන හොයලා බැලුවාද? යුගදනවි එකත් ගෙනාවේ combined cycle කියලා. නමුත්, අදටත් ඒක ඉන්ධන බලාගාරයක් පමණයි. මොකද, Floating Storage Regasification Unit - FSRU එක - අදටත් ස්ථාපනය කරන්නට බැරි වෙලා තිබෙනවා. අපි මේ ගැන ආංශික අධීක්ෂණ කාරක සභාවට ඇවිල්ලා ඇහුවා. නමුත්, අදාළ බලධාරින්ට උත්තර නැහැ. දැන් සහස්දනව් එකට මොකක්ද කරලා තිබෙන්නේ? සහස්දනව් එකේ බොරු දත්ත පදනම් කර ගෙන Cabinet Paper එකක් දාලා තිබෙනවා. ජනන පිරිවැය ඒකකයකට රුපියල් 20යි කියලා දාලා තිබෙනවා. හැබැයි, එහෙම කරලා තිබෙන්නේ ඩීසල් ලීටරයේ මිල රුපියල් 110යි, ඇමෙරිකානු ඩොලරයට තිබෙන විනිමය අනුපාතය රුපියල් 195යි

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කියලා, එවැනි බොරු දත්ත ඉදිරිපත් කරලා. බොරු දත්ත ඉදිරිපත් කරලා Cabinet Paper එකක් දාලා තිබෙනවා. කැබිනට් මණ්ඩලයයි, ජනාධිපතිවරයායි නොමඟ යවලා තිබෙනවා. හරියට ගණන් හදලා බැලුවොත් ඒ වෙලාවේ විනිමය අනුපාතය රුපියල් 195 නොවෙයි, රුපියල් 300යි. ඩීසල් ලීටරයක මිල රුපියල් 286යි, රුපියල් 110 නොවෙයි. ඇත්ත වශයෙන්ම මහජන උපයෝගිතා කොමිෂන් සභාව ලිඛිතව දීලා තිබෙනවා, මේ Cabinet Paper එක වැරැදියි කියලා. ඒ අය scenarios තුනක් කියනවා, එක වෙලාවක රුපියල් 35 වෙන්න පුළුවන්, රුපියල් 43 වෙන්න පුළුවන්, රුපියල් 72 වෙන්න පුළුවන් කියලා. මහජන උපයෝගිතා කොමිෂන් සභාව ම මේ අමාත්‍යාංශය දමපු Cabinet Paper එක වැරැදියි, ඒක බොරුවක්, ඒක රැවටිල්ලක් කියලා ඒ අර්ථයෙන් හඳුන්වන කොට මොකක්ද, අමාත්‍යාංශය කරන්නේ? මොකක්ද, විදුලිබල මණ්ඩලය කරන්නේ? විදුලිබල මණ්ඩලයත්, LTL එකත් සතියක් ඇතුළත සහස්දනවි ගිවිසුම අත්සන් කරනවා. ඒක සම්පූර්ණයෙන්ම වැරැදි ක්‍රියාවක්. අපි දන්න විධියට රුපියල් කෝටි 7,300ක් පමණ පාඩුවක් වෙනවා, මේ කරපු ක්‍රියාදාමය තුළ. ඒ පාඩුව ගෙවන්න සිද්ධ වෙලා තිබෙන්නේ මේ රටේ විදුලි පාරිභෝගිකයාට. මම ඇමතිවරයාගෙන් ඉල්ලීමක් කරනවා, කැබිනට් මණ්ඩලයටයි, රටටයි කරපු බොරුව, ඒ වරද දැන්වත් නිවැරදි කරන්න කියලා.

ඒ වාගේම, ඔබතුමන්ලා ඡන්ද කාලයේ ලොකුවට කිව්වා, පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කරනවා කියලා. වසර 5ක් ඇතුළත සූර්ය බලශක්තිය හරහා විදුලිය මෙගාවොට් 2,000ක් පද්ධතියට එකතු කරනවා කියලා කිව්වා. සුනිත්‍ය බලශක්ති අධිකාරිය යටතේ අද ආයතන 680ක් තිබෙනවා. ඍජු සහ වක්‍ර රැකියා ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. Rooftop solar panels හරහා විදුලිය මෙගාවොට් 1,709ක් නිපදවනවා. Ground-mounted solar panels හරහා විදුලිය මෙගාවොට් 140ක් ලබා දෙනවා. හැබැයි, කොහොමද තමුන්නාන්සේලා සූර්ය බලශක්ති ව්‍යවසායකයන්ට සලකන්නේ? ඒගොල්ලන්ගේ tariff rate එක අඩු කරනවා, රුපියල් 37 ඉඳලා රුපියල් 19 දක්වා. එතකොට අමාරුවෙන් සූර්ය බලශක්ති ව්‍යාපෘතිය ආරම්භ කරපු ඒ ව්‍යවසායකයන්ට මොකක්ද වෙන්නේ? මොකද්ද ඒ අයට අත්පත් වෙන ඉරණම? ඡන්ද කාලයේ පුනර්ජනනීය බලශක්තිය ගැන, hydro බලශක්තිය ගැන, wind power ගැන, සූර්ය බලශක්තිය ගැන කයිවාරු ගහලා බලයට ආවාට පස්සේ කූට ක්‍රම හරහා ඉන්ධන මාෆියාවේ වහලුන් බවට අද ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. ඒකයි ඇත්ත කථාව.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Leader of the Opposition, you have only two more minutes.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

I will extend my time by a few minutes, Sir.

රටටත්, ජනතාවටත් කිව්වේ පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කරනවා කියලා. හැබැයි පහර පිට පහර ගහනවා, පුනර්ජනනීය බලශක්ති ව්‍යවසායකයන්ට; සූර්ය බලශක්ති ක්ෂේත්‍රයේ ව්‍යාවසයකයන්ට. නිකම් නොවෙයි පන්න පන්න පහර ගහන්නේ. ඒ අය අධෛර්යවත් කරනවා. අන්න ඒකයි මම කියන්නේ, මේ රජය කරන්නේ ඉන්ධන සහ විදුලිබල මාෆියාවේ කොන්ත්‍රාත්තුවක් කියලා. ඉන්ධන සහ විදුලිබල මාෆියාවේ subcontractor කෙනෙක් තමයි වර්තමාන ආණ්ඩුව; වර්තමාන රජය; වර්තමාන ඇමතිවරයා.

අවසාන වශයෙන් මම තව කාරණාවක් විග්‍රහ කරන්නට කැමැතියි. මේක මේ රටේ ජනතාව දැනගන්නට ඕනෑ. අපේ මන්ත්‍රීවරුත් අවබෝධ කරගන්නට ඕනෑ. ඔබතුමන්ලා බලයට ආවේ අලුත් Debt Sustainability Analysis එකක් හරහා ඉදිරියට යනවා, අලුත් IMF agreement එකකට යනවා කියලා. හැබැයි පසුගිය රජය ගිය පාරෙම තමයි යන්නේ. අපට ණය ලබා දුන්නු ණය හිමිකරුවන් එක්ක සාකච්ඡා කරලා අපි එකඟ වෙලා තිබෙනවා, ඒ ගෙවන්න තිබෙන ණය මුදලේ ප්‍රමාණය අඩු කර ගැනීමට. ඒකට කියනවා, debt haircut කියලා. ඒ එකඟතාවට ඇවිල්ලා තිබෙනවා. එක පැත්තකින් ගෙවන්න තිබෙන ණය අඩු කර ගන්නට debt haircut එක හරහා කටයුතු කරන අතරතුර, macro-linked bond එක හරහා අපේ රටටත්, ජනතාවටත් බරපතළ හානියක් කරනවා.

මොකක්ද ඒ හානිය? ඒක අමුතුම සූත්‍රයක්. අමුතුම මොළකාරයන්ගේ සමන්විත සූත්‍රයක්. දන්නවාද ඒ සූත්‍රය මොකක්ද කියලා? මොකක්ද macro-linked bond කියන්නේ? ආර්ථික වර්ධන වේගය වැඩි වෙනකොට අර කපා දමන්නට එකඟ වුණු ණය ප්‍රමාණය - debt haircut එක - අපේ රටට ක්‍රම ක්‍රමයෙන් අහිමි වෙනවා. ආර්ථික වර්ධන වේගය වැඩිවෙන්න වැඩිවෙන්න අපේ ණය බරත් වැඩිවෙන මේ සූත්‍රයට එකඟ වෙලා තිබෙනවා, macro-linked bond එක හරහා. බලන්න, රටට කරන හානිය. Domestic debt restructuring ක්‍රියාත්මක කරනකොට, දේශීය ණය ප්‍රතිව්‍යුහගත කරනකොට, නිර්ධන පන්තිය නියෝජනය කරනවාය කියපු ඔබතුමන්ලා ලොකුවට කිව්වා නේද, EPF සල්ලිවලට, ETF සල්ලිවලට අසාධාරණයක් වෙලා තිබෙනවා, ඒක අපි වෙනස් කර ගන්නවා කියලා? කෝ, වෙනස් කර ගත්තාද? Banking system එකට හානියක් කළේ නැහැ, සුපිරි පොහොසතුන් නිසා. Primary bond dealersලාට අත තිබ්බේ නැහැ, සුපිරි පොහොසතුන් නිසා. හැබැයි, නිර්ධන පන්තිය ආරක්ෂා කරනවාය කියපු, පොඩි මනුස්සයාව ආරක්ෂා කරනවාය කියපු ඔබ, එවකට රජය EPF එකට, ETF එකට කරපු ඒ හානිය, ණය ප්‍රතිව්‍යුහගත කිරීම - debt restructuring - හරහා පික්පොකට් ගහපු එක නිවැරදි කළේ නැහැ. ඒ මොකද, බොරු කියලා යන්න ඕනෑ තැනට ඔබ ගිය නිසා.

මම මේ කරුණු කාරණා ඉදිරිපත් කරමින්, විශේෂයෙන්ම රජයෙන් ඉල්ලීමක් කරනවා. කථාව වාගේම ක්‍රියාව තුළිනුත් පුනර්ජනනීය බලශක්තිය ශක්තිමත් කරන්න කටයුතු කරන්න. විදුලි පාරිභෝගික ජනතාව දස ලක්ෂ ගණනක් බලාගෙන ඉන්නවා, සියයට 33කින් විදුලි බිල අඩු වෙනකම්. ඒ වාගේම වරායේ ගොඩ බාන මිලටම තෙල් ටික ලබා දෙනකම් බොහෝ පාරිභෝගිකයන් බලාගෙන ඉන්නවා. කරුණාකරලා බොරු කරන්නේ නැතුව, රවට්ටන්නේ නැතුව, අන්දවන්නේ නැතුව ඒ පොරොන්දු ටික ඉෂ්ට කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have ten minutes.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I think the Hon. Minister wants to speak.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, the Hon. Minister?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු සභාපතිතුමනි, ඇත්තටම විපක්ෂ නායකතුමා සාවද්‍ය ප්‍රකාශයක් කළා. අපි බලයට පත්වෙනකොට rooftop solar unit එකක් තිබුණේ, රුපියල් 27ට. එය රුපියල් 27 ඉඳලා රුපියල් 19ට අඩු කළා තමයි. ඒක නිවැරදි කරගන්න වෙනවා. ඒ වාගේම අපි කොන්ත්‍රාත් එකක් කරනවා කියලා එතුමා කිව්වා. නිෂ්පාදකයාගේ කොන්ත්‍රාත් එක විපක්ෂ නායකතුමා භාර ගෙනද, අපට වැඩි මිලට ගන්න කියන්නේ? නිර්ධන පන්තියේ මිනිස්සුන්ට අඩු මිලට විදුලිය දෙන එක වළක්වන්න හදන්නේත්, වැඩි මිලට අපට ගන්න කියන්නේත්, කාගේ කොන්ත්‍රාත් එකකටද කියලා මම මේ සභාව දැනුවත් කරන්න කැමැතියි.

මොකද, අපි unit එකක් රුපියල් 37කට අරගෙන ලංකාවේ ලක්ෂ 80ක් පමණ ජනතාවට - සියයට 70ක් වන පාරිභෝගිකයන්ට - units 90 දක්වාම unit එකක් රුපියල් 18.50ටයි විකුණන්නේ. එහෙම තිබෙද්දී රුපියල් 37ට ගන්න කියන්නේ, කාගේ කොන්ත්‍රාත් එකකටද කියලා හැමෝම තේරුම් ගත්තොත් හොඳයි කියලා මම හිතනවා. අනිවාර්යයෙන්ම ඒ ඊනියා ව්‍යවසායකයන්ගේ පැත්ත තමයි එතුමා අරගෙන තිබෙන්නේ කියලා මම පැහැදිලිව කියනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Sajith Premadasa, I will give you one minute to clarify.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම බොහොම කෙටි වෙලාවක් ගන්නවා, ගරු සභාපතිතුමනි.

ඊනියා හරි, ඊනියා නොවන හරි, පුනර්ජනනීය බලශක්ති නිපදවන්නන්ගේ, විශේෂයෙන්ම ව්‍යවසායකයින්ගේ, පොඩි මනුස්සයාගේ පැත්ත තමයි ඕනෑම වෙලාවක මම ගන්නේ කියන එක මේ අවස්ථාවේ කියන්න කැමැතියි. ඇත්ත වශයෙන්ම කාගේ කොන්ත්‍රාත්තුවක්ද, කවුරු මොන ආකාරයට කළාද කියන එක තමන් කැඩපත ඉදිරිපිටට ගිහිල්ලා බලාගත්තොත් හොඳට බලාගන්න පුළුවන්. *[බාධා කිරීමක්]* විනාඩියක් දෙන්න. මේ රටේ සූර්ය බලශක්ති ව්‍යවසායකයින් විඳින දුක එතුමා දන්නේ නැහැ. එතුමා කියනවා, ඒගොල්ලන්ගේ ගණන අඩු කළාම ඔක්කොම හරි ලු. පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කිරීම තුළින් තමයි විදුලි ඒකකයක මිල පාරිභෝගිකයන්ට අඩු කරලා දෙන්න පුළුවන් වෙන්නේ. හැබැයි මේගොල්ලන් කරන්නේ මොකක්ද? රුපියල් 37 ඉඳලා අඩු කළා. 37 ඉඳන් 27 කළා. 27 ඉඳලා 19 කළා. සූර්ය බලශක්ති ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින්ව වළ පල්ලට ඇද දමන ප්‍රතිපත්තිය තමයි මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරන්නේ. ඒ නිසා කණ්ණාඩිය ඉස්සරහට ගිහිල්ලා බලාගන්න, තමන් ව්‍යාජද, නිර්ව්‍යාජද කියලා. මම ඊට වඩා කියන්න යන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Shanakiyan Rajaputhiran Rasamanickam, your ten minutes start now.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Thank you, Hon. Chairman.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
Sir, -

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාත් මොනවාදෝ කියන්න බලාපොරොත්තු වෙනවා. ඒකත් අහලාම කථා කරන්නම්, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay. The Hon. Major General (Rtd.) Aruna Jayasekera.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
Hon. Chairman, there was a matter raised by the Hon. Dayasiri Jayasekara this morning about the MoU signed between the US Government and the Ministry of Defence of Sri Lanka with regard to the Montana National Guard and the US Coast Guard, District 13.

On the day the Votes of the Ministry of Defence were discussed, I tabled the correct document in English, which we signed. He was referring to the Sinhala document, which is incorrect. So, I have to correct it. Now, again, I am **tabling*** that document - the MoU signed between the US Government and the Ministry of Defence of Sri Lanka on the 14th with regard to the Montana National Guard and the US Coast Guard, District 13.

Thank you, Sir.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Shanakiyan Rajaputhiran Rasamanickam, sorry about the delay. Your time - 10 minutes - starts now.

[10.59 a.m.]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Thank you, Sir. I would also like to ask the Hon. Chief Opposition Whip for a couple of extra minutes, if needed, to accommodate me. විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමනි, අවශ්‍ය වුණොත් වැඩිපුර විනාඩි දෙකක් විතර පුළුවන් නම් මට ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඇත්තටම ඉතාම වැදගත් අමාත්‍යාංශයක් තමයි ගරු කුමාර ජයකොඩි ඇමතිතුමා අතේ තිබෙන්නේ. පසුගිය ආණ්ඩුව පෙරළෙන්න සාධක වෙච්ච අමාත්‍යාංශය තමයි කුමාර ජයකොඩි ඇමතිතුමා අතේ අද තිබෙන්නේ. 2022-23 කාලයේ ඇති වූ ආර්ථික අර්බුදයත් එක්ක වැඩිම බලපෑමට ලක් වූ අමාත්‍යාංශය තමයි මේ අමාත්‍යාංශය. එහෙම නැත්නම් මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු නිසා තමයි රටේ විශාල අරගළයක් ඇති වුණේ. ඇමතිවරු කිව්වා, මෙච්චර කාලයකට තෙල් නැහැ කියලා. කරන්ට් කපන්න වුණා. අරගළයක් ඇති වෙලා ඔබතුමන්ලාට බලයට එන්න ප්‍රධාන සාධකයක් වුණේ අද ඔබතුමා භාරව සිටින මේ අමාත්‍යාංශය. ඔබතුමන්ලාත් මේ ආණ්ඩුව භාර ගන්නකොට මේ අමාත්‍යාංශය හරහා කරන වැඩ පිළිබඳව රටේ ජනතාවට කරන්න බැරි පොරොන්දු රාශියක් දුන්නා. ඒ කාලයේ පොරොන්දු දෙනකොටම අපට නම් ලොකු කල්පනාවක් තිබුණා, කොහොමද මේ පොරොන්දු ඉෂ්ට කරන්නේ කියලා. ඒ කියන්නේ, ඉතා පැහැදිලිව කංචන විජේසේකර හොරකම් කරපු නිසා නොවෙයි තෙල් මිල ඒ ප්‍රමාණයේ තිබුණේ, තෙල්වලට ගහන බදු නිසායි. ඒ වාගේ තත්ත්වයක් උඩ ලබා දුන් සමහර පොරොන්දු නිසා රටේ ජනතාව මේ ආණ්ඩුවට ඡන්දය දුන්නා. මේ වෙනකොට ආණ්ඩුවට ඒ ඡන්දයේදී දුන්න පොරොන්දු ඉෂ්ට කරගන්න බැරි වෙලා තිබෙනවා. හැබැයි, ඒක කරගන්න පුළුවන් යම් ක්‍රමවේද කිහිපයක් පිළිබඳව මම අද ඔබතුමන්ලාට යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකාව හා සම ආර්ථිකයක් තිබෙන රටවල energy manage කරගන්නේ කොහොමද කියන එක පිළිබඳව අපි හොඳ අධ්‍යයනයක් කරලා බැලුවොත්, ශ්‍රී ලංකාවට හොඳ පාඩමක් ඉගෙන ගන්න පුළුවන් කියලා මම හිතනවා. ගරු සභාපතිතුමනි, උදාහරණයක් වශයෙන් නේපාලය, භූතානය වාගේ රටවල් ගැන බැලුවොත්, එම රටවල energy security කියන එක ඉතාම ඉදිරියෙන් තිබෙන්නේ. ඒගොල්ලන් energy security එක establish කරගෙන තිබෙන්නේ ඒ අවට තිබෙන රටවල power and energy sector එක සමඟ ගනුදෙනු කිරීමෙන්. සමහර රටවල්, ඒ කියන්නේ landlocked රටවල් ඉන්දියාවත් එක්ක තමන්ගේ energy connection එක හදාගන්න අනෙක් රටවල් හරහා පවා ගනුදෙනු කරනවා. ඒ කියන්නේ directly ඉන්දියාවත් එක්ක grid connectivity එකක් හදාගන්න බැරි විටදී, අනෙක් රටවල් හරහා තමන්ගේ grid connectivity එක හදාගන්න තැනට අද ලෝකයේ සමහර රටවල් ඉදිරියට ඇවිත් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, උදාහරණයක් වශයෙන් ගත්තොත්, භූතානයේ export income එකෙන් සියයට 63ක් ඒගොල්ලන් ලබා ගන්නේ energy export කරලායි. If we take the economy of Bhutan, 63 per cent of their export income comes from exporting power and energy to foreign countries. So, in a country like Sri Lanka, where we have sunlight throughout the year, we can have solar farms across the country. You have to get proper approval to have solar farms; you cannot haphazardly set up solar farms. But, if we increase our energy production, it would be a great source of forex earning; a great source to earn forex is the energy industry. ගරු සභාපතිතුමනි, මම හිතන විධියට භූතානය තමයි අද වැඩිපුරම bitcoin mine කරන්නේ. මොකද, ඒ රටේ තිබෙන energy source එකත් එක්ක. ඒ රටේ winter කාලය එනකොට ඒ grid connectivity එක තිබෙන නිසා අසල්වැසි රටවලින් ඒ රටට විදුලි supply එක ලැබෙනවා. Energy වැඩියෙන් නිපදවන කාලයට වැඩි ටික පිටරටවලට විකුණනවා. එවන් තත්ත්වයකට භූතානය වැනි රටවල් පවා පත් වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, නේපාලය ගිය අවුරුද්දේ විතරක් earned US Dollars 12.5 million just by exporting energy. ඉතින්, ශ්‍රී ලංකාවේ energy crisis එක සම්බන්ධයෙන් කාරණා අංක එකට තිබෙන්නේ, ඉදිරි අනාගතයේදී energy crisis එකක් නැති කර ගැනීම. කාරණා අංක දෙක තමයි, energy sector එක හරහා ලංකාවට forex උපයා ගැනීම. දැන් ශ්‍රී ලංකාව හරි පාරේ යන ගමන් ඉන්නවා කියලා මම හිතනවා. පසුගිය අප්‍රේල් මාසයේ ගරු ඉන්දීය අගමැතිතුමා ලංකාවට ආවාම energy සම්බන්ධ ගිවිසුමක් - High Voltage Direct Current Interconnection සම්බන්ධව MoU එකක් - අත්සන් කළා.

ගරු සභාපතිතුමනි, High Voltage Direct Current Interconnection හරහා ශ්‍රී ලංකාවේ grid එක ඉන්දියාවත් එක්ක connect කර ගැනීම තුළින් ශ්‍රී ලංකාවට energy export කරන්න අවස්ථාවක් ලැබෙනවා. අපි දන්නවා, රට තුළ වැස්ස අඩු වන කාලයට hydropower නිපදවන්න බැරි වුණාම, අපි ඩීසල් භාවිත කරලා ජෙනරේටර්වලින් තමයි කරන්ට් එක නිපදවන්නේ කියන එක. ඒකට විශාල වියදමක් යනවා. එවැනි කාලයකදී මේ grid connectivity එක හරහා අපට ඉන්දියාවෙන් කරන්ට් එක ලබා ගන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව බැලුවාම, දකුණු ඉන්දියාවේ ඊළඟ අවුරුදු කිහිපය ඇතුළත AI තාක්ෂණය හා සම්බන්ධ තාක්ෂණික කටයුතුවලට කරන්ට් එක - electricity - විශාල වශයෙන් අවශ්‍ය වනවා.

ශ්‍රී ලංකාව තුළ IT ක්ෂේත්‍රය develop කරන්න තිබුණු අවස්ථාවේදී අපි උඩ බලාගෙන ඉඳලා, IT ක්ෂේත්‍රයේ අපට එන්න තිබුණු chance එකත් දකුණු ඉන්දියාවට ගියා. දැන් දකුණු ඉන්දියාවේ ආර්ථිකය, විශේෂයෙන්ම තමිල්නාඩුවේ ආර්ථිකය අපේ රටේ ආර්ථිකය අභිබවා ගිහිල්ලා තිබෙනවා. අනාගතයේදී AI තාක්ෂණය හරහා දකුණු ඉන්දියාවට ලැබෙන්න තිබෙන ඒ ව්‍යාපාරික කටයුතුවලට අවශ්‍ය energy supply කිරීම තුළින් හෝ අපේ රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් - contribution එකක් - අපට ලබා ගන්න පුළුවන්. මම මේ කියන්නේ ගහෙන් ගෙඩි එනවා වාගේ ආපු අදහස් නොවෙයි. "World Energy Outlook 2025" කියන Report එකේ තිබෙනවා, ඉන්දියාවේ සමස්ත energy requirement එක 2035 වර්ෂය වනකොට සියයට 40කින් වැඩි වන්න ඉඩ තිබෙනවා කියලා. එතකොට 2035 වර්ෂය වනකොට ඉන්දියාවේ සමස්ත energy requirement එක සියයට 40කින් වැඩි වන්න ඉඩ තිබෙනවා නම්, එයිනුත් වැඩිපුර වැඩි වන්නේ තමිල්නාඩුවල නම්, උතුරු ඉන්දියාවට වඩා ලංකාවේ උතුරු පළාත තමිල්නාඩුවට ළඟයි නම්, මේ grid connectivity එක හරහා අපේ රටට විශාල වාසියක් ලබා ගන්න පුළුවන්. මේක කියපු ගමන් ලංකාව තුළ ඉන්න ගෝත්‍රික මානසිකත්වයක් තිබෙන සමහර අය අහනවා, අපේ energy sector එක ඉන්දියාවට භාර දෙන්නද යන්නේ කියලා. ඒ වාගේ කාරණා කියපු අය දැන් නම් ඉන්නේ ආණ්ඩු පක්ෂය එක්ක. ඒ නිසා මම හිතනවා, ඒක

වැඩිය ගැටලුවක් වන එකක් නැති වෙයි කියලා. ඇඩි ඉන්දීය විරෝධී මතයක හිටපු අය අද ඉන්නේ ආණ්ඩු පක්ෂයේ. ඒක නිසා එතැනින් එහාට ගිහිල්ලා අද ඉන්දියාවත් එක්ක සමීපව වැඩ කරන තත්ත්වයකට ඔබතුමන්ලා එන්න ඕනෑය කියන එක තමයි අපේත් බලාපොරොත්තුව වන්නේ.

ගරු සභාපතිතුමනි, ඉන්දියාවට ලංකාව අඩපණ කරන්න ඕනෑ නම්, ලංකාවට දීලා තිබෙන ඩොලර් බිලියන හතර හෙට දෙන්න කිව්වා නම්, ලංකාව බුදි; ලංකාවේ ආර්ථිකය බුදි. ඩොලර් බිලියන 4ක් තිබෙනවා, දෙන්න. අපි දැක්කා, ජනාධිපතිතුමා Budget Speech එකේදි කිව්වා, ඩොලර් බිලියන 7 දක්වා අපේ විදෙස් සංචිත වැඩි වෙලා තිබෙනවා කියලා. ඇත්තටම ඒක ඇතුළේ debt swap එකත් තිබෙනවා. ඉන්දියාව ඩොලර් බිලියන හතර හෙට ඕනෑ කිව්වා නම්, මේ ආණ්ඩුවත් බුදි, ඇමතිතුමාත් බුදි, අපිත් බුදි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Shanakiyan Rasamanickam, you have two more minutes.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, can I have a couple of extra minutes?

ගරු ඇමතිතුමනි, ඒ කාරණය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මේ වගකීම තිබෙන්නේ ඔබතුමාගේ අතේ. ඔබතුමාට ඒ හරහා electricity crisis එක වළක්වන්නත් පුළුවන්, electricity tariff එක අඩු කරන්න අවස්ථාවත් ලැබෙයි. මොකද, supply එක වැඩි වුණාම අපේ tariff එකත් අඩු කරන්න පුළුවන්. විදුලි බිල සියයට 33කින් අඩු කරනවා කියලා ඔබතුමන්ලා රටේ ජනතාවට කිව්වා. ඒ සියයට 33 අඩු කරන්නත් මෙක ක්‍රමවේදයක් වන්න පුළුවන්.

ඊළඟට, ත්‍රිකුණාමලයේ තිබෙන oil tanks ගැනත් මම කථා කරන්න ඕනෑ. Energy crisis එක වාගේම fuel crisis එකකුත් ඇති වුණා. මම හිතන විධියට, Trincomalee energy hub එකක් විධියට deveop කරන්න tripartite MoU එකක් අත්සන් කරලා තිබෙනවා, UAE, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර. ගරු සභාපතිතුමනි, ඒකෙදි components හතරක් තිබෙනවා. Pipeline එක, bunkering, refinery එක, ඒ වාගේම තමයි ඒ තෙල් ටැංකි ටික develop කිරීම. ගරු සභාපතිතුමනි, දැන් ජනාධිපතිවරයාට පුළුවන්, ආණ්ඩුවට පුළුවන්, මේ ගැන සාකච්ඡා කරන්න. ඉන්දියාව දවසකට බැරල් මිලියන 4.4ක් purchase කරනවා. දවසකට බැරල් මිලියන 4.4ක් purchase කරනකොට අපි pipeline එකක් හරහා ඉන්දියාව එක්ක connectivity එකක් හදා ගැනීම තුළින් ලංකාවේ තෙල් මිල අඩු කරන්නත් යම් ක්‍රමවේදයක් හදන්න පුළුවන්. අපි දන්නවා, අපි ඕනෑම කඩයකට ගිහිල්ලා පුටු 1,000ක් ගන්න කොට පුටුවක මිලයි, පුටු 10ක් ගන්නකොට පුටුවක මිලයි වෙනස් කියන එක. ඒ pipeline එක හරහා ඉන්දියාව බැරල් විශාල ප්‍රමාණයක් ගන්න කොට, අපට ලංකාවේ fuel price එකත් අඩු කරන්න පුළුවන් ක්‍රමවේදයක් හදන්න පුළුවන්. හැබැයි, refinery එක පිළිබඳව නැවත වාරයක් හිතා බලන්න අවශ්‍යයි. මොකද, අපට තුන්වැනි refinery එකක් අවශ්‍ය ද කියන එක අහන්න ඕනෑ. අපට crude oil ගෙනැල්ලා refine කළ හැකි ස්ථාන විධියට සපුගස්කන්දේ එකයි, හම්බන්තොට එකයි, ත්‍රිකුණාමලයේ එකයි කිව්වොත්, තුනෙන් එකක්වත් හරියට function වෙන්නේ නැහැ. ඊට වඩා සුබවාදියි, අපට pipeline එක හරහා තෙල් ගෙනාවොත් ඒ තෙල් අඩු මිලට දෙන්න පුළුවන්. Trincomalee Oil Tank Farm එකේ tanks ටික develop කරලා අපට අවශ්‍ය තෙල් ප්‍රමාණය bunker කරලා තියාගන්න පුළුවන්. රට තුළ හදිසි අර්බුදයක් ආපු වෙලාවක මේ තෙල් ටික තිබුණොත් ඔබතුන්ලාගේ ආණ්ඩුවට energy හා fuel හරහා කවදාවත් අරගළයක් ඇති නොවන තත්ත්වයට රට පවත්වාගෙන යන්න පුළුවන්. මේ කාරණා සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ ආණ්ඩු පක්ෂය ඉතාම ඕනෑකමින් මැදිහත් වෙලා කටයුතු කරන්න.

ගරු සභාපතිතුමනි, අපේ රටේ ජනතාව ඉන්දියාවට භය වෙන්න අවශ්‍ය නැහැ. ඉන්දියාව සහ ඉන්දියාවේ ජනතාව තමයි අපට භය වෙන්න ඕනෑ. මොකද, ශ්‍රී ලංකාවේ තිබෙන පිහිටීම ඉන්දියාවේ ආරක්ෂාවට විශාල වශයෙන් බලපානවා. අපේ නියෝජ්‍ය ආරක්ෂක ඇමතිතුමාත් ගරු සභාවේ ඉන්නවා. Unstable ලංකාවක් වුණොත් ඒක බලපාන්නේ ඉන්දියාවට. ලංකාව destabilize කරන්න ඕනෑ, ලංකාව තුළ අර්බුද ඇති කරන්න ඕනෑ කියන මතයේ අපි නැහැ. මේ refinery එක, නැත්නම් මේ pipeline එක හදන එක හරහා හෝ grid එක හදන එක හරහා ලංකාවේ සාමාන්‍යයෙන් තිබෙන power and energy sector එක වෙනස් කරන්න කියලා අපි කියන්නේ නැහැ. මේකට additional sector එකක් එකතු කර ගන්න කියලා තමයි අපි කියන්නේ.

கௌரவ அமைச்சர் அவர்களே! அதேபோன்றுதான், வடக்கு மாகாணத்தின் மன்னார் மாவட்டத்தில் நிறுவப் பட்டிருக்கின்ற காற்றாலைகள் பற்றி தேர்தல் காலத்திலே சனாதிபதி அவர்களால் மிக முக்கியமான வாக்குறுதி வழங்கப்பட்டது. இங்கே வன்னி மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற எங்களுடைய மதிப்புக்குரிய பாராளுமன்ற உறுப்பினர் வைத்தியர் சத்தியலிங்கம் அவர்களும் இருக்கின்றார். சனாதிபதித் தேர்தலுக்கு முன்பாகவும், பாராளுமன்றத் தேர்தலுக்கு முன்பாக சனாதிபதியாகவும் அவர் மன்னார் மக்களுக்கு வழங்கிய வாக்குறுதி, "மன்னார் பிரதேசத்தில் புதிதாக காற்றாலைகள் அமைப்பதற்கான அனுமதி வழங்கப்பட மாட்டாது" என்பது. ஆனால், இந்த ஆட்சி வந்ததற்குப் பின்னர், அங்கு காற்றாலைகளை அமைப்பதற்கெதிராக மக்கள் பாரிய போராட்டத்தில் ஈடுபட்டார்கள். இறுதியாக, அந்தப் பிரதேசத்தில் இருக்கின்ற மக்களுடைய விருப்பத்துக்கு மாறாக, ஆயருடைய விருப்பத்துக்கு மாறாக, மதத் தலைவர்களுடைய விருப்பத்துக்கு மாறாக, சிவில் சமூகத்துடைய விருப்பத்துக்கு மாறாக, மாண்புமிகு சனாதிபதி அவர்கள் சொல்லி யிருக்கின்றார், "14 காற்றாலைகளையும் அமைத்தேயாக வேண்டும். அதனைத்தாண்டி நாங்கள் எதனையும் செய்ய மாட்டோம்" என்று.

இந்த விடயம் சம்பந்தமாகத் தேசிய மக்கள் சக்தியைச் சேர்ந்த வட மாகாணத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற பாராளுமன்ற உறுப்பினர்களும் அங்குள்ள மக்களுக்குப் பொறுப்புக்கூற வேண்டும். ஏனென்று சொன்னால், இந்த 14 காற்றாலைகள் அமைப்பதற்கு வட மாகாணத்திலுள்ள மக்கள் இணக்கப்பாட்டைத் தெரிவித்தார்கள் என்று சொல்வது பிழையானது. வேறு வழியில்லாமல், "இதற்குமேல் போராட்டம் செய்வதென்றால், மன்னாரிலிருந்து கொழும்புக்கு ஆயிரக்கணக்கானோர் வந்து காலிமுகத்திடலில் போராட்டம் செய்தால்தான் அது முடியும்; பரவாயில்லை, 14 காற்றாலைகளையும் அமைப்பதை நாங்கள் ஏற்றுக் கொள்கின்றோம்" என்று அவர்கள் சொன்னார்களா, இல்லையா? என்பதுகூட எனக்குச் சந்தேகமாக இருக்கின்றது. ஆனால், இந்த 14 காற்றாலைகளையும் மன்னாரில் அமைப்பது தொடர்பாக மக்கள் மத்தியில் பெரியதோர் ஆதங்கம் இருக்கின்றது.

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய வீட்டுக்குப் பக்கத்தில் ஒரு காற்றாலையை அமைத்து, காலையிலிருந்து மாலை வரைக்கும் அந்தக் காற்றாலை சுழலும்பொழுது உருவாகின்ற சத்தம் உங்களுடைய காதுகளுக்குக் கேட்டால்தான் அதனால் ஏற்படுகின்ற பாதிப்பு உங்களுக்குப் புரியும். அதிக சனத்தொகை உள்ள, அதிகளவு மக்கள் வாழும் பிரதேசங்களில் இவ்வாறு காற்றாலைகளைக் கொண்டுவந்து நிறுவுவதனூடாக மக்களுடைய அன்றாட வாழ்க்கைக்குக் கஷ்டமான சூழல் வரும். அதேபோன்று, இதில் இன்னும் பல சிக்கல்கள் இருக்கின்றன. இந்த விடயத்தை - 14 காற்றாலைகளை - மக்கள் ஏற்றுக்கொள்ளவில்லை. சரி, வேறு வழியில்லை! நிறைவேற்று அதிகாரம் கொண்ட சனாதிபதி முறையை வைத்து, "இதுதான் எங்களுடைய முடிவு" என்று நீங்கள் சொன்னாலும்கூட, அதனைத் தாண்டி அங்கு காற்றாலைகளின் எண்ணிக்கையை அதிகரிக்கக் கூடாது.

கௌரவ அமைச்சர் அவர்களே, அதேபோன்று இறுதியாக ஒரு விடயத்தைச் சொல்கின்றேன். மட்டக்களப்பு மாவட்டத்தில் எத்தனையோ குடும்பங்களுக்கு solar panel பொருத்து வதற்கான அனுமதி வழங்கப்பட்டுள்ளபோதிலும் அவர்கள் solar panelஐ fix பண்ண முடியாத நிலையில் இருக்கின்றார்கள். பல பிரதேசங்களில் மின் இணைப்பைச் செய்வதற்கு, அதிகமான தூரங்களுக்கு மின் கம்பங்கள் இல்லாதிருக்கின்றது. அந்த மின் கம்பங்களை நிறுவுவதற்கான காசை மக்கள் கட்ட வேண்டுமென்று தெரிவிக்கப்படுகின்றது. இந்த இரண்டு விடயங்கள் சம்பந்தமாகவும் நீங்கள் கரிசனை காட்ட வேண்டுமென்று கேட்டுக் கொள்வதோடு, நான் கூறிய, grid connectivity, மற்றும் fuel supply சம்பந்தமான இரண்டு விடயங்களுக்கான உங்களுடைய பதிலையும் எதிர்பார்க்கின்றேன். நன்றி!

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Ravindra Bandara. You have ten minutes.

[පූ.භා. 11.13]

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු සභාපතිතුමනි, අද දවසේ අපි විවාදය පවත්වන්නේ අපේ රටේ ඉතාම වටිනා ක්ෂේත්‍රයක් වන බලශක්ති ක්ෂේත්‍රය පිළිබඳවයි. ඒ වාගේම පසුගිය අවුරුද්දක කාලය තුළ විශාල වැඩ කටයුතු ප්‍රමාණයක් සිදු කළ අමාත්‍යාංශයක් ගැනයි අද අපි කථා කරන්නේ. අවුරුදු 30කට ආසන්න කාලයක් අකාර්යක්ෂමතාව නිසා, දේශපාලන හේතු ඇතුළු තවත් නොයෙකුත් හේතු නිසා අපට මේ ප්‍රතිව්‍යුහගතකරණය - restructuring - කරගන්න බැරි වුණා. මේ අවුරුද්ද ඇතුළත ඒ කටයුතු සිදු කරලා, මේ වන විට එහි අවසාන අදියරට අපි ගෙනැල්ලා තිබෙනවා. මම හිතන විධියට ඒක සුවිශේෂී කාරණයක්. ඒ වාගේම ලංකා විදුලිබල මණ්ඩලය සමාගම් 12කට කඩලා තිබුණේ. ඒ වාගේම ඇමතිතුමා පැහැදිලි කළා වාගේ එහි සේවකයෝ ඉවත් කරලා, සියයට සියයක් රජය සතු නොවන විධියට ගිය එක, සියයට සියයක් රජය සතු වෙමින් ඉස්සරහට යනවා කියන එක සම්බන්ධයෙන් අපි ගොඩක් සතුටු වෙන්න ඕනෑ. ඒ වාගේම මේ restructuring තුළින් සිදුවන විශේෂම කාරණය තමයි, විදුලිබල ක්ෂේත්‍රයේ විනිවිදභාවය, තරගකාරිත්වය සහ කාර්යක්ෂමතාව ඇතිවීම. ඔන්න ඔය කියන කාරණා ඉෂ්ට වෙමින් යන මොහොතක තමයි මා මේ කථාව කරගෙන යන්නේ.

විශේෂයෙන්ම පසුගිය කාලයේ හදිසි විදුලි මිලදී ගැනීම් තිබුණු බව අපි දන්නවා. ඊට අදාළව කාරණා ගොඩක් තිබුණා. එහිදී අකාර්යක්ෂමතාව ඇතුළු සේවක ප්‍රශ්න තිබුණා. විදුලිබල ඇමතිවරයා ඉන්නේ මාතර නම්, ඔහු මාතර ඉන්න අයගෙන් විදුලිබල මණ්ඩලය පුරවනවා. සෞඛ්‍ය ඇමතිවරයා ඉන්නේ බදුල්ලේ නම්, ඔහු බදුල්ලේ ඉන්න අයගෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රය පුරවනවා. අන්න ඒ විධියට ආපු තැනක් මේ ආකාරයට කාර්යක්ෂම තත්ත්වයට පත් වුණා කියන්නේ සුවිශේෂීම සිද්ධියක්.

ඒ වාගේම මීට පෙර කථා කරපු අපේ විපක්ෂ නායකතුමා කියපු යම් දෙයක් ගැනත් මම කියන්න ඕනෑ. අපේ හීන ඉටු වෙමින් යනවා කියලා අපි කිව්වාම, එතුමා ඒකට සමච්චල් කළා. ඇත්තවශයෙන්ම කියන්න ඕනෑ, ඒ හීන තමයි දැන් ඉටු වෙමින් යන්නේ කියලා. ඒ වාගේම ලියාගෙන ආපු කොළයක් බලාගෙන තමයි එතුමා කථා කළේ. අපේ ඇමතිතුමා කරපු කථාව එතුමා අහගෙන හිටියා නම්, එතුමාගේ ඒ කථාව වෙනස් කර ගන්න තිබුණා. මොකද, මෙගාවොට් 2,000ක ඉලක්කයක් තමයි අපට තිබුණේ. ඒ ඉලක්කය පළමුවැනි අවුරුද්ද තුළ මෙගාවොට් 702ක් පුනර්ජනනීය බලශක්තියෙන් අපි සපුරා තිබෙනවා. තව මෙගාවොට් 1,300යි සම්පූර්ණ කරන්න තිබෙන්නේ. ඒක සම්පූර්ණ කරන්න අපට තවත් අවුරුදු 4ක් තිබෙනවා. එහෙම නම් සූර්ය බලශක්තිය, පුනර්ජනනීය බලශක්තිය අධෛර්යවත් කර තිබෙනවා කියලා එතුමා කියන්නේ කොහොමද? ඒ වාගේම විදුලි බිල අඩු කරන එක ගැනත් කථා කරනවා. හැබැයි, අර rooftop solarවලට රුපියල් තිස් ගණනක් දීපු එක ගැන කථා කරන්නේ නැහැ. ඒ කථාව තුළම බරපතළ විසංවාදයක් තිබෙනවා. අවුරුදු 20කට ගිවිසුම් ගහලා රුපියල් තිස්හතයි ගානකට ඒකකයක් දෙනවා. ඒක පාරිභෝගිකයාට එන්නේ ඒකකයක් රුපියල් විසිගණන්වලින්. එතැනම තේරෙනවා නේ, ඒකත් පාඩු පිට යන්නේ කියලා. අවුරුදු 20ක් එහා අනාගතය දෙස බලලා සැලසුම් සහගතව වැඩ කටයුතු කරපු නැති එක තමයි මේකට හේතුව. ගොඩක් අය කියනවා නේද, කංචනගේ කාලයේ තමයි හොඳටම කළේ කියලා. නමුත්, ඉතාම අවිධිමත් විධියට තමයි ඒ ගිවිසුම්ගත වීම සිදු වෙලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. Rooftop solar panels ගත්තාම, පන්සල්වල එහෙම ඒ solar panels සවි කරද්දී කටයුතු කරපු හැටි අපි දැක්කා. ඒ වාගේම අපි දැක්කා, මාතර පන්සල්වල වහලවල් මත ඒවා 50ක් විතර සවි කරලා තිබෙනවා. නමුත්, ඒවාට transformer capacity එක නැහැ. ඒ නිසා ඒවා සවි කරපු පලියට පද්ධතියට එකතු කර ගන්න බැහැ. අන්න ඒ වාගේ තත්ත්වයක් තමයි තිබුණේ. දැන් විශේෂයෙන් සතුටු වෙන්න ඕනෑ, මේ අමාත්‍යාංශයේ ඇමති ධුරය දරන්නේත් ඉංජිනේරුවරයෙක් වීම පිළිබඳව. ඒ වාගේම ළඟදී නියෝජ්‍ය ඇමති ධුරයට පත් වුණේත් ඉංජිනේරුවරයෙක්. ඉතින්, මේ සුවිශේෂී කාර්යක්ෂමතාවට මම හිතන්නේ ඒකත් බලපානවා. ඒ ගැන හැමෝම සතුටු වෙන්න ඕනෑ.

ඒ වාගේම සියයට 30ක් විදුලි බිල අඩු කිරීම ගැනත් කථා කරනවා. අපි බලයට ආපු ගමන් විදුලි බිල සියයට 30ක් අඩු කරනවාය කිව්වේ නැහැ නේ. ඒ තිබුණු structure එක ගොඩක් අවුල් නේ. ඒ structure එක හරි ගස්සාගෙන යමින් තමයි සියයට 30ට විදුලි බිල අඩු කරන්න කටයුතු කරන්නේ. එලෙස සියයට 30ට විදුලි බිල අඩු කරන්න කාලය තිබෙනවා. නිසැකවම ඉදිරි අවුරුදු තුන ඇතුළත විදුලි බිල සියයට 30ට අඩු කිරීම කියන කාරණය තුළ රජය ඉන්නවා කියන එක මම ඉතාම පැහැදිලිව කියනවා. නමුත්, ඉතාම සාවද්‍ය කරුණු තමයි විපක්ෂ නායකතුමා කිව්වේ. ඒවා එකිනෙකට ගැළපෙන්නේ නැහැ; කියපු කරුණු වැරදියි; දත්ත වැරදියි. ඒ වාගේම පුනර්ජනනීය බලශක්තිය එකතු වෙන ප්‍රමාණය ගැන කියපු දත්තත් වැරදියි. විශේෂයෙන් මම කියන්න ඕනෑ, ඒ අතරතුර යම්කිසි හොඳ කාරණා ටිකකුත් කියැවුණාය කියන එකත්.

ගරු සභාපතිතුමනි, විදුලිය ගොඩක් ජනනය වන වෙලාවේදී අපි ගැටලු සහගත තත්ත්වයක් දකිනවා. සූර්ය විදුලි බලයේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, System Control Unit එකට මේ වෙලාවේ සූර්ය විදුලිය කොච්චරක් ජනනය වෙනවාද කියන එක පෙනෙන්නේ නැතිකම. ඒක වලාකුළක් ආවාම වෙනස් වෙනවා; ඉර එළිය වැඩියෙන් තිබෙන දවසට එය වෙනස් වෙනවා. ඉතින් ඒ system එක නැතුව තමයි මේවා වැඩි මුදලක් අරගෙන දීගෙන, දීගෙන ගියේ. නමුත්, ඒකට අවශ්‍ය වන පද්ධතිය smart කිරීම කියන කාරණය ගැන කටයුතු කරලා තිබුණේ නැහැ. එහෙම කරන්නේ නැතුව කොච්චර සවි කරලා ගියත් වෙන්නේ මොකක්ද? එතැන තමයි system එක unbalance වෙන්නේ; මොකද, හර්ට්ස් 50 ඒක රඳවා ගන්න අවශ්‍යයි. ඒක ඉල්ලුම හා සැපයුම මත තිබෙන දෙයක් නේ. ඉතින් මේකේදී අපි සැපයුම තමයි control කරන්න ඕනෑ. ඒකේදී අනික් හැම දෙයක්ම පෙනුණාට, hydropower, thermal power ප්‍රමාණය පෙනුණාට, System Control Unit එකට ඒ ප්‍රමාණය බලා ගන්න බැහැ. ඒකට විසඳුම් ලබා දෙන්න ඕනෑ. ඒවාට විසඳුම් ලබා දෙන කටයුතු තමයි දැන් පටන් අරගෙන තිබෙන්නේ.

ගරු ඇමතිතුමා කිව්ව විධියට එහි නියමු ව්‍යාපෘතිය දැන් සිද්ධ වෙනවා. ඒකේ මුල් අදියර හැටියට inverter control units 2,000ක් සවි කරගෙන යනවා, කිලෝවොට් 100ට වැඩි ඒවායේ. ඒ කියන්නේ, ඒක අපට දැනගන්න පුළුවන් විධියට සකස් කරනවා, මුල් අදියරේදී. ඒකේදී මෙගාවොට් 650ක් control කර ගන්න පුළුවන්. සූර්ය විදුලියෙන් මෙගාවොට් 650ක් control කර ගන්නවා කියන එක ලොකු දෙයක්. මොකද, ඒක දැන් තිබෙන පීඩාකාරී තත්ත්වයෙන් මිදෙන්න පුළුවන් දෙයක්. එහි දෙවන අදියරයේ solar inverters 42,000ක් - ඒක කිලෝවොට් 5ට වැඩි ඒවා. ඒකෙන් control කරන්න පුළුවන්, මෙගාවොට් 1,500ක්. දැන් ඒක ක්‍රියාත්මකයි. ඒ වාගේම විශේෂයෙන් මම කියන්න ඕනෑ, ඒ කියන කාරණයේදී ගොඩක් වෙලාවට ඒක develop වෙන්නේ අපේ ලංකා විදුලිබල මණ්ඩලය හරහාම තමයි කියන එක. ඒ modem එක develop කරන්නේ දේශීය අය. Companies 4ක් යොදාගෙන ලංකාවේ තමයි ඒ modem එක දියුණු කරගෙන යන්නේ. ඒ ගැනත් අපි සතුටු වෙන්න ඕනෑ. ඉතින් ඒකත් එක්කම තමයි, smart meters ක්‍රියාත්මක වෙන්නේ; grid එක smart වෙනවා. ඒ වැඩකටයුතුත් දැන් පටන් අරගෙනයි තිබෙන්නේ. එම නිසා ඒ ගැන අපි සතුටු වෙන්න ඕනෑ. එහෙම solar panels සවි කරගෙන, සවි කරගෙන ගියාට, ඒක බලා ගන්න පුළුවත් තත්ත්වය දැන් තමයි නිර්මාණය වෙන්නේ. ඒ කටයුතුත් දැන් සිද්ධ වෙනවා. ඒ අනුව අපේ ගෙදරට rooftop solar දාගෙන තිබෙනවා නම් අපට ඒක පෙනෙනවා; system එක තුළ බලා ගන්න පුළුවන්.

ඔය කාරණය සම්බන්ධයෙන් කවුද කියලා තිබෙනවා මම දැක්කා, ඕකෙන් වෙන්නේ meter readersලාගේ job එක නැති වෙන එක කියලා. නමුත් දැනට සිටින meter readersලා කාගේවත් job එක නැති කරන්නේ නැහැ. හැබැයි, අපි meter readersලාගේ job එක වුණත් ඊට වඩා ඵලදායී දෙයකට යොදවනවා. මොකද, system එක තාක්ෂණයත් එක්ක දියුණු වෙලා තිබෙන නිසා system එකෙන් ඒක බලා ගන්න පුළුවන් නම්, ඇයි ගෙදරට ඇවිල්ලා මීටරය බලන්නේ? ඒ නිසා ඒවා දියුණු වෙන්න ඕනෑ. අන්න ඒ දියුණුවත් එක්ක තමයි අපි ගමන් කරන්නේ. මොකද, අපේ විදේශ විනිමය එළියට යනවා, ඩීසල් පුච්චනවා නම්. ඒවා ගෙනැල්ලා ඒ කටයුතු කරනවාට වඩා අපේ රටේ සම්පත්වලින් - දේශීය සම්පත්වලින් -මේවා ගොඩනඟනකොට තමයි අර කියපු විධියට විදුලි බිල අඩු කරන්න අපට පුළුවන් වෙන්නේ. අන්න ඒක තමයි වැදගත් වෙන්නේ.

ඒ වාගේම තව විශේෂ කාරණයක් මම කියන්න ඕනෑ. Smart grid, smart meters ඔක්කෝම වෙනවාත් එක්කම, අපට solar power හරියට ගන්න පුළුවන්. ඒ වාගේම ඒ AI tools යොදාගෙන පුරෝකථනය කරනවා. ඒ තාක්ෂණික ක්‍රියාවලිය තමයි දැන් සිද්ධ වෙන්නේ. ඒ වාගේම ඉතාම පැහැදිලිව තව දෙයක් කියන්න තිබෙනවා. European Union එකෙන් grant එකක් ලැබිලා තිබෙන නිසා දැන් ඒ කටයුතු කරගෙන යනවා. විශේෂයෙන්ම රජයේ ගොඩනැඟිලිවල වහලවල් මත solar panels සවි කරනවා. දඹුල්ලේ cool room එකේ solar panels සවි කළොත් ඒකෙන් සිද්ධ වෙන දේ මේකයි. ඔවුන්ට සියයට 15ක් දෙනවා, ඔවුන්ගේ විදුලි බිල ගෙවන්න. එතකොට විදුලි බිල ගෙවීම පිළිබඳව ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. සියයට 80ක් රජයට. සියයට 5ක් ගන්නවා, CEB එකට ඒ අවශ්‍ය කටයුතු සඳහා. ඒ සියයට 80 අරගෙන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ගේ විදුලි බිලට සහනයක් දෙනවා. කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ගැන ගොඩක් හිතපු අය වැයක් තමයි මේ වතාවේ ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ඒවා ගැන ඔබතුමන්ලා සතුටු වෙන්න ඕනෑ. අන්න ඒවා තමයි "හීන" කියන්නේ. ජනතාවගේ හීනවලට යනවා කියන්නේ ඒකයි. එහෙම නැතුව කොහේවත් නැති, කිසිම ගැළපීමක් නැති, විසංවාද - contradictions - ගොඩක් තිබෙන කථා කිව්වා කියලා වැඩක් නැහැ. ඒ කතන්දර අපි මෙච්චර කාලයක් දැක්කා. නමුත්, ඒවා කිසිසේත්ම ඵලදායී වුණේ නැහැ. ඒ නිසා අපේ රටේ සම්පත්වලින් - දේශීය සම්පත්වලින් - ප්‍රයෝජන ගන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, ඊළඟ කාරණය මේකයි. මට ඇහුණා, pump-storage hydropower ගැන කියනවා. ඒක හොඳයි. නමුත් අපි pump-storage hydropowerවල නොවෙයි, හැම දාම ඉන්න ඕනෑ. දැන් ලෝකය යන්නේ වෙනස් තත්ත්වයකින්. ඒකත් - pump-storage hydropower එකත් - ඕනෑ. ඒ අතර green hydrogenවලට යන්න ඕනෑ. දැන් green hydrogen තමයි ලෝකයේ පිරිසිදුම ඉන්ධන විධියට භාවිත කරන්නේ. ඒක ජලයෙන් ලබා ගන්න පුළුවන්. ඒ වාගේම ඒකට සූර්ය ශක්තිය, සුළං ශක්තිය යොදා ගන්න පුළුවන්. පරිසර දූෂණයක් නැහැ. ඉස්සෙල්ලාම අපට green hydrogen store කරගන්න පුළුවන්. ඒ වාගේම green hydrogen අපනයනය කරන්නත් පුළුවන්. අනාගතයේදී අන්න ඒ වාගේ තත්ත්වයකට යන්න තමයි අපි හිතාගෙන ඉන්නේ. අනාගතයේදී අපි යන්න ඕනෑ එතැනටයි.

ඇත්තටම අපි දැක්කා, ළඟදී ඉන්දියාවෙන් බස් එකක් හඳුන්වා දෙනවා, green hydrogenවලින් ධාවනය වන. ඒ වාගේම Toyota Mirai වාගේ hydrogen vehicles නිපදවා තිබෙනවා. ඒ නිසා transport sector එකටත් මේක හඳුන්වා දෙන්න ඕනෑ. අපි ඩීසල්වලට, පෙට්‍රල්වලට වැය කරන මුදල ඉතුරු කරගන්න ඕනෑ. ඒ වාගේම තමයි green hydrogen නිපදවනකොට, ඒකේ අතුරු ඵලයක් විධියට green ammonia ලැබෙනවා. Green ammoniaවලට ලෝකයේ හොඳ market එකක් තිබෙනවා. ඒ වාගේම අපේ රටේ පොහොර නිපදවන්න, යූරියා නිෂ්පාදනය කරන්න green ammonia යොදා ගන්න පුළුවන්.

ඔන්න ඔය කියන තත්ත්වයත් එක්ක තමයි අපි ඉදිරියට යන්නේ. ඒක ඔයගොල්ලන් හිතපු නැති, ඔයගොල්ලන්ට දකින්න බැරි වුණු පැත්තක්. මම මේ කියන්නේ අවුරුදු 20කට ගිවිසුම් ගැහුවා වාගේ කාරණා නොවෙයි. බොහොම සැලසුම් සහගතව අපි මේ කටයුතු කරන්නේ. මොකද, අපි වැඩිපුරම හිතන්න ඕනෑ, පාරිභෝගිකයා ගැනයි. ඒ solar power සපයන කාලයේ ඒගොල්ලන් ගැන හිතුවා වාගේ වැඩිපුරම හිතන්න ඕනෑ, පාරිභෝගිකයා ගැනයි. මොකද, විදුලි බිල අඩු කරන්නයි අපි කටයුතු කරන්නේ.

ජනාධිපතිතුමාගේ කථාව තුළත් සඳහන් කළා, සුළං බලය එකතු කිරීමේ උපපොළක් සඳහා වන පිරිවැය පවා නොමැතිව,

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

සමස්තය මෙගාවොට් 500ක ව්‍යාපෘති කිලෝවොට් පැයකට ඇමෙරිකානු ඩොලර් ශත 8.26ක අනුපාතයකින් විදුලිබල උත්පාදනය සඳහා නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව ටෙන්ඩර් 2ක් ප්‍රදානය කර තිබුණු බව. එහෙම තමයි කලින් ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණේ. මෑතකදී මෙගාවොට් 50ක බලාගාර 2ක් ප්‍රදානය කර තිබෙන්නේ, ඩොලර් ශත 3.96ක සහ ඩොලර් ශත 3.88ක අනුපාතයකට. ඩොලර් ශත 8.26ට ඒගොල්ලන් දෙන්න ගිය ඒවා දැන් දෙනවා, ඩොලර් ශත 3.96 සහ 3.88 කියන අනුපාතවලට. ඒ ගැන සතුටු වෙන්න ඕනෑ. මම කියන්නේ මේකයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Ravindra Bandara, your time is up.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න, ගරු සභාපතිතුමනි.

විපක්ෂය සාම්ප්‍රදායික විධියට හැම දේටම එරෙහි වෙනවා වෙනුවට පුනර්ජනනීය බලශක්තිය හරහා අපේ රට ඉස්සරහට යන ගමනට සහාය දිය යුතුයි. බලශක්ති ක්ෂේත්‍රය තුළ ඇති වන මේ දියුණුවට; 2030දී ආසියානු කලාපයේ අඩුම විදුලි බිල සහිත රට බවට අපේ රට ළඟා කරගන්න යන මේ වැඩ පිළිවෙළට සහාය දෙන්න කියා විපක්ෂයෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Chamara Sampath Dasanayake. You have three minutes.

[පූ.භා. 11.23]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු සභාපතිතුමනි, මම විනාඩි 3ක් ඉල්ලා ගත්තේ යම් කාරණයක් ගැන සඳහන් කරන්නයි. මගේ පළාත නියෝජනය කරන අපේ බුද්ධිමත්, උගත් මන්ත්‍රීතුමා කථා කළාට පසුව මට කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. හැබැයි, ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ අපි මේවාට අකුල් හෙළන්නේ නැහැ. වික්ටෝරියා, කොත්මලේ, ඉහළ කොත්මලේ, නොරොච්චෝලේ, උමා ඔය වාගේ ව්‍යාපෘති දෙස බලන්න. ඔබතුමාට මතක ඇති, ඒ දවස්වල බණ්ඩාරවෙල ටවුමට සෙනඟ ගෙනැල්ලා පුරවලා, "උමා ඔයේ හිලක් තිබෙනවා. උමා ඔයේ හිල වහන්න." කියලා කියපු ආකාරය. මම මහ ඇමති වශයෙන් කටයුතු කළ කාලයේ උමා ඔය ව්‍යාපෘතිය සම්බන්ධ මාධ්‍ය සාකච්ඡාවලට හතර වතාවක් ගිහින් තිබෙනවා, ඔබතුමන්ලාගේ ප්‍රධාන නායකයාත් එක්ක. අන්තිමට එහෙම හිලක් වැහුවේත් නැහැ, ඔයගොල්ලන්. ධාරිතාව මෙගාවොට් 120යි. ඇමතිතුමාගෙන් මම අහනවා, මෙගාවොට් 120 දැන් ගත්තාද කියලා. දැන් ඒ ප්‍රතිලාභ ගන්න. අපේ කාලයේ ණය වෙලා, බැණුම් අහලා, ගුටි කාලා, පාරවල්වල ඉඳලා, පව වෙලා තමයි ඒ ව්‍යාපෘති සිදු කළේ. අපිව අනාථ කළා. අපිව දමන්න පුළුවන් පහළම තැනට දැම්මා. එහෙම කරද්දිත් තමයි අපි ඒ ව්‍යාපෘතිය හරහා මෙගාවොට් 120ක ධාරිතාවක් ලබා දෙන්න කටයුතු කළේ. අද මේ ආණ්ඩුව තමයි ඒ මෙගාවොට් 120 ප්‍රතිලාභය ගන්නේ.

නොරොච්චෝල් හදනකොට, ඔබතුමන්ලා විපක්ෂයේ සිටියදී උද්ඝෝෂණ කළා, උපවාස කළා. ඉහළ කොත්මලේ, පහළ කොත්මලේ, වික්ටෝරියා වැනි ව්‍යාපෘති හදනකොට, අපි නොවෙයි එදා ඒවාට අකුල් හෙළුවේ. ඔයගොල්ලන් මොකක්ද කරන්නේ? තව වෙනකම් විදුලි බල පද්ධතියට මෙගාවොට් 1ක් එකතු කරලා නැහැ. ඉදිරියේදී එකතු කළොත් තමයි ඔයගොල්ලන් එහෙම එකතු කළා වෙන්නේ. තව වෙනතුරු මෙගාවොට් 1ක්වත් එකතු කරලා නැහැ, ඔයගොල්ලන් මේ විදුලි බල පද්ධතියට. ඒවා කළා නම් කළේ යූඇන්පීකාරයෝයි, ශ්‍රී ලංකාකාරයෝයි. අපි දෙගොල්ලන් තමයි එහෙම කළා නම් ඒ කරපු වැඩ කොටස කළේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ජීවත් වෙන හපුතලේ ආසනයේ පහළ අක්කර 100 - ඔය පැත්තේ දුෂ්කර ගම්මානවලට විදුලි බලය තිබුණේ නැහැ, 1994දී අපි ආණ්ඩුව ගන්නකොට. නමුත් අද වෙනකොට ඒ පැතිවලට විදුලි බල අවශ්‍යතාවෙන් සියයට 99ක්ම විදුලි බලය ලබා දීලා තිබෙනවා. අද ඔයගොල්ලන්ට ඒ පැත්තේ ගෙවල්වලට එක ලයිට් කණුවක්වත් දමන්න තරම් තත්ත්වයක් ඉතුරු වෙලා නැහැ. අද වනවිට ඔයගොල්ලන්ට ලැයිම් කාමරයකට එක ලයිට් කණුවක් දමන්න තරම්වත් අවශ්‍යතාවක් නැහැ. මොකද, ඒ ප්‍රශ්න සියල්ල විසඳා තිබෙන්නේ; ඒ පැතිවලට විදුලි බල අවශ්‍යතාවෙන් සියයට 99ක්ම ලබා දීලා තිබෙන්නේ. ඔයගොල්ලන් ආණ්ඩුව භාර ගෙන බදුල්ල දිස්ත්‍රික්කයේ කොහේ හරි ලයිට් කණු 100ක් හෝ යොදා කරපු විදුලි ප්‍රොජෙක්ට් එකක් තිබෙනවා නම් කියන්න. ඒ ඔක්කෝම කරලා තමයි ඔයගොල්ලන්ට භාර දීලා තිබෙන්නේ.

අපි මේවාට අකුල් හෙළුවේ නැහැ. උමා ඔයේ හිලක් තිබුණා, උමා ඔය ව්‍යාපෘතිය වහන්න, නවත්වන්න කිව්වා. ඉරානකාරයින්ට යන්න දුන්නේ නැහැ. අපි ඉරානයෙන් ණය අරගෙන ඒ ප්‍රොජෙක්ට් එක කළේ කොච්චර අමාරුවෙන්ද? ඔබතුමා දන්නවා, කිනිගම, හීල්ඔය, මකුල්ඇල්ල වාගේ ප්‍රදේශවල මිනිස්සු පාරට ඇවිල්ලා මොන තරම් උද්ඝෝෂණ කළාද කියලා. ඒ කාලයේ එහෙම ලොකු ප්‍රශ්න ඇති කළා. හැබැයි, අද අපි ඒවා ගෙන යන්නේ නැහැ. අද ඉන්න විදුලිබල ඇමතිතුමා යටතේ තමයි ඒ මෙගාවොට් 120ත් එකතු වෙන්නේ. දැන් මම හිතන්නේ වැඩ ඉවරයි. තවත් ටික දවසකින් ඒ මෙගාවොට් 120 මණ්ඩලයට ගන්න පුළුවන්. මෙගාවොට් 120ක් කියන්නේ ලෙහෙසි නැහැ. ඇල්ල වාගේ සංචාරක පුරවරයකට, බදුල්ල වාගේ දිස්ත්‍රික්කයකට -එක තැනකට- අද ඒ මෙගාවොට් 120ම දෙන්න පුළුවන්. ඒ නිසා අකුල් හෙළුවේ කවුද කියන එක ගැන මෙතැනදී කියන්න එපා. කවුරු ආණ්ඩු කළත්, අපේ කාලයේ කළත්, යූඇන්පී ආණ්ඩුව කාලයේ කළත්, ශ්‍රී ලංකා ආණ්ඩුව කාලයේ කළත්, කරපු හොඳත් පොඩ්ඩක් කියන්න.

දැන් නොරොච්චෝලේ බලාගාරය හදපු කාලයේ කොච්චර විරුද්ධ වුණාද? කොච්චර බැණ්ණාද? අද නොරොච්චෝලේ බලාගාරයේ මෙගාවොට් 500 නැත්නම් මේ රටේ විදුලිබලය පවත්වාගෙන යන්න පුළුවන්ද? නොරොච්චෝලේ බලාගාරය කැඩිලා, මාසයක් පැව්වොත් එහෙම දවස් 6ක් ලයිට් කපන්න වෙනවා. ලයිට් කැපුවොත් එහෙම තේරෙයි; රටේ ආර්ථික වර්ධනය සියයට 4.8ට තිබෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
පොඩි වෙලාවක් දෙන්න.

විදුලිය නැති වුණොත් රටේ ආර්ථික වර්ධනය 4.8ට තියා ගන්න බැහැ මහත්තයෝ. 4.8 "ඩං" ගාලා වැටෙනවා; කර්මාන්ත නවතිනවා. පැය 6ක්-7ක් විදුලිය කැපුවොත්, මේ රටේ ආර්ථික වර්ධනය 4.8ට තියා ගන්න වෙන්නේ නැහැ. ඒක හොඳට මතක තියා ගන්න. නොරොච්චෝලේ බලාගාරය හදපු නිසා, විදුලි බලාගාර ටික හදපු නිසා තමයි ඒ ප්‍රශ්න ටික විසඳිලා තිබෙන්නේ කියන එකත් මතක තියා ගන්න කියමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Anura Karunathilaka. You have 14 minutes.

[පූ.භා. 11.28]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)
ගරු සභාපතිතුමනි, චාමර සම්පත් මහත්මයාගේ කථාවෙන් පසුව කථා කරන්න ලැබීම ගැන මමත් සන්තෝෂ වෙනවා ඇත්තටම. හැබැයි එතුමා ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමාගේ කථාව අහගෙන හිටියා නම්, අර "එක මෙගාවොට් එකක්වත් එකතු කළේ නැහැ" කියන කථාව කියන්නේ නැහැ. මොකද, එතුමා එතුමාගේ කථාවේදී පැහැදිලි කළා, මෙගාවොට් 702ක් එකතු කරපු විදිය, 2025 අවුරුද්ද තුළදී. *[බාධා කිරීමක්]* ඔව්, හරි.

මම මගේ කථාවට එන්නම්. 2026 අවුරුද්දේ බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ සාකච්ඡා කරන මේ මොහොතේ අප විසින් සැලකිල්ලට ගත යුතු කරුණු කිහිපයක් තිබෙනවා කියලා අපි හිතනවා. විශේෂයෙන් 2026 අය වැය ඉදිරිපත් කරද්දීත් අපි කිව්වා, 2025දී අපි බලාපොරොත්තු වුණේ, මේ රටේ ආර්ථිකය ස්ථායීකරණය කිරීම. හැබැයි එතැනින් පස්සේ 2026දී අපේ ප්‍රමුඛම අරමුණ හැටියට ගන්නේ, සැලකිය යුතු ආර්ථික වර්ධන වේගයක් අත්පත් කර ගැනීම. අන්න ඒ ආර්ථික වර්ධන වේගය අත්පත් කර ගන්න නම්, බලශක්ති අමාත්‍යාංශය හැටියට ගෘහස්ථ විදුලි පාරිභෝගිකයා, ඒ වාගේම ඉන්ධන පාරිභෝගිකයා ගැනත් සැලකිල්ලට ලක් කරන්න වෙනවා. ඒ වාගේම ඒ අයට සාධාරණ මිලකට, කාර්යක්ෂමව ඒ සේවාවන් ලබා දෙනවා වාගේම කර්මාන්ත සහ සේවාවන් සඳහා අවශ්‍ය වන බලශක්තිය සැපයීම ගැනත් සැලකිල්ලට ලක් කරන්න ඕනෑ. ඒ නිසා ආර්ථික වර්ධන වේගය ලබා ගැනීම සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් සැපයීමේ වගකීම මෙන්න මේ බලශක්ති ක්ෂේත්‍රයට තිබෙන්න ඕනෑ. ඒ නිසා විශේෂයෙන්ම මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරනකොට, අප විසින් සැලකිල්ලට ගන්න ඕනෑ, මෙන්න මේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා 2025 අවුරුද්ද තුළ කරන ලද කාර්යයන් මොනවාද, ඒ වාගේම 2026 අවුරුද්ද තුළ කරන්න බලාපොරොත්තු වෙන කාර්යයන් මොනවාද කියලා. අන්න ඒ කරුණු පිළිබඳ අවධානය යොමු කරලා සාකච්ඡා කරනවා නම් තමයි අපට මේ වාගේ සාකච්ඡාවකින් හොඳම ප්‍රතිඵල අත්පත් කර ගන්න පුළුවන් වෙන්නේ.

ඒ වාගේම අපි දන්නවා, ප්‍රධාන වශයෙන් කර්මාන්ත හා සේවා අංශවල තිබෙන ප්‍රධාන ගැටලුවක් තමයි බලශක්තිය සඳහා දරන පිරිවැය. වරින් වර අඩු කිරීම්, ඒ වාගේම වරින් වර වැඩි කිරීම් සිද්ධ වුණත් අපි රජය භාර ගත්ත කාලයත් එක්ක බලද්දී දැන් විදුලි බිල සියයට 11කින් අඩුයි; සමහරුන්ට ඒක අමතක වුණාට. ඒ වාගේම අපි දන්නවා, ඒක ප්‍රමාණවත් නැහැ. ඒ විතරක් නොවෙයි. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ අපි කිව්වා, එවකට තිබ්බ ප්‍රමාණයෙන් අඩු ගණනේ තුනෙන් එකක්වත් අඩු වෙන්න ඕනෑ කියලා. ඒ ස්ථාවරය අපි වෙනස් කරලා නැහැ. අපේ සැලසුම් සකස් වෙන්නේ, අපේ වැඩ පිළිවෙළ සකස් කරන්නේ, අන්න ඒ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහායි. අපි දන්නවා, ප්‍රධාන වශයෙන් අපේ විදුලි ජනනයේදී ඒ ඒ ප්‍රභවයන්ගෙන් ලැබෙන දායකත්වය. පුනර්ජනනීය බලශක්ති ප්‍රභවවලින් සියයට 70.2ක් ලැබෙනවා. පුනර්ජනනීය නොවන බලශක්ති ප්‍රභවවලින් සියයට 29.8ක් ලැබෙනවා. ඒකට තමයි වැඩි වියදමක් දරන්නේ. පුනර්ජනනීය බලශක්ති ප්‍රභව තමයි ලාභම. හැබැයි ජල විදුලියෙන් තමයි වැඩිම කොටසක් එන්නේ. මහා පරිමාණ ජල විදුලි බලාගාරවලින් සියයට 38ක් විතර එනවා. එතැනදී ඒකකයක් සඳහා රුපියල් 2ක්-3ක් අතර ප්‍රමාණයක් තමයි වියදම් වෙන්නේ. ඒ වාගේම කුඩා පරිමාණ ජල විදුලි බලාගාරවලින් සියයට 10ක් විතර ජනනය වෙනවා. හැබැයි එතැනදී ඒකකයක් සඳහා රුපියල් 6ක්-7ක් වාගේ ප්‍රමාණයක් වියදම් වෙනවා. එහෙම බැලුවාම ඇත්තටම ජල විදුලිය තමයි වඩාත්ම ලාභදායී ජනන ප්‍රභවයක් හැටියට තිබෙන්නේ.

නමුත්, අපි දන්නවා, ලංකාවේ ජල විදුලිය සඳහා තිබෙන විභවයේ අපි ආසන්න ප්‍රමාණයට ඇවිල්ලා තිබෙන්නේ කියලා. මේ ක්ෂේත්‍රය මීට වඩා පුළුල් කරන්න අවස්ථා තිබෙනවා නම් තිබෙන්නේ ඉතාම ටිකයි. ඒ හින්දා අපි වැඩියෙන් අවධානය යොමු කරන්න ඕනෑ. ඒ වාගේම නියඟය කාලවල මේකෙන් ලැබෙන විදුලි ජනනය සීමා වන නිසා අපට වෙනත් විකල්පවලට යන්නට සිද්ධ වනවා.

ජල විදුලි ක්ෂේත්‍රයේ විකල්ප සඳහා අපට යන්න පුළුවන් අවස්ථා තිබෙන්නේ ඉතා සීමිත ප්‍රමාණයක්. ඒ නිසා විශ්වාසදායක, ඒ වාගේම ස්ථාවර විකල්ප පුනර්ජනනීය ප්‍රභව වෙත අපි යොමු වෙන්න ඕනෑ. ඒ සඳහා අපට තිබෙන්නේ සුළඟ සහ සූර්ය බලය. කලින් ප්‍රකාශ කළා වාගේ 2025 අවුරුද්දේදී solar power වලින් සියයට 97.35ක් එකතු කරන්න විදුලිබල අමාත්‍යාංශය සමත් වෙලා තිබෙනවා. Ground-mounted solar panels වලින් මෙගාවොට් 112.85ක්, rooftop solar panels වලින් මෙගාවොට් 584.5ක්.

වහල මත සූර්ය පැනල ගැන කථා කරනකොට ඇමතිතුමාත්, බණ්ඩාර මන්ත්‍රීතුමාත් ඒ ගැන සඳහන් කළා. හැබැයි, මම පොඩි කාරණයක් ඒකට එකතු කරන්නම්. මේ solar වල මිල සංශෝධනය කළා. ඒක ඇත්ත. ඒකකයකට රුපියල් 27ක් තිබුණේ. හැබැයි, මේ රුපියල් 27 තිබෙනකොට අවුරුදු 20කට ගිවිසුම් ගත වෙන්න ඕනෑ. එතකොට අවුරුදු 20ක් පුරා රුපියල් 27 ගණනේ ඒකකයකට ගෙවන්න ඕනෑ. මේකෙදි අපි ඇත්තටම කල්පනා කරන්න ඕනෑ දෙයක් තිබෙනවා. ආයෝජකයාට තමන්ගේ ආයෝජනය සඳහා සාධාරණ, ලාභදායී වනවා වාගේම පාරිභෝගිකයා ගැන හිතන්නත් ඕනෑ. අපි පිරිවැය අඩු කර ගන්න ඕනෑ නම්, වඩා ලාභදායී මිලකට පාරිභෝගිකයාට විදුලිය දෙන්න ඕනෑ නම්, ජනන මිල අඩු කර ගන්න ඕනෑ. රුපියල් 27 ගණනේ අවුරුදු 20ක් තිස්සේ ගෙවලා අපි කොහොමද ජනන මිල අඩු කර ගන්නේ?

ඒ වාගේම මම මේ කාරණයත් කියන්න කැමැතියි. දැන් මේ රුපියල් 19, රුපියල් 21ට තිබෙන මිලට ගත්තත් අවුරුදු 5ක්, 6ක් ඇතුළත තමන් solar power වලට කරන ආයෝජනය ආපහු

[ගරු අනුර කරුණාතිලක මහතා]

ගන්න පුළුවන්. එහෙම නොවෙනවා කියන එක්කෙනෙක් ඉන්නවා නම්, ඒ කර්මාන්තය පිළිබඳ අවබෝධයක් නැතිව තමයි කථා කරන්නේ. ඇත්තටම කවුරු හරි එක්කෙනෙක් කියනවා නම් ඒ ප්‍රමාණයට කරන්න බැහැ කියලා කියන, මම ඒ අයට ආරාධනා කරන්න කැමැතියි, එන්න අපේ ළඟට, ගුණාත්මකව ඒ වාගේම උසස් නිමාවකින් යුතුව, කිසිම කොමිස් මුදලක් ගන්නේ නැතිව ඒ දේ කර ගන්න පුළුවන් ආයතනවලට යොමු කරන්න අපි කැමැතියි.

ඊළඟට, 2025 අවුරුද්දේ තවත් මෙගාවොට් 200ක ව්‍යාපෘති සඳහා ශක්‍යතා අධ්‍යයන, පාරිසරික වාර්තා කැඳවන කටයුතු ආරම්භ කර තිබෙන්නේ. සියඹලාණ්ඩුවේ මෙගාවොට් 100ක, මුල්ලිකුලම්වල මෙගාවොට් 50 ඒකක දෙකක ව්‍යාපෘති සඳහා කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම ගොඩබිම මත ඉදි කරන මෙගාවොට් 180ක solar panel ව්‍යාපෘති සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් කරගෙන යනවා, අනුරාධපුරයේ මෙගාවොට් 100ක්, ආනමඩුවේ මෙගාවොට් 80ක් වශයෙන්. ඒ වාගේම ජලය මත පාවෙන සූර්ය බලාගාර මෙගාවොට් 150ක ව්‍යාපෘති සඳහා පාරිසරික අධ්‍යයනයක් මේ වන විට කරමින් යනවා. ඒ වාගේම ශක්‍යතා අධ්‍යයනයක් මේ වනකොට කරමින් යනවා, රිදියගම මෙගාවොට් 50ක්, දැදුරු ඔය මෙගාවොට් 100ක් ආදී වශයෙන්.

ඊළඟට, අපට සුළං බලයෙන් විදුලිය නිපදවීම සඳහා හොඳ විභවතාවක් තිබෙනවා. ඇත්තටම ගත්තොත්, සාමාන්‍යයෙන් අපේ විදුලි ජනනයෙන් සියයට 5ක්, 6ක් විතර ප්‍රමාණයක් සඳහා තමයි අපි සුළඟ පාවිච්චි කරන්නේ. නමුත්, ඇමෙරිකාවේ NREL ආයතනය විසින් ADB ආධාර මත කරපු සමීක්ෂණයක් තිබෙනවා, අධ්‍යයනයක් තිබෙනවා. ඒ අධ්‍යයනය තුළ කියනවා, ගොඩබිම තුළ ඇති කරන සුළං බලාගාරවලින් ගිගාවොට් 100කට යන්න පුළුවන්, ඒ වාගේම කලපුව මත ඇති කරන සුළං බලාගාරවලින් ගිගාවොට් 4කට යන්න පුළුවන් විභවතාවක් ලංකාව තුළ තිබෙනවා කියලා. ඒ වාගේම ලෝක බැංකුව කරපු අධ්‍යයනයක් තිබෙනවා. Offshore එකේ, නොගැඹුරු ජලයේ ගිගාවොට් 27ක විභවතාවක් වාගේම ගැඹුරු ජලයේ ගිගාවොට් 29ක විභවයක් තිබෙන බව කියනවා. මම කියන්නේ නැහැ, මේ සියලු විභවයන් අපට පාවිච්චි කරන්න පුළුවන් කියලා. ප්‍රායෝගික තත්ත්වයන් තිබෙනවා. ඒ සඳහා අධික පිරිවැයක් දරන්න සිදු වනවා. ඒ නිසා මේ ප්‍රමාණයම ළඟා කරන්න බැරි වුණත් අපට සැලකිය යුතු අවස්ථාවක් තිබෙනවා, සුළං බලයෙන් විදුලිය ජනනය කරන්න. මොකද, අපේ දැන් තිබෙන ප්‍රමාණය ගත්තොත්, ගිගාවොට් දෙකයි දශම ගණනක් තමයි අපට දැනට අවශ්‍ය වෙන්නේ - ගිගාවොට් 2.9ක් තමයි ලංකාවේ දැන් අවශ්‍යතාව. නමුත්, අප දැන් සුළං බලයෙන් නිෂ්පාදනය කරන්නේ මෙගාවොට් 260කට ආසන්න ප්‍රමාණයක් විතරයි. එම නිසා අපි හිතනවා දැනට තිබෙන මෙම ප්‍රභවය අප හොඳින් පාවිච්චි කළ යුතුයි කියලා.

විපක්ෂයේ මන්ත්‍රීවරු ගොඩක් දෙනෙක් කථා කළා, ඒ කාලයේ ආරම්භ කළ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ගැන සහ සූර්ය බල සංග්‍රාමය ගැන. නමුත්, ප්‍රශ්නය තිබෙන්නේ එම බොහෝ ව්‍යාපෘතිවල කටයුතු ආරම්භ කරද්දී ඒවා සම්බන්ධයෙන් නිශ්චිත ජාතික ප්‍රතිපත්තියක් නොතිබුණු එකයි. නිශ්චිත ජාතික ප්‍රතිපත්තියක් නොමැතිකම නිසාම නිශ්චිත සැලැස්මක් තිබුණේ නැහැ. ඒ හේතුවෙන් මතු වන අභියෝගවලට මුහුණ දෙන්නේ කොහොමද කියන එක ගැන වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. ඒ විධියට වැඩ කරලා තමයි, එහෙන් මෙහෙන් අත ගාලා තමයි, සමහර ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙන්නේ.

විශේෂයෙන් සූර්ය බලය කියන්නේ අතිශය සංවේදී ප්‍රභවයක්. ඒකෙන් පද්ධතිවලට ඇති වන ගැටලු කළමනාකරණය කර ගන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව එදා ප්‍රමාණවත් අවධානයක් යොමු වෙලා තිබුණේ නැහැ. එම නිසා ඇත්තටම අපි දැන් කල්පනා කරගෙන යනවා, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් හැටියට හයිඩ්‍රජන් පාවිච්චි කරලා ඉදිරියේදී අපේ බලශක්ති අවශ්‍යතා සම්පූර්ණ කර ගන්නේ කොහොමද කියන එක ගැන.

ජපානයේ ෆුකුෂිමා නගරයේ තමයි ලෝකයේ විශාලතම හරිත හයිඩ්‍රජන් බලාගාරය තිබෙන්නේ. කෝබේ නගරයේ තමයි සියයට සියයක්ම හයිඩ්‍රජන් වායුවෙන් ක්‍රියාත්මක වන ගෑස් ටර්බයින් යන්ත්‍රය තිබෙන්නේ. Solar power වලින් සහ net metering හරහා ගන්නා electricityවලින් හයිඩ්‍රජන් හදලා කාබන් ඩයොක්සයිඩ් ශුන්‍ය විමෝචනයක් තුළින් විදුලිය නිෂ්පාදනය කරනවා. ඒ වාගේම, ප්‍රවාහනයේදී දකුණු කොරියාවේ සෝල්, උල්සන් ආදි නගරවල බස් සහ ටැක්සි හයිඩ්‍රජන් පාවිච්චි කරලා ධාවනය කරවනවා. ටොයොටා සමාගම හයිඩ්‍රජන්වලින් ධාවනය වන Toyota Mirai කාර් හදලා තිබෙනවා. Hyundai, Nikola සහ Volvo වාගේ ආයතන දැන් ඒ සඳහා යොමු වෙමින් පවතිනවා. ජර්මනියේ හයිඩ්‍රජන්වලින් දුම්රිය ධාවනය කරවනවා. මම මේ උදාහරණ කිහිපය ගත්තේ, හයිඩ්‍රජන් අනාගතයේ බලශක්ති ප්‍රභවයක් හැටියට භාවිත කරන්න අපට පුළුවන් බව පෙන්වීමටයි.

අපි දන්නවා, අපට ඒ වාගේ තත්ත්වයකට එන්න තවත් සෑහෙන කාලයක් ගත වෙයි කියලා. හැබැයි, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය කාරණා ගැන දැන්ම අවධානය යොමු කරලා අපි කටයුතු කරන්න ඕනෑ. එම නිසා තමයි 2025 සැප්තැම්බර් මාසයේ හයිඩ්‍රජන් ප්‍රතිපත්තිය හදන workshop එකක් පැවැත්වූයේ. හයිඩ්‍රජන් ප්‍රතිපත්තිය එළි දක්වන්න අවශ්‍ය කරන මූලික කටයුතු සියල්ල දැන් සකස් කරලා ඉවරයි. මම හිතනවා මේ අවුරුද්ද අවසාන වන කොට හයිඩ්‍රජන් ප්‍රතිපත්තිය එළි දක්වන්න අපට පුළුවන්කම ලැබෙයි කියලා. ඒ විතරක් නොවෙයි, එම ප්‍රතිපත්තිය එළි දක්වනවාත් සමඟම tariff policy එක හැදෙන්න ඕනෑ කොහොමද, බැටරි ප්‍රතිපත්තිය හැදෙන්න ඕනෑ කොහොමද කියා සොයා බලා ඒ ප්‍රතිපත්ති හදන්න අවශ්‍ය වන විද්වත් කමිටු ද හදලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. උපාය මාර්ගිකව ඒවා ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම ද සකස් කරන්න, ඒ සඳහා අවශ්‍ය වන safety regulations හදන්න, standards - ප්‍රමිති - හදන්න වාගේම ඒ දේවල් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන මාර්ග සිතියම - road map එක - හදන්න මේ වන කොට සැලසුම් සකස් කරලා තිබෙනවා. මම විශ්වාස කරනවා 2026 අවුරුද්ද වන කොට ඒ කටයුතු සම්පූර්ණ කරන්න පුළුවන්කම තිබෙනවා කියලා. මුදල් අමාත්‍යවරයා හැටියට ගරු ජනාධිපතිතුමා තමන්ගේ අය වැය කථාවේදී බලශක්ති ප්‍රභවයක් හැටියට හයිඩ්‍රජන් එකතු කර ගැනීම ගැන සඳහන් කළේ මෙන්න මේ සැලසුම් මත පිහිටායි.

හැබැයි, සමහර අයට ඒවා ඇහුණේ නැහැ. සමහර අයට ඇහුණත් ඒවාට ඇහුම්කන් නොදී සිටියා. "Point of Order මන්ත්‍රීතුමා" නම් හොඳටම නිදාගෙන හිටපු හින්දා එතුමාට ඒක ඇහුණේම නැහැ.

බලශක්තිය ගැන කථා කරන කොට අපට පොසිල ඉන්ධන ගැන කථා නොකරම බැහැ. සාමාන්‍යයෙන් ලංකාවේ හැම අවුරුද්දකම වාගේ සියයට 4ක, 5ක විතර ප්‍රමාණයකින් පොසිල ඉන්ධන සඳහා තිබෙන ඉල්ලුම වැඩි වෙනවා. ඇත්තටම ජාතික ආරක්ෂාවේ වැදගත් අංගයක් තමයි අඛණ්ඩ බලශක්ති සැපයුම. අපට දැනට තොග ගබඩා පහසුකම් තිබෙන්නේ දවස් 25කට විතරයි. අඩුම ගණනේ දින 45කට ප්‍රමාණවත් තොග පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවක් තිබෙනවා. එම නිසා බලශක්ති අමාත්‍යාංශය හැටියට ඝන මීටර් 260,000ක ප්‍රමාණයකින් එය වර්ධනය කරන්න අවශ්‍ය සැලසුම් සකස් කරලා දැනටමත් ඒ සඳහා අවශ්‍ය සමහර පියවර ගෙන තිබෙනවා. කොළොන්නාවේ ඝන මීටර් 64,000ක ටැංකි හදන්න දැනටමත් පටන්ගෙන තිබෙනවා. ඒ සඳහා රුපියල්

බිලියන 3.7ක් ඇස්තමේන්තු කර තිබෙනවා. 2027 අවුරුද්දේදී එම කටයුතු සම්පූර්ණ කරන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මුතුරාජවෙල තවත් ඝන මීටර් 40,000ක ටැංකි හදන්න රුපියල් බිලියන 3.49ක් යනවා කියලා ඇස්තමේන්තු කර තිබෙනවා. එය 2027දී අවසන් කරන්න පුළුවන්කම ලැබෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

තව කරුණු දෙකක් සඳහන් කරලා මම මගේ කථාව අවසන් කරන්නම්. කොළඹ වරායේ ඉඳලා කොළොන්නාව දක්වා ප්‍රධාන නළ 5කින් තමයි දැනට ඉන්ධන ගෙන යන්නේ. ඒවා දශක ගණනක් පැරණියි; නිරන්තරයෙන්ම තෙල් කාන්දු වෙනවා. අපි ඉස්සර කාලවල දැකලා තිබෙනවා සමහර දේශපාලනඥයන්ගේ ආධාරකරුවන් ඒවා කඩලා තෙල් ගත්තු අවස්ථා.

2017 ඉඳලා තමුන්නාන්සේලා උත්සාහ කළා නළ මාර්ග 2ක් හදන්න. හැබැයි බැරි වුණා. 2019දීත් සල්ලි හොයාගෙන ඒක කරන්න කියලා කොන්ත්‍රාත් ප්‍රදානය කළා. ඒත් ක්‍රියාත්මක කරන්න බැරි වුණා. ඔන්න දැන් කොළඹ වරායේ ඩොල්ෆින් තෙල් නැව් තටාකාංගණයේ ඉඳලා කොළොන්නාව නිමාව දක්වා අඟල් 18ක සහ අඟල් 14ක විෂ්කම්භය සහිත නළ දෙකක් construct කරන්න, ඒ වාගේම ඩොල්ෆින් තෙල් නැව් තටාකාංගණයේ ඉඳලා වරායේ සේරම් ගේට්ටුව දක්වා තවත් අඟල් 12ක නළයක් එළන්න කැබිනට් අනුමැතිය ලැබී තිබෙනවා. ඒ සඳහා වන කටයුතු කරන්න දැන් අපට පුළුවන්.

ගරු සභාපතිතුමනි, මෙහි තිබෙන ආර්ථික වටිනාකම ගැනත් මට වචනයක් කියන්න ඕනෑ. සාමාන්‍යයෙන් පැය 96ක් විතර යනවා එක තෙල් නැවක් unload කරන්න. මේ නළ මාර්ගය ක්‍රියාත්මක වුණොත් ඒක පැය 72 සිට 48 දක්වා අඩු කර ගන්න පුළුවන්. ඒ තුළින් අවුරුද්දකට ඩොලර් ලක්ෂ 48ක් ඉතිරි කර ගන්න පුළුවන් කියලා ඇස්තමේන්තු කර තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Anura Karunathilaka, your time is up.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු සභාපතිතුමනි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

දැනට කොළොන්නාවේ තෙල් ගබඩාවේ ඉඳලා කටුනායක දක්වා Jet A-1 fuel ගෙන යන්නේ දුම්රියෙන් සහ බවුසර්වලින්. හැබැයි ඒක ප්‍රමාණවත් වෙන්නේ නැහැ, විශේෂයෙන් ඉදිරියේදී ඇති වන අවශ්‍යතා එක්ක ගත්තාම. ඒ නිසා මුතුරාජවෙල ගුවන් යානා ඉන්ධන පහසුකම් සහිත terminal එකක් හදලා මුතුරාජවෙල ඉඳලා කටුනායකට නළ මඟින් ඉන්ධන සපයන්නත් කටයුතු කර තිබෙනවා.

මේ සංවාදයේදී මතු වුණු කරුණු කිහිපයක්ම තිබුණත් අවසාන වශයෙන් ඉන් එක කාරණයක් පිළිබඳව පමණක් කථා කරන්න මට අවස්ථාව දෙන්න, ගරු සභාපතිතුමනි. සපුගස්කන්ද තෙල් පිරිපහදුව සම්බන්ධයෙන් අපි ප්‍රමාණවත් අවධානයක් යොමු කරලා නැහැ කියා විපක්ෂය කිව්වා. සපුගස්කන්ද පිරිපහදුව නවීකරණය කරන්න ඕනෑ. සාමාන්‍යයෙන් ලංකාවේ සියයට 25ක ඉන්ධන අවශ්‍යතාව සැපිරෙන්නේ එතැනින්. දවසකට බැරල් 10,000ක් දක්වා පිරිපහදු කිරීම සඳහා සැලසුම සකස් කරලා ඒ සඳහා අභිලාෂ කැඳවා තිබෙනවා. අභිලාෂ යෝජනා 20ක් ලැබිලා තිබෙනවා. දැන් ඒ ලේඛන ගොනුගත කිරීම කරන්න යනවා. ඒක ක්‍රියාත්මක කරන ආකාරය අපට නුදුරේදී බලා ගන්න පුළුවන්.

සාමාන්‍යයෙන් ගරු විපක්ෂ නායකතුමා හැම දාම වාගේ කථාවක් අවසන් කරන්නේ මැක්කාගේ න්‍යාය පාවිච්චි කරලා, debt restructuring වලින්. බලශක්ති අමාත්‍යාංශය ගැන කථා කරන කොටත් debt restructuring වලින් තමයි කථාව අවසන් කළේ.

අපි දන්නවා බලශක්ති ක්ෂේත්‍රයේ අවශ්‍යතාව සහ ආර්ථිකයට එහි වැදගත්කම කොයි තරම්ද කියන එක. අපි එය හඳුනාගෙන තිබෙනවා. ඒ පිළිබඳ සැලසුම් සකස් කරමින්, ජනතාවට වුණු පොරොන්දු, ඒ වාගේම ජනතාව අපෙන් බලාපොරොත්තු වුණු දේවල් ඉටු කරලීම සඳහා අපි කටයුතු කරමින් ඉන්නවා. මට මේ කාලය ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The next speaker is the Hon. Ravi Karunanayake. You have 22 minutes.

[පූ.භා. 11.44]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Thank you, Hon. Chairman, for allowing me to speak at this very important Discussion. I am also happy that you are presiding.

ගරු සභාපතිතුමනි, බලශක්ති අමාත්‍යාංශය ගැන කථා කරන මේ අවස්ථාවේදී මම මූලිකව පෙන්වන්න හදන්නේ මේ රටේ විදුලි බලය සැපයීම ආරම්භ වුණේ කොහොමද කියලායි. SS Helios කියන නැව 1882දී කොළඹ වරායට සේන්දු වෙනවා. කොළඹ කොටුවේ තිබෙන බ්‍රිස්ටල් හෝටලය 1890දී ඩීසල් ජෙනරේටර් එකකින් පටන් ගත්තේ. ඒ ගමන අද ඇවිල්ලා තිබෙන තත්ත්වය කෙරෙහි මම මේ අවස්ථාවේ ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා.

ගරු සභාපතිතුමනි, 2025දී විදුලි බලය ගිගාවොට් 16,500ක් රටේ ජනනය වෙනවා. මේක 2030දී ගිගාවොට් 24,000කට වැඩි වෙයි කියලා පුරෝකථනය කර තිබෙනවා. 2040දී ගිගාවොට් 34,000යි; 2050දී ගිගාවොට් 45,000යි. අපි විෂය භාර ඇමතිතුමාත් එක්ක විවෘත සාකච්ඡාවක් පැවැත්වූවා. ඒ කාරණාත් එක්ක අප දන්නා දේ තමයි, විදුලිබල ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අපි බොහොම භයානක තත්ත්වයකට ගමන් කරනවා කියන එක. අපි ඒකට උත්තර දිය යුත්තේ කෙසේද කියන එක මම මේ අවස්ථාවේදී පෙන්වා දෙන්න කැමැතියි.

රටේ විදුලි බලය සඳහා වන ඉල්ලුමේ වර්ධන වේගය සියයට 5ක් වනවා. දැන් ඩොලර් එක රුපියල් 300යි. අය වැය ඉදිරිපත් කරන දවසේ ඩොලරය රුපියල් 300ට තිබුණාට අද මේ කථා කරන මොහොතේ LC එකක් අරින කොට ඩොලරය රුපියල් 312ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ දවස් කීපයට අපේ රටේ ණයබරතාව, ණය තොගය වැඩි වී තිබෙනවා බිලියන 300කින්. මේ දවස් කීපය තුළ වැඩි වුණු ප්‍රමාණයයි, ඒ. මම ඒක ගත්තේ, ඒක අපේ ආයෝජනයට කොයි ආකාරයෙන්ද බලපාන්නේ කියලා පෙන්වන්න.

ගරු සභාපතිතුමනි, දැන් මේ විදුලි බලය මෙගාවොට් 16,500න් මෙගාවොට් 4,000ක් hydropower වලින්, මෙගාවොට් 7,000ක් ගල් අඟුරුවලින්, තව මෙගාවොට් 4,000ක් furnace oilවලින් සහ තවත් මෙගාවොට් 1,500ක් පුනර්ජනනීය බලශක්තිය තුළින් තමයි ඇතිවෙලා තිබෙන්නේ. ඒ මේ අවස්ථාවේ

[ගරු රවි කරුණානායක මහතා]

තිබෙන තත්ත්වය. සාමාන්‍යයෙන් තරග කරන රටක් හැටියට අපේ විදුලි ඒකකයක විකුණුම් මිල දැනගැනීම අත්‍යවශ්‍යයි. මොකද, ඉන්දියාව, පාකිස්තානය, බංග්ලාදේශය වාගේ රටවල ඒකකයක මිල රුපියල් 16ත්, 20ත් අතර තිබෙනකොට, තායිලන්තය, මැලේසියාව වාගේ රටක රුපියල් 22ක තිබෙන අවස්ථාවක ලංකාවේ රුපියල් 24ක, 25ක වාගේ තැනක තමයි තිබෙන්නේ. ඒ නිසා මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා ඒ ගැන පැහැදිලි කරන්න. අද මේ කියන වෙලාවේ ඒකකයක විකුණුම් මිල දළ වශයෙන් රුපියල් 26ක තිබෙනකොට, නිෂ්පාදන මිල රුපියල් 23ක් ගණනය වන්නේ මේ ආකාරයට. මම මෙය උපුටා ගන්නේ "Operating Performance Highlights for 2025 - Quarter 1" කියන වාර්තාවෙන්. එහි කියා තිබෙන තත්ත්වය අනුව, hydropower ඒකකයක් නිෂ්පාදනය කරන්න රුපියල් 2.50කුත්, බෙදා හැරීමේ - distribution - වියදම එක් ඒකකයකට ශත 1.50කුත්, ජනන ගාස්තුව වශයෙන් රුපියල් 4.50කුත්, corporate ගාස්තුව ශත 3කුත් වෙනවා. අද අපේ සම්පූර්ණ වියදම රුපියල් 31ක් වෙනකොට අපේ ආදායම රුපියල් 26.09යි. ඉතින්, අලාභයක් ඇතිවෙලා තිබෙනවා. මම මේ අවස්ථාවේ පෙන්වන්න හැදුවේ කොයි ආකාරයෙන්ද අපි ගමන් කරන්නේ කියලා. මොකද, තරගකාරී තත්ත්වයකදී අපට ඉතාම තියුණු ලෙස තරග කරන්න නම් මේ මොහොතේ විදුලිය අවශ්‍යයි.

ගරු සභාපතිතුමනි, අද installed capacity එක තිබෙනවා, 6,000ක් පමණ. ඒ කියන්නේ, CEB එකයි, පෞද්ගලික අංශයයි අතර. රට තිබෙන maximum demand එක 2,900ත් 3,000ත් අතර තිබෙනකොට, උදේට 2,700ක් තිබෙන්නේ මම හිතන විධියට පුනර්ජනනීය විදුලි බලය පාවිච්චි කරලා. හැබැයි, මෙකේ තිබෙනවා පොඩි mismatch එකක්. අද රටේ deficit generation එකක් තිබෙනවා. රට වර්ධනය වන ආකාරයට විදුලි බලය වර්ධනය වන ආකාරය ගත්තාම, රටේ වර්ධන වේගය අපට පෙනෙන්න නැහැයි කියන එක තමයි මේකෙන් අර්ථකථනය කරන්නේ. සාමාන්‍යයෙන් සියයට 7ත්, 11ත් අතර වර්ධන වේගය තිබෙනකොට විදුලි බලයට තිබෙන ඉල්ලුම සියයට 5ට අඩුවෙලා තිබෙනවා. ඒ නිසායි අද ඇමතිතුමාට ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන්නේ පුනර්ජනනීය නිෂ්පාදනය තුළ. ඒ නිෂ්පාදනය කරන ටික පද්ධතියට සම්පූර්ණයෙන් ගන්න ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. දැන් least-cost generation පාවිච්චි කරන්නේ නැතිව, ඒකෙන් බැහැර වෙන්න අවශ්‍යයි, පුනර්ජනනීය බලශක්තියට අවස්ථාවක් දීමට. මේ අවුරුදු 76ක සාපය තුළ කටයුතු කරපු ආණ්ඩුවලින් CEB එකට කරපු විදුලි ව්‍යාපෘතිවල සම්පූර්ණ වටිනාකම Rs. 1 trillion. Hon. Chairman, today, the total asset value of the CEB, which has got added over the past 76 years, is roughly Rs. 1 trillion. So, you could see the stupendous amount of investment that has gone into it. Why I am using these figures is this.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Rs. 1 trillion?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Yes, one trillion in rupees. I am happy that the Hon. Bimal Rathnayake is also interested.

So, the reason I brought these figures up is to speak about our future since it is very important and is a necessity at a time when we are trying to get into the South Asian market and compete with exporters, whether it be China or India, to the European Union and the US market. I think China and India will play a pivotal role and let us see how we move on. So, its assets value is Rs. I trillion. ඇමති මණ්ඩලය තුළිනුත් මේකේ SWOT analysis එකක් කරන්න බලන්න. අද බැලුවාම මේකේ තිබෙන ඉතාම භයානක තත්ත්වය හෙළිදරව් වෙයි. මේක දවසින් දෙකෙන් ඇතිවෙලා නැහැ, අතීතයේ සිට ඇවිත් තිබෙන ප්‍රශ්නයක ප්‍රතිවිපාක, මේ. මේක දවසින් දෙකෙන්, ගිහිල්ලා සුපර්මාර්කට් එකකින් බඩු ගන්නවා වාගේ කරන්න බැහැ. ජනනයට අවුරුදු 3ක්, 4ක් යනවා. බෙදා හැරීමේ කටයුතුවලට තව අවුරුදු 4ක්, 5ක් යනවා. SWOT analysis එකකින් අපට බලාගන්න පුළුවන්, කොයි ආකාරයෙන්ද මේ තත්ත්වය වෙනස් කරන්න පුළුවන් කියලා.

ගරු සභාපතිතුමනි, මම මොහොතකට ඒ කාරණාවෙන් බැහැරට යනවා, තවත් කාරණයක් කියන්න ඕනෑ නිසා. Ceylon Electricity Board Act, No. 17 of 1969 හරහා ඇති වුණු මේ විදුලිබල මණ්ඩලය 2002දී ප්‍රතිසංස්කරණය කරනවා, කරු ජයසූරිය ඇමතිතුමා විසින්. ඊට පසුව කංචන විජේසේකර ඇමතිතුමා ඒකට ලොකු දායකත්වයක් ලබා දීලා 2024දී මේක යම් තැනකට ගෙනාවා. එහිදී වුණේ මේක සම්පූර්ණයෙන්ම වාණිජකරණය කරන එක සහ රජයේ තිබෙන ඒ ඇඟිලි ගැසීමේ හැකියාව පුළුවන් තරම් අවම කිරීම. ඒක 2024දී ගෙනාවාට පසුව ආණ්ඩුව වෙනස් වුණා. ඒ වෙනස්වීම තුළ ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති වෙනස්. ඒ ප්‍රතිපත්ති වෙනස්වීම තුළ අද වෙලා තිබෙන දේ තමයි, එදා කොම්පැනි 7, 8ක තරගකාරී තත්ත්වයක් ඇති කරන්න තිබුණු එක අද රජයේ අනුග්‍රහය යටතේ වෙලා තිබෙන එක. දැන් විදුලි ජනනය thermal, hydro and coal කියන තුන ඒකාබද්ධ කරලා එක කොම්පැනියක් - generation company එක - හදනවා. ඊට පස්සේ, බෙදා හැරීම. මේ කොම්පැනි 5 ඒකාබද්ධ කොම්පැනියක් ලෙස හදලා ඔබතුමන්ලා අනුගමනය කරන්න හදන ප්‍රතිපත්ති ඒ තුළ තිබෙනවා.

ගරු සභාපතිතුමනි, LECO එක ඉතාම සාර්ථකව ගෙන ගිය කොම්පැනියක්. මේකට public-private partnership එකක් තිබුණා. ඇයි මේක නැවත ඒ පරණ ග්‍රහණයට ගෙනෙන්න හදන්නේ කියන ප්‍රශ්නය මට තිබෙනවා. ඒක ඔබතුමන්ලාගේ අලුත් ආකාරයක වැඩ පිළිවෙළක් වෙන්න පුළුවන්. නමුත්, එහි සාර්ථකත්වය ගැන ඔබතුමන්ලා බලන්න. මේකේ Distribution, Division 1, Division 2, Division 3 and Division 4 යටතේ කරලා ඒ බෙදා හැරීම එක holding company එකක් යටතට ගන්නවා. LECO ගැන කථා කරන අවස්ථාවේදී මම මේ ගැනත් කියන්න ඕනෑ. ඊයේ ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා ඉතා ඕනෑකමින් පෙන්වන්න හැදුවා, යම් විධියක ඉතිරිකිරීම් තිබෙනවා කියලා. ඒ ගැන මට කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි කැමතියි ඉතිරි කිරීම් වර්ධනය වෙන එකට, ඒකට ප්‍රතිලාභයක් දෙන එකට. ඒක තමයි සාර්ථකත්වය. අපි එක්සත් ජාතික පක්ෂය හැටියට, ලක්ෂ 45ක්, ලක්ෂ 50ක් නියෝජනය කරන මේ පක්ෂයේ එකම මන්ත්‍රීවරයා හැටියට මම කථා කරන්නේ, ඒකට කැමැත්තක් දරා ගෙන. හැබැයි, ඊයේ මේ ගරු සභාවේදී පෙන්නුවා කාර් පුළුවන් තරම් අඩුවෙන් පාවිච්චි කරනවා කියලා. LECO එකට ස්වාධීනත්වයක් තිබෙනවා, ඒගොල්ලන්ට අයිතියක් තිබෙනවා. ඒක නැතුවා නොවෙයි. LECO සභාපති ජනක අලුත්ගේ මහතා පත් වෙනකොට ඒ අයට කාර් එකක් ගන්න අවශ්‍ය වුණා. ඒක, මිලියන 80ක බෙන්ස් එකක්. මිලියන 70කට showroom එකේ තිබුණ අළු පාට එක කළු පාට කරගෙන මිලියන 80ක් වෙලා තිබුණා. ඒ වාගේම, BYD cars 10ක් ගන්න, බිලියන 200ක්. මම ඇමතිතුමාට ඒ ගැන එදා කථා කළා. මට අවශ්‍ය වන්නේ එදා කියපු දේට

මොනවාද වෙලා තිබෙන්නේ කියලා පෙන්වන්නයි. හැබැයි, LECO එක හොඳයි. මොකද, public-private partnership තුළ යුගදනව්වල බිලියන දෙකක ආයෝජනයක් කළාට පසුව ඒකේ dividends ලැබෙනවා; හොඳට ගෙනියන එකක්. ඒ වාගේම smart metering පටන් අරගෙන තිබෙනවා. මමත්, අපේ හිටපු නියෝජ්‍ය අමාත්‍ය අජිත් පී. පෙරේරා මැතිතුමාත් කරලා තිබෙන දේ තුළින් අද පුළුවන් මේ smart meters තුළින් මෙරට සම්පූර්ණයෙන්ම නවීකරණය කරන්න. රුපියල් 10,500කට මීටරයක් තියා ගෙන ඉන්න අවස්ථාවක මේ අවස්ථාව ගන්න අවශ්‍යයි. ඉතින්, LECO එකේ ඒ තිබෙන උනන්දුව කිසිසේත්ම බාල්දු කරන්න එපා කියලා තමයි මම මේ අවස්ථාවේ මතක් කරන්නේ.

ගරු සභාපතිතුමනි, transmission and systems operation සම්බන්ධව එක කොම්පැනියක් තිබෙනවා. මම හිතන විධියට, මේක තමයි වැදගත්ම එක. මොකද, system control, power purchasing, planning and project implementation කියන ඒ ඔක්කෝම මේ කොම්පැනිය යටතේ තිබෙනවා. ඊට පස්සේ, transmission maintenance කියලා කොම්පැනියක් ඇති වෙනවා, හතරවෙනි කොම්පැනිය ලෙස. ඊට පස්සේ, Pension Fund එක සහ Provident Fund එක පාලනය කරන්න corporate company එකක් ඇති කරලා තිබෙනවා. මම දන්නේ නැහැ, ඒ company එකේ නම. ඒ, පස්වැනි කොම්පැනිය.

ගරු සභාපතිතුමනි, ලංකා විදුලිබල මණ්ඩලයේ එදා හිටපු සේවක සංඛ්‍යාව 26,800ක්. මම හිතන විධියට කරු ජයසූරිය මැතිතුමා ඉන්න අවස්ථාවේ දී 27,000ක් වශයෙන් හිටපු සේවක පිරිස ඊට පස්සේ ආපු ඇමතිවරු ටිකක් අඩු කළා. මා ඉන්න කාලයේ 26,000ක සේවක පිරිසක් හිටියා. ඊට පස්සේ කංචන විජේසේකර ඇමතිතුමා පාලනය කරනකොට ඒක 23,000කට අඩු වෙලා තිබුණා. දැනට 22,000ක් ඉන්නවා. දැන් ඒ 22,000න් 2,600දෙනෙකුත් යන්න ඉන්න අවස්ථාවේ කොයි ආකාරයකින්ද මේ පිරිස සමඟ ඉදිරියට යන්නේ කියන එක බලන්න ඕනෑ. විදුලිබල මණ්ඩලය මා හිතන විධියට 10,000ක්, 12,000ක් අතර පිරිසකින් කරගෙන යන්න පුළුවන්. මේක ඉතාම වාණිජ තත්ත්වයකින් දුවන්න අවශ්‍යයි. ඒ නිසා මේ අවස්ථාවේ ඔබතුමන්ලා අප දැනුවත් කරන්න අවශ්‍යයි මේක ප්‍රතිසංස්කරණය කරන්නේ කොහොමද කියලා. ඒක එදා ගත්ත තනි තීන්දුවකින් නොවෙයි. දේශපාලන අරමුණකින් ඒ දේවල් ක්‍රියාත්මක වුණ නිසා තමයි මේ ප්‍රශ්නය ඇති වුණේ. පාඩුවකින් දුවන තත්ත්වය ඇති වුණේ. මේ balance sheet එකේ රුපියල් බිලියන 600ක, 700ක ණයක් තිබුණා. එහෙම ණය තිබුණේ අද ගෙවන්න තිබුණු එක හෙටට කල් දැමීම නිසා. අන්තිමට බංකොලොත් වුණාට පසුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කිව්වේ, ඔබලාට සල්ලි ඕනෑ නම් මේ වාගේ දේවල් නිවැරදි කරන්න අවශ්‍යයි කියලා. ජනතාවට සහනයක් ලබා දෙන්න අවශ්‍ය නම්, -යම් කොටසක් සහනයක් දිය යුතුමයි- ඒ සහනය දෙන්න පුළුවන් අය වැය තුළින් මිසක්, විදුලිබල මණ්ඩලය තුළින් නොවෙයි. මොකද, ඒක stand-alone public utility company එකක්. මම හිතන විධියට මේක හරි මාර්ගයේ යනවා. නමුත් ඇඟිලි ගැසීම් නැත්නම් මම හිතන විධියට මීට වඩා හොඳ තත්ත්වයක් ඇති වෙයි කියලායි විශ්වාස කරන්නේ.

කරුණාකරලා ඔබතුමන්ලා පෙන්වා දෙන්න අවශ්‍යයි මේක ප්‍රතිසංස්කරණය කරන්නේ කොයි ආකාරයෙන්ද, වාණිජකරණය කරන්න හදන්නේ කොයි ආකාරයෙන් ද කියන එක, ගරු සභාපතිතුමනි. මේක ඉතාම අවශ්‍ය දෙයක්. මේකේ cost reflective - වියදමක් ඇති කරන, ආදායමක් උපයන - මාර්ගයක් තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පෙන්වා දීලා තිබෙන්නේ. මම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එච්චර හොඳයි කියන මනුස්සයෙක් නොවෙයි. අපි කටයුතු කරන්න ඕනෑ ශ්‍රී ලංකාවේ තිබෙන experience එකෙන්. ඒගොල්ලන්ට වැඩිය අපේ රටේ දක්ෂයෝ ඉන්නවා. පුදු හමක් තිබෙන කෙනෙක් ඇවිල්ලා කිව්වා කියලා අපි පිළිගන්න ඕනෑ නැහැ. නමුත් අපේ රජයේ නිලධාරින්ට කොන්දක් තිබෙන්න ඕනෑ ඒගොල්ලන්ට කියන්න, ඇයි අපි වෙනසක් ඉල්ලන්නේ කියලා. ආදායම මෙහෙම උපයනවා, වියදම මෙහෙම අඩු කරනවා කියලා අපි කිව්වොත්, ඒගොල්ලන් ඒක පිළිගන්න ඕනෑ. ඒ අය සානාවල, ටැන්සානියාවල තිබෙන උපක්‍රම මෙහේ පාවිච්චි කරලා හරියන්නේ නැහැ කියන එක මම මේ අවස්ථාවේ ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමැතියි.

මම මෙතෙක් දුරට මේ කථාව ගෙනිච්චේ අපි ඉදිරියේ තිබෙන ප්‍රශ්නය මොකක්ද කියන එක පෙන්වන්නයි, බිමල් ඇමතිතුමනි. අවුරුදු පහක, අටක කාලාන්තරය තුළ US Dollars 8 billion විතර වියදමක් දරන්න අවශ්‍යයි. ඒ කියන්නේ රුපියල් ට්‍රිලියන 2,400ක වියදමක් දරන්න තිබෙනවා, මේ අවුරුදු පහත්, අටත් තුළ. ලෝකය අද ගමන් කරන්නේ පුනර්ජනනීය බලශක්ති - renewable energy - නිෂ්පාදනය තුළ. ඒක නිසා ලංකාව ඒ සඳහා හැඩගස්වන්න අවශ්‍යයි. ඒක නිසා තමයි මම ඇමතිතුමාගෙන් ප්‍රශ්න ගණනාවක් ඇහුවේ. ඔබතුමා හිතුවා, දේශපාලන අරමුණින් අහනවා කියලා. එහෙම හිතුවත් කමක් නැහැ. අපට වැදගත් වෙන්නේ රටට හොඳක් කරන්නේ කොහොමද කියන එකයි. ඉන්ධනවලට වියදම් කරන එක නාස්තියක්. අපේ ස්වභාව ධර්මයෙන් අපට පුනර්ජනනීය නිෂ්පාදනයක් කරන්න පුළුවන් නම් ඒ සඳහා රුපියලක්, දෙකක් වැඩිපුර ගෙව්වත් සියයට 100ක් ලංකාවේ නිෂ්පාදනයක් වෙනවා. හැබැයි, ඉන්ධන සඳහා සියයට 75ක් රටින් පිට යනවා. ඒවාට යම් විසඳුමක් ලබා දිය යුතුයි කියන අරමුණින් තමයි මම මේ දේවල් අහන්නේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා ළඟ තිබෙන දත්ත අනුව මෙගාවොට් 4,000ක් සෝලාවලින් නිෂ්පාදනය කරන්න පුළුවන්. ඒ සෝලා ව්‍යාපෘති තිබෙන්නේ යාපනය, කප්පල්තුරේ, හම්බන්තොට, මොනරාගල, ත්‍රිකුණාමලය, මඩකලපුව කියන ප්‍රදේශවල. ඊට පස්සේ අපට සුළං - wind - බලයෙන් මෙගාවොට් 2,000ක් හොයා ගන්න තිබෙනවා. ඒක කරන්න තිබෙන්නේ මන්නාරම, කිලිනොච්චිය, ත්‍රිකුණාමලය, මඩකලපුව, හම්බන්තොට, මොනරාගල කියන දිස්ත්‍රික්කවල. මේ තමයි නිෂ්පාදනය කරන්න හැකියාව තිබෙන ප්‍රමාණය. මෙගාවොට් 700ක් තිබෙනවා pumped storages වල. Victoria Reservoir එකයි, Victoria downstream එකයි මඟින් අපට ඒ ප්‍රමාණය නිෂ්පාදනය කරන්න පුළුවන්. මේ විධියට බලශක්තිය නිෂ්පාදනය කිරීම තමයි අවශ්‍ය වෙන්නේ. Battery Energy Storage System - BESS - එක ඇති කිරීම තුළින් ඉන්ධනවලින් නිෂ්පාදනය කරන ප්‍රමාණය අපට අයින් කරන්න පුළුවන්. ඒ BESS එක තුළින් මෙගාවොට් 1,400ක නිෂ්පාදනයක් කරන්න පුරෝකථනය කර තිබෙනවා. ඒකේ අන්තිමට storage කරන්න තිබෙන්නේ, කොළඹ, හම්බන්තොට සහ හබරණ. හබරණ තමයි ඔබතුමන්ලාගේ storage hub එක විධියට control කරන්න හදන්නේ. බලන්න BESS එකට දීලා තිබෙන දේ.

ඊළඟට මම මේ වෙලාව උපයෝගී කර ගන්නවා, Operating Performance Highlight එකේ 2025 පළමුවැනි කාර්තුව ගැන කියන්න. CEB එකේ ක්‍රියාත්මක වෙන එක ඒකකයක් නිෂ්පාදනය කරන්න ඉන්ධනවලට රුපියල් 49.75ක් වැය වෙනවා. IPP thermal එකේ එක ඒකකයක් රුපියල් 73.97යි. මේ දෙක අතර වෙනස කිව්වාම හිතන්න එපා, පෞද්ගලික අංශයේ රුපියල් 25ක් කියලා. රුපියල් 49ට හරි, 50ට හරි නිෂ්පාදනය කළත් එහි capital cost එක පාවිච්චි කරලා නැහැ. ඒකත් එකතු කළාම පෞද්ගලික අංශයට රුපියල් 73.97ක් වැය වෙනවා. ඊට පස්සේ ගල් අඟුරුවලට රුපියල් 22යි. පුනර්ජනනීය නිෂ්පාදනය සඳහා රුපියල් 21යි. එහෙම නම් ඔබතුමන්ලා බලනවා ඇති, ඇයි මේ BESS එකට මේක කරන්න බැරි කියලා. මම හැම දවසේම අහන්නේ

[ගරු රවි කරුණානායක මහතා]

එයයි. එදා තිබුණු ආණ්ඩුවට යම් විධියේ උනන්දුවක් තිබුණා, ඒ දේ ඉෂ්ට කරන්න. ඒගොල්ලන් යම් දේවල් සිදු කළා. ඔබතුමන්ලා BESS එක රුපියල් 45.50කට ගෙනැල්ලා දීලා තිබෙනවා. ඒ proposals ඇති කරන කොට රජයේ නිලධාරින් ඒක ඉෂ්ට නොවන විධියට කටයුතු කරලා තිබෙනවා.

සාමාන්‍යයෙන් කොම්පැනියකට හෝ යම් භාණ්ඩයකට අවුරුදු 20ක කාල පරිච්ඡේදයක් තිබුණොත්, අවුරුදු 10ක කාල පරිච්ඡේදයක් අරගෙන ගිවිසුම් ගැහුවොත් තමන්ගේ වියදම ඒ අවුරුදු 10 තුළින් ගන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, Battery Energy Storage System තුළ life circle එක අවුරුදු 20ක් තිබෙනවා. හැබැයි, අවුරුදු 10කට ගත්තාම අනිවාර්යයෙන්ම වියදම වැඩි වෙනවා. මෑතකදී WindForce සමාගම ටෙන්ඩර් 20කින් 17ක් දිනලා තිබුණා. ඒකේ BESS එකට ලැබුණු rate එක රුපියල් 17ක් තිබෙනවා. පුනර්ජනනීය නිෂ්පාදනය එකතු කළාම රුපියල් 32යි. රුපියල් 32ට firm energy තිබුණාම, ඔබතුමන්ලා ඉන්ධනවලට ගෙවන රුපියල් 75, 80, 90 කියන එක නවත්වන්න පුළුවන් නේද? මෙන්න මේක තමයි අපි පෙන්වන්න හැදුවේ. මේක අධෛර්යවත් කරන්න එපා. අවුරුදු 10ට rate එක රුපියල් 17ක් නම්, මේක අවුරුදු 20ක් කළා නම් හරි. අද ඒ අය දරනු ලබන ප්‍රාග්ධන වියදම ඉදිරියටත් ඒ විධියට බලපානවා. මේ නිසා තමයි මම ඔබතුමාගෙන් නිරන්තරයෙන් අහන්නේ, ඇයි මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ නැත්තේ කියලා.

Duty-free තිබුණේ නැහැ කියන එක සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 27 (2) යටතේ මම ප්‍රශ්නයක් ඇහුවා. මම අගය කරනවා මෙන්න මේක.

මම ස්ථාවර නියෝග 27(2) යටතේ ඒ ප්‍රශ්නය ඇහුවාම, මුදල් ඇමතිතුමා මීට මාසයකට ඉස්සෙල්ලා ගැසට් එකක් ගැහුවා. ඒ කියන්නේ, මේක යම් විධියක bonded storage එකක් තුළින් කරන්න පුළුවන් කියලා. ඒ ගමන හරි. එක්සත් ජාතික පක්ෂය ඇතුළුව එදා තිබුණු ආණ්ඩුවල අවුරුදු 76ක ශාපය කියලා කිව්වත්, ඔබතුමන්ලාත් එතැනට ගමන් කරනවා. ඒ නිසා තමයි මම හැම වෙලාවේම කියන්නේ, ඔබතුමන්ලා ගමන් කරන්නේ UNP මාර්ගයේ කියලා. අපි කියනවා, ඒක හරියි කියලා. මොකද, UNP එකේ අපි එදා හොඳයි කිව්වාට පස්සේ අද නරක් වෙන්න බැහැ. නමුත්, ඔබතුමන්ලා දකුණට සිග්නල් දාලා වමට හැරෙන එක ගැන තමයි අපි හැම වෙලාවේම මතක් කරන්නේ.

අපේ රටත් නූතන ලෝකය කරා ගමන් කරන අවස්ථාවේ, RTCS - Round-The-Clock Solar - කියන එක තිබෙනවා. මේ technology මම වැඩිය දන්නේ නැති නිසා මම අහගෙන ඇවිල්ලා කියන්නේ. අපි ඒවාට භාජන වෙන්න අවශ්‍යයි. හැබැයි මට පෙනෙන විධියට, අපි මේ සම්බන්ධයෙන් න්‍යායාත්මක ගමනක් යනවාට වැඩිය, ප්‍රායෝගිකව කරන්නේ කොහොමද කියලා සොයා බලන්න අවශ්‍යයි. අපි විදුලිය ජනනය කරලාම මදි, සම්ප්‍රේෂණය - transmit - කරන්නත් අවශ්‍යයි. අද ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ නැහැ. අපි මෙගාවොට් 500ක් හැදුවාම ඒ ප්‍රමාණය transmit කරන ප්‍රශ්නය තමයි දැන් ඇතිවෙලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, මේ අවස්ථාවේ ඔබතුමන්ලාට කරන්න projects 6ක් තිබෙනවා. මොකද, 132kV transmission line එක දැන් 220kV දක්වා වැඩිවෙලා, ඒක 400kV දක්වා යන ගමනක් තිබෙන්නේ. ඉතින්, 400kV දක්වා අරගෙන යන්නේ කොහොමද? මම දන්නා විධියට කිලිනොච්චි-හබරණ, හබරණ-ත්‍රිකුණාමලය, හබරණ-මන්නාරම, හම්බන්තොට-මොනරාගල, වික්ටෝරියා-කිරිදිවැල, හබරණ-වික්ටෝරියා වශයෙන් තිබෙනවා. අන්තිමට හබරණ තමයි collecting centre එක විධියට තිබෙන්නේ. ඉතින්, මේ ගමන අපි ඉතා ඕනෑකමින් ගෙනයන්න අවශ්‍යයි. මම මෙතෙක් කිව්වේ, අපි මේ කාර්යය ඉෂ්ට කරන්නේ කොහොමද කියන එක ගැනයි.

මම මේ අවස්ථාවේ තවත් කාරණයක් කියන්න ඕනෑ. We must ensure that we are able to absorb these investments into the country. Hon. Bimal Rathnayake, Rs. 8 billion of investment with roughly a Rs. 2.4 trillion investment over the next seven, eight years would be too much for the economy to absorb. So, it has to have the absorption power. Now, the Central Bank is independent and they can suddenly say, " I am sorry, you are basically having too much heating on the economy." That is problem, I always say. අපේ ජනාධිපතිතුමාත් කිව්වා නේ, මහ බැංකුව රටේට භයයි කියලා. එහෙම කිව්ව එකේ අර්ථකථනය මොකක්ද? ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, මොකද, මම ප්‍රශ්න තුන හතරක් ඇහුවා කියලා ඔබතුමා දන්නවා. මම හිතන විධියට, ශ්‍රී ලංකා මහ බැංකුව ස්වාධීන වුවත්, ඒගොල්ලන්ගේ යම් දර්ශනයක් තිබුණත්, මේ රටේ තිබෙන බාධකය තමයි මහ බැංකුව. ඒ නිසා තමයි මම හැම අවස්ථාවේම මේ ගැන කථා කරන්නේ. වෙන කිසිවක් නිසා නොවෙයි. අපට ඉමහත් ප්‍රශ්න ඇති කළා. ඔබතුමාට වෙනසක් පෙනෙන්නේ නැහැ. දැන් උද්ධමනය වැඩි වෙන්න පටන් ගන්නවා. විදුලි බලය අඩු වුණාමත් ඔබතුමන්ලා fiscal පැත්තෙන් බණින්නේ පෙර තිබුණු ආණ්ඩුවලට. ඒ වාගේම විදුලි බලය අඩු නොවෙන්නේත් මෙන්න මේකයි කියලා කියන්න පටන් ගන්නවා. මම ඒක මීට කලිනුත් කියලා තිබෙනවා. ඒ වාගේම මට සතුටක් දැනෙනවා, මේ අය අපට භයයි කියලා ජනාධිපතිතුමාත් කියලා තිබෙන නිසා. Monetary and fiscal policy එක තුළින් අපි ඒක ලබා ගන්න අවශ්‍යයි. 2022 දී බිලියන 85ක් ලෙස තිබුණු අපේ GDP එක අද බිලියන 75ට අඩුවෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have only two more minutes of your allocated time.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, එතුමාට අපේ පැත්තෙන් අමතර කාලයක් ලබා දෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Total debt-to-GDP ratio is 104 per cent. මේ කථා කරන මොහොත වන විට GDP එක බිලියන 102ක් කිව්වා. ඒක හරි; you are right. මොකද, රුපියල අවප්‍රමාණය වෙලා තිබෙන නිසා. ඩොලරය රුපියල් 280ට තිබෙනකොට ඒක බිලියන 88යි, 89යි. Debt stock එක වැඩි වෙනකොට GDP එක වැඩි වෙලා තිබෙනවා.

1977 දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා සියයට 8ක, 10ක, 12ක වර්ධන වේගයක් දක්වා රට අරගෙන ගියේ මෙන්න මේ නිසයි. එදා මේ වර්ධන වේගය වැඩි වුණේ, අවුරුදු 30න් කළ යුතු මහවැලි

ව්‍යාපාරය අවුරුදු 5න් කරපු නිසායි. අද එහි ප්‍රතිලාභය විධියට තමයි ඔබතුමාට විදුලිය ඒකකයක් රුපියල් 2.50ට නිෂ්පාදනය කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. එහි අතිරික්තය නිසා තමයි, අද විවල තිබෙන ප්‍රශ්නය යම් විධියකින් අඩු කරගන්න ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමාට පුළුවන් වෙලා තිබෙන්නේ. එතැනින් වී මෙට්‍රික් ටොන් 4.5ක් ගන්න පුළුවන්. මහවැලිය තිබුණේ නැත්නම් මොකක්ද කරන්නේ? නැවතත් ආනයනය කරන්න වෙනවා. ඒකයි මම කියන්නේ, මේ සඳහා උපරිම මිලක් දාලා හරියන්නේ නැහැ, නිෂ්පාදන කටයුතු සඳහා තරගකාරිත්වයක් ඇති කරන්න ඕනෑ කියලා.

So, Sir, we must be able to absorb this into the economy. And also, the capital incentive part has to be encouraged. Capital absorption and the capital admission factor should be there and also, sensitivity and sincerity. On this particular basis, I state that the World Bank, JBIC, ADB and AIIB very clearly said that we have got to ensure that we move on to LNG. At that particular moment, they looked at Japan, India, USA, China and Pakistan and selected a company that does not produce LNG. Here, you must be politically sensitive. When production and our ports depend on China, when our trade depends on India and China, our Foreign Policy should be in line with the development of the country, the necessities of Sri Lanka and not for any other person's interests. So, India and China are very important; the USA is required for intentional relations; the European Union is needed for market access. You cannot sacrifice one for the other. So, that is why I say that political sensitivity has got to be looked at in all these, Sir. I am sure that these are matters you all should looked into when developing this country to be fast and robust in the future.

Sir, if we take the power plants, first, I looked at their generation part. But, now, we have got to ensure a proper retiring process for those plants.

මම දන්නා විධියට, කැලණිතිස්ස විදුලි බලාගාරය මෙගාවොට් 165යි. 2030 වර්ෂය වෙනකොට මේක සම්පූර්ණයෙන්ම වසා දමන්න වෙනවා. ඊළඟට, කිරිබත්ගොඩ මෙගාවොට් 190ක් තිබෙනවා. ඒක 2030 වර්ෂය වෙනකොට retire කරන්න තිබෙනවා. එතකොට power barge එක තිබෙනවා, Colombo Port එක ඇතුළේ. ඒක මෙගාවොට් 100යි. ඒකත් 2032 වර්ෂය වෙනකොට වසා දමන්න තිබෙනවා. ඊළඟ එක, අපි කථා කරන නොරොච්චෝලේ බලාගාරය. විදුලිබල අවශ්‍යතාවෙන් සියයට 45ක් නිෂ්පාදනය කරන්නේ ගල් අඟුරුවලින් - coalවලින්. ඒ මෙගාවොට් 900ත් 2032 වර්ෂය වෙනකොට retire කරන්න පටන්ගෙන, 2040 වර්ෂය වෙනකොට වහලා ඉවර කරන්න ඕනෑ. මේකේ economic term එකක් තිබෙනවා; මේ power plant එක "derate" කරන්න තිබෙනවා. අද රුපියල් 21ට නිෂ්පාදනය කරන විදුලි ඒකකය තව අවුරුදු 7කින් අඩු වෙන්න පටන් ගත්තොත් - 2032 වෙනකොට මේක අඩු වෙනවා නම්- එය කරන්න බලන්නේ කොහොමද? ඒ නිසා තමයි මම කියන්නේ, තෙල් මාෆියාව ගැන කියන අවුරුදු 76 ශාපය පැත්තකට දමලා ඒ ගැන ප්‍රායෝගිකව හිතලා කටයුතු කරන්න කියලා. මෙගාවොට් 1,600ක් තව අවුරුදු 7කින් අඩු වෙනකොට නිෂ්පාදනය කරන්න අවශ්‍ය දේවල් තිබෙන්නේ කොහේද?

තවත් කාරණයක් කියන්න තිබෙනවා, ගරු සභාපතිතුමනි. අවුරුදු 50කට ඉස්සෙල්ලා එක්සත් ජාතික පක්ෂය පටන් ගත්ත වික්ටෝරියා, කොත්මලේ, රන්දෙනිගල, රන්ටැඹේ වාගේ ජල විදුලි බලාගාරවලින් අද රුපියල් 2.50ට ඒකකයක් ගන්නේ එදා කරපු දේවල් නිසායි. ඒක ක්ෂණිකව කරපු වැඩ පිළිවෙළක් නොවෙයි. ඒක, අනාගතය ගැන හිතලා කරපු දෙයක්. මේවායේ තිබෙන අවුරුදු 50ක් තරම් පරණ මැෂින් දැන් අලුත්වැඩියා කරන්න අවශ්‍යයි. මේ රුපියල් බිලියන 8 තුළ රුපියල් ට්‍රිලියන 2.4ක වියදමක් දරන්න තිබෙන්නේ, මෙන්න මේවා නිවැරදි කරන්නයි. ඒක කොහොමද කරන්නේ? රජයට මේ සල්ලි මොන විධියකින්වත් හොයා ගන්න බැහැ. රනිල් වික්‍රමසිංහ, තමන්ගේ දේශපාලන අනාගතය පැත්තකට දමලා රට හදනවා කියලා ආදායම වැඩි කළත්, මේ ගමන එහෙමම ගියා. රජයකට මේ වියදම තනිව දරන්න බැහැ, පෞද්ගලික අංශය නැතිව. පෞද්ගලික අංශය තමයි දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 60ක්, 65ක්, 70ක් නියෝජනය කරන්නේ. මම ඉතාම කනගාටුවෙන් මේක කියන්නේ. මේකේ හරි, වැරදි කියලා දෙයකුත් තිබෙනවා. ඒ වාගේම මෙතැනදී ප්‍රායෝගික ගමන දිහාත් බලන්න වෙනවා.

ඔබතුමන්ලාගේ LTL එක යටතේ තිබෙනවා, subsidiary companies. ඒකේ තිබෙන ප්‍රශ්න ටික විසඳා ගන්න ඕනෑ. නමුත්, මේ සමාගම පොළොවේ ගැසීමෙන් ප්‍රතිලාභයක් ලැබෙනවා කියලා ඔබතුමන්ලා හිතනවා නම් අපි යන්නේ භයානක ගමනක්. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මුහුණ බලන්නත් බයයි, ඔබතුමා වෙලාව ඉවරයි කියන්න හදන නිසා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
You have one more minute.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම හිතනවා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක, මා මිත්‍ර ගයන්ත කරුණාතිලක මැතිතුමා මට තව මිනිත්තු දෙක තුනක කාලයක් ලබා දෙයි කියලා. මොකද, අපට අවශ්‍ය වන්නේ මේ ප්‍රශ්න කොයි ආකාරයකට හෝ විසඳන්නයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එතුමාට විනාඩි 5ක් විතර දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ආණ්ඩුවෙන් විනාඩි 4යි, අපෙන් විනාඩියයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අන්න හරි, මේ අය කොච්චර නම්‍යශීලිද බලන්න.

මෙගාවොට් 350ක සහස්දනව් බලාගාරයේ ගිවිසුම sign කරලා, ඔයගොල්ලෝ ගිහිල්ලා ඒක විවෘත කළා. ඊට පස්සේ හරිනි අමරසූරිය අගමැතිනිය ගිහිල්ලා කියනවා, අපි ආසියාවේ අඩුම මිලට විදුලිය නිෂ්පාදනය කරනවා කියලා. සිහින ලෝකය හොඳයි. නමුත්, අපි ඒකට ගමන් කරන්නේ කොහොමද? අපට කොළඹ ඉඳන් යාපනයට යන්න පුළුවන්, කරත්තයෙන්, බයිසිකලයෙන්, හෙලිකොප්ටරයෙන්. හෙලිකොප්ටරයෙන් යන්න පුළුවන් ගමන එහෙමම තියලා, කරත්තයෙන් යන්න පුළුවන් ගමන තමයි අපි නවත්වන්න අවශ්‍ය වන්නේ. සහස්දනව්

[ගරු රවී කරුණානායක මහතා]

බලාගාරයෙන් මෙගාවොට් 350ක් දුන්නාම, සාම්පූර් බලාගාරයේත් මෙගාවොට් 100ක් තිබෙනවා කියලා අපි දන්නවා. පුනර්ජනනීය බලශක්තියෙන් - renewable energyවලින්- මෙගාවොට් 300යි. මට කනගාටුයි, සහස්දනවි බලාගාරයේ ගිවිසුම තමයි අත්සන් කළේ, සොබාදනවි බලාගාරය තමයි පටන් ගත්තේ. ඒකට තමයි IPO එකක් ගන්න හැදුවේ. IPO එක දැම්මාම ඔබතුමන්ලාගේ අතිදක්ෂ පුද්ගලයින් ලවා ඒ කටයුතු කරන්න ගිහිල්ලා IPO එක නැතිවුණා නේද? ඒ මොකද? පෞද්ගලික අංශය පැත්තෙනුත් අපි ඒක බලන්න අවශ්‍යයි. ඔබතුමන්ලා දන්නවා, ව්‍යාපාරයක් කරනකොට පෞද්ගලික අංශය drive කරන්නේ profit orientation සඳහා කියලා. ඒකෙන් ආණ්ඩුවට ලාභයක් ලැබෙනවා. ඒක තමයි සියයට 30ක බද්ද. අපි කැමැති වුණත්, නැතත් අද හැම කොම්පැනියකම සියයට 33ක අයිතියක් රජයට තිබෙනවා. බදුවලින් සියයට 30ක් තිබෙනකොට, VAT එකෙන් සියයට 18ක් තිබෙනකොට, SSCLවලින් 2.5ක් තිබෙනකොට ආණ්ඩුව නොකියා කියනවා, තමන් තමයි මෙතැන ඉන්න වැඩිම shareholder කියලා.

ඔබතුමන්ලා මේ අවස්ථාවේදී LTL Holdings එකත් එක්ක කථා කරන්න අවශ්‍යයි. මොකද, ඒගොල්ලන්ට දක්ෂතාවක් තිබෙනවා. මමත් ඒක දන්නවා. ඒගොල්ලන් අතිදක්ෂ ලෙස ව්‍යාපාර කරනවා. හැබැයි, ඒ අයගෙන් ගන්නකොට tax අය කරලා ගන්න. කොම්පැනිය පොළොවේ ගැසීම තුළින් ප්‍රතිලාභයක් ලැබෙනවා කියලා හිතනවා නම්, ඒ ගමන වැරදියි කියලා මම හිතනවා. මීට පෙර තිබුණු ලොකුම IPO එක තමයි, ඩයලොග් එක. ඒක රුපියල් බිලියන 8යි. මේක රුපියල් බිලියන 20යි. මම LTL Holdings එක ගැන කිසිම දෙයක් කියන්නේ නැහැ. මම ඒගොල්ලන් එක්ක සටන් කරලා, රුපියල් බිලියන 2ක් tax ගෙවපු කොම්පැනියට අන්තිමට රුපියල් බිලියන 16ක් ගෙවන්න වෙන විධියට කටයුතු කළා, අපේ කාලය තුළ. ඒක, ඒගොල්ලන්ව හුරතල් කරලා කරන දෙයක් නොවෙයි. හැබැයි, ඒගොල්ලන්ගේ දැනුවත්කමට ගෞරව කරන්න අවශ්‍යයි.

CEB එකේ දක්ෂ ඉංජිනේරුවෝ ඉන්නවා. නමුත්, ඒගොල්ලන්ගේත් දැනුම තිබෙන්නේ limited framework එකක් තුළ. අපි මීට වැඩිය ගැඹුරින් හිතන්න අවශ්‍යයි. අපි ඉන්දියාවෙන් power-energy connection එක ගන්න අවශ්‍යයි. ගරු සභාපතිතුමනි, අපි ඒ තුළ ඉන්දියාවේ companies පුළුවන් තරම් මෙහාට ගෙනැල්ලා නිෂ්පාදන වියදම අඩු කරන්න අවශ්‍යයි. ඉන්දියාවට බය වෙන්න එපා; ඉන්දියාව සමඟ එකතු වෙන්න. චීනය ගැන කියලා බය කරන්න එපා. චීනයත් පාවිච්චි කරන්න. ඒගොල්ලන්ගේ deep-pocket capital එක අපට අවශ්‍යයි. ඒ ප්‍රාග්ධනය තුළ අපි ඉදිරියට යන්න අවශ්‍යයි.

දැන් බලන්න, එදා තිබුණු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව LTL Holdings එකට අවස්ථාව දුන්නා, රුපියල් මිලියන 96ක් සමඟ. ඒ කියන්නේ 1980දී රුපියල් මිලියන 11යි, ඊට පසුව මම හිතන විධියට 1996දී රුපියල් මිලියන 85යි වශයෙන්. දැන් ඔබතුමන්ලාට කොම්පැනියක් තිබෙනවා. LTL Holdings එකේ value එක රුපියල් බිලියන 100යි. ගණකාධිකාරිවරුන් අන්තිමට බලන්නේ balance sheet එක. කථාව නොවෙයි, කයිවාරුව නොවෙයි, වෙන්න පුළුවන්ද, නැද්ද කියන එක නොවෙයි. වසන්ත සමරසිංහ ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් නොයෙක් වෘත්තීමය අයිතීන් ඇති කළා. ඒ වෘත්තීමය අයිතිය ඇති කිරීම තුළ ඔබතුමන්ලා පුළුවන් තරම් tax එක ගන්න ඕනෑ. අහිංසක මිනිස්සුන්ට ගෙවනවා නම් ඒකට බාධාවක් ඇති කරන්නේ ඇයි? ඔබතුමා විපක්ෂයේ title එක ගලවලා කැබිනට් ඇමති වුණාට පසුව ඔබතුමන්ලාත් අපි හිතන ආකාරයට කටයුතු කරගෙන යනවා. ලාල් කාන්ත ඇමතිතුමා, බිමල් රත්නායක ඇමතිතුමා, වසන්ත සමරසිංහ ඇමතිතුමා, විජිත හේරත් ඇමතිතුමා අන්න, එක්සත් ජාතික පක්ෂය එදා හිතපු ගමන හරියාකාරව ගෙන යන්න පටන් අරගෙන තිබෙන්නේ.

මම මේ අවස්ථාවේ ඉල්ලන්නේ එක දෙයයි. රුපියල් බිලියන 100ක්, රුපියල් මිලියන 96කින් ගන්න පුළුවන් නම් මොකටද බාධා කරන්නේ? ඒකෙන් tax එක ගන්න. Tax එක හැටියට සියයට 35ක් එනවා. වක්‍ර බදු විධියට තව සියයට 22ක් එනවා, VAT එකෙන් සහ අනික් ඒවායෙන්. එම නිසා මම මේ සම්බන්ධව හෙව්වා. මොකද, මේ companiesවලට අශෝභන විධියට පහර ගහන එක එච්චර හොඳ නැහැ. මොකද, පෞද්ගලික අංශය තමයි දළ දේශීය නිෂ්පාදනයට සියයට 70ක් ගෙනෙන්නේ. ඔබතුමන්ලා එක පැත්තකින් කියනවා, අපි සියයට 7ක වර්ධන වේගයක් ගෙනෙන්න ඕනෑය කියලා. නමුත්, වර්ධන වේගයක් ගෙනෙන්න තරම් capital interaction එක මදි. ආණ්ඩුවේ තිබෙන්නේ ඉතිරි කිරීම් සියයට 11යි. පෞද්ගලික අංශයෙන් ඇවිල්ලා තිබෙන්නේ සියයට 12යි. හැබැයි, සියයට 40ක විතර ආයෝජන අවශ්‍යයි, මේ රටේ සංවර්ධනයට.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Ravi Karunanayake, your time is up.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I know, Sir. I will just take one more minute.

I am saying this for the sake of the country. ඒගොල්ලන් අදට රුපියල් බිලියන 10ක tax ගෙවනවා වාගේම, මම හිටපු කාලයේ ඒගොල්ලන් ගෙවපු නැති තව රුපියල් බිලියන 16ක dividend එකක් ලබා ගත්තා. CEB එකට total dividend එක විධියට රුපියල් බිලියන 22ක් ගෙවලා තිබෙනවා. එම නිසා ඔබතුමන්ලාගේ model එක වෙනස් කරන්න අවශ්‍යයි. මෙතැන රවලා, ගහලා, කොටලා ඒ වාගේ දේවල් කරනවාට වැඩිය මම හිතන විධියට අර ඉංග්‍රීසි භාෂාවේ තිබෙන විධියට, "you can catch more flies with honey than with vinegar". අන්න ඒ නිසා ඔබතුමන්ලා රටේ අභිවෘද්ධියට මේක උපයෝගී කර ගන්න. මොකද, අද වනකොට විදුලිය ඒකකයක් රුපියල් 26ට, රුපියල් 27ට, රුපියල් 30ට නැතිව රුපියල් 18ට ගෙනෙන්න පුළුවන් නම් එතකොට සියයට 6කින් තරග කරන්න පුළුවන්. මම ප්‍රායෝගික අත්දැකීම් එක්ක මේවා කියන්නේ. Macktiles ආයතනය අපට කිව්වේ, ඔවුන්ට tile companies එක්ක තරග කරන්න බැහැ, මොකද, දැනට තිබෙන විදුලි ඒකකයේ මිල වැඩියි කියලා. ඒක අඩු වෙන්න පටන් ගත්තාට පසුව ඒගොල්ලන්ට තරග කරන්න බැරි නිසා පුනර්ජනනීය බලශක්තියෙන් විදුලිය ජනනය කරන්න ඒගොල්ලන්ගේ වහලයට 10 megawatt solar panels දැම්මා. දැන් ඒගොල්ලන්ට ඉන්දියාවත් එක්ක තරග කරන්න පුළුවන්. While I mention that with regard to විදුලි බලය, Ceylon Petroleum Corporation එක ගැන කියන්න තිබෙන්නේ එක දෙයයි.

අපි ඒගොල්ලන්ට කියන්න ඕනෑ, පුළුවන් තරම් ආයෝජන මේ රටට ගෙනෙන්න කියලා. IMF එකට කියන්න බැහැ, මෙදා මේ රටට ණය ගෙවන්න, මේ රටේ ආයෝජන කරන්න බදු සහන දෙන්න බැහැ කියලා. ඒගොල්ලන්ට කරුණාකරලා කියන්න, නැහැ, අපේ බදු ටික අපි ගෙවනවා, අපේ ආදායම අපි මෙහෙම

හොයනවා, හැබැයි, අපේ බදුවලට ගෙවන සහනය අපට දෙන්න කියලා. IMF එකෙන් ඒගොල්ලන්ට කියන්න අවශ්‍ය වන්නේ, මෙහෙම තමයි කරන්න ඕනෑ කියලා. ආයෝජන රුපියල් බිලියන 4.5ක් ගෙනෙනවා කිව්වා නේ. ඒගොල්ලන් අත්සන් කළා නේ, රුපියල් බිලියන 3.7කට. එතකොට ඉතිරි 800 හෙමින් අඩු වුණා කිව්වා නේ. හැබැයි, ඔබතුමන්ලා දැන් කියනවා, වතුර purification එකට රුපියල් මිලියන 800යි කියලා. ඒක කොහේටද යන්න තිබෙන්නේ?

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Ravi Karunanayake, your time is up; you have gone far beyond the allotted time.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I am just finishing up.

එම නිසා, මේ ආයෝජනය ගෙනෙන එක හොඳයි. කරුණාකරලා ඉන්දියාවට අවස්ථාවක් දෙන්න, චීනයට අවස්ථාවක් දෙන්න. නමුත්, එකක් තිබෙනවා. ඒගොල්ලන්ගේ නිෂ්පාදනයට සියයට 20ක් දෙන්න ගිහිල්ලා ඒගොල්ලන් production එක 200ට ගෙනාවාම සියයට 80ක් ගියොත් CPC එක වහන්න ඕනෑ. එම නිසා මේවා ගැන හිතන්න. Power line එක ගෙන්වා ගන්න. මේවා තුළින් තමයි අපේ අලුත් ගමන ආරම්භ වෙන්නේ. ඉතින්, ඔබතුමන්ලා පසුගිය අවුරුදු 76ට ශාප කරන්නේ නැතිව දැන් වැඩ කරන්න. මේ ට්‍රිලියනය හොයලා දීලා තිබෙන්නේ ඒ අවුරුදු 76 තුළ කටයුතු කරපු එක්සත් ජාතික පක්ෂයේ වැඩ පිළිවෙළ තුළින්. ඊට පසුව අනෙක් ආණ්ඩුත් උදව් කරලා තිබෙනවා. නමුත්, කරුණාකරලා අපි මේ කටයුත්තේ බහුතරය අරගෙන මේ රට ඉදිරියට ගෙන යමු. අපට අවශ්‍යව තිබෙන විධියට අපි මේ කටයුතු නිර්දේශපාලනීකරණය කරලා හොඳ රටක් හදමු.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. D.V. Chanaka. You have 15 minutes.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Minister of Energy?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු සභාපතිතුමනි, මෙතුමා කියපු කාරණාවට අදාළව පොඩි කාරණා දෙකක් පැහැදිලි කරන්න තිබෙනවා. විශේෂයෙන්ම ඉන් එකක් තමයි, LECO එකේ වාහන මිලදී ගැනීමට අදාළ කාරණය. ඇත්තටම ඒගොල්ලන් Budget එකෙන් කලින් ඒකට වෙන් කරගෙන තිබෙනවා, රුපියල් මිලියන 622ක්. හැබැයි, පසුව ඒ මුදල රුපියල් මිලියන 466ට අඩු කරලා තිබෙනවා. ඒ, වාහන 17ක් සඳහායි. ඒ කියන්නේ, මෝටර් රථ 7කුත්, ඩබල් කැබ් රථ 10කුත් විධියට.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, කිසිම ප්‍රශ්නයක් නැහැ.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
නැහැ, නැහැ. පොඩ්ඩක් ඉන්න, මම ඒ ගැන පැහැදිලි කරන්නම්. *[බාධා කිරීමක්]* මම ඒ ගැන පැහැදිලි කරන්න ඕනෑ. මොකද, කාලය අපතේ යනවා. ප්‍රශ්නයක් නැහැ. පැහැදිලි කිරීමක් මම කරන්නේ. එහි සභාපතිතුමාගේ රථය දිගින් දිගටම breakdown වෙන හින්දා රුපියල් මිලියන 2, 3 වැය වෙනවා. ඒක BMW එකක්. එම නිසා ඒ වෙනුවට වෙන රථයක් ඕනෑ කියලා ඒගොල්ලන් කියලා තිබෙනවා. හැබැයි, LECO එකේ හිටපු සභාපති ජනක අලුත්ගේ මහත්මයා දන්නේත් නැතුව ඔහු ලංකාවේ නොහිටපු වෙලාවේදී තමයි, මේ order එක place කරලා තිබෙන්නේ ඒ ආයතනයෙන්. ඒකට අවශ්‍ය පරීක්ෂණයක් කරනවා. ඒක cancel කරන්න අවශ්‍ය උපදෙස් දීලා තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Ravi Karunanayake, please!

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
නැහැ. ඒක එතුමාගේ නමට දමන එකත් අසාධාරණයි. මම කියන්න ඕනෑ, ඒක එතුමාගේ නමට දමන එකත් අසාධාරණයි කියන එක. එතුමා නොදැනුවත්ව මේ ආයතනයේ නිලධාරින් විසින් තමයි ඒක කරලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න. අනෙක් එක තමයි, LTL Holdings එක ස්වේච්ඡාවෙන් IPO එක නැවැත්වුවා. ඒගොල්ලන් අපිට ලිඛිතව දීලා තිබෙනවා, "ඒගොල්ලන්ට දැන් සල්ලි තිබෙනවා. ඒ හින්දා IPO එක ඕනෑ නැහැ" කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඒක හින්දා ඔය කථාව පදනම් විරහිතයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා නිර්දේශ කළා,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. D.V. Chanaka - *[Interruption.]* Hon. Ravi Karunanayake, we are not going into a Debate on this.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, give me only a few seconds.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay, I will give you 15 seconds.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොන company එකද කැමති, තමන්ගේ controlling right එක නැති වෙනවා බලන්න. CPC එකට රුපියල් මිලියන 8.5ක shares දෙන්න කිව්වාම, කවුද ඒකට ඉදිරිපත් වෙන්නේ? පෞද්ගලික අංශය තරග කරන අවස්ථාවේදී රජයෙන් ඇඟිලි ගැසීම නවත්වන්න ඕනෑ. කරුණාකරලා ඔබතුමන්ලා දැන් දකුණට සිග්නල් දමලා වමට හැරෙන්න එපා. ඔබතුමන්ලා යන ගමන හරියට යන්න. නැත්නම් වසන්ත සමරසිංහට වෙන්නේ සල්ලි නැතුව හාල් ගේන්න. ඔන්න ඔය ගමන තමයි තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Ravi Karunanayake, now, I have to call upon the next speaker.

The Hon. D.V. Chanaka. You have 15 minutes and your time starts now.

[අ.භා. 12.19]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු සභාපතිතුමනි, සභාවේ කටයුතු lunch එකට නවත්වනකොට මගේ විනාඩි 3ත් ඉවර වෙලාම නවත්වන්න.

මම ගරු අමාත්‍යතුමාට වාගේම අපේ අලුත් නියෝජ්‍ය ඇමතිතුමාට සුබ පතනවා. පසුගිය වතාවේ අය වැය විවාදයේදී අපි කථා කරනකොට නියෝජ්‍ය ඇමතිතුමා හිටියේ නැහැ. නියෝජ්‍ය ඇමතිතුමා දකුණු පළාතෙන් ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා මම එතුමාට සුබ පතනවා. ඉස්සර මෙහෙම වුණා නම් ඇමතිවරු පැටවු ගහනවාය කියනවා. හැබැයි, අපි එහෙම කියන්නේ නැහැ. බලශක්ති අමාත්‍යාංශය කියන්නේ, අනිවාර්යයෙන්ම ඇමතිවරු දෙදෙනෙක් අවශ්‍ය අමාත්‍යාංශයක්. ඒක හින්දා මම විශ්වාස කරනවා, ඇමතිවරු දෙදෙනෙක් හෝ ඊට වැඩි වුණත් ප්‍රශ්නයක් නැහැ කියලා. ඔබතුමා හොඳට ඒ වගකීම ඉටු කරයි කියන බලාපොරොත්තුවෙන් මම ඔබතුමාට සුබ පතනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රය ගැන කථා කරන්න කලින් මේ ගැන මම කියන්න ඕනෑ. අද උදේ ඉඳන් නලින්ද ජයතිස්ස අපේ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා - එතුමා මෙතැන නැහැ- සහ පොලීසිය භාර අමාත්‍යතුමා කථා කරමින් "දෙරණ" රූපවාහිනී නාළිකාවට ගැහුවා, "අරුණ" පුවත් පතට ගැහුවා. "දෙරණ" රූපවාහිනී නාළිකාවේ පුවත් සාවද්‍යයි, "අරුණ" පුවත් පතේ පුවත් සාවද්‍යයි කියලා පොලිස් වාර්තාව පිළිබඳව අද විශාල ප්‍රහාරයක් එල්ල කළා. ඒ වාගේම, මහජන කැලඹීමක් ඇති කරන්න තමයි, "දෙරණ" රූපවාහිනී නාළිකාව සහ "අරුණ" පුවත් පත සූදානම් වෙන්නේ කියාත් කිව්වා. මට හිතෙන විදියට නීතිය ක්‍රියාත්මක කරලා මාධ්‍ය භය කරන්න ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාත්, පොලීසිය භාර අමාත්‍ය ආනන්ද විජේපාල මහත්මයාත් අද උදේ උත්සාහ කරනවා මම දැක්කා.

හැබැයි, ගරු සභාපතිතුමනි, මම ඊයේ දිනයේ මේ ප්‍රශ්නය මතු කළා. අද උදේ "දෙරණ" රූපවාහිනී නාළිකාවේ පත්තරේ විස්තරේ බලද්දි එහි කියනවා මම අහගෙන හිටියා, පොලිස් වාර්තාව ගන්න ඕනෑ නම් මහජන පොලිස් කමිටුවේ සහතිකයත්, ග්‍රාම නිලධාරි සහතිකයත් අරන් තමයි පොලීසියට යන්න ඕනෑ කියලා. මම මේ ප්‍රශ්නය මතු කළා, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය භාර චන්ද්‍රන අබයරත්න අමාත්‍යතුමාගෙන්. ගරු සභාපතිතුමනි, ඊයේ හැන්සාඩ් වාර්තාව තවම ඇවිල්ලා නැහැ. ඒක නිසා චන්ද්‍රන අබයරත්න අමාත්‍යතුමාගේ ඒ පිළිතුර හැන්සාඩ් වාර්තාවට refer කරලා මම කියන්නම්. "එතුමා මතු කරපු ප්‍රශ්නයට අදාළ පොලිස් වාර්තාව ගන්න මීට පෙර සිවිල් ආරක්ෂක කමිටු තිබෙන කාලයේ සිවිල් ආරක්ෂක කමිටු සභාපතිගෙන් වාර්තාවක් අවශ්‍ය වුණා. ඒ සිවිල් ආරක්ෂක කමිටු මේ වනවිට මහජන ආරක්ෂක කමිටු හැටියට වෙනස් වෙලා තිබෙනවා. ඒ නිසා කලින් තිබුණු ක්‍රියාවලියම තමයි. අලුත් දෙයක් නොවෙයි, මෙකේ නම වෙනස් වෙලා විතරයි කියලා" එතුමා කිව්වා. එතකොට රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමා කියනවා, "පොලිස් වාර්තාව ගන්න ඕනෑ වුණාම අනිවාර්යයෙන් එතුමා ගිහිල්ලා මහජන ආරක්ෂක කමිටුවෙන් නිර්දේශයක් ගන්න ඕනෑ" කියලා. ඒක "දෙරණ" රූපවාහිනී නාළිකාවත් කියනවා. ඒක "අරුණ" පුවත් පතත් කියනවා. හැබැයි, පොලීසිය භාර ඇමතිතුමා කියනවා, "මම ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට යනවා. මම මාධ්‍යයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරනවා" කියලා. අඩුම ගණනේ බොරුවක් කියනවා නම් ඇමතිවරු දෙදෙනා කථා කරගෙන කියන්න. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමා ඊයේ කියනවා, "ඒක අවශ්‍යයි" කියලා. උදේ නලින්ද ජයතිස්සයි, ආනන්ද විජේපාලයි කියනවා,"නැහැ, ඒක අවශ්‍ය නැහැ" කියලා. දැන් අපි කවුරු කියන එකද පිළිගන්න ඕනෑ?

අපට පිළිගන්න වෙන්නේ, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමා කියන දේ. මොකද, මම ළඟ තිබෙනවා, දේශීය නිෂ්කාසන වාර්තා ලබා ගැනීම සඳහා මොරටුමුල්ල පොලිස් ස්ථානයෙන් නිකුත් කරන ලද form එකක්. මේකේ තිබෙනවා, මහජන ආරක්ෂක කමිටු සභාපතිවරුන්ගේ නාම ලේඛනය. ඊට අමතරව, දේශීය නිෂ්කාසන වාර්තාව ලබා ගන්න අවශ්‍ය forms ගැනත් සඳහන්ව තිබෙනවා. ඒ තමයි, අයදුම්කරු විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත, අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත, ඉල්ලුම් කරන ලද ලිපිය, වසමට අයත් ප්‍රජා පොලිස් කමිටුවේ සභාපතිගේ නිර්දේශය, ඊට අමතරව ග්‍රාම නිලධාරිතුමාගේ නිර්දේශය. මම එම ලේඛනය මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මාධ්‍යයට ඇඟිල්ල දික් කරන්න කලින් ඔබතුමන්ලා මොරටුමුල්ල පොලීසියට ගිහිල්ලා බලන්න. ඔබතුමන්ලා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමාගෙන් ඒ ගැන අහන්න. එතකොට දැනගන්න පුළුවන්, කවුද ඇත්ත කියන්නේ කියලා. කැබිනට් මණ්ඩලයේ දෙපැත්තේ වාඩි වෙලා ඉන්න ඇමතිවරු දෙදෙනා මේ ගැන දන්නේ නැහැ. එක්කෙනෙක් කියනවා, මේකට වාර්තාව ඕනෑ කියලා. අනෙක් දෙදෙනා කියනවා, ඕනෑ නැහැ කියලා. ඒක හින්දා මාධ්‍යයට ගහන එක නවත්වන්න.

ගරු සභාපතිතුමනි, මාධ්‍යයට වාර්තා කරන අයගේ මාධ්‍ය සදාචාරය මෙන්න. මම ළඟ මේ තිබෙන්නේ, 2009 "ලංකා" පුවත් පත; ජනතා විමුක්ති පෙරමුණේ පුවත් පත.*[බාධා කිරීමක්]* ඔබතුමාගේ අමාත්‍යාංශය ගැනත් කථා කරනවා, පොඩ්ඩක් ඉන්න.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

"ලංකා" පුවත් පතට මම අවධානය යොමු කරනවා. මේ, යුද්ධය අන්තිම මොහොතේ. "බැංකු කඩා වැටීමේ අවදානමක්." කියලා 2009 ජනවාරි 04වැනි දා සඳහන්ව තිබෙනවා. "ප්‍රභා කාම්බෝජයට පැන යයි." කියලා 2009 ජනවාරි 25වැනි දා සඳහන්ව තිබෙනවා. යුද්ධය පැවති වෙලාවේදී රටේ කැලඹීමක් ඇති වෙන්න කිව්වේ, "ප්‍රභා කාම්බෝජයට යයි" කියලා. අනෙක් පැත්තෙන් කිව්වේ, "බැංකු කඩා ගෙන වැටෙයි" කියලා. මෙහෙම මාධ්‍ය සදාචාරය කරපු අය තමයි අද ඇවිල්ලා "දෙරණ" රූපවාහිනී නාළිකාවට, "අරුණ" පුවත් පතට -මාධ්‍යයට- ගහන්නේ.

ගරු සභාපතිතුමනි, දැන් මම බලශක්ති අමාත්‍යාංශය වෙත අවධානය යොමු කරනවා. ගරු ඇමතිතුමනි, මගේ වෙලාව ගියාට කමක් නැහැ, මම ඔබතුමාගෙන් ප්‍රශ්න කිහිපයක් අහන්න කැමතියි. පළමුවැනි ප්‍රශ්නය මෙයයි. අපි දැක්කා, refinery එකට investor කෙනෙක් ගේන්න ඔබතුමා EoIs කැඳවලා තිබෙනවා. හැබැයි, මේක ඒ කාලයේ කරන වෙලාවේ ඔබතුමන්ලාගේ වෘත්තීය සමිතිය මේකට විරුද්ධ වුණා. සියයට 50කට වඩා -51ක්- තියාගෙන අපි private investor කෙනෙක් ගේනවා කිව්වාම ඔබතුමන්ලාගේ වෘත්තීය සමිතිය එදා විරුද්ධ වුණා. අපි ඒ වෙලාවේදී පළමුවෙන්ම කිව්ව කාරණය තමයි, CPC එකයි, refinery එකයි වෙන් කරන්න ඕනෑ කියන එක. මොකද, CPC එකේ shares දුන්නොත් බිලියන 32ක් මේ අවුරුද්දේ ලාභයි, 2023දී බිලියන 100ක් ලාභයි, 2024දී බිලියන 36ක් ලාභයි, ඒකේ ලාභයත් මේ එන investorට යනවා කියලා අපි කිව්වා. හැබැයි, ඔබතුමන්ලා අද refinery එකේ වටිනාකම තක්සේරු කරලා නැහැ. ඒක separate කරලා නැහැ. එහෙම නොකර investor කෙනෙක් ගෙනාවාම මොකද වෙන්නේ? අර බිලියන 32ක් ලාභ ලබන CPC එකේත් කොටස් ඔබතුමාට ඒ investorට දෙන්න වෙනවා. මම බැලුවා, සම්පූර්ණ EoI එක. මේ වෙද්දී ආයතන දෙකක් නැහැ. ඔබතුමන්ලා කොහොමද refinery එකට investor කෙනෙක් ගේන්නේ, CPC එක separate කරන්නේ නැතුව? ඒක මගේ පළමුවැනි ප්‍රශ්නය.

දෙවැනි ප්‍රශ්නය තමයි, Mannar 50-megawatt ව්‍යාපෘතිය. ඒ ගැන ඇමතිතුමා නොවෙයි වැඩියෙන්ම කථා කළේ, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා. එක පැත්තකින් කියනවා, "පසුගිය ආණ්ඩුවෙන් අදානි ව්‍යාපෘතිය ගෙනාවා. ඒකේ ගණන් වැඩියි. හැබැයි අපි ගෙනාවා, Mannarවලට 50-megawatt ව්‍යාපෘතියක්, ඒකේ තමයි ලංකාවේ අඩුම මිල" කියලා. ඇමතිතුමාගෙන් මම අහන්න කැමතියි, කවුද ඒක ගෙනාවේ, කවුද ඒකේ ඉඩම පවරා ගත්තේ, කවුද ඒකේ feasibility එක කළේ, කවුද ඒකේ EoI එක කළේ කියලා.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ඇමතිතුමනි, ඔබතුමාට ඒ ගැන කියන්න අවස්ථාව තිබෙනවා.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
මෙගාවොට් 50ක් ඔබතුමන්ලාගේ කාලයේ ගෙනාපු එක සත්‍යයි. ඒ, ශත හතරයි ගණනකට. අපි දෙකක් ගෙනැල්ලා තිබෙනවා, ශත තුනයි ගණනකට. ඒකත් මතක තියාගන්න. මෙගාවොට් 50 ඒවා 2ක්.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු අමාත්‍යතුමනි, එංගලන්තයේ renewable energy පටන් ගත්ත වෙලාවේ පළමුවෙනි project එක ආවේ ඩොලර් ශත 18ට. එතකොට අවුරුද්දට මෙගාවොට් 1,000ක් විතර එනකොට තමයි එන්න එන්න ඒ ගණන අඩු වුණේ. හැබැයි, අපි ව්‍යාපෘතිය කළාම බලමු. ඔය අමාත්‍යාංශයේ කංචන මැතිතුමා තමයි ඇමතිතුමා වශයෙන් හිටියේ. මම විදුලිබල ක්ෂේත්‍රයේ හිටියේ නැහැ. ශත දෙකටත් ටෙන්ඩර්වලට දමනවා.

දාලා ඉඩම වෙන්කරගෙන හදන්නේ නැතිව ඉන්න අයත් ඕනෑ තරම් ඉන්නවා. දැනටත් 100ක්, 200ක් ඉන්නවා. ඒක නිසා හැදුවාම බලමු.

හැබැයි, අර ජනාධිපතිතුමා හැම දාම අඩුවට ගෙනාවා කියන ව්‍යාපෘතියට කංචන විජේසේකර ඇමතිතුමා ඉන්න කාලයේ තමයි ටෙන්ඩර් එක call කළේ; Technical Evaluation Committee එක දැම්මේ; SCAPC එක දැම්මේ. මේක තෝරා ගත්තාට පස්සේ දෙවැනියා උසාවි ගියා. දෙවැනියා උසාවියට ගියාට පස්සේ අලුත් ආණ්ඩුව එනකොට උසාවියෙන් ඒ නඩුව අයින් කර ගත්තා. ඊට පසුව ඔබතුමන්ලා කරපු එකම දේ තමයි power purchasing agreement එක sign කරන එක. ඒ හැරෙන්න කිසි දෙයක් කළේ නැහැ. පෙරහැරේ යන්න වෙන අලි ඉන්නවා. කමක් නැහැ. හැබැයි, කොටන් ඇදපු අලියා ගැන මතක් කළේ නැති වුණාට කමක් නැහැ, කොටන් ඇද්දේ නැහැ කියලා කියන්න එපා. කංචන විජේසේකර කොටන් ටික ඇදලා, ඇදලා ඔක්කොම කළාට පස්සේ පෙරහැරේ යන අලියා වීරක්‍රියාවක් විධියට ඒ ගැන කියන එක තමයි ප්‍රශ්නේ. කමක් නැහැ. කොටන් ඇදපු අය ගැන කියන්න ඕනෑ නැහැ. අඩුම ගණනේ කොටන් ඇද්දේ නැහැ කියන එක නවත්වන්න.

සියඹලාණ්ඩුව සූර්ය බලශක්ති ව්‍යාපෘතියත් ඒ වාගේම තමයි. සියඹලාණ්ඩුව සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සඳහා ඉඩම පවරා ගත්තේ දුමින්ද දිසානායක රාජ්‍ය ඇමතිතුමා සිටි කලයේයි. මේ ව්‍යාපෘතියේ ටෙන්ඩර් එක call කරලා; EoIs call කරලා; feasibility එක කරලා, අවශ්‍ය සියලු දේවල් කරලා කංචන විජේසේකර ඇමතිතුමා සිටි කාලයේ power purchasing agreement එක අත්සන් කරන තැනත් මම හිටියා. ඒ වෙලාවේ ගත්ත photo එකේ කංචන හිටපු ඇමතිතුමාට එහා පැත්තෙන් මමත් ඉන්නවා. දැන් ජනාධිපතිතුමා ඇවිත් කියනවා, "ඒකත් අපි කළේ" කියලා. මේ private investorsලා. මේකේ රජයට කරන්න කිසිම දෙයක් තිබුණේ නැහැ. ඔබතුමාට කරන්න තිබුණේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවරූ නඩුවට අමාත්‍යතුමා හැටියට ගිහිල්ලා එන්න විතරයි. හැබැයි, ජනාධිපතිතුමා මේ ගරු සභාවට ඇවිල්ලා කියනවා, "අපි තමයි සියඹලාණ්ඩුව සූර්ය බලශක්ති ව්‍යාපෘතිය ගෙනාවේ" කියලා. අර කලින් එකම තමයි. පෙරහැරේ ගියාට කමක් නැහැ. කොටන් ඇදපු කෙනා කොටන් ඇද්දේ නැහැ කියලා කියන්න එපා.

ඒ වාගේම ගරු අමාත්‍යතුමනි - ඔබතුමා ඒ කාලයේ හිටියාද දන්නේ නැහැ - ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයට විනාශකාරීම ලෙස කටයුතු කළේ ජනතා විමුක්ති පෙරමුණයි. ලංකාවේ තිබෙන මිල අඩුම ප්‍රභවය තමයි ජල විදුලි බලය - hydropower. Hydropower සඳහා වැය වෙන්නේ සාමාන්‍යයෙන් රුපියල් 3, රුපියල් 4යි. Mini -hydropower plantsවලට ගියොත් රුපියල් 15, රුපියල් 16යි. මේ තමයි unit එකකට යන ගණන. ගරු සභාපතිතුමනි, උමා ඔය ව්‍යාපෘතිය ආපු වෙලාවේ අවුරුදු අටක් උද්ඝෝෂණ කළා, "මේකේ මහ හිලක් තිබෙනවා, බණ්ඩාරවෙල ගිලා බහිනවා, බදුල්ල ගිලා බහිනවා" කියලා. අන්තිමට මොකද වුණේ? අවුරුදු අටක්

[ගරු ඩී.වී. චානක මහතා]

ව්‍යාපෘතිය පරක්කු වුණා. එක අවුරුද්දකට වෙච්ච පාඩුව විතරක් ඩොලර් මිලියන 60ක්. එක අවුරුද්දට වෙච්ච පාඩුව. සාමාන්‍යයෙන් මේකේ plant factor එක තිබෙන්නේ සියයට 20ක් විතර, hydropowerවලට. හැබැයි, එක අවුරුද්දකට ඩොලර් මිලියන 60කට ආසන්න ප්‍රමාණයක් වශයෙන්, ආසන්න වශයෙන් ඩොලර් මිලියන 480ක පාඩුවක් වුණා.

සාම්පූර් ගල් අඟුරු බලාගාරය ගෙනාවා. ඒක මෙගාවොට් 900ක ව්‍යාපෘතියක්. මේ ගොල්ලන් මොකද කළේ? මේ ගොල්ලන් ගිහින් උද්ඝෝෂණ කළා. අන්තිමට යහ පාලන ආණ්ඩුවට සහයෝගය දීලා උසාවියට ගිහින් එකඟ වෙනවා, සාම්පූර් බලාගාරය හදන්නේ නැති වෙන්න. මොකද වුණේ? ඒක නැවැත්තුවා. රුපියල් 22ට unit එක තිබුණු එක. ගල් අඟුරු කියන්නේ රුපියල් 22යි. අද solar energy ගත්තත්, බැටරිත් එක්ක යනකොට රුපියල් 46ක් වෙනවා. හැබැයි, ගල් අඟුරු තමයි ලෝකයේ ඒ වෙලාවේ තිබුණු අඩුම energy source එක. ඒක නවත්වන්න උද්ඝෝෂණ කළා. අන්තිමට ලෝකය තීරණයක් ගත්තා, අපි තවදුරටත් ගල් අඟුරුවලට යන්නේ නැහැ කියලා. ජනාධිපතිතුමා කියපු විධියට තව සියයට 25කින්, 30කින් විදුලි බිල අඩු කරන්න තිබුණා. හැබැයි අවාසනාවකට ගරු සභාපතිතුමනි, ඒකටත් විරුද්ධ වුණා. ඩොලර් බිලියන 2.8ක පාඩුවක් වුණා. මේක තමයි ඇත්තටම රටේ වුණේ. රටේ තිබුණේ ඩොලර් ප්‍රශ්නයකටත් වඩා බලශක්ති අර්බුදයක්. එහෙම නැත්නම් විදුලි බලය පිළිබඳ අර්බුදයක්. මේකට ප්‍රධාන හේතුව තමයි එදා උමා ඔය ව්‍යාපෘතිය නවත්වපු එක; සාම්පූර් ව්‍යාපෘතිය නවත්වපු එක. නොරොච්චෝලේ හතරවැනි අදියර මෙගාවොට් 300ක් හදන්න අවශ්‍ය grid එක හදලා, transmission lines ටික හදලා අවශ්‍ය ඔක්කොම ටික කරලා තිබියදී ඒක නැවැත්තුවා. මේ ඒවායේ ප්‍රතිඵල. රුපියල් 22ට ගන්න තිබෙන එක, නැප්තාවලින් රුපියල් 45ට ගන්නකොට, furnace oilවලින් රුපියල් 50ට, 55ට ගන්නකොට, ඩීසල්වලින් රුපියල් 80ට, 85ට ගන්නකොට විදුලි බිල වැඩි වෙනවා. හැබැයි, මේ බලාගාර හදන එකට විරුද්ධ වෙච්ච කණ්ඩායම ඇවිල්ලා අද නොයෙක් ඒවා කියනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය අය වැය වෙලාව වනකොට ලංකාවේ තිබුණා ස්ථායීතාව පිළිබඳ ප්‍රශ්නයක්. මම ඒ වෙලාවේ ඇමතිතුමාට යෝජනාවක් කළා, අපි rooftop solarවලට බැටරි දමමු කියලා. ඒකට රුපියල් 46කුත් යෝජනා කළා. ඒ වෙලාවේ හැන්සාඩ් එක බැලුවොත් පේනවා. ඇමතිතුමා ඒ වෙලාවේ නම් හිනා වුණා. හැබැයි අන්තිමට හරි ඔබතුමා ඒක ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා, දැන් rooftop solar panels with battery, ground-mounted solar panels with battery විශාල ප්‍රමාණයක් එයි කියලා.

ඒ වාගේම, ගරු සභාපතිතුමනි, ප්‍රසන්න රණතුංග හිටපු ඇමතිතුමා දැන් පාර්ලිමේන්තුවේ නැහැ. එතුමා මගෙන් ඉල්ලීමක් කළා, ඒ නිසා මේ කාරණය කියන්න ඕනෑ. ඔහුගේ තාත්තා වන රෙජී රණතුංග මහතාගේ රෙජී රණතුංග පදනමෙන් පෞද්ගලික අංශයෙන් ඉඩමක් අරගෙන, ඒකේ ව්‍යාපෘතියක් කරලා, වෘත්තීය පුහුණු අධිකාරියට නොමිලයේ ලබා දීලා, ළමයින්ට අවුරුදු 15ක් අධ්‍යාපනය ලබා දීපු එක ගැන ඊයේ දිනයේ පාර්ලිමේන්තුවේදී අග්‍රාමාත්‍යවරියගෙන් ප්‍රශ්න අහලා මඩ ගහන්න සූදානම් වෙලා තිබෙනවා. අන්තිමට අග්‍රාමාත්‍යතුමිය කියලා තිබෙනවා ඒක ගැන තොරතුරු නැහැ කියලා. හැබැයි, ඇත්ත තත්ත්වය තමයි, ඉඩමත් පෞද්ගලික අංශයෙන් අරගෙන, සම්පූර්ණයෙන්ම නොමිලයේ කරලා දීලාත්, අන්තිමට රණතුංග පවුලට මඩත් කන්න සිදු වෙලා තිබෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි, 2030 වෙනකොට ලංකාව සියයට 70ක් renewable energyවලට යන්න ඕනෑ. සියයට 30ක් clean energyවලට යන්න ඕනෑ. මේවා තෙල් නොවෙයි, LNGවලට convert කරන්න තමයි ගිවිසුම්ගත වෙලා තිබෙන්නේ. ඒ කියන්නේ අපේ plan එක තිබුණේ, ඊට පස්සේ 2040දී carbon neutral, කාබන් නැති කරන්න තමයි, අපි ගිවිසුම්ගත වෙලා ලෝකයට ගිහින් කියලා තිබෙන්නේ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා 2050දී කියලා කිව්වා. රනිල් වික්‍රමසිංහ මහත්මයා 2040දී කියලා කිව්වා.

හැබැයි, ගරු සභාපතිතුමනි, අද ඇමතිතුමා ඉද්දී කියන්න ඕනෑ, ලංකාවට ගෙන්වන්න හදන්නේ ඩීසල් කැබ් 1,700ක්. දැන් ලෝකයේ තිබෙන රාජ්‍ය ආයතන ඔක්කොටම electric vehicles ගන්න කටයුතු කරද්දී, තෙල්වලින් දුවන වාහනවලින් ඈත් වෙද්දී, අපි විතරක් electric vehicles වෙනුවට ඩීසල් කැබ්වලට යනවා. මම ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, ඔබතුමන්ලා මේවා අනුමත කරනවාද කියලා. අපි ගිහිල්ලා ලෝකයේ රටවල් එක්ක carbon neutral කරන්න agreements ගහනවා, renewable energyවලට ගන්නවා. අපි climate change ගැන කථා කරනවා. අනෙක් පැත්තෙන් ඩීසල් කැබ් ගේන්න තමයි, ඔබතුමන්ලා ටෙන්ඩර් කැඳවන්නේ. මම දන්නේ නැහැ, ගරු ඇමතිතුමාගෙන් හෝ නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මේ ගොල්ලෝ consult කරන්නේ නැද්ද කියලා. අඩුම ගණනේ එහෙම හරි දෙයක් කළා නම් මේ දේ වෙන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, නියෝජ්‍ය ඇමතිතුමනි, අපි ඔබතුමන්ලාට සුබ පතනවා. සියලු නිලධාරින්ට සුබ පතනවා. World Bank එකත් එක්ක කටයුතු කරලා, අපි offshore wind විභවය සොයා ගෙන තිබෙනවා. ඒකෙන් මෙගාවොට් පනස් ගණනකට ආසන්න ප්‍රමාණයක් Mannerවල offshore wind තිබෙනවා. ඒ විභවය පාවිච්චි කරලා, ලංකාවට අඩු මුදලට විදුලිය ලබා දෙන්න කටයුතු කරන්න. අර ජනාධිපතිතුමා කිව්වා වාගේ සියයට 30ක් අඩු කරලා, අඩු මුදලට විදුලිය ලබා දෙන්න. එතකොට අපිට පුළුවන් වෙයි, රටක් විධියට ඉස්සරහට යන්න. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Order, please! The ongoing Proceedings of the Committee of the whole Parliament shall stay suspended until 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු ගාමිණී රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විෂය භාර අමාත්‍යවරයා මේ මොහොතේ සභාවේ නැති නිසා මම මේ පැහැදිලි කිරීම කරන්නේ, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා නඟපු ප්‍රශ්නයකට අදාළවයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, police clearance certificate එකක් ඉල්ලපු කෙනෙකුට මහජන ආරක්ෂක කමිටුවේ සභාපතිගේ අනුමැතියක් අවශ්‍යද, ඔහුගේ නිර්දේශයක් අවශ්‍ය ද කියන ප්‍රශ්නයට අදාළ කාරණා දවස් දෙකක් තිස්සේ දිගින් දිගටම මේ ගරු සභාවේ දෙපැත්තට දෝලනය වෙනවා. මේ ප්‍රශ්නය ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා මතු කළා; ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමාත් මතු කළා. ඒ කාරණයට හරියාකාර, පැහැදිලි උත්තරයක් විෂය භාර අමාත්‍යවරයා ලබා දුන්නා. යම්කිසි අතපසුවීමක් මත අපේ යම් අමාත්‍යවරයෙකු මේ සම්බන්ධයෙන් දුන්නු උත්තරය නොවෙයි, විෂය භාර අමාත්‍යවරයා දීපු එක තමයි ඇත්ත වශයෙන්ම උත්තරය. අපි මේ රටේ පුරවැසියන්ට මේ කාරණය කියන්න ඕනෑ. මේ ප්‍රශ්නයට උත්තරය හරිම පැහැදිලියි. මොකක්ද ඒ උත්තරය? police clearance certificate එකක් ඉල්ලන කෙනෙකුට මහජන ආරක්ෂක කමිටුවේ නිර්දේශයක් අවශ්‍ය වන්නේ නැහැ. ඒ සඳහා ග්‍රාම නිලධාරි සහතිකයක් අවශ්‍යයි කියලා කියනවා නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ග්‍රාම නිලධාරි සහතිකයක් පවා අවශ්‍ය වන්නේ යම්කිසි ගැටලු සහගත තත්ත්වයක් උදා වුණොත් පමණයි. අපි police clearance certificate එකක් ඉල්ලුවාට පස්සේ ඇත්ත වශයෙන්ම ඒ අදාළ පොලිස් බල ප්‍රදේශය භාර පොලිස් නියෝජිතයා තමයි ග්‍රාම නිලධාරියා ළඟට යන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ග්‍රාම නිලධාරියා හමු වෙලා තමයි තොරතුරු විමසා බලන්නේ, 'මොහු මේ ප්‍රදේශයේ පදිංචිකරුවෙක් ද, නැද්ද' යන වග සම්බන්ධයෙන්. විපක්ෂය මේක මහා ලොකු ආන්දෝලනාත්මක කාරණයක් කරගෙන තිබෙනවා. මම දන්නේ නැහැ, විපක්ෂයට වෙනත් සටන් පාඨ නැද්ද කියලා. මම විපක්ෂයට කියන්නේ මේ තරම් දුප්පත් වෙන්න එපා කියලායි. විපක්ෂය මේ තරම් දුප්පත් වීම වැරැදියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
දැන් අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඔබතුමාගේ කාරණය පැහැදිලියි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මේ විධියට කොළ කෑලි උස්සාගෙන ඇවිල්ලා අපේ රටේ පුරවැසියන් නොමඟ යවන්න එපා. මේ මොකක්ද කරලා තිබෙන්නේ? කොළ කෑල්ලක් සභාගත කරලා කියනවා, මොරටුමුල්ල පොලීසියෙන් එවැනි සහතිකයක් ඉල්ලුවා කියලා. මේ ලේඛනයේ මහජන ආරක්ෂක කමිටුවේ සභාපතිවරුන්ගේ නාම ලේඛනයක් තිබෙනවා. ඒක ඇත්ත. නමුත්, ඒකෙන් අදහස් වෙනවා ද, police clearance certificate එකට ඒක අදාළයි කියලා? මෙතැනට ඇවිල්ලා මේ සභාවේ බොරු ලේඛන සභාගත කරනවා. ඒ නිසා අපි පැහැදිලිව විපක්ෂයට කියනවා, මේ තරම් දුප්පත් වෙන්න එපා කියලා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මෙතුමා මගේ නම සඳහන් කරලා කියපු කාරණා සම්බන්ධයෙන් මම යමක් කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම සභාගත කරපු ලේඛනයේ සම්පූර්ණ වගකීම මම භාර ගන්නවා. මම ඒක මාධ්‍යයටත් නිකුත් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, වාදයකට යන්න අවශ්‍ය නැහැ. පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මට තත්පර කිහිපයක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මම විවාදයකට යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව හමුවට මාධ්‍ය ආයතන ගෙන්වනවා නම්, ඔබතුමන්ලාගේ ඇමතිතුමාත් ගෙන්වන්න. ඒ වාගේම ගරු බලශක්ති ඇමතිතුමනි, මාලිමාවේ වෘත්තීය සමිති හරහා Ceylon Petroleum Corporation එකේයි, CPSTL එකේයි දැන් දිගට හරහට transfers කරනවා ලු. ඒ තිබෙන චක්‍රලේඛ වෙනස් කරලා එසේ transfers කරනවා ලු.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා කියන දේ පැහැදිලියි.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මට තව තත්පර 10ක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මම බලශක්ති ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්නේ. ඒ ආකාරයට transfers කරන එක වහාම නවත්වන්න. නීත්‍යනුකූල නොවන විධියට එසේ transfers කරන එක නවත්වන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ බලන්න, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා සභාගත කර තිබෙන ලේඛනය. මෙය මොරටුමුල්ල පොලීසියෙන් නිකුත් කළා කියලායි තිබෙන්නේ. මම එහි පිටපතක් ලබා ගත්තා. මෙහි මොකක්ද කියලා තිබෙන්නේ? 'මහජන ආරක්ෂක කමිටු සභාපතිවරුන්ගේ දුරකථන නාමාවලිය' කියා මෙහි සඳහන්ව තිබෙනවා. මෙහි ඒ සභාපතිවරුන්ගේ නම්, දුරකථන අංක ආදි විස්තර ටිකක් තිබෙනවා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ලේඛනයේ අනෙක් පැත්තේ තිබෙන්නේ මොකක්ද?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මම දන්නේ නැහැ, මට මේ තනි කොළයක් ලැබිලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ කොළය දිහා බලලා කියන්න, ඔබතුමිය මේක භාර ගන්නවාද, නැද්ද කියලා. ඒක ඔබතුමියගේ වගකීමක්. කොහේවත් යන බොරු ලේඛනයක් ගෙනැල්ලා මෙතැන සභාගත කරලා කියනවා, මේක මොරටුමුල්ල පොලීසියෙන් issue කළා කියලා. මේ ලේඛනයේ උඩින් අතින් ලියා තිබෙනවා, "මොරටුමුල්ල පොලීසිය" කියලා. මොකක්ද මේ විහිළුව? ඔයගොල්ලන්ට දේශපාලන සටන් පාඨයක් නැත්නම්, අනේ, කරුණාකරලා ප්‍රශ්න ටිකක් හොයාගෙන එන්න. මිනිස්සු නොමඟ යවන දේවල් මෙතැන කියන්න එපා, ඩී.වී. චානක මන්ත්‍රීතුමා. තේරුණා ද? මේ ප්‍රශ්නයට උත්තරය හරි පැහැදිලියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔය කාරණය සම්බන්ධයෙන් දැන් වාදයකට යන්න එපා.

මීළඟට, ගරු ගාමිණී රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, රටේ ආර්ථිකයට අදාළව 2026 වර්ෂයේ,-

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔබතුමාට කථා කරන්න දුන්නා නේ. *[බාධා කිරීමක්]*

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔබතුමාගේ point of Order එක මොකක්ද? තත්පර 15යි දෙන්නේ. තත්පර 15න් කියන්න.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමිය, ඔබතුමිය නියෝජ්‍ය ඇමතිතුමාට විනාඩි දෙකහමාරක් දුන්නා.

මේ දීපු form එකේ- *[බාධා කිරීමක්]* ඔය තිබෙන නාම ලේඛනයේ addresses ඔක්කෝම මොරටුමුල්ලේ addresses. මේකේ තිබෙනවා, ඉල්ලුම් පත්‍රය දමද්දී, සාමාජිකයාගේ නම, මහජන ආරක්ෂක කමිටුවේ නිර්දේශය, ඊට පස්සේ ග්‍රාම නිලධාරි නිර්දේශය ආදිය. මා හිතන විධියට, ඔබතුමා වැරදි ලේඛනයක photocopy එකකුයි අරගෙන ඇත්තේ, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. මම මේක සභාගත කරලා තිබෙනවා. මම මේ ලියුමේ copy එකක් මාධ්‍යයටත් දැන් නිකුත් කරනවා. එතකොට කාටත් බලා ගන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාළ විවාදය පැවැත්වෙන මේ මොහොතේ,-*[බාධා කිරීමක්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අන්න, ඩී.වී. චානක මන්ත්‍රීතුමා යනවා.

[අ.භා. 1.06]

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
ඩී.වී. චානක මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්න. ඔබතුමා පොඩ්ඩක් ඉඳලා යන්න. මොකද, ඔබතුමා හිටපු විදුලිබල නියෝජ්‍ය අමාත්‍යවරයෙක්. *[බාධා කිරීමක්]* ඔබතුමා හිටපු විදුලිබල නියෝජ්‍ය අමාත්‍යවරයෙක් නිසා පොඩ්ඩක් ඉඳලා යන එක හොඳයි.

ජාතික ජන බලවේගය ආණ්ඩුවේ රටේ ඉදිරි අනාගත ආර්ථික උපාය මාර්ගික සැලැස්මට ගැළපෙන විධියට, ඒ උපාය මාර්ග ක්‍රියාත්මක කරන්න සැපිරිය යුතු අත්‍යවශ්‍ය කොන්දේසියක් තමයි පරිපූර්ණ බලශක්ති පද්ධතියක් ඇති කිරීම. *[බාධා කිරීමක්]* පරිපූර්ණ බලශක්ති පද්ධතියක අවශ්‍යතාව වෙනුවෙන් මේ අය වැය ලේඛනය ඇතුළේ සාකච්ඡා කළ යුතු, මතු කළ යුතු, අවධානය යොමු කළ යුතු කාරණා කිහිපයක් තිබෙනවා. හැබැයි, ඒවා ගැන කියන්න පෙර කිව යුතු දෙයක් තිබෙනවා.

මට කලින් කථා කරපු ඩී.වී. චානක මන්ත්‍රීතුමනි, ඔබතුමා හිටපු විදුලිබල නියෝජ්‍ය අමාත්‍යවරයෙක්. ඔබතුමා විදුලිබල

නියෝජ්‍ය අමාත්‍යවරයකු හැටියට සිටිද්දී විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, විදුලිබල මණ්ඩලය සම්බන්ධයෙන් කටයුතු කරපු ආකාරය මම කියන්නම්. දැන් ඔබතුමා ආණ්ඩුවට අවවාද - advice - දෙනවා, මෙහෙම කරන්න, මෙහෙම කරන්න, අරෙහෙම කරන්න කියලා. හැබැයි, ඔබතුමා එම ධුරයේ හිටපු කාලය මම ඔබතුමාට මතක් කරලා දෙන්නම්. ඔබතුමන්ලාගේ 2029 සිහින ජනාධිපතිවරයාගේ කාල්ටන් මඟුල් ගෙදර තිබුණා නේද? ඒ කාල්ටන් මඟුල් ගෙදර පැවැති දවස්වල හිටපු විදුලිබල නියෝජ්‍ය අමාත්‍යවරයා කවුද? ඔබතුමායි. ඒ කාල්ටන් මඟුල් ගෙදරට විදුලිය ගන්න,- *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. මේක අහගෙන ඉන්න. ඒ මඟුල් ගෙදරට විදුලිය ගන්න විදුලි සැපයුම ඉල්ලුවේ, එවකට නියෝජ්‍ය ඇමතිතුමා. මඟුල් ගෙදර සතියක් තිබුණා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
කථාව අවසානයේ ඔබතුමාට අවස්ථාව ලබා දෙන්නම්.

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)

කාල්ටන් මඟුල් ගෙදර සතියක් තිබුණා; සතියක් මඟුල් කෑවා. මඟුල් උත්සවය තිබ්බ්ව ගෙදර කෙනායි විදුලි බලය ඉල්ලන්න ඕනෑ; විදුලිය සැපයුම ඉල්ලන්න ඕනෑ. ඒ කියන්නේ, මනමාලයායි විදුලි සැපයුම ඉල්ලන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා තමයි දෙවැනි මනමාලයා. ඒ මඟුල් ගෙදර දෙවැනි මනමාලයා වෙච්ච ඔබතුමා තමයි විදුලි සම්බන්ධතාව ඉල්ලා ගත්තේ. සතියක් මඟුල් කෑවා. මඟුල් කාලා ලංකා විදුලිබල මණ්ඩලයට ලක්ෂ 29ක පොල්ලක් තිබ්බා. අවුරුදු ගාණක් යනකල් ඒක ගෙව්වේ නැහැ. ඒක ගෙව්වේත් පාර්ලිමේන්තුවේ හිටපු, දැනට ජීවතුන් අතර නැති මන්ත්‍රීවරයෙක්. ඒක හොඳට මතක තියා ගන්න. විදුලි සම්බන්ධතාව ඉල්ලුවේ එක්කෙනෙක්; මඟුල් ගෙදර තව කෙනෙකුගේ; බිල ගෙව්වේ තව කෙනෙක්. ඔහොමයි තමුන්නාන්සේලා ඇමතිකම් කළේ. එහෙම ඇමතිකම් කරලා දැන් ජාතික ජන බලවේගය ආණ්ඩුවට අවවාද - advice - දෙන්න එන්න එපා; අමාත්‍යාංශ කරන ආකාරය ගැන උපදෙස් දෙන්න එපා. ඔබතුමන්ලාගේ උපදෙස් අපට අවශ්‍ය නැහැ. මේ රටේ බලශක්ති අමාත්‍යාංශය කළ යුතු වැඩ කොටස මොකක්ද කියන එක පිළිබඳව අපට හොඳ වැටහීමක් තිබෙනවා; අවබෝධයක් තිබෙනවා. අපට අරමුණක් තිබෙනවා; ඉලක්කයක් තිබෙනවා. ඒ අරමුණ, ඒ ඉලක්කය වෙනුවෙන් මේ අමාත්‍යාංශය මෙහෙයවනවා කියන කාරණයත් මතක් කරමින් මම දැන් මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාළව මගේ අදහස් ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විශේෂයෙන්ම විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය සම්බන්ධයෙන් පසුගිය කාල පරිච්ඡේදය තුළ පැවැති ප්‍රධාන ගැටලුවක් ගැන, මීට කලින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය භාරව හිටපු විදුලිබල ඇමතිවරුන් කරපු දේවල් ගැන මා කියන්නම්. පසුගිය කාලය වනකොට විදුලිබල මණ්ඩලයේ සේවකයෝ 14,000කට වැඩි ප්‍රමාණයක් -16,000ක් පමණ- සිටියා. විදුලිබල මණ්ඩලය අහෝසි කරලා, ඇවර කරලා, සමාගම් 12කට කඩලා ඒ සේවකයන් 14,000 බලහත්කාරයෙන් විශ්‍රාම ගන්වන සැලසුම ක්‍රියාත්මක කරලායි තිබුණේ.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසානයේ අවස්ථාව දෙන්නම්.

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)

ඒ ක්‍රියාත්මක කරලා තිබ්බ්ව සැලැස්ම වෙනස් කරලා, විදුලිබල මණ්ඩලය පූර්ණ රාජ්‍ය සමාගම් 4ක් යටතේ මෙහෙයවමින් ඒ සියලු සේවකයන්ගේ අයිතිවාසිකම්, වරප්‍රසාද ආරක්ෂා කරමින් කටයුතු කරන්න අපට මේ වන කොට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත හරහා එම කටයුත්ත සම්පූර්ණ කරන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ අනුව මේ වෙනකොට 2,778කට ආසන්න සේවක ප්‍රමාණයක් ස්වකැමැත්තෙන් විශ්‍රාම යන්න ඉල්ලීමක් කර තිබෙනවා. ඒ වාගේම 17,000කට ආසන්න සේවක සංඛ්‍යාවකගේ රැකියාව සුරක්ෂිත කරන්න අපට හැකියාව ලැබුණා. පසුගිය ආණ්ඩුව කාලයේ වාගේ නම් ඒ අයට ගෙදර යන්න වෙන්නේ මොකුත් නැතුව. අද විපක්ෂයේ සිටින ඔබතුමන්ලා ආණ්ඩු කළ කාලයේ එවැනි ඛේදනීය තත්ත්වයක් තමයි තිබුණේ. නමුත් අපි අද වනවිට ඒ තත්ත්වය වෙනස් කර තිබෙනවා.

විශේෂයෙන්ම ඉදිරි සියවසට අදාළව, ඉදිරි ගමනට අදාළව, රටේ හෙට දවසේ අවශ්‍යතාව වෙනුවෙන් බලශක්ති අමාත්‍යාංශය මෙහෙයවන්නේ කොහොමද කියන එක පිළිබඳව කථා කරද්දි සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා. අපි කවුරුත් දන්නවා, පසුගිය කාලය පුරා අපේ රටේ විදුලිබල අවශ්‍යතාව සපුරාලීමේදී වැඩිපුර අවතීර්ණ වී තිබෙන්නේ වියදම් වැඩි විදුලිබල උත්පාදන මාර්ගවලට බව. ඒ කියන්නේ, ගල් අඟුරු වැනි පොසිල ඉන්ධන තමයි වැඩිපුර පාවිච්චි කර තිබෙන්නේ. සූර්ය බලය, ජලය වැනි ප්‍රභව පාවිච්චි කර විදුලි බලය උත්පාදනය කරනවා වෙනුවට වැඩිපුර පොසිල ඉන්ධනවලට තමයි ඒ කාලයේ වියදම් දරා තිබෙන්නේ. පසුගිය කාල වකවානු තුළ පැවැති ආණ්ඩු වැඩි අවධානය යොමු කර තිබුණේ ඉන්ධන සහ ගල් අඟුරු භාවිතයෙන් විදුලිය උත්පාදනය කිරීමටයි. ඒකෙන් විදුලි නිෂ්පාදන පිරිවැය වැඩි වුණා. එසේ නිෂ්පාදන පිරිවැය වැඩි වීම හේතු කොටගෙන මේ රටේ ජනතාවට -මේ රටේ නිෂ්පාදකයාට, මේ රටේ ආර්ථිකයට මැදිහත් වන බොහෝ අයට- වැඩි පිරිවැයක් දරන්න සිද්ධ වුණා; ඒ කරුමයට කරගහන්න සිද්ධ වුණා.

නමුත්, වර්තමානයේ බලශක්ති අමාත්‍යාංශය ඉදිරි වර්ෂයට අදාළ සැලසුම් ඇතුළේ විශේෂයෙන්ම පුනර්ජනනීය බලශක්තිය වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කර තිබෙනවා. බලශක්ති අමාත්‍යාංශයේ සංවර්ධන සැලසුම් අනුව, 2030 දක්වා වන ඉදිරි වසර 5ක කාලය තුළ විදුලිබල අවශ්‍යතාවෙන් සියයට 70ක් සපුරා ගැනීම සඳහා පුනර්ජනනීය බලශක්තිය යොදා ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලය සහ අමාත්‍යාංශය කටයුතු කරමින් තිබෙනවා. ඒ නිසා ගල් අඟුරු බලාගාරවල පිහිට පතමින්, ඉන්ධන බලාගාරවල පිහිට පතමින්, වැඩි පිරිවැයක් සහිතව විදුලිය ඒකකයක් නිෂ්පාදනය කරන ක්‍රමවේදය වෙනුවට, අඩු පිරිවැයකින් විදුලිය ඒකකයක් නිෂ්පාදනය කර, මේ රටේ පාරිභෝගික ජනතාවට, මේ රටේ කර්මාන්ත සිදු කරන ව්‍යවසායකයින්ට අඩු මිලට විදුලි බලය ලබා දීමට අවශ්‍ය කරන උපාය මාර්ගික දැක්මක් සහිත වැඩ පිළිවෙළක් 2026 වසර

[ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා]

වෙනුවෙන් මෙම අය වැය ලේඛනය තුළ ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව අපේ රජය කටයුතු කරනවා කියන කාරණයත් විශේෂයෙන්ම මේ අවස්ථාවේදී ඔබතුමන්ලාගේ අවධානයට මම යොමු කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විදුලි ජනන සැලැස්මට අනුව 2025-2045 දක්වා වූ වසර 20ක කාල වකවානුව තුළ රටේ විදුලිබල අවශ්‍යතාව සියයට 60කින් පමණ වැඩි වෙන බව දැනට පුරෝකථනය කර තිබෙනවා. සියයට 60කින් වැඩි වන රටේ සමස්ත විදුලි අවශ්‍යතාව සපුරාලීමට අවශ්‍ය කරන විදුලි ජනනයට අදාළ උපාය මාර්ගික සැලැස්මක් සහ ඉදිරි දැක්මක් මේ අය වැය ලේඛනය තුළ විදුලිබල මණ්ඩලයට අදාළව ඉදිරිපත් කර තිබෙන බව ඉතා පැහැදිලියි. නමුත්, පසුගිය දශකයක් පුරාවට -පසුගිය කාල වකවානුව තුළ- කර තිබුණේ මොකක්ද? බලයට පත් වෙච්ච බොහෝ ආණ්ඩු සහ ඇමතිවරු බොහෝ දුරට කර තිබුණේ විශේෂයෙන්ම මොන ප්‍රභවය යටතේ විදුලිය ජනනය කරනවාද කියන කාරණය පිළිබඳව තර්ක කරමින් හිටපු එකයි. වැඩිපුර ගල් අඟුරුවලට යනවාද, වැඩිපුර ඩීසල් බලාගාරවලට යනවාද, වැඩිපුර ජල විදුලියට යනවාද, වැඩිපුර සූර්ය බලශක්තියට යනවාද, සුළං බලයට යනවාද කියලා තමයි ඒ අය වාද කරමින් හිටියේ. නමුත් එසේ වාද කරමින් හදපු සැලසුම් 2045 වෙනකොට සියයට 60කින් වැඩි වෙන අපේ ජාතික විදුලිබල අවශ්‍යතාව, ඒ ඉල්ලුම සපුරන්න සමත් වෙලා නැහැ. ඒ නිසා ඒවා යල් පැන ගිය සැලසුම් ලෙස දක්වන්න පුළුවන්.

පසුගිය කාලය පුරාවටම සිද්ධ වුණේ ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව විදුලි බලය මිලදී ගැනීමේ ක්‍රියාවලියක්. ලංකා විදුලිබල මණ්ඩලයේ කටයුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව, වංචාව, දූෂණය සහ නාස්තිය සහිතව පවත්වා ගෙන යැමක් සිදු කර තිබෙන්නේ. ඒකේ ප්‍රතිඵල හැටියට ඒ පාඩු ලබන ආයතනවල බර ජනතාව මත පටවන තත්ත්වක් ඇති වී තිබුණා. ඉතිහාසයේ ගමන් කරපු ඒ ගමන් මඟ වෙනස් කරලා, ඒ අඳුරු පරිච්ඡේදය වෙනස් කරලා, මේ රටේ අනාගත වුවමනාව එක්ක, අනාගත අවශ්‍යතා එක්ක රට සංවර්ධනය කිරීමේ දිශාවට ගෙන යන්න අවශ්‍ය මූලික අවශ්‍යතාවක් වුණු බලශක්ති අවශ්‍යතාව සපුරාලීමට සමත් ආකාරයේ උපායමාර්ගික දැක්මක් සහිතව බලශක්ති අමාත්‍යාංශය කටයුතු කරනවාය කියන කාරණය මතක් කරමින්, මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. විනාඩියෙන් කියලා අවසන් කරන්න.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පොඩි අධ්‍යයනයක් කරලා කථා කළා නම් හොඳයි. මම ඇමතිවරයෙක් වශයෙන් පත් වුණේ, 2022 සැප්තැම්බර් මාසයේ. Wedding එක තිබුණේ 2018දී. ඔය කිව්වේ, ජනාධිපතිතුමාගේ ආරක්ෂාවට ගහපු security lights ගැන. Wedding එක තිබුණේ ජෙනරේටරයකින්. ඒකේ සම්පූර්ණ බිලත් ගෙවලා තිබෙන්නේ. අසත්‍ය කියන්න එපා. මම කරපු දේවල් - *[බාධා කිරීමක්]* පැය 16ක් කරන්ට් එක කපන රටක් අපි භාර ගත්තේ. *[බාධා කිරීමක්]* පෙට්‍රල් පෝලිම් තිබුණු රටක් භාර ගත්තේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
හොඳයි, අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා. පැහැදිලියි.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
හැබැයි අපි ආයතන ඔක්කෝම ලාභ ලබන ආයතන විධියට තමයි භාර දුන්නේ. එහෙම නැතුව ඔබතුමා,- *[බාධා කිරීමක්]* ජනාධිපතිතුමා "පාපිසි" කියන එක සාධාරණයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
ජනාධිපතිගේ security light එකට - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා. *[බාධා කිරීමක්]*

[අ.භා. 1.16]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. *[බාධා කිරීම්]* පොඩ්ඩක් නැවැත්තුවා නම් හොඳයි. ඔබතුමාට මයික් එක දීලා නැහැ නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, බලශක්ති අමාත්‍යාංශයේ අය වැය ඇස්තමේන්තුව ගැන කථා කරන අවස්ථාවේ මට කථා කරන්න විනාඩි කිහිපයක් ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. 2024 ශ්‍රී ලංකා විදුලිබල පනත - Electricity Act එක - වෙනස් කරලා බලාපොරොත්තු වුණේ, CEB එක unbundle කරන්න. එහෙම unbundle කරලා කොටස්වලට වෙන් කරන්න. ජනනය වෙනම, සම්ප්‍රේෂණය වෙනම, බෙදා හැරීම වෙනම විධියට. ඒ වාගේම ජනනය සඳහාත් වෙන වෙනම ආයතන ස්ථාපනය කරන්න. ඒකෙන් මොකක්ද බලාපොරොත්තු වුණේ? කාර්යක්ෂමතාව වැඩි කරලා, විනිවිදභාවය වැඩි කරලා අවසානයේදී ලයිට් බිල අඩු කිරීමට තමයි බලාපොරොත්තු වුණේ. සාමාන්‍ය ජනතාවට ලයිට් බිල අතිශයින් බලපානවා, එදිනෙදා ජීවන කටයුතුවලදී. අද රටේ ජනතාවගෙන් සියයට 25ක් පමණ දරිද්‍රතාවෙන් පෙළෙනවා. ලයිට් බිල ගෙවා ගන්න අපහසු

බොහෝදෙනා ඉන්නවා. ඒ, එක පැත්තක්. අනෙක් පැත්තෙන්, පෞද්ගලික අංශයේ කර්මාන්තවල, කුඩා සහ මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයන්ගේ නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම සඳහා ලයිට් බිල අඩු කර ගන්න එක වැදගත්.

2025 සංශෝධනවලට අපි එකඟ වුණේ නැහැ. ඔබතුමන්ලා ගෙනාපු මූලික සංශෝධනය අනුව, unbundle කරපු එක යම් කිසි විධියකට නැවතත් rebundle කළා. ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම කියලා තුනට කැඩුවාට, ජනනය ඇතුළේ තිබුණු වෙන් කිරීම ඔබතුමන්ලා වෙනස් කළා. මම අහගෙනයි ගරු ඇමතිතුමා කිව්වා, ඉදිරි පරම්පරාවලටත් සියයට 100ක රජයේ අයිතිය තබා ගන්න ඒ ජනනය කඩලා විකුණනවා වෙනුවට රජය තුළ පවත්වාගෙන යන්න කටයුතු කළා කියලා.

හැබැයි එතැන තිබෙන logic එක පිළිබඳව අපි පොඩ්ඩක් හිතන්න ඕනෑ. මොකද, කලින් plan එක තිබුණේ, ජල විදුලියෙන් ජනනය කරන ආයතන වෙනම තියන්න. ඒ කියන්නේ මහවැලිය. අමතක කරන්න එපා, ඔය අවුරුදු 76ක ශාපය කියන කාලයේ තමයි වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ බලාගාර ඔක්කෝම හැදුවේ. හැබැයි ඒවා කවදාකවත් රජයෙන් අන්සතු කරන්න කිසිම හැකියාවක් තිබුණේ නැහැ, ඒ පනතට අනුව. නමුත් ඒ පනතට අනුව හැකියාවක් තිබුණා, යම් දවසක ගල් අඟුරුවලින් විදුලිය ජනනය කරන බලාගාර, නැත්නම් ඩීසල්වලින් විදුලිය ජනනය කරන බලාගාර, සුළං, සූර්ය බලවලින් විදුලිය ජනනය කරන බලාගාරවලින් යම් කොටසක් සඳහා දේශීය හෝ විදේශීය පෞද්ගලික ආයෝජන ලබා ගන්න. ඒ අවස්ථාව තිබුණා. ඒක තමයි ඇත්ත වශයෙන්ම ඒ තිබ්ච්ච logic එක. මොකද, ඒ අවශ්‍ය ආයෝජන ගෙන එන්න ඉඩ දෙන්න. දැන් මොකක්ද ඔබතුමන්ලා rebundle කරන එකෙන් කළේ? මහවැලියයි, ඩීසල්, ගල් අඟුරු, සුළං බලාගාර ඔක්කෝමයි එකතු කරලා එක කොම්පැනියක් හදලා, සියයට 100ක රජයේ අයිතියට තියාගෙන ඉන්නවා. එතකොට ඒකෙන් අර බලාපොරොත්තු වෙච්ච දේ, ආයෝජන ලබා ගැනීම, කරන්න බැරි වෙනවා. එතකොට, ඒ ආයෝජනවලට අපි බලාපොරොත්තු වෙච්ච investment hook එක ලැබුණේ නැහැ, ගරු ඇමතිතුමනි. ඒ ගැන ඔබතුමන්ලාගේ දේශපාලන මතවාදය සහ අපේ මතවාදය අතර යම් වෙනසක් තිබෙනවා. ඒකට ප්‍රශ්නයක් නැහැ. මම කියන්නේ, ඒක තමයි එතැන වෙච්ච වෙනස. අලුත් ආයතනය දැන් නිර්මාණය කරගෙන යනවා, ඒ තමන්ගේ logic එක අනුව. උදාහරණයක් හැටියට Transco - National Transmission Company - එකට එකතු කරනවා, LTL Holdings කියන ආයතනය. LTL Holdings ආයතනය කියන්නේ, ඇත්ත වශයෙන්ම විදුලිය ජනනය කරන ආයතනවලින් ලංකාවේ දෙවැනි විශාලතම ආයතනය. හැබැයි, LTL Holdings එක තිබෙන්නේ transmission company එක යටතේ. Transmission කියන්නේ සම්ප්‍රේෂණය. එතකොට ඔයගොල්ලන්ගේ logic එක පිළිබඳව ලොකු ගැටලුවක් පැන නඟිනවා, කාගේ වුවමනාවටද මේ වැඩේ කළේ කියලා. අපි මේ පාර්ලිමේන්තුවේදී විවේචනය කරනකොට, යම් පුද්ගලයකු මේකේ සභාපති වෙන්න බලාපොරොත්තු වෙනවාද, ඒකද මේ වැඩේ කරන්නේ කියලාත් අපි ප්‍රශ්න ඇහුවා. නමුත්, ඒවාට උත්තර ලැබුණේ නැහැ. ඒ කෙසේ වෙතත්, යම් ආරම්භයක් ලබාගෙන තිබෙන බව අපට පෙනෙනවා. දැන් තිබෙන ප්‍රශ්නය තමයි, මේ කරන transformation එක කරන්නේ කොහොමද කියන එක. හරි, තමන්ගේ දේශපාලන මතවාදයට අනුව ඒ ප්‍රතිපත්තිය වෙනස් කළා. දැන් වෙන විධියකට මේ unbundling එක කරනවා.

අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කථා කරනකොට ප්‍රශ්නයක් ඇහුවා, කවුද මේකට නායකත්වය දෙන්නේ කියලා. මේ expert panel එක කවුද? මේ ආයතන restructure කරනකොට, reform කරනකොට ඉන්න consultantsලා කවුද? එක්කෙනෙකුගේ දෙදෙනෙකුගේ team එකකට මෙය ප්‍රතිව්‍යුහගත කිරීමේ හැකියාව තිබෙනවාද? මේකට international consultancy ආයතනයක් නැත්තේ ඇයි? එතුමා සඳහන් කළා, ජාත්‍යන්තරව පිළිගත් firms කිහිපයක නම්. මේවා එකකවත් සහයෝගය ලබා ගන්නේ නැත්තේ ඇයි කියන මූලික ප්‍රශ්නය අපට අහන්න සිද්ධ වනවා.

ඔබතුමන්ලා පිටු 8ක structure එකක් ඉදිරිපත් කළා, අලුත් entities හදන්න. නමුත්, ඒකට දැවැන්ත විරෝධයක් ආවා. Engineersලා ඒකට විරුද්ධ වුණා. ඔබතුමා කිව්වා, ගොබෙල්ස් න්‍යාය යටතේ expertsලා කියා ගන්නා කට්ටිය කවුද කියලා. බොහෝදෙනා ඒකට විරුද්ධ වුණා. දැන් අපට ආරංචි වෙලා තිබෙනවා, ඒ විරෝධයත් එක්ක අලුත් plan එකක් හදන්න ඔබතුමන්ලා දැන් කල්පනා කරනවා කියලා, අර පිටු අටේ plan එක වෙනුවට.

So, really, the question is whether there is a Master Plan for this transformation. Have you conducted due diligence? Is there an Action Plan? Are there checklists and timelines? Have you identified who is responsible for what and by when? Those are questions that need to be asked. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, සමහර වෙලාවට ලාභෙට වැඩ කරන්න ගිහිල්ලා අනා ගත්ත අවස්ථා බොහොමයක් තිබෙනවා. සමහර වෙලාවට මේ වාගේ දැවැන්ත දෙයක් කරනකොට ඒකට අපිට යම් කිසි මුදලක් වැය කරන්න සිද්ධ වනවා කියන එකත් මම ඔබතුමන්ලාට කියන්න කැමැතියි. ඒ නිසා අපිට දැන ගන්න ඕනෑ, අවම වශයෙන් මේ ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් රජයට එක තීරණයක් තිබෙනවාද කියලා. උදාහරණයක් හැටියට පුබුදු නිරෝෂන් මැතිතුමා තමයි මේ සම්බන්ධයෙන් වැඩිපුරම කථා කරන්නේ. PSRS එකේ ප්‍රධානියා. අපි පත්තරවල දැක්කා, ගරු ඇමතිතුමා එතුමාගේ සේවාව දීර්ඝ කිරීමේ ලිපිය අත්සන් කරන්න බැහැ කිව්වාද, එතුමාට ගෙදර යන්න කිව්වාද මොකක්ද එකක් කියලා. ඊට පස්සේ පත්තරවල අපි දැක්කා, ජනාධිපතිතුමා කිව්වා කියලා, එහෙම එකක් නැහැ, ඔහුට නැවතත් ඒ කාර්යභාරය ලබා දෙන්න කියලා. ගරු ඇමතිතුමා පාර්ලිමේන්තුවේ ඉන්නවා, අපට ප්‍රශ්නයක් අහන්න පුළුවන්. සමහර විට අපේ ප්‍රශ්නයට එතුමා දෙන උත්තරයට අපි එකඟ නොවෙන්න පුළුවන්. නමුත්, එතුමා ඉන්නවා අපට උත්තර දෙන්න. හැබැයි, ගරු මරික්කාර් මැතිතුමාගේ සභාපතිත්වයෙන් තිබෙන SOC එකේදී පුබුදු නිරෝෂන් මැතිතුමාගෙන් අපි ඇහුවා, transmission network එකට අවශ්‍ය ආයෝජන කරන්න කොපමණ විතර මුදලක් ඊළඟ අවුරුදු 5ට බලාපොරොත්තු වනවාද කියලා. එතුමා SOC එකේදී දුන් උත්තරය තමයි, ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක් ඕනෑ කියන එක. ඒ ඇමෙරිකානු ඩොලර් බිලියන පහෙන් එක ඇමෙරිකානු ඩොලර් බිලියනයක් ආණ්ඩුවෙනුත්, ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක් පෞද්ගලික ආයෝජන හරහාත් ලබා ගන්න බලාපොරොත්තු වනවා කියලා කිව්වා. දැන් ඇත්තටම මොකක්ද වෙන්නේ කියන එක අපට මේ Budget එකෙන් බලාගන්න පුළුවන්.

ඊට කලින් මම යමක් කියන්නම්. කලින් තිබුණු plan එක අනුව සියයට 51ක් තිබුණෙ ආණ්ඩුවට; සියයට 49ක් දක්වා පෞද්ගලික ආයෝජන මේ සඳහා ලබා ගන්න හැකියාවක් තිබුණා. එසේ වුණා නම් ඔය ඩොලර් බිලියන 4 ලබා ගන්න හැකියාවක් තිබුණා. දැන් එහෙම එකක් නැහැ.

අපි මේ Budget එක ගැන නේ කථා කරන්නේ. ඒ නිසා අපි පොඩ්ඩක් මේ Budget Estimates, 2026 පොත පෙරළලා බලමු. මේ පොතේ 279වන පිටුවට ගියාම, "Development Activities" යටතේ තිබෙන්නේ, "Power Generation, Distribution & Development" කියලා. මේකේ තිබෙනවා, 2026 අවුරුද්දේ

[ගරු හර්ෂ ද සිල්වා මහතා]

ඔබතුමන්ලා කොච්චර වියදම් කරන්න බලාපොරොත්තු වෙනවාද කියලා. මේකේ capital එක රුපියල් බිලියන 21යි තිබෙන්නේ. එච්චරයි තිබෙන්නේ. මුළු අවුරුද්දටම බිලියන 21යි. ඒ බිලියන 21න් බිලියන 7.6ක් යනවා ADB, JICA එක හරහා ගත්ත CEB loan එකට. ඉතිරි ඒවායෙන් බිලියන 1.1ක් Colombo Waste-to-Energy Power Plant එකේ හිස්තැනක් පුරවන්න තිබෙනවා. ඊට පස්සේ මිලියන 302ක් තිබෙනවා, "Expending the Capacities & Capabilities of the SLAEB" යටතේ. ඊළඟට, ලොකු projects තුනක් තිබෙනවා. බිලියන 5.4ක් තිබෙනවා, "Kerawalapitiya - Port 2nd Transmission Line Project" එකට. ඊට පස්සේ, "Sampur Kappalthurai Transmission Development Projects" සඳහා බිලියන එකහමාරයි. "Installation of 75MW A Synchronous Condenser Unit at New Habarana" කියලා බිලියන 1.8යි.

දැන් ඔබතුමන්ලා මේක පොඩ්ඩක් අහගන්න. මොකද, අපි මේ Budget එක ගැන නේ සාකච්ඡා කරන්නේ. මේ කියපු ඩොලර් බිලියන පහෙන් අවුරුද්දක් ගණනේ ඇමෙරිකානු ඩොලර් බිලියනයක් ගෙනාවා කියලා අපි හිතමු. ඒ කියන්නේ, බිලියන 310ක් මේ අවුරුද්දේ එන්න ඕනෑ. හැබැයි, මේ ආණ්ඩුව Budget එකෙන් වෙන් කරන්නේ බිලියන 20යි. ඒ කියන්නේ සියයට 18ක වාගේ ප්‍රමාණයක්. මේ transmission එකට පමණක් අවශ්‍ය ප්‍රමාණයෙන් සියයට 8ක වාගේ ප්‍රමාණයක් තමයි මුළු CEB එකටම වෙන් කරන්නේ.

බලන්න, මේකේ cost එක කීයද කියලා. කලින් කිව්වා, cost එක අඩු කරන්න තමයි reforms කරන්නේ කියලා. Kerawalapitiya - Port 2nd Transmission Line Project එකට AIIB loan එක ඩොලර් මිලියන 52යි. ඒකේ interest cost එක, SOFR එකත් සමඟ සියයට 0.5ක් විතර එකතු වුණාම සියයට 4.5ක් විතර වනවා. හැබැයි, ඉස්සර වාගේ නොවෙයි, Public Debt Management Office එකෙන් ඔය loan එක assess කරලා ඒකේ අවදානමට - risk එකට - premium එකක් එකතු කරනවා. ඒ premium එක සියයට 4.34ක් වනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එතකොට මේ ඩොලර් මිලියන 52 loan එකට සියයට 9කට ආසන්න පොලී ප්‍රමාණයක් අපි ගෙවනවා. සියයට 8.85ක් ගෙවනවා. හිතන්න, මේ කරන structure එක හරහා සියයට 8.8ක් ඇමෙරිකන් ඩොලර්වලින් ගෙවනවා. මම කියන්නේ පොතේ තිබෙන ඉලක්කම. ඇමෙරිකන් ඩොලර් බිලියනයක් වෙනුවට ඩොලර් මිලියන 50ක් ගෙනැල්ලා, ඒ ඩොලර් මිලියන 50ට සියයට 9කට ආසන්න පොලියක් ගෙවලා, අපි විදුලි බිල අඩු කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය අහන එක සාධාරණයි කියලා මම විශ්වාස කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. විපක්ෂ නායකතුමාත්, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාත් දිගින් දිගටම කිව්වා, "අපි පුනර්ජනනීය විදුලිය නිෂ්පාදකයන් වෙනුවෙන් පෙනී ඉන්නවා" කියලා. ඒකේ කිසි වැරැද්දක් නැහැ. අපි ඩීසල් මාෆියාවත් එක්ක නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කාලය අවසන් බව මම දන්නවා. මට විනාඩියක් දෙන්න.

මෙවර Budget එකෙන් solar PV storage කරනවාට යම් දිරි දීමනාවක් ලැබෙයි කියලා බොහෝ දෙනා බලාපොරොත්තු වුණා. නමුත්, ලැබුණේ නැහැ.

ඒ වාගේම මම මේ කාරණයත් කියන්න ඕනෑ. Treasury එකට ලැබෙන මුදල් ගැන හැමෝම කථා කරනවා. ඒක බලාපොරොත්තු නොවුණු ආදායමක්. පෙට්‍රල් සහ ඩීසල් වාහන ආනයනය කරලා ගහපු බදුවලින් තමයි ඒ රුපියල් බිලියන 600ක විතර අමතර ආදායම ලැබුණේ. එහෙම නම් මම යෝජනාවක් කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ගරු ඇමතිතුමනි, අපට පුළුවන් ඒකෙන් fund එකක් හදන්න. පෙට්‍රල්, ඩීසල් වාහන ආනයනයෙන් ලැබුණු බදු ආදායමෙන් අපි හදමු fund එකක්. ඒ fund එක පාවිච්චි කරමු subsidy එකක් දෙන්න, මේ PV storage සඳහා, PV store කරන්න battery storagesවලට. අපට මේ වාගේ දෙවල් අලුතින් හිතන්න පුළුවන්. ඒ විධියට හිතන්නේ නැත්නම් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හොඳයි, මම අවසන් කරනවා.

අපේ plan එකත් confuse වෙලා තිබෙනවා නම්, අපි බලාපොරොත්තු වන විදුලි බිල අඩු කිරීමේ කාර්යය කරන්න බැහැ කියන එක මට මේ අවස්ථාවේ කනගාටුවෙන් වුණත් කියන්න සිදු වනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.30]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ ආණ්ඩුව බලයට එනකොට කිව්වේ, "බලශක්තිය යනු ජනතාවගේත්, ආර්ථිකයේත්, සංවර්ධනයේත්, රුධිරය" කියලා. හරි ද? ඒකට දැන් වෙලා තිබෙන්නේ මොකක්ද කියලා බලමුකෝ. JVP එක තමයි කිව්වේ, හොර සූත්‍ර හදලා තිබෙනවා කියලා. ඒගොල්ලෝ කියපු විධියට දැන් තවම හොර සූත්‍රයට තමයි කටයුතු කරමින් යන්නේ. රුපියල් 9,000ක විදුලි බිල රුපියල් 6,000ට අඩු කරනවා කියලා ආපු කට්ටිය තමයි අවුරුද්දක් ගිහිල්ලාත් තවම ඒ විධියටම විදුලි බිල තියාගෙන ඉන්නේ. එම නිසා මේගොල්ලන්ගේ කියුම් කෙරුම් ටික පොඩ්ඩක් කියන්න ඕනෑ.

මෙතුමන්ලා කියනවා, ලංකා විදුලිබල මණ්ඩලය දැන් රුපියල් බිලියන 13ක පාඩුවක් ලබනවා ලු. ඒක අමූලික අසත්‍යයක්. ලංකා විදුලිබල මණ්ඩලයේ රුපියල් මිලියන 21,000ක ලාභයක් තිබෙනවා. හැබැයි, අතීතයේ අරන් තිබෙන ණයත් එකතු කරලා තමයි මෙතුමන්ලා cost එක හදන්නේ. ඒ හොරා කාපුවා, නාස්ති කරපුවා ඔක්කෝම පාරිභෝගිකයා මත පටවන්න තමයි සූදානම්

වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විදුලි බිල වැඩි කිරීමේ හෝ අඩු කිරීමේ බලය තිබෙන්නේ PUCSL එකටයි. මේගොල්ලෝ ඉදිරි මාස තුනේ නියඟය, අරවා, මේවා කියලා මේක කරගන්නයි හදන්නේ. පසුගිය කාලයේ සියයට 74ක් විදුලිය ජනනය කරලා තිබෙන්නේ ජලයෙන්. සාමාන්‍යයෙන් විදුලි ඒකකයකට රුපියල් 2.60යි වියදම් වෙන්නේ. රුපියල් 3.00යි කියමුකෝ. විදුලි මාෆියාවට යට වෙලා තමයි බොරු කියලා, මුදල් අමාත්‍යාංශය හරහා PUCSL එකට නියෝග දීලා විදුලි බිල වැඩි කරන්න හදන්නේ. ඇත්ත වශයෙන්ම කරන්න ඕනෑ, පනත අනුව මණ්ඩලයේ ලාභයෙන් කොටසක් පාරිභෝගිකයාට සහන ලබා දීමට වෙන් කිරීමයි. එහෙම නම් මේගොල්ලෝ කරන්න ඕනෑ විදුලි බිල අඩු කිරීමයි. විදුලි බිල අඩු කිරීම කෙසේ වෙතත් වැඩිපුර ඩීසල් ඒවායින් මිලදී ගන්න තමයි කටයුතු කරන්නේ. හොඳ වෙලාවට PUCSL එක තිබුණේ. PUCSL එක නොතිබුණා නම් ෂොට් එක දෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, තව කියන්න ගොඩක් දේවල් තිබෙනවා. භාණ්ඩාගාරය උතුරන්න දැන් සල්ලි තිබෙනවා කිව්වා නේ. එහෙම නම් ජනතාවට සහන දෙන්නකෝ. විදුලි බිල අඩු කරන්නකෝ. තෙල් මිල අඩු කරන්නකෝ. භාණ්ඩාගාරය උතුරන්න සල්ලි තිබෙනවා කිව්වාට, ඒ එකක්වත් කරන්නේ නැහැ නේ.

විශේෂයෙන්ම ස්වාධීන මිල නියාමන කොමිසම ගැන බලමු. ඇවිදින පුස්තකාල කියලානේ කිව්වේ. ඇවිදින පුස්තකාල නම්, විනිවිදභාවයෙන් කටයුතු කරනවා නම් ස්වාධීන මිල නියාමන කොමිසම ක්‍රියාත්මක කරන්නකෝ. හොරා කනවා කියපු, කොමිස් ගහනවා කියපු කංචන ඒ කොමිසම ගෙනාවා. ඒක ක්‍රියාත්මක කරන්නේ නැතිව ඉන්නවා. හැබැයි එතුමාට ඕනෑ ඕනෑ ජාති නම් ඔක්කෝම සිද්ධ වනවා. මගේ කථාවේ ඉතිරි හරියේදී මම ඒ ටික විස්තරාත්මකව කියන්නම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ලංකාවේ විදුලි බල ක්ෂේත්‍රයට reforms ගෙනැල්ලා ඔබතුමන්ලා ආයතන 4ක් හැදුවා. එම ආයතන 4ට කවුද දාලා තිබෙන්නේ? සේවකයන්ව මාරු කරලා තිබෙනවා, ඒ අයට දෙන වන්දිවලටත් රුපියල් බිලියන 10ක් විතර වැය වනවා. මේ අය අන්තිමට ඒකත් පාරිභෝගිකයාගේ කරට දැමීමේ සූදානමකින් දැන් ඉන්නේ. ඒ ආයතන 4ටම දාලා තිබෙන්නේ CEB එකේ හිටපු පරණ අය. කවුද ඒ? අද CEB එක මේ තත්ත්වයට ගෙනාව අයම තමයි reform කළ ආයතනවලට මෙතුමා පත් කරලා තිබෙන්නේ. Distribution company එකේ Chairman කවුද, CEB එකේ හිටපු නිලධාරියෙක්. Generation company එකේ CEOත් එහෙමයි. පද්ධති පාලන සමාගමේ - NSO එකේ - සභාපති ලෙස දාලා තිබෙන්නේ කවුද? LECO එකේ ඉඳලා කළු පාට බෙන්ස් එකක්ම ඕනෑය කියලා රුපියල් ලක්ෂ 800කට බෙන්ස් එකක් ඕඩර් කළ කෙනා. මෙන්න ඇවිදින පුස්තකාලවලින් පත් කරන අය. LECO එකේ ඉඳලා රුපියල් ලක්ෂ 700ක බෙන්ස් එකක් තිබියදී කළු පාටම බෙන්ස් එකක් ඕනෑය කියලා රුපියල් ලක්ෂ 800කට බෙන්ස් ගන්න ගිය කෙනා තමයි පත් කරලා තිබෙන්නේ. ඊළඟට, CEB එකේ ඉන්නකොට කොටසක්වත් හරියට පාලනය කර ගන්න බැරි වුණු අය තමයි සම්ප්‍රේෂණ සමාගමටත් පත් කරලා තිබෙන්නේ. මේ පත්වීම් දිහා බැලුවාම හොඳට පෙනෙනවා, ඇමතිවරයා කොහොමද මේ පත් කිරීම් කරන්නේ කියලා.

දැන් Electricity Generation Lanka (Pvt.) Limited එකට අධ්‍යක්ෂවරුන් තුන්දෙනෙක් පත් කරලා තිබෙනවා. මේ තුන්දෙනාම ඉංජිනේරුවෝ. එතකොට කෝ, procurement විෂය දන්නා කෙනෙක්? කෝ, finance දන්නා කෙනෙක්? ඒ එක්කෙනෙක්වත් පත් කරලා නැහැ. හරි විධියට බැලුවාම මේ පත් කිරීම් පනතට පටහැනියි, පනතට විරුද්ධව කරන්නේ. මට එක දෙයක් පෙනෙනවා. මේ ඇමතිවරයා නම් අනිවාර්යයෙන් ජනාධිපතිව අන්දලා මේ ආණ්ඩුව කවදා හරි වළ පල්ලට තල්ලු කරනවා; ඒක නම් පැහැදිලිවම කියන්න ඕනෑ. LECO එකට තරුණ සේවක කණ්ඩායමක් ඇවිල්ලා ඒක සක්‍රිය කළා. මේ බොහෝ ආයතනවලට විශ්‍රාමික නිලධාරින් දාන්නේ ඇයි? අලුත් අයට, තරුණ අයට අවස්ථාව නොදෙන්නේ ඇයි කියන එක මම අහන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ලංකාව පුරාම කරන්ට් එක කැපුවාම ඇමතිතුමා එක පාරට ඇවිල්ලා කිව්වානේ, වඳුරෙක් පැනපු නිසා මෙහෙම වුණා කියලා. ඊට පස්සේ මේ ගැන හොයන්න කමිටුවක් පත් කළා, මහාචාර්යවරුන්ගෙන් සමන්විත. ඒ කමිටුවේ එක නිර්දේශයක්වත් තවම ක්‍රියාත්මක කරලා නැහැ. ඒ වෙනුවට කරලා තිබෙන්නේ මොකක්ද? බැටරි ගන්න ටෙන්ඩර් එකක් call කරලා වැඩක් යනවා කියලා ආරංචියි. ඉස්සරහට අපි ඒ තොරතුරු ටිකත් දෙන්නම්.

මෙතුමන්ලා දැන් දිගින් දිගටම LNG ගැන කථා කරනවා. ඔව්, අනෙක් අයට ඒක කරන්න බැරි වුණා. ඉන්දියානු සමාගමක් දුන් යෝජනාවක් තිබෙනවා. දැන් ටෙන්ඩර් එකක් දාලා, චීන සමාගමක් විසින් සුදු අලියෙක් කරන වැඩ කොටසකුත් යටින් යනවා. ඉදිරි කාලයේදී අපි ඒ තොරතුරුත් එළියට දාන්නම්. මරුම වැඩේ කියන්නේ, CEB එකේ වැඩවලදී දේශීය සමාගම්වලට ඒවාට එන්න බැරි වන විධියට තමයි ඒ ටෙන්ඩර් ඔක්කෝම හදන්නේ. මම කියන ඒවා බොරු නම් ඔබතුමාට ඇත්ත කියන්න පුළුවන්.

ඊළඟට CPC එක පෙන්වනවානේ, ඒගොල්ලන් විශාල ලාභයක් ලබනවා කියලා. කොහොමද ඒ අය ලාභ ලබන්නේ? දැන් CPC එක තමයි දැවි තෙල් දෙන්නේ විදුලි ජනනයට. හරි නම් ගාණ අඩු වෙන්න ඕනෑ. ඒක දෙන්නේ රුපියල් 177ට. හැබැයි ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව direct import කළා නම්, රුපියල් 155ට ගන්න පුළුවන්. එහෙම කරලා කියනවා, CPC එක පට්ට ලාභ ලබනවා කියලා. මම ගණන් හිලව් ඔක්කෝම කියන්නම්. CPC එක දැවි තෙල් දෙනවා, රුපියල් 177ට. මේක import කරන්න පුළුවන්, 155ට tax නැතුව. Tax එක්ක ගෙනාවත් රුපියල් 166යි. Yugadanavi Power Plant එකේ නිෂ්පාදනය රුපියල් 41ට ඇවිල්ලා තිබෙනවා. හැබැයි, මේක රුපියල් 36ට අඩු කරන්න පුළුවන් tax නැතිව direct import කළා නම්. Tax එක්ක direct import කළා නම් රුපියල් 36ට අඩු කරන්න පුළුවන්, 41 ඉඳලා. එතකොට ඒකේ ප්‍රතිලාභය පාරිභෝගිකයාට දෙන්න පුළුවන්. ඒක නොදෙන්නේ ඇයි කියන එක මම අහන්න කැමැතියි. මොකද, සාමාන්‍යයෙන් අවුරුද්දකට Yugadanavi Power Plant එකෙන් unit මිලියන 800ක් නිෂ්පාදනය කරනවා. එතකොට tax එකත් එක්ක අරගෙන බැලුවත්, රුපියල් 5කින් අඩු කළොත් කොච්චර ප්‍රමාණයක් අඩු වනවාද? ඒ වාසිය පාරිභෝගිකයාට දෙන්න පුළුවන් නේ. මෙහෙම කරලා තමයි දැන් අතිරේක ලාභය රුපියල් මිලියන 3,600ක් කියලා CPC එක පෙන්වන්නේ. කාවද මේ රවටන්නේ? මිනිස්සුන්ව අන්දන එක නේ කරන්නේ.

ඩීසල් මිල ගැනත් මම ඒ විධියටම කියන්නම්කෝ. ඩීසල් ලීටරයක් රුපියල් 277ට දෙන්නේ. හැබැයි, tax නැතුව ඒක රුපියල් 205ට ගෙනෙන්න පුළුවන්. Kelanitissa Power Plant එකේ per unit cost එක රුපියල් 67යි. මේක රුපියල් 50ට අඩු කරන්න පුළුවන්. සාමාන්‍යයෙන් අවුරුද්දකට units මිලියන 600ක් නිෂ්පාදනය කරනවා. එහෙම කරලා කියනවා, ඔන්න CPC එකට මිලියන 10,500ක් ලාභයි කියලා. මිනිස්සුන්ව නැති කරලා, මිනිස්සුන්ගේ රීරි මාංස උරා බීලා, වේදිකාවල බොරු කියලා තමයි මේවා කරන්නේ.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

මට තව ගොඩක් දේවල් කියන්න තිබෙනවා. ඒ අතර මට තව tender එකක් ගැනත් කරුණු ඉදිරිපත් කරන්න තිබෙනවා. ඒ tender එක ගැන කරුණු ඉදිරිපත් කරන්න කලින් තව කරුණු කිහිපයක් කියන්න ඕනෑ. දැන් ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කරලා තිබෙනවා. මේගොල්ලන් ගෙනාපු සංශෝධනයෙන් solar powerවලට සම්පූර්ණයෙන්ම ගේම් එක දෙනවා. ගණන අඩු කරලා, අඩු කරලා, අඩු කරලා discourage කරනවා. ඇයි? ඒක නැති කරලා දමන්න. එතකොට තේ මාටියා ගහන්න පුළුවන්, ඉන්ධනවලින් හදන ඒවායෙන්. දැන් ඒක අඩු කරලා, ඒ ගැන ඇහුවාම කියනවා, බැටරි පද්ධතියක් නැහැ, බැටරි පද්ධති ගෙනෙන්න යනවාලු. දැන් අවුරුද්දක් වෙනවා. මොනවාද කරන්නේ? අවුරුද්දක් වෙලාත් මොනවාද කරන්නේ මේකේ?

අනික් කාරණය තමයි, ආපු ගමන් National Electricity Advisory Council - NEAC - එක අයින් කළා. ඒක තිබුණේ ඇමතිතුමාට හරියාකාරව උපදෙස් ලබා දීම සඳහා. ස්වාධීන, සුදුසුකම්ලත් කණ්ඩායමකින් තමයි ඒක හදලා තිබුණේ. දැන් ඒ කමිටුව වෙනුවට හෙංචයියන්ගෙන් යුත් කමිටුවක් දමාගෙන, ඔන්න ඒක අහෝසි කරලා වැඩේ ගෙනියනවා. ඒ නිසා අපි ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, මේ කරන වැඩවලින් වෙන්නේ මොකක්ද කියලා.

ලංකාවේ සම්ප්‍රේෂණ පද්ධතිය දියුණු කිරීමේ තදබල අවශ්‍යතාවක් තිබෙනවා. ඒකට ඩොලර් බිලියන 5ක් විතර ඕනෑ. මේකට ආණ්ඩුව ඩොලර් බිලියන 5ක් දමනවා කියන එක පට්ටපල් බොරුවක්. විශේෂයෙන්ම ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, JICA වැනි ආයතන මේ සම්බන්ධව අනතුරු ඇඟවීම් කරලා තිබෙන්නේ. ආයෝජන විශ්වාසය සම්පූර්ණයෙන් අහිමි කරලා මේ වැඩේ කරන්න යන්නේ කොහොමද කියලා මට නම් තේරෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, තව කාරණයක් කියන්න තිබෙනවා. ගොඩක් කාරණා කියන්න තිබුණාට වෙලාව මදි නිසා මම ඉක්මනට ඒ කරුණු ටික කියලා කථාව අවසන් කරන්නම්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ත්‍රිකුණාමලයේ solar power project එකක් කරන්න යනවා. ඇමතිවරයා බලපෑම් කරන්නේ මේක කාට දෙන්න කියලාද? Blue Sun Technologies කියන කොම්පැනියට. මොකක්ද, ඒ කොම්පැනිය? ඒ කොම්පැනියේ සියයට සියයක් අයිතිය තිබෙන්නේ NEM Construction (Pvt.) Limited එකට. ඒ කොම්පැනි එකත් එක්ක ඇමතිවරයාට තිබෙන සම්බන්ධය මොකක්ද? එතුමාව පොහොර සංස්ථාවෙන් අස් කළාම රස්සාව දුන්නේ ඒ කොම්පැනිය. ඒ කොම්පැනියෙන් තමයි රස්සාව දුන්නේ. දැන් ළබැඳියාවන් අතර ගැටුමක් ඇති වනවා. හැබැයි, එක් දක්ෂ වැඩක් යනවා. ඇමතිතුමා ලිඛිතව කිසි දෙයක් දෙන්නේ නැහැ. ලේකම්තුමා හරහායි, private secretary හරහායි, telephone එකෙනුයි තමයි උපදෙස් දෙන්නේ. මොකද, පොහොර සමාගමෙන් පාඩමක් ඉගෙනගෙන ද කොහෙදෝ. මේ කොම්පැනියට පරිසර අනුමැතිය නැහැ, ඉඩම් අනුමැතිය නැහැ, විදුලිබල මණ්ඩල ජාල සම්බන්ධීකරණ අනුමැතිය නැහැ. ඒ එක අනුමැතියක්වත් නැතිව මේ සමාගමට එම ව්‍යාපෘතිය ලබා දෙන්න උත්සාහ කරන්නේ ඇයිද කියන එක අපි දන්නේ නැහැ. මේ සම්බන්ධව සමාජ මාධ්‍යයකත් වාර්තා කර තිබෙනවා මම දැක්කා. ඇත්තවශයෙන්ම මේ කාරණය නිසා නිලධාරින් එක්ක වැඩ කරගන්න බැරි තත්ත්වයක් අමාත්‍යාංශයට ඇති වෙලා තිබෙනවා. වැඩිය ඕනෑ නැහැ, අමාත්‍යාංශ ලේකම් මහාචාර්යවරයෙක්. එතුමාටත් මූනිවත රැකගෙන බලාගෙන ඉන්න වෙලා තිබෙනවා කියලා තමයි අපට වටෙන් පිටෙන් ආරංචි එන්නේ.

ඒ වාගේම මට තව කාරණයක් කියන්න තිබෙනවා. මට එතුමාගේ නම මතකයි. නමුත් මම නම කියන්නේ නැහැ. තනතුර, විදුලිබල ප්‍රතිසංස්කරණ කමිටුවට පත් කරපු අධ්‍යක්ෂ ජනරාල්වරයා. එතුමා ඉල්ලාගෙන නැවා. ඔහුගේ සේවා කාලය දිගු කර දෙන්න කියලා, ඊට පස්සේ ඔහු අස් කරලා, ආයෙත් පැලවත්තට ගෙනැල්ලා ෂොට් එක දුන්නාම, ඉක්මනින්ම ලියුම දෙන්න වුණා. මේ කථාව ජනාධිපතිතුමා අහනවා නම්, නැත්නම් ජනාධිපතිතුමාගේ මාධ්‍ය අංශයෙන් මේක එතුමාට පෙන්වනවා නම්, අපට ජනාධිපතිතුමාට කියන්න තිබෙන්නේ, මේ ඇමතිවරයා ඔබතුමාව අන්දනවා කියලායි. කවදා හෝ මේ ආණ්ඩුව නැති කිරීමේ ආරම්භක පුද්ගලයා වන්නේ මේ ඇමතිවරයා කියන එක මට පැහැදිලිව කියන්න පුළුවන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම කලින් දවසකත් මේ සම්බන්ධව ප්‍රශ්නයක් ඇහුවා.

දැන් මේ හැම එක්කෙනෙක්ම smartphones පාවිච්චි කරන්නේ නැහැ. අපේ පළාත්වල ඉන්නවා වයසක උදවිය රුපියල් 4,000, රුපියල් 5,000 වටිනා පොඩි phones පාවිච්චි කරන්නේ. එක පාරට ඇවිල්ලා කරන්ට් කපා ගෙන යනවා. අපි ඒකට සහන කාලයක් ඉල්ලුවාම, "දෙන්න බැහැ" කියනවා. එකපාරම කියනවා, දෙන්න බැහැ කියලා. අඩුම ගණනේ හොයලා බලන්නම් කියලාවත් කියන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ටික ගැනත් පැහැදිලිව කියන්න ඕනෑ. ඒ කාලයේ කිව්වා, ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ඉන්දියාවට විකුණන්න යනවා කියලා. ලොකුවට ඒකට උද්ඝෝෂණ - protests - කළා, වැඩ වර්ජන කළා. ඒ ඔක්කෝම කරලා මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා ඒක කරනවා. ප්‍රශ්නයක් නැහැ. දැන් ඒකට අත්සන් කරලා සෑහෙන කාලයක්. ඒක තේ අපි කියන්නේ රට යනවා,එනවා; රට යනවා, එනවා විතරයි කියලා. හම්බ වෙච්ච දෙයකුත් නැහැ, ගත්ත දෙයකුත් නැහැ. හරිද? දැන් ඒකට ගිවිසුමක් අත්සන් කරලා තිබෙනවා. ඒ ගිවිසුම අත්සන් කළාට ඒ තෙල් ටැංකිවලින් එකක් හෝ කිහිපයක් හෝ දියුණු කිරීම තවම ආරම්භ කරලාවත් නැහැ. ඔන්න, මාර කාර්යක්ෂමතාව! ඇවිදින පුස්තකාල!

තවත් එක්කෙනෙක් කිව්වානේ, 159දෙනාම කදිරගාමර්ලා වාගේ ලු. මට මතක නැහැ කවුද ඒක කිව්වේ කියලා. මෙන්න "ජයකොඩි ගාමර්ගේ" තත්ත්වය. තවත් එක "ගාමර්" කෙනෙක් කිව්වා, ඒගොල්ලෝ භාර ගන්නකොට තෙල් පෝලිම්, ගෑස් පෝලිම් තිබුණා ලු. මොන ලෝකයේ ඉන්නවාද දන්නේ නැහැ. ඒක කිව්වේ "හර්ෂණ ගාමර්." රුපියල් බිලියන පහයි දශම ගණනක භාණ්ඩාගාරයේ ඉතිරියක් එක්ක තමයි ඔබතුමන්ලා ආණ්ඩුව භාර ගත්තේ. ඔබතුමන්ලාට ආයෝජන ගෙනෙන්න බැරි නිසා, ඩොලර් ආදායම මේ රටට ගෙනෙන්න බැරි නිසා මේ වාගේ පට්ටපල් බොරු කියන්නේ ඇයි? කිව්වේ නැද්ද, රුපියල් 9,000ක බිල රුපියල් 6,000ට ගෙනෙනවා, රුපියල් 6,000 බිල රුපියල් 4,000ට ගෙනෙනවා, 3,000 බිල රුපියල් 2,000ට ගෙනෙනවා කියලා? කිව්වේ නැද්ද? හැම තෙල් ලීටරයකින්ම මහ බැංකුවට රුපියල් 50ක් දෙනවා, අපි ආපු ගමන් ඒවා අයින් කරනවා කිව්වා. කෝ අද ඒවා? ඒවා මිනිස්සු අන්දන්න කිව්වා ද මම දන්නේ නැහැ. මේගොල්ලෝ කියන බොරුවල හැටියට ඔලිම්පික් ක්‍රීඩාවේ බොරු කීමේ තරගයක් තිබ්බොත් පදක්කම් 159ක් හම්බවෙයි. නේද? ඒ පදක්කම් ටික ඇඟේ දා ගත්තාම නිකම් යෝධයෙක් වාගේ පෙනේවි. ඒ තරමට බොරු කියනවා. අපි මේ අයට කියන්න කැමතියි කෙළිරි ගාන්නේ නැතිව දීපු පොරොන්දු ටික ඉෂ්ට කරන්න කියලා. ආහාරවල, අධ්‍යාපනයේ, සෞඛ්‍යයේ බදු බිංදුවට ගෙනෙනවා කිව්වා; දැන් කෙළිරි ගානවා. තෙල් ලීටරය රුපියල් 50න් අඩු කරනවා කිව්වා; දැන් කෙළිරි ගානවා. විදුලි බිල අඩු කරනවා කිව්වා; දැන් කෙළිරි ගානවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මාලිමා ආණ්ඩුව ගෙනෙන්න, මාලිමාවට ඡන්දය දුන්නේ බහුතරයක් කාන්තාවෝ. සමහර ගෙවල්වල පිරිමියා සමඟි ජන බලවේගයට ඡන්දය දෙද්දී කාන්තාව තමයි මාලිමාවට ඡන්දය දුන්නේ. ඇයි? සමහර තරුණ කාන්තාවෝ TikTok බලාගෙන උයනකොට, වැඩිහිටි කාන්තාවෝ YouTube බලාගෙන උයනකොට - අම්මා තමයි ගෙදර දුක් විඳින්නේ - ස්වාමිපුරුෂයා හම්බ කරලා ගෙනැල්ලා දුන්නාම අම්මා තමයි ගෙදර වියදම් කළමනාකරණය කරන්නේ. එයා තමයි පඩිපත කළමනාකරණය කරන්න ඕනෑ. එතකොට ගෙදර වැඩියෙන්ම දුක් විඳින්නේ අම්මා. ඒ දුක දරා ගෙන උයනකොට මේගොල්ලෝ -ජනාධිපතිතුමාගේ කට්ටිය- ඇවිල්ලා කියනවා, අපි තෙල් ලීටරයක මිල රුපියල් 50කින් අඩු කරනවා. අපි ආහාරවල, අධ්‍යාපනයේ, සෞඛ්‍යයේ බදු බිංදුවට ගෙනෙනවා, අපි රුපියල් 9,000ට තිබෙන විදුලි බිල රුපියල් 6,000ට අඩු කරනවා කියලා. ඉතින් අර අම්මා හිතින් ගණන් හදලා බලනවා, රුපියල් 9,000ක් විතර මාසයට ඉතිරියි නේද කියලා. ඉතින්, ඇයි මම JVP එකට ඡන්දය නොදෙන්නේ කියලා හිතලා තමයි JVP එකට ඡන්දය දුන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
හොඳයි, මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

අපේ පළාත්වල සමහර ගෙවල්වල ස්වාමිපුරුෂයායි, බිරිඳයි ගෙදර fight. ඇයි? JVP එකට ඡන්දය දෙන්න ඕනෑ කියලා. ඡන්දය දුන්නේ මොකටද? බදු අඩු කරන්න, භාණ්ඩ මිල අඩු කරන්න, විදුලි බිල අඩු කරන්න, තෙල් මිල අඩු කරන්න. දැන් ඒ එකක්වත් නොකර කුඩු නාට්‍ය විතරයි පෙන්වන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කුඩු අල්ලන එක අනිවාර්යයෙන්ම හොඳයි. අපි ඒකට සියයට දෙසීයයක් සහයෝගය ලබා දෙනවා. පාතාලය මර්දනය කරන එක අනිවාර්යයෙන්ම හොඳයි. අපි ඒකටත් සියයට 200ක් සහයෝගය දෙනවා. හැබැයි, පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මේ අල්ලන ඒවාට මොනවාද වෙන්නේ කියලා කවුරුවත් දන්නේ නැහැ. ඒවා පුච්චනවාද, නැද්ද කියලා ඒවා පෙන්වන්නේ නැහැ. එතකොට ජනතාව තුළ සැකයක් එනවා මේවා දුඹුරු සීනි ද, පාන් පිටිද කියලා දන්නේ නැහැ කියලා. මොකද හේතුව, මේ අල්ලන ඇල්ලිල්ලට බඩු හිඟ වෙන්න එපායැ. බඩු හිඟ වුණා නම්, ඒ ඇබ්බැහිවූවන්ට ඒ මත්ද්‍රව්‍ය ගන්න එක අමාරු වෙන්න ඕනෑ. අමාරු වුණා නම්, "සික්" ගහන්න ඕනෑ. එහෙම "සික්කාරයෝ" කවුරුවත් අපට පෙනෙන්න නැහැ නේ.

අපි පැහැදිලිව මේ කාරණය කියන්න කැමැතියි. ඔබතුමන්ලා අවුරුදු පහකට බලයට ආවේ. තවම අවුරුද්දයි ඉවර. ඒ නිසා දැන්ම අපි ඔබතුමන්ලාගේ කකුලෙන් අදින්න, කඩාගෙන වට්ටන්න, රට අස්ථාවර කරන්න කිසිසේත්ම සූදානම් නැහැ. ඒ වාගේම, අර්බුද නිර්මාණය කරලා අර්බුද මතින් දේශපාලනය කරලා බලයට එන්න අපට කිසිම වුවමනාවකුත් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, අවසන් කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
අවසන් කරනවා.

ඔබතුමන්ලාට තව අවුරුදු හතරක් තිබෙනවා. අපට ඔබතුමන්ලා එක්ක පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. මේ විවේචන කරන්නේ දුන්නු පොරොන්දු ඉෂ්ට කරන්න කියලායි. ඒකට කෙඳිරි ගගා ඉන්න එපා. පාපිසි කෑලි ඔක්කෝම හාන කොට සති දෙකකට සැරයක් ජනාධිපතිතුමාටම ඇවිල්ලා ඒවා හෝදන්න වෙනවා. එතකොට කොල්ලෝ එතුමාට comments දානවා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ආවා කියලා. එතුමා ඒ තත්ත්වයට අසරණ කරන්න එපා. මොනවා වුණත් එතුමා රටේ ජනාධිපති නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වංචා දූෂණ සම්බන්ධ හැටහුටහමාරක් ෆයිල් තිබෙනවා. මේ අමාත්‍යාංශය තරම් වෙන කිසිදු අමාත්‍යාංශයකට අදාළ ෆයිල් කවුරුවත් අපට දුන්නේ නැහැ. අපි ඉදිරි කාලයේදී ඒවා ඇදලා ගන්නවා කියන එකත් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු උපාලි පන්නිලගේ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක් ලැබෙනවා.

[අ.භා. 1.48]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ ඉතාම වැදගත් ක්ෂේත්‍රයක් උසුලන බලශක්ති ක්ෂේත්‍රයේ අය වැය විවාදයට එක්වන්න ලැබීම පිළිබඳව මම බෙහෙවින් සන්තෝෂ වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු දක්වන අදහස් දෙස බලාගෙන ඉන්න කොට අපේ රටේ ජනතාවට හිතෙනවා ඇති, පසුගිය අවුරුදු 76 මේ රට පාලනය කළේ කවුද, මේ අමාත්‍යාංශය දැරුවේ කවුද කියලා. අපි විශේෂයෙන්ම මේ බලශක්ති ක්ෂේත්‍රය පිළිබඳව කථා කරන කොට, බලශක්ති

[ගරු උපාලි පන්නිලගේ මහතා]

ක්ෂේත්‍රයේ අර්බුදයකට මග පාදලා, ඒක අර්බුදයක නිමග්න කළේ කවුද කියලාත් මේ රටේ ජනතාව ඉතා හොඳින් දන්නවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

විශේෂයෙන්ම ජාතික ජන බලවේග රජය විධියට අපි බලශක්ති ක්ෂේත්‍රය ඉතාම වැදගත් කොට සලකනවා. ඒ ක්ෂේත්‍රයේ අපේ දැක්ම වාගේම, ඒ ක්ෂේත්‍රයේ අපේ සැලසුම් සියල්ල අපි සංවිධානගත කරලා තිබෙන්නේ බලශක්ති ස්වෛරීත්වයට අදාළවයි ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අපේ රටේ බලශක්ති ස්වෛරීත්වය කරා යන්න නම් අපට දේශීය මූලාශ්‍රවලින් බලශක්තිය ලබා ගැනීම සිදු කරන්න වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ රටේ සමහර ජනාධිපතිවරු, සමහර ජනාධිපතිවරියන් සමහර ඡන්ද කාලවලදී අපේ රටෙන් තෙල් හොයා ගත්තා. එහෙම තෙල් හොයා ගත්තාට තවම අපට මේ භූමියෙන් සත්‍ය ලෙස තෙල් හොයා ගන්න බැරි වෙලා තිබෙනවා. ඡන්දවලදී තේල් හොයා ගත්තාට, සත්‍ය ලෙස හොයා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒක නිසා අපට බලශක්තිය ලබා ගන්න තිබෙන්නේ කොහෙන්ද? අපට බලශක්තිය ලබා ගන්න තිබෙන්නේ, පුනර්ජනනීය - renewable - ප්‍රභවවලින්. අපි මුල් කාලයේ ඉඳන්ම පුනර්ජනනීය ප්‍රභවවලින් බලශක්තිය අරගත්තත්, 70 ගණන්, 80 ගණන් වනකොට ජලය මඟින් විදුලිය සපයා ගැනීමේ ඒ හැකියාව ක්‍රමයෙන් වියැකී ගියා. මොකද, අපේ සියලු ජල ප්‍රභව මේ වනවිට tap කරලා අපි විදුලිය නිපදවාගෙන තිබෙනවා. අපට ඊළඟට ඉතුරු වෙලා තිබෙන්නේ මොනවාද? ඊළඟට සූර්ය ශක්තියෙන් විදුලිය සපයා ගන්න පුළුවන්. සුළඟින් විදුලිය සපයා ගන්න පුළුවන්. අපට Dendro power වාගේ - දැව වාගේ - මූලාශ්‍රවලට යන්න පුළුවන්. අන්න ඒ නිසා අපේ බලශක්ති සැලැස්ම අපි සකස් කරලා තිබෙන්නේ ඉතාම කෙටි කාලයකින් පුනර්ජනනීය බලශක්තිවලින් අපි හැකිතාක් උපරිම බලශක්තියක් උපදවා ගන්නයි. විශේෂයෙන්ම සූර්ය බල ශක්තියෙනුත්, සුළං බලශක්තියෙනුත් පුනර්ජනනීය බලශක්තිය නිපදවා ගෙන ඒ හරහා අපේ රටේ ඉන්ධන අවශ්‍යතාවටත්, ඒ වාගේම විදුලිය අවශ්‍යතාවටත් වැඩි ප්‍රමාණයක දායකත්වයක් ලබා ගැනීම සඳහා තමයි කටයුතු කරමින් ඉන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඛනිජ තෙල් අපට බාහිරින් ආනයනය කරන්න සිදු වෙනවා. පසුගිය වසරවල දළ වශයෙන් ඩොලර් බිලියන හතරකට ආසන්න මුදලක් ඛනිජ තෙල් ආනයනය කිරීම සඳහා පමණක් අපට වැය කරන්න සිදු වුණා. එය මේ දවස්වල යම් ප්‍රමාණයකට අඩු වෙලා තිබුණත්, ලෝක වෙළෙඳ පොළේ මිල උච්චාවචනය අනුව සමහර වෙලාවට අපට මේ ඩොලර් බිලියන හතර ඉදිරියටත් දරන්න සිදු වෙනවා. ඒක අපි වාගේ ආර්ථිකයකට ඉතාම අහිතකර තත්ත්වයක්. ඒක නිසාම තමයි අපට පුනර්ජනනීය බලශක්තියට යොමු වීමට අවශ්‍ය වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ වාර්ෂිකව විදුලිබල ඉල්ලුම දළ වශයෙන් ගිගා වොට් පැය 16,000කට වඩා වැඩි වෙලා තිබෙනවා. මේ ප්‍රමාණය වාර්ෂිකව තවත් සියයට 5කින් විතර වැඩි වෙමින් තිබෙනවා. මෙන්න මේ අවශ්‍යතාවට මුහුණ දීම සඳහා තමයි ජාතික ජන බලවේගයේ බලශක්ති සැලැස්ම අපි සකස් කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම අපි ප්‍රවාහන ක්ෂේත්‍රය ගත්තොත්, බලශක්ති භාවිතය සියයට 29.3ක් විතර අවශ්‍ය වෙනවා. ඒ වාගේම ගෘහස්ථ වාණිජ ක්ෂේත්‍රය සඳහා සියයට 32.3ක් වාගේම, කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා සියයට 34.5ක් අවශ්‍ය වෙනවා. ඒ විධියට තමයි අපේ රටේ බලශක්ති භාවිතය තිබෙන්නේ. මෙන්න මේ සෑම ක්ෂේත්‍රයක් ගැනම අවධානය යොමු කරලා තමයි අපි අපේ බලශක්ති සැලැස්ම හදලා තිබෙන්නේ.

මොකද, අපට ප්‍රවාහන ක්ෂේත්‍රය අමතක කරලා කටයුතු කරන්න බැහැ. විශේෂයෙන්ම අපේ ප්‍රවාහන ක්ෂේත්‍රයට ඉන්ධන අවශ්‍ය වෙනවා. ලංකාවේ ලක්ෂ 78කට ආසන්න වාහන ප්‍රමාණයක් තිබෙනවා. ඒ කෙරෙහි අපි අවධානය යොමු කරලා විශේෂයෙන්ම දහවල් කාලයේ විද්‍යුත් ආරෝපණය කිරීම සඳහා මධ්‍යස්ථාන පිහිටුවීම අපි මේ වසරේ ආරම්භ කළා. ඒ අනුව මේ වෙනකොටත් ප්‍රධාන මධ්‍යස්ථාන 7ක් ආරම්භ කරලා තිබෙනවා. තවත් ඒ වාගේ විද්‍යුත් ආරෝපණ දිරිමත් කිරීම සඳහා 2026 වර්ෂය තුළ අපි තවත් මධ්‍යස්ථාන 3ක වැඩ අවසන් කිරීමට කටයුතු කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ වාගේම ලංකාවේ තිබෙන සෑම ඉන්ධන පිරවුම්හලකම විද්‍යුත් වාහන ආරෝපණ මධ්‍යස්ථාන ක්‍රමයෙන් ස්ථාපනය කිරීම සඳහාත් අපි සැලැස්මක් සකස් කරලා, ඒ වෙනුවෙන් කටයුතු කරමින් ඉන්නවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒත් එක්කම පසුගිය කාල සීමාව තුළ බලශක්ති ක්ෂේත්‍රය මොන විධියටද දේශපාලනීකරණය කරලා තිබුණේ කියලා විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. ඒ වාගේම, ඒ හරහා මේ බලශක්ති ක්ෂේත්‍රය තුළ මොන වාගේ උගුල් අටවා තිබුණාද කියන එකත් මේ රටේ ජනතාවට නැවත මතක් කර දෙන්න සිද්ධවෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විශේෂයෙන්ම ඔබතුමිය දන්නවා, තෙල් මිල ඡන්ද කාලවල ඡන්දය ලබා ගැනීමේ එක් උපක්‍රමයක් වුණා. ඡන්ද කාලයේ තෙල් මිල අඩු කරනවා. ඊට පස්සේ අනික් පැත්තෙන් මොකක්ද වුණේ? ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව දේශපාලනීකරණය කරලා තිබුණා. ඉතාම දක්ෂ හා කාර්යක්ෂම නිලධාරින් සිටියත්, අතිරික්ත සේවක ප්‍රමාණයක් ගෙනැල්ලා මේ ආයතන සම්පූර්ණයෙන්ම විනාශ කර තිබුණා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අනවශ්‍ය විධියේ සේවක බඳවා ගැනීම් හරහාත්, දේශපාලනීකරණය හරහාත් එම ආයතන අකාර්යක්ෂම කරලා තිබුණා. අකාර්යක්ෂම කරලා අන්තිමට මොකක්ද වුණේ?

ඛනිජතෙල් නීතිගත සංස්ථාව විශාල ණය බරක හිර වුණා. ඊට පස්සේ මොකක්ද කළේ? දැන් කිව්වා, අපි රුපියල් 50කින් තෙල් මිල අඩු කරනවා කිව්වාය කියලා. මොකක්ද කරලා තිබුණේ? ඛනිජතෙල් නීතිගත සංස්ථාව විනාශ කරලා, එතැන විශාල ණය බරක් ඇති කරලා, ඒ ණය මහා භාණ්ඩාගාරයට දීලා, ඊට පස්සේ මහා භාණ්ඩාගාරයට ගෙවන්න තෙල් මිලට රුපියල් 50ක් එකතු කළා. ඒක තමයි කළේ. එහෙම කරලා උගුලක් අටවලා, ඊටපස්සේ තෙල්වලට රුපියල් 50ක බද්දක් ගහලා, තෙල් බෙදා හරින්න විදේශීය සමාගම් ගෙන්වූවා. විදේශීය සමාගම් ගෙන්වලා තෙල් බෙදා හරින අතරතුර අපි තෙල් මිල අඩු කළොත්, අන්න ඒ අඩු කිරීමෙන් විදේශීය සමාගම්වලට පාඩු වුණා, ඒ පාඩුව පියවා ගන්න කියලා මහා භාණ්ඩාගාරයෙන් එම සමාගම්වලට ආපහු ගෙවන්න වුණා. ඒකත් මහජනතාව මත පටවන ඉතාම අදූරදර්ශී ගිවිසුම්වලට ගිහිල්ලා අපේ රටේ ජනතාව මත විශාල බරක් පටවපු ක්‍රමයක් තමයි තිබුණේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ තත්ත්වයෙන් ගලවා ගැනීම සඳහා තමයි අපි දැන් කටයුතු කරමින් ඉන්නේ.

අනෙක් පැත්තෙන් මොකක්ද කරලා තිබුණේ? විශේෂයෙන්ම සපුගස්කන්ද තෙල් පිරිපහදුව නවීකරණය කළේ නැහැ. ඒකට අවශ්‍ය ආයෝජන ගෙනාවේ නැහැ. එහි අතුරු නිෂ්පාදන සම්පූර්ණයෙන්ම කඩා වැටිලා තිබුණා. දැන් අපි මේ වසරේ සිට අලුතින් ආයෝජන කැඳවලා එම ඉන්ධන පිරිපහදුව නැවත නවීකරණය කරන්නත් කටයුතු කරමින් ඉන්නවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඒ වාගේම තවත් පැත්තකින් ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල උච්ඡාවචනයට මුහුණ දීම සඳහා අපට තෙල් ගබඩා කර ගන්න වෙනවා. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ගබඩා සංකීර්ණය පිළිබඳව දැන් මෙතැනදී කථා කළා. අපි දන්නවා, මේ

වෙනකොටත් ඒ සම්බන්ධයෙන් විදේශීය ආයතනයක් එක්ක ගිවිසුම්ගතවෙලා තිබෙනවා. නමුත්, අපට අයත් තෙල් ටැංකිවල ප්‍රතිසංස්කරණ කටයුතු අපි මේ වසරේම ආරම්භ කළා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඉදිරි වසර කිහිපය ඇතුළත අපට අයත් තෙල් ටැංකි 24ත්, ඒ වාගේම වෙනත් සමාගම්වලට අයත් තෙල් ටැංකි 61ත් ප්‍රතිසංස්කරණය කරලා අපේ රටේ තෙල් ගබඩා කරගෙන ලෝක වෙළෙඳ පොළේ මිල උච්ඡාවචනයන්ට මුහුණ දීම සඳහා කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ ගොල්ලෝ නැවත නැවතත් කියනවා, අපි රුපියල් 50කින් තෙල් මිල අඩු කරනවා කිව්වා කියලා. මෙන්න මේ වගේ උගුලක් අටවලා මේ ගොල්ලෝ හිතුවා අපි ඒ උගුලට අහුවෙයි කියලා. අපි එහෙම අහුවුණේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. 2024 සැප්තැම්බර් 21 තමයි ජනාධිපතිවරණය පැවැත්වුණේ. එතකොට මේ ගොල්ලෝ මොකක්ද කළේ? 2024 අගෝස්තු 15 වෙනකොට ලංකාවේ ඔක්ටේන් 95 පෙට්‍රල් ලීටරයක් තිබුණේ රුපියල් 379ට. ඒ වාගේම ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයක් තිබුණේ රුපියල් 344ට. මේ ගොල්ලෝ මැතිවරණය ප්‍රකාශ කළාට පස්සේ සැප්තැම්බර් මාසයේ ආපසු වෙනස් කළා. අගෝස්තු 15වැනිදා මේක වෙනස් කළා. ඊටපස්සේ මැතිවරණ කටයුතු යන අතරතුර ඡන්ද ගුණ්ඩුවක් විධියට ආපහු සැරයක් සැප්තැම්බර් මාසයේ පළවැනිදාත් -දවස් 15කින්- වෙනස් කළා. ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයක් රුපියල් 332කටත්, ඔක්ටේන් 95 පෙට්‍රල් ලීටරයක් රුපියල් 377ටත් ගෙනාවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, දැන් මිල කීයද? අඩු කරලා නැද්ද? 2024 අගෝස්තු මාසයේ 15වැනිදා වෙනකොට තිබුණු මිල එක්ක දැන් මිල දැන් කීයද? මේ නොවැම්බර් මාසය වෙනකොට ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයක් රුපියල් 294යි. අන්න අඩුවෙලා තිබෙනවා. 2024 අගෝස්තු 15වැනිදා ඉඳලා අද වෙනකොට හරියටම රුපියල් 50කින් මිල අඩුවෙලා තිබෙනවා. ඒ වාගේම ඔක්ටේන් 95 පෙට්‍රල් ලීටරයක් රුපියල් 44කින් අඩුවෙලා තිබෙනවා. අපි කියන්නේ නැහැ, ඒක ප්‍රමාණවත් කියලා. නමුත්, අපි ඉතාමත් කාර්යක්ෂම විධියට මේ ආයතන පාලනය කරලා, ලෝක වෙළඳ පොළේ මිල උච්චාවචනයන් පිළිබඳ අවධානය යොමු කරලා ජනතාවට සහන ලබා දීලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඒ වාගේම විදුලිබල ක්ෂේත්‍රයේත් ඉතාම බරපතළ උගුලක මේ රටේ ජනතාව හිර කරලා මේ ගොල්ලන් අපෙන් අහනවා, විදුලි බිල අඩු කරන්නේ නැද්ද කියලා. දිගින් දිගටම කියන්න හදනවා, අපි පුනර්ජනනීය බලශක්තිය අධෛර්යවත් කරන්න යනවා කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමිය දන්නවා විදුලිබල ක්ෂේත්‍රයේත් මේ වාගේම උගුලක අපේ රටේ ජනතාව හිර කරලා තිබුණා කියලා. මේ ගොල්ලන් මොකක්ද කළේ? මේ ගොල්ලන් දැන් නිතරම කියනවා, සූර්ය බලශක්තිය ගැන. නමුත් මේ ගොල්ලන් මොකක්ද කළේ? සූර්ය විදුලි ඒකකයක් රුපියල් 27ට, 37ට මිලදී ගන්න ගිවිසුම් ගැහුවා. ඒ ගිවිසුම් ගැහුවේ කෙටි කාලීනව නොවෙයි. අවුරුදු 20කට ගිවිසුම් ගැහුවා. වැඩි මිලට ගත්තාට පස්සේ අපි කොහොමද පාරිභෝගිකයින්ට අඩු මිලට දෙන්නේ? අපි ඒවා ඔක්කෝම සංශෝධනය කරලා, සූර්ය විදුලි ඒකකයක් රුපියල් 19ට, 20ට ගන්න පුළුවන් වන මට්ටමට අපි කටයුතු සකස් කරලා තිබෙනවා.

ඒ වාගේම අපි කිව්වා, මේ වසර තුළ සූර්ය බලශක්තියෙන් මෙගාවොට් 2,000ක ධාරිතාවක් දක්වා යනවා කියලා. මේ වසර තුළම ඒ මෙගාවොට් 2,000 සම්පූර්ණ කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අපි මේ වසර තුළදී ප්‍රධාන ධාරාවට සූර්ය බලශක්තියෙන් විතරක් මෙගාවොට් 700කට ආසන්න ප්‍රමාණයක් අලුතින් එකතු කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා විධියට අය වැය කථාවේදී කිව්වා, ඉතාමත් අධික මිල ගණන්වලට විදුලිය මිලදී ගැනීමට එකඟතාව පළ කරලා තිබුණා කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
මම ඉක්මනින් අවසන් කරනවා.

අපි පසුගිය වසරක කාලය තුළ මෙගාවොට් 150කට ආසන්න සුළං විදුලිබල ව්‍යාපෘති කැඳවාගෙන ආවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අර ඩොලර් ශත 8.26ට තිබ්බ එක, ඩොලර් ශත 3.96ට, 3.77ට, 4.65 වශයෙන්, ආසන්න වශයෙන් සියයට 50කට වඩා අඩු ප්‍රමාණයකින් අපි ඒවා ගෙන එන්න කටයුතු කර තිබෙනවා. අපි ජනතාවට මෙන්න මේ සහන, විශේෂයෙන් අපි සුළං විදුලි බලාගාර හරහාත්, සූර්ය විදුලි බලාගාර හරහාත් විදුලියෙන් ඉතුරු කරන මුදල් ජනතාව වෙත ඉතාමත් කෙටි කාලයකින් ලබා දෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ වාගේම අපි ඉන්ධන ක්ෂේත්‍රයේ ඇති කරන පරිවර්තන හරහා ලැබෙන වාසියත් ජනතාවට ලබා දෙමින් ඉන්නවා. ඒ සඳහා තමයි බලශක්ති අමාත්‍යාංශය කටයුතු කරන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ලබා දුන් කාලය පිළිබඳව බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.01]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද දවසේ විවාදයට ගන්නේ බලශක්ති අමාත්‍යාංශය ගැන. අද උදේ බලශක්ති ඇමතිතුමා, ටයි කෝට් ඇඳගෙන අපේ විපක්ෂ නායකතුමාට අත දිගු කරලා ප්‍රකාශ කළා, ඊනියා හොරුන් වෙනුවෙන් කඩේ යනවා කියලා. මම එතුමාට මතක් කරලා දෙන්න ඕනෑ, එතුමා පිළිබඳව හොඳ චරිත සහතිකයක් දෙන්න බැහැ කියන කාරණය. එන්පීපී ආණ්ඩුව මුලින්ම කැත කළේ එතුමා. එන්පීපී එක බලයට එන්න කලින් කිව්වා, චෝදනා තිබෙන, හොරු වෙච්ච, හොරකම් කරපු, වංචා කරපු කිසි කෙනෙකුට තනතුරු දෙන්නේ නැහැයි කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමාව අපහසුතාවට පත් කරන්න නොවෙයි මෙහෙම කියන්නේ. ඔබතුමා පිරිසිදුයි කියන කාරණය කියන්න කොතෙක් උත්සාහ දැරුවත්, ඔබ පොහොර සංස්ථාවෙන් interdict වෙච්ච නිලධාරියෙක්.

ඔබතුමා එළියට දැම්මේ ඇයිද කියන කාරණය මම නැවත නැවත මතු කරලා දෙන්න යන්නේ නැහැ. මේ NPP ආණ්ඩුව කිලිටි කරපු, මේ NPP ආණ්ඩුව වංචනිකයන්ට, දූෂිතයන්ට තනතුරු දෙන්නේ නැහැ කියලා කියද්දීත් තනතුරු ලබා ගන්න කටයුතු කරපු ඇමතිවරයෙක්, ඔබතුමා. ඒකටත් හේතු ඇති.

ගරු සුජීව සේනසිංහ හිටපු ඇමතිතුමනි, මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා මුලින්ම සිද්ධ වෙච්ච හොරකම, වංචාව, දූෂණය මොකක්ද? සුළං බලාගාර ගනුදෙනුව. ඒකට ටෙන්ඩර් කැඳෙව්වා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ටෙන්ඩර් කැඳවන කොට ඒකේ මූලික කොන්දේසියක් වුණු රක්ෂණය - bond එක - ඉදිරිපත් නොකර ඒ ටෙන්ඩර් එක අවලංගු කරපු ඒ සමාගමටම නැවත එය ලබා දෙන්න ඔබතුමාත්, ඔබතුමාගේ ජනාධිපතිත්, කැබිනට්

[ගරු චමින්ද විජේසිරි මහතා]

මණ්ඩලයත් අනුමත කිරීම කළා, ඇමතිතුමනි. එදා ඔබතුමාගේ ජනාධිපතිවරයා විපක්ෂයේ සිටියදී, ඒ අවලංගු වෙච්ච, cancel කරපු, tender procedure එකෙන් බැහැරව වෙච්ච සියලු ගනුදෙනු සහ ඒ කර්මාන්ත පිළිබඳව ඇඟිලි දිගු කරලා කථා කළා. එදා රාජපක්ෂලාගේ කළු සල්ලි සුදු කරනවා කියපු, රනිල් වික්‍රමසිංහලාගේ කළු සල්ලි සුදු කරනවා කියපු ඒ ආයතනයේ ඒ පුද්ගලයාටම ඒක ලබා දීම තමයි ඔබගේ ආණ්ඩුව කරපු ප්‍රධානම මූල්‍ය ගනුදෙනුව, වංචාව සහ අයථා වැඩ පිළිවෙළ. ඒක අද සමාජය දන්නවා; ඔබතුමන්ලාට ඡන්දය දුන් උගතුන්, වියතුන්, බුද්ධිමතුන් දන්නවා. ඒක නොදන්නා කාරණයක් නොවෙයි. ඔබතුමාත්, ඔබතුමාගේ ජනාධිපතිතුමාත් සාධාරණද කියලා අපි අහනවා. ආණ්ඩු මාරු වෙනකොට, ආණ්ඩු පෙරළෙන කොට, අත යට ගනුදෙනු සිදු වුණේ කොහොමද, මුදල් ගියේ කොතැනටද, ඒවා කළේ කොහොමද, සම්බන්ධ වුණේ කවුද, ඇමතිට කොච්චර ගියාද, අරයාට කොච්චර ගියාද කියලා එළි වෙනවා. ඒවා එළි වෙන කොට ඔබතුමන්ලාට දුවන්න පාර මදි වෙයි, ගරු ඇමතිතුමනි. එම නිසා උඩ බලාගෙන කෙළ ගහන්න එපා. කෙළ වදින්නේ තමන්ගේ මුහුණටමයි. ඔබතුමාට ඔබතුමාගේ දේශපාලනික වැඩ පිළිවෙළ නිවැරැදිව ගෙන යන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න. ඇමතිතුමනි, ඔබතුමා දක්ෂයෙක් නම් ඔබතුමාට තිබුණා, මේ අය වැයෙන් මේ ආණ්ඩුව ගොඩ දාන්න. ගරු සුජීව සේනසිංහ හිටපු ඇමතිතුමනි, ලාභ ලබා තිබෙනවා කියලා මෙතුමන්ලා කියනවා. ඒ ලාභයේ වාසිය ගෙනෙන්න ඕනෑ රටේ අහිංසක, අසරණ පාරිභෝගික ජනතාව වෙතයි, ඡන්ද දායකයා වෙතයි.

මට කලින් කථා කරපු ඇමතිතුමා හොඳ කථාවක් කිව්වා. ඡන්දෙ කාලේ ඡන්දය ගන්න බොරු කියනවා කිව්වා. හරි නේ, ජනාධිපතිතුමා බොරුවක් කිව්වා නේ. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා බොරු කියලා ඡන්දය ගත්තා, ජනතාව රැවැට්ටුවා, විදුලි පාරිභෝගිකයින් හැමෝම රැවැට්ටුවා. විදුලි බිල අඩු කරනවා, අඩු කරන්න පුළුවන්, මෙහි හොරකම නවත්වනවා, වංචාව නවත්වනවා, දූෂණය නවත්වනවා කියලා, ගණන් හදලා පාරිභෝගිකයින්ට, කර්මාන්තශාලාවලට විදුලි බිල අඩු වෙන්නේ මෙහෙමයි කියලා ඡන්දය ගත්තා කියා තමන්ගේ ආණ්ඩුවේ ඉන්න ඇමතිතුමෙක්ම දැන් කියලා වාඩි වුණා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
කියපු බොරු ගණන් කළා නම්, ඉලක්කම් මදි වෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඔව්, ඉලක්කම් මදි වෙනවා. ඇට නැති දිවට තමන් කියපු කාරණා මොනවාද කියලා අද අමතකයි. ඒක නේ නලින්ද ජයතිස්ස මහත්මයා උදේ ඇවිල්ලා පත්තරේ විස්තරේ කියවන්නේ. ගරු මන්ත්‍රීතුමනි, එතුමා පත්තරේ විස්තරේ කියවනවා. මම ඇත්තටම එතුමාට ගරු කරනවා. නමුත්, එතුමන්ලාගේ වැරැදි ටික, එතුමන්ලා කියන බොරු ටික, එතුමන්ලා කරපු තක්කඩිකම් ටික මාධ්‍යයේ සටහන් වෙලා තිබෙනවා. එතකොට මාධ්‍ය ආයතන ඒවා පෙන්වනවා; වැරැදුණාම ඒක නිවැරැදි කරනවා. ඒක තමයි මාධ්‍යකරණයේදී ඔවුන්ට තිබෙන අයිතිය. හැබැයි, ඒක දන්නවා ජනමාධ්‍ය ඇමතිවරයා. ජේවීපී එකේ අනුර කුමාර දිසානායක මහත්මයා කියපු ඒ සියලු දේවල් එදා "පත්තරේ විස්තරේ" ඉදිරිපත් කරමින් කට උල් කරලා මේ සමාජයට, රටට කියලා එතුමන්ලාට ඡන්දය අරන් දෙනකොට වමුදිත හොඳයි. එහෙම කරන කොට "දෙරණ" නාළිකාවේ චතුර අල්විස් හොඳයි. නමුත්, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ අය ඒ අයගේ සදාචාරය, ශීලාචාරකම අනුව මාධ්‍ය හසුරුවන වැඩ පිළිවෙළ නිසා තම ආණ්ඩුවට රිදෙන කොට, ආණ්ඩුවේ වැරැදි පෙන්වා දෙන කොට, ජනමාධ්‍ය හරහා බොරු කියලා බලය හදා ගත්තු මේ උදවිය අද ජනමාධ්‍යයට ඇඟිල්ල දිගු කරලා, ජනමාධ්‍යය වැරැදියි, මෙහෙම කරන්න එපා කියලා කියන්න හදනවා. අපි ඒ ගැන කනගාටු වෙනවා. තමුන්නාන්සේලාගේ වැරැදි හදා ගන්න.

ගරු ඇමතිතුමනි, මා කියාගෙන ආවේ මේකයි. අද මේ රටේ තිබෙන දැවෙන ප්‍රශ්නය තමයි ආර්ථික අර්බුදය. ඒ ප්‍රශ්නය විසඳිලා නැහැ, ගමේ, රටේ, නගරයේ. ඒක බලුත් විට විකුණන පුංචි පුද්ගලයාගේ ඉඳලා රාජ්‍ය සේවකයාගේ වැටුප දක්වා අද විහිදිලායි තිබෙන්නේ. ඔබතුමන්ලා විදුලි බිල අඩු කළා නම්, ඉන්ධන මිල අඩු කළා නම් ඊට සාපේක්ෂව සියලු භාණ්ඩවල, අත්‍යවශ්‍ය සේවාවල මිල අඩු වෙනවා. ඒක තමයි ආර්ථික න්‍යාය. එතකොට වැටුප වැඩි කරන්න කියලා කෑ ගහන්න ඕනෑ වෙන්නේ නැහැ. ඔබතුමන්ලා එදා කියපු විධියට විදුලි බිල අඩු කළාම දෛනික ජීවිතයේ ජනතාවට ගන්න තිබෙන ඒ සියලු අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවාවල මිල පහළ යනවා; කර්මාන්තවල නිෂ්පාදන පිරිවැය අඩු වෙනවා. ගරු ඇමතිතුමනි, ඒකයි මම කිව්වේ මේ අය වැය හරහා ඔබතුමාට ලොකු දායකත්වයක් දරන්න තිබුණා කියලා. ජනාධිපතිතුමා කියපු ඒ බොරු ටික බොරු නොවෙයි කියලා ඔප්පු කරන්න හැකියාව තිබිච්ච ඇමතිවරයා මුදල් ඇමති නොවෙයි, ඔබතුමායි. ඒක එතුමා කරන්නේත් නැහැ. ඔබතුමා එය නොකරද්දී පාරිභෝගිකයාටත් නැතුව, ඡන්දදායකයාටත් නැතුව වාසිය කොහේටද ගලාගෙන යන්නේ? ගලාගෙන යන්නේ වෙන කොහේටවත් නොවෙයි- *[බාධා කිරීමක්]* ඒක නරියාට කුකුළු කොටුව භාර දුන්නා වාගේ තමයි.

ගරු බලශක්ති ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, සූර්ය විදුලිබලය හා සම්බන්ධ බැටරි ටෙන්ඩර් එකක් කැඳෙව්වා කියලා. ලංසු එකසිය ගණනක් ඒකට අදාළව ලැබුණා ලු. ඒක හොඳයි. හැබැයි ඔය කියන ලංසු එකසිය ගණන අතරට ලාංකික ආයෝජකයෙකුට, ලාංකික ව්‍යාපාරිකයකුට ලංසු ඉදිරිපත් කරන්න, එතැනට යන්න බැරි වෙන විධියට තමුන්නාන්සේලා වැට අහුරලා ඉවරයි. මොකක්ද සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා කරලා තිබෙන්නේ? දැන් මේ බැටරි ගනුදෙනුව යන්නේ කොහේටද? චීනයට. ඔබතුමන්ලා ඒකට අදාළව දමනවා කොන්දේසියක්. Tender Evaluation Committee එකෙන් පිරිවිතර සකස් කරද්දී මූලික සුදුසුකමක් හැටියට දමනවා, මෙවැනි බැටරි ව්‍යාපෘති ජාත්‍යන්තරව, රටවල් දෙකක සිදු කරලා තිබෙන්න ඕනෑ කියලා. ඒ සුදුසුකම තිබෙන කවුද ඉන්නේ අපේ රටේ? ගරු ඇමතිතුමනි, අපේ රටේ එහෙම කවුද ඉන්නේ කියලා ඔබතුමා නැඟිටලා කියන්න? ඇයි ඔබතුමන්ලා ඒ කොන්දේසිය දැම්මේ? ඔබතුමන්ලා තෝරාගත්තු, ඔබතුමාත් එක්ක ප්‍රධාන පෙළේ hotelsවල වාඩි වෙලා කථා කරන චීන අයෝජකයෙකුට ඒක දෙන්නයි එහෙම කළේ. නම් පිටින් අපි ඔප්පු කරලා පෙන්වන්නම්, ඔබතුමන්ලා ඒක දෙන්නේ කාටද කියලා.

ඇයි ඒ කොන්දේසිය දැම්මේ? මේ රටේ සිටින ආයෝජකයෙකුට, මෙවැනි ව්‍යාපෘති කරන හොඳ කණ්ඩායමකට ඒක දෙන්න පුළුවන් නේ. ඒ කොන්දේසිය දැමීම තුළම -එතැනම- වංචාවක් සිදු කරලා තිබෙනවා. ඒ තමයි, මේ ව්‍යාපෘතිය ලංකාවට නොව, චීනයට දෙන්න පුළුවන් වැඩ පිළිවෙළ සකස් කිරීම. අද ඔබතුමාත් චීන භාෂාව දන්නවා ඇති. ඇයි, වැඩි හරියක් චීන්නු තමයි ඉන්නේ විදුලිබල අමාත්‍යාංශයේ. ගරු සුජීව සේනසිංහ

මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ගිහිල්ලා බලන්න. ඉහළ ඉන්නේත් චීන්නු, පහළ ඉන්නේත් චීන්නු. මම දන්නේ නැහැ, චීන භාෂාව. දන්නවා නම් මම මේ ගැන අහනවා. මම දන්නේ නැහැ චීන භාෂාව. නැත්නම් මම චීන භාෂාවෙන්ම මේ ගැන අහනවා. මේවා ඔබතුමන්ලාට කැප දේවල් නොවෙයි; අකැප දේවල්. එවැනි දේවල් කරන නිසා තමයි අද භාණ්ඩ මිල අඩු වෙලා නැත්තේ, ජනතාවට පීඩනය එල්ල වෙලා තිබෙන්නේ. එදා ආණ්ඩු කළා වාගේ ඔබත් ඩීලුත් දමනවා; කොමිසුත් ගන්නවා. ඔබතුමන්ලා ඔබතුමන්ලාගේ පටි තද කරගෙනයි තිබෙන්නේ. රටේ ජනතාව ඒක දන්නවා. ජනතාව ඒක දන්නා බව දැනෙන කොට, ඒක මාධ්‍යයේ දමන කොට; ඒක පත්තරයේ දමන කොට, ඒක පත්තර විස්තර ඉදිරිපත් කරද්දී කියන කොට මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරලා ජනමාධ්‍ය බය කරන්න බැහැ, මහත්තයෝ. එදා ඒවා කරපු උදවියට යන්න වුණේ පිටිපස්ස දොරෙන්. ඒවා හොඳට මතක තියාගන්න. එවැනි අය ත්‍රිකුණාමලයේ ගිහිල්ලා හැංගිච්ච දේශපාලන ඉතිහාසයක් තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා ඒවා කරන්න යන්න එපා. මොකද, ඔබතුමන්ලාට ඒවා සුදුසු නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ වාගේම මම තවත් කාරණයක් මතක් කරන්න ඕනෑ. මම මෙය වරප්‍රසාද කාරණයක් විධියටයි ගෙනෙන්න හිටියේ. මම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ - COPE එකේ - සාමාජිකයෙකු විධියට ඉන්නවා. මම අන්තිමට COPE එකට ගිය වෙලාවේ වෙච්ච දෙයක්, මේක. විගණකාධිපතිවරයා විගණනය කළ යුතු, ඒ විගණනයට සම්බන්ධ වෙච්ච කාරණා සම්බන්ධයෙන් තමයි COPE එකේ කටයුතු කරන්නේ. අපි එම කාරක සභා රැස්වීමට ගියාම සිදු වන සාමාන්‍ය සම්ප්‍රදාය තමයි, නිලධාරින් ඇවිල්ලා එදා දවසේ විමර්ශනය කරන කාරණය පිළිබඳ ෆයිල් එක දෙන එක. ඒ ෆයිල් එක ඇරලා බලන කොට, එහි විගණකාධිපතිවරයාගේ වාර්තාව තිබුණේ නැහැ. ඒ හේතුවෙන් මට ලොකු අසාධාරණයක් වුණා, මාධ්‍යයෙන්- *[බාධා කිරීමක්]* ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමාත් එදා එතැන සිටියා. මේ පාර්ලිමේන්තුවේ හැම දාම අණ පනත් ආදිය පරිශීලනය කරන, COPE එක නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට මම එදා දවසේ ඇහුවා, "විගණන වාර්තාවක් නැහැ, මොකක්ද මේකට හේතුව?" කියලා. ඒක පෞද්ගලික ආයතනයක්. එය LTL කියන ආයතනයයි. ඒ ආයතනයේ හොරකම, වංචාව, දූෂණය පිළිබඳව මට අදාළ නැහැ. හැබැයි මොකක්ද ඒ කරපු තක්කඩි වැඩේ? අපේ COPE එකේ සභාපතිතුමා ඉතාම වැදගත්, උගත් මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම, එතුමා හොරකම, වංචාව පිළිබඳව විවේචනය කරන කෙනෙක්. COPE එක කරන්නේ මාධ්‍ය සන්දර්ශනයක් නොවෙයි කියන තැනට ගෙනෙන්න පුළුවන් වැඩ පිළිවෙළ එතුමා හදයි කියන විශ්වාසයත් තිබෙනවා. එතුමා ස්ථාවර නියෝග වෙනස් කරලා COPE එකට එන කාරණාවලට අදාළ හැම ගනුදෙනුවක් ගැනම හොයලා, එහිදී අප සොයා ගන්නා හැම දේම සම්බන්ධයෙන් පියවර ගන්න අපට බැරි නම් ඒවා හොරකම, වංචාව, දූෂණය පිළිබඳ හොයන වගකිව යුතු ආයතන වෙත ගෙන යන්න ඕනෑ කියලා අලුත් සංශෝධනයක් ද ගෙන ආවා. හැබැයි එහෙම කරපු සභාපතිතුමා මේ පාර්ලිමේන්තු බලය තනියම අරගෙන, මේ පාර්ලිමේන්තුවේ කථානායක බලය තනියම අරගෙන කටයුතු කර තිබෙනවා. මම මේ ලේකම් මණ්ඩලයෙන් අහනවා, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අත්හිටුවන්න බලය තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවට නොවෙයිද කියලා. ඒකට අනුමැතිය දෙන්නේ කථානායකවරයායි. ස්ථාවර නියෝග 120 (2) හි කාරණය පැහැදිලිව සඳහන් කර තිබෙනවා. විගණනයට භාජන වෙච්ච කාරණා තමයි එහිදී සාකච්ඡා කරන්න ඕනෑ. එහි පෞද්ගලික ආයතන ගැන සාකච්ඡා කරන්න බැහැ. මම අහුවාම කිව්වා, "නැහැ, ඒක අපි අත්හිටුවනවා" කියලා. ඒක කමිටුවට අත්හිටුවන්න බැහැ. ඒක සම්පූර්ණයෙන් වැරැදියි. ඒ ආයතනය ගිහිල්ලා නඩු දැම්මොත් ඒ නඩුවේ සාක්ෂිකාරයන් හැටියට අපට යන්න වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ මොකද කරන්නේ? සභාපතිතුමාව පාවිච්චි කරලා, පෞද්ගලික ආයතනවල නිලධාරින් ගෙනැල්ලා, ඒ පෞද්ගලික ආයතනවල නිලධාරින් බය කරලා, ඒ අයගේ අත යට ගනුදෙනු හදා ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදන එක වහාම නවත්වන්න අවශ්‍ය කටයුතු කථානායකතුමා ලවා ක්‍රියාත්මක කරවන්න. මේ සම්බන්ධයෙන් minutes ඇති. මම එදා විරුද්ධ වුණේ වෙන මොකකටවත් නොවෙයි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග උල්ලංඝනය කරලා, ඒ කමිටුව අත්හිටුවපු එකට. ඒක මේ පාර්ලිමේන්තුව කරන්න ඕනෑ කාරණයක්; පාර්ලිමේන්තුවේ අනුමැතිය ගන්න ඕනෑ කාරණයක්. ඒක කාරක සභාවකට අත්හිටුවන්න බැහැ. එහෙම කරලා මොකක්ද කරන්න හදන්නේ? ඒ ආයතනය විගණනයට ලක් කරලා, ඒ ආයතනයේ තිබෙන කාර්යභාරය සියල්ල යටපත් කරනවා. සභාපතිතුමා කරපු තව වැරැද්දක් තිබෙනවා. අපි ඇහුවාම කියනවා, "නැහැ, ඒක විදුලිබල මණ්ඩලයේ තිබිච්ච ප්‍රශ්නයක්, ඒක හොයා බලන්න මේ ආයතනය ගෙනාවා" කියලා. මේක පූර්වාදර්ශයක් වුණොත් මොකද වෙන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි? විදුලිබල මණ්ඩලය විසින් ඕනෑම පෞද්ගලික ආයතනයක් එක්ක බැඳිච්ච යම් කාරණයක් කළාම ඒ සම්බන්ධව ප්‍රශ්න කරන්න ඒ ආයතනයේ නිලධාරින් COPE එකට කැඳවලා ඔවුන්ව හිර කරනවා. ඔවුන්ගේ අභ්‍යන්තර ගනුදෙනු ගැන අහනවා; කොහොමද මේක පත් කර ගත්තේ කියලා අහනවා. ඒවාට වෙනම ආයතන තිබෙනවා. කවුරු හරි හොරකමක්, වංචාවක් සිද්ධ කර තිබෙනවා නම්, එහෙම හොරකමක් කර තිබෙන බව තේරෙනවා නම්, කවුරු හරි පුද්ගලයෙක් ගිහිල්ලා පොලීසියේ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ පැමිණිලි කරන්න ඕනෑ. ඉතිහාසයේ නොවුණු විධියට මේ ආණ්ඩුවේ බලය පාවිච්චි කරලා, කාරක සභාවේ බලය පාවිච්චි කරලා මේ තක්කඩි වැඩ කිරීම පිළිබඳව අපි විරුද්ධ වෙනවා.

ගරු ඇමතිතුමනි, මේ අමාත්‍යාංශය යටතේ තමුන්නාන්සේලා අද ගෙනියන මේ වැඩ පිළිවෙළ රටේ ජනතාවට දැනෙන්න අවශ්‍ය විධියට කඩිනම්ව හදන්න. ඔබට තිබෙන චෝදනාවලින් මිදෙන්න. ඔබ පිරිසිදු නම්, ඔබ දක්ෂයි නම්, ඔබ කියපු දේවල් මේ රටේ ජනතාවට ලැබෙන්න නම්, ඔබට මීට වඩා වැඩකටයුතු ගණනාවක් කරන්න සිද්ධ වෙනවා. අද රටේ බහුතර පිරිසක් තමන්ගේ ගෙදර තිබෙන හැම විදුලි බල්බයක්ම දල්වන්නේ නැහැ. ඔවුන් එක විදුලි බල්බයක් දල්වා ගෙන ඉන්නවා. ඔබතුමන්ලා ඒ ගැන හොයා බලන්න. ඇයි, ඒ? ඔවුන්ට ලැබෙන ආදායම, පිරිවැය එක්ක ගළපා ගන්න, තමන්ට ලැබෙන ආදායමෙන් ජීවත් වෙන්න. ඔවුන් බොහෝ අවශ්‍යතාවලින් විතැන් වෙලා ඉන්නේ. ඔවුන් කන බොන එක අඩු වෙලා තිබෙනවා. ගෙදර විදුලි බල්බ දමන්නේ නැහැ. ගමන් බිමන් යන්නේ නැහැ. ඒ, ආර්ථික අර්බුදයේ තිබිච්ච පීඩනය නිසායි. හැබැයි, තමුන්නාන්සේලා ඇවිල්ලා අටු කොටු පුරවලා, අපි මේක දැන් හදලා තිබෙනවාය කිව්වාට, ඒක ගමේ ජනතාවට දැනිලා නැහැ; ඒක රටේ ජනතාවට දැනිලා නැහැ; ඒක පාරිභෝගිකයාට දැනිලා නැහැ. එතැනට ගෙනියන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ඔබතුමන්ලා හදන්න දන්නේ නැහැ. ඇයි, ඒ? ඔබත් පසුගිය කාලයේ හොරකම් ටික පෙන්වමින්, ඒ ෆයිල් ටික පෙන්වමින් අරක කළා, මේක කළා කියලා අපට චෝදනා කළා. ළිඳ ළඟ සංගමය වාගේ චිත්ත අඳින්නේ නැතුව, චෝදනා නොකර මේ කටයුතු කරන්න. බලය ඔබතුමන්ලාගේ; පාර්ලිමේන්තුව ඔබතුමන්ලාගේ; ජනාධිපතිතුමා ඔබතුමන්ලාගේ; අගමැති ඔබතුමන්ලාගේ. ඒ නිසා චෝදනා කරමින් ඉන්නේ නැතුව ඒ චෝදනා ඔප්පු කරලා අවශ්‍ය වැඩ පිළිවෙළ කරන්න කියලා මම යෝජනා කරනවා.

[ගරු චමින්ද විජේසිරි මහතා]

ගරු ඇමතිතුමනි, බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්මත වෙනකොට විදුලි බිල අඩු කරන්නේ කවදාද, කොච්චර ගණනකින්ද අඩු කරන්නේ, ඉන්ධන මිල කොච්චර ප්‍රමාණයකින්ද අඩු කරන්නේ කියන කාරණා ටික ගැනත් කියන්න පුළුවන් කශේරුකාව ඔබට තිබේවි කියලා විශ්වාසය තබමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[2.15 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Hon. Deputy Chairperson, before I start speaking on the Votes of the Ministry of Energy, I wish to say a word about yesterday's meeting between President Anura Kumara Dissanayake and the Members of the Ilankai Tamil Arasu Kachchi. Most of those who went to meet the President are here today. There is a feeling among those Tamil Members of Parliament that there has been some positive signs from President Anura Kumara Dissanayake. We are also happy about that, though we had a lot of misunderstandings within Parliament and were very angry about throwing away the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam's Private Members' Bill on the Provincial Councils Elections.

But, today, what happened? Today, President's Media Division has issued a statement - the Hon. Member (Dr.) Sathiyalingam is here - and do you know what they have, interestingly, said? The statement states, I quote:

> "Discussions focused on the Provincial Council Elections and the need for a new Constitution. President Dissanayake stated that the Government believes long-standing issues faced by the people of the Northern and Eastern Provinces...."

That is about our ethnic issue.

> "...can no longer be addressed through outdated political solutions."

So, suddenly after one year, the President has now declared that devolution is an outdated political solution. Having said that, it goes on to state, I quote:

> ".....it is necessary to move towards a new political framework and the support of everyone is essential ........"

So, what is this new framework? Is it something that would give Thirteen plus, something that would give Thirteen minus or something that would go for the absolute abolition of the Thirteenth Amendment and bring in something new? This is a very serious situation. I am bit perturbed and I did, in fact, put a tweet on that matter. So, Hon. (Dr.) Sathiyalingam - I know you are due to speak after me - I want you to say whether the President, when he had the discussion, told you all that the solution that has been spoken about so far in this country is outdated and that there is a new framework they are looking at.

Having said that, Madam, I will now move onto the Votes of the Ministry of Energy. ගරු ඇමතිතුමනි, දැන් දිගින් දිගටම පුනර්ජනනීය බලශක්තිය පිළිබඳව තමයි කථා වෙන්නේ. මට පෙර කථා කළ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, හැම පිරවුම්හලකටම electric vehicle - EV - chargers දමනවා කියලා. මට පොඩ්ඩක් මේ ගැන කියන්න. ඔබතුමන්ලා දන්නවාද දන්නේ නැහැ, ඔය chargersවල තල තුනක් තිබෙනවා කියලා. එකක් තමයි mobile chargers. ඒක ගෙදර තිබෙන ordinary plug එකට ගහලා charge කරගන්න පුළුවන් charging system එකක්. ඒක හැම වාහනයකටම හදිසියකදී charge කරගන්න දෙන වයර් එකක්. ඒකෙන් කිලෝවොට් පැය 75ක් තිබෙන සාමාන්‍ය විද්‍යුත් වාහනයක් සම්පූර්ණයෙන් charge කරගන්න පැය 20ක් ගත වෙනවා. ඒක කරන්න බැහැ, පාරේ එහෙම නැත්නම් commercialize කරපු chargersවලට. ඊට පසුව තිබෙනවා, Level 2 AC chargers. ඒවාට කියන්නේ overnight chargers. ඒවා භාවිතයෙන් සාමාන්‍යයෙන් කිලෝවොට් පැය 75ක් තිබෙන, කිලෝමීටර 400ක්, 500ක් දුවන්න පුළුවන් වාහනයක් charge කරගන්න පැය 8-10 අතර කාලයක් ගත වෙනවා. That is what is known as an overnight charger. තමන්ගේ නිවසේ, එහෙම නැත්නම් තමන්ගේ යම් කිසි ස්ථානයක ඒක දමාගන්න පුළුවන්.

ඊට පසුව තිබෙනවා, DC fast chargers. අද විවාදය අවසන් කරන්න ඉස්සෙල්ලා කාට හරි මට කියන්න පුළුවන්ද, how many functional DC fast chargers are there in Sri Lanka? අද ශ්‍රී ලංකාවේ Direct Current fast charging slots කීයක් තිබෙනවාද? ඒ සම්බන්ධයෙන් නියාමනය වන රෙගුලාසි හදලා ඉවරද? Expressway එකේ කොපමණ Direct Current fast chargers තිබෙනවාද? අලුතින් expressway එකේ හදන්න බලාපොරොත්තු වෙන සේවා ස්ථානයේ එහෙම එකක් දමන්න බලපොරොත්තු වෙනවාද? මේක හරි වැදගත්. අර chargeNet App එක පාවිච්චි කරලා බැලුවාම, මා යන වාහනයට පෙන්වන්න ඕනෑ Direct Current fast chargers ළඟම තිබෙන්නේ කොහේද කියලා. ඒකෙන් free ඒවා කොළ පාටට පෙන්වන්න ඕනෑ. එතකොට මට එතැනට ගිහින් charge කරගන්න පුළුවන්. ඒක occupied නම්, මට ඊළඟ charger එකට යන්න වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවාද, අද ලංකාවේ ඉලෙක්ට්‍රික් වාහන ලියාපදිංචි කිරීම සියයට 15කින් වැඩි වෙලා තිබෙනවා කියලා? මෙතෙක් තිබුණේ 5,000කට අඩු ප්‍රමාණයක්. වැඩියෙන්ම තිබුණේ Nissan LEAF. දැන් BYD සහ අනෙකුත් Chinese electric vehicles සෑහෙන්න ඇවිත් තිබෙනවා. දැන් 10,000කට කිට්ටු වෙන්න තිබෙනවා. එය ලංකාවට විශාල ප්‍රමාණයක්. ඒ කියන්නේ, functioning vehicles අතර, ලක්ෂ 150ක් වාගේ මුදලක් ආයෝජනය කරලා පාරිභෝගිකයන් මේ විද්‍යුත් වාහන ගෙන තිබෙනවා. ඒක ලොකු මුදලක්. මේවා වෙන රටවල නම් ලක්ෂ 70කට යන්නෙත් නැහැ. ලක්ෂ 60ක්වත් යන්නේ නැහැ. අපේ බදු එක්ක - සියයට 250ක් වාගේ බද්දක් වැටෙනවා - රුපියල් ලක්ෂ 150යි, 170යි, 200ක් වාගේ ප්‍රමාණයකට තමයි මේගොල්ලන් මේ වාහන මිලදී ගෙන තිබෙන්නේ. මම ඊයේ පෙරේදා ගමට ගියා. අපි ඔලුවිල් Green Villa කියන ස්ථානයේ ඉන්නකොට එතැනට ATTO 3 එකක ආචාර්යවරයෙක් ආවා. එතුමා අග්නිදිග විශ්වවිද්‍යාලයේ උගන්වන මහත්මයෙක්. එතුමාගෙන් මම ඇහුවා, කොහොමද මේ වාහනයේ

charging කළමනාකරණය කර ගත්තේ කියලා. එතුමා හිනාවෙලා කිව්වා, "හබරණ පැත්තේ එකක් තිබුණා. යන්තම් charge කරගෙන ආවා. නැගෙනහිර පළාතේ එකක්වත් නැහැ" කියලා. ඊට පස්සේ overnight chargers දමාගන්න ඕනෑ. Direct Current fast charge කරගන්න නම් ඒ සඳහා අවම වශයෙන් amperes විශාල ගණනක dedicated lines තියාගන්න ඕනෑ. Direct Current fast charging සඳහා dedicated grid එකක් හදන්න මේ රජයට ක්‍රමවේදයක් තිබෙනවාද?

අනෙක් කාරණය මේකයි. Sri Lanka Sustainable Energy Authority එකෙන් මේවා නියාමනය කිරීම සඳහා වූ රෙගුලාසි හදනවාද? ඊළඟ අවුරුද්දේ ඔබතුමන්ලාට ජනතාවට භය නැතුව කියන්න පුළුවන්ද, "විද්‍යුත් වාහන ගන්න භය වෙන්න එපා, අපි හැම තැනකම මිනිත්තු 20ක වාගේ කාලයක් තුළ සම්පූර්ණයෙන්ම charge කර ගන්න පුළුවන් Direct Current fast charging slots දමනවා" කියලා? මොකද, මිනිස්සුන්ට ඒක ලොකු ප්‍රශ්නයක්. අපෙන් අහනවා, "සර්, ඔබතුමන්ලා පාර්ලිමේන්තුවේ නේ ඉන්නේ. Could you please find that out? අපිට මේක ලාභයි. කිලෝමීටරයකට රුපියල් 7ක වාගේ ප්‍රමාණයක් මේකට වියදම් යන්නේ. නැත්නම් රුපියල් 25ක්, 30ක් විතර යනවා" කියලා. මේ electric vehicles ගන්න අපේ යාළුවෝ අහනවා, middle-class familiesවල අය අහනවා, "We are going to spend at least Rs. 17 million to Rs. 20 million on these. අපිට භය නැතුව මේවා ගන්න පුළුවන්ද?" කියලා. අපිට ඔය ප්‍රශ්නවලට උත්තර දෙන්න බැහැ.

ගරු ඇමතිතුමනි, ඊළඟට තුන්වැනි කාරණය තමයි Inginiyagala Hydropower Station එක. ඒ ගැන මට යමක් කියන්න ඕනෑ. Inginiyagala Hydropower Station එක හදනකොට ඒකේ ගිගාවොට් පැය 28ක ධාරිතාවක් තිබුණා. ඒකෙන් 2021-2022 කාලසීමාවේ ගිගාවොට් පැය 20ක විතර ප්‍රමාණයක්, එහෙම නැත්නම් ගිගාවොට් පැය 17ක විදුලිය ජනනය කරනු ලැබුවා. හැබැයි, දැනට තිබෙන දත්ත අනුව ගිගාවොට් පැය 10කට අඩු ප්‍රමාණයක් තමයි එතැන ජනනය වෙන්නේ. මම වැරැදි නම් නිවැරැදි කරන්න. එතකොට මොකක්ද තිබෙන ප්‍රශ්නය? ප්‍රශ්නයක් තිබෙනවා. සේනානායක සමුද්‍ර වේල්ල හරියට නඩත්තු වෙලා නැහැ. ඔබතුමා දන්නවා, ඔය ඉඟිනියාගල සේනානායක සමුද්‍රය ඉතාම වැදගත් ජලාශයක් බව. ඒකෙන් විශාල ජල කන්දරාවක් ලබා ගන්න පුළුවන්. ඒක මේ රටට වැදගත් කාරණා දෙකක් ඉටු කරනවා. එකක් තමයි, විදුලිය නිපදවීම. අනෙක් එක තමයි, අපේ කුඹුරුවලට වාරිමාර්ග හරහා වතුර ලබා දීම. හැබැයි, ඒක හරියට නඩත්තු නොකිරීම හේතු කොට ගෙන විශාල ප්‍රශ්නයක් පසුගිය අවුරුදුවල ඇති වුණා. ගිය අවුරුද්දේ ලැබුණු විශාල වර්ෂාපතනය හේතුවෙන් වේල්ල කඩා ගෙන ගියා. දැන් ආයෙත් වර්ෂාපතනය ලැබෙන්න පටන් ගත්තා. දැන් climate change එකේ ප්‍රතිඵලයක් හැටියට උතුරු, නැඟෙනහිර, එහෙම නැත්නම් ඊසාන දිග මෝසම් සුළං එන කාල සීමාව වෙනස් වෙලා. ලබා දෙන වතුර ප්‍රමාණය, ජලයේ ධාරිතාව වෙනස් වෙලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
I am about to wind up, Madam. Please give me half-a-minute.

ඒකට සරිලන එකම ක්‍රමය විධියට මම දිගින් දිගටම කිව්වා, අම්පාර සේනානායක සමුද්‍රය තිබෙන ගල්ඔය ජලාශය හරහා ද්විතීයික වේල්ලක් - secondary dam එකක් - හදලා, එතැන වැඩිපුර තිබෙන ජලය ටික එකතු කරගෙන, වාරිමාර්ග පද්ධතියත් කළමනාකරණය කරගෙන, repumping system එකක් හදන්න කියලා. මොකද, ඒ ප්‍රදේශයේ ඕනෑ තරම් සූර්ය බලය ලබා ගන්න පුළුවන්. ඒ සූර්ය බලය පාවිච්චි කරලා, repump කරලා, නියඟය තිබෙන කාලයේදී - during the droughts - ඒ වතුර නැවතත් වාරිමාර්ග පද්ධතියට සහ බලශක්තියට යොදා ගන්න පුළුවන්. කරුණාකරලා ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු කේ. ඉලංකුමාරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.27]

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற வலுசக்தி அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

வட மாகாணத்தில் இதுவரை காலமும் யாரும் மின்சக்தி மற்றும் எரிசக்தி தொடர்பான விடயங்களைக் கண்டுகொள்ளவில்லை. ஆனால், நாங்கள் ஆட்சிக்கு வந்த பின்னர், முதன்முதலாக வட மாகாணத்தில் காங்கேசன்துறையில் எண்ணெய் தாங்கியை அமைத்திருக்கின்றோம். இதற்கு முன்னர், அநுராதபுரம் போன்ற பிரதேசங்களுக்குச் சென்று எரிபொருள் நிரப்பிக்கொண்டுவந்தே விநியோகிக்கப்பட்டது. ஆனால், நாங்கள் முதன்முறையாக யாழ்ப்பாணம் - காங்கேசன்துறையில் எண்ணெய் தாங்கியை நிறுவி, அங்கிருந்து வட மாகாணத்துக்குத் தேவையான எரிபொருளை விநியோகித்துக்கொண்டு இருக்கின்றோம். இதுவரை காலமும் வட மாகாணத்துக்கு வாகனங்கள் ஊடாகத்தான் எரிபொருள் கொண்டுசெல்லப்பட்டது. இப்பொழுது மாற்று ஏற்பாடாக புகையிரதம் ஊடாகவும் எரிபொருளைக் கொண்டுசெல்வதற்கு நாங்கள் தீர்மானித்து இருக்கின்றோம். அதற்கான பாதையை அமைப்பதற்குக்கூட நாங்கள் நடவடிக்கை எடுத்து வருகின்றோம்.

வட மாகாணத்தில் அதிகளவான தீவுகள் இருக்கின்றன. அங்கு வாழும் மக்களுக்கு மின்சாரம் அத்தியாவசியமானது. இதுவரை காலமும் generator thermal ஊடாகத்தான் அங்கு மின்சாரம் வழங்கப்பட்டு வந்தது. அதற்கு எரிபொருளைக் கொண்டுசெல்வதற்குக்கூட, பலர் இடர்பாடுகளை ஏற்படுத்தி வந்திருக்கிறார்கள். இன்று நெடுந்தீவு, அனலைதீவு, நயினாதீவு போன்ற பிரதேசங்களில் windmillsஐயும் சூரிய மின் கலங்களையும் நிறுவி, அதனூடாக அந்தப் பிரதேசங்களுக்கு வினைத்திறனான முறையில் மின்சாரத்தை வழங்குவதற்கு எங்களுடைய அரசாங்கம் நடவடிக்கை எடுத்து வருகின்றது. நெடுந்தீவுப் பகுதியில் எந்தவோர் அரசாங்கமும் எரிபொருள் நிரப்பு நிலையத்தை நிறுவவில்லை. ஆனால்,

[ගරු කේ. ඉලංකුමාරන් මහතා]

எங்களுடைய அரசாங்கம் ஆட்சிக்கு வந்து ஓராண்டுக்குள் அங்கு ஓர் எரிபொருள் நிரப்பு நிலையத்தை நிறுவுவதற்கு நடவடிக்கை எடுத்து வருகின்றது. இதை யாரும் நினைத்துக்கூட பார்த்திருக்க மாட்டார்கள். அப்பிரதேச வாழ் மக்கள்கூட, தங்களுக்கு எரிபொருள் நிரப்பு நிலையத்தை அமைத்துத்தரும்படி கேட்கவில்லை. அவர்கள் நினைத்திருந்தார்கள், அங்கு எரிபொருள் நிரப்பு நிலையம் வராது என்று. ஆனாலும், எங்களுடைய அரசாங்கம் அங்கு எரிபொருள் நிரப்பு நிலையத்தை நிறுவியிருக்கிறது. அந்த எரிபொருள் நிரப்பு நிலையத்தை நாங்கள் தனியாருக்கு வழங்கவில்லை. அந்த எரிபொருள் நிரப்பு நிலையத்தை நிறுவும்போது மீன்பிடித் தொழில் செய்யும் ஒருவர் என்னிடம், "அந்த எரிபொருள் நிரப்பு நிலையத்தை நாங்கள் செய்கின்றோம். அதற்குரிய அனுமதியை எங்களுக்குத் தாருங்கள்" என்று கேட்டார். ஆனால், எமது அரசாங்கமானது அந்த எரிபொருள் நிரப்பு நிலையத்தை வலுசக்தி அமைச்சு ஊடாக அமைத்து, அங்கிருக்கின்ற co-operative நிறுவனத்துக்கு வழங்கியிருக்கிறது. கடந்த காலங்களில் அமைச்சர்களும் பாராளுமன்ற உறுப்பினர்களும் எரிபொருள் நிரப்பு நிலையங்களை வியாபார நோக்கில் பயன்படுத்திய வரலாறுதான் இருக்கின்றது. ஆனால், எங்களது அரசாங்கம் வலுசக்தி அமைச்சின் நிதியைப் பயன்படுத்தி அதனை நிறுவி, அந்தக் கஷ்டப் பிரதேச வாழ் மக்களின் நலன் கருதியும், அங்குள்ள co-operative நிறுவனத்தின் முன்னேற்றம் கருதியும் அந்த நிறுவனத்துக்கே அதை வழங்கியிருக்கின்றது என்பதை நான் இங்கு பெருமகிழ்ச்சியுடன் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

மன்னாரில் காற்றாலைகளை அமைக்க வேண்டாமென பாரிய போராட்டம் நடைபெற்றது. அந்தப் போராட்டத்தில் ஈடுபட்டவர்களை மாண்புமிகு சனாதிபதி அவர்கள் இரண்டு தடவை அழைத்துப் பேசினர். "கடந்த காலத்தில் முன்னெடுக்கப்பட்ட கருத்திட்டங்களைச் செயற்படுத்த வேண்டிய கடப்பாடு எங்களுக்கு இருக்கின்றது. ஆகையால், இப்பொழுது அனுமதி அளிக்கப்பட்ட செயற்றிட்டங்கள் மட்டுமே அங்கு மேற்கொள்ளப்படும். இனிமேலும் அங்கு காற்றாலைகளை நிறுவுவதற்கு அனுமதி அளிக்கப்படாது. மன்னார் சிறியதொரு தீவு என்பதால் அவற்றை நிறுவுவதற்கு நாங்கள் அரசாங்கம் என்ற ரீதியில் தடைவிதித்து இருக்கிறோம்" என்று ஆணித்தரமாகக் கூறிவிட்டார். வட மாகாணத்திலுள்ள பூநகரி போன்ற பிரதேசங்கள் மக்கள் தொகை குறைவான இடங்கள். அவ்வாறான பிரதேசங்களை இனங்கண்டு, இவ்வாறான செயற்றிட்டங்களைச் செய்தால் எதிர்ப்பு குறைவாக இருக்கும். அத்துடன், அந்தப் பிரதேச வாழ் மக்களுக்குப் பயனுள்ள விதத்தில் வேலைவாய்ப்புகளும் உருவாகும். இந்த அடிப்படையில் நாங்கள் இவ்வாறான செயற்றிட்டங்களை ஆரம்பிக்கத் தீர்மானித்து இருக்கின்றோம்.

இன்று வலுசக்தி ஊடாக மீன்பிடி இயந்திரங்களை இயக்குவதற்கான ஆய்வுகள்கூட நடைபெற்று வருகின்றன. இதுவரை காலமும் எரிசக்தி ஊடாகத்தான் மீன்பிடி இயந்திரங்களைப் பயன்படுத்தி வந்தார்கள். எமது ஆய்வு வெற்றியளிக்குமாக இருந்தால், எதிர்வரும் காலத்தில் கடற்றொழிலாளர்கள் மின்சக்தி ஊடாகத் தமது தொழிலை வினைத்திறனாகச் செய்யக்கூடிய நிலைமை ஏற்படும். இப்பொழுது, இலங்கையில் electric cars அதிகளவு இறக்குமதி செய்யப்படுகின்றன. எனினும், அவற்றை charge பண்ணுவதற்கான charging points குறைவாகவே காணப்படுகின்றன. இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்த உடன் அவ்வாறான 10 charging pointsஐ நிறுவுவதற்குத் தீர்மானித்தது. இன்று அதில் 7 நிறுவப்பட்டு இருக்கின்றது. இன்னும் 3 நிறுவப்படவேண்டி இருக்கின்றது. இந்தத் திட்டம் வெற்றியளித்து இருக்கின்றது. எனவே, நாங்கள் அனைத்துப் பிரதேசங்களிலும் எரிபொருள் நிரப்பு நிலையங்களுடன் மின்சார வாகனங்களை charge பண்ணக்கூடிய உபகரணங்களையும் பொருத்துவதற்குத் தீர்மானித்து இருக்கின்றோம். இவ்வாறு வட மாகாணத்தின் அபிவிருத்தி தொடர்பில் எமது அரசாங்கமானது ஒவ்வொன்றாக அவதானித்துச் செய்து வருகின்றது.

கடந்த ஒரு வருட காலத்தில் செய்ய முடியாத பல வேலைகளை நாங்கள் செய்திருக்கின்றோம். உதாரணத்துக்கு, நெடுந்தீவில் எரிபொருள் நிரப்பு நிலையம் நிறுவப்படுமென யாரும் நினைத்திருக்கவில்லை. இங்கு இருக்கின்ற ஒருசிலர் கூறுகின்றார்கள், எங்களுடைய பாராளுமன்ற உறுப்பினர் பதவியை resign பண்ணிவிட்டுப் போகும்படி. இந்தப் பாராளுமன்றத்தில் இருந்தவர்கூட வெளியில் இருந்துகொண்டு கூறுகின்றார், இங்கிருக்கின்ற அமைச்சர்கள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்கள் பதவி விலக வேண்டும் என்று. அவர், full suit அணிபவர்; யாழ்ப்பாணத்தில் வேட்டியுடன் வலம் வருபவர்; பாராளுமன்றத்துக்கு வரத் துப்பில்லாதவர்; தமிழரசுக் கட்சியை அழிப்பதற்கு மூலகாரணமாக இருப்பவர்! நான் அவருக்குக் கூறுகின்றேன், முதுகெலும்பு இருக்குமாக இருந்தால் யாழ்ப்பாணத்துக்குச் சென்று, தனது பிள்ளைகள் எங்கே இருக்கிறார்கள், யாரைத் திருமணம் செய்திருக்கிறார்கள் என்று கூறும்படி. அதனைக்கூட, துணிச்சலாகக் கூற முடியாதவராகத்தான் அவர் இருக்கிறார்.

நான் இங்கு இன்னும் ஒருவரைப் பற்றி கூற வேண்டும். அவர்தான் cameraவுக்கு முன்னால் வீர வசனம் பேசுபவர். அவர் cameraஐக் கண்டால் வீர வசனம் பேசுவார். ஆனால், cameraவுக்குப் பின்னால், தமிழர்களைக் கொன்று அழித்தவர்களுடன் கூட்டாகக் கைகோர்த்துக்கொண்டு இருப்பார். அப்படிப்பட்ட அவர், எங்களைப் பார்த்துக் கூறுகின்றார், "நீங்கள் பதவி விலக வேண்டும்" என்று. Administration சார்ந்த பரீட்சையில் எழுதத் தெரியாமல் pass பண்ணாத அவர், பாராளுமன்றத்திலுள்ள cameraவுக்கு முன்னால் மாத்திரம் நின்றுகொண்டு, வெட்டி வீழ்த்துவதாகப் பீத்துகின்றாரே ஒழிய, மக்களுக்காக எதுவும் செய்யவில்லை. நாங்கள் மக்களுக்கான அபிவிருத்திகளைச் செய்துகொண்டு இருக்கின்றோம். *[இடையீடு]* உங்களுடைய கதையால் யாழ். மாவட்டம் முன்னேறாதெனக் கூறிக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)

நான் இவருக்கு ஒன்றைக் கூற விரும்புகின்றேன். தமிழரின் கலாசாரமானது ஒருத்தனுக்கு ஒருத்தி! அதைக்கூட, பின்பற்றாதவர்தான் இவர். இவருக்கு தான் யார் என்று தெரியாது. பக்கத்து வீடோ, அயல் வீடோ என்று இவருக்குக்கூட தெரியாது. அப்படிப்பட்டவர்தான் இன்று பல வாதங்களை முன்வைக்கிறார். இன்று யாருடன் இருக்கிறார் என்றுகூட தெரியாதவர்தான் இங்கு புலம்புகிறார்.

இனவாதத்தின் அலை ஏற்பட்டபோது, இங்கு இருக்கின்ற தமிழ் கட்சிகளும் சிங்களக் கட்சிகளும் சந்தோசமாக இருந்ததை நான் அவதானித்தேன். ஏனென்றால், அவர்களுக்கு இனவாதத்தில்தான் தூங்கிப் பழக்கம்! இனவாதம் ஊடாகத்தான் வாக்குகளைப் பெற்றுப் பழக்கம்! இன ஐக்கியத்தை ஏற்படுத்தி, நல்லதொரு சமுதாயத்தை உருவாக்க வேண்டும் என்ற நோக்கில் நாங்கள் எங்களுடைய பயணத்தை மேற்கொள்ளும்போது, இவ்வாறான செயற்பாடுகளைச் செய்து, திரும்பவும் நாட்டு மக்களை அழிக்காதீர்களெனக் கேட்டுக் கொள்கின்றேன்.

இனவாதத்தால் உங்களது பிள்ளைகள் பாதிக்கப்பட மாட்டார்கள். ஏனென்றால், அவர்கள் எல்லோரும் தென்பகுதியில் ஆங்கில மொழிமூலப் பாடசாலையில் படிக்கிறார்கள். தனது பிள்ளையைக்கூட ஒழுங்காகத் தமிழில் கற்பிக்கத் தெரியாதவர்தான் இங்கு மற்றவர்களைக் குறை கூறுகிறார். முகப்புத்தகத்தில் ஒழுங்காகத் தமிழில் வசனங்களைப் பதிவிடத் தெரியாத இவர், நாங்கள் சிங்களத்தில் தவறாக, "මම නම...." என்று சொன்னதை பெரிதுபடுத்திக் கதைக்கிறார். இதுதான் இவரது பழக்கம்! தனது முகப்புத்தகத்தில் ஒழுங்காகத் தமிழில் பதிவிடத் தெரியாத நீங்கள், ஒரு தமிழனா? எனக் கேட்க விரும்புகின்றோம். ஒருவேளை சிங்களவராக மாறிவிட்டாரோ தெரியவில்லை; மாறினாலும் பிரச்சினையில்லை! மாறத்தான் வேண்டும்! ஏனென்றால், அவர் கொழும்பில்தான் இருக்கிறார். அவர் திருமணம் செய்ததே அப்படி! யாரைத் திருமணம் செய்திருக்கிறேன் என்றுகூட கூற முடியாதவர்தான் தமிழரின் கலாசாரத்தை மேம்படுத்தப் போகிறாரா? என நான் அவரிடமே கேட்கின்றேன்.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
இன்று அவர் பெரிய பீத்தாண்டி மாதிரி cameraக்கு முன்னால் தமிழில் வீர வசனம் பேசுகிறார்; தமிழரை உசுப்பேற்றும் விதமாகச் செயற்படுகிறார். இவ்வாறு உசுப்பேற்றி, ஊசுப்பேற்றி தமிழர்களைக் கொலைசெய்த வரலாறுதான் இருக்கிறது. தமிழ், சிங்களம், முஸ்லிம் என அனைவரும் ஒருமித்து நாட்டைக் கட்டியெழுப்பி வருகிறார்கள். அதற்கு ஆதரவைத் தருமாறு கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු අර්චුනා මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இந்த point of Orderஐத் தமிழில் சொல்ல விரும்புகின்றேன். ஏனெனில், எனது தாய் மொழி தமிழ்!

முதலாவது, Standing Order No. 91(h) states, I quote:

> "No Member shall make any imputation of improper motives against another Member,.."

இரண்டாவது, Standing Order No. 91(e)ஐ வாசியுங்கள்! It states, I quote:

> "Every Member must confine his observations to the subject under discussion;"

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, தம்பி இளங்குமரன் subject தொடர்பாக எத்தனை நிமிடம் கதைத்தார் என்பதையும் அவரை நீங்கள் எப்போது நிறுத்தினீர்கள் என்பதையும் எனக்குச் சொல்லுங்கள்! நீங்கள் interpretationஐக் கேட்டுக்கொண்டுதானே இருந்தீர்கள்? இன்றைக்கு வலுசக்தி சம்பந்தமான விவாதம் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. நீங்கள் அவருடைய பேச்சைக் கேட்டீர்களா, நிறுத்தினீர்களா? நேற்று நீங்கள் என்னை நான்கு நிமிடத்தில் நிறுத்தினீர்கள். ஆனால், இன்றைக்கு அவரை நிறுத்தவில்லை. இது இந்த மூலாசனத்தை வக்குச் செய்கின்ற அவமரியாதை! தயவுசெய்து, அதில் இருக்க வேண்டாம்! அந்தப் பக்கம் போய் இருங்கள்! உங்களுக்கு வெட்கம், மானம், ரோஷம் இருந்தால், தயதுசெய்து அந்தக் கதிரையில் இருக்க வேண்டாம்! நேற்று இதே மாதிரிதான், நான் சம்பந்தம் இல்லாமல் கதைப்பதாகச் சொல்லி, 4 நிமிடங்களில் 2 நிமிடங்கள் கடந்தவுடன் என்னைக் குழப்பினீர்கள். உங்களுடைய கட்சியினருக்கு ஒரு நியாயம், எனக்கு இன்னொரு நியாயமா? தயவுசெய்து, பதிலைச் சொல்லுங்கள்! நான் இனி தமிழில்தான் கதைப்பேன். நெஞ்சில் அடித்துச் சொல்கிறேன், நான் தமிழன்! என்னிடம் இனவாதம் இல்லை. நான் சிங்கள மக்களைக் காதலிக்கிறேன். ஆனால், நான் தமிழன்! நீங்கள் எனக்குப் பதிலைச் சொல்லுங்கள்! *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, මට මේ ගැන සිංහලෙන් කථා කරන්න අවශ්‍ය නැහැ. මට මේ ගැන දෙමළෙන් තමයි කථා කරන්න ඕනෑ. මට අයිතියක් තිබෙනවා, දෙමළෙන් කථා කරන්න. මට සිංහලත් පුළුවන්. මම වැඩිපුරම ආදරේ කරන්නේ සිංහල මිනිස්සුන්ට. හැබැයි, මම මේකට දෙමළෙන් උත්තර දෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ මන්ත්‍රීතුමා අදාළ subject එකට නැතිව කථා කරන්නේ කොහොමද? ඒ අවස්ථාව දුන්නේ කොහොමද? ඒකට මට උත්තර දෙන්න. මම ඒක දෙමළෙනුත් කියන්නම්; සිංහලෙනුත් කියන්නම්.

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද කියලා ඉන්න.

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, රත්තරන් කිරි බොන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තමයි මේ කථා කරන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
එතැන point of Order එකක් නැහැ, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[2.38 p.m.]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
Hon. Deputy Chairperson, first, I would like to answer the question raised by the Hon. Nizam Kariapper with regard to the meeting we have had with the President yesterday. Actually, I do not know what is stated in that media statement, but the President very carefully listened to us and mentioned that, in the future, there will be a process to discuss about the political solution, which is very much needed in our country. That is the only thing I can say.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
Order, please! මේ අවස්ථාවේදී ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. LAKSHMAN NIPUNA ARACHCHI took the Chair.*

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தயவுசெய்து என்னுடைய நேரத்தைத் தற்போதிலிருந்து கணிப்பிடவும்.

நேற்று மாண்புமிகு சனாதிபதி அவர்களுடன் நடைபெற்ற கலந்துரையாடல் தொடர்பாக கௌரவ நிசாம் காரியப்பர் அவர்கள் எழுப்பிய கேள்விக்கு என்னுடைய பதில்: - இந்த நாட்டிலே ஓர் அரசியல் தீர்வை ஏற்படுத்துவதற்காகக் கடந்த காலத்திலே நடைபெற்ற செயற்பாடுகள் தொடர்பில் எங்களுடைய கட்சிப் பிரதிநிதிகள் சனாதிபதி அவர்களுக்கு விளக்கமாகச் சொன்னார்கள். அதை அவதானமாகக் கேட்டுக்கொண்டிருந்த அவர், இந்த நாட்டிலே நிரந்தரமான ஓர் அரசியல் தீர்வை மேற்கொள்வதற்காகப் புதிய பேச்சுவார்த்தைகளை முன்னெடுக்க வேண்டும் என்பதில் தான் உறுதியாக இருப்பதாக எங்களுக்குச் சொல்லியிருக்கிறார். அந்த வகையிலே, நாங்கள் எதிர்காலத்திலே மாண்புமிகு சனாதிபதி அவர்களுடன் பேசுவதற்குத் தயாராக இருக்கிறோம்.

நான் இன்றைய அமைச்சுத் தொடர்பான விடயத்துக்கு வருகிறேன். இந்த வலுசக்தி அமைச்சு மிகவும் முக்கியமான ஓர் அமைச்சு; இந்த நாட்டிலே ஓர் ஆட்சி மாற்றம் ஏற்படுவதற்குப் பிரதான காரணமாக இருந்த அமைச்சு; மக்கள் வீதிக்கு வந்ததற்குப் பிரதான காரணமாக இருந்த அமைச்சு. அந்த வகையிலே, ஆட்சி மாற்றத்தை ஏற்படுத்திய இந்த அமைச்சினூடாக மேற்கொள்ளப்படுகின்ற நடவடிக்கைகளின் மூலம், மீண்டும் மக்கள் அப்படியான queueஇல் நிற்கின்ற காலம் வராத ஒரு நாடாக இந்த நாட்டை மாற்ற வேண்டிய பாரிய பொறுப்பு இந்த அமைச்சுக்கு இருக்கிறது. அந்த வகையிலே, இந்த வரவு செலவுத்திட்டத்திலே இவ்வமைச்சினுடைய 4 முக்கியமான செயற்பாடுகளைக் குறிப்பிட்டிருக்கிறார்கள். அதாவது, புதுப்பிக்கத்தக்க எரிசக்திப் பயன்பாட்டை ஊக்குவித்தல், எரிசக்தி வீண் விரயத்தைக் குறைக்க மின் கட்டமைப்பு விரிவாக்கம் மற்றும் நவீன மயமாக்கல், விலையுயர்ந்த எரிசக்தி வளங்களில் தங்கியிருப்பதைக் குறைத்தல், தனியார் துறைப் பங்கேற்போடு முதலீடுகளை மேம்படுத்தல் ஆகிய 4 தலைப்புகள் முக்கியமாகக் குறிப்பிடப்பட்டிருக்கின்றன.

இந்த அமைச்சுக்கு ஒதுக்கப்பட்டிருக்கின்ற 23 பில்லியன் ரூபாயிலே கிட்டத்தட்ட ஒரு பில்லியன் ரூபாய் மீண்டுவரும் செலவினங்களுக்கு ஒதுக்கப்பட்டிருந்தாலும், 22 பில்லியன் ரூபாய் மூலதனச் செலவினத்திற்கு ஒதுக்கப்பட்டிருக்கிறது. அதன் அர்த்தம், இந்த நாட்டினுடைய மின்சாரக் கட்டமைப்பையும் எரிசக்திக் கட்டமைப்பையும் வலுப்படுத்துவதற்கான பல அபிவிருத்தித் திட்டங்களை மேற்கொள்ள அரசு எதிர்பார்க்கிறது என்பதாகும். இது பாராட்டுக்குரிய விடயம்! அதேபோல, எங்களுடைய நாட்டில் இருக்கின்ற பெருமளவு மின்சக்தியைப் பயன்படுத்துகின்ற வைத்தியசாலைகளுக்குச் சூரிய மின்கலங்களைப் பொருத்தி இயற்கையாக மின்சாரத்தைப் பெறுவதற்காக ஒரு பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது. அவ்வாறே சமய நிறுவனங்களுக்குக் கூரை சூரியசக்தி மின்கலங்களைப் பொருத்துவதற்காக 1.2 பில்லியன் ரூபாய் நிதியொதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. அதற்காக அமைச்சர் அவர்களுக்கு எனது நன்றியையும் பாராட்டுகளையும் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, வைத்தியசாலைகளிலே சத்திரசிகிச்சைக் கூடம், emergency unit, மருந்துகளைப் பாதுகாக்கின்ற களஞ்சியம் போன்றவற்றுக்கு 24 மணித்தியாலமும் குளிரூட்டும் சாதனங்கள் பயன்படுத்தப்பட வேண்டும் என்பது உங்களுக்குத் தெரியும். அதற்குப் பெருமளவு மின்சாரம் பயன்படுத்தப்படுகின்றது. ஆகவே, என்னுடைய வேண்டுகோள் என்னவென்றால், அவ்வாறான

நிறுவனங்கள் மேற்கூரைகளில் பொருத்தப்படுகின்ற சூரிய சக்திக் கலங்களின்மூலம் தேவையான மின்சாரத்தைப் பெறுவதற்கேற்ற வகையில் எதிர்காலத்தில் அவற்றுக்கு நீங்கள் நிதியை ஒதுக்க வேண்டும் என்பதாகும். அதன்மூலம் நிச்சயமாகப் பாரிய பயனை இந்த நாடு அடையக்கூடியதாக இருக்கும்.

மின்சாரம் என்பது மக்களுடைய அன்றாடத் தேவையாக இருக்கின்றது. அது மாத்திரமல்ல, குறைந்த விலையிலே மின்சாரத்தை வழங்கினால்தான் இந்த நாட்டினுடைய பொருளாதார அபிவிருத்தி மேம்படும். இங்கு வருகின்ற உற்பத்தியாளர்கள் பெருந்தொகையான மின்சாரச் செலவைத் தாங்க முடியாதவர்களாக இருப்பார்கள். ஏனென்றால், மின்சாரக் கட்டணம் கூடும்போது உற்பத்திச் செலவு நிச்சயமாக அதிகரிக்கும். ஆகவே, எங்களுடைய நாட்டிலே இயற்கை மின்சாரத்தை உற்பத்தி செய்வதற்கான முதலீடுகளைக் கொண்டுவரவேண்டிய பாரிய பொறுப்பு உங்களுக்கு இருக்கின்றது. அதை நீங்கள் செய்வீர்கள் என்று நாங்கள் நம்புகின்றோம்.

அதேபோல, இன்று உலக நாடுகளை எடுத்துப் பார்த்தால், இயற்கை மின்சாரம் அல்லது இயற்கை வளங்களைப் பயன்படுத்தி, புதுப்பிக்கத்தக்க எரிசக்தியின் ஊடாகச் சுற்றுச் சூழலுக்குக் குறைந்த பாதிப்புள்ள முறையினூடாக மின்சாரத்தை உற்பத்தி செய்வதில் பல நாடுகள் முன்னணியில் இருப்பதைக் காணலாம். குறிப்பாக, ஆசிய நாடுகளை எடுத்துக்கொண்டால், அதில் முக்கியமாக பூட்டான் - எங்களின் ஓர் அயல் நாடு - green energyஐ உற்பத்தி செய்து அயல் நாடுகளுக்கு விற்பனை செய்கின்றது. அதனூடாகத் தங்களுடைய வருடாந்த வருமானத்திலே 60 சதவீதத்திற்கும் மேற்பட்ட அந்நியச் செலாவணியை அவர்கள் பெற்றுக் கொள்கிறார்கள். எங்களுடைய நாடும் அப்படியான ஒரு நாடு. நாங்கள் வருடம் முழுவதும் சூரிய சக்தியைப் பயன்படுத்தலாம்; வருடம் முழுவதும் காற்றைப் பயன்படுத்தலாம். முறையான திட்டமிடல் இருக்குமாக இருந்தால், எங்களுடைய நாடும் பூட்டானைப்போல புதுப்பிக்கத்தக்க எரிசக்தியை உற்பத்தி செய்து ஏனைய நாடுகளுக்குக் கொடுக்கலாம். எங்களுக்கு மிகவும் அண்மையிலுள்ள நாடான இந்தியாவுக்குக்கூட எங்களுடைய நாட்டிலிருந்து புதுப்பிக்கத்தக்க எரிசக்தியை ஏற்றுமதி செய்யக்கூடிய வசதி எதிர்காலத்தில் ஏற்படும். ஆகவே, தயவுசெய்து, புதுப்பிக்கத்தக்க எரிசக்தியை உற்பத்தி செய்வதற்கான திட்டங்களுக்காக மக்களுக்கு நீங்கள் மானியங்களை வழங்க வேண்டும்.

இன்றைக்கு எங்களுடைய நாட்டிலே அதிக சூரிய சக்தியைப் பெறுகின்ற உலர் வலயங்களில் வாழ்கின்ற மக்கள், குறிப்பாக வடக்கு, கிழக்குப் பிரதேசங்களிலே வாழ்கின்ற பெருந்தொகையான மக்கள் தங்களுடைய கூரைகளிலே சூரிய சக்தி மின்கலத்தைப் பொருத்தி மின்சக்தியைப் பெற்று தங்களுடைய தேவையைப் பூர்த்திசெய்யவும் அதிலிருந்து வருமானம் பெற்றுக்கொள்ளவும் முயற்சி செய்வதைக் காணக்கூடியதாக இருக்கின்றது. ஆனால், அவர்களுடைய அந்த முயற்சிக்குப் பலன் கிடைப்பதில்லை; அதற்கான உட்கட்டமைப்பு வசதிகள் மின்சார சபையிடம் இல்லை. இந்த ஒரு வருடத்திற்குள் நீங்கள் எல்லாவற்றையும் செய்யலாம் என்று நான் சொல்லவில்லை. அதற்கான அடித்தளத்தை இட்டு, புதுப்பிக்கத்தக்க எரிசக்தியை எங்களுடைய நாட்டிலே உற்பத்தி செய்து எங்களுடைய மக்கள் பயன் பெறும் வகையிலும் நாட்டை வளமானதாக மாற்றுவதற்கும் உரிய வேலைத்திட்டங்களை முன்னெடுக்க வேண்டு மென்பதைத்தான் இந்தச் சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

இங்கு பேசிய மாண்புமிகு சனாதிபதி அவர்கள், வீண் விரயமற்ற, அதிக உற்பத்திச் செலவில்லாத, குறைந்த விலையில் மின்சாரத்தைப் பெறக்கூடிய ஏற்பாடுகள் செய்யப்பட்டுள்ளதாகக் குறிப்பிட்டிருந்தார். முன்னர் 50 மெகாவொட் மின் உற்பத்தியின் ஓர் அலகு மின்சாரத்துக்கு 8 டொலருக்கு அதிகமான தொகையைச் செலுத்த வேண்டியிருந்த நிலையில், இப்போது கட்டம் Iஇன்போது 3.96 மற்றும் கட்டம் IIஇன்போது 3.77 அமெரிக்க டொலர் விலையில் உற்பத்தி செய்யக்கூடிய விலைமனுக்களை அங்கீகரித்திருப்பதாகச் சொல்லப்படுகின்றது. நல்ல விடயம். அதன்மூலம் எங்களுடைய மக்கள் எதிர்நோக்கும் பல பிரச்சினைகளைக் குறைக்கக்கூடியதாக இருக்கும்.

கடந்த ஆட்சிக் காலத்திலே வட, கிழக்கு மாகாணங்களிலே யுத்தத்துக்குப் பின்னர் மீள் குடியேறிய மக்களுக்கு 'வடக்கின் வசந்தம்' என்ற திட்டத்தினூடாக இலவச மின்சார இணைப்பு கொடுக்கப்பட்டது உங்களுக்குத் தெரியும். ஆனால், அதைத் தவறவிட்ட மீள்குடியேறிய பல மக்கள் இப்போது அங்கு வாழ்கிறார்கள். ஆகவே, கௌரவ அமைச்சர் அவர்களே, நீங்களும் வடக்கு, கிழக்கு மாகாணத்தில் மீள்குடியேறிய மக்களுக்கு அந்த 'வடக்கின் வசந்தம்' திட்டத்தைப்போல ஒரு திட்டத்தைக் கொண்டுவந்து இலவச மின்சார இணைப்பைப் பெற்றுக்கொள்வதற்கான ஏற்பாட்டைச் செய்ய வேண்டுமென நான் கேட்டுக் கொள்கிறேன். அதுபோல், விவசாயத் துறையை எடுத்துக்கொண்டால், இந்தியாவின் தமிழ் நாட்டிலே விவசாயிகளுக்கு இலவசமாக மின்சார வசதி செய்து கொடுக்கிறார்கள். அதுபோல், நீங்கள் இங்கே இலவசமாகக் கொடுக்கத் தேவையில்லை. சிறு உற்பத்தியாளர்கள், விவசாயிகளுக்கு மானிய அடிப்படையில் அந்த வசதியை ஏற்படுத்தி கொடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கிறேன்.

வன்னிப் பிரதேசத்தின் மன்னார் மாவட்டத்திலே காணப்படுகின்ற காற்றாலைகள் தொடர்பான பிரச்சினை பற்றி உங்களுக்குத் தெரியும்; நான் புதிதாகச் சொல்ல வேண்டிய தேவையில்லை. அந்த மக்கள் அதற்கெதிராக நீண்ட காலமாகப் போராட்டம் செய்துகொண்டிருக்கிறார்கள். காணாமற்போனவர்களுடைய பெற்றோர்கள், உறவினர்கள் 3,000 நாட்களுக்கும் மேலாகத் தெருவிலே இருக்கின்றார்கள். இந்தப் போராட்டங்களை முடிவுக்குக் கொண்டுவராமல் நீடிக்க அனுமதிக்கும் ஒரு பழக்கம் எங்களுடைய நாட்டிலே இருக்கின்றது. தயவுசெய்து, இந்தப் போராட்டத்தை நீண்ட காலத்துக்குச் செல்ல விடாதீர்கள்! அந்த மக்களுடைய குறையைக் கேளுங்கள்! விஞ்ஞான ரீதியாக ஆராயுங்கள்! அந்த மக்கள் ஏதோவொரு காரணத்துக்காகக் காற்றாலைகளை விரும்புகிறார்களில்லை. உங்களால் மாத்திரம்தான் அவர்களுடைய பிரச்சினையைத் தீர்க்க முடியும்; உங்களால் மாத்திரம்தான் அவர்கள் அந்தப் போராட்டத்தைவிட்டு வீடு செல்ல வழிசமைக்க முடியும். இந்த அரசாங்கம் இதைப் பொறுப்புணர்வோடு செய்ய வேண்டுமென்று நான் கேட்டுக் கொள்கிறேன். இறுதியாக, எங்களுடைய பிரதேசங்களிலே காணப்படுகின்ற பொது ஸ்தாபனங்களின் கூரைகளிலே சூரிய சக்தி மின்கலங்களைப் பொருத்துவதனூடாக எரிசக்தித் துறையில் எங்களுடைய நாட்டை வளமான நாடாக முன்னோக்கிக் கொண்டுசெல்வதற்கு நீங்கள் நடவடிக்கை எடுக்க வேண்டும்; நாங்கள் அதற்கு பூரண ஒத்துழைப்பு வழங்குவோமெனச் சொல்லி, நன்றி கூறி, விடைபெறுகிறேன். வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ගීතා හේරත් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.49]

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය විවාදයේදී බලශක්ති අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කිරීමට අවස්ථාවක් ලබාදීම පිළිබඳව මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම බලශක්ති ක්ෂේත්‍රය ගත්තාම අපේ රටට ගැළපෙන ආකාරයට පරිවර්තනීය වෙනසක් සිදු විය යුතුයි කියන තැන ආණ්ඩුවක් විධියට අපි ඉන්නවා. පසුගිය කාලසීමාව තුළ ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය වුණා. ඒ වාගේ වෙනස්කම් කිහිපයක්ම සිද්ධ කරන්න අපි සමත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම අපේ රටේ ප්‍රධාන බලශක්ති ප්‍රභවය ලෙස ජල විදුලිය තමයි උපයෝගී කර ගන්නේ. ඒ කොහොම වුණත් සූර්ය සහ සුළං වැනි පුනර්ජනනීය විදුලිය වෙත මේ වෙනකොට අපි වෙනස් වෙමින් තිබෙනවා. ඒක හොඳ තත්ත්වයක්. ආණ්ඩුවක් විධියට අපි ඒ සඳහා දිරිගැන්වීම් සිද්ධ කරනවා. මොකද, බලශක්ති ක්ෂේත්‍රය තුළ එවැනි වෙනස්කම් සිද්ධ වීමට අවශ්‍ය වෙලා තිබෙනවා.

ඇත්තටම මේ බලශක්ති ක්ෂේත්‍රය තුළ ඉදිරි පියවරක් සනිටුහන් කිරීමට මේ ගත වූ වසරක කාලසීමාව තුළ අපි ආණ්ඩුවක් විධියට සමත් වෙලා තිබෙනවා. රටේ සංවර්ධන පරමාර්ථ සපුරා ගැනීමට මේ බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන සමස්ත ප්‍රතිපත්ති සකස් කිරීමේ වගකීම පැවරිලා තිබෙන්නේ බලශක්ති අමාත්‍යාංශයට. ශ්‍රී ලංකාවේ මහජන උපයෝගිතා කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව ඇතුළු බලශක්ති ක්ෂේත්‍රයේ නොයෙකුත් නියාමන ආයතන සඳහා වූ ප්‍රතිපත්ති නියෝග සම්පාදනය කිරීමේ බලයත් බලශක්ති අමාත්‍යාංශයට තිබෙනවා. ඒ වාගේම විදුලිය, ඛනිජ තෙල්, පුනර්ජනනීය බලශක්තිය සහ පරමාණුක බලශක්තිය ආශ්‍රිත කටයුතුවල නිරතව සිටින නොයෙකුත් රජය සතු ආයතන අධීක්ෂණය කිරීමත් බලශක්ති අමාත්‍යාංශය විසින් සිද්ධ කරනු ලබනවා.

බලශක්ති අමාත්‍යාංශය අපේ රටේ ආර්ථික වර්ධනය හා සමාජ අභිවෘද්ධිය කෙරෙහි සහාය වෙමින් සුරක්ෂිත හා විශ්වසනීය බලශක්ති සැපයුමක් සහතික කිරීම වෙනුවෙන් සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරනු ලබනවා. මම කලින් සඳහන් කළා වාගේ 2024 අංක 36 දරන විදුලිබල පනත 2025දී නැවත සංශෝධනය කළා. ඇත්ත වශයෙන්ම ඒ සංශෝධන අපේ රට පරිවර්තනීය වෙනසක් සඳහා යාමට මීට දශක දෙකකට, තුනකට කලින් සිද්ධ වෙන්න තිබුණු දෙයක්. ඒ කොහොම නමුත් අපි බලයට පත් වූ වහාම ඒ වෙනස්කම් සිදු කර තිබෙනවා. විදුලිබල පනත සංශෝධනය කිරීමේදී විශේෂයෙන් අපේ රටේ ආර්ථිකයට ගැළපෙන ආකාරයටත්, අනෙක් අතට විදුලිබල මණ්ඩලයේ සේවකයන්ගේ අයිතීන් සුරක්ෂිත වන ආකාරයටත්, ඒ වාගේම පාරිභෝගිකයන් අපහසුවකට පත් නොවන ආකාරයටත් තමයි ඒ සංශෝධන සිදු කර තිබෙන්නේ. විදුලිබල පනත සංශෝධනය තුළින් විදුලිබල මණ්ඩලය සතු ඒ බලතල සමාගම් 4කට බෙදීමක් සිද්ධ වෙනවා. ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම සහ පද්ධති පාලනය සඳහා සමාගම් 4කට බලය පැවරෙනවා. ඒ කොහොම නමුත් මෙතැනදී පෞද්ගලීකරණයක් සිද්ධ වෙන්නේ නැහැ. අයිතිය සම්පූර්ණයෙන්ම රජය සතු වෙනවා.

ඒත් එක්කම කියන්න ඕනෑ, අපේ ආණ්ඩුවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය ගැන. එහි කොටසක් විධියට තරගකාරී හා කාර්යක්ෂම විදුලිබල සැපයුමක් පාරිභෝගිකයන්ට ලබාදීම සඳහාත්, විවිධ වර්ගයේ විදුලිබල වෙළෙඳ පොළවල් හඳුන්වා දීමටත්, ඒ තුළින් පෞද්ගලික අංශයේ ආයෝජනවලට වැඩි අවස්ථා ලබා දීමටත් අපි ආණ්ඩුවක් විධියට කටයුතු කරමින් ඉන්නවා.

විශේෂයෙන්ම කියන්න ඕනෑ, විදුලිබල මණ්ඩලයේ 23,000ක් පමණ සේවකයින් ඉන්න බව. මේ සේවකයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වෙන ආකාරයට, රැකියා අහිමි වීමක් සිද්ධ වෙන්නේ නැති වෙන්න, ඔවුන්ව නැවත අනුයුක්ත වීමක් වෙනවා. ඒ වාගේම මේ සේවකයින්ගේ කිසිදු දීමනාවක්, ප්‍රතිලාභයක්, ප්‍රතිපාදනයක් අහිමි කිරීමකින් තොරව, විශ්‍රාම වැටුප් අරමුදල්, අර්ථසාධක අරමුදල් ඒ විධියටම පවත්වාගෙන යමින් තමයි මේ පනත සංශෝධනය කරලා තිබෙන්නේ. ඒ නිසා ඒක ඇත්තටම ප්‍රගතිශීලී පනතක් විධියට හඳුන්වන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලශක්ති අමාත්‍යාංශය ගත්තාම, ඒ යටතේ පවතින ප්‍රධාන ආයතනය වන්නේ ලංකා විදුලිබල මණ්ඩලයයි. ඒ වාගේම සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඇතුළු ආයතන කිහිපයක්ම තිබෙනවා. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය මේ වෙනකොට බලශක්ති අමාත්‍යාංශයේ විෂය පථයෙන් ඉවත් වෙලා තිබෙනවා. ඒත් එක්කම ජාතික පද්ධති පාලන පුද්ගලික සමාගමත්, ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයීම් පුද්ගලික සමාගමත්, විදුලිබල බෙදා හැරීමේ ලංකා පුද්ගලික සමාගමත්, විදුලි ජනන ලංකා පුද්ගලික සමාගමත් බලශක්ති අමාත්‍යාංශය යටතට ඇතුළත් වෙනවා. ඉතින් 2026 වර්ෂයේ මෙන්ම, 2025 වර්ෂයේත් අය වැය මඟින් බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා අපි යෝජනා ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, විදුලිබල අංශයෙන් වාගේම බලශක්ති අංශයෙන් ගත්තාම.

2025 වර්ෂය තුළ ගත්තාම, දේශීය බලශක්ති ඉල්ලුම සපුරාලීමේදී පොසිල ඉන්ධන තවදුරටත් සැලකිය යුතු කාර්ය භාරයක් ඉටු කරනවා. ඉතින් දේශීය බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීම සහ ඒ වාගේම ගෝලීය බලශක්ති සැපයුමට ශ්‍රී ලංකාව දායක කිරීම අරමුණු කරගෙන 2025 තුළ වැඩසටහන් කිහිපයක්ම ක්‍රියාත්මක කිරීමට අපි අපේක්ෂා කරනවා. ඒ අනුව සපුගස්කන්ද පිරිපහදුව නවීකරණය කිරීම සහ නව පිරිපහදුවක් ඉදි කිරීමට අපේක්ෂා කරනවා. අපේ රටේ ඛනිජ තෙල් අවශ්‍යතාවයෙන් සියයට 25ක් පමණ සපුගස්කන්ද තෙල් පිරිපහදුව මඟින් සපයනු ලබනවා. ඒ කොහොම නමුත්, සියයට 75ක පමණ ප්‍රමාණයක් ආනයනය කිරීමෙන් තමයි සපුරා ගන්නේ. ඉතින් මෙහෙම ගත්තාම, විදේශ විනිමය සංචිත කෙරෙහි මෙය බලපෑමක් ඇති කරනවා. ඒ නිසා දේශීය ඛනිජ තෙල් අවශ්‍යතාව අප රට තුළම පිරිපහදුව මඟින් නිෂ්පාදනය කිරීමට අපි අපේක්ෂා කරනවා. ඉතින් ඒ වෙනුවෙන් පිරිපහදු කිරීම සඳහා නව පිරිපහදුවක් ඉදි කිරීමට මේ වෙනකොට අපි කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒත් එක්කම ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය තුළ පවතින ටැංකි 99ක ප්‍රමාණය අතරින්, ටැංකි 24ක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසිනුත්, තෙල් ටැංකි 61ක් ත්‍රිකුණාමල ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම මඟිනුත් සංවර්ධනය කිරීමට මූලික පියවර අරගෙන තිබෙනවා. ඒ අතරින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු ටැංකි 24න් ටැංකි 2ක අලුත්වැඩියා කිරීමේ කටයුතු මේ වෙනකොට සිදු කෙරෙමින් පවතිනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රිකුණාමලය බලශක්ති කේන්ද්‍රස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා ඉන්දියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ශ්‍රී ලංකාව

අතර ත්‍රෛපාර්ශ්වික අවබෝධතා ගිවිසුමක් අත්සන් කරලා තිබෙනවා. ඒ යටතේත් ටැංකි 61ක සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කරලා තිබෙනවා.

ඒ වාගේම විද්‍යුත් වාහන ආරෝපණය සඳහා දිවයින පුරා ආරෝපණ මධ්‍යස්ථාන 10ක් ස්ථාපිත කිරීමට කටයුතු කරලා තිබෙනවා. එතැනදී 7ක වැඩ අවසන් වෙලා පාරිභෝගිකයින්ට ඒ සඳහා අදාළ සේවාවන් ලබාදීම මේ වෙනකොට ආරම්භ කරලා තිබෙනවා. ඊට අමතරව, අනුරාධපුර, දෙමටගොඩ සහ බම්බලපිටිය යන ප්‍රදේශවල ඉදි කිරීම් කටයුතු සිදු කිරීමට නියමිතව තිබෙනවා. ඒ වාගේම ඉන්ධන ගබඩා ධාරිතාව පුළුල් කිරීමටත් සැලසුම් කරලා තිබෙනවා. විශේෂයෙන්ම බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් ඉන්ධන ගබඩා ධාරිතාවයන් පවත්වා ගැනීම අවශ්‍ය වෙනවා. ඉතින් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මෙට්‍රික්ටොන් 440,147ක පමණ සමස්ත ගබඩා ධාරිතාවයක් තමයි පවත්වාගෙන යන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒ ටැංකි ඉදි කිරීමටත් අපි සැලසුම් කරලා තිබෙනවා.

ඒ විධියට ගත්තාම, කොළොන්නාව ඛනිජ තෙල් ගබඩා පර්යන්තය තුළ සමස්ත ධාරිතාව ඝනමීටර් 64,000කින් යුත් ටැංකි 6ක් ඉදිකිරීමේ කටයුතු මේ වනවිට ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම කොළොන්නාව ඛනිජ තෙල් ගබඩා පර්යන්තය තුළ සමස්ත ධාරිතාව ඝනමීටර් 22,000කින් යුත් ටැංකි 2ක් ඉදිකිරීමට මේ වෙනකොට කටයුතු කරමින් පවතිනවා. ඊට අමතරව මුතුරාජවෙල ඛනිජ තෙල් ගබඩා පර්යන්තය තුළ සමස්ත ධාරිතාව ඝනමීටර් 40,000කින් යුත් ටැංකි 3ක් ඉදිකිරීමට කටයුතු සූදානම් කර තිබෙනවා. ඒත් එක්කම ඉන්ධන ප්‍රවාහන නළ මාර්ග පද්ධති සංවර්ධනය කිරීම සඳහාත් කටයුතු කරමින් තිබෙනවා. කොළඹ වරායේ සිට කොළොන්නාව පර්යන්තය දක්වා ඉන්ධන ප්‍රවාහනය කරනු ලබන නළ මාර්ග පද්ධති ඉතා පැරණි සහ අබලන් තත්ත්වයේ තිබෙන්නේ. ඒ වෙනුවෙන් එම නළ මාර්ග ඉදිකිරීමට කටයුතු සූදානම් කර තිබෙනවා.

විශේෂයෙන්ම කියන්න ඕනෑ, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දැනට ලාභ ලබන ආයතනයක් බවට පත් වෙලා තිබෙන බව. අපේ රටේ බලශක්ති සුරක්ෂිතතාව වෙනුවෙන් බලශක්ති අමාත්‍යාංශයත්, ඒ වාගේම ආණ්ඩුවක් විධියට අපත් වගකීමෙන් යුතුව කටයුතු කරනවා කියන කාරණය මතක් කරමින් මම කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.59]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இன்றைய தினம் வலுசக்தி அமைச்சு சார்பான குழுநிலை விவாதத்திலே உரையாற்றுவதிலே மட்டற்ற மகிழ்ச்சி யடைகின்றேன். முதலாவதாக, இரண்டு விடயங்களுக்கு அமைச்சரிடம் பதிலை எதிர்பார்க்கின்றேன். ஒன்று, பொதுமக்கள் மற்றும் நிறுவனங்கள் தமக்குத் தேவையான மின்சார விநியோகத்தைப் பெறுவதற்குப் பணம் செலுத்தி யிருந்தாலும் மின்சார சபையிடம் அதற்கான உபகரணங்கள், உதிரிப்பாகங்கள் இல்லாதிருக்கின்ற காரணத்தால், அது மாதக்கணக்கிலே இழுபடுகின்ற ஒரு நிலை காணப்படுகின்றது. இது தொடர்பாக அமைச்சு உடனடியாக நடவடிக்கை எடுக்க வேண்டும் என்பதோடு, இதற்கு என்ன நடவடிக்கை எடுக்கப்பட்டிருக்கிறது என்பதையும் நான் இச்சமயத்தில் கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

இரண்டாவது விடயம், இன்று electricity bill டிஜிட்டல் முறைப்படி அனுப்பப்படுவதால், smartphone வைத்திருக் கின்றவர்கள் மட்டும்தான் அதனைப் பார்க்கக்கூடிய ஒரு நிலை காணப்படுகிறது. 'கொரோனா'விற்குப் பின்பு சில இடங்களிலே குறிப்பாக, முல்லைத்தீவு போன்ற மாவட்டங் களிலே மின்சாரக் கட்டணத்துக்கான billஐ paperஇலே கொடுக்கத் தொடங்கியிருக்கிறார்கள். ஆனால், வன்னி மாவட்டத்தைப் பொறுத்தமட்டிலே, கிராமப்புறங்களிலே இருக்கின்ற எங்களுடைய மக்கள் சிறிய phones வைத்திருக்கிறபடியால், இந்த டிஜிட்டல் முறையினூடாக அனுப்பப்படும் மின்சாரப் பட்டியலைப் பார்க்க முடியாத நிலையில், இரண்டு-மூன்று மாதங்கள் மின்சாரக் கட்டணம் செலுத்தாது மின்சாரம் துண்டிக்கப்படுகின்ற சூழல் ஏற்படுகின்றபோதுதான், அதுபற்றி தங்களுக்குத் தெரியவில்லை என்று சொல்லுகின்ற நிலைமையை நாங்கள் காணக்கூடியதாக இருக்கிறது. கௌரவ அமைச்சர் அவர்களே, சாதாரணமாக அன்றாடம் உழைக்கின்றவர்கள் மற்றும் விவசாயிகள் முதலானவர்களின் வீடுகளுக்குச் சென்று மின்சார விநியோகத்தைத் துண்டிக்கின்றபோது, மூன்று-நான்கு மாதங்கள் கடந்த பின்னர் அந்த billஐக் கட்டவேண்டிய ஒரு நிலை ஏற்படுவதால், அது அவர்களுக்கு ஒரு சுமையாக மாறுகின்றது. அந்தந்த மாதத்திற்கான water bill, paperஇல் கொடுக்கப்படுகிறது. டிஜிட்டல் முறை தேவை! நான் இல்லையென்று சொல்லவில்லை. ஆனால், மேற்கூறிய சிக்கல் காணப்படுவதால், கிராமப்புறங்களிலே அந்த டிஜிட்டல் முறை சரியாக அறிமுகப்படுத்தப்படும்வரை paperஇலே electricity billஐக் கொடுப்பதற்கான முயற்சியை மேற்கொள்ள வேண்டும்.

நாங்கள் காற்றாலை சம்பந்தமாக ஜனாதிபதி அவர்களைச் சந்தித்துப் பேசியபோது, ஒருமாத கால அவகாசத்தை அவர் கேட்டுக்கொண்டார். அமைச்சர் அவர்களும் காற்றாலை சம்பந்தமாக மக்களுக்கு உள்ள பிரச்சினைகளைக் கேட்டறிவதற்காக அங்கு வந்திருந்தபோது, முதல் காற்றாலை அமைக்கப்பட்டதன் பின்பு தாங்கள் தண்ணீருக்குள் தவித்ததை, இடம்பெயர்ந்த சம்பவங்களை, தங்களுடைய தொழில் பாதிக்கப்பட்டதை, தாங்கள் அனுபவித்த துன்பங்களை மக்கள் ஆதங்கத்துடனும் ஆக்ரோஷத்துடனும் உணர்வுபூர்வமாக அவரிடம் வெளிப்படுத்தினார்கள். அமைச்சர் அவர்களும் சாதாரண மக்களுடன் இருந்து பழகியவர் என்ற அடிப்படையிலே, மக்கள் வெளிப்படுத்திய அந்தத் துன்பங்களை அவர்களுடைய உணர்வு சார்ந்த ஆதங்கத்தைப் புரிந்துகொள்வாரென்று நினைக்கின்றேன்.

மேலும், மாண்புமிகு ஜனாதிபதி அவர்களோடு பேசுகின்றபோது, "இந்த மின்சாரக் கட்டண உயர்வு காரணமாக, தொழில் செய்வதற்காக முதலீட்டாளர்கள் நாட்டுக்கு வரமுடியாமல் இருக்கிறார்கள். ஆகவே, நாம் முதலீட்டாளர்களைக் கொண்டுவர வேண்டுமென்றால், மின்சாரக் கட்டணத்தைக் குறைப்பதற்கான ஒரு சூழலை உருவாக்க வேண்டும். அந்த வகையிலே, மன்னாரிலே இந்தக் காற்றாலை என்பது பிரதானமாக இருக்கின்றது. ஆகவே, அதை நாங்கள் செய்ய வேண்டும்" என்ற அடிப்படையிலே பேசினார். இந்தக் காற்றாலை சம்பந்தமான போராட்டம்

[ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා]

கிட்டத்தட்ட 105 நாட்களாக நடைபெற்று, பல பிரச்சினைகள், இழுபறிகள் ஏற்பட்டு, கடைசியிலே ஜனாதிபதி அவர்களும் அமைச்சரவையும் இனி மன்னார் நகரத்துக்குள்ளே இந்தக் காற்றாலை சம்பந்தமான விடயங்களைக் கையாள்வதில்லை என்ற ஒரு தீர்மானத்திற்கு வந்ததன் அடிப்படையில், அதுசம்பந்தமாக வெளியிடப்பட்ட வர்த்தமானி அறிவிப்பை எங்களுடைய மக்கள் பார்த்ததன் பின்பு, இனி மன்னாரின் நகரப்புறங்களிலே இந்தக் காற்றாலை சம்பந்தமாக எந்த ஒரு முயற்சியும் நடைபெறாது என்ற உத்தரவாதத்தின் அடிப் படையிலே, ஆயிரக்கணக்கான மக்களுடைய அந்த உணர்வுரீதியான போராட்டம் இப்பொழுது இடைநிறுத்தப் பட்டிருக்கின்றது.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் எங்களது மக்களுடைய ஆதங்கத்தைக் கேட்டறிந்தீர்கள். எங்களுடைய மன்னார் நகரத்தின் அமைப்பு உங்களுக்குத் தெரியும். அங்கு கடலும் மன்னார் நகரப்புற நிலமும் சரிசமமான மட்டத்தில் காணப்படும் நிலைப்பாடுதான் இருக்கின்றது; அதனை நீங்கள் நன்றாக அறிவீர்கள். அங்கு 7-8 ஏக்கரைக் கொண்ட விஸ்தீரணமுள்ள இடத்தில்தான் அந்தக் காற்றாலை அமைக்கப்படுகின்ற சூழல் இருக்கின்றது. மக்கள் செறிந்து வாழுகின்ற பிரதேசத்திலே அந்த முறைமை வருகின்றபோது பல பிரச்சினைகளைச் சந்திக்க நேரிடும் சூழ்நிலை இருப்பதாக அவர்கள் எடுத்துச் சொன்னார்கள். ஆகவே, அரசாங்கம் இனியும் இந்த நகரப்புறத்திலே காற்றாலைகளை அமைப்பதற்கு முயற்சிக்க வேண்டாம் என்று மக்கள் சார்பாக நான் உங்களிடம் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மன்னாரிலே சூரிய சக்தியைப் பெறுவதற்காக பல வெட்டவெளியான, கால்நடைகள்கூட மேயமுடியாத பல ஏக்கர் கணக்கான நிலங்கள் இருக்கின்றது. அங்கு வெய்யில்கூட அதிகமாகக் காணப்படும். அதை அரசாங்கம் பயன்படுத்த முடியும். ஆனால் அந்த நிலங்கள் வன இலாகாவுக்குச் சொந்தம் என்று சொல்கிறார்கள். வன இலாகாவுக்குச் சொந்தமான அந்த இடங்களை அரசாங்கம் எடுத்து, சூரிய சக்தி மின்சாரத்தை உற்பத்தி செய்ய முடியும் என்ற ஓர் ஆலோசனையை நான் சொல்கின்றேன். ஆகவே, முண்டியடித்துக்கொண்டு மன்னாரின் நகர்ப்புறத்தில் இந்தக் காற்றாலையை அமைப்பதைவிடுத்து, சூரிய சக்தியூடாகக் கிடைக்கின்ற மின்சாரத்தைப் பெறுவதற்கு மன்னாரிலுள்ள அத்தகைய இடங்களைப் பயன்படுத்த வேண்டுமென்று நான் அமைச்சரிடம் வேண்டுகோள் விடுக்கின்றேன். இதுவே மக்களுடைய விருப்பமாகவும் இருக்கின்றது. வருவாயை ஈட்டுவதற்காக மக்களுடைய சிந்தனைகளை மழுங்கடித்து அதன் ஊடாக வருமானத்தைப் பெறுவது தவறு என்பதை இந்த அரசாங்கம் உணர்ந்துள்ள காரணத்தால், இனிவரும் காலங்களில் நகரப்புறங்களில் காற்றாலைகளை அமைக்க முடியாது என்று அமைச்சரவையிலே தீர்மானம் எடுக்கப் பட்டிருப்பது அரசாங்கத்தின் முன்னைய தீர்மானத்திற்கு அப்பாற்பட்ட ஒரு நல்ல விடயமாக இருக்கிறது.

அத்துடன், கௌரவ அமைச்சர் அவர்களே, எங்களுடைய மன்னார் பிரதேசத்தில் மின்சாரம் இடைக்கிடை துண்டிக்கப் பட்டுத் துண்டிக்கப்பட்டு வருவதால், மக்களுடைய குளிர்சாதனப் பெட்டி, தொலைக்காட்சி போன்றவை செயலிழக்கின்ற நிலை காணப்படுகின்றது. அங்குள்ள மின்சார wireஇலே உப்பு படிகின்ற காரணத்தால் இந்தத் தடங்கல்கள் ஏற்படுவது வழமையாக இருக்கிறது. ஆகவே, இந்த விடயத்திலும் நீங்கள் கவனமெடுக்க வேண்டும்.

கௌரவ பாராளுமன்ற உறுப்பினர் வைத்தியர் சத்தியலிங்கம் அவர்கள் சொன்னதுபோல, மக்கள் மின்சார இணைப்பைப் பெறுவதற்கு 40,000 ரூபாய் செலுத்த வேண்டியிருக்கின்றது. ஏழை மக்களால் இவ்வளவு பெருந்தொகைப் பணத்தை ஒரே தடவையில் கட்ட முடியாத நிலை காணப்படுகின்றது. ஆனால், அவர்கள் கொஞ்சம் கொஞ்சமாக அதனைக் கட்டக்கூடிய தகுதியுடன் இருக்கிறார்கள். ஆகவே. இதற்கென ஒரு மானிய முறையை நீங்கள் அறிமுகப்படுத்த வேண்டும். எல்லாவற்றையும் இனாமாகக் கொடுத்துவிட முடியாது. தவணை அடிப்படையில் கொஞ்சம் கொஞ்சமாகக் கட்டுவதற்கான வசதியை ஏற்படுத்திக் கொடுப்பீர்களானால், எல்லோரும் மின்சார இணைப்பைப் பெறும் ஓர் அரிய வாய்ப்பைப் பெறுவார்கள் என்பது என்னுடைய ஆலோசனையாக இருக்கின்றது.

அடுத்து, இன்றைய விவாதத்துக்கு அப்பாற்பட்ட ஒரு விடயத்தை நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். மன்னாரில் உள்ள காற்றாலை சம்பந்தமான விடயத்தை எங்களுடைய குருமார், மன்னார் மறை மாவட்ட ஆயர் அவர்கள், துறவிகள் எல்லோரும் கையாளுகின்றபோது, ஏனையவர்கள் தூற்றுகிறார்கள்; அவர்கள் மதம் சம்பந்தமான விடயங்களை மட்டும் கவனிக்க வேண்டுமென்று சொல்கின்றார்கள். அதை என்னால் ஏற்றுக்கொள்ள முடியாது. எங்களுடைய கத்தோலிக்க சமய பழைய ஏற்பாட்டில், இஸ்ரேலிய மக்களைக் கானான் நாட்டுக்கு மோசே அழைத்துச் சென்றார் என்று சொல்லப்பட்டுள்ளது. எங்களுடைய ஆயர், குருக்கள், துறவிகள் அனைவரும் மக்களை, அவர்களுடைய இறையாண்மையை, அவர்களுடைய உரிமைகளைத் தட்டிக் கேட்பதற்கான, அவர்களை வல்லமையோடு வழிநடத்து வதற்கான தகுதியைக் கொண்டிருக்கின்றார்கள் என்பதை நான் இங்கே குறிப்பிட விரும்புகின்றேன். ஆகவே, எங்களுடைய குருக்கள், ஆயர்கள், துறவிகள், பங்குத் தந்தையர்கள் எல்லோரும் சமயத்தை மட்டும்தான் போதிக்க வேண்டுமென்று சொல்ல முயற்சிக்கின்றவர்களுக்கு, அவ்வாறு ஒருக்காலும் சொல்லத் துணியாதீர்கள் என்பதை நான் கூற விரும்புகின்றேன்.

இன்னுமோர் உதாரணத்தைச் சொல்கின்றேன்; போர் நடைபெற்ற வேளையில் தங்களுடைய இனத்தைப் பாதுகாப்பதற்காக மக்களை அழைத்துச் செல்கின்றபொழுது, தங்களுடைய உயிரைக்கூட தியாகம் செய்த வரலாறு எங்களுடைய கத்தோலிக்க மதத் துறவிகளுக்கு மட்டும்தான் இருக்கின்றது. ஆகவே, எங்களுடைய ஆயர் பெருந்தகை, எங்களுடைய பங்குத் தந்தையர்கள், கன்னியர்கள், துறவிகள் உட்பட அனைவரும் நியாயமான முறையில், இறை யாண்மையோடு கூடிய வகையில் மக்களைப் பிரச்சினை களிலிருந்து மீட்டெடுப்பதற்காக முன்னின்று உழைப்பதை யாரும் விரல் நீட்டிப் பேசக்கூடாது என்பதைச் சொல்லிக்கொண்டு, எமது இன விடுதலைப் போராட்டத்தில் மரித்த எங்களுடைய குருவானவர்களுக்கும் துறவிகளுக்கும் எனது அஞ்சலியைச் செலுத்தி, உரையை முடிக்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පත්මනාදන් සත්‍යලිංගම් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
Sir, my name was mentioned by the Hon. Adaikkalanathan. And, thank you very much for mentioning my name.

கௌரவ உறுப்பினர் அவர்கள் குறிப்பிட்டவாறு, மீளக்குடியேறிய மக்களுக்கு இந்தப் பிரச்சினை இருக்கின்றது என்பதை நான் மீள வலியுறுத்துவதோடு, தம்பி இளங்குமரன், தயவுசெய்து தமிழரசுக் கட்சியைப் பற்றி நீங்கள் கவலைப்பட வேண்டாம். கவலைப்படுவது உடல் நலத்துக்குக் கூடாது, ஆவி கெதியில் போய்விடும்! தமிழரசுக் கட்சியை நாங்கள் பார்த்துக் கொள்கின்றோம். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 3.12]

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ තිබෙන ඉතාම වැදගත් ක්ෂේත්‍රයක් වන බලශක්ති ක්ෂේත්‍රය පිළිබඳව තමයි අද දින අය වැය කාරක සභා අවස්ථාවේ විවාදය පවත්වනු ලබන්නේ. ඇත්තටම අපි හැමෝටම වැදගත් වෙනවා, අපේ රටේ බලශක්ති ක්ෂේත්‍රයේ දිශානතිය මොකක්ද කියන එක පැහැදිලි කර ගන්නා එක. මොකද, බලශක්ති ක්ෂේත්‍රයට අවුරුදු 76ක් තිස්සේ විශාල කාර්ය භාරයක් ඉටු කර තිබෙනවා කියලා අද උදේ ඉඳලාම විපක්ෂයේ මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළා. හැබැයි, මීට කලින් මේ පාර්ලිමේන්තුවේදීම ඒ මන්ත්‍රීවරුන් කිව්වා, අවුරුදු 76 ගැන කථා කරන්න එපා කියලා. එහෙම කියපු ඔවුන් අද දවස පුරාම අවුරුදු 76ක් ගැන කථා කරමින්, ඒගොල්ලන් තමයි මේවා කළේ කියලා ලොකු කථාවක් කළා. හැබැයි, ඒ අවුරුදු 76ක පාලන කාලයේ අවසාන ප්‍රතිඵලය විධියට රට බංකොලොත් වුණා. ඒ නිසා විවිධ ක්ෂේත්‍ර පවා බිඳ වැටීමකට ලක්වෙලා තිබෙන්නේ.

බලශක්ති ක්ෂේත්‍රය අද එක අමාත්‍යාංශයක් යටතට අරගෙන තිබෙනවා. මෙම අමාත්‍යාංශය යටතට විදුලි බලය සහ ඉන්ධන - petroleum - කියන ක්ෂේත්‍ර 2ම අයත් වෙනවා. නමුත් අද වැඩිපුර කථා වුණේ විදුලි බල ක්ෂේත්‍රය සම්බන්ධවයි. මූලික වශයෙන් ගත්තොත් බලශක්තිය සඳහා වැය කරන මුදල පාරිභෝගිකයාට දැරිය හැකි එකක් වෙන්න ඕනෑ. ඊළඟට, ස්ථාවර, තිරසර සහ ගුණාත්මක ලෙස ඒ බලශක්තිය ලබා දීම සිදු කළ යුතුයි. එක පැත්තකින් මෙය අපේ රටේ ආර්ථිකය එක්කත් බැඳී තිබෙනවා. ඒ වාගේම පොදුවේ ගත්තොත් මෙම ක්ෂේත්‍රය මහජන අවශ්‍යතා එක්කත් බැඳී තිබෙන එකක්. ඒ නිසා අපි ඉදිරියේදී මහජන කේන්ද්‍රීය බලශක්ති පරිවර්තනයකට සැලසුම් සකස් කරගෙන යන මොහොතක් තමයි මේ පවතින්නේ.

අපේ අරමුණ වන්නේ ඔය කියපු කාරණා දෙක ඉටු කර ගැනීම සඳහා මේ ක්ෂේත්‍රය අවශ්‍ය වෙනස්කම් සහිතව ඉස්සරහට අරගෙන යන එකයි. එතකොට ඒ ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපාර මාදිලි, තරගකාරිත්වය, කා එක්කද වැඩ කරන්නේ, මේ ආයතන ව්‍යුහ මොනවාද කියන අරමුණු පෙරදැරිව තමයි අපි මහජන කේන්ද්‍රීය බලශක්ති පද්ධතියක් සහ ක්ෂේත්‍රයක් නිර්මාණය කරන්නේ. නමුත්, රනිල්-කංචන කලින් ගෙනැල්ලා තිබුණු පනතේ ඇත්තටම මේ වෙන් කරන්න හදපු ආයතනවල රාජ්‍ය හිමිකාරිත්වය ගැන පැහැදිලි අදහසක්වත් තිබුණේ නැහැ. මූලික වශයෙන් ආයතන 12කට විතර වෙන් කරනවා කියලා තිබුණා. හැබැයි ඒවායේ රාජ්‍ය හිමිකාරිත්වය, එහෙම නැත්නම් බලශක්ති ස්වාධිපත්‍යය ගැන හරි අදහසක් තිබුණේ නැහැ. හරි පැටලිලිසහගත අදහසක් තමයි ඒ පනතේ තිබුණේ.

ඒක තමයි අපි වෙනස් කළේ. අපි හරියටම මේ ක්ෂේත්‍ර ටික වෙන් කරලා තිබෙනවා. අපි විදුලිබල ක්ෂේත්‍රය ජනනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම සහ පද්ධති පාලන ක්ෂේත්‍රය වශයෙන් මූලික ආයතන හතරකට unbundle කරලා තිබෙනවා. මම දැක්කා මන්ත්‍රීවරයෙක් කිව්වා, අපි unbundle කරන්න ගිහිල්ලා rebundle කරලා තිබෙනවා කියලා. Rebundle කරලා තිබෙනවා කියලා එතුමා කියන්නේ මං හිතන හැටියට technology පැත්තෙන්. Technology පැත්තෙන් rebundle කරනවා කිව්වාට වැඩක් නැහැ නේ. ආයතන ව්‍යුහයක් විධියට තමයි අපි මේ unbundle කරලා තිබෙන්නේ. Technology එක වෙනස් වෙන්න පුළුවන්. ගොඩක් වෙලාවට තාප බලාගාර, LNG වුණත්, දැවිතෙල් වුණත්, මොනවා වුණත් ඒක තාක්ෂණයක්. එතකොට ඒ ජනනය කරන සමාගමට විවිධ තාක්ෂණ, විවිධ ඉන්ධන පාවිච්චි කරන, විවිධ ප්‍රභව පාවිච්චි කරන ජනන බලාගාර අයිති වෙන්න පුළුවන්. ඒ නිසා ඒ අදහස මම ප්‍රතික්ෂේප කරනවා.

ඊළඟට අපි ආයෝජනය කරලා තිබෙන විධිය. දැන් සෑහෙන කාලයක් තිස්සේ මේ ක්ෂේත්‍රයට ආයෝජනය කළා කිව්වා නේ. හැබැයි, ඉතාම අසමාන විධියට තමයි විදුලිබල ජනනයටත්, සම්ප්‍රේෂණයටත්, බෙදා හැරීමටත් මෙතෙක් කල් ආයෝජනය කරලා තිබුණේ, අපි මේ රට, මේ ක්ෂේත්‍රය භාර ගන්නකොට. ජනනයට යම් කිසි විධියකට විශාල ප්‍රමාණයකින් ආයෝජන ඇවිල්ලා තිබුණාට, ඉදිරියේදී වැඩි වෙන අවශ්‍යතාව අනුව අපට තවත් ඉස්සරහට යන්න වෙනවා. ප්‍රමාණවත් මදි වෙනකොට. ජනනයට ආයෝජනය කරලා තිබෙන ප්‍රමාණයට සාපේක්ෂව ගත්තොත්, සම්ප්‍රේෂණයට ආයෝජනය කරලා තිබුණු මුදල ඉතාම අඩුයි. අපිත් කැමැතියි, ආණ්ඩුවේ මුදල්වලින්ම ආයෝජනය කරගෙන ඉස්සරහට යන්න පුළුවන් නම්. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ, අපට වෙනත් ව්‍යාපාර මාදිලියකට යන්න වෙලා තිබෙන්නේ රාජ්‍ය හිමිකාරිත්වය තියාගෙනමයි. දැනට පවතින තත්ත්වය අනුව සම්ප්‍රේෂණ පද්ධතිය දියුණු කරන්නේ නැතුව මේ කටයුත්ත සම්පූර්ණ වන්නේ නැහැ.

දැන් අපි solar power නිපදවනවා නම්, wind power නිපදවනවා නම්, ඒවා ගෙනියන්න ඕනෑ. නමුත් ඒ සඳහා අවශ්‍ය සම්ප්‍රේෂණ මාර්ග හරියට දියුණු කරලා නැහැ, මෙච්චර කල්. සම්ප්‍රේෂණ මාර්ග ප්‍රමාණවත් මදි. ඒ නිසා තමයි අපි පසුගිය අය වැයෙනුත්, මෙවර අය වැයෙනුත් සම්ප්‍රේෂණය සඳහා විශාල වශයෙන් අවධානය යොමු කර තිබෙන්නේ. මොකද, backbone එක හදන්න එපායැ. එහෙම නැතුව කොහේ හරි generate කළාට විතරක් බැහැ නේ. ඒක යවන්න ඕනෑ. යවන්න නම් හොඳ සම්ප්‍රේෂණ පද්ධතියක් තිබෙන්න ඕනෑ. හැබැයි අපේ රටට හරි බලශක්ති ප්‍රතිපත්තියක් තිබිලා නැහැ. විදුලිබල ක්ෂේත්‍රය ගත්තත්, ද්‍රව ඉන්ධන - petroleum - ගත්තත් එහෙමයි. ප්‍රතිපත්තියක් නැතුව මේ කටයුතු කරන්න බැහැ. විවිධ කාල වකවානුවල එක එක එකතු වෙලා හැදිච්ච පද්ධතියක් තිබෙනවා. හැබැයි අපි දැන් ඉන්න තැන අනුව අනිවාර්යයෙන්ම බලශක්ති ප්‍රතිපත්තියකට යන්න ඕනෑ. අපි ඒ සම්බන්ධ තීන්දුවක්, තීරණයක් අරගෙන තිබෙනවා.

[ගරු තනුර දිසානායක මහතා]

සම්ප්‍රේෂණය වාගේම තමයි බෙදා හැරීමත් ඉතාම වැදගත්. ගොඩක් දුෂ්කර ප්‍රදේශවලට සහ විවිධ ආයතනවලට, විවිධ කර්මාන්තවලට යම් ගැටලු තත්ත්ව මතුවෙලා තිබෙනවා, දීර්ඝ කාලයක් තිස්සේ බෙදා හැරීම ගැන දක්වලා තිබෙන අඩු සැලකිල්ල නිසා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙන්නේ, හරි ක්‍රමයක් යටතේ ආයෝජන කැඳවාගෙන බෙදා හැරීම වර්ධනය කර ගන්නයි. මොකද, බෙදා හැරීම තමයි end userට බලපාන්නේ. පාරිභෝගිකයා අතට quality service එකක්, ස්ථාවර, තිරසර, ඒ ගොල්ලන්ගේ වැඩ කටයුතු කරගෙන යන්න පුළුවන් විධියේ සේවාවක් ලැබෙන්න ඕනෑ. අපි දන්නවා, විශේෂයෙන්ම ග්‍රාමීය සහ දුෂ්කර පළාත්වල ටිකක් හවස වෙලාව ගත්තොත් විදුලිබලයේ ස්ථාවරභාවය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ quality එක පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා; බලය මදි ප්‍රශ්නයක් තිබෙනවා. ඒවා විසඳන්න ඕනෑ ප්‍රශ්න. ඒවාට සැලසුම් හදන්න ඕනෑ.

ඒ නිසා මෙන්න මේ කාරණා පදනම් කරගෙන තමයි කටයුතු කරන්න ඕනෑ. දැන් තිබෙන system එක වෙනම එකක්. එතකොට මේ system එක වෙනස් කරගෙන යන්න තමයි අපි මේ ආයෝජනවලට අදාළ සහ සියලු ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. ඒවාට සමහර පැතිවලින් ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගන්න ඕනෑ වෙන්න පුළුවන්. සමහර වෙලාවට ආයෝජන ගෙන එන්න වෙන්න පුළුවන්. සමහර වෙලාවට කළමනාකරණ තීන්දු තීරණ ගන්න වෙන්න පුළුවන්. අන්න ඒ විධියට නිසි සැලැස්මක් එක්ක යන එක තමයි අපි ආණ්ඩුවක් විධියට මේ ක්ෂේත්‍රයේ කරලා තිබෙන මූලිකම වෙනස්කම. එහෙම කරන්නේ නැතුව කොයි තරම් දුරට තැන් තැන්වල විවිධ බලාගාර හැදුවත්, අපේ රටේ renewable energyවලට අපි ගියත් මේ ප්‍රශ්නය විසඳන්න හම්බ වෙන්නේ නැහැ. අපේ එක මූලික අරමුණ වෙලා තිබෙන්නේ, විදුලි මිල අඩු කරන එක.

හැබැයි, මන්ත්‍රීතුමන්ලා කිව්වා, අපි solar powerවලට ඊට කලින් දීලා තිබුණු unit price එක රුපියල් 37 ඉඳලා අඩු කළා. ඒත් එක්කම, ඒ පැත්තෙන්ම ආයෙත් කියනවා, පාරිභෝගිකයන්ගේ මිල අඩු කරන්න කියලා. මොකක් හරි සූත්‍රයක් තිබෙනවාද දන්නේ නැහැ, වැඩි මිලට අරගෙන අඩු මිලට විකුණන විධියේ. ඒක තමයි ඒගොල්ලන් කරපු විධිය. ඒ කරපු විධිය නිසා තමයි අවසානයේදී ජනතාවට සහ මේ ආයතනවලට පීඩාව ආවේ. අපි ඉන්න ඕනෑ මූලධර්මය මේකයි. මේ ආයතන පාඩු නොවන විධියට ජනනය කරන්න ඕනෑ, සම්ප්‍රේෂණය කරන්න ඕනෑ, බෙදා හරින්න ඕනෑ. ඒ සඳහා නිසි ව්‍යාපාර මාදිලියක් එක්ක මේ ක්‍රියාවලිය හරි ප්‍රතිපත්තියක් එක්ක ඉස්සරහට යන්න ඕනෑ.

හැබැයි, මීට කලින් මොකද කළේ? විවිධ ආකර්ෂණ ගන්න - ඡන්ද ළං වනකොට, විවිධ දේවල්වලට- ඉතාම අදූරදර්ශී විධියට මේ මිල ගණන් වෙනස් කරලා ඒවායේ පීඩනය දැම්මේ ඒ ආයතනවලට. ඒ ආයතනවලට පීඩනය දැම්මාට පස්සේ අධික ණය බරවලට ඒ ආයතන යට වුණා. ඒ නිසා තමයි ආයෝජනය කර ගන්න බැරි තත්ත්වයට පසුගිය කාලයේ පත් වුණේ. නමුත්, අපි මේ තත්ත්වය වෙනස් කරලා තිබෙනවා. අපි යන්න ඕනෑ අලුත් ක්‍රමයකට, අලුත් ප්‍රතිපත්තියකට. ඒ වාගේම renewable energy පැත්තට. හැබැයි, අපි සහන සැලසිය යුතු ක්ෂේත්‍ර දිහා බලන්න ඕනෑ. අපි ධීවරයන්ට ඉන්ධන සහනාධාරයක් දෙනවා නේ. ඒ වාගේ විවිධ කර්මාන්තවලටත් විවිධ සහන ලබා දෙනවා. අපි සහන සැලසිය යුතු ක්ෂේත්‍රවලට භාණ්ඩාගාරයෙන් සහන සලසන්න ඕනෑ. හැබැයි, මේ ක්ෂේත්‍රය බිඳ වට්ටන්න හොඳ නැහැ. මේ ක්ෂේත්‍රය බිඳ වැට්ටුවොත්, මේ ආයතන බිඳ වට්ටන තැනට අපි තීන්දු තීරණ ගත්තොත්, ඉස්සරහට මේ කටයුතු තිරසර ලෙස කරගෙන යන්න බැරි වෙනවා. මෙතෙක් කල් වෙලා තිබුණු අවුල්වලින් එකක් තමයි ඒක. සමස්තයක් විධියට වැරදි විධියට මේවා කළමනාකරණය කර තිබුණා. ඒකයි අපි කියන්නේ දේශපාලනීකරණයෙන් තොරව, දේශපාලන අරමුණුවලින් තොරව බලශක්තිය ගැන හිතන්න ඕනෑ කියලා. මීට කලින් ඒ ඔක්කොම එකට mix කරගෙන තමයි කටයුතු කරගෙන ගියේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම ගත්තොත් අපේ මූලිකම දේ තමයි, ඉදිරි කාල සීමාව තුළ අපි සැලසුම් සකස් කර තිබෙන්නේ renewable energy generate කරන්න. ඒ වාගේම ඒවා බැටරි පද්ධතිවල ගබඩා කරන්න. ඒ හරහා අපට ඒවා නැවත භාවිත කිරීම. ඒ සඳහා හයිඩ්‍රජන් නිෂ්පාදනය හෝ වෙන යම් නවීන තාක්ෂණික පැත්තකට යන්න පුළුවන්. මම හිතන්නේ අපි කරලා තිබෙන ලොකුම දේ තමයි, බලශක්ති ක්ෂේත්‍රය නිසි ලෙස සැලසුම් කරලා, සැලසුමක් ඇතිව, ප්‍රතිපත්තියක් ඇතිව ඉස්සරහට යන්න පුළුවන් තැනට ගෙනැල්ලා තිබෙන එක. මේ හරහා තමයි අපේ රටේ ජනතාවට විදුලි මිලත් අඩු කරලා තිරසර සහ ස්ථාවර service එකක් දෙන්න පුළුවන් වෙන්නේ. අපේ බලශක්ති ඇමතිවරයා, නියෝජ්‍ය ඇමතිවරයා ඇතුළු ඒ වෙනුවෙන් වැඩ කරන ආයතනවල සියලුදෙනාට මා ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
විනාඩි 14ක් නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 13යි.

[අ.භා. 3.22]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you. මම stopwatch එක දාන්නම්. නැත්නම්, විශ්වාස කරන්න බැහැ නේ. දැන් stopwatch එක දානවා.

வணக்கம்! இது கார்த்திகை மாதம். ஆகவே, மனதின் ஒரு சில வலிகளைத் தமிழிலே சொல்ல ஆசைப்படுகின்றேன். இந்தத் தேசிய மக்கள் சக்தி அரசாங்கம் குறைந்தது இந்த மாதத்திலே எமது அரசியல் கைதிகளையாவது விடுவிக்கு மென்று ஆசைப்பட்டோம். ஆனந்தசுதாகரன் அண்ணா வினுடைய மாமியார் இன்றைய தினம் மரணமாகி யிருக்கின்றார்; குழந்தைகள் பராமரிப்பதற்கு யாருமில்லாமல்

தவிக்கின்றனர். ஆகவே, இருகரம் கூப்பி உங்களுடைய மனசுக்கு ஓர் அன்பான வேண்டுகோள் விடுக்கின்றேன். முடிந்தால் இந்த அரசியல் கைதிகளை விடுவியுங்கள்! இதைச் சொல்லிக்கொண்டு, இன்றைய தினம் நடைபெறுகின்ற வலுசக்தி அமைச்சின் நிதியொதுக்கீடு மீதான குழுநிலை விவாதத்திற்கு நேரடியாக வருகின்றேன்.

இங்கு நான் முதலில் ஓர் ஊழல் சம்பந்தமான document ஒன்றைச் ***சமர்ப்பிக்கிறேன்**.

இது ஒன்று - இரண்டு - மூன்றாவது அல்ல, நான் சமர்ப்பிக்கும் ஆறாவது document. இது ஒரு மாபெரும் ஊழல்! இதன்மூலம், போரால் பாதிக்கப்பட்டு, 30 வருட காலமாக அழிந்த எங்களுடைய இனத்தை, மறுபடியும் 16 வருடமாகச் சில கட்சிகள் செத்தவனுடைய உடம்பில் இருக்கின்ற எலும்பையும் தோண்டி, அந்த எலும்பில் இருக்கின்ற குருதி மச்சையையும் தோண்டுவதுபோல் தோண்டிக் கொண்டிருக்கின்றனர். அதுபற்றிய இந்த ஆவணத்தை மிகப் பெரிய வலியோடு நான் சமர்ப்பிக்க விரும்புகின்றேன்.

பூநகரி என்பது உங்களுக்குத் தெரியும், 'பூநகரி அடிபாடு', 'பூநகரித் தளம்' என்று அடிக்கடி பேசப்பட்ட, போரிலே அழிந்த ஓர் இடம் என்பது. அந்த இடத்திலே 2024ஆம் ஆண்டு solar power energy என்ற வகையில் ரணில் விக்கிரமசிங்ஹ அரசாங்கத்திலே ஒரு திட்டத்தைக் கொண்டுவந்தார்கள். அதற்கு ஒப்பந்தம் செய்யப்பட்ட Solar power energy சம்பந்தமான Sunpower Systems (Pvt.) Limited என்று சொல்லப்படுகின்ற அந்த நிறுவனம் இந்தியாவினுடைய, இலங்கையைச் சேர்ந்த கம்பனியாகும். அதில், Mr. S.M. Jayantha B. Samarakoon, Chairman; Mr. C. Jayaranjan, Director and Mr. S. Selvarajah, Director. 2024ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் 18ஆந் திகதி செய்யப்பட்ட இந்த ஒப்பந்தம் காலாவதியாகிப் போய்விட்டது. அதற்குப் பிறகு, வடக்கு மாகாணத்தில் உள்ள ஆகக் குறைந்த வருமானம் பெறுகின்ற, அங்கிருக்கின்ற மக்கள் வாழ்வாதாரம் இல்லாமல் மிகவும் வறுமையில் வாழ்ந்துகொண்டிருக்கின்ற ஒரு மாவட்டமான கிளிநொச்சி மாவட்டத்தில் இருக்கின்ற எங்களுடைய வடக்கு மாகாணத்தினுடைய ஜமீன்தார் - 11 bar permit வாங்கிய இந்த 'பார்' அவர்கள் - மறுபடியும் இந்தியாவுக்குப் போய் இந்த agreementஐச் செய்திருக்கிறார். எனக்கு மிகவும் வெட்கமாக இருக்கின்றது! முழுக் கள்வர் முன்னாலே பார்த்துக் கொண்டிருக்கிறார்கள்! இவர்கள் முட்டையை விழுங்கி னார்களோ, மாறிச் சொன்னால் பிறகு அதை பாராளுமன்ற அறிக்கையிலிருந்து நீக்கிவிடுவீர்கள், ஆகவே, அதைச் சொல்லாமல் 'அதை' விழுங்கினார்களோ என்னவோ தெரியாது; முழுசிக்கொண்டே இருக்கிறார்கள். இதுதான் அந்த document - agreement. இந்த Sunpower Systems (Pvt.) Limited என்ற கம்பனி EPF, ETF ஐ pay பண்ணாததால் உயர் நீதிமன்றத்தில் வழக்குத் தாக்கல் செய்யப்பட்டு, வருடத்திற்கு 5 மில்லியன் pay பண்ண வேண்டுமென்று தீர்ப்பு வழங்கப்பட்டுள்ளது. உடனடியாக அதே மூன்றுபேரும் போய் திரும்ப United Solar Energy SL (Pvt.) Limited என்ற வேறொரு கம்பனியை ஆரம்பித்திருக்கிறார்கள். அந்தக் கம்பனிக்குத் திரும்ப அதே ஒப்பந்தத்தைக் கொடுத்திருக்கிறார்கள்.

முல்லைத்தீவு, கிளிநொச்சி, பூநகரியில் வாழுகின்ற மக்கள் electricity எடுக்கிறதென்றால் மாபெரும் கஷ்டம்! யாராவது புலம்பெயர் நாட்டிலிருந்து வந்த ஒருவர் வீட்டுக்கு solar energyஐ எடுக்கிறதென்றால் மாபெரும் கஷ்டம்! ஆனால், 1,200 ஏக்கர் காணியை மொத்தமாக 70 மில்லியன் ரூபாய் கையூட்டல் வாங்கியிருக்கின்றார் இந்த ஜமீன்தார். அவருடைய பெயருக்கு 40 மில்லியன் ரூபாய், அவருடைய மகனுடைய பெயருக்கு 30 மில்லியன் ரூபாய்! அவருடைய மகன் யாரென்றால், Jaffna Hindu Collegeஇல் சாரங்கன் என்று சொல்லப்படுகின்ற ஒரு விளையாட்டு வீரர். அவருடைய accountக்கும் அண்மைய தினத்தில் இந்தியாவிலிருந்து வைப்பிலிடப்பட்டிருக்கின்றது. அதற்குரிய ஆதாரங்களையும் வழங்குவேன். இந்த விடயம் எனக்கு வெட்கமாகவும் கவலையாகவும் இருக்கின்றது. ஏனென்றால், அந்தக் கிளிநொச்சிச் சனம் பாவம்!

நானும் கிளிநொச்சியில் இருந்திருக்கின்றேன். உருத்திர புரமா, உடையார்கட்டா, முள்ளிவாய்க்காலா, அக்கராயனா, சகல இடத்திலும் வெறும் காலுடன் நான் பாடசாலைக்குப் போயிருக்கிறேன். அவர் சார்ந்த கட்சியின் 8 பாராளுமன்ற உறுப்பினர்கள் இங்கே இருக்கிறார்கள். நான் அவர்களிடமே கேட்டேன், "அண்ணை! மனச்சாட்சி இருந்தால் உண்மையைச் சொல்லுங்கோ, இந்த documentஐ பாராளுமன்றத்தில் சமர்ப்பிக்காமல் விடுகிறேன்" என்று. அவர்கள் சொன்ன பதில், "தம்பி! அந்த ஊழல் உண்மையாக இருந்தால் ராசா அதை அரசாங்கம் தேடிக் கண்டுபிடிக்கட்டும், நீ அதனைச் சபையில் வை" என்று. இந்த documentஐ நான் முன்வைக்கிறேன். ஆனால், அந்த மக்கள் உட்பட எல்லோரும் இந்த ஊழல் பிடிபடும் என்று நினைத்தால் - தம்பி! உங்களுக்கும்தான் நான் இதைச் சொல்கிறேன், நாங்கள் யாருக்கும் support இல்லை; யார் என்றாலும் நாங்கள் உண்மையின் பக்கம் நிற்போம்! முட்டையைத் தின்றவர் கத்தத் தேவையில்லை - உங்களுடைய அரசாங்கம் ராசா, ஒருநாளுமே இந்தப் பிட்டு விற்கிறவருக்கும், வாழைப்பழம் விற்கிறவருக்கும் கத்தரிக்காய் விற்கிறவருக்கும் எதிராகச் சட்ட நடவடிக்கை எடுக்காது. நீங்கள் வேண்டு மென்றால் இருந்து பாருங்கள், உங்களுடைய அரசாங்கம் நடவடிக்கை எடுக்காது ராசா! ஏனென்றால், அண்மையில் அந்தக் கட்சி மாண்புமிகு சனாதிபதி அவர்களோடு கதைத்துவிட்டு வந்திருக்கின்றது. இப்பொழுது இந்த barகாரன் "ஜனாதிபதி மாதிரி நல்லவர் இந்த உலகத்திலேயே இல்லை" என்று சொல்ல ஆரம்பித்திருக்கிறார். ஆகவே, இந்த ஆதாரங்களைச் சமர்ப்பித்ததன் பிறகும் உச்ச நீதிமன்றத்தில் நியாயம் கிடைக்கும்வகையில் நீங்கள் நடந்து கொள்ளவில்லையென்றால், நான் ஒன்றும் செய்ய இயலாது.

அடுத்து, நான் முஸ்லிம் சமூகம் சம்பந்தமாக இரண்டு விடயங்கள் கதைக்க வேண்டும். ஆதம்பாவா என்ற ஓர் உறுப்பினர் - அவர் இங்கே இருந்தால், முதுகெலும்பு இருந்தால் பதில் சொல்லட்டும்! - "இந்த road அரசாங்கம்தான் போடும். இல்லாவிட்டால் போடப்பட மாட்டாது" என்று சொல்லியிருக்கிறார்.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

அரசாங்கம் இயங்குவது சனங்களின் காசில். சனங்களின் காசை எடுத்து சனத்துக்கே செலவு செய்வதற்கு, எவ்வாறு அவர் சொல்ல இயலும் road போடமாட்டோமென்று. இது தொடர்பில் video வெளிவந்திருக்கின்றது.

அடுத்து, புத்தளம் வைத்தியசாலை தொடர்பாக ஒரு விடயம் மாத்திரம் சொல்கிறேன். அந்த வைத்தியசாலையை

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු රාමනාදන් අර්ච්චුනා මහතා]

District General Hospital ஆக இல்லாவிட்டாலும், ஒரு Teaching Hospitalஆகவாவது தரம் உயர்த்த வேண்டும் என்பதுதான் என்னுடைய ஆசை. ஆனால், நீங்கள் முட்டாள்தனமான, பொய்யான வாக்குறுதிகளை வழங்க வேண்டாம். நான் இதுபற்றி 27(2)இன்கீழ் சுகாதார அமைச்சரிடம் கேள்வி கேட்பதற்கு அனுமதி கேட்டிருக்கிறேன். அவர் பதில் சொல்லும்போது நீங்கள் அறியலாம்.

சரி, அடுத்த விடயத்துக்கு வருகிறேன். இப்போது செம்மறி ஒன்று கதைத்தது. சில நேரங்களில் சில செம்மறிகளைப் பார்க்கும்போது பாவமாக இருக்கின்றது. அவர்களுடைய அறிவு அவ்வளவுதான்! அந்தச் செம்மறியுடைய அறிவு அவ்வளவுதான்! அதற்கு நான்கு வசனங்கள் சொல்ல வேண்டுமென நான் ஆசைப்படவில்லை. இந்த documents எல்லாவற்றையும் யார் எனக்குத் தந்தாரோ, யார் இதை வைத்து barக்கு அடி என்று சொன்னாரோ, அவரே செம்மறிக்கு எதிராக வழக்குப் போட்டிருக்கிறார். ஆகவே, இந்த செம்மறிக் கூட்டத்தின் அடிபாட்டுக்குள் நான் வர விரும்பவில்லை. எனக்கு இந்த documentsஐத் தந்து, bar காரருக்கு அடிக்கச்சொல்லிச் சொன்னதே - மன்னிக்க வேண்டும், தம்பி செம்மறியோ, தங்கச்சி செம்மறியோ தெரியாது; நான் திறந்து பார்க்கவில்லை - தம்பி செம்மறிக்கு எதிராக வழக்குப் போட்டவர்தான். இத்தோடு எனது தமிழ் உரையை முடித்துக் கொள்கிறேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කැමැතියි, පොඩ්ඩක් සිංහලෙන් කථා කරන්න. ජනාධිපතිතුමා ඇවිල්ලා මෙතැන කිව්වා, වංචා, දූෂණ තිබෙනවා නම්, කියන්න කියලා. මම දන්නේ නැහැ, එතුමාගේ වචන. මට එච්චර සිංහල බැහැ. වරෙල්ලා, වරෙල්ලා, මගේ office එකට වරෙල්ලා කිව්වා. මම දැන් හය පාරක් ගිහිල්ලා තිබෙනවා. එක පාරක් නොවෙයි, හය පාරක් ගිහිල්ලා තිබෙනවා, office එකට. මගේ ළඟ මේ තිබෙන්නේ ඒ documents ටික. Hospitalsවල වංචා, දූෂණ පිළිබඳ documents මා ළඟ තිබෙනවා. මේක හයවන document එක.

එතුමා මෙතැනට ඇවිල්ලා කථා කරනකොට මටත් නින්ද යනවා, හැමෝටම නින්ද යනවා. ඒක වෙනම කථාවක්. හැබැයි, එතුමාට පොඩ්ඩක් ඒ වීඩියෝ එක බලන්න කියන්න. මම මේ කියන එක බොරු නම්, එතුමා ඇවිල්ලා මට කෙළින්ම කිව්වොත්, මම පාර්ලිමේන්තුවෙන් එළියට යන්නම්. මම එතුමාට කියන්නේ නැහැ, ජනාධිපති ධුරයෙන් අයින් වෙන්න කියලා. ජීවිත කාලය පුරා දේශපාලනයෙන් අයින් වෙන්න එතුමා කැමැති නැතුව ඇති. එහෙම ඉන්න ඕනෑ කියලා හිතනවා ඇති. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක හයවන document එක. ඔබතුමන්ලා හිතන්න එපා, මම ඇවිල්ලා මේ ටික කියන්නේ ඇමතිතුමන්ලාට විරුද්ධව කියලා. එහෙම නොවෙයි. ඔබතුමන්ලා යම්කිසි බොරුවක් ආයේ ආයේ කියනවා. ඔය පාපිස්සෝ ටික ගහලා පොඩ්ඩක් සවුත්තු වනකොට, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ලොක්කා ඇවිල්ලා එකපාරටම හෝද්දලා දානවා. ඒක අහගෙන ඉන්නකොට මටත් හිතෙනවා, අප්පට සිරි, මමත් JVP එකට ගියා නම් හොඳයි කියලා. හැබැයි, හෙට උදේ ගිහිල්ලා බලනකොට ඒක සම්පූර්ණයෙන්ම බොරු කථාවක්.

මම මේ ඉල්ලීම කරන්නේ ජනාධිපතිතුමාගෙන්. ජනාධිපතිතුමනි, ඔබතුමාව තවම අපේ රටේ මිනිස්සු එළවලා නැහැ. මේ documentsවල තිබෙනවා, ඔබතුමන්ලාගේ ඇමති කෙනෙක් රුපියල් මිලියන 40ක් අරගෙන තිබෙනවා කියලා. එහි total project cost එක US Dollars 20 million වනවා. ඒකෙන් 10 per cent එතුමාට ගියා කියලා සමහරු කියනවා. මම කියන්නේ නැහැ. හැබැයි ඔයගොල්ලෝ කිව්වා, "අපි capitalistsලා නොවෙයි, අපි communistsලා" කියලා. අන්තිමට බලනකොට රවී කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ හිටපු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා අත්සන් කළ ඒ agreement එකම අත්සන් කර තිබෙනවා. ඒ company එක වහලා, ඒ අයම දාලා company එකේ නම වෙනස් කරලා පටන් අරගෙන තිබෙනවා. මම නමත් එක්කම කියන්නම්. ඒ තමයි, Mr. S.M. Jayantha B. Samarakoon as the Chairman, Sunpower Systems (Pvt.) Limited. Mr. C. Jayaranjan කියන්නේ, "බාර් ශ්‍රී" මන්ත්‍රීතුමාගේ හොඳ යාළුවා.

මම තව කාරණයක් කියන්නම්. ඒ හොර වැඩ ඔක්කෝම ටික හැදුවේ මනිවන්නන් කියන පුද්ගලයා. මට ඒකත් කියන්න ඕනෑ. අර rocket එකක් යැව්වා නේ, ඒ rocket එකේ සිද්ධිය පිටුපස හිටියේත් ඒ මනිවන්නන් කියන පුද්ගලයා. පුළුවන් නම් හොයන්න. ඔබතුමන්ලාගේ CID එක තිබෙනවා නේ. ඒ මනිවන්නන් කියන පුද්ගලයාව තමයි rocket එක සම්බන්ධව අත්අඩංගුවට ගත්තේ. ඊට පස්සේ ඔහු එළියට දැම්මා, ඔහුට එරෙහිව කිසි නඩුවක් නැහැ. ඔහු සල්ලි හම්බ කරගෙන ඊළඟට හදලා තිබෙනවා, United Solar Energy කියලා වෙන company එකක්. ඒකට දීලා තිබෙනවා, මේ project එක. ඒක US Dollars බිලියන ගණනක project එකක්. එම project එකට ඔබතුමන්ලා විරුද්ධ වෙලා පාරේ උද්ඝෝෂණ කළා. හොරු, හොරු කිව්වා. රනිල්ටත් කිව්වා. මමත් කියන්නම්, හොරු කියලා. හැබැයි, ඒ හොර වැඩේම ආයේ ඔයගොල්ලොත් කරනවා නේ.

ඊළඟට, තව එකක් කියන්න ඕනෑ. ජනාධිපතිතුමා ඇවිල්ලා එදා මෙහෙම කථාවක් කිව්වා. "කාටවත් මේ රටේ ජාතිවාදය අවුස්සන්න දෙන්නේ නැහැ" කියලා. මගේ මුහුණ බලලා කිව්වාද කියලා මම පොඩ්ඩක් හය වුණා. හැබැයි, මම කියන්නේ ඔක්කෝටම කලින් ජනාධිපතිතුමා දැනගන්න ඕනෑ එතුමා බෞද්ධ කියලා. ජනාධිපතිතුමා දැනගන්න ඕනෑ, එතුමා සිංහල කියලා. එතුමන්ලාගේ මන්ත්‍රීවරුන් ගිහිල්ලා පාරේ කියනවා, පිළිම වන්දනාව ගෝත්‍රික වැඩක් කියලා. එහෙම නම් ඒ අය බෞද්ධ වෙන්න බැහැ. එතුමා තමයි අපට කියන්න ඕනෑ එතුමන්ලා බෞද්ධද, නැද්ද කියලා. මගේ birth certificate එකේ ලියලා තිබෙන්නේ, "දෙමළ- හින්දු" කියලා. ආයේ පාරක් කියන්නම්, දෙමළ-හින්දු. හැබැයි, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා වාගේ අයට මම ආදරෙයි. ඒගොල්ලෝ හොඳටම දන්නවා, කථා කරන්න පුළුවන්, අඩියක් ගහන්න පුළුවන් උතුරේ ඉන්න එකම මන්ත්‍රීවරයා මම කියලා. මට විතරයි කථා කරන්නේ. මම කෙළින්ම කියනවා, මම දෙමළ-හින්දු පුද්ගලයෙක් කියලා. මට කවදාවත් සිංහල-බෞද්ධයෙක් වෙන්න බැහැ. තමුන්නාන්සේලා මට කියන්න, ඇත්තටම ඔබතුමන්ලා සිංහල-බෞද්ධද, නැද්ද කියලා. මට ඒක කියන්න. ඔබතුමන්ලා සිංහල- බෞද්ධ නොවෙයි නම් කවුරු හරි අත උස්සලා කියන්න, "අපි සිංහල-බෞද්ධ නොවෙයි" කියලා, ඔයගොල්ලෝ මොකක් හරි නමක් කියා ගන්න. "පාපිස්සෝ" කියලා හරි කියාගන්න. මේ සභාව ඇතුළේ සිංහල-බෞද්ධ කවුරු හරි ඉන්නවාද? මට කියන්න, සිංහල-බෞද්ධ කවුරු හරි ඉන්නවාද කියලා. මට guts තිබෙනවා, මම දෙමළ-හින්දු කියලා, ඇවිල්ලා ඔයගොල්ලොත් එක්ක අඩියක් ගහන්න. හැබැයි, ඔයගොල්ලන්ට තමන් සිංහල කියලා මතකත් නැහැ, බෞද්ධ කියලා මතකත් නැහැ. කිසි දෙයක් මතක නැහැ. දැන් ආණ්ඩුවට ආවාට පස්සේ පට්ටපල් බොරු කියනවා. ඇයි, එහෙම කරන්නේ?

සාමාන්‍යයෙන් කොණ්ඩය තිබෙන මිනිස්සු නේ, සැලූන් එකකට යන්නේ. මේ ඉස්සරහ ඉන්නවා, එක්කෙනෙක්. කොණ්ඩේ නැහැ. කොණ්ඩේ නැති නිසා ඒ කෙනාට දැන් සැලූන්

තිබෙන්නේ කොහේද කියලා හොයා ගන්න බැහැ නේ. එතුමා ඇවිල්ලා ප්‍රකාශ කළා, උතුරේ හමුදාවෙන් කරන සැලූන් එකයි තිබෙන්නේ කියලා. හමුදාව දාපු සැලූන් එකයි ලු තිබෙන්නේ. මම අභියෝග කරනවා. සැලූන් 14ක නම් මං ළඟ තිබෙනවා. ඒ 14ම මම කියන්නම්. මෙය බොරුවක් නම් මම යනවා, පාර්ලිමේන්තුවෙන් එළියට. හැබැයි, එතුමා කියපු එක බොරු නම්, එතුමාගේ බිරිඳත් අරගෙන පාර්ලිමේන්තුවෙන් එළියට යන්න කියන්න. ඒක තමයි අභියෝගය. KKS එකේ තොන්ඩමන්නාරු පාරේ එකක් තිබෙනවා. Vavunya Pampaimadu Camp එක ඉස්සරහ තව එකක් තිබෙනවා. Vavuniya Prison එක ඉස්සරහ තව එකක් තිබෙනවා. ඊළඟට, Iraperiyakulam Camp එක ඉස්සරහ තව එකක් තිබෙනවා. Paruthithurai Camp එක ඉස්සරහ තව එකක් තිබෙනවා. Kilinochchi Viswamadu - Punnaineeraviවල තව එකක් තිබෙනවා. Akkarayankulam STF Camp එක ඉස්සරහ තව එකක් තිබෙනවා.

අපි කියන්නේ නැහැ, ඒක වැරදියි කියලා. හැබැයි, වෙලා තිබෙන්නේ මොකක්ද? සාමාන්‍යයෙන් කොණ්ඩේ කපන්න මම කලින් කිව්ව කෙනාට යන්න ඕනෑ නැහැ නේ. මේ පැත්තේ ඉන්න සමහර අයට කොණ්ඩයක් නැති නිසා සැලූන් එකකට යන්නේ නැතිව ඇති. සාමාන්‍යයෙන් මිනිස්සු මාසයකට, එකහමාරකට වතාවක් තමයි සැලූන් එකකට යන්නේ. එතැන ඉන්නේ 200යි, 300යි. Army camp එකෙන් ගිහිල්ලා මේ සැලූන් දමා ගත්තා නම් කොහොම ද එතැන ඉන්න මිනිස්සු වැඩ කරන්නේ? මේක පට්ටපල් බොරුවක්. මම අභියෝගයක් කරනවා. සැලූන්14ක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා බොරු කියන්න පුළුවන්ද? ඒ වාගේ බොරු කියපුවා ගැන මට කියන්න තව ගොඩක් විස්තර තිබෙනවා.

මම තව කාරණයක් කියන්න ඕනෑ. බෙන්ස් එකක් ගෙනාවා ලු, Chairman කෙනෙකුට. ඒ, රුපියල් මිලියන 80ක. අනේ, ලජ්ජා වෙන්න. තමුන්නාන්සේලා බත් කනවා නම්, තමුන්නාන්සේලා සිංහල-බෞද්ධ නම් මෙහෙම බොරු කියන්න එපා. ඔයගොල්ලන්ට ඡන්දය දුන් මිනිස්සු ඔක්කෝම පාරේ හිඟා කනවා. පුළුවන් නම් මාතරට ගිහිල්ලා බලන්න, පොළොන්නරුවට ගිහිල්ලා බලන්න. ඒ මිනිස්සු තවම ත්‍රීවීල් එළවනවා. ඔයගොල්ලන් ඒ ත්‍රීවීල්වලත් කෑලි ගැලෙව්වා. අන්තිමට ඔයගොල්ලන් ගෙනාවේ බෙන්ස් එකක්. ඔයගොල්ලන් කිව්වේ, නිර්ධන පන්තිය නියෝජනය කරනවා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
තත්පර 20ක් දෙන්න and I will wind up.

නිර්ධන පන්තිය නියෝජනය කරනවා කිව්වාට, ඔයගොල්ලන්ගේ වත්කම් බැරකම් බලන්න. ඔයගොල්ලන්ට ලජ්ජා නැද්ද? තමුන්නාන්සේලා trouser එකක් අඳින්නේ නැතුව underwear එකත් එක්ක මේ පාර්ලිමේන්තුවට එන්න.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇන්ටන් ජයකොඩි නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.34]

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ සාකච්ඡාව තමයි සිදු කරන්නේ. විදුලිබල ක්ෂේත්‍රය පැත්තෙන් ගත්තොත් මම හිතනවා, අපේ රටේ විදුලිය ජනනය කරන ආකාරය පිළිබඳව පොඩි අවබෝධයක් සමඟම සාකච්ඡාවට පිවිසුණොත් හොඳයි කියලා.

අපි දන්නවා, විද්‍යුත් චුම්භක ප්‍රේරණය තුළින් විදුලි බලය උපදවනවා, turbines හරහා ඒ චාලක ශක්තිය විද්‍යුත් ශක්තිය බවට පරිවර්තනය කරනවා කියලා. මෙන්න මේ චාලක ශක්තිය උත්පාදනය කිරීම සඳහා ගුරුත්වය යටතේ චලනය වන ජලය අපි පාවිච්චි කරනවා, ඒ වාගේම සුළංවල තිබෙන චාලක ශක්තිය අපි භාවිත කරනවා, ඒ වාගේම රත් කරලා හුමාලයෙන් ගන්නා චාලක ශක්තිය අපි භාවිත කරනවා, විශේෂයෙන්ම hydrocarbon භාවිත කරලා. විශාල වශයෙන් මේ හුමාලය භාවිත කරලා එහි චාලක ශක්තිය විද්‍යුත් ශක්තිය බවට අපි පරිවර්තනය කරනවා. ඒ වාගේම අපි න්‍යෂ්ටික ශක්තියත් භාවිත කරනවා. දැන් ලෝකයේ අලුත්ම ප්‍රවණතාව hydrogen දහනයෙන් තාපය ලබාගෙන එහි ජල වාෂ්පවල චාලක ශක්තිය විද්‍යුත් ශක්තිය බවට පරිවර්තනය කිරීම. ඒ වාගේම ප්‍රකාශ විද්‍යුත් ආවරණය, ඒ කියන්නේ semiconductors හරහා සූර්ය ශක්තිය විද්‍යුත් ශක්තිය බවට පරිවර්තනය කර ගැනීම. ඊට අමතරව විද්‍යුත් රසායනික ප්‍රතික්‍රියා මඟින්, බැටරි මඟින් විදුලිය ලබා ගැනීමත් සිදු කරනවා.

අපේ රටේ මෙන්න මේ විදුලි උත්පාදනය සඳහා තිබෙන ප්‍රභව මොනවාද? විදුලි උත්පාදනය සඳහා ප්‍රධානම ප්‍රභවයක් ලෙස අපි රටක් විධියට මේ දක්වාම විශ්වාස කරලා තිබෙන්නේ ජල විදුලිය පිළිබඳවයි. ජල විදුලිය සම්බන්ධයෙන් ගත්තොත්, UN එක 1950 දශකයේ survey එකක් කරනවා. ඒ survey එකේදී තහවුරු කර ගන්නවා, මෙගාවොට් 2,400ක විතර විදුලි ජනන හැකියාවක් අපේ රටේ තිබෙනවා කියලා. එස්. ආරුමුගම් මහත්තයා "Water Resources of Ceylon" කියන පොතේ සඳහන් කරනවා, අපට 2,200ක විතර capacity එකක් තිබෙනවා කියලා. හැම ගංගාවක් ගැනම අධ්‍යයනය කරලා 1965දී විතර තමයි ඔහු ඒ පොත ලියන්නේ. මෙන්න මේකම තමයි මහවැලි මහ සැලැස්මට භාවිත කර ගන්නේ. ඒකෙන් මෙගාවොට් 1,400ක විතර hydropower ප්‍රමාණයක් දැනට අපේ රටේ හදනවා. ඒක දළ වශයෙන් ගත්තොත් සියයට 38ක, 40ක විතර විදුලි උත්පාදනයක්.

සුළං මඟින් ගනු ලබන චාලක ශක්තිය සම්බන්ධව 2003දී විතර මහාචාර්ය ලක්ෂ්මන් ඩී. ගුරුස්වාමි ප්‍රමුඛත්වයෙන් -ඔහු ඇමෙරිකානු ජාතිකයෙක්. ඇමෙරිකානු බලශක්ති අධිකාරියේ වැඩ කරන කෙනෙක්- වාර්තාවක් දෙනවා, අපේ රටේ මෙගාවොට් 20,000කට ආසන්න සුළං විදුලි capacity එකක් තිබෙනවා කියලා විදුලිය නිෂ්පාදනය සඳහා. මේ සඳහා සියයට 6ක භූමි ප්‍රමාණයකුත් සුදුසුයි කියලා ඔවුන් නිර්දේශ කරනවා. ඊට පසු අවුරුද්දක German expert team එකකුත් මේක තහවුරු කරනවා, අපේ රටේ මෙගොවොට් 15,000ක capacity එකක් තිබෙනවා, ඒකට යන්න පුළුවන් කියලා.

[ගරු ඇන්ටන් ජයකොඩි මහතා]

අපට සූර්යාලෝකය -සූර්ය ශක්තිය- විදුලිය බවට පරිවර්තනය කර ගන්න පුළුවන්. අපේ රටේ silicon metal වර්ග මීටරයකින් දළ වශයෙන් වොට් 12ක, 13ක වාගේ capacity එකකට යන්න පුළුවන්. ඒ තුළින් විශාල විදුලි උත්පාදනයක් කර ගන්න පුළුවන්. මේක කොච්චරද කියනවා නම්, පෘථිවියට ලැබෙන සූර්යාලෝකය විද්‍යුත් ශක්තිය බවට පරිවර්තනය කළොත් දැනට ජනනය වන විදුලි ප්‍රමාණය වාගේ ලක්ෂ 8 ගුණයක් අපට solar energy ලබා ගන්න පුළුවන්, තනිකරම මේ ශක්තිය විදුලිය බවට පරිවතර්තනය කළොත්.

රසායනික බැටරි නිෂ්පාදනය පැත්තෙන් ගත්තොත්, අපට පිරිසිදු මිනිරන් තිබෙනවා. ඒකෙන් graphene හදන්න පුළුවන්. මේ graphene සම්බන්ධව Manchester University එක 2007දී පරීක්ෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරනවා, graphene ව්‍යුහයක් තුළ ඉලෙක්ට්‍රෝන ගබඩා කරන්නේ කොහොමද කියලා. ඒක polarization සම්බන්ධ පරීක්ෂණ පත්‍රිකාවක්. ඒක කොච්චර වටිනාකමක් තිබෙනවාද කියනවා නම් 2010දී ඒකට හම්බ වෙනවා, භෞතික විද්‍යාව සම්බන්ධයෙන් Nobel Prize එක. මෙන්න මේක බැටරි විදුලිය ගබඩා කර ගැනීමේ විශාල පිම්මක් බවට පරිවර්තනය වනවා.

ඊත් එක්කම තව අපේ රටේ න්‍යෂ්ටික ප්‍රතික්‍රියා සඳහා අවශ්‍ය යුරේනියම් ප්‍රමාණයක් සුළු වශයෙන් තිබෙනවා. මමත් ඒ සම්බන්ධයෙන් පොඩි අධ්‍යයනයක් කරලා තිබෙනවා. ඒ වාගේම නැඟෙනහිර වෙරළ කලාපයේ තිබෙන ඛනිජ වැලිවල අපට තිබෙනවා, මොනසයිට් කියන ඛනිජය සියයට 1ක් වාගේ ප්‍රමාණයක්. ඒ වාගේම බේරුවල සහ පානදුර ප්‍රදේශයේ මුහුදේ තිබෙනවා, තෝරියම් කියන ඛනිජය. ඒක විකිරණශීලීයි, ඒක අපට න්‍යෂ්ටික උත්පාදනය සඳහා භාවිත කරන්න පුළුවන්. මේ තෝරියම්වලින් ඇත්තටම යුරේනියම්වලට වඩා තුනෙන් එකකට වඩා අඩු ශක්තියක් නිපදවෙන්නේ. ඒ නිසා මේක පරමාණු බෝම්බවලට වඩා මෙන්න මේ සඳහා තමයි අපට දායක කරගන්න පුළුවන්. ඉන්දියාව ගත්තොත්, දැනට ඉන්දියාව විශාල වශයෙන් මේ technology එක දියුණු කරලා සෑහෙන ඉහළ තැනකට ඇවිල්ලා තිබෙනවා. මෙහෙම විදුලි උත්පාදනයක් සඳහා අපේ රටේ විශාල ප්‍රභවයක් තිබෙන අවස්ථාවක, අපට කොහොමද විදුලි අර්බුදයක් පැමිණෙන්නේ?

උදේ ඉඳලා අපි සාකච්ඡා කරපු කාරණා ගත්තොත්, අපට ලැබෙන උපදෙස්, අපේ විදුලිබල ඇමතිතුමාට ලැබෙන උපදෙස් ගත්තාම, මට හිතාගන්න බැහැ මේ රටේ මෙහෙම ඇමතිවරු සිටියාද කියලා. අපි දන්නවා, සමහර ඇමතිවරියන් සිටියා මෙගාවොට් ද ලොකු, කිලෝවොට් ද ලොකු කියලා හඳුනාගන්න බැරි. ඒ වාගේම, ෆ්ලෙමින්ලා වාගේ මහා විද්‍යාඥයන්ටත් එහා ගිය ඉංජිනේරුවරු සිටියා විදුලිබල ඇමතිවරු වෙලා. හැබැයි, අපේ රටේ විශාල විදුලි අර්බුදයක් පැමිණියා. දිනකට පැය 16, 18 වාගේ විදුලි කප්පාදුවකට ලක් වුණා. පසුගිය රජයන් කොහොමද මේකට ප්‍රතික්‍රියා දැක්වූයේ? මගේ දුව ඇතුළු තවත් දරුවන් ලක්ෂ ගණනක් A/L විභාගය කළා, 2022දී. ඔවුන්ට විභාගයට මුහුණ දෙන්න වුණේ, 2023දී. ඒ වෙලාවේ දෙමාපියන් වන අපිත්, දරුවනුත් ඉල්ලා සිටියා, කීයක් ගියත් කමක් නැහැ මේ A/Lවලට පාඩම් කරන දරුවන්ට විදුලිය දෙන්න කියලා. හැබැයි, ආණ්ඩුව මොකද කළේ? මේ දරුවන් A/Lවලට පාඩම් කරන්න වැඩිපුර විදුලිය පාවිච්චි කරයි කියලා විදුලිය ලබා දුන්නේ නැහැ. නමුත්, A/L අවසන් වෙලා දවස් දෙකෙන් විදුලි ගාස්තු වැඩි කළා; පැය 24ම විදුලිය ලබා දුන්නා. ඔන්න, මහ ලොකුවට කථා කරන, උපදෙස් දෙන, අපේ විදුලිබල ඇමතිවරයාට උපදෙස් දෙන හිටපු පාලකයන්ගේ තත්ත්වය. එහෙම රටක් තමයි තිබුණේ.

ඇත්තටම මේ තිබෙන අර්බුදය මොකක්ද? අපි දන්නවා, අපට පුරෝකථනයක් කරගන්න බැහැ කියලා. මහවැලි ව්‍යාපාරය හොඳයි. මහවැලි ව්‍යාපාරය හදනකොට එහි තිබුණු තත්ත්වය අපි දන්නවා. ඒ වෙනකොට ලෝකයේ විශාල වශයෙන් global warming ගැන කථා කරන්න පටන් ගත්තා, climate change ගැන කථා කරන්න පටන් ගත්තා. ඒ කාලය තමයි ඒවායේ ආරම්භය. මෙන්න මේක අපේ මේ ජලාශවලින් කරන ජල විදුලි උත්පාදනයට කොහොම බලපායිද කියලා පුරෝකථනයක් කරගන්න බැරි වුණා. ඒක එක් උදාහරණයක්.

අනික් කාරණය මේකයි. 1990 දශකයේ අග භාගය වෙනකොට, එහෙම නැත්නම් 2000 වසරේ මුල ලෝකයේ ගල් අඟුරු බලාගාර සම්පූර්ණයෙන්ම ඉවත් කරන තැනට ගියා, ඉවත් කරමින් සිටියා. අන්න එතකොට තමයි අපි කථා කළේ ලංකාවේ ගල් අඟුරු බලාගාර ඇති කරන්න. ඒ කියන්නේ, අපට පුරෝකථනයක් කරන්න බැහැ. ඒ වාගේම, ලෝකයේ කොහොමද ඒ කරුණු තිබෙන්නේ කියලා අපි දන්නේ නැහැ. අන්න ඒක තමයි මේ අර්බුදයේ මූලිකම තැන. ලෝකයේ මේ වෙනකොට විදුලි උත්පාදනය සම්බන්ධයෙන් විශාල පර්යේෂණ ප්‍රමාණයක් තිබෙනවා. එය විශාල වශයෙන් ඉහළට පැමිණ තිබෙනවා. හැබැයි, පසුගිය කාලයේ පැවැති රජයන්, හිටපු විදුලිබල ඇමතිවරු, ඇමතිවරියන් සිටියේ දශක ගණනාවක් පිටුපසින්. අන්න ඒකේ ප්‍රතිඵල තමයි මේ. උදාහරණයක් හැටියට කියන්න පුළුවන්, වික්ටෝරියා ජලාශය පිළිබඳව. ඒක බොහොම හොඳයි. එහි target එක තිබුණේ මෙගාවොට් 210ක්; හැත්තෑවේ තුනක්. හැබැයි, ඒක දුවන්න පුළුවන් උපරිමයෙන් අවුරුද්දට සති 2ක් හෝ සති 3ක්. ඊට පසු මේක සති දෙකෙන් තුනෙන්, මාසයෙන් 30ට, 40ට බහිනවා. ඉතිරි shortage එක කොහෙන්ද ලැබෙන්නේ? ඉතිරි ටික ලබා ගැනීමට බලාගාරවල ඩීසල් පුච්චනවා. ඒ බලාගාර කාගේද? ඒවා බහුතරයක් මේකේ හිටපු ඇමතිවරුන්ගේ. ඉතින් මේවායේ සම්බන්ධයක් නැද්ද? ඕනෑ නම් නම් list එකක් දෙන්න පුළුවන්. අන්න එහෙම තමයි මේගොල්ලන් අර්බුදය විසඳුවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ලෝකයට සමාන්තරව යනවා නම්, ලෝකය කොහේද අද ඉන්නේ, ඒ තැනත් එක්ක, ඒ තාක්ෂණයත් එක්ක අපට ඉන්න පුළුවන්. අන්න ඒ නිසා තමයි 2026 අය වැයේදී විශාල වශයෙන් hydrogen energy සම්බන්ධයෙන්, hydrogen දහනය සම්බන්ධයෙන් අපි මේ සාකච්ඡාව ආරම්භ කර තිබෙන්නේ, ඒ වෙනුවෙන් ප්‍රතිපාදන සපයා තිබෙන්නේ. අනික් පැත්තෙන්, දිනක විදුලි පරිභෝජන රටාව ගත්තොත්, සාමාන්‍යයෙන් peak එකක් එනවා සවස 5.00 ඉඳලා රාත්‍රී 11.30 විතර වෙනකල් මෙගාවොට් 2,900ක විතර ප්‍රමාණයක. ඊට පසු ඒක බහිනවා මෙගාවොට් 600ට, 700ට. අන්න, ඒ වැඩිපුර විදුලිය ගබඩා කරන්න පුළුවන් බැටරි ටිකක් අපට ඕනෑ. අන්න ඒ නිසා තමයි, අපි 2026 අය වැයෙන් මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබෙන්නේ. පෞද්ගලික අංශය සම්බන්ධ කරගෙන මෙගාවොට් 160ක ධාරිතාවක් ගබඩා කරගෙන ඒක අර peak එකේදී ලබාගන්න පුළුවන් විධියට කටයුතු කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තෙල් ගැනත් ටිකක් කථා කරන්න බලාපොරොත්තුවෙන් සිටියා. නමුත්, වේලාව මදි. විශේෂයෙන්ම කාවේරි ද්‍රෝණියේ තෙල් ගවේෂණය සඳහා ළිං ප්‍රමාණයක් කැණීම් කළා. ඒවායේ ගෑස් තිබෙනවා කියලා හඳුනා ගත්තා. නමුත්, ඒකේ economic viability එක තවම නිරීක්ෂණය කරලා නැහැ. ඉදිරියේදී ඒ සඳහා ඉතාම පාරදෘශ්‍යව රජය මැදිහත් වෙලා කටයුතු කරනවා. හැබැයි, අපේ හිටපු පාලකයෝ මොකක්ද කළේ? ඒකෙන් පොඩි සිහිනි ආතල් එකක් ගත්තා. මොකක්ද? තෙල් හම්බවුණා කියලා දැන ගත්තා විතරයි, ඒ තෙල්වලින් රට

වටේ දුවනවා. ගෑස් තිබෙනවා කියලා නිකම් තහවුරු කර ගත්තා විතරයි, ගෑස්වලින් රට වටේ කාර් එළවන්න පටන්ගෙන මහජනතාව මුළා කරපු අය තමයි දැන් මේ වෙලාවේ අපේ විදුලිබල ඇමතිතුමාට උපදෙස් දෙන්නේ.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.46]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇන්ටන් ජයකොඩි මැතිතුමාගේ කථාව මම ගොඩක් වෙලාවක සිට අහගෙන හිටියා. එතුමා අපට අධ්‍යාපනය දුන්නා. පටන් ගන්නකොට ඒක ඉතා සාරගර්භ කථාවක්. ඊට පස්සේ කියපු ඒවා ගැන මට පොඩි ප්‍රශ්නයක් ආවා. මොකද, රටට මෙහෙම වුණේ ඇයි ද කියලා කියනකොට විදුලිබල ක්ෂේත්‍රයට ජනතා විමුක්ති පෙරමුණේ දායකත්වය කොච්චර ද කියන එකත් පොඩ්ඩක් මතක් කර ගත්තොත් හොඳයි. මොකද, 1971දී, 1988-1989 කාලයේ ලයිට් කණු, ට්‍රාන්ස්ෆෝමර් ගිනි තියලා එතැනින් පටන් ගත්ත එක එතුමන්ලාට මතකද දන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මමත් ඉතින් ආපස්සට යනවා. ඒක ගරහන තැනට යනවා වාගේ. ඒ නිසා මම ඒකට කැමති නැහැ.

සාම්පූර් බලාගාරය හදන්න ගියාම පෙළපාළි ගිහිල්ලා ඒක නැවැත්තුවා. විදුලි බලාගාර පටන් ගන්කොට ඒවා නැවැත්තුවා. අපේ විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරනකොට පාරවල් දිගේ මැරෙන්න හැඳුවා, මිනිස්සු ගෙන්වලා. ඉතින් ඒවායේ ප්‍රතිඵලය තමයි මේ තිබෙන්නේ. ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා උදේ ඉඳන් කිව්වා කරපු ටික. ඒ නිසා තමුන්නාන්සේලාගේ නතර කරපු ප්‍රමාණය ගත්තොත් ඔය ඔක්කෝටම වැඩිය වැඩියි කියලා තමයි මට කියන්න තිබෙන්නේ. තමුන්නාන්සේ දැන් කිව්වා නේ අලුත් වැඩ පිළිවෙළක් එක්ක, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව බලයට ඇවිල්ලා කරපු ක්‍රියාකාරකම් එක්ක, සොබාදනවි බලාගාරය 2025 ජූලි 23වන දා පටන් ගත්තා කියලා. මේ බලාගාරය LNG ව්‍යාපෘතියක් විධියට තමයි පටන් ගත්තේ. Combined cycle එකක් විධියට තමයි මේකත් යන්නේ. අලුත් ආණ්ඩුව මේ ගිවිසුම අත්සන් කළා. ඒක LNGවලින් වැඩ කරනවා කියලා තමයි පටන් ගත්තේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඇවිල්ලා කරන්න හදපු දැවැන්ත වෙනස්කම ගැන නේ මේ කථා කරන්නේ. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මේ සොබාදනවි එකේ ජුනි මාසයේ capacity charge එක රුපියල් 340යි. අගෝස්තු මාසයේ capacity charge එක රුපියල් 1,320යි. ඒකකයක් ගන්නේ රුපියල් 1,239.48ට; එක විදුලි ඒකකයක්. මේ තමුන්නාන්සේලා හදපු අලුත්ම කොම්පැනිය. සැප්තැම්බර් මාසයේ capacity charge එක රුපියල් 1,193යි. විදුලි ඒකකයක් රුපියල් 164.86යි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව හදපු, නැත්නම් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව විවෘත කරපු සොබාදනවි එකේ විදුලි ඒකකයක ගණන තමයි මම කිව්වේ. ඊළඟට, ඔක්තෝබර් මාසයේ capacity charge එක රුපියල් 1,219.13යි. විදුලි ඒකකයක unit cost එක රුපියල් 235.96යි. කවුද මේවාට අනුමැතිය දුන්නේ? නොවැම්බර් 15 වෙනකන් රුපියල් 590යි. ඒත් විදුලි ඒකකයකට යනවා රුපියල් 598.88ක්. මේක තමයි මේ මාලිමා ආණ්ඩුවේ ක්‍රියාකාරකම, තමුන්නාන්සේලා පටන් ගත්ත සොබාදනවි බලාගාරයේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභඳනවි බලාගාරය සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවේ තිබෙන්නේ විදුලි ඒකකයක් රුපියල් 20ක් කියලා. මේ පිළිබඳව මහජන උපයෝගිතා කොමිෂන් සභාව ලිපියක් යවා තිබෙනවා, "මේක බොරු. මේක නොවෙයි ඇත්ත ගණන. අනිවාර්යයෙන්ම විදුලි ඒකකයක් රුපියල් 70ට යනවා" කියලා. අවුරුදු 20ක් මේක ක්‍රියාත්මක කරන්න වැඩ පිළිවෙළ හදලා තිබෙනවා. තමුන්නාන්සේලා පුනර්ජනනීය බලශක්තියෙන් මිලට ගන්නා විදුලි ඒකකයක් රුපියල් 37 සිට රුපියල් 19ට අඩු කරන අතරේ, කවදාද මේ බලාගාර LNG බවට පත් වෙන්නේ?මෙන්න මේක තමයි තිබෙන ප්‍රශ්නය. තමුන්නාන්සේලා හදන අලුත් බලාගාර දෙකේම ගණන් පැහැදිලිවම පුනර්ජනනීය බලශක්තියට වඩා වැඩියි. මොකද හේතුව, ඒවා ඩීසල් බලාගාර. ඒවා LNG බලාගාර වෙන්නේ නැහැ. අපට කියන්න, කවදාද ඒවා LNG බලාගාර වෙන්නේ කියලා. ඒ ක්‍රියාදාමය තිබෙන්නේ තමුන්නාන්සේලා පටන් ගත්ත පළමු කාරණය විධියට.

දෙවැනි කාරණය මෙයයි. තමුන්නාන්සේලා tender එකක් කැඳවලා තිබෙනවා, "Establishment of 160 MW/640 MWH standalone battery energy storage system from 10 MW/40 MWH AC capacity projects on build, own and operate basis with 15 year operational period - Request for Extension of the Submission Date II" කියලා. මේක තමුන්නාන්සේලා දාලා තිබෙනවා. මේක කවදාද දැම්මේ? 2025 ජූලි 30වන දා. දවස් 42ක් දැම්මා, 2025 සැප්තැම්බර් 10 දක්වා. ඩොලර් මිලියන 6.6යි. ශ්‍රී ලංකාවේ සල්ලිවලින් නම් රුපියල් බිලියන දෙකක් විතර. ඒගොල්ලන් ඒකට තව කාලයක් දෙන්න කියලා ඉල්ලුවා. මේකේ විශාල වැඩ කොටසක් කරන්න තිබෙනවා. එක පැත්තකින්, මේ ස්ථාන හොයා ගන්න ඕනෑ. ඒ වාගේම ඒවාට bonded warehouse එක හොයා ගන්නට ඕනෑ. ඒ වාගේම feasibility study එකක් කරන්න ඕනෑ. Bid submission එකට යනකල් වැඩ ගොඩාක් තිබෙනවා, කරන්න. මේ ස්ථාන හොයා ගන්න ඕනෑ. මේවා මේ ගණන තුළ කරන්න බැහැයි කියලා ඒ කොම්පැනි ඉල්ලීමක් කළා. සති දෙකක්ද කොහේදෝ තමුන්නාන්සේලා දුන්නා.

ඊට පස්සේ මොකක්ද වෙන්නේ? මේකට ඉල්ලුම්පත්‍ර දානවා, කොම්පැනි ගණනාවක්. ඒ කොම්පැනි ගණනාවෙන් හැම කොම්පැනියම දාන්නේ තමන්ට ලංකාවට ඒවා ගෙනැල්ලා battery storage එක කරන්න යන වියදම ඔක්කෝමත් ඇතුළු කරලා. හැබැයි, tax එකත් එක්ක ගණන කීයද කියලා තමයි කොම්පැනි දාන්නේ. හැබැයි, එක කොම්පැනියක් මොකක්ද කරන්නේ? ඒ කොම්පැනිය දානවා, tax නැතුව. ඒක කොහොමද කරන්නේ? WindForce කියන කොම්පැනි එකක්. ඒ කොම්පැනිය දානවා, tax එක නැතුව; bid කරනවා, tax එක නැතුව. එයාලා bid එක දාන්නේ tax එක නැතුව? ලෝක හොරකමක් නේ. එතකොට මොකක්ද වෙන්නේ? හරියටම 2025 ඔක්තෝබර් 14වන දා අනුර දිසානායක මැතිතුමා මුදල් ඇමතිතුමා විධියට ගැසට් එකක් ගහනවා, එහි තිබෙනවා, "Establishment of a renewable energy generation facility with a minimum of one megawatt (1MW) power generation capacity or establishment of an Energy Storage System facility with a minimum capacity of one megawatt hour (1MW h) to enhance renewable energy integration" කියලා.

මේකේ තිබුණු tax එක අයින් කරලා ගැසට් එකක් ගහනවා. මේ tender එක open කරන්නේ කවදාද? මේක 15වැනි දා නිකුත් වෙන්නේ. 14වැනි දා තමයි ටෙන්ඩර් එක open වෙන්නේ. එතකොට මම අහන්න කැමැතියි, කොහෙන්ද මේ insider information යන්නේ කියලා. මාර ප්‍රශ්නයක්. මම මේ කාටවත් චෝදනා කරනවා නොවෙයි.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කුමාර ජයකොඩි අමාත්‍යතුමා.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
මම පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ඔය bid එක open කරන්න කලින් bidders ලා හැමෝටම addendum එකක් යවලා තිබෙනවා, tax ඇතුව සහ tax නැතුව offer කරන්න කියලා. ඒක දැනුම් දීලා තමයි කළේ. එතකොට ඒ අනුව කටයුතු කරලා තිබෙන්නේ. ඒ හින්දා ඔතැන-*[බාධා කිරීමක්]* ඔබතුමා ඒ කෑල්ල අයින් කළා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තිබෙනවා නම් කරුණාකරලා ඔබතුමා ගෙනැවිත් පෙන්වන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
Original document එකේ නොවෙයි, ඊට පස්සේ Addendum එකක් විධියට ඉදිරිපත් කරලා තිබෙනවා. ඔබතුමා ඒක පරීක්ෂා කරලා බලන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර ඒ කැබිනට් පත්‍රිකාව පාර්ලිමේන්තුවේ සභාගත කරන්න කියලා. එතකොට අපි තීරණය කරන්නම්. එතකොට අපට කථා කරලා බලන්න පුළුවන්. එහෙම එකක් මේකේ නැති නිසායි මම මේ කිව්වේ.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
Addendum එකක් තිබෙනවා. මම එය **සභාගත*** කරනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම ඔබතුමාට කියන්නේ මට කරුණාකරලා ඒක ඉදිරිපත් කරන්න කියලා. මම ඒක එතකොට පිළිගන්නවා.

හැබැයි, මේක බලනකොට පෙනෙනවා, අනෙක් ඔක්කෝම කොම්පැනි tax එක්ක දමන බව. එක කොම්පැනියක් tax නැතුව දානවා. ඒ කියන්නේ කොහෙන් හරි insider dealing එකක් යනවා, "ගැසට් එකක් එනවා. ඒ නිසා බය නැතුව මේක දාන්න" කියලා. හරියටම ටෙන්ඩර් එක open වෙන්නේ 14වැනි දා. ගැසට් එක නිකුත් වෙනවා, 14වැනි දා. මම දන්නේ නැහැ, කොහොමද මෙහෙම වෙන්නේ කියලා. ගරු ජනාධිපතිතුමාට අපි කියන්නේ හොරකමට, වංචාවට විරුද්ධ නම් බලන්න කවුද මේවා කරන්නේ කියලා. මොකද ඔබතුමා ලවා ගැසට් ගහ ගන්නවා. ටෙන්ඩර් එක යනකොට ටෙන්ඩර් එකේ කට්ටිය මේ වැඩේ හරියටම කර ගන්නවා. දන්නවා, ගැසට් එකක් එනවා කියලා. අන්තිමට අහු වෙන්නේ ගැසට් එක ගහපු මුදල් ඇමති; ජනාධිපතිතුමා.

අනෙක් කාරණය මෙයයි. 2024 මුල් මාස හයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් රුපියල් බිලියන 27ක ආදායමක් ගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අයියෝ, විනාඩි දෙකක් වෙන්න බැහැ. ඊට වඩා තිබෙනවා. මගේ වෙලාව ගත්තා. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් ලැබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, නැහැ. මට කථා කරන්න දුන්නේ නැහැ නේ.

2024 මුල් මාස හයේ රුපියල් බිලියන 27යි. 2025 මුල් මාස හයේ රුපියල් බිලියන 17යි. රුපියල් බිලියන ගණනාවකින් මේක අඩු වෙලා තිබෙනවා.

මම කියන්න කැමැතියි, මේ කාරණයත්. මේ රජය බලයට එනකොට ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයක් රුපියල් 331යි. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ රුපියල් 293යි. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? රුපියල් 40ක විතර මිල අඩු වීමක් වුණා. හැබැයි, බ්‍රෙන්ට් වෙළෙඳ පොළේ සහ සිංගප්පූරු මිල දර්ශකයේ මීට වඩා වැඩි ප්‍රමාණයකින් අඩුවෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා ඇතුළු තමුන්නාන්සේලා VAT එක ගැන කථා ගොඩක් කිව්වා. VAT එකට කිසි දෙයක් වුණේත් නැහැ, ඔක්කෝම ඒ විධියටම තිබෙනවා. හම්බ කරන ඒවා කංචනගේ සාක්කුවට යනවා කිව්වා, අරයාගේ සාක්කුවට යනවා කිව්වා. තමුන්නාන්සේලා දැන් ඒවාට උත්තර දීගන්න බැරුවයි ඉන්නේ. ඒ වාගේම මිල සූත්‍රය තමුන්නාන්සේලා මාසිකව ප්‍රසිද්ධ කරන්නේත් නැහැ, ඒක හංගාගෙන ඉන්නවා. ඒ වාගේම තවත් කාරණයක් තිබෙනවා. විශේෂයෙන්ම ලාභ ගජ මිතුරන්ට මේවා ලබා දෙනවා. මම කියන්න කැමැතියි, තෙල් සංස්ථාවේ වර්තමාන සභාපතිතුමාට; එතුමා කළමනාකරු විධියට වැඩ කරපු කාලයේ තෙල් loads 20ක් විතර වරායේදී නැති වුණා. ඒ පිළිබඳව

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

පරික්ෂණයක් කරන්න කියලා ගරු රන්වල මැතිතුමා විසින්ම ඉල්ලීමක් කරලා තිබෙනවා. මේ කාරණය ගත්තාම, ආචාර්ය නෙත්තිකුමාර මහත්මයා Facebook එකේ කාරණයක් දාලා තිබෙනවා, "රාජ්‍ය ආයතනවලට ලිහිසි තෙල් විකුණන මිලට, දින 4ට ගජ මිතුරන්ට discount එක දාලා lubricants විකුණලා තිබෙනවා. වෙච්ච අලාභය රුපියල් මිලියන 16යි" කියලා. මම මේ සටහන **සභාගත*** කරනවා.

රුපියල් මිලියන 71ක් ලැබෙන්න තිබුණත්, ඒගොල්ලන් රජයට විකුණන මිලට ගැළපෙන විධියට රුපියල් මිලියන 55කට දෙනවා. එතැන රුපියල් මිලියන 16ක loss එකක් තිබෙනවා. කරුණාකරලා මේ සම්බන්ධයෙන් සොයා බලන්න කියලා මම කියනවා. මොකද, මේ ආයතන හදන්න එනවා කියලා හොරු ටිකක් තමයි ඇවිල්ලා තිබෙන්නේ. ඒකයි තිබෙන ප්‍රශ්නය. දැන් ඒ කට්ටිය එකතුවෙලා ආපහු ඒ වැඩේම කරනවා. අනික් කාරණය තමයි, ජනාධිපතිතුමා කිව්වා, දූෂණය භයානකයි කියලා. දූෂණය නැවැත්වීමට කටයුතු නොකිරීම ඊටත් වඩා භයානකයි කියලා කිව්වා. හැබැයි, ඊට වැඩිය දූෂිත නිලධාරින් තමයි දැන් එතුමා පත් කරලා තිබෙන්නේ.

විශේෂයෙන්ම 2023 විගණකාධිපති වාර්තාවේ බොහොම පැහැදිලිව තිබෙනවා, තෙල් ප්‍රමාද වී භාර දීම, අස්ථානගත වීම, ප්‍රමිතියෙන් තොර තෙල් ගොඩබෑම සම්බන්ධයෙන් සැපයුම්කරුවන්ගෙන් ඩොලර් මිලියන 4.39ක්; මිලියන 164ක් ලබා ගන්න ඕනෑ කියලා. හැබැයි, මේ වෙනකොටත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා නැහැ. මෙහි එකතුව ගත්තොත්, විටෝල් සමාගම විතරක් අතිවිශාල මුදලක් දෙන්න තිබෙනවා. ඒ මුදල එකතු කර ගන්න මේ අයට තවමත් බැරිවෙලා තිබෙනවා. ඒ වාගේම නැව් සමාගම තෙල් අඩුවෙන් ගොඩබෑම් කිරීම නිසා outturn loss එක ඩොලර් මිලියන 27ක් වෙනවා. ඒ කියන්නේ, එම සමාගම් රුපියල් බිලියන 7.8ක මුදලක් -රුපියල් කෝටි 800කට ආසන්න මුදලක්- තෙල් සංස්ථාවට ගෙවන්නට ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තව වැදගත් කාරණයක් කියන්න තිබෙනවා. මේ වෙනකොට තිබෙන පිරිස්බල සැකැස්ම ගැනත් මම කියන්න ඕනෑ, ගරු ඇමතිතුමා. අමාත්‍යාංශ ලේකම්තුමා අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නවා. මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් යවපු ලිපියක් මා ළඟ තිබෙනවා. CPSTL එක සම්පූර්ණයෙන්ම රාජ්‍ය සමාගම්වලට අයිති වෙනවා. නමුත්, මේ ලේකම්වරයා, උදයංග හේමපාල මැතිතුමා ලියුමක් ගහනවා. මේක නීතිපති දෙපාර්තමේන්තුවේත් බොහොම පැහැදිලිව තිබෙනවා. CPSTL එකට කැමැති විධියට මේ අයව බඳවා ගන්න බැහැ. මේ සම්බන්ධයෙන් මම ඉදිරියේදීත් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. මම ලේකම්තුමාගෙන් ඉල්ලනවා, කරුණාකරලා රාජ්‍ය ව්‍යාපාර පිළිබඳව තිබෙන එම ලිපි කියවන්න කියලා. මොකද, මේවා වැරදි විධියට කරලා තමුන්නාන්සේලාට කැමැති, කැමැති විධියට බඳවා ගැනීම් කරන්න බැහැයි කියන එකත් මතක් කරමින්, මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව මූලාසනයට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. LAKSHMAN NIPUNA ARACHCHI left the Chair, and THE HON. KITNAN SELVARAJ took the Chair.*

[අ.භා. 3.59]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාළව අද දවසේ කෙරෙන විවාදය තුළ කරුණු කාරණා මතු වන වෙලාවේ, බලශක්ති අමාත්‍යාංශයේ විශේෂ අවධානයට යොමු වන ආයතනය තමයි, ලංකා විදුලිබල මණ්ඩලය. එහෙම නැත්නම් බලශක්ති අමාත්‍යාංශය යටතේ තිබෙන ලංකා විදුලිබල මණ්ඩලය.

Ceylon Petroleum Corporation එක, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ඇතුළුව මේ අමාත්‍යාංශයට අයත් තවත් ආයතන ගණනාවක් තිබෙනවා. ඒ සමහර ආයතන පිළිබඳ කරුණු මේ සාකච්ඡාව ඇතුළේ එළියට එන්නේ නැහැ. මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී අපේ ගරු බලශක්ති ඇමතිතුමා කථා කළ වෙලාවේ වැදගත් කරුණු ගණනාවක් ඉදිරිපත් කළා. ගරු බලශක්ති නියෝජ්‍ය ඇමතිතුමාත් කරුණු ඉදිරිපත් කරාවි. අපේ අනෙකුත් මැති ඇමතිවරුන් ඉදිරිපත් කරපු කරුණු අතරත් තිබුණා, වැදගත් කරුණු ගණනාවක්. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කළ කරුණු අතරත් තිබුණා, බැහැර නොකළ යුතු කරුණු. අපි ඒකත් කියන්න ඕනෑ. ඒ කියන්නේ, විපක්ෂයේ ඔබතුමන්ලා මතු කරපු සමහර කරුණු, බැහැර නොකළ යුතු ඒවායි. මේ අමාත්‍යාංශවල සහ ආයතනවල තිබෙන විශාලත්වය නිසා සමහර කරුණු සුළු ඒවා වාගේ පෙනෙනවා. මොකද, මේ පද්ධති විසින් ඒවා සුළු කරුණු බවට පත් කරලා තිබෙනවා.

විශේෂයෙන් අපේ රටේ විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රය ගැන සාකච්ඡා කරද්දී ජනතාවට සංවේදීම ආයතන දෙකක් තමයි ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව. විදුලිබල මණ්ඩලය සහ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රටේ නිෂ්පාදන ක්‍රියාවලියට වාගේම පාරිභෝගිකයාගේ එදිනෙදා ජීවිතයේ පැවැත්මට අවශ්‍ය කරන බොහෝ කටයුතුවලට අදාළව ද සේවාවන් විශාල ප්‍රමාණයක් සම්පාදනය කරනවා. රෝහල්වල එදිනෙදා කටයුතු පවත්වාගෙන යන්න, කර්මාන්තශාලාවල නිෂ්පාදන කටයුතු පවත්වාගෙන යන්න, ගෙදර දොරේ වැඩ ටික

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු වසන්ත සමරසිංහ මහතා]

කරගෙන යන්න, කාර්යාල සේවා ටික පවත්වාගෙන යන්න විදුලි බලය, ඉන්ධන සම්පාදනය අත්‍යවශ්‍ය වෙනවා. ඒ සඳහා විදුලි බලාගාර ටික හරියට පවත්වාගෙන යන්න ඕනෑ. ඒ වාගේම විදුලිය නිෂ්පාදනය කරන්න බලාගාරවලට අවශ්‍ය ගල් අඟුරු ටික ගෙනැවිත් දීම, සූර්ය බලශක්තියෙන් හරියාකාරව විදුලිය නිෂ්පාදනය කිරීම, සූර්ය බලශක්තිය වැඩි කරලා අපේ රටේ green energy පැත්ත වැඩි කර ගැනීම ආදි විවිධ කරුණු ගැන සංවාද, සාකච්ඡා අපට තිබෙනවා.

පසුගිය කාලයේ විදුලිබල ක්ෂේත්‍රයේ ඇති වෙච්ච ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡාව බොහෝ විට කරලියට ආවා. ඒ සාකච්ඡාව, අපේ මාලිමාව ආණ්ඩුව -ජාතික ජන බලවේගය ආණ්ඩුව- අහම්බයෙන් ගෙනාපු එකක් නොවෙයි. ඒ සාකච්ඡාව දිගටම තිබුණා. ඒ සාකච්ඡාව, ඒ ප්‍රතිසංස්කරණ සිදු කරන්න බලපෑ හේතුව, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කළ කරුණු අතරත් තිබුණා. ඒක හරි. විදුලිබල ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මතු කරපු සමහර කරුණු විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණවලට අදාළවම මතු කරපු කරුණු තමයි. ඒ ප්‍රතිසංස්කරණවල අරමුණ වුණේ, වංචාව, දූෂණය, නාස්තිය අවම කිරීම, කාර්යක්ෂමතාව ඇති කිරීම, cost එක අඩු කිරීම, ජනතාවට දරන්න වන පිරිවැය අඩු කිරීම, අඩු මුදලට විදුලිය ලබා දීම, නිෂ්පාදන පිරිවැය අඩු කිරීම, අපේ රටේ කර්මාන්තකරුවාට දරන්න සිදු වන විදුලි බිල අඩු කිරීම ආදියයි. අපනයන නිෂ්පාදනවල පිරිවැය අඩු කරගෙන අපනයන ආදායම වැඩි කර ගැනීමත් තවත් අරමුණක්. මොකද, නිෂ්පාදන පිරිවැය - cost එක - අඩු කරලා අපනයන වෙළෙඳ පොළට භාණ්ඩයක් යවන්න පුළුවන් අවස්ථා වැඩි කර ගැනීමත්, සේවකයාගේ පඩිය වැඩි කරන්න පුළුවන් අවස්ථා ඇති කිරීමත් අවශ්‍ය වනවා. මේ කියන අරමුණු ඉටු කර ගන්න තමයි මේ කියන හැම ප්‍රතිසංස්කරණයක්ම කළ යුතුව තිබෙන්නේ.

දශක දෙකතුනක් පරක්කු වෙලා තිබුණු වැඩක් තමයි අපි කඩිනමින් සිදු කළේ. අපි අවුරුද්දක් ඇතුළත ඒ වැඩේ අවසන් කළා. ඒකයි අපේ ආණ්ඩුවේ තිබෙන වැදගත්කම. අවුරුද්දක් ඇතුළත අපි ඒ වැඩේ අවසන් කළා. ඒ කටයුත්තේදී CEB එකට සියයට 100ක්ම අයිති companies 6ක් තමයි අපි හැදුවේ. ඒ කියන්නේ, ඒ companies 6ම අයිති CEB එකටයි; ඒවා පෞද්ගලික අංශයට අයිති companies නොවෙයි. CEB එකට සියයට 100ක්ම අයිති companies 6ක් හැදුවා. ඒ companies 6 විවිධ කටයුතු වෙනුවෙනුයි හදලා තිබෙන්නේ. ඒවා අතර, generationවලට, distributionවලට, system operation සහ transmissionවලට අදාළ companies තිබෙනවා, විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල්වලට අදාළ company එකකුත්, අවශේෂ කටයුතු සඳහා වන තවත් company එකකුත් තිබෙනවා. ඒ companiesවලට අදාළ වැඩ ටික කරගෙන යන්න දැන් පටන්ගෙන තිබෙනවා. අපි ඉදිරි අවුරුද්දේදී ඒ කටයුතු ටික වඩාත් ශක්තිමත්ව කරගෙන යනවා. ඒ කටයුතු ටික කරගෙන යන්න, ඒ කාර්යභාරය ඉදිරියට කරගෙන යන්න අවශ්‍ය වන කළ යුතු තවත් බොහෝ වැඩ කොටසක් තිබෙනවා. ඒ අවශ්‍යතා සපුරා ගනිමින් ඒ වැඩ කටයුතු ටික ඉදිරියේදීත් අපි කරගෙන යනවා. ඒ නිසා මේ සාකච්ඡාව ඇතුළේ ආර්ථිකයට, පාරිභෝගිකයාට වාසි වන විධියට, තරගකාරිත්වයක් ඇති වන විධියට තීරණ ගන්නවා. මිල ගණන් වාසිදායක වෙන්නේ තරගකාරිත්වය තුළින්. පාරිභෝගිකයාට වාසි වන විධියට තරගකාරිත්වය ඇති කරලා, පාරිභෝගිකයාට වාසි වන විධියට මිල ගණන් කැඳවීම හරහා භාණ්ඩ හා සේවාවල මිල අඩු වුණේ කොහොමද කියන කාරණාව පිළිබඳව අපි මේ සභාව තුළ ඇති තරම් සාකච්ඡා කළා.

විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඒ පිළිබඳ කරුණු ඉදිරිපත් කළා. රුපියල් 40 ඉඳන් රුපියල් 12 දක්වා unit cost එක අඩු වුණේ කොහොමද කියන කාරණය අපි මෙහිදී සාකච්ඡාවට ගත්තා. ඒක නැවත නැවතත් සාකච්ඡාවට ගන්න ඕනෑ නැහැ කියලා මම හිතනවා. මේ තරගකාරිත්වය, මේ විනිවිදභාවය - transparency එක - ඇතුළේ, රුපියල් 40ක්ව තිබුණු unit cost එක අපි අවුරුද්දක් ඇතුළත රුපියල් 12කට ගෙනැල්ලායි තිබෙන්නේ. අපේ අරමුණ වෙලා තිබුණේ ඒක තමයි. විදුලි පිරිවැය අඩු වෙන කොට තමයි අනෙක් හැම පිරිවැයක්ම අඩු වෙන්න පටන් ගන්නේ. ඒක තමයි අපේ අරමුණ වුණේ. ඒක තමයි අපි සිද්ධ කළේ. මේ කටයුතු ටික කරගෙන යනකොට, අපේ විපක්ෂයේ සමහර ගරු මන්ත්‍රීතුමන්ලා ඇහුවා, කවුද දැන් මේක කළේ, විශේෂඥයෝ කවුද, මේ ප්‍රතිසංස්කරණ කටයුතුවල කාර්යභාරයන් කරන්න හිටපු අය කවුද, මේ කර්තව්‍යවලට මැදිහත් වුණේ කවුද කියලා. ඒකට සුදුසු අය ඒ කටයුතු කරලා දැන් වැඩේ සාර්ථක කරලා තිබෙනවා නේ. *[බාධා කිරීමක්]* වැඩේ කරමින් යනවා, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි. ඒ වැඩේ කරමින් යනවා. ප්‍රශ්නයක් තිබෙනවා නම් අපි ඒ ප්‍රශ්නයත් ඉදිරියේදී විසඳනවා. ගැටලුවක් නැතිව දැන් ඒ වැඩේ කරගෙන යනවා. තවදුරටත් ප්‍රශ්න තිබෙනවා නම් ඒ ප්‍රශ්නත් විසඳනවා. මොකද, මෙච්චර කල් බැරි වෙලා තිබුණු වැඩක් අපි අවුරුද්දක් ඇතුළත අවසන් කළා. අපි ඒ වැඩේ කළා වාගේම ඉදිරියටත් අවශ්‍ය කටයුතු කරනවා.

ඒත් එක්කම මම මේ කථාවත් කියන්න ඕනෑ. දැන් විදුලිබල මණ්ඩලය ආශ්‍රිතව දිගින් දිගටම කථා වෙමින් තිබෙන තවත් එක ප්‍රශ්නයක් තමයි LTL එකේ ප්‍රශ්නය. දැන් මේ කාරණයට අදාළව බොහෝ අය ප්‍රශ්න කරනවා; බොහෝ අය විවිධ ප්‍රශ්න මතු කරනවා. ඒ බොහෝ ප්‍රශ්න මතු කරන අයගෙන්, තමන් මොකක්ද කළේ කියලා ඇහුවාම, මොකුත් කියන්නේ නැහැ. LTL එකත් විදුලිබල මණ්ඩලයටම අයිතිව තිබුණු ආයතනයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහරු මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් හොර ගල් අහුලමින් තමයි කථා කරන්නේ. ජාතික ජන බලවේගයේ ආණ්ඩුව හදපු අපි මේ කාරණය ගැන කියන්නේ ඇත්ත තත්ත්වය කියන්න මිස වෙන කිසිවක් නිසා නොවෙයි. මෙහි ඉතිහාස කථාවේ ගොඩක් කථා තිබෙනවා. අවසන් නොවෙච්ච කථාවක් ද තිබෙනවා. ඒ අවසන් නොවෙච්ච කථාව ඉදිරියේදී අවසන් කරන්න ඕනෑ. මේ වෙලාවේ අපේ ගරු විදුලිබල ඇමතිතුමාත් සභාවේ ඉන්නවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්නවා. ඒ අවසන් නොවුණු කථාව අවසන් කරන්න ඕනෑ. අවසන් කරන්න බැරි වෙච්ච, ඔබතුමන්ලාත් දන්නා තවත් කථා තිබෙනවා නම් දැන් ඒවාත් කියලා ඉවර කරමු. මොකක්ද, වෙච්ච දේට අදාළ කථාව? මොකක්ද වුණේ? LTL එකේ කොටස්වලින් සියයට 63ක් විදුලිබල මණ්ඩලයට අයිතිව තිබුණා. සියයට 27ක් අයිතිව තිබුණා Teckpro කියන පෞද්ගලික ආයතනයට- *[බාධා කිරීමක්]* LTL ESOT Limited නමින් ආයතනයක් තිබුණා. සේවක භාර අරමුදලක් ලෙස අර ඉතිරි සියයට 10 තිබුණා, සේවකයන්ට අයිතිව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

මම විනාඩි 3කින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ටික කාලයක් යනකොට මොකද වෙන්නේ? ඉහත කී පරිදි සියයට 63 ප්‍රමාණය විදුලිබල මණ්ඩලයට අයිතියි; සියයට 27ක ප්‍රමාණය Teckpro කියන පෞද්ගලික ආයතනයට අයිතියි. ඉතිරි සියයට 10, ඒ කියන්නේ Employees' Trust Fund එකට හෙවත් සේවකයන්ට අයිති සියයට 10 "පෙරදිවි" කියන ආයතනයට

අයිතියි. ඔන්න, ප්‍රශ්නය ආපු තැන. ඒ සේවක භාර අරමුදලට සහ සේවකයන්ට අයිති කොටස් හිමි ආයතන දෙකම පිළිබඳව තමයි ප්‍රශ්නය ආවේ. අපි, සේවකයෝ මේකට නඩු කිව්වා. කොටස් අයිතිය තිබිච්ච සේවකයෝ මේකට නඩු කිව්වා. නඩු කියලා උසාවියේදි තමන්ගේ අයිතිවාසිකම් දිනා ගත්තා. ඒ අයිතිවාසිකම් දිනා ගත්තේ උසාවියේදී. සේවකයෝ තමන්ගේ අයිතිය ඉල්ලලා නඩු කිව්වාම, උසාවියේදි settlement එකකට ඇවිල්ලා සේවකයන් තමන්ගේ අයිතිය ලබා ගත්තා. හැබැයි, තවදුරටත් තම අයිතිවාසිකම් වෙනුවෙන් නඩු කියන්න එන සේවකයන්ට මේ අයිතිය ලබා ගන්න ඕනෑ. ටික දවසක් යන කොට ආවා ප්‍රශ්නයක්. ඒ මොකක්ද? මේ නඩුවට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණයේදී settlement එකකට ගිහිල්ලා එනකොට ඒ අතරතුර ආපු මුදල් අවශ්‍යතාවක් වෙනුවෙන්, **විදුලිබල මණ්ඩලයට** තිබුණු සියයට 63ක කොටස් අයිතිය දෙකට බෙදුණා. කොහොමද, බෙදුණේ? CEB එකට සියයට 35යි. ඉතිරි සියයට 28 ගියා West Coast කියන සමාගමට. West Coast කියන සමාගමට ඒ සියයට 28 දුන්නේ රුපියල් බිලියන 26කටයි. ඇයි ඒ? විදුලිබල මණ්ඩලයේ තිබුණු ණය මුදලක් පියවීම සඳහායි. හැබැයි, ඒ සියයට 28 West Coast කියන සමාගමට රුපියල් බිලියන 26කට දෙන්නේ කොටස් වෙළෙඳ පොළේවත් දමන්නේ නැතිව අභ්‍යන්තර එකඟතාවකින්. මේ විධියට තමයි මේ සාකච්ඡාව ප්‍රශ්නගත වුණේ. එතකොට දැන් කොටස් අයිතිය වෙනස් වෙනවා. ඒ කොහොමද? CEB එකට සියයට 35යි, West Coast එකට සියයට 28යි, Teckpro එකට සියයට 27යි, අනෙක් සමාගම වන පෙරදිවි සමාගමට සියයට 10යි. ඊට පස්සේ, තිබුණු එකෙන් සියයට **22කට**, එහෙම නැත්නම් රුපියල් බිලියන 20ක් හොයලා තමයි කොටස් වෙළෙඳ පොළට යන්න ගියේ. කොටස් වෙළෙඳ පොළට යන්න යනකොට තමයි අපි එය නැවැත්වුයේ. ඒ යනකොට අපි කිව්වා, රජයේ සියයට 51 අඩු කරන්න බැහැ කියලා. රජයේ සියයට 51 තබා ගන්න ඕනෑ නිසා ඒ සියයට 20 අපි ඉල්ලුවා, CPC එකට. Ceylon Petroleum Corporation එකට ඒ සියයට 20 ගන්නම් කිව්වා. Ceylon Petroleum Corporation එකට ගන්නම් කිව්වාම, අන්න ඒ වෙලාවේ LTL එක අපට දැනුම් දුන්නා, "නැහැ, සල්ලි තිබෙනවා" කියලා. ඒකෙන් තමයි IPO එක නැවතුණේ. *[බාධා කිරීමක්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු ඇමතිතුමනි, -

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, මට තව විනාඩි 2යි තිබෙන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමා වාගේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙකු ඉන්න තැන මේක අහන්න ඕනෑ. ඒ විධියට කොටස් වෙළෙඳ පොළට යන එක ප්‍රජාතන්ත්‍රවාදී දෙයක්. එවිට රටේ පුරවැසියන් හැමෝටම කොටස් මිල දී ගන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, හැබැයි ඔබතුමා ඔය කියන Ceylon Petroleum Corporation එකට shares දෙනවා නම් මේ මූලික කොටස් එකතුවට යාමට ඔබතුමන්ලා එකඟද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
අහගෙන ඉන්න, මම ඒ ගැන කියන්නම්. ඒක තමයි මම කියන්න හැදුවේ. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, මේකේ කථාව වෙනස්. ඒකයි මම මේ කියන්න හැදුවේ. කථාව වෙනස්. Ceylon Petroleum Corporation එකට කොටස් දෙනවාට එකඟ වුණේත් නැහැ; Ceylon Petroleum Corporation එක කොටස් ගන්නවාට එකඟ වුණේත් නැහැ. Ceylon Petroleum Corporation එකට සියයට 20 දීලා, අපි මේ ඉල්ලන, ඉල්ලන ප්‍රමාණය දීලා යනවා නම් අප එකඟයි. මොකද, තවත් දෙන්න පුළුවන් නේ. තවත් ප්‍රාග්ධනය රැස් කරන්න පුළුවන් නේ. බාධාවක් නැහැ නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒකට විරුද්ධ නැහැ?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒකට විරුද්ධ නැහැ. ඒකට විරුද්ධ වුණේ නැහැ, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි. එතකොට කොටස් වෙළෙඳ පොළට ගියේ නැහැ; කොටස් වෙළෙඳ පොළට යන්න එකඟ වුණේ නැහැ. ඒක තමයි අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, මම කිව්වේ. එතකොට කොටස් වෙළෙඳ පොළට යන්න එකඟ වුණේ නැහැ. මෙන්න මේ කථාව ඇතුළේ තමයි මට මේ කාරණය කියන්න වුවමනාව තිබුණේ. මේ ප්‍රශ්නයේ ඉතිහාස කථාව ඇතුළේ තව බොහෝ කථා තිබෙනවා; සංසිද්ධි තිබෙනවා; ලැයිස්තු තිබෙනවා, අපි ළඟ.

මට කියන්න වුවමනාව තිබුණේ මේකයි. දැන් මේකේ ඉන්නවා, සේවකයෝ 600ක් විතර. කොටස් නැහැ, 2017න් පස්සේ ආපු සේවකයින්ට. කොටස් තිබෙන සේවකයින් 15ක් විතර මේකේ ඉන්නවා. LTL Holdings එකේ 2024දී ලාභය රුපියල් බිලියන 10යි. ඒ රුපියල් බිලියන 10න් සේවකයෝ 15දෙනෙකුට තිබෙනවා, රුපියල් බිලියන 1.3ක ලාභයක්. ඉදිරියේදී මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්කම තිබෙනවා. ජාතික ජන බලවේගය ආණ්ඩුව බොහෝ ප්‍රශ්න හඳුනාගෙන ඒවාට අවශ්‍ය කරන විසඳුම් හොයන්න මැදිහත් වෙනවා. අපි කිසිම තැනකදී ප්‍රශ්න මඟහැරලා ගිහිල්ලා නැහැ. ඒ නිසා ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රශ්නය බේරන්න ඒ ප්‍රතිව්‍යුහගත ක්‍රියාවලියට මැදිහත් වෙච්ච ඇමතිවරයා, නියෝජ්‍ය ඇමතිවරයා ඇතුළු සියලුදෙනාම - ආණ්ඩුව - ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතිසංවිධානයේදී මැදිහත් වුණා වාගේම ඒ වෙච්ච වංචා, දූෂණ නවත්වලා මේ ආයතන පද්ධතීන් ප්‍රතිසංවිධානය කරලා, වැරැද්දක් වෙලා තිබෙනවා නම් ඒවා නිවැරදි කරගෙන, ඔබතුමන්ලා පෙන්වා දෙන කරුණු තිබෙනවා නම් ඒවාත් පිළිගෙන ඒවා නිවැරදි කරන්න කටයුතු කරනවා කියන කාරණය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුහම්මද් ෆයිසාල් මන්ත්‍රීතුමා.

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தேவையில்லாமல் எனது பெயரை புத்தளம் வைத்திய

[ගරු මුහම්මද් ෆයිසාල් මහතා]

சாலையுடன் தொடர்புபடுத்தி இரண்டு நாட்களாக *[இடையீடு]* சில வைத்தியர்கள் நினைத்துக்கொண்டு இருக்கிறார்கள், வைத்தியரானவுடன் தங்களுக்கு எல்லாம் தெரியும் என்று. வைத்தியசாலைகள் எந்தத் தரத்தில் இருக்கின்றன என்று சரியாகத் தெரிந்துகொள்ளாமல், 'சும்மா' இங்கு வந்து தடுமாறிக்கொண்டு இருக்கிறார்கள். புத்தளம் வைத்திய சாலையானது, 2002ஆம் ஆண்டு ஏப்பிரல் மாதம் 22ஆம் திகதி Base Hospital type A ஆகத் தரம் உயர்த்தப்பட்டு இருக்கின்றது. அதற்கான ஆதாரங்கள் -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම බලාපොරොත්තු වෙනවා, මගේ විනාඩි 11ම, නැත්නම් විනාඩි 12ක් විතර මට ලබා දෙයි කියලා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, සමාවෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගෙන් අහන්නේ Standing Order එක මොකක්ද කියලා නේ. ස්ථාවර නියෝග 92 (2) (ආ) යටතේ මම අහන්නේ. දැන් මේ ගරු මන්ත්‍රීතුමා කථා කළ point එක මොකක්ද කියලා පුළුවන් නම් මට කියන්නකෝ. කවදා හරි school ගිහිල්ලා තිබෙනවා නම්, කවදා හරි Standing Orders පොත අරගෙන කියවලා තිබෙනවා නම් මට කියන්න, point එක මොකක්ද කියලා. *[බාධා කිරීමක්]* ඔය Standing Orders කවදා හරි ඔබතුමා කියවලා තිබෙනවාද? *[බාධා කිරීමක්]* Standing Orders කවදා හරි කියවලා තිබෙනවාද?

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ නම කිව්වා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔබතුමා ඒවා කියවන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ නම කිව්වා නම් ගරු කථානායකතුමාගේ අවසරය ඇතුව ඇවිල්ලා කථා කරන්න. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 4.15]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීම්]* පොඩ්ඩක් නිශ්ශබ්ද වෙලා මට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න. *[බාධා කිරීම්]* Thank you, Sir. Hon. (Dr.) Archchuna, please sit down. Hon. Members, please sit down. Please, be quiet. Thank you very much.

බලශක්ති අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කරන මේ අවස්ථාවේදී විශේෂයෙන්ම අපි ආණ්ඩුවට ඇඟිල්ල දික් කරනවා. *[බාධා කිරීම්]* Hon. (Dr.) Archchuna, please sit down. අපි කෙළින්ම ආණ්ඩුවෙන් අහනවා, ආණ්ඩුව බලයට එන්න කලින් දුන්නු විශාල පොරොන්දු ප්‍රමාණය ඉටු කළාද කියලා. පෙට්‍රල් සම්බන්ධයෙන් කිව්වා; ඩීසල් සම්බන්ධයෙන් කිව්වා; විදුලි බිල ගැන කිව්වා. මම හිතන්නේ නැහැ, මම ඒ ගැන දිගින් දිගටම කියන්න ඕනෑ කියලා. බොරු විශාල ප්‍රමාණයක් කියලා තමයි මේ ආණ්ඩුව බලයට ආවේ. මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, මේ පවවලට බදු ගැහුවොත් එහෙම, ජනාධිපතිතුමාගේ පව ටිකෙන්ම පිට රට ණය ටික භාගයක් ගෙවලා දාන්න පුළුවන්.

ඒ වාගේම අනෙකුත් මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් කියන පව ටිකට බදු ගැහුවොත් ඉතුරු භාගය ගෙවා දමන්න පුළුවන්. එච්චර බොරු ප්‍රමාණයක් මේ ආණ්ඩුව කියනවා. දැන් නළියනවා. තව පව එනවා, එක් කෙනෙකුගෙන්; පව කැප්ටන් කෙනෙකුගෙන්. ඒක ඇඟේ පිහිටලා තිබෙන්නේ. ධාරණය වෙලා මුල් ඇදලා තිබෙන්නේ. වෙනස් වෙන්න බැහැ. පව කියලා පුරුදු වෙලා, නියම පචෝරිස් වෙලා. ඊට එහා පැත්තේ නම් ඉන්නවා, හොඳ ඇමතිවරයෙක්. දෙන්නෙක් තුන්දෙනෙක් ඉන්නවා, සාමාන්‍යයෙන් සංයමයකින් යුතුව තමන්ගේ කාර්යභාරය කරන. අපි කියන එක හොඳට අහගෙන ඉන්න. අපි නිකම් කාටවත් අනම් මනම් දේවල් කියන්නේත් නැහැ.

ගරු ඇමතිතුමනි, මම මේ කියන දේ ඔබතුමා හොඳට අහගෙන ඉන්න. ගොඩක් අය ඇමතිතුමාට දෝෂාරෝපණය කළා. නමුත්, මම එතුමාට දෝෂාරෝපණය කරන්නේ නැහැ. මම එතුමාට කියන්නේ මේකයි. ඔබතුමන්ලා ගොඩක් විවේචන නේ කරන්නේ. අපේ නායකයෝ -ජේ.ආර්.ලා, ගාමිණී දිසානායකලා, ප්‍රේමදාසලා- තමයි මහවැලි ව්‍යාපෘතිය පටන් ගත්තේ. අදටත් grid එකෙන් භාගයක් අපට ලැබෙන්නේ මහවැලියෙන් ලැබෙන ඒ ප්‍රතිලාභයෙන්. මම හිතන විධියට, රුපියල් දෙකක් විතර වාගේ තමයි ඒකකයකට ගෙවන්නේ. ඒ ගැන ඔබතුමන්ලා කියනවා කවදාවත් අපට ඇහිලා නැහැ. මොකද, 76 වසරක ශාපය කියලා බොරු කිය-කියා ඒකටම පහර ගහමින්, ඒකෙන්ම ජීවත් වෙන්න බලන්නේ නැතුව, මෙන්න මෙහෙම කාර්යයක් අපේ නායකයින් සිදු කරලා තිබෙනවා කියලා ඔබතුමාත් කිව්වා නම් මම හිතන්නේ ඒක සාධාරණ වෙනවා. මහවැලි ව්‍යාපෘතිය ආරම්භ කළේ 80 දශකයේ නේ ඇමතිතුමා. ඒ, ආසියාව ජල විදුලි උත්පාදනය ගැන හිතලාවත් නැති කාලයක. අවුරුදු 7කින් එහෙම කරන්න පුළුවන් කියන්නේ ලොකු දෙයක්. ඔබතුමා ගිහිල්ලා බලන්න, ඉන්දියාව, බංග්ලාදේශය සහ නේපාලය වාගේ රටවලට. විශේෂයෙන්ම ජල විදුලි උත්පාදනය ගත්තොත්, 95 per cent of hydropower sources had exhausted in Sri Lanka. මහවැලි ව්‍යාපෘතිය

ආරම්භ කළේ 1980දී. ඒ කියන්නේ, ලෝකයේ රටවල් ජල විදුලි උත්පාදනය ගැන හිතලාවත් නැති කාලයක. ඒ කරපු කාර්යය වෙනුවෙන් අපි ඒ නායකවරුන් සිහි කරන්න ඕනෑ. ඒ ගැන ඔබතුමාගේ කථාවේදී කිව්වා නම් හොඳයි. ඔබතුමන්ලාට මෙහෙම ආණ්ඩුව කරන්න හෝ සියයට 50කට විදුලි බලය ලැබෙන්නේ, මහවැලියෙන් ලැබෙන ඒ බලශක්තිය නිසායි. ඒ සම්බන්ධයෙන් ඔබතුමා අවධානය යොමු කරයි කියලා මම හිතනවා. මම ඔබතුමාට නොවෙයි, කෙළින්ම ඇඟිල්ල දික් කරන්නේ.

විශේෂයෙන්ම සූර්ය බලය සම්බන්ධයෙන් ඔබතුමන්ලා අදහස් ප්‍රකාශ කළා. ඒ සම්බන්ධයෙන් ගොඩක් කට්ටිය කථා කරපු හින්දා මම ඒ කාරණයට එන්නම්. කිලෝවොට් 500ට අඩුවෙන් නිෂ්පාදන කරන අයගෙන් විදුලි ඒකකයකට අය කරන්නේ රුපියල් 28යි. කිලෝවොට් 500ට වැඩියෙන් නිෂ්පාදන කරන අයගෙන් විදුලි ඒකකයකට අය කරන්නේ රුපියල් 23යි; කිලෝවොට් 20 දක්වා නිෂ්පාදනය කරන අයගෙන් විදුලි ඒකයකට අය කරන්නේ රුපියල් 19යි. සාමාන්‍යයෙන් ගෙවල්වලට ඒකකයක් වෙනුවෙන් රුපියල් 19ක් වාගේ තමයි මම හිතන්නේ ඔබතුමන්ලා ගෙවන්නේ. ඒක සංශෝධනය වෙනවා, විටින් විට. ඒ වාගේම කිලෝවොට් 20 සිට 100 දක්වා රුපියල් 17යි; කිලෝවොට් 100 සිට 500 දක්වා රුපියල් 15යි; රුපියල් 27ට, රුපියල් 23ට තිබුණු විදුලි ඒකකයක් දැන් රුපියල් 19ට, රුපියල් 15ට වාගේ පහත බැස තිබෙනවා. මම දන්නවා, ප්‍රශ්නයක් තිබෙනවා කියලා. මේවා store කරගන්න අමාරුයි. බැටරි නැහැ. දවල්ට විතරයි සූර්ය බලය ලැබෙන්නේ. ඒකේ පොඩි අපහසුතාවක් තිබෙනවා. හැබැයි, ඔබතුමා ඒ පිළිබඳව හොඳට අවධානය යොමු කරන්න ඕනෑ. ලංකාවේ ජලවිදුලි ඒකකයට අපි රුපියල් 60ක් විතර ගෙවනවා. ලංකාවේ මහවැලිය තිබෙද්දී නේ එහෙම ගෙවන්නේ. ඉන්දියාවට මහවැලියක් නැහැ. අපි විදුලි ඒකකයකට රුපියල් 60ක් ගෙවනකොට, ඉන්දියාව ගෙවන්නේ රුපියල් 28ක් වාගේ ප්‍රමාණයක්. එතකොට අපි නිෂ්පාදනයට කෙළින්ම අවස්ථාව ලබා දුන්නේ නැත්නම් මොකද වෙන්නේ? ජනතාවට ඔබතුමන්ලා කිව්වා, ඉතාම පහසු මිලකට - තුනෙන් දෙකකට වාගේ මුදලකට- විදුලි බිල අඩු කරනවාය කියලා. රුපියල් 1,500ට වාගේ තිබුණු විදුලි බිල දැන් රුපියල් 5,500ක්, රුපියල් 6,000ක් විතර වෙලා ඇති. ඉතාම අමාරුවෙන් තමයි ජනතාව ජීවත් වෙන්නේ. රටේ ජනතාවගෙන් සියයට 25ක් දිළිඳුයි. ගොඩක් වෙලාවට මම දකිනවා, ඔබතුමන්ලා හිනා වෙනවා. ඔබතුමන්ලා ඒ කාලයේ පාරවල් ගාණේ උද්ඝෝෂණය කරමින් ඇවිද්දාට දැන් ඒ තෙතමනය නැහැ, ඔබතුමන්ලා ළඟ. ආණ්ඩු ගන්න ඔබතුමන්ලා වෛරයෙන්, ඊර්ෂ්‍යාවෙන්, ක්‍රෝධයෙන් කටයුතු කළා. හිතේ තෙතමනයක් ඇතුව ගොවීන් ගැන කථා කරද්දී ගොවීන් අඬනවා. උදේ කථා කරපු ඇමතිවරයෙක් කියනවා මම අහගෙන හිටියා, රටේ සියයට 80ක් ඉන්නේ හිඟන්නෝ කියලා. ඒ වාගේම ලජ්ජා නැතුව හිඟන්නෝ අස්වැසුම ඉල්ලා ගෙන එනවාය කිව්වා. ඇමතිතුමා මේක හොඳට හිතේ තියා ගන්න. ගම්වල ඉන්නේ ඉතාම අහිංසක මිනිස්සු. ඔවුන් deal දාන්නේ නැහැ, පගා ගහන්නේ නැහැ, බලු වැඩ කරන්නේ නැහැ. ඔවුන් ඉතාම අහිංසකව ජීවත් වෙන මිනිස්සු. එහෙම ජීවත් වෙන මිනිස්සුන්ට,- *[බාධා කිරීමක්]* අහගෙන ඉන්නකෝ, අහගෙන ඉන්නකෝ, පාපිසි. එහෙන් මෙහෙන් පඩි ගත්තාට ඇවිල්ලා මේක නාඩගම් මඩුවක් කරලා යන්න එපා. අහගෙන ඉන්න, කථාවක් කරනකොට. මම කියන ඒවාට උත්තර දෙන්න, ඔබතුමන්ලාගේ කථාවේදී. ගරු ඇමතිතුමනි, පුළුවන් නම් ඒ දුප්පත් ජනතාවට solar unit එකක් දෙන්න. Solar unit එකක් දුන්නා නම් අවුරුදු ගණනක් ඒගොල්ලන්ට විදුලි බලය නිකම් ලබා ගන්න පුළුවන්. ඒ වාගේ නිර්මාණාත්මක වැඩක් කරන්න.

ඒ වාගේම ඔබතුමාට මම මේ කාරණයත් කියන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. සියයට 75ක් අපි වියදම් කරන්නේ තෙල්වලට. ඒ නිසා තමයි අපේ බලශක්තියේ මිල ගණන් වැඩි. විදුලිය ඒකකයක් රුපියල් 60යි. ඒක රටට දරා ගන්න බැහැ. මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, විශේෂයෙන්ම සුළං විදුලි බලාගාර සම්බන්ධයෙන් වන ටෙන්ඩරයට. මම මේ කියන්නේ මට ලැබෙන තොරතුරු. මම වැරදි වෙන්න පුළුවන්. ටෙන්ඩර් යොමු කරන ආයෝජකයන්ට -මෙගාවොට් 50 එකට- මීට පෙර මෙගාවොට් 50 සුළං විදුලි බලාගාර 2ක් සැලසුම් කර තිබිය යුතු සමාගමක් විය යුතු බවත්, මෙම බලාගාර ඉදිකරන ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් - EPC - සමාගම් මීට පෙර ඉදිකර ඇති බලාගාර දෙකෙන් එකක් වෙනත් රටක ඉදි කර තිබිය යුතු බවත් මේ ටෙන්ඩරයේ ඇතුළත් වෙනවා කියලා තිබෙනවා. අපේ ලංකාවේ ටෙන්ඩර්කරුවන්ට ඒකට ඇතුළත් වෙන්න බැහැ කියලා තිබෙනවා. මම දන්නේ නැහැ, එහි තාක්ෂණික පැත්ත. මම ඒ ගැන දන්නේ නැති හින්දා ඔබතුමාට කෙළින්ම ඒ චෝදනාව කරන්නේ නැහැ. ආණ්ඩුවට චෝදනා කරන්නේත් නැහැ. හැබැයි, මෙහෙම අපට තොරතුරු ලැබිලා තිබෙනවා. දැන් මේ නිසා අපේ ලංකාවේ ආයෝජකයින්ට මේකට සහභාගි වෙන්න අවස්ථාව ලැබී නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමා මගේ කථාවෙන් පස්සේ කථා කරන්න. මම ඉතාම සාධාරණව කරුණු ඉදිරිපත් කළේ, මට ලැබී තිබෙන තොරතුරු අනුවයි.

මම ඒක පිළිබඳ විශාල අධ්‍යයනයක් කරලා නැහැ, මට ලැබුණු තොරතුරු අනුවයි කරුණු කාරණා ඉදිරිපත් කළේ. ඔබතුමන්ලා දිගින් දිගටම රටට බොරු -ව්‍යාජ- තොරතුරු දෙනවා. මම මේක ඔබතුමාට කිව්වොත්, ඔබතුමා පිළිගනීවි. ජනාධිපතිවරයාත් බොරු කියනවා, ආණ්ඩුවේ මන්ත්‍රීවරුත් බොරු කියනවා.

දැන්, අදානිගේ මෙගාවොට් 500ක ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඔබතුමන්ලා අදහස් ප්‍රකාශ කරනවා, "මෙගාවොට් 50 ඩොලර් ශත 3.50ට නැත්නම් ශත 4.00ට දුන්නා. නමුත් අදානි ගන්න ආවේ ශත 8.00කට" කියලා. ඔබතුමා දන්නවා, මෙගාවොට් 500ක යන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන්න කොච්චර අමාරුද, නැත්නම් ඒක නිර්මාණය කරන්න අවශ්‍ය logisticsවලට යන වියදම කොච්චරද කියලා. මම නිකමට හොයලා ගත්තා. මම බැලුවා, මේ කථාව ඇත්තද කියලා. "මේ ටෙන්ඩරය දුන්නේ වැඩි ගණනකට, මීට වඩා අඩුවට ගන්න පුළුවන්" කියලා ජනාධිපතිවරයා හැම වෙලාවේම කියනවා. මම ඔබතුමාට අභියෝග කරනවා. ඔබතුමාට පුළුවන් නම් transmission line එකත් එක්ක මෙගාවොට් 500ක් ඊට වැඩිය අඩුවෙන් අරගෙන පෙන්වන්න, ඔබතුමාට මාස හයක් දෙන්නම්.

ගරු ඇමතිතුමනි, මේකේ තිබෙන භයානකකම තමයි මේ අවස්ථාව අපට නොලැබුණු නිසා ඉන්දියාවේ අදානි සමාගම,- මම අදානි සමාගම අඳුරන්නේත් නැහැ; දන්නෙත් නැහැ. මම වර්ටේටම කථා කරලා තොරතුරු ගත්තා. එතුමන්ලා මොකක්ද කියන්නේ? කැබිනට් සංශෝධන වාගේම, සාකච්ඡා 14කට පස්සේ ගණන ඩොලර් ශත 9.50ට පළමුවැනි එක ආවා. ඊට පසුව ඩොලර් ශත 8.00 දක්වා අඩු කරගන්න, ඒ කියන්නේ රුපියල් 23කට. ඔබතුමා පිළිගන්නවා, ලංකාවේ විදුලි ඒකකයක් නිෂ්පාදනය වෙන අන්තිම අඩුම ගණන රුපියල් 23යි කියලා. මම හිතන විධියට coal powerවලින් පවා. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා මේ ගැන දන්නවා. විදුලිය ඒකකයක් රුපියල් 23යි. අපට රුපියල් 23ට දෙන්න පුළුවන්. ගිගාවොට් ගැහුවා නම්, ගිගාවොට් භාගයයි මේකෙන් එන්නේ.

ඔබතුමා දන්නවා, ලංකාව වටේම තිබෙන්නේ සුළං කොරිඩෝව කියලා. ලෝකයේ තිබෙන හොඳම සුළං කොරිඩෝව තිබෙන්නේ ලංකාවේ. ගිගාවොට් 60ක් නිෂ්පාදනය කරන්න පුළුවන්. අපිට මේ chance එක miss කරගන්න, මහ හරින්න බැහැ. මහවැලිය අපට මහ හැරුණා නම්, අද අපි ඉන්නේ හාමතේ, මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි. එහෙම නම් අපට මේ රටේ ජීවත් වෙන්නත් බැරි වෙනවා. ඒ ඇමතිවරු නිවැරදි තීන්දු අරගෙන,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
තව ටිකක් කාලය දෙන්න. විනාඩි තුනක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අර කට්ටිය disturb කළා නේ. Thank you.

ගරු ඇමතුමනි, මම මේ කාරණයට ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. අදානි සමාගම ඉදිරිපත් කළ ටෙන්ඩරය අනුව, එය double-circuit 220 kV, 400 kV transmission line එකත් එක්ක ඩොලර් මිලියන 200ක් වෙනවා. ඔවුන් නිෂ්පාදනය කරලා අවුරුදු 10කින් ඒක අපේ ආණ්ඩුවට, පහසු ගෙවීමේ ක්‍රමයට දෙනවා. එතකොට අපට transmission line එක ලැබෙනවා. එතකොට ඒක CEB එකට ගන්න පුළුවන්. එතැන 500ක් හැදුවා නම්, තව 500ක් හදලා අපට ඊළඟට 2,000ක් හදාගන්න පුළුවන් නම්, - Mannar Basin එකේ 2,000ක් හදාගන්න පුළුවන්. රට වටේට 60ක් හදන්න පුළුවන්. අපි Mannar Basin එකේ ගිගාවොට් 2ක් හැදුවා නම්, අපට විදුලි ඒකකයක් රුපියල් 23ට දෙන්න පුළුවන්, ගරු ඇමතිතුමනි. අපට වතුකරයේ ජනතාවට විදුලිය අඩුවෙන් දෙන්න පුළුවන්, පඩි වැඩි කරනවා වාගේ. අපට ඒ විදුලිය රුපියල් 750ට දෙන්න පුළුවන්. රුපියල් 6,000 විදුලි බිල රුපියල් 750ට ගෙනෙන්න පුළුවන්. දැන් රුපියල් 60කට ඒකකයක් දෙන්නේ. බොරු කියලා මේ chance එක නැතිකරගත්ත නිසා, "50ක් ශත 3.50ට, 4.00ට දුන්නා. මේක ශත 8.00ට දුන්නේ" කියලා රටට පව ගහන්න එපා. මෙගාවොට් 500 මේ ගණනට ගේන්න බැහැ, ලෝකයේ කොහේවත්. පිලිපීනයේ ශත 8ක් යනවා. ඒ වාගේම අප්‍රිකාවේ ශත 13ක්, ශත 14ක් යනවා. මෙන්න මේ වාගේ ප්‍රමාණයක් වෙනවා, අනෙක් රටවල.

මම අදානි සමාගමට කථා කරලා ඇහුවා, අපේ රටවල ගණන් ඇයි කියලා. එතුමන්ලා කිව්වා, logistics නිසා කියලා. ඉන්දියාවේ ශත 4ට පුළුවන්. මොකද, ඉන්දියාවේ ඔක්කොම logistics ටික තිබෙනවා. ලංකාවේ මේ භාණ්ඩ නැහැ. මේ භාණ්ඩ ලංකාවට ගෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, අදානි ලංකාවට ආවා නම් අද ලංකාව ජාත්‍යන්තරයේ අවධානයට ලක් වෙනවා. මොකක් නිසාද ලංකාව අවධානයට ලක් වෙන්නේ? මොනවාද ජනාධිපතිතුමා ගිහින් කථා කරන්නේ? පොඩි හනුමා ගැන කථා කරනවා. ලොකු හනුමා තමයි ගිහිල්ලා පන්සල ගිනි තිබ්බේ. ගිනි තියලා ගින්දර වැපිරිලා වටේට යනකොට පොඩි හනුමාව හොයනවා. රට ගිහින් මොකක්ද කියන්නේ? හැම දාම කුඩු කථාව. නැත්නම් පාතාලය ගැන කියනවා. ඕවා නොවෙයි කථා කරන්න ඕනෑ. ජනාධිපතිතුමාට අපි කියනවා, අනෙක් ජාත්‍යන්තර නායකයින්ගෙන් ඉගෙන ගන්න කියලා. ජාත්‍යන්තරයට ගිහින්; UN එකට ගිහින් කථා කරන්න, බලශක්තිය ලංකාවට ගෙනෙන්නේ කොහොමද කියලා. කාටද ගෙනෙන්න පුළුවන්? ශත 7.50ට කාටද දෙන්න පුළුවන්? ශත 8.00ට අදානිලා ඉල්ලුවා. ශත 7.50ට අපට කවුරුවත් එකඟ වෙනවාද? අපට ඒ සහයෝගය දෙන්න කියලා ඉල්ලන්න. ගරු ඇමතිතුමනි, එහෙම වුණොත් අනාගතයේ අපට මේ රට ගොඩගන්න පුළුවන්. බලශක්තිය සම්බන්ධයෙන් අපට වැරදුණ තැන ඔබතුමන්ලා නිවැරදි කරගන්න. මේක රටේ ඉදිරි අනාගතයට විශාල කැළලක්; පැල්ලමක්. අපට මේක දිගටම කරගන්න බැරි වුණොත් මොකද වෙන්නේ?

LTL එක ගැන කථා කරන්න මට වෙලාවක් නැහැ. LTL එකට නඩු දාලා පගා අරගෙන හිටියේ. ඒ නඩුව අයින් කරගත්තා. මගේ යාළුවෙක් LTL එකේ නඩුව කළේ. මේ දැන් කථා කරපු ඔබතුමන්ලාගේ ඇමති කෙනෙක්. ඒක ගැන ඔබතුමා හොඳට සොයලා බලන්න. LTL එක සියයට 70ක් විතර අල්ලාගෙන ඉන්නවා, monopoly එකක් තියාගෙන. LTL එකේ ඉන්න CEB එකේ ඉංජිනේරුවන්ටත් ගෙවනවා; වටේ ඉන්න දේශපාලනඥයන්ටත් ගෙවනවා. LTL එකෙන් පිට වැඩ කරන්න කොච්චර අමාරුද කියලා ඇමතිවරයා වශයෙන් ඔබතුමා දන්නවා නේ. ඔක්කොම ටෙන්ඩර් යන්නේ LTL එකට. කිසිම පෞද්ගලික ධනයක් නොයොදා ආණ්ඩුවෙන් ණය අරගෙන. ගන්න ටෙන්ඩරුත් ආණ්ඩුවෙන් ගන්නේ. මොකද, ඒ ටෙන්ඩර් පටිපාටිය අයින් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මට ආරංචියක් ලැබුණා -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පසුව ලබා ගත් කාලයත් ඉවරයි.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Please give me one more minute, Sir.

ගරු ඇමතිතුමනි ආරංචියක් තිබුණා, LTL එකට conflict of interest එකක් තිබෙනවා නම් ටෙන්ඩර්වලට ඉදිරිපත් වෙන්න බැහැ කියලා. ඒ clause එක අයින් කරලා, ඒකේ ඉන්න නිලධාරින්ම තමයි ඒකට ඉදිරිපත් වෙන්නේ කියලා ආරංචියක් තිබුණා. ඒ නිසා මේක ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, ඉතා ඉක්මනින් මේ ගැන හොයන්න. ගරු ඇමතිතුමනි, නඩුව දාලා පගා අරගෙන ඉල්ලා අස්කරගත්තේ කවුද කියලා සොයන්න. නම් කියන්නේ නැහැ, මම. ඔබතුමා දන්නවා, ඒ නඩුව කළේ කවුද කියලා. මගේ නීතිඥ මහත්මයෙක්. එපා කියද්දී ඉල්ලා අස් කරගත්තේ, LTL එකට chance එක දෙන්න. මේ ඔක්කොම සුදනෝ වාගේ කථා කළාට දැන් පගා මරුවෝ බවට පත් වෙලා. තවම අවුරුද්දයි ගියේ, තව හොඳ හොඳ සෙල්ලම් එළිවෙන ජාමේට බලාගන්න පුළුවන්. අර කට්ටිය අවුරුදු 17ක්, 18ක් ඉඳලා. මේ, එක අවුරුද්දට.

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉතා ඉක්මනින් මේක කෙළින් කළේ නැත්නම්, මොකක්ද වෙන්නේ? බොරු කිය-කියා ජනතාව අන්දනවා. අපි ජනතාවට මේ සහනය ලබා දුන්නේ නැත්නම්, මහවැලියෙන් අපේ නායකයන් කළා වාගේ ඔබතුමා ඒ අවස්ථාව ලබා නොදුන්නොත්, ඉතා ඉක්මනින් -අවුරුදු දෙකක් යනකොට - මේ කරන ජනතා විනාශයට ඔබතුමන්ලාව අනිවාර්යයෙන්ම ගහලා පන්නන්න ජනතාවට සිද්ධ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.28]

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ජාතික ආර්ථිකය සහ ආර්ථික සංවර්ධනය කියන කාරණා ගත්තාට පස්සේ, එහිදී ඉතාම වැදගත් කාර්යභාරයක් ඉෂ්ට කරන බලශක්ති

අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයට එකතු වන්න ලැබීම සතුටක්. අද උදේ ඉඳලා මේ විවාදය අහගෙන ඉන්නකොට දැනුණු කාරණාවක් තමයි, අපේ රටේ බලශක්ති ක්ෂේත්‍රය ගැන විතරක් නොවෙයි, බලශක්තිය ක්ෂේත්‍රය ඇතුළු අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳව උපදෙස් විශාල ප්‍රමාණයක් විපක්ෂයෙන් අපට ලබා දුන්නා. රට සංවර්ධනය කළ යුතු ක්‍රමවේද, රැගෙන යා යුතු දිශාව, රටේ තිබෙන ආර්ථික ශක්තීන්, ඒවා උපයෝජනය කර ගන්නා ආකාරය පිළිබඳ පාඩම් විශාල ප්‍රමාණයක් ඔවුන් අපට ලබා දුන්නා. අපි එක පැත්තකින් ස්තුතිවන්ත වනවා, ඒ පෙන්වා දීම සම්බන්ධව. නමුත් ඒත් එක්කම නැඟෙන ප්‍රශ්නය තමයි, මේ තාක්කල් බලය හොබවමින් ඉඳලා, අද ඔය උපකල්පනය කරන තැන්වලට මේ රට අරගෙන යන්න බැරි වුණේ ඇයි කියන එක. විශේෂයෙන් උදේ ඉඳලා මතු කරපු කාරණා බැලුවාම, පොඩි තර්ක කිහිපයක් මෙහි තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, point of Order එක මොකක්ද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ස්ථාවර නියෝග 92. ගරු මන්ත්‍රීතුමනි, මහවැලිය හැදුවේ අපි; සූර්ය බල සංග්‍රාමය කළේ අපි; tender අරගෙන ආවේ අපි. එතකොට මේ රටට සියයට 100ක් විදුලිය දුන්නේ අපි. JVP එක නොවෙයි. ඒක දැනගන්න. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
There is no point of Order in that. - *[Interruption.]*

මෙහෙමයි, මහවැලිය සම්බන්ධව කියන කාරණය හරි. ඒ වාගේ හොඳ දේවල් තිබෙනවා. මම කිව්වේ ඔබතුමන්ලා බලශක්තිය සම්බන්ධයෙන් කියපු අනෙක් දේවල් සම්බන්ධයෙන්. විශේෂයෙන්ම ඔබතුමන්ලාට renewable energy සම්බන්ධව කොයිතරම් දේවල් කරන්න තිබුණාද, කොයි තරම් නම් තැනකට යන්න තිබුණාද කියන කාරණාව. You could have done that. So, that is what I mentioned.

ඒ සම්බන්ධයෙන් මම කියන ඊළඟ කාරණය මෙයයි. දැන් මෙතැන හැමදාම කෑගහනවා, අපේ රටේ දුප්පත්කම සියයට 80කට ගෙනැල්ලා තිබෙනවා කියලා. කෙසෙල් ගෙඩියේ තමන්ගේ නම ගහලා බෙදලා, එහෙම තමයි මේ පාලකයෝ රට කරගෙන ගියේ. ජනතාව අන්ත අසරණ වෙලා, ජන පීඩාවක් ඇවිල්ලා තිබෙන කොට, කෙසෙල් ගෙඩියේ නම ගහලා බෙදලා රට පාලනය කරලා දැන් කියනවා, දුප්පත්කම මෙන්න මෙතැනට ඇවිල්ලා තිබෙනවා ලු. අපි දන්නවා, දුප්පත්කම එතැනට ගෙනැල්ලා තිබෙනවා කියලා. ඒ නිසා අපි ඒ දුප්පත්කම එතැනින් පහළට ගේන්න අවශ්‍ය කරන මැදිහත්වීම් කරන්න අපේක්ෂා කරනවා.

ඊළඟට මාධ්‍ය නිදහස සම්බන්ධයෙනුත් අද කථා කළා. අපේ ජනමාධ්‍ය ඇමතිතුමාට දැඩි ප්‍රහාරයක් අද දවසේ එල්ල කරන්න උත්සාහ කළා. අපි ජනමාධ්‍ය නිදහස රකින ආණ්ඩුවක් විධියට විශේෂයෙන්ම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. 2019 කාලයේදී ලසන්ත වික්‍රමතුංගව ඝාතනය කරලා, ෆෙඩ්රිකා ජැන්ස්ට මරණ තර්ජන කරලා දරු දෙදෙනා එක්ක එළවලා, පෝද්දල ජයන්තව අරගෙන ගිහිල්ලා පහරදීලා මහ මඟ දාලා ගිහින්, කීත් නොයාර් පැහැර ගෙන ගිහිල්ලා, 2011දී සිරස නාළිකාවට බෝම්බ ගහලා, ඒ ඔක්කෝම කරලා, දැන් නමක් කිව්වා කියලා ඇවිල්ලා කියනවා, මාධ්‍ය නිදහස සම්බන්ධව කටයුතු කරන්නේ මෙහෙමයි කියලා. ඒ නිසා පාර්ලිමේන්තුව ඇතුළේ යම් ප්‍රකාශයක් කළා පමණයි. ඒ නිසා මාධ්‍ය නිදහස සම්බන්ධව කථා කරනකොට ඔයිට වඩා වටිනාකමක්, ඔයිට වඩා වගකීමක් තිබෙන්න ඕනෑ. මාධ්‍ය නිදහස ආරක්ෂා කරන ලද පුද්ගලයින් විසින් ඒ උපදේශය දෙනවා නම්, ඒ උපදේශය පිළිගන්න අපි සූදානම්.

ඒ වාගේම අද දවසේ කථා කරන මාතෘකාවට ආවොත්, බලශක්තිය කියන කාරණය ගැන කථා කරනකොට, මේ රටේ ඒවා කරලා තිබෙන්නේ කොහොමද කියන කාරණාවත් පැහැදිලියි. එක්තරා මන්ත්‍රීවරයෙක් පැහැදිලි කළා, අපේ රටේ විදුලිබල මණ්ඩලයේ ඉන්න ඕනෑ, 12,000ක් 13,000ක් විතර පිරිසක් කියලා. නමුත්, ඒ සංඛ්‍යාව 27,000කට වැඩි කර තිබෙනවා. ඒ සංඛ්‍යාව දැන් 23,000කට අඩු වෙලා තිබෙනවා. ඒකේ තිබෙන optimum use එක ගන්න නම්, 12,000ක් 13,000ක් ඒ ආයතනයේ හිටියාම ඇති කියනවා. එතකොට කවුද 27,000කට ඒ පිරිස වැඩි කළේ? අපි අද කථා කරලා බැලුවාම දකින දේ තමයි, විදුලිබල මණ්ඩලයේ top-level management එක අඩුයි කියන එක. හැබැයි lower level එක පුරවලා තිබෙනවා. ඒවා පුරවලා තිබෙන්නේ කොහෙන්ද? මාතරින්, කෑගල්ලෙන් හා රත්නපුරෙන් දම්පු අයගෙන්. ඒ අදාළ ප්‍රදේශයෙන් ඇමතිවරයා පත් වනකොට, ඒගොල්ලන් ගිහිල්ලා මේ ආයතන පහළ මට්ටමේ සේවකයන්ගෙන් පුරවනවා. ඒක නිසා ඒවා පාඩු ලබන ආයතන බවට පත් කරලා තිබෙනවා.

මම මෙහිදී එක කාරණයක් ඉදිරිපත් කරන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, economynext.com කියන website එකේ සඳහන් කරනවා, ලංකා විදුලිබල මණ්ඩලයේ තිබෙන රුපියල් බිලියන 413ක පාඩුව ගැන. එහි මෙසේ සඳහන් කරනවා:

> "Under Rajapaksa regimes, state energy enterprises ran losses due to political decisions to subsidize energy off-budget and the Ceylon Electricity Board also did not submit requests to the regulator, most of the time to raise prices as the rupee fell or fuel or other costs rose."

තවදුරටත් පැහැදිලිවම මේකේ සඳහන් කරනවා, කොතැනින්ද මේ පාඩුව කළේ කියලා. තමන් ගත්තා වූ දේශපාලන තීන්දු, වැරදි කළමනාකරණ මූලධර්ම ඇතුළු මේ සියල්ලත් එක්ක අපේ රට මේ තැනට අරගෙන ඇවිල්ලා, දැන් මෙතැන එක එක දේවල් ප්‍රකාශ කරනවා. ඒක නිසා ඒ කියා තිබෙන දේවල් සම්බන්ධයෙන් අපි කනගාටු වනවා. විශේෂයෙන්ම අද ලෝකය ගමන් කරන දිශාව දෙස බලන්න. ආණ්ඩුවක් විධියට අපි උත්සාහ කරමින් තිබෙනවා, විශේෂයෙන්ම බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කරන්න සහ පුනර්ජනනීය බලශක්තියට තිබෙන ප්‍රවේශ පුළුල් කරන්න.

ඒ වාගේම ජාතික ආර්ථික සංවර්ධනය සඳහා බලශක්තිය දායක කර ගන්නේ කොහොමද කියන කාරණාව පිළිබඳව කථා කරන්නත් අපි අපේක්ෂා කරනවා. ඒ වෙනුවෙන් අය වැයෙන් රුපියල් බිලියන 23කට වඩා මුදලක්, පුනරාවර්තන වියදම් සඳහා රුපියල් බිලියන 22ක් වෙන් කරලා ඊට අවශ්‍ය පියවර අපි අරගෙන තිබෙනවා.

[ගරු රුවන් විජේවීර මහතා]

ලෝකය ගමන් කරන දිශානතිය බැලුවාට පස්සේ විශේෂයෙන්ම ගෝලීය බලශක්ති පුරෝකථනයන්ට අනුව අන්තර්ජාතික පුනර්ජනනීය බලශක්ති ඒජන්සිය විසින් මෙන්න මෙහෙම කාරණාවක් සඳහන් කරනවා. විශේෂයෙන්ම 2022 වර්ෂය වනකොට සාමාන්‍යයෙන් පොසිල ඉන්ධන සියයට 63ක් අපේ රට ඇතුළු ලෝකය භාවිත කළා. ඒක 2050 වර්ෂය වනකොට සියයට 12ක් දක්වා අඩු වනවා. ඒ වාගේම ඍජු පුනර්ජනනීය බලශක්තිය 2022 වර්ෂය වන විට සියයට 23ක ප්‍රමාණයක තමයි තිබුණේ. ඒක සියයට 52ක් දක්වා වැඩි වනවා. 2050 වාගේ කාලය වනකොට renewable energy සියයට 81ක් දක්වා වැඩි වනවා කියන්නේ International Renewable Energy Agency එක. ඔවුන් විසින් තමයි මේ report එක නිකුත් කරලා තිබෙන්නේ. ඒ නිසා renewable energyවලට ලොකු ඉඩක්, space එකක් නිර්මාණය වෙලා තිබෙනවා.

2025.05.14වැනි දින අපේ රට සම්බන්ධයෙන් "The Island" e -paper එකේ මෙන්න මෙවැනි වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා, I quote:

> “The future energy carrier will be green hydrogen produced by solar and wind  power, which are available in great abundance for us. Throughout the world, a GH revolution is taking place.”

දැන් මෙතැන කියන්නේ අපට ලොකු space එකක් තිබෙනවා කියලායි. මේකේ එක තැනක සඳහන් කරනවා, "Our country is thus sitting on a goldmine” කියලා; අපි ඉඳගෙන ඉන්නේ රන් ආකරයක් උඩයි කියලා මෙහි කියනවා. ඒක නිසා අපි විවිධ පියවර අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම අපි මේ වනකොට උත්සාහ කරමින් තිබෙනවා, renewable energy කියන එකට තිබෙන්නා වූ ඉඩකඩ සහ renewable energy කියන එකට අපේ රටට යන්න පුළුවන් තැන, අපේ රටට අත්කර ගන්න පුළුවන් දේවල් ටික අත්පත් කර ගන්න. විශේෂයෙන්ම අපි ඒ වෙනුවෙන් උත්සාහ කරමින් තිබෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.36]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඉතාම වැදගත් විවාදයක් තමයි අද සිද්ධ කරන්නේ. හේතුව, මේක මම පළමු දවසේම ඉඳන් කියන දෙයක්. මේ ආණ්ඩුව බලයට ආවේ අපේ රටේ ප්‍රධාන ප්‍රශ්නය හොරකම කියලායි. මම එදා ඉඳන් කියනවා, දැනුත් කියනවා, මේ රටේ ප්‍රධාන ප්‍රශ්නය හොරකම නොවෙයි කියලා. හොරකමත් එක ප්‍රශ්නයක් තමයි. මේ රට දියුණු නොවෙන්න මේ දශකය තුළත්, ඉදිරි කාලයේත් බලපාන ප්‍රධාන අර්බුදය තමයි, බලශක්ති අර්බුදය. බලශක්තිය අඩු මිලට, අඛණ්ඩව, දිගින් දිගටම ඉල්ලුමට සරිලන ලෙස සපයන්න පුළුවන් නම් මේ රට දියුණු මාවතකට ගෙන යන්න ඒක ඉතාම පහසුවක් වනවා. ඒ වාගේම තමයි, මේ කථාව හරිද කියලා අපේ රටේ ජනතාවටම බලාගන්න අවස්ථාව ලැබෙනවා, අඩු මිල ගණන් යටතේ බලශක්තිය අතින් අපි ස්වයංපෝෂිත වුණොත්. එම නිසා මේ රටේ ප්‍රධාන ප්‍රශ්නය විසඳනවා නම්, විසඳිය යුතු අංක එකේ ප්‍රශ්නය මේකයි. මේ ප්‍රශ්නය විසඳීමෙන් පසුව තමයි මේ රටේ වේගවත් ආර්ථික ගමනක් ආරම්භ වන්නේ. ලංකාවද ඇතුළු ලෝකයේ ඕනෑම රටක ආර්ථිකය විශාල පිම්මක් පැනපු හැම අවස්ථාවක්ම අඩු මිල බලශක්තිය අතින් ස්වයංපෝෂිතව තිබුණු කාලයක් වුණා. ඒක 1997 වර්ෂය විතර වෙනකම්ම තිබුණා. ඊට පස්සේ තමයි ක්‍රමිකව සැපයුම ප්‍රමාණවත් නොවීම නිසා විවිධ ගැටලු මත මේ ප්‍රශ්න නිර්මාණය වුණේ.

ඉතින් තව පොඩි කාරණා ටිකක් මේ කථාවට අදාළව කියාගෙන ගියොත්, මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, උපකල්පනය කරපු තැන්වලට එන්න බැරි වුණා කියලා. එහෙම බැරි වෙච්ච හේතුව මෙයයි. මේ බලශක්තිය හා සම්බන්ධව වැඩ කරපු හැම මොහොතකම එවකට විපක්ෂයේ එක කණ්ඩායමක් හිටියා, JVP එක කියලා. ඒ සියලුදෙනා මේ තැන්වලට ගිහිල්ලා උද්ඝෝෂණය කරලා, ඒවා කඩාකප්පල් කළා. 2014දී සාම්පූර් බලාගාරය ඉදි කළා නම්, මේ ප්‍රශ්නවලින් සෑහෙන කොටසක් විසඳා ගන්න තිබුණා. අන්න, ඒ කණ්ඩායම දැන් විපක්ෂයේ නැති එක තමයි මේ ආණ්ඩුවට තිබෙන ඊළඟ වාසිය.

ඊළඟට, කෙසෙල් ගෙඩියක් ගැනත් කිව්වා නේ. කෙසෙල් ගෙඩියක්වත් බෙදන්නේ නැතුව බලය ලබා ගත් මිනිස්සුන්ට, සියලු දේවල් ටික බෙදලා අන්තිමට කෙසෙල් ගෙඩියක් ඉතුරු වෙලා ඒක දුන්නාම, ඒකේ ෆොටෝ එකක් ගහලා ඒකේ දේශපාලන වාසිය ලබා ගන්න පුළුවන්. හැබැයි, කෙසෙල් ගෙඩියක්වත් මිනිස්සුන්ට නොදී බලය ලබා ගත් කණ්ඩායමක් කෙසෙල් ගෙඩිය දුන්නේ ඇයි කියන තැනට ඇවිල්ලා තිබෙනවා.

ඊළඟ කාරණාව මෙයයි. දිගටම කිව්වා, කාටද ගිනි තිබ්බා, අරහෙට ගිනි තිබ්බා කියලා. ඔව්, ඒවා ඇත්ත. අපිත් ඒවා දැක්කා. හැබැයි, 2005දී JVP එක විසින් යම් කෙනෙක් මේ රටේ ජනාධිපති කළා. ඒ ජනාධිපති කරපු කෙනාගේ කාලයේ තමයි ගිනි තිබ්බේ. 2008, 2009, 2010 කිය කියා කිව්වා නේ. 2005දී මේ රටේ ජනාධිපති කෙනෙක් පත් කළා, JVP එක. අන්න, ඒ කාල සීමාවේ තමයි ඕක කළේ. ඒ නිසා package එකම භාර ගන්න කියලා කියනවා.

ඊළඟට, සේවකයන් ස්ථිර කිරීම ගැනත් කිව්වා. ඇත්ත, සේවකයන් සංඛ්‍යාව වැඩි ඇති. හැබැයි, සේවකයන්ගේ වැටුප සඳහා යන මුදල මේ ප්‍රධාන ප්‍රශ්නයට බලපාන්නේ නැහැ. ඊළඟ එක, සේවකයන් ස්ථිර කරන්න කියලා කවුද කිව්වේ? අර රන්ජන් ජයලාල් වාගේ අය ඔබතුමන්ලාගේ පාලන බලය ගෙන ඒම සඳහා මිනිස්සු එකතු කරගෙන, මැන්පවර් සේවකයන් ගත්තොත්, ඒ අය ස්ථිර කරන්න කියලා, අනන්මනන් සියලු දේවල් ටික කරලා, දැන් සුදනෝ වාගේ අනික් මිනිස්සුන්ට කථා කරනවා. ඒ නිසා ඔබගේ කථාවට පොඩ්ඩක් උත්තර නොදුන්නොත්, ඔබේ ඩිජිටල් ත්‍රස්තවාදීන් ටික එකතු වෙලා ඔය කැල්ල දානවා. ඒ නිසා මේකත් එක්කම දාන්න කියලා කියනවා, ඒ ත්‍රස්තවාදීන්ට.

ඊළඟ කාරණාව, රටක සාමාන්‍යයෙන් විදුලි බල ඉල්ලුම දළ දේශීය නිෂ්පාදනයත් එක්ක අනුලෝමව සමානුපාතික වනවා. ඒ වාගේම තමයි කලින් කාරණාවේ තව එකක් තිබෙනවා, අර ඔබතුමා කියවපු තැනම මමත් කියෙව්වා. පහළ සේවකයන් වැඩිවීම විදුලිබල මණ්ඩලයේ ප්‍රශ්නයක් තමයි. හැබැයි, ඉහළ නිපුණතාවක් සහිත අයගේ වැටුප් සහ පහසුකම් ලබා නොදීමත් එක ප්‍රශ්නයක්. ඔබ වැඩිපුර සැලකිලිමත් වන්නේ නිපුණතාව තිබෙන අයට පහසුකම් සැලසීම වෙනුවට නිපුණතාව නැති අර වැඩි පිරිසක් ඉන්න පහළ රැකියා ස්තරයට පහසුකම් ලබා දෙන්න කියලාත් ඒ ලිපියේම තිබුණා, ඒක කියවපු වෙලාවේ මාත් ඒක දැක්කා.

ඊළඟ කාරණය, රටක සාමාන්‍ය විදුලි ඉල්ලුම වැඩි වනවා කියන්නේ මරු. විදුලි ඉල්ලුම වැඩිවීම තමයි රටේ දියුණුව පෙන්වන සාධකය. මුලින්ම පටන් ගන්නේ එතැනින්. ආර්ථිකයේ ප්‍රතිලාභ ලැබෙන්න කලින් අවුරුද්දකට කොයි තරම් ප්‍රමාණයක් අලුතෙන් විදුලි සැපයුම් ඉල්ලනවාද, වාර්ෂිකව විදුලි සැපයුම් වැඩිවීම කොපමණද කියන අන්න ඒ දේවල්වලින් තමයි රට නිවැරදි ගමන් මාර්ගයක යනවා කියලා අපට දකින්න ලැබෙන්නේ. හැබැයි, මේ පසුගිය වසරක කාල සීමාව තුළ අර ඇදී ඇදී තිබුණු සමාගම්වලට වෙන් කිරීමේ ක්‍රියාවලිය හැර රෙගුලාසි ලිහිල් කරන්න, පවතින දැඩි නීති රීති අඩු කරලා, ඒවා පහසු කරලා, ආයෝජන ගෙන්වා ගන්න වෙන ගත් ක්‍රියාමාර්ග මොනවාද කියලාත් මම ආණ්ඩුවෙන් අහන්න කැමැතියි.

ඒ වාගේම තමයි, විදුලි බල ක්ෂේත්‍රය පළමුවෙනි වතාවටයි මේ විධියට පෞද්ගලික අංශයට විවෘත කරන්න උත්සාහ කරන්නේ. පෞද්ගලික අංශයට මේ විදුලි බල ක්ෂේත්‍රය විවෘත කිරීම හරහා විදුලි බිල අඩු කරන්න පුළුවන් කියලා ඔබ දිගින් දිගටම කියනවා. ඒක සතුටක්. හේතුව, ඔබ මෙතෙක් කල් විශ්වාස නොකළ වෙළෙඳ පොළ ක්‍රමය කියන්නේ ඔන්න ඕකට. මේ රටේ මිනිස්සුන්ටත් කියනවා බලාගෙන ඉන්න කියලා, විදුලි බිල අඩු වනවා නම්, අන්න ඒ අඩුවන ක්‍රමවේදය ඇතුළේ අපි බලාපොරොත්තු වන, අපි කැමැති, අපි කරමු කියන වෙළෙඳ පොළ තරගකාරිත්වය තුළින්, දක්ෂිණාංශික ආර්ථික ප්‍රතිපත්ති මඟින් කොහොමද භාණ්ඩ හා සේවාවල මිල අඩු කරන්නේ කියලා බලාගන්න පුළුවන් බව, ඔය ඔබ නම් කරන ආයෝජන පැමිණීම හරහා. මම දැක්කා, පොඩි ප්‍රමාණයක රෙගුලාසි ලිහිල් කරලා, සමාගම්වලට වෙන් කරනවා කියලා කියපු තැන ඉඳලා විවිධ ආයෝජකයින් මේ සඳහා ආයෝජනය කරන්න එනවා කියලා ඔබේ කථාවල කියනවා.

ඒක සතුටක්. හේතුව, එහෙම කරලා තමයි මේ රට ගොඩනඟන්න පුළුවන් වන්නේ. එහෙම නැතුව මධ්‍යගත සමාජවාදී සැකැස්මක හිර කරගෙන ඉඳලා මේ දේවල් කරන්න බැහැ. ඒ නිසා ඔබ මේ ගනු ලබන හොඳ ක්‍රියාමාර්ග ඇත්තටම අපි අගය කරන්න ඕනෑ. සමාජවාදී සෙරෙප්පුව ගලවලා යන්තම් එක කකුලකට හරි ධනවාදී සපත්තුවක් දා ගැනීම රටේ ජනතාවගේ පැත්තෙන් යහපතක්. අපි ඒක අගය කරනවා. තව තවත් ඒ ක්ෂේත්‍රයට පෞද්ගලික අංශයට ඇතුළු වන්න පුළුවන් අවස්ථා සලසන්න කියලාත් මා ඉල්ලනවා.

තව කාරණාවක් තිබෙනවා. විදුලිබල නියෝජ්‍ය ඇමතිතුමාත් මෙතැන ඉන්නවානේ. පසුගිය දවසක රූපවාහිනී විවාදයකදී ඔබතුමා අපේ චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා එක්ක යම් කථා ටිකක් කිව්වා. මේ අවුරුද්දේ ලාභය සහ අලාභය පිළිබඳව පොඩි පොඩි කථා ටිකක් කිව්වා. ඔබතුමාට පුළුවන් මගේ කථාවෙන් පස්සේ ඒකට උත්තර දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නොවැම්බර් 18 වැනි දා "ඩේලි මිරර්" පුවත් පතේ සඳහන් වන්නේ කොහොමද? ඒ මෙහෙමයි: "පළමු කාර්තුව තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ අලාභය බිලියන 18.4යි. දෙවැනි කාර්තුවේ ලාභය බිලියන 3.5යි. හැබැයි, තුන්වැනි කාර්තුවේ ලාභය බිලියන 5.31යි. ඒ අනුව මේ වනවිට මේ සම්පූර්ණ කාල සීමාව තුළ තවම අලාභය බිලියන 9.58යි. හැබැයි, ගිය අවුරුද්දේ ජනවාරි - සැප්තැම්බර් කාලය තුළ ලාභය බිලියන 143.7යි. මෙවර අලාභය 9.58යි. ගිය අවුරුද්දේ ඔය කාලය තුළ ලාභය බිලියන 143.7යි." මේක පුවත් පත් වාර්තාවක්. හැබැයි, ඔබතුමා කියපු බොරුව මොකක්ද? වසර අවසන් වෙනකොට බිලියන 25ක් විතර ලාභ වෙනවා කිව්වා. ඔබතුමා එහෙම එකක් කිව්වා. එහෙම නම් මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. බිලියන 25ක් විතර ලාභ ලබන්න නම්, මේ අවසාන මාස 3ක කාල සීමාව තුළ ඔය විදුලිබල මණ්ඩලය බිලියන 35ක් විතර ලාභ උපයන්න ඕනෑ. මොකද, දැනටත් පාඩුයිනේ. ඔබතුමා කිව්වේ ඇත්තක් නම්, ඊළඟ ප්‍රශ්නය තමයි, මෙහෙම විචලනයක් සිද්ධ වෙන්නේ කොහොමද කියන එක. ලාභ වෙනවා, අලාභ වෙනවා එකම කාර්තුව තුළ. නමුත් මේ අවුරුද්දේ වර්ෂාපතන ඇද හැලෙමින් විවිධ විධියට දේශගුණය වෙනස් වුණේ නැහැ. එහෙම නම් මේ සා විශාල විචලනයක් වෙන්නේ කොහොමද? ඉන්ධන මිල වෙනස් වෙන්නේත් නැත්නම්, අච්චු-වැස්ස එකත් විශාල වශයෙන් වෙනස් වෙන්නේත් නැත්නම්, කොහොමද මේ විචලනය සිද්ධ වෙන්නේ කියලා ඔබතුමාගේ කථාවේදී සඳහන් කරන්න කියා මා කියන්න කැමැතියි.

එහෙම වෙනවා නම්, අනිවාර්යයෙන්ම ඩීසල් විදුලි බලාගාර එක්ක පොඩි ගනුදෙනුවක් කරමින් ඉන්නවා ඔබතුමාගේ ආණ්ඩුව හෝ කවුරු හරි කණ්ඩායමක්. හේතුව, ඩීසල් විදුලි බලාගාරවලට තමයි මේ රටේ වැඩිම මුදලක් වැය වන්නේ විදුලිය ඒකකයක් නිෂ්පාදනය කරන්න. ඒවා බහුතරයක් පෞද්ගලික විදුලි බලාගාර. ඒවායෙන් අපි විදුලිය මිලදී ගන්නවා. ඔබතුමා කියන විධියට මෙහෙම ලොකු විචලනයක් වෙනවා නම්, අනිවාර්යයෙන්ම එතැන කුමන හෝ වංචාවක් සිදු විය යුතුයි. මොකද, කාර්තු 2ක් පාඩු වෙනවා, තව කාර්තුවක ලොකු ලාභයක් ගන්නවා. එහෙම නම් එතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගැන ඔබතුමාගෙන් පැහැදිලි කරගන්න කැමැතියි, ඔබතුමා එදා කිව්වේ ඇත්තක් නම්. එදා කිව්වේ බොරුවක් නම්, ඒක බොරුවක් කියලා කියන්න. එතකොට ඒක එතැනින් ඉවරයි.

ඊළඟ කාරණාව මේකයි. අපේ රටේ විදුලි අවශ්‍යතාවෙන් සියයට 30ක් විතරම සපුරා ගන්නේ ඉන්ධන සහ ගල් අඟුරු බලාගාර භාවිතයෙන්. පසුගිය අවුරුද්දේ ඔබේ ආණ්ඩුව මේ ප්‍රතිශතය අඩු කරන්න අලුතින් ගත්ත සාර්ථක ක්‍රියාමාර්ග මොනවාද කියලාත් මම අහන්න කැමැතියි. හේතුව, ආණ්ඩු කටයුතු කළ යුත්තේ ජනතාවට වඩ වඩාත් යහපත සලසා දීමේ අරමුණින්. ඒ නිසා මම විශ්වාස කරනවා, ඔබේ ආණ්ඩුව පසුගිය අවුරුද්දේ ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කළ මුදල් වියදම් කරලා ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගන්න ඇති කියලා.

ඊළඟට, මේ කාරණයට අදාළව ලංකාවට වාර්ෂිකව ලැබෙන වර්ෂාපතනය ගැන බලන්න. ලංකාවට අවුරුද්දකට ලැබෙන වර්ෂාපතනයෙන් අප තවම සියයට 20ක්වත් පාවිච්චි කරන්නේ නැහැ. මම දන්නා තරමින් ඒ තරම්වත් පාවිච්චි කරන්නේ නැහැ. එහෙම නම් ඉතුරු ටික කොහොමද ජල විදුලිය උත්පාදනය කිරීම සඳහා යොදා ගන්නේ කියන අලුත් නිර්මාණශීලී පියවර ගැන හිතන්න කියලා මම ආණ්ඩුවට යෝජනා කරනවා. සුළං විදුලිය පිළිබඳවත් ලෝකය තුළ දැන් ප්‍රවණතාවක් තිබෙනවා. ඊට අමතරව සූර්ය විදුලිය පිළිබඳවත් ලෝකයේ දැන් අලුත් ප්‍රවණතාවක් තිබෙනවා. ඒ කටයුතු වෙනවා. හැබැයි, ඒ අතරතුර ලංකාවට ලැබෙන වර්ෂාපතනයෙන් සියයට 80ක් විතර අපි තවම බලශක්ති නිෂ්පාදනය සඳහා භාවිත කරන්නේ නැහැ. ඒ නිසා අලුත් විධියට මේ පිළිබඳව හිතලා විශේෂයෙන්ම අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ, මධ්‍ය කඳුකරයේ ජලය ගබඩා කළ හැකි විධියට -චළල්ලක් ආකාරයට- අලුත් සැලැස්මක් හැදුවොත්, ඒකෙන් පරිසර දූෂණය අවම කරගෙන සම්ප්‍රේෂණ පද්ධති වෙනස් කරගන්නේත් නැතුව විශාල දෙයක් කරගන්න පුළුවන් කියලා මම හිතනවා. හැබැයි, ඒ ගැන අලුතින් හිතන්න සිද්ධ වෙනවා. ඒ වාගේම අලුතින් ලොකු වැඩ ටිකක් කරන්නත් කියා අපි කියනවා, කානු ශුද්ධ කිරීම වාගේ පොඩි පොඩි දේවල්වලින් ජනතාවට සේවයක් කරන අතරතුර. මොකද, ලොකු ලොකු වැඩ නොකර, ලොකු ලොකු දේවල් නොකර ප්‍රතිලාභත් ලොකු ලොකුවට ගන්න බැහැ. මේවා තමයි මේ රටේ තිබෙන ප්‍රධාන ප්‍රශ්න.

[ගරු අමිල ප්‍රසාද් මහතා]

ඊට අමතරව, සීතාවක ආදී ප්‍රදේශවල කැලණි ගඟ ආශ්‍රිතව තව කොයි තරම් ප්‍රමාණයක් කුඩා ජල විදුලි බලාගාර ඉදිකරන්න පුළුවන්ද කියා බලන්න කියාත් මා යෝජනා කරනවා. මොකද, ඒ හරහා අපට පුළුවන් වේවි, කොළඹ ප්‍රදේශ ජලයෙන් යට වෙන එකෙන් බේරා ගන්න. ඒ වාගේම ජල සිතියම වෙනස් කරලා භෝග වගා කරන ප්‍රදේශවලට මේ ජල මාර්ග හරවා අලුත් විධියකට ලංකාවේ ජල සිතියමක් නිර්මාණය කරගන්න පුළුවන් වෙයි කියලාත් මම හිතනවා. ඒ නිසා මම යෝජනා කරනවා, කැලණි ගඟ ආශ්‍රිතව අලුත් කුඩා ජල විදුලි බලාගාරවලට අවස්ථාව සලසන්න කියා. ඒ වාගේම ආණ්ඩුවෙන් අහනවා, එවැනි කටයුතු ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ආණ්ඩුව ගෙන තිබෙන -ණය පහසුකම් ලබා දීම, රෙගුලාසි ලිහිල් කිරීම වාගේ- ක්‍රියාමාර්ග මොනවාද කියලාත්. මේ කාරණා සටහන් කරගෙන ඇමතිතුමාට පසුව උත්තර දෙන්න පුළුවන්.

ඊළඟ ප්‍රශ්නය මේකයි. මගේ කථාව ආරම්භයේදීත් මම කිව්වා, මේ ආණ්ඩුව පොඩි අර්බුදයකට මුහුණ දෙමින් ඉන්නවා, ටික ටික ඒ අර්බුදයෙන් ගැලවෙමිනුත් ඉන්නවා කියලා. ඒ තමයි මේ හැම තැනකම රාජ්‍ය සතු පංගුව රජය අල්ලාගෙන ඉන්න ඕනෑය කියලා හිතන අතරතුර පෞද්ගලික අංශයට විවෘත කරන්නත් උත්සාහ කිරීම. මෙන්න මේ කාරණය ඉතාම වැදගත්. මට මේකට උත්තරයක් අවශ්‍ය වෙන්නේ ඔබතුමන්ලාගෙන් නොවෙයි. මම හිතනවා එළියේ ඇති කියලා පුබුදු නිරෝෂන්. මට ඔහුගෙන් කොහේදී හරි තැනකදී උත්තරයක් ඕනෑ, මම මේ අහන්න හදන කාරණාව පිළිබඳව. අද දවසේදී දිගින් දිගටම මතු වෙච්ච කථාවක් තමයි ලංකාව තුළ සූර්ය බලයෙන් විදුලිය උත්පාදනය කරන්න මේ තරම් පුළුවන්කම තිබෙද්දීත් ඇයි ඒක කරන්නේ නැත්තේ කියන එක. මම විශ්වාස කරන විධියට ඒකට හේතුව තමයි, "බලශක්ති රාජ්‍ය සුරක්ෂිතතාව" කියන යල් පැන ගිය, මනෝමූලික අදහසක මේ ආණ්ඩුව ඉන්න එක. ඒක ලෝකයේ ගොඩක් රටවල නැහැ. නමුත්, "රාජ්‍ය විසින් බලශක්තියේ සුරක්ෂිතතාව බලා ගන්න ඕනෑ, පෞද්ගලික අංශයට දුන්නොත් ඒ ගොල්ලන් අප සමඟ තරහ වෙලා සප්ලයි එක නවත්වයි" වාගේ අදහසක මේ ආණ්ඩුව ඉන්නවා. ඒක තමයි මේ ප්‍රශ්නවලට ප්‍රධාන හේතුව.

ඇයි මම එහෙම කියන්නේ? ඒ ප්‍රශ්නය මොකක්ද? ඒ හරහා සිද්ධ වෙන දේ තමයි මේ ක්ෂේත්‍රයට ආයෝජන එන්න උත්සාහ කරනකොට අපි-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට තවත් විනාඩි හතරක් ලබා දෙනවා.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
බොහොම ස්තුතියි.

එතකොට මම කථා කරමින් හිටපු තැනට ආයෙත් ආවොත් එහෙම, වේගවත් ආයෝජන මේ රටට නොඑන්න මෙන්න මේ සංකල්පය බලපා තිබෙනවා. ඇයි, මම එහෙම කියන්නේ? දිගටම උදේ ඉඳලා අහපු ප්‍රශ්නය තමයි ලංකාවට මෙච්චර සූර්ය ශක්තිය ලැබෙද්දීත් අපි ඒක භාවිතා කරන්නේ නැත්තේ ඇයි කියන එක. භාවිතා කරන්න බැරි, grid එකේ ප්‍රශ්නය නිසා. හැබැයි, ආණ්ඩුව තවම ලෑස්ති නැහැ, grid එක නවීකරණය කරන්න. Grid එක නවීකරණය කරන්න ලෑස්තිවුණත්, සල්ලි නැහැ ආණ්ඩුවට. මම ඒකයි කිව්වේ, කොහේ හරි තැනකදී එතුමාට උත්තර දෙන්න කියලා. ඩොලර් බිලියන පහක වාගේ මුදලක් ඒ සඳහා යනවා. ඩොලර් බිලියන පහක් ඒකට වැය කරන්න මේ වෙලාවේ ආණ්ඩුවට බැහැ. ඩොලර් බිලියන පහ හරි, හතර හරි, තුන හරි යොදවලා මේ වෙලාවේ grid එක නවීකරණය කරන්නේ නැතුව, සූර්යාලෝකය හරහා එන අසමතුලිත ශක්තිය එකතු කරන එක අමාරුයි. මොකද, එක වෙලාවක හොඳට පායලා, තවත් වෙලාවක වලාකුළකින් ඉර වැහෙනවා; එකවර අඳුරු වෙනවා. එවිට සූර්ය බලය සැපයෙන්නේ අක්‍රමවත් ලෙස. ජලයෙන්, ඩීසල්වලින් විදුලිය නිපදවනකොට එහෙම නොවෙයි, ක්‍රමවත්ව සැපයෙනවා. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ මේ grid එක නවීකරණය කරන්නේ නැතුව, හැම නිවසකම වහලවල සූර්ය පැනල සවි කළත් මේ තිබෙන අසමතුලිතතාව නිසා ඒවා කොහොමද පද්ධතියට එකතු කරන්නේ? ඒ නිසා grid එක නවීකරණය නොකර ඔය එක දෙයක්වත් කරන්න බැහැ කියන එක තමයි මගේ දැනුම අනුව මට නම් තේරෙන්නේ. හැබැයි, ආණ්ඩුවට grid එක නවීකරණය කරන්න සල්ලිත් නැහැ, පෞද්ගලික අංශයට අවස්ථාවක් දෙන්නේත් නැහැ. දිගින් දිගටම කියනවා, අලුතින් සම්ප්‍රේෂණ පද්ධති ඉදිකරන ප්‍රදේශවල සහ අලුතින් විදුලිය ජනනය කරන ප්‍රදේශවල පෞද්ගලික අංශයට අවස්ථාව දෙනවා කියලා.

ඊළඟ ප්‍රශ්නය මේකයි. ලංකාවේ සියයට 90කටත් වැඩිය දැන් විදුලියෙන් පෝෂණය වෙලා ඉවරයි. එහෙම නම් තවත් සියයට 10කටත් වඩා අඩු ප්‍රදේශයකට විතරයි විදුලිය දෙන්න තිබෙන්නේ. ඒ ප්‍රදේශවල grid එක අලුතින් හැදුවා කියලා අපි බලාපොරොත්තු වන අරමුණ ඉෂ්ට වෙන්නේ නැහැ. එහෙම නම්, ඉස්සර වෙලාම මේ රටේ විදුලි අර්බුදයට දෙන්න පුළුවන් විසඳුම තමයි grid එක නවීකරණය කිරීම. ඒකයි මම ඔබෙන් අහන්නේ, grid එක නවීකරණය නොකර මේ සමස්ත පද්ධතියේ තිබෙන ශක්තිය අපි ගන්නේ කොහොමද කියලා. එතකොට ඔබතුමන්ලා මොකද කරන්නේ? ඔබතුමන්ලා කරන දේ තමයි අර මනෝමූලික තියරිය ඔළුවේ තියාගෙන ඉන්න නිසා, පහසුව සඳහා ඩීසල් බලාගාරවලින් දිගටම විදුලිය ගන්න එක. අර වැඩේ අමාරුයි, ඒක ඔබතුමන්ලා කලින් කියපු ප්‍රතිපත්තිවලට විරුද්ධයි. ඒ නිසා සූර්ය බලාගාර පුළුවන් තරම් දුර්වල කරන්න උත්සාහ කරනවා. ඒ සඳහා තමයි ඔබ සැපයුම අවම කරන පරිදි යම් යම් රෙගුලාසි ගෙනෙන්නේ. ඒකට ගෙවන මිල අඩු කරනවා, ඉල්ලන අයට අවස්ථාව දෙන්නේ නැහැ. අවසානයේදී මොකද වෙන්නේ? මම දන්නා අය ඉන්නවා, මුදල් අරගෙන වෙනත් රටවල ආයෝජනය කරන්න යනවා. ඒ ගොල්ලන් කැමැතියි ආයෝජනය කරන්න. හැබැයි විදුලිබල මණ්ඩලයට ඒ විදුලිය ගන්න බැහැ. අන්තිමට ඉංජිනේරුවන්ගේ වැටුප් වැඩිවීමයි, සේවක පඩි නඩියි එක්ක මහ ජනතාව ගැටෙන්න පටන් ගන්නවා, මේ ඇත්ත ප්‍රශ්නය ගැන කවුරුවත් කථා කරන්නේ නැතිව.

ඒ නිසා මම දිගින් දිගටම කියන්නේ, ආණ්ඩුවට සිද්ධ වෙනවා, මේ දෙබිඩි ප්‍රතිපත්තියෙන් අයින් වෙලා ඇත්ත ප්‍රතිපත්තියට එන්න. මම ඉල්ලීමක් කරනවා. මේ grid එකේ රාජ්‍ය අයිතිය තියාගෙන, යම් ප්‍රතිශතයක් පෞද්ගලික අංශයට විවෘත කරන්න කියලා. ඒ එන සල්ලි ටික අරගෙන grid එක නවීකරණය කළොත්, මේ රටේ බලශක්ති අර්බුදයේ තිබෙන සෑහෙන ප්‍රශ්න ටිකක් විසඳා ගන්න පුළුවන්. ඒක කරපු ගමන් අසාමාන්‍ය ආයෝජන ප්‍රමාණයක් මේ රටට විදුලිබලය හා සම්බන්ධයෙන් එනවා කියලා මම විශ්වාස කරනවා. ඒක "නැහැ" කියලා කවුරු හරි කියනවා නම්, ඒ අයට පුළුවන් ඒ සඳහා තර්ක ඉදිරිපත් කරන්න. නමුත් මම විශ්වාස කරනවා ඒක එහෙමයි කියලා. ඒකයි මම එතුමාගෙන් ඒ ප්‍රශ්නය ඇහුවේ.

ඊළඟ කාරණය මේකයි. මේ මුදල් ප්‍රමාණය උපයා ගන්න බැරි නම්, ආණ්ඩුවට මේක තියා ගන්න ඕනෑ නම් සිද්ධ වෙනවා, තමන් සතුව පවතින මොනවා හරි assets විකුණන්න. ඒවා විකුණලා ඕනෑ නම් පුළුවන්, ඒ එන සල්ලි ටික ක්‍රමවත්ව මේ සඳහා යොදා ගන්න. ඉතින් ඒ දේ නොකර කවදාවත් මේ රටේ සූර්ය බලයෙන් කොයි තරම් විදුලිය නිපදවූවත් ඒ ටික පද්ධතියට එකතු කරන්න බැහැ. ඒ නිසා ඒ වෙනුවෙන් ක්‍රියාමාර්ග ගන්න කියලා මම කියනවා. මේ තාක්ෂණික කරුණු ටික ආණ්ඩුවේ අවධානයට යොමු කළාට වැඩක් නැහැ. පාපිසිවල අවධානයට යොමු කළාට වැඩක් නැහැ නේ. මේක කෙළින්ම යොමු කරන්න ඕනෑ කෙනා, ජනාධිපතිතුමා. මම හිතාගෙන ඉන්නවා, අනුරාධපුරයේ ගිය වෙලාවක අනුර කුමරුගේ අපල දුරු වී, නුවණ පහළ වී, National Grid එකට පෞද්ගලික ආයෝජන ගෙන ඒම සඳහා ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරලා කොඩියක් එල්ලන්න. ඔබතුමන්ලාට කිව්වාට වැඩක් නැහැ, ජනාධිපතිතුමා මේක කරනකල්. ඒ පිළිබඳවත් සඳහන් කරමින් මා ඊළඟ කාරණාවට අවතීර්ණ වෙන්නම්.

ඊළඟ කාරණාව තමයි, බලශක්තියේ අනෙක් පැත්ත, බොර තෙල් සහ තෙල් කර්මාන්තය. ලෝකයේ බොහොම ලාභ ලබන ව්‍යාපාරයක්. පසුගිය දවස්වල නම් ඔබ ආණ්ඩුව ගන්න කලින් - මෙතැන හිටපු ඇමතිතුමා නැඟිටලා ගිහිල්ලා - කිව්වේ, ලංකාවේ highways හදන්න කලින් පිරිපහදු මධ්‍යස්ථානය හදා ගත්තොත්, ඒකේ සල්ලිවලින් ලංකාව ස්වයංපෝෂිත කරන්න පුළුවන් ආදී වැඩ ගොඩක් කරන්න පුළුවන් කියලා ලොකු කයිවාරුවක් ගැහුවා. හැබැයි, අවුරුද්දක් ගත වුණා, තවම අපට අලුත් පිරිපහදුවක් හදා ගන්න බැරි වුණා. අලුත් පිරිපහදුවක් ආණ්ඩුවට හදන්න බැරි නම්, ඒ සඳහා භය නැතිව පෞද්ගලික අංශයේ කෙනෙකුට කරුණාකරලා ආරාධනා කරන්න. පිරිපහදුව හදා ගත්තොත්, ඒ පිරිපහදුවේ එන අමතර දේවල්වලින් පොහොර නිෂ්පාදනයේ ඉඳලා බොහෝ දේවල්; අර ඔබ ඉස්සර ජනතාවට කියපු ටික කරන්න පුළුවන්. පොහොර සංස්ථාවේ නිලධාරියෙකුත් දැන් ඇමති වෙලා ඉන්නවා නේ. ඒ කාලයේ පොහොර සංස්ථාව ගැන හොඳට කථා කරන්න ඇති නේ. බලශක්ති ඇමතිත් එතුමාමයි නේද? එතකොට පොහොර සංස්ථාවෙන් පොහොර ටික නිෂ්පාදනය කරලා ගොවීන්ට දෙන්න පුළුවන්. මේ දවස්වල ගොවීන්ට පොහොර නැහැ. ඒ මිනිස්සුන්ට සල්ලි ටික දීලා නැහැ. දැන් සමහරු අවස්ථා දෙකක් පොහොර ගහලා ඉවරයි. ඉතින්, මේ හැම අර්බුදයක්ම ඔබේ අකාර්යක්ෂමතාව නිසා සිද්ධ වෙන්නේ. හැබැයි, සල්ලි ටික යැව්වේ නැති වුණාට එදා හර්ෂ ද සිල්වා මැතිතුමා කියපුවාම ඔබ ආඩම්බරයෙන් අත්පුඩි ගැහුවා නේ. මේසවලට ගැහුවා නේ, උතුරන්න සල්ලි තිබෙනවා කියන කොට. උතුරන්න සල්ලි තිබෙද්දිත් පොහොරවලට අවශ්‍ය සල්ලි ටික දෙන්නේ නැහැ. පිරිපහදුව හදනවා කියලා උඩ පැන පැන කිව්වත්, පිරිපහදුව හදලා, ඒකෙන් අමතර ඵල ලෙස පොහොර නිෂ්පාදනය ආදී ඉතුරු දේවල් ටික කරන්නෙත් නැහැ.

ඊළඟට කාරණාව මෙයයි. ඉන්ධන සම්බන්ධයෙන් ගත්තාම,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මම පොඩි වෙලාවකින් ඉවර කරන්නම්.

ඉන්ධන පිරිවැය එහෙම නැත්නම්, ඉන්ධන මිල අවම කිරීම සඳහා ආණ්ඩුව පසුගිය කාල සීමාව තුළ කිසිදු සාධනීය පියවරක් ගන්නවා මම දැක්කේ නැහැ. බැණ බැණ හිටපු මිල සූත්‍රය දිගේම යනවා. මිල සූත්‍රය ඔබ කවුරුත් දන්නවා. පාඩු නොලබා පවත්වාගෙන යන්න මිස අපි ඒක මහ ජනතාවට වාසියක් වෙන්න හදන එකක් නොවෙයි. මිල සූත්‍රය නරකයි නොවෙයි. නමුත් අපි උත්සාහ කරන්න ඕනෑ, තෙල් මිල අඩු කරන්න. ඔබ පසුගිය කාලයේ කිව්වා, සමහර රටවල්වලින් සෘජුව තෙල් අරගන්නවා කියලා. නමුත්, දැන් ඒවා පිළිබඳව කිසිම හාවක් හුවක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
තත්පර ගණනකින් අවසන් කරනවා.

ඊට අමතරව, උදැසන කියපු විධියටම ත්‍රිකුණාමලය නගර ආශ්‍රිතව තෙල් ටැංකි ටික අරගෙන ඉන්දියාවත් එක්ක එකතු වෙලා ඒ පැත්තෙන් අලුත් සංවර්ධන කලාපයක් හදන්නත් පුළුවන් කියන අදහසත් ඉදිරිපත් කරමින් මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කංචන වැලිපිටිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේ ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு கிட்னன் செல்வராஜ் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. KITNAN SELVARAJ left the Chair and THE HON. (MRS.) SAGARIKA ATHAUDA took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව ආරම්භ කරන්න, ගරු මන්ත්‍රීතුමා.

[අ.භා. 4.55]

**ගරු කංචන වැලිපිටිය මහතා**
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දවසේ බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් සාකච්ඡා කරන මේ මොහොතේ ලොකු ලොකු වැඩ කරපු විපක්ෂයේ මන්ත්‍රීවරුන්, ලොකු ලොකු වැඩ කරලා රට බංකොලොත් කරපු විපක්ෂයේ මන්ත්‍රීවරුන්, පොඩි පොඩි වැඩ කරන අපේ ආණ්ඩුවට උපදෙස් දෙන්න පටන් අරගෙන තිබෙනවා. ඒක නිසා අපි කියන්න ඕනෑ, ඔබතුමන්ලා අවුරුදු 76ක් තිස්සේ රට පාලනය කරපු එකේ ප්‍රතිඵල රටේ ජනතාව බුක්ති විඳලා එහි ප්‍රතිඵලයක් හැටියට තමයි, පසුගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ 21වැනි දා ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් හදා ගත්තේ කියන එක. දැන් අපි අපේ වැඩ පිළිවෙළ ආරම්භ කරලා ක්‍රියාත්මක කරමින් යනවා.

[ගරු කංචන වැලිපිටිය මහතා]

ඒ වාගේම දැන් ගොඩක් අය කියමින් යනවා, ජනතා විමුක්ති පෙරමුණ උද්ඝෝෂණය කරපු නිසා තමයි පසුගිය කාලයේ වැඩ කර ගන්න බැරි වුණේ කියලා. ඒකටත් අපි තමයි වැරදි වෙලා තිබෙන්නේ. මේගොල්ලන්ට ලොකුම ප්‍රශ්නය වෙලා තිබෙන්නේ අපි. ජනතා විමුක්ති පෙරමුණ උද්ඝෝෂණය කරපු නිසා වැඩ කර ගන්න බැරි වුණා කියනවා. හැබැයි, ජාතික ජන බලවේගය ආණ්ඩුව පත් වෙලා වැඩ කරමින් යනකොටත් මේ විධියටම උද්ඝෝෂණය කළා. පසුගිය අය වැය ඉදිරිපත් කළාට පස්සේ රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි වෙන්නේ නැහැ කියලා විපක්ෂය බලපෑම් කරලා, චෝදනා කරලා වෛද්‍යවරුන් උද්ඝෝෂණය කරන තැනට පත් කර ගත්තා, රාජ්‍ය නිලධාරින් උද්ඝෝෂණය කරන තැනට පත් කළා. හැබැයි, ජාතික ජන බලවේගය රජය වැටුණේ නැහැ. සාමාන්‍යයෙන් දේශපාලනයේදී කියනවා, හැම වෙලාවේම ජනතාවට වඩා අඩියක් ඉදිරියෙන් පාලකයෝ ඉන්න ඕනෑ කියලා. අපේ පක්ෂය වැඩ කරන්නේ එහෙමයි. අපි යම් ක්‍රියාමාර්ගයක් ගන්නවා නම් ගන්නේ ජනතාව ගැන හිතලා. ඒක ජනතා හිතවාදී ක්‍රියාමාර්ගයක්. ඒ නිසා ක්‍රියාමාර්ග ගනිද්දී ඒ වෙලාවේ ජනතාවට එය තේරුම් ගන්න බැරි වුණාට අපි විශ්වාස කරනවා, ඉතා නුදුරු කාලයේදී ජනතාව එය තේරුම් ගනියි කරයි කියලා. ඒ න්‍යාය අනුව තමයි අපි කටයුතු කරමින් ඉන්නේ. ඒ නිසා විපක්ෂය විසින් අවුළවන හැම ගින්නක්ම දවස් කිහිපයක් ඇතුළත නිවිලා යනවා. ජනතාව මේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසය ඇති කර ගන්නවා. ඒක තමයි මෙම ආණ්ඩුවේ ක්‍රියාවලිය. ඉතිහාසයේ හැම දාමත් වැරදි කළේ, ජනතාවට විරුද්ධ තීන්දු තීරණ ගත්තේ, ඒගොල්ලන්. එම නිසා තමයි ජනතාව ඒවාට විරුද්ධව ක්‍රියාමාර්ග ගත්තේ. නමුත් ඒ අයගේ නොහැකියාව වහ ගැනීම සඳහා දැන් අපේ පක්ෂයට චෝදනා කරන්න පටන් අරගෙන තිබෙනවා.

එදා ඒගොල්ලන් අතරමඟ නතර කළ ව්‍යාපෘති දැන් ආණ්ඩුව පටන් ගත්තාම ඒකේ අයිතිය ගන්නත් ඒගොල්ලන් උත්සාහ කරමින් ඉන්නවා. මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත ඉඳන් නුවර දක්වා කොටසේ වැඩකටයුතු අවුරුදු ගණනක් තිස්සේ නතර කරලා තිබුණේ. ඒක විනාශ වෙමින් ගියා. හැබැයි, ජාතික ජන බලවේගය ආණ්ඩුව පත් වෙලා වැඩ ටික ආරම්භ කළාට පස්සේ, දැන් පටන් අරගෙන තිබෙනවා ඒකට උප්පැන්න දෙන්න. දැන් ඒකට පියවරු 100ක් අයිතිය කියනවා. පසුගිය කාලයේ ඒක අවජාතක වෙලා තිබුණේ. අයිතිකාරයෝ නැහැ. හැබැයි, ජාතික ජන බලවේගය වැඩ පටන් අරගෙන ක්‍රියාත්මක කරගෙන යනකොට දැන් පියවරු ගොඩයි.

ඒ වාගේම තමයි විදුලි බලාගාර ගැන කියද්දී හිටපු නියෝජ්‍ය ඇමතිවරයෙක් අද උදේ කියනවා, සුළං බලයෙන් නිෂ්පාදනය කළ විදුලිය අඩු මිලට ගත්තේ ඒගොල්ලන්ගේ ආණ්ඩුවයි කියලා. විදුලි බලාගාර හදන්න ඉඩම් මිලදී ගත්තා ලු, ඇස්තමේන්තු හැදුවා ලු, වැඩ පිළිවෙළක් හැදුවා ලු, හැබැයි ඒවා ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා ලු. අපේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව දැන් ඒවා ක්‍රියාත්මක කරනකොට කියනවා, "අනේ! අපි තමයි ඒක කරන්න හිටියේ" කියලා. පසුගිය දවස්වලත් එහෙම කිව්වා. ඒ අය කියන විධියට ආණ්ඩුව ගත්ත හැම ක්‍රියාමාර්ගයක්ම රනිල් වික්‍රමසිංහ මහත්තයා කරන්න ඉඳලා තිබෙන්නේ. අන්න ඒ වාගේ හැසිරීමක් තමයි දැන් ඒ අයගේ තිබෙන්නේ.

එදා එතුමන්ලාගේ සැලැස්ම වුණේ, විදුලිබල මණ්ඩලය කෑලි 12කට කඩලා, විකුණලා, සේවකයෝ 12,000කට වඩා එළියට ඇදලා දාලා, ඒක පෞද්ගලික අංශයට දෙන්න. හැබැයි, අපේ ආණ්ඩුව පත් වුණාට පසුව අපේ ඇමතිවරු වැඩ භාරඅරගෙන, දැන් ඒ ආයතනය ප්‍රතිව්‍යුහගත කරලා, කොටස් හතරකට වෙන් කරලා, රාජ්‍ය සමාගම් හතරක් ලෙස ක්‍රියාත්මක කරන්න දැන් වැඩ පිළිවෙළ ආරම්භ කරලා තිබෙනවා. අන්න ඒ වැඩ පිළිවෙළ ආරම්භ කරලා, කටයුතු ක්‍රියාත්මක කරගෙන යනකොට දැන් කියනවා, රනිල් වික්‍රමසිංහ මහත්තයාත් ඕකම තමයි කරන්න හිටියේ, හැබැයි, එතුමාට කරන්න දුන්නේ නැහැ කියලා. අපි කියනවා, ජාතික ජන බලවේගයේ අපේ වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කරමින් යනවා. ඒක කරන්න හිටියේ කවුද කියලා අදාළ නැහැ. මොකද, කළේ නැහැ. හැබැයි, අපි රටේ ජනතාව වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන, ජනතාවට සහන සැලසීම වෙනුවෙන් අපි මෙය ක්‍රියාත්මක කරමින් යනවා.

ඊළඟට කියනවා, අපි විදුලි බිල සියයට 30 කින් අඩු කරන බව කිව්වා ලු. ඔව්, අපි විදුලි බිල සියයට 30කින් අඩු කරන බව කිව්වා. අපේ වැඩ පිළිවෙළ තුළ එය තිබෙනවා. ඒකට අනුව අපි කටයුතු ක්‍රියාත්මක කරමින් යනවා. එම වැඩ පිළිවෙළ යථාර්ථයක් කර ගත්තාට පස්සේ අපට ඉතා ඉක්මනට විදුලි බිල අඩු කරන්න පුළුවන්. අපි ආණ්ඩුවක් හැටියට ඒ වෙනුවෙන් කටයුතු කරමින් ඉන්නවා. මේ වෙලාවේ විදුලි බිල අඩු කරන්න බැරි වුණත්, අපේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වුණාට පස්සේ විදුලි බිල අඩු කරලා ජනතාවට සහන ලබා දෙන්න අපට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වසර ඇතුළත අපි ජනතාවාදී ක්‍රියාමාර්ග ගණනාවක් අරගෙන තිබෙනවා. පසුගිය ආණ්ඩුව සුළං විදුලි බලාගාර ආරම්භ කළා. විදුලි ඒකකයක් මිලදී ගන්න ඒගොල්ලන් තීන්දු කරලා තිබුණේ ඩොලර් ශත 8.26කට. හැබැයි, අපේ ආණ්ඩුව පත් වුණාට පසුව පසුගිය සැප්තැම්බර් මාසයේ ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය කළා. අපි ආයෝජකයෝ කැඳෙව්වා. ඒගොල්ලන් එකඟ වෙලා තිබෙනවා, විදුලි ඒකකයක් ඇමෙරිකානු ඩොලර් ශත 3.77කට ලබා දෙන්න. අපි ඒ යන වියදම අඩු කිරීම තුළ ඒ මුදල් ජනතාවට සහන සැලසීම වෙනුවෙන් උපයෝගී කර ගන්න පුළුවන් අනාගතයේදී. අපි දැන් එම වැඩ පිළවෙළ ආරම්භ කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ ජනතාව වෙනුවෙන් අපි තව විශේෂ වැඩකටයුතු රාශියක් ආරම්භ කරලා තිබෙනවා. මෙපමණ කල් විදුලිබල මණ්ඩලය ක්‍රියා කරමින් තිබුණේ, අපේ රටේ ජනතාවට ඕනෑ කරන ආලෝකය ලබාදීම වෙනුවෙන්; ජනතාවට ඒ අවශ්‍ය කරන යටිතල පහසුකම් ඉටු කිරීම වෙනුවෙන්. හැබැයි, මේකේ ආයෝජනයක් කිරීම වෙනුවෙන් සැලසුම් සකස් කරලා තිබුණේ නැහැ. අපේ ආණ්ඩුව පත් වුණාට පසුව විදුලිබල මණ්ඩලය, බලශක්ති අමාත්‍යාංශය ඒ වෙනුවෙන් මේ වන විට වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා.

ඉදිරි දශකය තුළ -ඉදිරි අවුරුදු 10 තුළ- අපේ රටේ වැඩි වන විදුලි ඉල්ලුම ගැන දැන් පුරෝකථනයක් කරමින් ඉන්නවා. අපි විශ්වාස කරනවා තව අවුරුදු 10ක් ඇතුළත අපේ රටේ විදුලි ඉල්ලුම සියයට 60කින් වැඩි වෙයි කියලා. සියයට 60කින් විදුලි ඉල්ලුම වැඩි වන කොට ඊට අදාළ සැපයුම සිදු කිරීමේ කාර්යය අපි ඉෂ්ට කර ගන්න ඕනෑ. අන්න ඒකට අදාළ වැඩ පිළිවෙළ අපි දැන් සකස් කරමින් ඉන්නවා. විශේෂයෙන්ම ඒ අනාගත අවශ්‍යතාව වෙනුවෙන් දත්ත පද්ධති වැඩි දියුණු කිරීමේ මධ්‍යස්ථාන ගොඩනැඟීම, හරිත හයිඩ්‍රජන් නිෂ්පාදනය, හරිත ඇමෝනියම් නිෂ්පාදනය, ප්‍රවාහන විද්‍යුත්කරණය වාගේ වැඩ පිළිවෙළ දැන් ආරම්භ කර තිබෙනවා.

බලශක්ති අමාත්‍යාංශයත්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයත්, ප්‍රවාහන අමාත්‍යාංශයත් එකතු වෙලා ඒ අවශ්‍ය කරන වැඩ පිළිවෙළ සකස් කිරීම වෙනුවෙන් අලුත් පනත් කෙටුම් පත් සකස් කරමින් ඉන්නවා. ඒ වැඩි වන ඉල්ලුමට සරිලන ආකාරයේ විදුලිය සැපයුමක් කිරීම වෙනුවෙනුත්, අනාගතයේ ඩිජිටල්කරණයත්

එක්ක මේ රට අලුත් දිශානතියකට ගෙන යෑම වෙනුවෙනුත් අවශ්‍ය කරන කටයුතු අපි සූදානම් කරමින් ඉන්නවා. ඒ වෙනුවෙන් බලශක්ති අමාත්‍යාංශය තම දැක්ම, වැඩ පිළිවෙළ අනුව අවශ්‍ය කටයුතු කරමින් ඉන්නවා. අප එසේ කටයුතු කරමින් ඉන්න කොට අද ගරු විපක්ෂ නායකතුමා කියනවා මම දැක්කා, ජාතික ජන බලවේගය ආණ්ඩුව සිහින දකිනවා කියලා. ඔව්, ජාතික ජන බලවේගය ආණ්ඩුව සිහින දකිනවා තමයි. සමහර වෙලාවට ඔබට හිතා ගන්නත් බැරි ආකාරයේ සිහින ජාතික ජන බලවේගය ආණ්ඩුව දකිනවා, ඒ සිහින යථාර්ථයක් කිරීම වෙනුවෙන් අපේ ගරු ජනාධිපතිතුමාත්, අපේ කැබිනට් මණ්ඩලය ප්‍රමුඛ ජාතික ජන බලවේගය ආණ්ඩුව ඇතුළු අප සියලුදෙනාත් ඇප කැප වෙලා වැඩ කරමින් ඉන්නවා කියන එක මම විපක්ෂ නායකතුමාට මතක් කර දෙනවා.

අප කවුරුත් බලාපොරොත්තු වන "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ගොඩ නඟා ගැනීම පිණිස මේ රට රැගෙන යන ගමන වෙනුවෙන් දායක වන, බලශක්ති අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළ ඉදිරි වසර තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන සපයන එම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අනුමත කිරීමට සියලුදෙනාගේ සහයෝගය ලබා දෙන්න කියන ඉල්ලීම කරමින්, මම නිහඬ වෙනවා. සියලුදෙනාට ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.04]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மிகவும் முக்கியமான ஓர் அமைச்சான வலுசக்தி அமைச்சின் வரவு செலவுத்திட்டக் குழுநிலை விவாதத்தில் உரையாற்றுவதற்குச் சந்தர்ப்பமளித்தமைக்காக நன்றி தெரிவித்துக் கொள்கின்றேன். கடந்த காலத்திலே நாட்டிலே மிகப்பெரிய மாற்றம் வருவதற்குக் காரணமாக இருந்த இந்த அமைச்சுக்கு இந்த வரவு செலவுத்திட்டத்திலே மீண்டெழும் செலவினமாக 1.1 பில்லியனும் மூலதனச் செலவினமாக 22 பில்லியனும் ஒதுக்கீடு செய்யப்பட்டிருப்பதை நாம் உண்மையாகப் பாராட்டுகிறோம். ஏனெனில், இந்த வலுசக்தி அமைச்சினை வலுப்படுத்துவதன்மூலம்தான் நாட்டில் பொருளாதார ஸ்திரத்தன்மையை ஏற்படுத்தக்கூடிய நடவடிக்கைகளை எடுக்க முடியும். அந்த வகையிலே, நாட்டிலே உற்பத்தித் திறனைப் பெருக்குவதற்காக இந்த ஒதுக்கீடுகள்மூலம் மிகப் பயனுள்ள செயற்றிட்டங்களைச் செய்ய இந்த அமைச்சு முன்வந்துள்ளமைக்கு உண்மையில் எனது வரவேற்பையும் பாராட்டையும் தெரிவித்துக் கொள்கின்றேன்.

இச்சந்தர்ப்பத்தில் நான் மிக முக்கியமாக எனது மாவட்டத்தில் இருக்கின்ற பிரச்சினைகள் சம்பந்தமாகவே எனது விண்ணப்பத்தை முன்வைக்க விருக்கின்றேன். மிக முக்கியமாக மட்டக்களப்பு மாவட்டத்திலே வலுசக்தி அமைச்சின் மின்சார சபையின் ஊடாக 95 சதவீதத்திற்கும் அதிகமாக மின்சார வழங்கல் இருக்கின்றபொழுதிலும், கிராமங்களிலே அல்லது உள்ளூர்ப் பகுதிகளிலே புதிதாகக் குடியேறுகின்ற அல்லது புதிதாக வீடுகளை அமைக்கின்ற வர்களுக்கு மிகப் பிரதான பிரச்சினையாக இருப்பது மின்சாரத்தைப் பெற்றுக்கொள்வதிலே இருக்கின்ற பாரிய சிரமங்களாகும். தற்போதைய நிலையில் மின்சாரத்தைப் பெறுவதற்காக ஆகக்குறைந்தது 40,000 ரூபாய்க்கு மேற்பட்ட தொகையைச் செலுத்த வேண்டியிருக்கின்றது. மாவட்டத்திலே வறுமையான நிலையில் இருக்கின்ற, மிகக் கஷ்டப்படுகின்ற வர்களுக்கு இது மிகப் பாரிய நெருக்கடியாக இருக்கின்றது. கடந்த காலங்களில் பல உதவித் திட்டங்களின்மூலம் இந்தச் செயற்றிட்டங்கள் இலகுவாக்கப்பட்டிருந்தன. அதுபோல், எதிர்காலத்திலே இந்த அமைச்சின் ஊடாக அவ்வாறான செயற்றிட்டத்தைக் கொண்டுவருவதற்கான ஏற்பாடுகளைச் செய்வதன்மூலம் வறுமையினால் பாதிக்கப்பட்ட மக்களுக்கு மின்சாரத்தைப் பெற்றுக்கொடுக்க வேண்டும் என்ற முன்மொழிவை ஒரு கோரிக்கையாக முன்வைக்கின்றேன்.

அதற்கப்பால், ஓரிடத்துக்குப் புதிய மின்சார நீடிப்பைப் பெறுகின்றபோது, மின்சார சபையினால் 4 இலட்சம் ரூபாய்தான் ஆகக்கூடிய தொகையாக ஒதுக்கப்படுகின்றது. மிகத் தூரமான பகுதிகளிலே இருக்கின்ற மக்கள் தங்கள் வீடுகளுக்கான மின் இணைப்பைப் பெறுவதற்கு விண்ணப்பிக் கின்றபோது, அங்கு பல வீடுகள் இருந்தாலும் குறித்த 4 இலட்சம் ரூபாய்க்கு மேற்பட்ட தொகை செலவாக மதிப்பிடப்படுகின்றபோது அதை அவர்களே செலுத்த வேண்டியிருப்பது அவர்களுக்கு மிகப் பாரிய சுமையாக இருக்கின்றது. இதன் காரணமாக, வறுமையில் வாழ்கின்ற மக்கள் மின்சாரத்துக்காக விண்ணப்பிக்க முடியாமல் இருக்கின்றார்கள். நான் நினைக்கிறேன், இந்தப் பிரச்சினை நாட்டின் எல்லாப் பகுதிகளிலும் இருக்கும் என்று. ஆகவே, இதற்குரிய தீர்வுக்கான முயற்சியை இந்த அமைச்சினூடாகச் செய்ய வேண்டிய பாரிய பொறுப்பு அரசுக்கு இருக்கின்றது.

அதற்கப்பால், விவசாயிகள் மற்றும் சிறிய, நடுத்தரத் தொழில்முயற்சியாளர்கள் சலுகை - concession - அடிப்படையில் மின்சாரத்தைப் பெறுவதற்கு ஏற்புடைய நிலைமை இருக்க வேண்டும். மிக முக்கியமாக வர்த்தக நடவடிக்கைகளில் ஈடுபடுகின்றவர்கள் three-phase electricityஐப் பெறுவதில் பாரிய பிரச்சினையை எதிர்நோக்க வேண்டியிருக்கின்றது. அதற்காக ஒரு Chartered Engineer மூலம் அளவீட்டைச் செய்ய வேண்டியிருக்கின்றது. ஆனால், ஒரு வர்த்தகத்தை ஆரம்பிப்பதற்கு முன்னரே அவ்வாறு அளவீடு செய்வதற்கு ஒரு முறைமை இல்லை. அவர்கள் அந்த வர்த்தக நிலையத்தை ஆரம்பிப்பதற்கான சகல ஏற்பாடு களையும் செய்த பின்னர் அந்த அளவீட்டு முறைமையைச் செய்ய வருகின்றபோது, transformerஇலே அதற்குரிய வலுவை வழங்குவதற்குரிய வசதி இல்லாமல் இருக்கின்றது. இவ்வாறானதொரு நெருக்கடி நிலைமையைத் தவிர்ப்பதற்கு மின்சார சபையினூடாக ஒரு செயற்றிட்டம் இருப்பதாகத் தெரியவில்லை. முன்னராகவே Chartered Engineer ஊடாக அளவீடு செய்வதற்கு வசதி இல்லை; வர்த்தக நிலையத்தை ஒழுங்கு செய்த பின்னர் transformerஇல் அதற்கான வலு இல்லை. இதற்காக அவர்கள் நிறைய பணத்தைச் செலுத்துவதனால் அவர்களது முதலீடு குறைந்து, வர்த்தகத்தை ஆரம்பிப்பதற்கு மிகச் சிரமப்படும் நிலை காணப்படுகின்றது.

நாட்டின் பொருளாதாரத்துக்குச் சிறிய, நடுத்தரத் தொழில்முயற்சியாளர்கள் பாரிய பங்களிப்பை வழங்குகின்ற போதும் மாவட்டங்கள் தோறும் சிறிய வர்த்தகங்களை ஆரம்பிப்பதில் இவ்வாறான நெருக்கடி நிலைமை இருந்தால், அவர்களால் தங்களுடைய வர்த்தகத்தை மேற்கொண்டு செய்ய முடியாத நிலை ஏற்படும். அத்தோடு, மட்டக்களப்பு மாவட்டத்திலே புதிதாகப் பொதுக் கட்டிடங்கள் கட்டப் படுகின்றது, குடியேற்றங்கள் நிகழ்கின்றன. அந்தப் பொதுக் கட்டிடங்கள், வீடுகளுக்கான மின்சார விநியோகத்துக்குப்

[ගරු ඉලෙයියතම්බි සිරිනාත් මහතා]

புதிதாக விண்ணப்பிக்கும்போது, அவற்றின் அமைவிடம் மிக அதிக தூரமாக இருப்பின், மின்சார இணைப்பைப் பெறுவதிலே பாரிய சிரமம் இருக்கின்றது.

அதற்கப்பால், எமது மாவட்டத்திலே மின்சார சபையில் நிலவும் ஆளணிப் பற்றாக்குறை மிகவும் நெருக்கடியான நிலைமையாக இருக்கின்றது. குறிப்பாக, எல்லாத் தர உத்தியோகத்தர்களுக்கும் - Electrical Superintendent, meter readers போன்ற சகல பதவிகளுக்கும் - பாரிய பற்றாக்குறை இருக்கின்றது. இந்தப் பற்றாக்குறை கிழக்கு மாகாணத்தின் முழு இடங்களிலும் இருக்கின்றது. கடந்த காலங்களில் அந்தப் பதவிகளுக்குத் தேர்வு செய்யப்பட்ட உத்தியோகத்தர்கள் பல்வேறு மாவட்டங்களில் இருந்து வந்தவர்களாகவும், குறுகிய காலப்பகுதியிலே இடமாற்றம் பெற்றுச் செல்பவர்களாகவும் இருக்கின்ற காரணத்தால், அந்த வெற்றிடங்களை மீள் நிரப்ப முடியாதவொரு நெருக்கடியான நிலைமை இருக்கின்றது. ஆகவே, எதிர்வரும் காலங்களில் நீங்கள் இந்த வேலைகளுக்கான ஆளணியைத் தெரிவு செய்கின்றபொழுது அந்த மாவட்டத்தில் உள்ளவர்களுக்கு முன்னுரிமை யளிப்பதன்மூலம்தான் இந்தச் சேவையைத் தொடர்ச்சியாகச் செய்ய முடியும். வெளி மாவட்டங்களில் இருந்து வருபவர்கள் குறைந்த காலப்பகுதிக்கு அங்கு வேலை செய்துகொண்டு, தற்காலிகமாகவோ, நிரந்தரமாகவோ, நீண்டகாலத்துக்கோ மாற்றலாகிச் செல்கின்றார்கள். இதனால் அந்தப் பகுதியிலே ஆளணிப் பற்றாக்குறை மிகப் பெரியளவில் இருப்பதால், மின்சார சேவையைக் கொண்டுசெல்வதில் பாரிய சிக்கல்கள் இருக்கின்றது.

அதற்கப்பால், சில இடங்களில் மேலதிகமாக transformers பொருத்தப்பட வேண்டிய தேவை இருந்தாலும், அதற்காக நீண்ட காலம் காத்திருக்க வேண்டிய நிலைமை இருக்கின்றது. உதாரணமாக, பல இடங்களிலே விவசாயம் செய்பவர்கள் பகல் நேரங்களிலே நீர்ப் பம்பிகளை ஒரே நேரத்தில் இயக்குகின்றபொழுது, மின்சாரத்தின் வோல்ட் அளவு மிகக் குறைந்தளவாக இருப்பதன் காரணத்தினால், தொடர்ச்சியாக வினைத்திறனான முறையிலே விவசாயச் செயற்பாடுகளில் ஈடுபட முடியாதிருக்கின்றது. அதைவிட, அவர்கள் மின்சாரத்தைப் பெறுவதற்கு விண்ணப்பித்திருந்தும்கூட, அதற்குத் தேவையான transformer வசதிகளை கிராமங்கள் மற்றும் சுற்றுப்புறங்களிலே பெறுவது கடினமாக இருக்கிறது. நகரப் பகுதிகளிலும் இந்தப் பிரச்சினை இருக்கின்றது.

இட நெருக்கடியான, அதிகளவான சனத்தொகை இருக்கின்ற பகுதிகளிலே உள்ளவர்கள் solar மூலம் மின்சாரத்தைப் பெறுவதற்காக விண்ணப்பிக்கின்றபொழுது, அதற்கான விண்ணப்பங்கள் மிகை நிலையில் இருப்பதனால், தங்களுடைய அடிப்படைத் தேவையான மின்சாரத்தை solar கலங்களின்மூலம் பெற்றுக்கொள்வதிலும் நெருக்கடி இருக்கின்றது. அதாவது, Solar மின் கலங்களுக்கான அனுமதி தனிப்பட்ட ரீதியாகச் சிறியளவில் கொடுக்கப்பட்டிருந்தாலும் மேலதிக விண்ணப்பங்களுக்கான அனுமதி கடந்த மார்ச் மாதம் முதல் நிறுத்தப்பட்டிருக்கின்றது. இவ்வாறான நிலையிலே, மீள் புதுப்பிக்கத்தக்க energy செயற்றிட்டத்திற்காக அரசாங்கம் பாரிய நிதி ஒதுக்கீட்டைச் செய்தாலும், மட்டக்களப்புப் பிரதேசத்திலே வீட்டுப் பாவனைக்கும் சரி, தொழிற் றுறைகளின் தேவைக்கும் சரி, solar மூலம் மின்சாரத்தைப் பெறுவதிலே தொடர்ச்சியாகப் பாரிய நெருக்கடி நிலவுவதைக் காணக்கூடியதாக இருக்கின்றது. ஆகவே, எமது பிரதேசத்திலே பொருளாதார அபிவிருத்தியை அடிப்படையாகக் கொண்டும் சரி, மக்களுடைய வாழ்வாதாரத்தை அடிப்படையாகக் கொண்டும் சரி, மின்சாரத் தேவையைப் பூர்த்திசெய்வதிலே பல நெருக்கடிகள் இருக்கின்றன. நான் இங்கு முன்னரே குறிப்பிட்டதுபோல மின்சார சபையில் ஆளணிப் பற்றாக்குறை இருக்கின்றது; transformer வசதிகளைப் பெற்றுக்கொள்வதில் பிரச்சினை இருக்கின்றது; three-phase மின்சாரத்தைப் பெற்றுக்கொள்வதிலே பிரச்சினை இருக்கின்றது; solar வசதிகளைப் பெற்றுக்கொள்வதிலே பிரச்சினை இருக்கின்றது.

இதற்கப்பால், தற்போது பல இடங்களிலே battery backup facilityமூலம் solar energy பெறுவதற்காகக் கொடுக்கின்ற கட்டணம் ஒரு நிலையானதாக இல்லை. சாதாரணமாக solar மூலம் 20 வாட்ஸ் மின்சாரத்துக்காக அவர்கள் செலுத்துகின்ற தொகையைவிடக் கிட்டத்தட்ட 3 மடங்கு அதிகமாக battery backup மின்சார வசதிக்காகச் செலுத்துகின்ற நிலை காணப்படுகின்றது. அதாவது, battery backup மூலமான மின்சாரத்தைப் பெறுவதற்குக் கொடுக்கப்படுகின்ற பணம், சாதாரணமாக solar மின்சாரத்திற்குக் கொடுக்கப்படுகின்ற பணத்தைவிட 2 மடங்குதான் அதிகமாக இருக்கின்றது. இதனால் அவர்கள் அதனைப் பெறுவதில் பின்னிற்கின்ற நிலைமை இருக்கின்றது. ஆகவே, இந்த விடயங்களையும் கருத்திற்கொள்ள வேண்டுமென்று நான் கேட்டுக் கொள்கின்றேன்.

இதற்கப்பால், மிக முக்கியமாக எமது பிரதேசத்திலே சிறிய மற்றும் நடுத்தரத் தொழில்முயற்சியாளர்கள் மிக விரைவாக மின்சாரம் பெற்றுக்கொள்வதற்கும் மற்றும் மின்சாரம் பெற இருக்கின்ற விவசாயிகளுக்கும் எவ்வாறான சலுகை அடிப்படையிலே அது வழங்கப்படும் என்ற தெளிவின்மை மக்களிடம் இருக்கின்றது. அதுபோல், இந்த அரசு புதிய திட்டத்தின் மூலமாக அரச நிறுவனங்களுக்கும் கோயில் களுக்கும் மின்சாரம் வழங்குவதற்காகப் பாரிய நிதி ஒதுக்கீடுகளைச் செய்திருக்கின்றபோதிலும், அது எவ்வாறான முறையிலே பகிர்ந்தளிக்கப்படும், எவ்வாறு அந்த விடயங்களைக் கொண்டுசெல்வது என்பதிலே தெளிவின்மை காணப்படுகின்றது.

இதற்கப்பால், எமது மாவட்டத்திலே பல இடங்களிலே எரிபொருள் நிரப்பு நிலையங்களை அமைத்துக் கொடுக்க வேண்டிய பொறுப்பு இருக்கின்றது. சில இடங்களிலே co-operative எரிபொருள் நிரப்பு நிலையங்கள் மண்ணெண்ணெயை மட்டும் விநியோகிக்கின்ற நிலை இருக்கின்றது. அவற்றுக்கு மேலதிகமாக பெற்றோல், டீசல் விநியோகத்தைச் செய்யக்கூடிய வசதிகளைச் செய்யவேண்டி இருக்கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
I request for one more minute, Madam Presiding Member.

அதற்கப்பால், இன்றைய நெருக்கடி நிலையில் பல இடங்களிலே பிரதேச சபைகள்கூட தமது வருமானத்தை அதிகரிக்கக் கூடியதான ஓர் இலகுத் தன்மையைக் கொண்டிருக்கவேண்டிய பொறுப்புடன் இருப்பதனால், இந்த விடயங்களைக் கருத்திற்கொண்டு இந்த வலுசக்தி அமைச்சினூடாக ஒரு செயற்றிட்டத்தைக் கொண்டுவர வேண்டிய ஒரு பொறுப்பு உங்களுக்கு இருக்கின்றது. உங்களுடைய திட்டங்களை நாங்கள் வரவேற்கின்ற அதேவேளை, எமது மாவட்டத்திலே இருக்கின்ற பல நெருக்கடிகளையும் சிறப்பாக நிவர்த்தி செய்வதற்கான ஒரு திட்டமிடலை உங்களிடம் இருந்து நான் எதிர்பார்க்கின்றேன் என்பதைக் கூறி, இந்த வலுசக்தி விடயத்திலே மீள் புதுப்பிக்கத்தக்க energyஇனூடாக இந்த நாட்டிலே சிறப்பானதொரு நிலையான திட்டம் முன்கொண்டுவரப்பட வேண்டும் என்று கேட்டு, உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.15]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අද විවාදයට ගැනෙන බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මගේ අදහස් දැක්වීමට ප්‍රථම විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ අදහස්වලින් කිහිපයකට පමණක් පිළිතුරු දෙන්න මම කැමැතියි. ගොඩක් වැරදි සහගත තොරතුරු සහ ඔවුන්ගේ දැක්ම පිළිබඳව කරුණු අනාවරණය වුණා.

පළමු කාරණය මේකයි. ප්‍රධාන ප්‍රශ්නය හැටියට කිව්වා, විදුලිය සැපයුම ප්‍රමාණවත් වෙන්නේ නැහැයි කියලා. අපට විදුලිය සඳහා විශාල විභවයක් තිබෙන බව ඇත්ත. එහෙත්, විදුලිය සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රශ්නය හැටියට තිබෙන්නේ සැපයුම නොවෙයි ඉල්ලුම - ඉල්ලුම සඳහා විදුලිය ලබා ගැනීම. ඉල්ලුම නිසි පරිදි කළමනාකරණය කිරීම වෙනුවෙන් අවශ්‍ය අවස්ථාව නිර්මාණය කර නොගත්තොත් විදුලිය කොච්චර සැපයුවත් වැඩක් වෙන්නේ නැහැ. ඒ වාගේම, මේ ඉල්ලුම හා සැපයුම පිළිබඳව සාමාන්‍ය ආර්ථික විද්‍යා පොතේ කියන විධියට, සාමාන්‍ය භාණ්ඩයක් විධියට පුළුවන් තරම් සැපයුම වැඩි කළොත් මිල අඩු වෙලා, අඩු මිලට දෙන්න පුළුවන් කියන තර්කයක් ඉදිරිපත් වුණා. මම හිතන්නේ එතැන ප්‍රායෝගිකත්වය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන්නේ. ඒ නිසාම වෙන්න ඇති මෙවැනි කණ්ඩායම් නියෝජනය කරන විපක්ෂයට දශක ගණනාවක් මේ වැඩකටයුතු කරලා විද්‍යුතයෙන් ඒ ප්‍රයෝජන ලබා ගන්න බැරිවෙලා තිබෙන්නේත්. ඒ නිසා තමයි අපි ඊට වඩා වෙනස් ප්‍රවේශයක් ගන්නේ. ඇත්තෙන්ම රටේ ආර්ථිකය දියුණු කරන්න, කර්මාන්ත දියුණු කරන්න, ඒ වාගේම වෙනම ක්ෂේත්‍රයක් විධියට ඉදිරියට එනකොට විශාල පෙරළියක් ඇති කරන්න, භාණ්ඩවල ඵලදායිතාව වැඩි කරන්න, භාණ්ඩවල පිරිවැය අඩු කරන්න විශාල දායකත්වයක් දීපු ක්ෂේත්‍රයක් තමයි මේ විද්‍යුතය කියන්නේ.

ඒ වාගේම සඳහන් කළා, ලංකා විදුලිබල මණ්ඩලයේ අලාභය පිළිබඳව. එතැනදීත් එක්කෝ මේ කරුණු විකෘති කිරීමක් සිද්ධ කරනවා, ඒ පිළිබඳව නොදැන. විදුලිබල මණ්ඩලයේ අලාභය ගණනය කිරීම ගත්තාම, අපි සාමාන්‍යයෙන් ඕනෑම දෙයක ලාභය, අලාභය ගණනය කරනකොට ආදායමට වඩා වියදම වැඩි වුණොත් අලාභයක් එනවා කියලා කාටත් අවබෝධයක් තිබෙනවා. හැබැයි, මේ අලාභය වාර්තා කිරීම සිදු කරන්න විදුලිබල මණ්ඩලයේ යම් ගණනය කිරීමේ ක්‍රමවේදයක් තිබෙනවා. ඒ වාගේම, විදුලිය වැනි උපයෝගිතා - utilities - මහජනතාවට විකිණීමේදී ඒ සඳහා කටයුතු කරන ස්වාධීන අධිකාරියක් තිබෙනවා. ඒ තමයි, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම. ඔවුන් විසින් ඒ මිල නියම කිරීම ගණන් බලා, පිරිවැය බලා, නිශ්චය කරන රාමුවක් තුළ තමයි මේ වැඩකටයුත්ත සිද්ධ වෙන්නේ. ඒ වාගේම, මෙතැනදී විශේෂත්වයක් තිබෙනවා. විදුලිය සම්බන්ධයෙන් මිල නියම කිරීම සිද්ධ කරන්නේ දැනට විදුලිය හදන්න ගිය පිරිවැය බලා, ඒ පිරිවැයට යම් ප්‍රතිශතයක් එකතු කර ලාභයක් ලබා ගැනීමට නොවෙයි. මේක හොඳට අධ්‍යයනය කරන්න. මෙතැනදී විදුලිය සම්බන්ධයෙන් තිබෙන මිල නියම කිරීමේ ක්‍රමවේදය - methodology එක - තමයි, අනාගතයේදී අපි අපේක්ෂා කරන මේ බල මිශ්‍රණයට කොච්චර යනවාද කියන එක.

අපට තිබෙන ජල විදුලිය, අනෙකුත් පුනර්ජනනීය බලශක්ති, අනෙකුත් කාරණා කියන මේ සියල්ල සලකා බලා, ඒ පුරෝකථනයන් මත තමයි මිල නියම කරන්නේ. ඒ සඳහා යන පිරිවැයේදී විශේෂ අවධානය යොමු කරනවා, ජල විදුලිය, renewable energy, coal power, fuel කියන සියලුම දේවල් කෙරෙහි. ඒ වාගේම බෙදා හැරීම සඳහාත් යම් පිරිවැයක් යනවා. ඒ වාගේම සම්ප්‍රේෂණය සඳහාත් යම් පිරිවැයක් යනවා. මේ පිරිවැය ඔක්කොම එකතු කරලා මහජන උපයෝගිතා කොමිසමෙන් තමන්ගේ වත්කම්; ඒ කියන්නේ විදුලිබල මණ්ඩලයේ පවතින වත්කම්වලටත් යම් ප්‍රතිශතයක් එකතු කරලා තමයි මිල ගණනය කරන්නේ.

හැබැයි, ඒ සත්‍ය තත්ත්වය වෙනස් වෙන්න පුළුවන්, මාස 6ක් ගත වුණාට පස්සේ. ඒ නිසා අතීතයේදී සිද්ධ වෙච්ච පුරෝකථනය වෙනස් වුණොත් මාස 6න්, 6ට ලාභ, පාඩු සිද්ධ වෙන්න පුළුවන්. විශේෂයෙන්ම 2024දී -ගිය අවුරුද්දේ- මුළු වර්ෂයටම රුපියල් බිලියන 144ක, මාස 6ට ගත්තාම රුපියල් බිලියන 119ක ලාභයක් ලැබුවා. දැන් අපි මොනවා හෝ වැරැද්දක් කරලා පාඩු කරගෙන තිබෙනවා. ඇත්තටම සිද්ධ වුණේ මෙන්න මේ තත්ත්වයයි. හරියටම ගත්තොත්, මහජන උපයෝගිතා කොමිසම විසින් 2024 මාර්තු මාසයේ සියයට 22කින් මිල අඩු කළා; 2024 ජූලි මාසයේදී සියයට 22කින් මිල අඩු කළා; ඒ වාගේම 2025 ජනවාරි මාසයේ සියයට 20කින් අඩු කළා; ඊට කලින් තමයි සියයට 66කින් මිල වැඩි කර තිබුණේ; 2025 ජූනි මාසයේදී සියයට 15කින් මිල වැඩි කළා; 2025 ඔක්තෝබර් මාසයේදී මිල වැඩි කළේ නැහැ. මෙන්න මේ අඩු-වැඩි කිරීම් සිද්ධ කරන්නේ ඒ තොරතුරු හුවමාරු වීම මතයි. එම නිසා ජනනය වෙච්ච ලාභය තමයි ඒ නියෝජනය වෙලා තිබෙන්නේ.

ඇත්ත වශයෙන්ම ගත්තාම, ඉන් බිලියන 51ක් 2025දී ලබා ගත යුතුව තිබූ ලාභයට හිලව් කළා. ඒ නිසා තමයි මේ අලාභ තත්ත්වය තිබෙන්නේ. ඒ, වැරදි තොරතුරු ඉදිරිපත් කිරීමකුයි සිද්ධ කරලා තිබෙන්නේ.

මම ප්‍රධාන කාරණයට සම්බන්ධ වෙන්නම්. ඇත්තටම අපි බලශක්තිය දකින්නේ කොහොමද? බලශක්තිය හුදෙක් තනි භාණ්ඩයක් ලෙස හදලා; නිෂ්පාදනය කරලා, පාරිභෝගිකයාට දීලා වෙළෙඳ පොළේ ලාභයක් හෝ පාඩුවක් ලබා ගන්නවාට එහා ගිය ක්ෂේත්‍රයක් විධියට මහජන කේන්ද්‍රීය බලශක්ති

[ගරු අනිල් ජයන්ත මහතා]

පරිවර්තනයක් ඉලක්ක කරගෙන තමයි අපි මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ. අපට අතීත අඩු පාඩුත් හරිගස්සාගනිමින් ඉදිරියට යන්න තිබෙනවා. ඒ සඳහා ගොඩක් වැඩ කටයුතු කරන්න තිබෙනවා. ඒ අනුව බලශක්තිය ජනනය කිරීම, ප්‍රේෂණය, බෙදා හැරීම, පද්ධති පාලනය සම්බන්ධයෙන් අපි විදුලි බල පනතේ කරන ලද සංශෝධනයක් අනුව ඉතාමත් නිවැරදි ආකාරයට ඒ ආයතනවලට, රාජ්‍ය සමාගම් අතරට මේ බලශක්තිය ප්‍රවර්ධනය කිරීමට ඉඩ පහසුකම් ලැබෙන පරිසරය නිර්මාණය කරලා දීලා, ඒ අවස්ථාව නිර්මාණය කරලා තිබෙනවා.

එතැනදී කිසිම විධියකින් පෞද්ගලික අංශය අයින් කරලා, රාජ්‍ය අංශය; ආණ්ඩුව ඒ සියල්ල කරන්න ඕනෑ කියලා එකක් නැහැ. ඒක වැරදියි. හැබැයි ඒක මෙහෙයවීම පිළිබඳව දැක්මක් තිබෙනවා. භාණ්ඩයක් නිෂ්පාදනය කරලා, ගබඩා කරලා, විකුණනවා වාගේ එකක් නොවෙයි. ආර්ථිකයත් එක්ක ගැට ගැහිලා තිබෙන අපේ විභවතාවන් තිබෙනවා. ලෝකයේ තාක්ෂණය වෙනස් වෙලා තිබෙනවා. ඒවා උපයෝගී කර ගන්නේ කොහොමද කියන කාරණයේදී අනිවාර්යයෙන්ම අලුතෙන් හඳපු සමාගම් හතර යටතේ පෞද්ගලික අංශයේ ආයෝජන කැන්දාගෙන ඉතාම සහයෝගයෙන්, අවබෝධයෙන් තමයි වැඩ කරන්නේ. අතීතයේදී සිද්ධ වුණේ පෞද්ගලික අංශයේ කාට හරි මේ කොන්ත්‍රාත් දෙන එක. තමන් කැමතිම power purchase agreement එකක් අවුරුදු 10ක, 20ක කාලයකට ඉතා වැඩි මිලකට අත්සන් කරනවා. හැබැයි, ඒක පාවිච්චි කරන්නේ කොහොමද, ඒක අපේ grid එකට එකතු කරන්නේ කොහොමද කියලා කල්පනා කරන්නේ නැහැ. ඔන්න ඔය ගැටලුව තමයි තිබුණේ. අපි ඒක අයින් කරනවා.

පෞද්ගලික අංශය අයින් කරලා රාජ්‍ය අංශය විදුලිබලය සම්බන්ධයෙන් වැඩ කරන්න යනවා කියලා වැරදි මතයක් සමාජගත කරන්න එපා. අපට දුන් ජන වරම අනුව, අපේ අරමුණු අනුව, නිසි දැක්මකට අනුව බලශක්ති ක්ෂේත්‍රය ඉදිරියට ගන්නෙ කොහොමද කියන එක ගැනයි අපි උත්සාහ කරන්නේ. මහ ජනතාව සම්බන්ධ කරගෙන අපේ ආර්ථිකය දියුණු කරලා, සියයට 7කට වැඩි මධ්‍ය කාලීන ආර්ථික වෘද්ධියක් ලබා ගන්න අපට අවශ්‍යයි කියලා අපේ අය වැය කථාවේදී ඉදිරිපත් කළා. ඒ ගමන යනකොට බලශක්තිය තීරණාත්මකයි. බලශක්තියේ මිල අඩු කර ගන්නට ඕනෑ. බලශක්තියට තිබෙන ඉල්ලුම වැඩි කර ගන්නට ඕනෑ. ඒ අනුව අදාළ වැඩකටයුතු ඉදිරියේ දී සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේ දී බලශක්තිය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළා. මෙහි තිබෙන වැදගත්කම පෙන්නුම් කරමින් අපි වඩාත් පාරදෘශ්‍ය විධියට මේ මිලදී ගැනීම්වලට යන්නට ඕනෑ. පුනර්ජනනීය බලශක්තිය සම්බන්ධයෙන් කරුණු මතු කළා, මෙගාවොට් 500ක විදුලිය නිපදවිය හැකි ව්‍යාපෘතියක් අපි අවලංගු කළේ ඇයි කියලා. අපිට දරන්න බැරි වැඩි මිලකට තිබුණු නිසා අපි අවලංගු කළා. එතැන තිබුණේ ඩොලර් සත 8.26කට - වැඩි මිලකට. අපි හොයා බැලුවා, ඒ සමාගමේම ඉන්දියාවේ මිල තිබුණේ ඩොලර් සත 3කට, 4කට වාගේ ගණනකට. ඉතින් වැඩි මිලකට ගන්න ගිහිල්ලා අපි අමාරුවේ වැටෙනවාට වැඩිය හොඳයි, ඉතාම සැලසුම් සහගතව ඉදිරියට යන එක. ගරු ජනාධිපතිතුමා එතුමාගේ කථාවේ දී පැහැදිලි කළා, 2025 වසරේ ඔක්තෝබර් මස 28 වන දින මුල්ලිකුලම් හී විදුලි ව්‍යාපෘති දෙකක් සඳහා ඉතා අඩු මිලකට මේ විදුලිබලය ගත්තා කියන කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සඳහන් කරන්න කැමැතියි බලශක්ති අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 23,100ක් බව. එයින් විදුලි බලශක්ති සේවාව වැඩි දියුණු කිරීමට, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, පුනර්ජනනීය බලශක්තිය, න්‍යෂ්ටික බලශක්තිය වෙනුවෙනුත් වෙන් කරලා තිබෙනවා. මෙහිදී විශේෂ කාරණා දෙකක් තිබෙනවා. විශේෂයෙන් බලප්‍රේෂණය සහ බෙදා හැරීම සම්බන්ධව තිබෙන වියදම් තුළ රුපියල් මිලියන 18,291ක්ම ප්‍රාග්ධන වියදම්. ඒ අතර ව්‍යාපෘති ගණනාවක් තිබෙනවා. ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ ණය සඳහා විදේශ ගෙවීම් ගිණුම්කරණය කියලා බිලියන 7.6ක් තිබෙනවා. එතැනදීත් සඳහන් කරන්නට ඕනෑ, මේ අය වැයට පිටින් - off the Budget - ගිහිල්ලා මූල්‍ය විනය කඩලා, අතීතයේදී ඔය ගොල්ලන්ගේ ආණ්ඩු කරපු ඒවායේ පවු ගෙවන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. දැන් අපට ඒවා ගිණුම්ගත කරන්නට සිද්ධ වෙලා තිබෙනවා. මේ අය වැයට absorb කරන්න සිද්ධ වෙලා තිබෙනවා. විගණකාධිපතිවරයා ඉදිරිපත් කරපු, ඉස්සෙල්ලා කථා කරපු වාර්තාවල තිබෙන අය වැයට පිටින් ගත්ත ණය දැන් අපිට ගිණුම් ගත කරන්න සිද්ධ වෙලා තිබෙනවා. එතැන තිබෙනවා, බිලියන 7.6ක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම තවත් ව්‍යාපෘතියක් තිබෙනවා. පුනර්ජනනීය බලශක්තිය අතරේ බිලියන 1.1ක් අපද්‍රව්‍ය භාවිත කරලා බලශක්තිය නිර්මාණය කරන එක, ඒ කියන්නේ waste-to-energy. මේක හොඳ දෙයක්. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ ඒ සඳහා ගෙවන මිලෙන් Treasury එකට බරක් පටවලා තිබෙනවා. ඒ ගිවිසුම අනුව රුපියල් 36ක් **බැගින්** මිලදී ගැනීම් කරන්න සිද්ධ වෙනවා. අවුරුදු 20ක power purchase agreement එක ගහලා තිබෙනවා. මෙවැනි කරුණු කාරණා තිබෙන අතරේ තමයි බලශක්ති අමාත්‍යාංශයේ මේ වියදම් කළමනාකරණය කරමින් තිබෙන්නේ. ඉදිරියේ දී - ලබන අවුරුද්දේ - Energy Transition Act එක ගෙනෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

'බලශක්තිය' කියන එක විදුලියට විතරක් සීමා නොකර විවිධ ක්ෂේත්‍ර සඳහා ඉන්ධන - මේ වෙනකොට අපේ මුහුදේ තිබෙන ඛනිජ සම්පත්, කැනීම් පිළිබඳ පර්යේෂණවලින් හොයා ගත්ත දේවල් ඉදිරියේ දී වාණිජකරණය කිරීමට සැලසුම් සකස් කරමින් තිබෙනවා. ඒ සඳහා මේ වනවිටත් consultancy සමාගමක් වෙනුවෙන් අදාළ මුදල් වෙන් කරලා තිබෙනවා. මන්නාරම් ද්‍රෝණියේ හොයා ගත්ත ස්ථාන හතරෙන් ස්ථාන දෙකක තෙල් තිබෙනවා කියලා මේ වනවිටත් හොයා ගෙන තිබෙනවා. මෙන්න මේ කාරණයට මැදිහත්ව කටයුතු කරන්න අපි උත්සාහ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ඇත්තටම විධිමත් විධියට මේ ආර්ථිකය වේගවත් කරන්න විශාල දායකත්වයක් දෙන, තල්ලුවක් දෙන ක්ෂේත්‍රයක් විධියට බලශක්ති ක්ෂේත්‍රය හඳුනා ගැනීම තමයි අපේ අරමුණ වෙන්නේ. ඒ සඳහා දායක වූ බලශක්ති පරිවර්තනීය පනත ලබන අවුරුද්දේ දී මේ ගරු සභාවට ඉදිරිපත් කරලා, සම්මත කරන්නට කටයුතු කරනවා. මාගේ අදහස් හා යෝජනා දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු අර්කම් ඉල්යාස් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.25]

**ගරු අර්කම් ඉල්යාස් මහතා (බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அர்கம் இல்யாஸ் - வலுசக்தி பிரதி அமைச்சர்)
(The Hon. Arkam Ilyas - Deputy Minister of Power)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බලශක්ති අමාත්‍යාංශයේ කාරක සභා අවස්ථාවේ විවාදයට බලශක්ති නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස කරුණු දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම ජාතික ජන බලවේග ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශයන්හී බලශක්ති ක්ෂේත්‍රයට අපි විශාල බරක් තබා තිබෙනවා. විශේෂයෙන්ම අපේ ඉලක්කය වුණේ තරගකාරී, පාරදෘශ්‍ය පාරිභෝගිකයා මූලික කර ගත් පරිසර හිතකාමී බලශක්ති ක්ෂේත්‍රයක් උදා කරදීමයි. අපගේ ප්‍රධාන අරමුණු ලෙස එය ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම මෑතක් වනතුරු අපි පොසිල ඉන්ධන මත විශාල වශයෙන් යැපෙන බලශක්ති ක්ෂේත්‍රයක් විධියට තමයි තිබුණේ. නමුත්, වර්තමානය වන විට එය වෙනස් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම පුනර්ජනනීය ප්‍රභව තුළින් වැඩි වැඩියෙන් බලශක්තිය උපද්දවන්න පුළුවන් රටක් බවට අපේ රට දැන් හඳුනා ගෙන තිබෙනවා. ලංකාව ගත්තොත්, අද වෙනකොටත් ඒ අවශ්‍යතාවලින් විශාල ප්‍රමාණයක් තෙල් ආශ්‍රිත තාප බලයෙන් තමයි තවමත් රැඳී පවතින්නේ. නමුත්, අද වෙනකොට රටේ අවශ්‍යතාවයෙන් ඇත්තටම හතර, පස් ගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයක් - ඒ කියන්නේ අපේ රටේ අවශ්‍යතාව ගිගාවොට් 3ක්, 4ක්, 5ක් වෙනකොට 20කට වඩා අධික ප්‍රමාණයක් - විදුලිය උත්පාදනය කර ගන්න පුළුවන් ප්‍රභව තිබෙනවා කියලා අපි හඳුනා ගෙන තිබෙනවා.

විශේෂයෙන්ම අපේ බලශක්ති ක්ෂේත්‍රයට සම්බන්ධ ක්ෂේත්‍රයක් වෙච්ච ගමනාගමන ක්ෂේත්‍රයටත්, ඒ වාගේම බලශක්ති අපනයන ක්ෂේත්‍රයටත් අපට ලොකු විභවතාවක් තිබෙනවා කියලා අපි දැන් ගොඩාක් දුරට කථා වෙනවා; හඳුනාගෙන තිබෙනවා. නමුත් ඒ සඳහා පසුගිය ආණ්ඩු මොනවාද කළේ කියන එක නම් ඇත්තටම ප්‍රශ්නයක්. අපි ඒ සඳහා වූ අඩිතාලම මේ අවුරුද්ද ඇතුළත බොහෝ දුරට දාලා අවසන්. පසුගිය රජයන්වලින් දිගින් දිගටම සූර්යබල විදුලිය වැනි දේ ප්‍රවර්ධනය කළත්, ඒ සඳහා අවශ්‍ය සම්ප්‍රේෂණ පද්ධති නම් හදලා තිබුණේ නැහැ. අදත් විපක්ෂය පැත්තෙන් කථා කළ සමහර කථිකයන් කිව්වා, "අපි සූර්ය බල ශක්තිය තවතවත් ප්‍රවර්ධනය කරන්න ඕනෑ. ඒකේ මිල වැඩි කරලා දෙන්න ඕනෑ" කියලා. විශේෂයෙන් විපක්ෂ නායකතුමා තමයි කිව්වේ, "සූර්ය බල ශක්තිය නිපදවන අයට වැඩි මුදලක් දෙන්නත් ඕනෑ, පොරොන්දු වෙච්ච විධියට විදුලිය අඩු මිලට දෙන්නත් ඕනෑ" කියලා. මේ දෙකෙන්ම contradiction එකක් වෙන්නේ. මිල අඩු කරන්නත් ඕනෑ, අදාළ සූර්ය බලශක්තිය නිපදවන අයට වැඩි මුදලක් දෙන්නත් ඕනෑ. අපට ඒ දෙකම කරන්න බැහැ. අපට හරියටම කරගන්න නම් හරි මිලකට විදුලිබලය නිපදවා ගන්න ඕනෑ. එතකොට අපට අඩු මුදලට ලබා දෙන්න පුළුවන් වෙයි. ඒ වාගේම අපට අධිකව ලැබෙන විදුලිය ගබඩා කිරීම සඳහා වන ප්‍රභවතාවන් සඳහාත් උත්සාහ ගෙන තිබුණේ නැහැ. බලශක්තිය ගමනාගමන ක්ෂේත්‍රයට යොදා ගන්නේ කොහොමද කියලාත් කිසිම වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. ඒ වාගේම පද්ධතිය, සුහුරු පද්ධතියක් කරන්න හොඳ වැඩ පිළිවෙළක් තිබුණේත් නැහැ. ඒ වාගේම නව පුනර්ජනනීය ශක්ති ප්‍රභව සඳහා අවස්ථා ලබා දීම වාගේ දේවල් හරියට හිතලාවත් තිබුණේ නැහැ.

කලින් කථා කරපු මන්ත්‍රීවරයෙකුත් කිව්වා, ඉන්දියානු සමාගම්වලට ඩොලර් ශත අටකට දීලා තිබුණු එක අපි අයින් කරපු එක වැරැදියි කියලා. අපි අයින් කළේ නැහැ. ඇත්තටම අපි ඒ සමාගම් එක්ක negotiationsවලට ගියා. ඒ ගොල්ලන් එතැනින් අයින් වෙලා ගිය එක ඇරෙන්න අපි අයින් කළේ නැහැ. ඒක පළමුවැනි එක. ඒ මන්ත්‍රීතුමා කියනවා, මෙගා වොට් 500ක වාගේ විශාල මුදලක් එනකොට සාමාන්‍යයෙන් ඒ වාගේ ගණනකට යන්න වෙනවා කියලා. ඩොලර් ශත අටකට වාගේ යන්න වෙනවා ලු. ඒක ලොකු project එකක් කියලා කිව්වා. ඇත්තටම projects ලොකු වෙන්න, ලොකු වෙන්න ලබා දෙන මුදල අඩු වෙන්න ඕනෑ. සාමාන්‍ය engineering theory එක දන්නේ නැති මිනිස්සු මෙතැන අපට උගන්වන්න එනවා, project එක ලොකු වෙන්න, ලොකු වෙන්න ගණනත් වැඩි වෙන්න ඕනෑ කියලා. එහෙම තර්කයක් ගෙන එනවා. එහෙම නම්, ඊට වඩා හොඳයි පොඩි projects ටිකක් දෙන එක කියලා අපි හිතනවා. විශේෂයෙන්ම අපිත් විශාල projectsවලට ටෙන්ඩර් කැඳවනවා. ඒ ටෙන්ඩර් කැඳවීමෙන් පසුව මීටත් වඩා අඩු මුදල්වලට අපට ලබා දෙන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා.

තවත් විශේෂ දෙයක් කියන්න ඕනෑ. අපි ඉදිරියට බොහෝ දුරට බලාපොරොත්තු වෙන්නේ තරගකාරී ටෙන්ඩර් පටිපාටියක් යටතේ විදුලිබල ක්ෂේත්‍රය සඳහා ආයෝජන කැඳවා ගැනීමයි. ඒක කලිනුත් ගොඩාක් කථිකයන් ප්‍රකාශ කළා. මුල්ලිකුලම් වාගේ ප්‍රදේශවල සුළං විදුලිබලාගාර ව්‍යාපෘති සඳහා ඇත්තටම හත් දෙනෙක් ඉදිරිපත් වුණා. ඒ, ඉතාම අඩු මුදලකට. ලංකාවේ මුදලින් විදුලි ඒකකයක් රුපියල් 25ක වාගේ ගණනකට දෙන්න හදපු එකක් අපට රුපියල් 11ක වාගේ මුදලකට දෙන්න පුළුවන් වුණා. ඒ වාගේම ඒකේ තවත් විශේෂ දෙයක් තිබුණා. අපි ගණන් හදලා බැලුවාම අවුරුදු 20ක වාගේ කාලයකින් බිලියන ගණනක පාඩුවක් තමයි ඇත්තටම අපට නවත්වා ගන්න පුළුවන් වුණේ.

අපේ මන්ත්‍රීවරයෙකු කථා කරන කොට කිව්වා, "Grid එක update කරන්න, සම්ප්‍රේෂණ පද්ධති හදන්න." කියලා. 2015, 2016 කාලයේ ඉඳලාම ඒ ගොල්ලන්ගේ ආණ්ඩුවක් තිබුණා. කවදාවත් මේවා කරන්න හිතපු දේවල් නොවෙයි. අපි කරගෙන යනකොට අපි කරන එක දන්නේ නැහැ වාගේ මේ ගොල්ලන් දැන් කියනවා, "Grid එක update කරන්න, සම්ප්‍රේෂණ පද්ධති හදන්න" කියලා.

ඇත්තටම අපේ Budget එක අරගෙන බැලුවත් පෙනෙනවා, AIIB fund එකක් හරි, loan එකක් මඟින් මිලියන 200ක් ලබාගෙන අපි දැනටමත් සම්ප්‍රේෂණ පද්ධතියේ update එකක් පටන් අරගෙන තිබෙනවා කියලා. ඒ වාගේම සාම්පූර්, හබරණ ප්‍රදේශයේ, විශේෂයෙන් නැඟෙනහිර පළාතේ තිබෙන විභවය අපේ රට ඇතුළට ගැනීම සඳහා තවත් සම්ප්‍රේෂණ පද්ධතියක් සඳහා ටෙන්ඩර් දැනටමත් කැඳවා තිබෙනවා. ඒ වාගේම කිරිඳිවැල -හබරණ 400kV සම්ප්‍රේෂණ පද්ධතිය, සූරියවැව-මොනරාගල සම්ප්‍රේෂණ පද්ධතිය, ඒ වාගේම නොරොච්චෝලේ-වාරියපොල 220kV සම්ප්‍රේෂණ පද්ධතිය සඳහා ප්‍රසම්පාදන කටයුතු දැනටමත් අපි ආරම්භ කරලා තිබෙනවා.

ඒ වාගේම තමයි අපේ රටේ විදුලිය අවශ්‍යතාව. සාමාන්‍යයෙන් අපේ රටේ විදුලිය අවශ්‍යතාවෙන් වැඩිම අවශ්‍යතාව ඇති වෙන්නේ රාත්‍රී කාලයට. නමුත් විශේෂයෙන්ම සූර්ය බල ශක්තිය ඇතුළු පුනර්ජනනීය විදුලි ප්‍රභවවලින් නිෂ්පාදනය කරන විදුලිය ගබඩා කර වැඩි අවශ්‍යතාවක් ඇති වෙලාවල පාවිච්චි කිරීමට අවශ්‍ය ගබඩා ශක්තිය අපට ඇත්තටම තිබුණේ නැහැ. නමුත් අපේ රජයක් යටතේ ඒ සඳහාත් අවස්ථා විවර කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය මාසයේ යොමු කළ ටෙන්ඩර් එකෙන් ඒකකයක් රුපියල් 17ක් වාගේ අඩු මුදලකට මෙගා වොට් 160ක ප්‍රමාණයක බැටරි පද්ධතියක් සඳහා අපට ටෙන්ඩර් ප්‍රදානය කරන්න අවස්ථාව හම්බ වෙලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඒ ටෙන්ඩරය පුළුවන් තරම් ඉක්මනට ප්‍රදානය කරන්න. ඒ වාගේම ලබන අවුරුද්දේ වැඩි බැටරි

[ගරු අර්කම් ඉල්යාස් මහතා]

ප්‍රමාණයක් රට ඇතුළතට අරගෙන එන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අද දවසේ මෙගා වොට් 100කට අදාළ ටෙන්ඩරයක් close වුණා. අපි හිතනවා, ඒකට මීටත් වඩා අඩු මුදලකට tender prices ඇවිල්ලා ඇති කියලා.

ඒ වාගේම තවත් කාරණයක් තමයි, ගමනාගමන ක්ෂේත්‍රයේ ඇති ප්‍රශ්නය.

අපේ රටට වාහන ආනයනය කිරීමේ රෙගුලාසි නැවත ලිහිල් කිරීමත් එක්ක EVs, ඒ කියන්නේ විදුලි බලයෙන් ධාවනය වන වාහන විශාල ප්‍රමාණයක් අපේ රට ඇතුළට ආවා. නමුත් එම වාහනවල බැටරි නැවත ආරෝපණය කරන්නේ රාත්‍රි කාලයට. ඒකෙන් වෙන්නේ ඩීසල් පුච්චලා හදන විදුලියෙන් EVs ආරෝපණය කරන එකයි. 2026 වසර තුළ අපි ඒ සඳහා ලොකු වැඩ වැඩ පිළිවෙළක් ඇත්තටම ක්‍රියාත්මක කරනවා. විශේෂයෙන්ම අපේ වැඩ පිළිවෙළ තුළ තිබෙනවා, ලබන අවුරුද්ද ඇතුළත EV charging points විශාල ප්‍රමාණයක් ඇති කිරීමේ කාර්යයත්. ඒ තුළින් අපි බලාපොරොත්තු වනවා, දවල් කාලයේදී වැඩිපුර විදුලිය පාවිච්චි වන විධියට charging points ඇති කරන්න.

ඒ වාගේම තවත් වැදගත්ම කාර්යයක් තමයි, 2026 වසර ඇතුළත විශේෂයෙන්ම සූර්ය බලය නිපදවන ස්ථානවලට smart metering system එක ලබා දීම. ඒ වාගේම කාර්යාල පරිශ්‍ර, කර්මාන්ත, ඒ වාගේම මහල් නිවාස සංකීර්ණ වැනි වැඩි වශයෙන් විදුලිය පාවිච්චි කරන ස්ථානවලට smart metering system එක සවි කරන්නත් අපි බලාපොරොත්තු වනවා. මූලික වශයෙන්ම 2026 අවුරුද්ද තුළ pilot project එකක් විධියට අපි units 2,000ක් ඇතුළත් කරනවා.

ලංකාව ඇතුළේ වැඩියෙන්ම තිබෙන තවත් ප්‍රශ්නයක් තමයි, අපි සූර්ය විදුලි බලය නිපදවනවා, ඒක කොහොමද control කරන්නේ, කොච්චර ප්‍රමාණයක් අපේ system එක ඇතුළට එනවාද, කොච්චර ප්‍රමාණයක් අපට අවශ්‍ය වනවාද කියන එක බලාගන්න ක්‍රමයක් නොමැති වීම. ඇත්තටම ඒක තමයි සූර්ය විදුලි බලයේ තිබෙන ප්‍රශ්නය. සූර්ය විදුලි බලය control කරන්න පුළුවන් system එකක් මෙච්චර කාලයක් හදලා තිබුණේ නැහැ. 2015දී, 2016දී සූර්යබල සංග්‍රාම ගෙනාවා කියනවා, තව සමහරු තව තව දේවල් ගෙනාවා කියනවා. නමුත්, ඒවා ගේනකොට ඒකට අවශ්‍ය system එක, අදාළ යටිතල පහසුකම්, ඒකට අදාළ රෙගුලාසි හදන්නේ කොහොමද කියලා ඒ අය හිතලා තිබුණේ නැහැ. අපි හිතනවා, අපට මේක කරන්න පුළුවන් කියලා. අපි අනිවාර්යයෙන්ම මේක කරනවා. සූර්ය විදුලි බලය control එකක් සහිතව අපේ system එකට වැඩිපුර ලබා ගැනීම තමයි අපේ අවශ්‍යතාව. අපි හිතනවා, 5kWවලට වඩා වැඩියෙන් rooftop solarවලින් විදුලිය නිපදවන 45,000කට අධික පිරිසක් ඉන්නවා කියා. ඇත්තටම අද වන විට ලංකාවේ මෙගාවොට් 1,500ක විතර ප්‍රමාණයක් සූර්ය විදුලි බලය විධියට නිෂ්පාදනය කරනවා. එසේ නිෂ්පාදනය කරන 1,500ක් පමණ වන මෙගාවොට් ප්‍රමාණය control එකක් සහිතව අපේ system එකට ඉදිරියේදී ගන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා.

ඒ වාගේම තවත් විශේෂම දෙයක් තමයි, අපේ electricity tariff එක. අද වෙනකල් දවල් කාලයේ අපි වැඩිපුර විදුලිය උත්පාදනය කළත්, එසේ වැඩිපුර උත්පාදනය කරන විදුලිය curtail කරන්න, ඒ කියන්නේ කපන්න සිද්ධවෙලා තිබෙනවා කියලා අපි දන්නවා. ඒකට ලොකුම හේතුව තමයි, time-based tariff එකක් නැතිකම. අපි හිතනවා, smart metering system එක හරහා, smart grid system එක හරහා බොහොම ඉක්මනින් ඒක අපට ලංකාව තුළට අරගෙන එන්න පුළුවන් වේවි කියලා. ඇත්තටම අපට මිලියන 7ක පමණ පාරිභෝගික ජනතාවක් ඉන්නවා. ඒ පාරිභෝගික ජනතාවට මේ time-based tariff එක හරහා ලොකු සහනයක් ලබා දෙන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා.

ඒ වාගේම අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා, අවුරුදු 3ක් ඇතුළත සියයට 30කින් විදුලි බිල අඩු කරනවා කියලා. මම හිතනවා, මේවා හරියට ක්‍රමවත්ව කරන්න පුළුවන් කියලා. එහෙම නැතුව පාඩු පිට නොවෙයි. 2014 ඉඳලා 2022 වෙනකල් අපේ රටේ විදුලි බිලේ කිසිදු වෙනසක් නොකර එවක සිටි පාලකයින් ඔවුන්ගේ දේශපාලන වාසි සඳහා විදුලි බිල ඒ විධියටම පවත්වාගෙන ගියා. අන්තිමට රුපියල් බිලියන 500ක විතර පාඩුවක් ඇතිවෙලා තමයි ලංකා විදුලිබල මණ්ඩලය නතර වුණේ. අපි හිතනවා, රටේ ජනතාවටත් බරක් නොවී, ලංකා විදුලිබල මණ්ඩලයටත් පාඩුවක් නොවී, cost-reflective method එකකින් අවුරුදු 3ක් ඇතුළත විදුලි බිල හරියටම සියයට 30කින් අඩු කිරීමේ target එකට ඇත්තටම අපට මේ ක්ෂේත්‍රය අරගෙන යන්න පුළුවන් කියලා.

අවසාන වශයෙන් හෝ කිව යුතු තවත් විශේෂ කාරණයක් තිබෙනවා. ඇත්තටම අපට දැන් අවස්ථාවක් ලැබී තිබෙනවා, විශේෂයෙන්ම ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය හරහා අපේ රට ඇතුළේ ඛනිජ තෙල් ගවේශනයට අවස්ථාව ලබා ගැනීමට. අද වනකොට ඉන්දියාව පවා තමන්ගේ බලශක්ති අවශ්‍යතාවෙන් සියයට 45ක් පමණ තම රට තුළින්ම සපයා ගන්නවා. අපට තවමත් ඒක කරන්න බැරිවෙලා තිබෙනවා. නමුත් අපි 2011 වසර වනකොටම හඳුනාගෙන තිබෙනවා, ලංකාවේ මන්නාරම් ද්‍රෝණියේ යම් කිසි විභවයක්, ප්‍රවණතාවක්, පුළුවන්කමක් තිබෙනවා කියලා; එහෙම නැත්නම් natural gas නිධි තිබෙනවා කියලා. ඇත්තටම අපට ඒ වෙලාවේත් හඳුනාගන්න පුළුවන් වෙලා තිබුණා, නිධි දෙකක් තිබුණා කියලා. ඉතින් අපි බලාපොරොත්තු වනවා, ලබන අවුරුද්දේ මුල් කාර්තුව තුළ ඒ සඳහා ටෙන්ඩර් කැඳවන්න. ඒකට අදාළ සමාගම් දැනටමත් අපිත් එක්ක සාකච්ඡා කරනවා. එම සමාගම් අපිත් එක්ක එකතු වෙලා ලංකාවේ වියදමකින් තොරවම ඒ ගවේශන කටයුතු සිදු කරයි කියලා අපි හිතනවා. ඇත්තටම අපට එවැනි නිධියක් සොයාගන්න පුළුවන් වුණොත්, ලංකාව ඇතුළේ බලශක්ති ක්ෂේත්‍රය තුළ අපට ලොකු විප්ලවයක් කරන්න පුළුවන් වේවි. මෙන්න මේ කරුණුත් එක්ක අපේ බලශක්ති ක්ෂේත්‍රය තුළ මේ වසර දෙක, තුන ඇතුළත අනිවාර්යයෙන්ම අපට විශාල වෙනසක් සිදු කරන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. අනිවාර්යයෙන්ම අපේ target එක තමයි, හොඳ විදුලි බිලක් යටතේ කර්මාන්ත සහ ලංකාවේ සියලුම ජනයා සඳහා අඩු මිල ගණන්වලට විදුලිය ලබා දීම. අනෙක් පැත්තෙන් බලශක්ති ක්ෂේත්‍රයේ විප්ලවය අපි මේ අවුරුදු 5 ඇතුළත අනිවාර්යයෙන්ම සිදු කරන්න උත්සාහ කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු එරංග වීරරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.37]

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)

(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අප රජය මහජන කේන්ද්‍රීය බලශක්ති පරිවර්තනයක් - people-centric energy transition

එකක් - කරා යන ගමන සාර්ථක කර ගැනීමට ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කර ප්‍රේෂණය, ජනනය, බෙදා හැරීම සහ පද්ධති පාලනය වෙනුවෙන් සමාගම් 4ක් ස්ථාපිත කර තිබෙනවා. අපි තරගකාරී මිල ක්‍රමයක් අනුගමනය කළොත්, බලශක්තිය ජනනය කිරීම, බෙදා හැරීම සහ සම්ප්‍රේෂණ කටයුතුවලට යන පිරිවැය අඩු කර ගන්නත්, කර්මාන්තවලට අවශ්‍ය බලශක්තිය අඩු මිලට ලබා දෙන්නත් පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම බලශක්ති ක්ෂේත්‍රයේ අනාගතය, අපේ රටේ ආර්ථිකයේ ඊළඟ පිම්ම වන ඩිජිටල් ආර්ථිකය සමඟ බද්ධ වන්නේ කෙසේද කියන එක සම්බන්ධවත් මම මේ සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි.

වර්තමාන ලෝකය තුළ කෘත්‍රිම බුද්ධිය කියන්නේ, වේගයෙන් දියුණු වන ක්ෂේත්‍රයක්. මේ තාක්ෂණයට දත්ත දැවැන්ත ප්‍රමාණයක් අවශ්‍යයි. ඒ දත්ත ගබඩා කරන්න, AI data centres අවශ්‍ය වනවා. AI data centres සඳහා 2024දී ගෝලීය විදුලි පරිභෝජනයෙන් ටෙරාවොට් පැය 415ක් පමණ අවශ්‍ය වනවා. ඒ කියන්නේ, ගෝලීය විදුලි පරිභෝජනයෙන් සියයට 1.5ක්. එය, 2030 වසර වනකොට දෙගුණයක් වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. ඒ කියන්නේ, සියයට 23ක් දක්වා එම ප්‍රමාණය වැඩි වෙයි. Data centre එකකට යන පිරිවැයෙන් සියයට 50කට වඩා වැඩි ප්‍රමාණයක් යන්නේ විදුලිබල ශක්තියට. අපි උදාහරණයක් විධියට, data centre එකක් 10 megawatts කියලා ගත්තොත්, ඒ data centre එක නඩත්තු කරන්න විදුලි බලයට පමණක් ඩොලර් මිලියන 8ක්, 12ක් වාගේ මුදලක් වාර්ෂිකව වැය වනවා. මම ඒ ගැන සඳහන් කළේ, බලශක්තිය කියන එක data centre එකකට කොච්චර අවශ්‍යයිද කියලා මේ සභාවට ඒත්තු ගන්වන්න.

අපේ ලංකාව පිහිටා තිබෙන්නේ, submarine cablesවල කේන්ද්‍රස්ථානයේ. ඒ කේන්ද්‍රස්ථානයේ පිහිටීම උපයෝගී කරගෙන අපට පුළුවන් වනවා, ආසියානු කලාපයේ සහ ජාත්‍යන්තරයේ දත්ත මධ්‍යස්ථාන hub එකක් හැටියට කටයුතු කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විදේශීය ආයෝජකයෙක් ලංකාවට ඇවිල්ලා data centre එකක් ආරම්භ කරන්න හිතනවා නම්, ඔහු ප්‍රධාන ප්‍රශ්න දෙකක් අහනවා. ඉන් එකක් තමයි, "මට පැය 24ක් පුරාවටම, මිලි තත්පරයකටවත් විසන්ධි නොවන විදුලියක් ලබා දෙන්න පුළුවන්ද?" කියන එක. මෙහිදී තමයි අපට ද්විත්ව විදුලි පද්ධතියක - dual-grid system එකක, ඔරොත්තු දීමේ ඉහළ හැකියාවක් තිබෙන විදුලි පද්ධතියක වැදගත්කම මතු වන්නේ. දත්ත මධ්‍යස්ථානයක් තත්පරයකට හෝ බිඳ වැටුණොත් සිදුවන පාඩුව ඩොලර් මිලියන ගණනක් වෙන්න පුළුවන්. ඒ නිසා අපට ඉතාම ශක්තිමත් හා ස්ථායී - resilient - විදුලි පද්ධතියක් අවශ්‍ය වනවා. විදුලිය ලබා දෙන එක් මාර්ගයක් බිඳ වැටුණොත්, ක්ෂණිකව තවත් මාර්ගයකින් විදුලිය ලබා දෙන්න අවශ්‍යයි, දත්ත පද්ධතියට අඛණ්ඩ විදුලිය ලබා දෙන්න. ඒ සඳහා ද්විත්ව පෝෂක ප්‍රදේශ නිර්මාණය කරන්න අපේ රජය සැලසුම් සකස් කරමින් තිබෙනවා.

දත්ත මධ්‍යස්ථාන ගැන කථා කරනකොට දත්තවල ස්වෛරීභාවය ඉතාම වැදගත්. ලෝකයේ තිබෙන නවතම සංකල්පයක් තමයි, දත්ත තානාපති කාර්යාල - data embassies - කියන එක. එස්තෝනියාව කියන්නේ, මේ ක්ෂේත්‍රයේ ඉතාම ඉහළින් සිටින රාජ්‍යයක්. වෙනත් රටවල රජයන්ට ඔවුන්ගේ ඉතා වැදගත් දත්ත ආරක්ෂිතව ගබඩා කිරීම සඳහා අපේ රටේ ඉඩ පහසුකම් ලබා දීමට මේ data embassy කියන සංකල්පය හරහා අපි අවධානය යොමු කරනවා. මෙය ක්‍රියාත්මක කරන්න නම්, අපේ රජයටත්, අපේ රටටත් ඉතාම ඉහළ මට්ටමේ බලශක්ති සුරක්ෂිතතාවක් ඇති කර ගැනීම අවශ්‍යයි. මම ඉස්සෙල්ලා සඳහන් කළ විධියට dual-grid system එකකට ගිහිල්ලා ස්ථායීතාව සහ අඛණ්ඩ බලශක්තියක් ලැබෙන විධියට අපේ grid එක සකස් කරන්න ඕනෑ. ඒක සකස් කරගෙන data embassy කියන model එකට ගියොත්, අපේ රටට විශාල වශයෙන් විදේශ විනිමය ගෙනෙන මාර්ගයක් ඇති කර ගන්න පුළුවන් වනවා, ලංකාවේ data centres ස්ථාපිත කිරීම හරහා. ලංකාවේ data centres හදනවා නම්, අපේ විදුලි සන්දේශ සමාගම් හරහා අපට පුළුවන් විශාල වශයෙන් අපේ බලශක්තිය ප්‍රයෝජනයට ගන්න. බලශක්තිය ප්‍රයෝජනයට ගන්නා සමාගම් උනන්දුවක් දක්වනවා, ඔවුන්ම බලශක්තිය නිපදවිය යුතුයි කියන අවශ්‍යතාව මත බලශක්ති ජනනය කරන මධ්‍යස්ථාන ස්ථාපිත කර ගන්න.

ඒ උනන්දුව තිබෙන නිසා ඔවුන්ට අවශ්‍යයි, power wheeling කියන සංකල්පය යොදා ගන්න. ඒ සමාගම්වලට අවශ්‍ය බලශක්තිය තිබෙන තවත් ප්‍රදේශයක ඒ සමාගම විසින්ම ආයෝජනය කරලා පුනර්ජනනීය බලශක්ති වන සූර්යයා හෝ සුළං හෝ බලශක්ති ප්‍රභවයක් තුළින් බැටරි මාර්ගයට ගිහිල්ලා power wheeling කියන සංකල්පය හරහා පුළුවන්, වෙනත් ප්‍රදේශයක සිට තවත් ප්‍රදේශයක තිබෙන ඔවුන්ගේ කාර්යාලවලට, data centresවලට බලශක්තිය ලබා ගන්න. මේ power wheeling ක්‍රමයටත් යන්නත් අපි කටයුතු කර ගෙන තිබෙනවා. අපේ බලශක්ති ඇමතිතුමා ඇතුළු ඒ අමාත්‍යාංශය ඉතාම ඉක්මනින් මේ ක්‍රමය ගෙනෙන්න මේ දවස්වල කටයුතු කරමින් ඉන්නවා. මේ හරහා අපට පුළුවන් වෙයි, අපේ ආයෝජකයන්ට අවශ්‍ය හරිත බලශක්තිය, ඒ කියන්නේ green energy ඔවුන්ටම නිපදවා ගන්න පුළුවන් ආකාරයට කටයුතු ඇති කරන්න. ඒක අපේ රටට විදේශ ආයෝජකයන් ආකර්ෂණය කර ගන්න ප්‍රබල සාධකයක් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. සාම්ප්‍රදායික ක්‍රමයෙන් බැහැර වෙලා, රජය සතු මෙම සමාගම් හතර සහ බෙදා හැරීමේ ආයතනය වන LECO එක ඩිජිටල්කරණය කරන්න අපි කටයුතු කර ගෙන යනවා. උදාහරණයක් විධියට smart grid එකක් ගත්තොත්, විදුලිය නිෂ්පාදනයේ සිට බෙදා හැරීම දක්වාම ඩිජිටල් තාක්ෂණයෙන් පාලනය වන grid එකක් ඇති කරලා ඒ තුළින් අපට පුළුවන්, ඉතාම කාර්යක්ෂම සහ නවීන තාක්ෂණයෙන් යුතුව අඛණ්ඩව විදුලිය ලබා දෙන්න. ඒ සඳහා අපි කටයුතු කර ගෙන යනවා. පාරිභෝගිකයන් පාවිච්චි කරන විදුලි ඒකක ප්‍රමාණය ඉතාම ඉක්මනින් බලා ගන්නත්, කාර්යක්ෂමව විදුලිය පරිභෝජනය කරන්න උනන්දුවක් ඇති කරන මේ smart meter ක්‍රමය හඳුන්වා දෙන්නත් අපි කටයුතු කර ගෙන යනවා. ඒ වාගේම අපි මේ ක්ෂේත්‍රය තුළ කාර්යක්ෂමතාව වැඩි කරන්න, නාස්තිය අඩු කරන්න, පිරිවැය අඩු කරන්න අදාළ බලශක්ති මූලයන් ලංකාවේ ඇති කරන්න කටයුතු කර ගෙන යනවා. ඒ වාගේම අපි විදේශ ආයතන තුළ සෑහෙන උනන්දුවක් ඇති කරනවා, ලංකාවට ඇවිල්ලා බලශක්ති මධ්‍යස්ථාන ආරම්භ කරන්න. එම බලශක්තිය පරිහරණය කරන, අපේ රටට විදේශ විනිමය ගෙනෙන data centres සහ ඩිජිටල් පද්ධති නිර්මාණය තුළින් හා Foreign Direct Investments - FDIs - තුළින් මේ රටේ ආර්ථිකය සවිබලගන්වන්න අපි කටයුතු කර ගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බලශක්ති ප්‍රතිපත්තිය කියන්නේ හුදෙක් විදුලි බල්බයක් දැල්වීම පමණක් නොවෙයි. ඒක අපේ ඩිජිටල් ආර්ථිකයේ එන්ජිම පණ ගන්වන්න යන යන්ත්‍රණයක් කිව්වොත් ඒක නිවැරදියි. දත්ත මධ්‍යස්ථාන, data embassies, power wheeling වාගේ නවීන සංකල්ප හරහාත්, බලශක්ති ක්ෂේත්‍රය හරියට කළමනාකරණය කිරීම හරහාත් අපට පුළුවන් වෙනවා, අපේ ශ්‍රී ලංකාව ආසියාවේ ඩිජිටල් කේන්ද්‍රස්ථානයක් බවට පත් කරන්න. මේ සඳහා අපේ බලශක්ති අමාත්‍යාංශය පෙරමුණ ගෙන තිබෙනවා. අපේ රජය මේ සඳහා අවශ්‍ය සියලු කටයුතු කර ගෙන යනවා. ඒකට අවශ්‍ය, හිතැති අය

[ගරු එරංග වීරරත්න මහතා]

වැයක් අපි මෙවර ඉදිරිපත් කරලා තිබෙනවා. මේ අය වැය හරහා අපට පුළුවන් වෙයි, අපි බලාපොරොත්තු වන ඉලක්ක කරා නුදුරු අනාගතයේදීම ළඟා වෙන්න. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 25ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.46]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම ඉතාම වැදගත් අමාත්‍යාංශයක් යටතේ අදහස් දක්වන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

විදුලි බලය ගැන කථා කරද්දි විශේෂයෙන්ම අපට දැන් මේ කියන අවුරුදු 76ක ශාපය ගැන මතක් වෙනවා. මේ අවුරුදු 76ක ශාප කාලය ඇතුළත මේ රටේ විදුලි බලය සම්බන්ධව මොන වාගේ වෙනසක් වුණාද? විශේෂයෙන්ම ඩඩ්ලි සේනානායක, සර් ජෝන් කොතලාවල මැතිතුමන්ලාගේ අවධියේ මේ රටේ කර්මාන්තකරණය ආරම්භ වුණා. ඒ කර්මාන්තකරණයත් එක්ක විදුලිබල අවශ්‍යතාව ඇති වුණා. විශේෂයෙන්ම අපි ස්තුතිවන්ත වෙනවා, අපේ රටේ විදුලි බලයේ පියා වන ඩී.ජේ. විමලසුරේන්ද්‍ර මැතිතුමාට. එතුමාගේ තාක්ෂණික නායකත්වයෙන් එදා අපේ ප්‍රථම ජල විදුලි බලාගාරය විධියට ලක්ෂපාන ව්‍යාපෘතිය ආරම්භ වුණා. අපේ රට ඉදිරියට යනකොට 1977 විප්ලවයත් එක්ක, ඒ ආර්ථික වැඩ පිළිවෙළත් එක්ක මහවැලි සංවර්ධන වැඩසටහන පටන් ගත්තා. විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මහවැලියේ පළමු අදියර විධියට පොල්ගොල්ල වේල්ල හදලා මහවැලි ගඟේ ජලය බෝවතැන්න ජලාශය දක්වා හැරෙව්වා, උකුවෙල ජල විදුලි බලාගාරයකුත් හදලා. ඒ විධියට මහවැලි විදුලිබල පද්ධතිය හැදුවා. මහවැලි පද්ධතියට විදුලිය මෙගාවොට් 1,200කට වැඩි ප්‍රමාණයක් එකතු වුණා. අපේ රටේ දැවැන්ත විදුලිබල විප්ලවය පටන් ගත්තේ අන්න ඒ මහවැලි පද්ධතියත් එක්ක. ඒ තුළ වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ, කොත්මලේ, මොරගහකන්ද -මොරගකන්ද පස්සේ හැදුණේ මහවැලි පද්ධතිය තුළ- සමනලවැව කියන ජලාශ පද්ධතියම හැදුණා. ඒ එක්ක අපේ රටේ විදුලි අවශ්‍යතාව සම්පූර්ණ කරන්න පුළුවන් තැනට විදුලිය නිෂ්පාදනය වුණා. විශේෂයෙන්ම දකුණු ආසියාවේ ඉතාම කඩිනමින්ම සහ රටේ ජනතාවගේ විදුලිය අවශ්‍යතාව - දැනටත් සියයට 99.9ක - සම්පූර්ණ කරපු රට තමයි ශ්‍රී ලංකාව. 1997දී ලංකා විදුලිබල මණ්ඩලය සතුව fixed deposits තිබුණා. මේ විධියට තමයි ලංකා විදුලිබල මණ්ඩලය ඉදිරියට ආවේ. 1994දී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය බලයට ආවාට පස්සේ හැදුණේ මට මතක විධියට කුකුලේ ගඟ විදුලි බලාගාර ව්‍යාපෘතිය විතරයි. හැබැයි ඒ වෙලාවේ විදුලිබල පද්ධතියේ ආපු දියුණුව යම් මට්ටමකට නතර වුණා. ඒ නිසා හදිසි මිලදීගැනීම් වාගේ දේවල් ආරම්භ වුණේ 1994න් පස්සේ. එතකොට මේවාත් 76 ශාපයට අයිතිද කියලා මම අහන්න කැමැතියි.

විශේෂයෙන්ම අපේ විදුලිබල පද්ධතිය ගත්තාම, ආසියාවේ රටවලින් අඩුම loss එක තිබෙන විදුලි පද්ධතියත්, distribution network එකත්, transmission network එකත් තිබෙන්නේ අපට. ඒකත් ශාපයද කියලා මම අහන්න කැමැතියි. හැබැයි ශාපයට හේතු වුණු කාරණා තිබුණා. අපේ ට්‍රාන්ස්ෆෝමර් ගණනාවක් ගිනි තැබුවා. නොරොච්චෝලේ විදුලි බලාගාරය ගැන කිව්වොත්, අපි පිළිගන්න ඕනෑ, මහවැලි පද්ධතියෙන් පස්සේ අපේ රටට එකතු වුණු විශාලම විදුලිබල පද්ධතිය මෙගාවොට් 900කින් යුතු නොරොච්චෝලේ විදුලි බලාගාරය කියලා. ඒක අත්‍යවශ්‍ය ව්‍යාපෘතියක්. දැනටත් ඒක අපේ විදුලිබල පද්ධතියට විශාල දායකත්වයක් දෙනවා. ඒක හදපු එකට, ඒ දේශපාලන තීන්දුවට මහින්ද රාජපක්ෂ මහත්මයාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. හැබැයි එදා ඒකට විරුද්ධවත් කටයුතු කළා, ජනතා විමුක්ති පෙරමුණ .

ඒ වාගේම, සාම්පූර් විදුලි බලාගාරය ගැන මම එදාත් කිව්වා, අදත් කියනවා, හෙටත් කියනවා. අපට දෙවෙනි ගල්අඟුරු බලාගාරයක් තිබුණා නම් ඒක අපට තවත් සම්පතක්. ඒ සාම්පූර් බලාගාරය අපිට හදාගන්න බැරි වුණා. ඒකට යම්කිසි විධියකින් මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමාත් වගකියන්න ඕනෑ. ඒ දේශපාලන නායකත්වය ඒ තීන්දුව ගත්තේ නැහැ. ඒක අඩුපාඩුවක්. ඒ වාගේම මට මතකයි, උමා ඔය ව්‍යාපෘතිය 2010-2011 වාගේ තමයි පටන් ගත්තේ. ඒ ව්‍යාපෘතිය අවුරුදු 15ක් ඇදුණා. මීට මාස කිහිපයකට, අවුරුද්දකට ආසන්න කාලයකට කලින් තමයි ඒ බලාගාරයේ වැඩ කටයුතු අවසන් වුණේ. ඒක ප්‍රමාද වෙන්නත් ජනතා විමුක්ති පෙරමුණේ උද්ඝෝෂණ ඇතුළු බාධාකිරීම් බලපෑවා. ඒක විදුලිය මෙගාවොට් 120කික් යුතු ව්‍යාපෘතියක්. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, 2015-2016 කාලය තුළ ඒ විදුලිය මෙගාවොට් 120 හදලා දෙන්න පුළුවන් වුණා නම්, අපේ රටට කොච්චර හොඳ ද? 2015 ඉඳන් මේ දක්වා අවුරුදු 10ක් තිස්සේ ඒක හදන්න බැරි වීම නිසා අපේ රටට වෙච්ච අලාභයේ - loss එකේ - වටිනාකම රුපියල් බිලියන ගණනින් තමයි බලන්න වෙන්නේ. "හිලක් හිලක්, උමා ඔයේ හිලක්" කියලා උමා ඔයේ හිල හෙව්වා, ඒ දවස්වල. මෙතැන හිටියා නම් හොඳයි අපේ සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා. මම ඒ ගැන හොඳටම දන්නවා. මොකද, එතුමා උමා ඔයේ හිල හොයන කාලයේ මම හිටියේ tunnel එක ඇතුළේ. එකයි මම දන්නේ. ඒ වාගේ ව්‍යාපෘති ගණනාවක් ආපස්සට ඇදගෙන ගිය අය තමයි මේ. විදුලිය මෙගාවොට් 150ක Upper Kotmale Hydropower Project එක සම්බන්ධයෙනුත් ඒ දවස්වල යම් උද්ඝෝෂණ තිබුණා. කොහොම හරි අපට නිසි කාලයට ඒ ව්‍යාපෘතිය කරන්න පුළුවන් වුණා, උද්ඝෝෂණ කොච්චර තිබුණත්.

මේ රටේ විදුලිය පැත්තෙන් ගත්තාම -76 ශාපයන් නොවෙයි- ඇත්තටම, දකුණු ආසියාවේ ඉදිරියෙන්ම හිටපු රටක් අපි. හැබැයි, අද අපි විදුලි මිල සම්බන්ධයෙන් නරක පැත්තකයි ඉන්නේ. මොකද, අද අපේ නිෂ්පාදන වියදම වැඩියි. ඒක බරපතළ තත්ත්වයක්. ඒ නිසා අපි කළ යුතු ක්‍රියාමාර්ග කිහිපයක් තිබෙනවා. දැන් අපි FSR Unit එකක් ගැන කථා කරනවා. මේ FSR Unit එක පිළිබඳව මම SOC එකේදීත් කථා කළා; අමාත්‍යාංශ ලේකම්තුමාගෙන් දෙතුන් පාරක් ඇහුවා. ඒකට ටෙන්ඩරයක් award කරලා තිබෙනවා. හැබැයි මම මේ අවස්ථාවේ කියනවා, මේක වෙන්නේ නැහැ කියලා. මේ ව්‍යාපෘතිය වෙන්නේ නැහැ. ලොවෙත් වෙන්නේ නැහැ. මේක චීන සහ පාකිස්තාන සමාගම් දෙකක් ඒකාබද්ධ වෙලා තමයි කරන්නේ. පාකිස්තාන සමාගම සතුව තමයි තාක්ෂණික දැනුම සහ ඒ අත්දැකීම් තිබෙන්නේ. ඒ ආයෝජනය කරන්නේ චීන සමාගමක්. හැබැයි, මේක වෙන්නේ නැහැ. මොකද, මේ ව්‍යාපෘතිය පාඩුයි. 2035 දක්වා අපේ රටේ LNG අවශ්‍යතාව මිලියන 10ත්, 15ත් අතර ප්‍රමාණයක් MMBtu per year. හැබැයි මේ FSR Unit එක හැදුවොත් ඒකේ capacity එක මිලියන 40ක් MMBtu. මේ, අමතර ප්‍රමාණයක්. එතැන අතිරික්තයක් තිබෙනවා. FSR Unit එකේ rental එක අවුරුද්දකට ඩොලර් මිලියන 125යි. ඒක ගෙවන්නම ඕනෑ. අපි වැඩ කළත් නැතත්, LNG පාවිච්චි කළත් නැතත් ගෙවන්න ඕනෑ. හැබැයි, අපට යෝජනාවක් ඇවිල්ලා

තිබෙනවා. මම හිතන විධියට ඇමතිතුමාත් දන්නවා. ඉන්දියාවේ කොචින්වල තිබෙනවා, FSR Terminal එකක්. අපට කොචින්වලින් LNG ගන්න පුළුවන්. කොචින්වලින් අපට කන්ටේනර්වල බහලුම් විධියට ගෙනැල්ලා කුඩා terminal එකක් හදලා සම්බන්ධ කර ගත්තොත්, අවුරුද්දකට ඩොලර් මිලියන 40ක වාගේ ප්‍රමාණයකින් අපේ අවශ්‍යතාව සම්පූර්ණ කරගන්න පුළුවන්. FSRU ටෙන්ඩර් එක නිසා අපට අමතරව ඩොලර් මිලියන 85 ගාණේ අවුරුදු 10ට යනවා ඩොලර් මිලියන 850ක්. ආසන්න වශයෙන් US Dollars 1 billion වාගේ ප්‍රමාණයක්. මේකත් දරන්න වෙන්නේ පාරිභෝගිකයාට. ඒ නිසා ගරු ඇමතිතුමාට මම කියනවා, ඉන්දියාවත් එක්ක සාකච්ඡා කරලා කොචින් Terminal එකෙන් LNG ගන්න කටයුතු කරන්න කියලා. මොකද, අපට LNG supply එක තිබුණොත් සොබාදනවි, ලක්දනවි plants දෙකෙන් මෙගාවොට් 700ක් දුවන්න පුළුවන්. දැන් දුවන ඩීසල් වියදමට වඩා රුපියල් 20ක්, 23ක්, 24ක්, 25ක්, 26ක් වාගේ මුදලක් අඩු වෙනවා, LNG supply එක අපට දෙන්න පුළුවන් වුණොත්. මම දන්නේ නැහැ, මට නම් පේන්නේ විදුලිබල අමාත්‍යාංශය ඉබි ගමනින් යනවා වාගෙයි. අපි නිතර මේ ගැන කථා කරනවා. හැබැයි අපට පේන්නේ නැහැ අවශ්‍ය තීන්දු තීරණ ගන්නා බවක්.

ඔබතුමන්ලා පසුගිය ටිකේ - ඔබතුමන්ලා කළාද, කංචන කළාද කියලා හොයන්නත් බැහැ - Battery Energy Storage System - BESS - එකට tariff එකක් හැදුවා. හැබැයි ගරු ඇමතිතුමා, තවම ඒ tariff එක -රුපියල් හතළිස් ගණනක tariff එක - ඔබතුමන්ලා අත්සන් කර දීලා නැහැ. මේ tariff එකට දැනට තිබෙන ground-mounted solar panels සම්බන්ධ කරන්නත් පුළුවන්, rooftop solar panels සම්බන්ධ කරන්නත් පුළුවන්. හැබැයි මේ tariff එකට මේ අයට ගිවිසුම්ගත වෙන්න ඔබතුමන්ලා තවම මේ tariff එක අනුමත කරලා, අත්සන් කරලා නැහැ. මම හිතන විධියට, මේ අවුරුද්දේ ද කොහේදෝ ඒ කාලපරිච්ඡේදය අවසන් වෙනවා. ඔබතුමාට ඊයේ පෙරේදා Grid Connected Solar Power Association එකෙන් ලියුමකුත් එවා තිබෙනවා. ඔබතුමා තවම මේ කටයුත්ත කරලා නැහැ. ඔබතුමා ඒ සම්බන්ධයෙන් උත්තරයක් දෙනවා නම් හොඳයි.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු මන්ත්‍රීතුමා, ඕවාට - ratesවලට - මම අත්සන් කරන්න අවශ්‍ය නැහැ. කැබිනට් එකෙන් approval එකක් අරගෙන දීලා තිබෙනවා. ඒගොල්ලන් ඒක publish කරලා මම දැක්කා propaganda එකකුත් යනවා. ඒ හින්දා මම අත්සන් කරන්න ඕනෑ නැහැ tariffsවලට. Tariff එක අපි අනුමත කර දීලා තිබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

නොවැම්බර් 11 දින තමයි ඔබතුමාට මේ ලියුම එවලා තිබෙන්නේ. ගරු ඉංජිනේරු කුමාර ජයකොඩි කියන්නේ ඔබතුමා නේද? ඔබතුමාටයි මේක එවලා තිබෙන්නේ. ඉතින්, මේකට වැඩ කරලා නැහැ. ඔබතුමා අත්සන් කරන්නේ නැත්නම් අත්සන් කරන නිලධාරියා ලව්වා හරි මේක කරවන්න. මේක කෙරිලා නැහැ. ඒකයි මම මේ කියන්නේ. මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න ඕනෑ කවුරු හරි නිලධාරියෙක් ඇති නේ. ඔබතුමා නේ වගකිවයුත්තා. එහෙම නැතුව නලින් බණ්ඩාර නොවෙයි නේ, විදුලිබල ඇමති.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

Circulars 02ක් issue කරලා තිබෙනවා. ඕක ඒකට අදාළ එකක් නොවෙයි. Circulars 02ක් CEB එකෙන් දැනටමත් issue කර තිබෙනවා. ඒවා ප්‍රසිද්ධ කරලායි තිබෙන්නේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මම දන්නවා. මම මේ ලිපිය **සභාගත*** කරනවා.

ඉතින්, ඒ කටයුත්ත වෙලා නැහැ. ඒ වාගේම ඔබතුමන්ලා මෙගාවොට් 160ක Battery Energy Storage Systems වගයක් locations 13කට හෝ 14කට ටෙන්ඩර් කළා. මම හිතන විධියට, ඒ ටෙන්ඩර් එක open කළා. ඔබතුමාත් උදේ කථාවේදී ඒ ගැන කිව්වා. හැබැයි, තවම award කරලා නැහැ. ඒ ටෙන්ඩර් එකත් ඉක්මනට award වුණොත්, මෙගාවොට් 160ක Battery Energy Storage Systems ටික locations 13ක හෝ 14ක ක්‍රියාත්මක වෙනවා.

ඒ වාගේම මම හිතන විධියට, අද සපුගස්කන්දේ මෙගාවොට් 100කට අදාළ ටෙන්ඩරයක් තිබෙනවා. ඒ ටෙන්ඩරය ගැන හොයලා බලනකොට ඒකට ලංකාවේ කාටවත් bid කරන්න බැහැ. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඒකේ pre-qualifications හැටියට තිබෙනවා, ඒ වාගේ systems කලින් කරලා තිබෙන්න ඕනෑ කියලා. හැබැයි, අපේ රටේ තිබෙනවා, මෙගාවොට් 300, 400 බලාගාර හදපු සමාගම්. අපේ රටේ විතරක් නොවෙයි, LTL වාගේ සමාගම් බංග්ලාදේශයේත් මෙගාවොට් 225ක බලාගාරයක් හදලා තිබෙනවා. නේපාලයෙත් power plants තිබෙනවා. ඉන්දියාවෙත් power plants තිබෙනවා. හැබැයි, ඒ අයට මේකට දමන්න බැහැ. මේක බරපතළ දෙයක් නෙවෙයි. ඔබතුමා දන්නවා Battery Energy Storage System එකක් කිව්වාම, බැටරි ටික ගෙනැල්ලා install කිරීම තමයි එතැන කරන්න තිබෙන්නේ කියලා. ඒ installation එක කරන්න මහා දැනුමක් ඕනෑ නැහැ. පිරිවිතර අනුව අවශ්‍ය බැටරි ටික ගත්තා නම් ප්‍රශ්නයක් නැහැ. හැබැයි, දාලා තිබෙන මේ ටෙන්ඩරය අනුව පැහැදිලිවම අපේ රටේ කිසිම සමාගමකට දෙන්න වෙන්නේ නැහැ. මෙගාවොට් 300, 400, 500 බලාගාර හදපු සමාගම් තිබෙනවා. හැබැයි, ඔවුන් මේ වැඩේ කරලා නැහැ. ඒක හරි. අපි මේ වැඩේ කරන්න පටන් ගත්තේ ඊයේ පෙරේදා නේ. හැබැයි, ඔබතුමන්ලා දාලා තිබෙන qualificationsවලට අනුව අපට පිටරට සමාගමකට තමයි දෙන්න වෙන්නේ. එහෙම නැත්නම් අපේ රටේ ඉන්න ආයෝජකයෙකුට සිද්ධ වෙනවා, JV එකකට යන්න; එහෙම නැත්නම් commission එකකට වෙන සමාගමක් එක්ක සම්බන්ධ වෙන්න වෙනවා. ඉතින්, මේක අපරාධයක්. මම දන්නවා, මේක කරන්නේ ඔබතුමා නොවෙයි කියලා. විදුලිබල මණ්ඩලය ඇතුළේ යම්, යම් මාෆියා තිබෙනවා. ඒ අය එක එක පුද්ගලයන් සතුටු කරන්න, සන්තර්පණය කරන්න එහෙම නැත්නම් ඒ අයට favour කරන්න තමයි මේවා කරන්නේ කියන එක පැහැදිලිවම කියන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, CEB එකට පාඩුයි ලු. ඔබතුමන්ලා විදුලි බිලත් වැඩි කළා. විදුලි බිල වැඩි කළා. විදුලි බිල තුනෙන් එකකින් අඩු කරන්න ආපු අය වැඩි කළා. මහජන උපයෝගිතා කොමිසම කියනවා, අඩු කරන්න කියලා. ඔබතුමන්ලා ඒත් වැඩි කරනවා. ලංකා විදුලිබල මණ්ඩලය මාස හයට කෝටි 13,200ක් -බිලියන 13ක්- අලාභයි. ඇයි මෙහෙම වෙන්නේ? ඒකත් බරපතළ ප්‍රශ්නයක්.

ඔබතුමන්ලා විදුලිබල මණ්ඩලය කොටස් හතරකට කඩන්න හදනවා. මෙහිදී VRS එකට 2,000ක් විතර දැන් එකඟ වෙලා තිබෙනවා. මේකට බිලියන 10ක් ඕනෑ. එතකොට මේ බිලියන

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා ]

10ත් දෙන්න ඕනෑ පාරිභෝගිකයන්ද? VRS එක යටතේ යන අයටත් පාරිභෝගිකයන්ද දෙන්න ඕනෑ? විදුලිබල මණ්ඩලය තවදුරටත් ණයකාරයෙක් බවට පත් වෙන ඒ කාරණයට ඔබතුමන්ලා දෙන විසඳුම මොකක්ද? ඒ වාගේම විදුලිබල මණ්ඩලයේ විශ්‍රාමිකයන් ඉන්නවා. ඒ අයට අවුරුදු තුනෙන් තුනට විශ්‍රාම වැටුප් වැඩිවීමක් සිද්ධ වෙලා තිබෙනවා. හැබැයි, පසුගිය අවස්ථා දෙකේදීම මේ වැඩිවීම වෙලා නැහැ. ඒ ගැනත් ඔබතුමා අවධානය යොමු කරන්න.

ගරු ඇමතිතුමනි, තව කාරණයක් කියන්න ඕනෑ. අපි පසුගිය ටිකේ දැක්කා, - මමත් COPE එකේ සහ COPA එකේ ඉන්නවා - මේ LTL එක සම්බන්ධව අපේ පැත්තෙනුත් වැරදි මත පළ වුණා. අපේ සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාත් කිව්වා, LTL එකට CEB එකෙන් favour කරනවා කියලා. හැබැයි මම දන්න විධියට ඊයේ පෙරේදා අපේ ගරු අගමැතිතුමිය ගිහින් විවෘත කළ සොබාදනවි බලාගාරයේ lowest bid එක තිබුණේ, LTL එකේ. හැබැයි, CEB එක ඒ ව්‍යාපෘතිය LTL එකට දුන්නේ නැහැ. මට මතක විධියට චීන සමාගමකට දෙන්න කියලා නඩු ගිහිල්ලා අවුරුදු දෙකක්ද කොහේද නඩු කියලා තමයි LTL එක ඒ ටෙන්ඩරය ගත්තේ. ඒ නිසා මම දන්න විධියට LTL එකට CEB එක favour කරන්නේ නැහැ. CEB එක LTL එකට වැඩක් කරන්න දෙන්නේ නැති එක තමයි මම දන්න තත්ත්වය.

LTL එකට නේපාලයේ මෙගාවොට් 10ක hydropower plant එකක් තිබෙනවා; බංග්ලාදේශයේ මෙගාවොට් 225ක plants තුනක් තිබෙනවා; ඉන්දියාවේ මෙගාවොට් 4ක solar power plants දෙකක් තිබෙනවා; ඉන්දියාවේ switchgears හදන කර්මාන්තශාලාවක් තිබෙනවා; ටැන්සානියාවේ ට්‍රාන්ස්ෆෝමර් හදන කර්මාන්තශාලාවක් තිබෙනවා. ඒ වාගේම, බහරේන්වල ට්‍රාන්ස්ෆෝමර් කර්මාන්තශාලාවක් හදන්න නියමිතව තිබෙනවා.

අපි දන්නනවා, LTL එක 1980දී පටන් ගත්තේ Lanka Transformers Limited කියන ආයතනය ලෙස බව. මා කියන්නේ, LTL එක හොඳ model එකක් කියලායි. අද අපට පෙනෙනවා, COPE එකට ගෙන්වලා LTL එකත් විනාශ කරන්න හදන බවක්. මොකද, COPE එකට ගෙන්වනවා නම්, විගණකාධිපතිතුමා විගණනය කරනවා නම්, regulations ටිකත් හදන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. අපේ CEB එකේ තිබෙන Regulations අනුව LTL එක වැඩ කරන්න ගියොත්, LTL එකේ බලාගාර මාස ගණන් වසා තබන්න වෙනවා. මම දන්නවා, කැලණිතිස්ස සොජිට්ස් බලාගාරයේ මොකක් හරි පොඩි දෙයක් කැඩුණාම වෙන දේ. ඒකට අදාළ මිල දී ගැනීමක් කරන්න ගියාම Engineer දමනවා, AGMට; AGM දමනවා, DGMට; DGM දමනවා, GMට. ඒකේ purchasing වැඩේ කරන්න මාස තුනහතරක් යනවා. හැබැයි, LTL එක මොකද කරන්නේ? මොකක් හෝ කෑල්ලක් කැඩිලා නම්, Business Class ටිකට් එකක් හරි අරගෙන දීලා තමන්ගේ ඉංජිනේරුවෙක් යවන දිල්ලියකට යවලා එය ගෙන්වා ගන්නවා. ස්වීඩනයට වෙන්න පුළුවන්, ABB එකට වෙන්න පුළුවන්, Schneider එකට වෙන්න පුළුවන්, චීනයට වෙන්න පුළුවන් යවලා ටක් ගාලා ඒ part එක ගෙනැල්ලා සවි කරනවා. මොකද, ඒගොල්ලන්ගේ Agreement එක අනුව විදුලි බලාගාර වහලා තිබුණොත් ඒගොල්ලන්ට ගෙවන්න වෙනවා. ඒ නිසා LTL එක කියන්නේ, හොඳ model එකක්. අපි ඒකට ඊර්ෂ්‍යා කරලා වැඩක් නැහැ.

ඒ ආයතනයේ සේවකයන් සතුව යම් කොටස් ප්‍රමාණයක් තිබෙනවා. 1980 ගණන්වල නොයෙක් රාජ්‍ය ආයතනවලට සේවකයන්ට කොටස් දීම කියන ක්‍රමය apply කළා. ටෙලිකොම් ආයතනයේ සේවකයන්ට කොටස් දුන්නා, Ceylon Oxygen Limited එකේ සේවකයන්ට කොටස් දුන්නා. සමහරුන්ට නොමිලයේ කොටස් දුන්නා. හැබැයි, ඒ වෙලාවේ LTL එකේ සේවකයෝ කොටස් මිල දී අරගෙනයි තිබුණේ. කොටස් මිල දී ගන්න ඒ ආයතනයෙන්ම ණයක් ගත්තා කියලා, අප ඒවාට ඔට්ටු වෙලා වැඩක් නැහැ. අපේ රටේ අද විදුලිබල මණ්ඩලය 4ට කඩද්දී LTL එක පූර්වාදර්ශයක් කර ගන්න බලන්න. පුළුවන් නම් විදුලිබල මණ්ඩලයේ සේවකයන්ටත් කොටස් දෙන්න. ඔය ඉංජිනේරු මහත්වරුන්ට, DGM මහත්වරුන්ට කොටස් දෙන්න. එහෙම කරලා බලන්න, අදට වඩා හොඳට වැඩ කරන්නේ නැති වෙයිද කියලා. ඒ වාගේම චෝදනා කරනවා, LTL එකේ සේවක කොටස් ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණය 15දෙනෙකු සතුව තිබෙනවා කියලා. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, කොම්පැනියක security මහත්මයාගේ දායකත්වයයි, company එකේ CEOගේ දායකත්වයයි, COOගේ දායකත්වයයි එකිනෙකට වෙනස්; තාක්ෂණික දැනුම ආදිය නිසා එය වෙනස් වෙනවා. මම මේ ගැන සොයා බැලුවා. ඒ කොටස් දීමේදී මොකක්ද දාලා තිබෙන parameters? ඒගොල්ලෝ බලලා තිබෙන්නේ service එකයි, ඒ අය එවකට ලබපු salary එකයි. ඒවා base කරගෙන තමයි සේවකයන් එකසිය ගණනකට එහි කොටස් බෙදී ගිහින් තිබෙන්නේ. අද COPE එක උත්සාහ කරනවා, LTL එකත් COPE එකට ගෙන්නලා, විගණකාධිපති සම්බන්ධ කරගෙන ඒගොල්ලන්ගේ procedures වෙනස් කරන්න.

අපි දන්නවා නේ, විගණකාධිපතිතුමා CEB එක audit කරනවා කියලා. CEB එක audit කළා කියලා එය දැන් ලාභ වෙලා තිබෙනවාද? CEB එකට කෙළවිලා; පාඩුයි. CPC එක audit කළා කියලා ලාභ වෙලා තිබෙනවාද? SriLankan Airlines එක audit කළා කියලා ලාභ වෙලා තිබෙනවාද? දැන් ඒගොල්ලෝ අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් ආයතනයෙන් audit කරනවා. CEB එකට පුළුවන් ඒවා බලන්න. විගණකාධිපතිතුමාට තිබෙන ප්‍රශ්නය මේකයි. ඒගොල්ලන් audit කරන්න ගියොත් ඒගොල්ලන්ට සිද්ධ වෙනවා, government regulations and guidelines follow කරන්න කියන්න. එතකොට අර කොම්පැනියට commercial operationsවලට යන්න ලැබෙන්නේ නැහැ. මම දන්නවා, ඒගොල්ලෝ කරන්නේ ලොකු ව්‍යාපාරයක් බව. ඒගොල්ලෝ දකුණු ආසියාවේ විතරක් නොවෙයි, ආසියාවේම ඉන්න ප්‍රධාන පෙළේ බලශක්ති නිෂ්පාදකයෙක්. බලාගාර ඕනෑම එකක් හදන්න පුළුවන්. මෙගාවොට් 350 ඒවා දෙකක් ලංකාවේත් හදලා තිබෙනවා. International finance corporationsවල තිබෙන lending conditionsවල government ownership සම්බන්ධයෙන් බොහොම පැහැදිලිව සඳහන්ව තිබෙනවා, "While the IFC focuses on private enterprises, it may provide financing for a company with minority government ownership" කියලා. Government ownership එක minority නම් තමයි පිටරට සමාගම් finance කරන්නේ. අද LTL එකට මේ ලංකාවේ බැංකු හැම එකකින්ම ණය අරගෙන උපරිම cap එකටම ඇවිල්ලායි තිබෙන්නේ. ඒගොල්ලන්ට එළියට ගිහිල්ලා බිස්නස් කරන්න, ලෝකයට ගිහිල්ලා බිස්නස් කරන්න, දකුණු ආසියාවේ විතරක් නොවෙයි, අප්‍රිකාවේ ගිහිල්ලා බලාගාර හදන්න, පිටරට බැංකුවලින් loan එකක් ගන්න තිබෙන ප්‍රධාන බාධාවක් තමයි, ownership එකේ majority එක රජයට තිබෙන එක. මා කියන්නේ, මේ කඩන්න යන CEB එකේ කොටස් 4ටත්- *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, CEB එකේ logo එක නැහැ නේ, ඒගොල්ලන්ගේ එකේ. LTL එකේ වෙනම logo එකක් තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඒක තමයි. ඒ නිසා CEB එකේ කොටස් 4ටත් එහෙම කරන්න කියලායි මා කියන්නේ.

එම ආයතනය යන්න හැදුවා නේ, කොටස් වෙළඳ පොළේ කොටස් නිකුතුවකට. ඒකත් ඔබතුමන්ලා නැවැත්වූවා නේ. ඒ

කොටස් නිකුතුවට ගියා නම් වාසියි. මොකද, ඒ වෙලාවේ කොටසක නාමික අගය වෙලා තිබුණේ රුපියල් 14ක් වාගෙයි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි. ඒ වෙලාවේ ඒ කොටස් නිකුතුව කරලා තිබුණා නම්, දැන් ඒ කොටසක අගය රුපියල් 30ක් දක්වා ඉහළ ගිහිල්ලා. Market එකේ අයයි එය කියන්නේ. එහෙම නම්, ලංකා විදුලිබල මණ්ඩලය සතු කොටස්වල මිලත් වැඩි වෙනවා. නමුත්, ඔබතුමන්ලා ඒ කොටස් නිකුතුව නැවැත්වූවා; මේ රටේ ජනතාවට, පෞද්ගලික අංශයට කොටස් ගන්න තිබුණු අවස්ථාව නැති කළා. මා කියන්නේ ඒ ආයතනය model එකක් කර ගන්න කියලායි. LTL එකට ගහලා, වට්ටලා ඒක විනාශ කරන්න යන්න එපා. ඒ ගොල්ලන් වෙනුවෙන් commercial operations සඳහා අවශ්‍ය උදවි ලබා දෙන්න. ගරු ඇමතිතුමනි, ඒකට අවශ්‍ය නීති රීති පද්ධතිය හදන්න. ඒකයි වෙන්න ඕනෑ. එහෙම නැතිව, ඒ ඉන්න Director කෙනෙකුගෙන් ලැබුණු මුදලයි, ඒකයි, මේකයි සොයමින් ඉන්න එක නොවෙයි වෙන්න ඕනෑ. මේ පාඩු ලබන ආයතන ටික කොහොම හරි ගොඩගන්න බලන්න ඕනෑ. ඔබතුමන්ලා සතුව තිබෙනවා CEB එක; ඔබතුමන්ලා සතුව තිබෙනවා Lanka Coal Company (Pvt.) Limited එක. ඒ වාගේ තවත් කිහිපයක්ම තිබෙනවා නේ. CPC එක සහ CPSTL එකත් තිබෙනවා නේ. ඒවා ගොඩ නඟන්නේ කොහොමද කියලා බලන්න. Audit කරනවා කියලා මේ වාගේ ආයතනයකට පැනලා යකා නැටුවොත් වෙන්නේ, මේ ආයතන ටිකත් විනාශ වෙලා යන එකයි.

ඒ වාගේම, CPC එක ගැනත් කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, CPC එක දැන් තෙල් මිලත් වැඩි කරලා. අපි ඔබතුමන්ලාගේ සූත්‍රය හරියාකාරව දන්නේත් නැහැ; සූත්‍රය ගැන ඔබතුමන්ලා අපට කියන්නේත් නැහැ. හැබැයි, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය සියයට 38කින් වැඩි වෙලා තිබෙනවා. ඒක කොහොමද වුණේ? ඒ අය දැන් අපට අඩු මිලට තෙල් දෙනවාද? ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා ඒ දවස්වල කිව්වේ කංචන විජේසේකර හිටපු ඇමතිතුමාගේ සාක්කුවට ඉන්ධන ලීටරයකින් රුපියල් 50ක් යනවා කියලායි. දැන් ඒ රුපියල් 50 එහෙම යන්නේ නැති වෙන්න එපායැ. තවම ඒ රුපියල් 50 ඒ විධියට යනවාද? එහෙම යන්නේ නැත්නම් මොකද තවමත් පාඩු ලබන්නේ? ඒක කොහොමද වෙන්නේ? මාර වැඩක් නේ! අපට පෙනෙනවා, දැන් ආණ්ඩු බලය අරගෙන ඉන්න ඔබතුමන්ලාට මේවා හරියාකාරව කළමනාකරණය කරන්න බැහැ කියලා. ඉතින් ඒකෙන්ම පැහැදිලි වෙනවා, ඔබතුමන්ලාගේ කාර්යක්ෂමතාව මොකක්ද කියන එක.

ඒ වාගේම, මට කියන්න ඕනෑ අනෙක් කාරණාව, ගල් අඟුරු ගැනයි. එහෙම නේද, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා? ගල් අඟුරු ටෙන්ඩරයක් ඊයේ පෙරේදා ක්‍රියාත්මක වුණා. කලින් තිබුණේ අවම වශයෙන් ගල් අඟුරු මෙට්‍රික්ටොන් මිලියනයකවත් සංචිතයක් තිබෙන සමාගම් පමණක් ලියා පදිංචි කරන්නයි. හැබැයි, ඒ නිර්ණායකය මෙට්‍රික්ටොන් ලක්ෂයකට අඩු කරලා තිබෙනවා. ඒ වාගේම, Trident Chemphar Limited එකට තමයි ඒ ටෙන්ඩරය award කරලා තිබෙන්නේ. ඒ ගොල්ලන්ට match වෙන්නද, මේකේ qualifications හදලා තිබෙන්නේ කියන බරපතළ ප්‍රශ්නය මතුව තිබෙනවා. මෙට්‍රික්ටොන් ලක්ෂයක සංචිතයක් තිබෙන්න ඕනෑ කියන සුදුසුකම තමයි සඳහන් කරලා තිබෙන්නේ. ඒ වාගේම, ඒ Trident Chemphar Limited එකට දූෂණ චෝදනා තිබෙනවා. මීට කලින් සතොසට සහල් supply කරපු එකක් සම්බන්ධයෙන් ඒගොල්ලන්ට චෝදනාවක් තිබෙනවා. ඒ සහල් supply කරපු එක ඒගොල්ලෝ හරියට කරලා නැහැ. ඒ නිසා blacklist කරලා තිබෙනවා. ඔවුන් සම්බන්ධයෙන් Auditor-Generalගේ චෝදනාවකුත් තිබෙනවා. ඒ වාගේම, සති 8ක් දෙන්න ඕනෑ ටෙන්ඩරයට සති 4යි දීලා තිබෙන්නේ. Appealsවලට දෙන්න ඕනෑ දවස් 14ක්. නමුත් දීලා තිබෙන්නේ දවස් 7යි. ගරු ඇමතිතුමනි, මේවා දිහා බැලුවාම අපට සැක හිතෙනවා, මේ තිබෙන්නේ NPP ආණ්ඩුව ද කියලා. මොකද, ඔබතුමන්ලා බලයට ආවේ හොරකම් කරන්නේ නැහැ, දූෂණ වැඩ කරන්නේ නැහැ, අරවා කරන්නේ නැහැ, මේවා කරන්නේ නැහැ කියලා නේ. හැබැයි, හොරකම්වලට පාර කපනවා කියන්නේත් හොරකම් කිරීමක් තමයි. හොරුන්ට ඉඩ කඩ හදලා දෙනවා කියන්නේත් හොරකම් කිරීමක් තමයි. යම් දෙයකට බාධා කරනවා කියන්නේත් හොරකම් කිරීමක් වාගේ දෙයක් තමයි. මම ඒක නේ ඉස්සෙල්ලාත් කිව්වේ, උමා ඔය ව්‍යාපෘතිය 2015 වර්ෂයේ අවසන් කළා නම් අලාභයක් සිදු වන්නේ නැහැ කියලා. එය කල් යෑමෙන් වූ අලාභය ගණනය කළොත් විදුලිබල මණ්ඩලයේ පාඩුව වාගේ 10 ගුණයක් සොයන්න අපට පුළුවන්. ඒවාත් අපරාධ තමයි.

අපට බොහොම පැහැදිලිව පේනවා, මේ අමාත්‍යාංශයෙන් අද වැඩක් වෙන්නේ නැහැ කියලා. දැන් ඔබතුමන්ලාට දීලා තිබෙනවා ලංකා විදුලිබල මණ්ඩලය unbundling කරන්න. දැන් ඔබතුමන්ලා කොතැනද ඉන්නේ? දැන් ඒක වෙලා තිබෙනවා ද? දැන් IMF එක, එහෙම නැත්නම් ඒ ආයතන මෙතැනදී සතුටු වෙනවා ද? ඒගොල්ලන්ට සතුටක් තිබෙනවා ද? ඔබතුමන්ලා එය කොටස් කරන්න යන model එක දිහා බලන්න. ඔබතුමන්ලා විදුලිබල මණ්ඩලය කොටස් කරන්න යන්නේ සියයට 100ක් රජය සතු සමාගම් 4ක් විධියටයි. ඒ කියන්නේ, එක විදුලිබල මණ්ඩලයක් වෙනුවට විදුලිබල මණ්ඩල 4ක් හදන්න හදනවා. ඒක නේ වෙන්නේ. ඒකෙන් වැඩක් නැහැ. මම කියන්නේ, ඒකට පෞද්ගලික ආයෝජකයන්ටත් එන්න යම්කිසි ඉඩක් හදන්න ඕනෑ කියලායි. ඒවාට පෞද්ගලික ආයෝජකයන්ට ආයෝජනය කරන්න ඉඩ කඩ හදන්න ඕනෑ. එතකොට තමයි ඒවා දියුණු වෙන්නේ. එහෙම තමයි ටෙලිකොම් එක දියුණු වුණේ. එහෙම තමයි අනෙක් ආයතන දියුණු වුණේ. නමුත්, ඔබතුමන්ලා මේ කරන්න යන්නේ, ඔබතුමන්ලාගේ විදුලිබල මණ්ඩලයේ සේවකයන් ටිකත් සතුටු කරලා, රන්ජන් ජයලාල් මහත්මයා නැතත්, එයාවත් සතුටු කරලා, IMF එකත් සතුටු කරලා, ඒ සේරම සතුටු කරන්න යන model එකක් තමයි හදන්න යන්නේ. ඒක හරි යන්නේ නැහැ. ඒක සාර්ථක වෙන්නේ නැහැ. ඒ නිසා බොහොම පැහැදිලිවම මම කියනවා, ඒ ක්‍රියාමාර්ගය ගන්න එපා කියලා.

ජල විදුලිය සම්බන්ධයෙන් කථා කරද්දී, මන්ත්‍රීවරු කිහිප දෙනෙක් සමහර ගංගා ගැන සඳහන් කරමින් කිව්වා, ඒවා ආශ්‍රයෙන් ජල විදුලිය නිපදවන්න පුළුවන් කියලා. නමුත් ගංගාවලින් නැවත අපට මහා පරිමාණ ජලවිදුලි බලාගාර එකක්වත් හදන්න බැහැ. තව හැදුවොත්, සුදු ගඟේ තිබෙනවා මෙගාවොට් 20ක් හෝ 30ක්. කළු ගඟේ හදන්න බැහැ. මොකද, රත්නපුරෙන් පටන් ගත්තාම, කිලෝ මීටර් 48ක්, මීටර් 21කයි බෑස්ම; හදන්න බැහැ. හැබැයි, අපට පුළුවන් අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා වාගේ pumping storages හදන්න. ඒක අපි එදා ඉඳන්ම කියන කතන්දරයක්. Pumping storage එකක් හදන්න හොඳ තැනක් වික්ටෝරියා ජලාශය, ඒකේ පිහිටීමත් එක්ක. Pumping storages හදපුවාම, අමතර විදුලිය තිබෙන වෙලාවේ විදුලිය pump කර ගන්නවා. Peak එකේදී ආයේ පහළට දා ගන්නවා. ඔබතුමන්ලා ඒක කරන්න බලන්න. මට ආරංචියි, කැලණි ගඟේ පහළ ප්‍රාදේශවල ගං වතුර පාලනය කරන්න water reservoir එකක් හදන්න propose වෙලා තිබෙනවා, එහෙම එකක් එතැන හදන්න යනවා කියලා. ඒකත් හැදුවාට කමක් නැහැ. හැබැයි, දැනට,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, නියමිත කාලය අවසන්.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මම තව විනාඩි කිහිපයකින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය.

ඊළඟට, grid එකක් විධියට ඉන්දියාවත් එක්ක කේබල් එකකින් connect වෙන්න, ප්‍රශ්නයක් නැහැ. ඉන්දියාවත් එක්ක connect වෙන්න. මොකද, ඉන්දියාවේ peak එක තිබෙන්නේ දවල්ට, කර්මාන්තශාලා තිබෙන නිසා. අපේ peak එක තිබෙන්නේ රෑට, TV බලන වෙලාවට, මන්ත්‍රීතුමා. අරවා මේවා නාට්‍ය බලන වෙලාවට තමයි අපේ peak එක. එතකොට දවල්ට අපේ අමතර විදුලිය ඉන්දියාවට දෙන්න පුළුවන්. අපේ peak එකට, අපට TV බලන්න රෑට ඉන්දියාවෙන් ගන්න පුළුවන්. ඔබතුමන්ලා රටක් විධියට ඒ ගැන යම්කිසි එකඟතාවක් වෙලා තිබෙනවා නම්, වහාම ක්‍රියාත්මක කරන්න. මෙන්න මේ කරුණු කාරණා මතක් කරනවා.

විශේෂයෙන්ම ඔබතුමන්ලා රටේ ජනතාවට දුන්නා පොරොන්දුවක්, විදුලි බිල අඩු කරනවා කියලා. අඩුවට දෙන්න පුළුවන්. මහජන උපයෝගිතා කොමිසම කියලා තිබෙනවා, සියයට 12කින්, සියයට 13කින් අඩු කරන්න පුළුවන් කියලා. හැබැයි, ඔබතුමන්ලා මොකක්ද කරලා තිබෙන්නේ? අච්චර ණයයි, මෙච්චර ණයයි කියලා තවදුරටත් මේ තිබෙන මිලේම පවත්වාගෙන යනවා. මේ මිල අපේ රටේ ජනතාවට දරන්නත් බැහැ. ඒ නිසා මේ රටට කර්මාන්තකරුවෝ එන්නේත් නැහැ. අපේ රටට සෘජු විදේශ ආයෝජන එන්නේත් නැහැ. ඒ නිසා වහාම මේ විදුලි බිල අඩු කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියන එක මතක් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කුමාර ජයකොඩි අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.12]

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය වැඩිවීමක් ගැන කථා කළා. මම හිතන්නේ ණය සහ ණයවර ලිපි කියන දෙක පටලවාගෙන තිබෙනවා. සංස්ථාව දුවන්න ණය අරගෙන නැහැ. නමුත් ණයවර ලිපි තිබෙනවා. මම හිතන්නේ ඒවාත් එකතු කරලා තමයි ඔය ණය තිබෙනවා කියලා කියන්නේ. පසුගිය දවස්වල ඇති වෙච්ච කථා බහක් තමයි ඔබතුමා ඒ quote කළේ, CPC එකේ ණය වැඩි වෙලා කියලා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
පාඩු.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
නැහැ, නැහැ, ණය ගැනත් ඔබතුමා කිව්වා. පාඩු නැහැ, කොහොමත්. ලාභයි නේ. අපි ඔක්තෝබර් වෙනකොට බිලියන 32ක් ලාභ අරගෙන තිබෙනවා. ඊට අමතරව, HVDC line එක ගැන ඉන්දියාව එක්ක අපි එකඟ වෙලා MoU එකක් ගහලා තිබෙනවා; connection එකක්; high-voltage line එකක්. ඒකේ තාක්ෂණික කටයුතු අපි දැන් කරගෙන යනවා. එතැනදී අපි පරිස්සම් වෙන්න ඕනෑ දෙයක් තමයි, අපි කීයටද ගන්නේ, අපි කීයටද දෙන්නේ කියලා. මේ ගොඩක් අය කියනවා, බලශක්තිය අරහෙට යවන්න පුළුවන්, මෙහාට යවන්න පුළුවන් කියලා. සාමාන්‍යයෙන් ඉන්දියාවේ ඩොලර් ශත 3.50ට විතර තමයි අදානි පවා විකුණන්නේ, ටෙන්ඩර් හරහා. ඒ ආසන්න ගණනකට තමයි දෙන්නේ. අපි තවම ඒ average එකට ඇවිල්ලා නැහැ. ඉතින් අපි ඒවා ගැන කල්පනා කරන්න ඕනෑ, අපට විකුණන්න පුළුවන්ද, එහෙන් අපට ගන්න පුළුවන්ද කියලා. මොකද, transmission cost එකකුත් යනවා, අමතරව. අපි ඒ දෙක ගැන කල්පනා කරලා මේ කටයුත්ත කරන්න ඕනෑ. ඒවා ගැන අවබෝධයෙන් අපි කටයුතු කරගෙන යනවා.

විශේෂයෙන්ම ප්‍රශ්නයක් නැඟුණා, Trincomalee energy hub එකේ, oil tank farm එක ගැනත්. ඇත්තටම අපි ඒකේ මූලික කටයුතු කරගෙන යනවා, අපේ පැත්තෙන්. හැබැයි, ඉන්දියාවෙන් ප්‍රකාශ කළා, ඒ ගොල්ලන්ගේ joint working team එකක් එවනවා කියලා. නමුත් තවම ඒ අය ආවේ නැහැ. ආවාට පස්සේ අපට ඒ ගැනත් කටයුතු කරන්න පුළුවන්.

ඊට පස්සේ මතු වුණා grid connections ගැන, විශේෂයෙන්ම උතුරු පළාතේ. ඇත්තටම ඒකේ develop කරන්න ලොකු වැඩ කොටසක් තිබෙනවා. මේ සැරේ Budget එකෙනුත් අපේ අවධානය යොමු වෙලා තිබෙනවා ඒ ගැන කටයුතු කරන්න, උතුර සහ නැගෙනහිර දෙකේම. කිලිනොච්චිය-හබරණ 400 kV line එකක් construct කරන්න තිබෙනවා. ඒකට අදාළ මූල්‍ය පහසුකම් සපයන්න AIIB බැංකුව එකඟ වෙලා තිබෙනවා. ඒකට අදාළ කැබිනට් පත්‍රිකාව අපි දැන් යොමු කරලා තිබෙනවා. ඒක ඩොලර් මිලියන 140ක විතර වියදමක්. ඒ වාගේම දැනට සාම්පූර්-කප්පල්තුරේ line එකේ ටෙන්ඩර් එක විවෘත කරලා ඒ ඇගයීම් කටයුතු කරගෙන යනවා.

කප්පල්තුරේ-හබරණ line එක සම්බන්ධවත් තව මාස 2ක් ඇතුළත ටෙන්ඩර් කැඳවන්න අපි ලැහැස්ති කර තිබෙනවා. ඊට අමතරව අපේ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ හබරණ-කිරිඳිවැල, හම්බන්තොට-මොනරාගල සහ නොරොච්චෝල-වාරියපොල කියන lines 3ටත් ටෙන්ඩර් කැඳවා අවශ්‍ය කටයුතු ලබන අවුරුද්ද තුළ ආරම්භ කරන්න අපි කටයුතු කර තිබෙනවා.

ඇත්තටම උතුරු පළාතේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා, capacity එක අඩුවීම හේතුවෙන් grid එකට ගන්න බැරි වීම නිසා. අපි ඒ සඳහා අවශ්‍ය කටයුතු දැනට කරගෙන යනවා. ඒ වාගේම පූනරීන්වල මෙගාවොට් 234ක wind project එකක් අපි දැන් අනුමත කරගෙන තිබෙනවා. ඒ වාගේම වේරවිල්වල මෙගාවොට් 204ක ව්‍යාපෘතියක් සිදු කරනවා. අපි ඒ ව්‍යාපෘති දෙකටත් ටෙන්ඩර් කැඳවා ඒවා සංවර්ධනය කරන්න අවශ්‍ය කටයුතු ලබන අවුරුද්ද තුළ සිදු කරනවා.

මන්නාරමේ wind projects ගැනත් කථා කළා. ඇත්තටම දැනට ආරම්භ කර තිබෙනවා, මෙගාවොට් 20ක project එකක් පෞද්ගලික අංශයෙන්. දැනට ඒ කටයුතු කරගෙන යනවා. ඒ වාගේම තවත් award කර ආරම්භ කරන්න මූලික කටයුතු කරගෙන යන මෙගාවොට් 50ක project එකක් තිබෙනවා, මන්නාරම දූපත ඇතුළේ. අපි ඒකත් කරනවා. අපි ඒ ගැන පැහැදිලිවම දැනුම් දීලා තිබෙනවා, ඒ ජනතාවට සහ ඒ සංවිධානවලට. ඊට අමතරව සිලාවතුරේ මෙගාවොට් 100ක project එකකට අපි ටෙන්ඩර් කරලා evaluation එක අවසන්

කරගෙන යනවා. ඊට අමතරව වේරවිල් වාගේ තව ගොඩක් ව්‍යාපෘති තිබෙනවා. ඒ හැම එකක්ම එනකොට ඊළඟට අපේ transmission line එකත් සූදානම් කර ගන්න ඕනෑ. මොකද, ඒවා ගොඩක් වෙලාවට සිදු කර තිබුණේ නැහැ. සාමාන්‍යයෙන් දැනටත් සමහර projects තිබෙන්නේ 2034, 2037 වාගේ අවුරුදුවල අවසන් වන විධියට. එහෙම තමයි ඒවා තිබෙන්නේ. අපි ඒවා ඔක්කෝම ඉස්සරහට අරගෙන දැන් අවශ්‍ය කටයුතු ආරම්භ කර තිබෙනවා. මොකද, නැත්නම් මේවා හිර වෙනවා, හැම තැනින්ම.

අදානි ව්‍යාපෘතිය ගැනත් විශේෂයෙන්ම කථා කළා. ඒ සම්බන්ධයෙන් බොහොම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කළා, විපක්ෂයේ මන්ත්‍රීවරුන්. මොකද, එම ව්‍යාපෘතියෙන් ඇමෙරිකානු ඩොලර් ශත 8.26ට unit එකක් ගන්න එකඟ වෙලා තිබුණේ. හැබැයි, ඒකේ කිසිම විධියකින් transmission line එකේ cost එක ඉදිරිපත් වෙලා තිබුණේ නැහැ. මොකද, transmission line එක annuity payment එකක් යටතේ ගෙවීම් කරන්න තමයි සාකච්ඡා වෙමින් පැවතුණේ. ඒක finalize වෙලා තිබුණේත් නැහැ, ඒක නවතිනකොට. ඒ ඩොලර් ශත 8.26 තුළ තිබුණේ බලශක්තිය මිලදී ගැනීමේ unit එකක මිල විතරයි, kilowatt-hour එකකට. ඒ හැර ඒක ඇතුළේ transmission cost එක නැහැ. ඒ නිසා ඒකත් මේකට දමලා ඩොලර් ශත 8.26 ලාභයි කියලා,- මොකද, අදානිම ඩොලර් ශත 3.50ට ඉන්දියාවේ ටෙන්ඩර්වලට විකුණද්දී අපි ඩොලර් ශත 8.26ට ගැනීමේ අවශ්‍යතාව මොකක්ද කියන එක තේරුම් ගන්න ඕනෑ. ඒ නිසා පැහැදිලිවම transmission line එක ඒකේ නැහැ කියන එක හැමෝම දැන ගත්තොත් හොඳයි. මොකද, ඒක quote කරලා මෙතැන කියනවා, ඩොලර් ශත 8.26 සාධාරණයි කියලා.

ඇත්තටම ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි මම අදානි සමාගම එක්ක කථා කළා. සෘජුවම අපි කිව්වේ, අපිට mandate එකක් තිබෙනවා, ඩොලර් ශත 5කට ආසන්න තැනකට එනවා නම් අපිට මේ ගැන සලකා බලන්න පුළුවන් කියායි. ඊට පසුව ඒගොල්ලනුත් බොහොම සහයෝගයෙන් ඒකෙන් ඉවත් වුණා. මොකද, අපිට mandate එකක් තිබෙනවා, විදුලි බිල අඩු කරන්න. අපි ඒකට අවශ්‍ය පියවර තමයි ගන්නේ. මොකද, අවුරුදු 20කට agreement එකක් ගහලා ඩොලර් ශත 8.26ට ගත්තොත්, අපට ඒක තවත් අඩු කරන්න බැරි වෙනවා. අපි ඒකට අවශ්‍ය පියවර ගොඩක් අරගෙන තිබෙනවා. ඉදිරියට අපි ඒ දේවල් කරනවා.

Cost of generation - generation point එකේ cost එක - අපි 19.2ක average එකට අඩු කරගෙන තිබෙනවා, මේ මොහොත වෙනකොට. ඒ අනුව hydro, 1.79යි, thermal - CEB ගත්තොත් 47.91යි. මේවා ඔක්කෝම averages. Coal - CEB, 19.52යි, wind - CEB, 13.91යි, thermal - IPP, 91.80යි. පෞද්ගලීකරණය හරහා ඔය දේවල් කළොත් ඕක තමයි වෙන්නේ. Renewable energy average other than solar rooftops, 16.69යි. එතකොට solar rooftops, 29.73යි. ඒක තමයි අර 37 සහ 27 effect එක. ඒක තමයි වැඩියෙන්ම තිබෙන්නේ. Solar powerවල සියයට 56ක් විතරම තිබෙන්නේ රුපියල් 36කට ආසන්න average එකක්. ඕක තමයි තිබෙන්නේ. අපි ඒවා අඩු කරගෙන යනවා. එතකොට ඇත්තටම ගත්තොත් අපි ඒ ආසන්නයෙන් US Dollars 6.2ක දැනට ඉන්නවා. අපේ අරමුණ US Dollars 5කට ආසන්නයට ඒක අඩු කරගන්න එකයි.

විදුලි බිල ගැන කථා කළොත්, 2024 ජූලි තමයි අන්තිමට revise වෙලා තිබුණේ අපේ ආණ්ඩුව බලයට පත් වෙන්න ඉස්සෙල්ලා.

එතකොට, units 30 දක්වා unit එකකට රුපියල් 8ක් අරගෙන තිබුණා. දැන් ජනතාවට ගෙවන්න වෙන්නේ රුපියල් 4.50යි. Units 60 දක්වා unit එකකට රුපියල් 20ක් ගත්තා. දැන් රුපියල් 8ට අඩු කරලා තිබෙනවා. Unit 0-60 දක්වා රුපියල් 25ට තිබුණු unit එකක මිල දැන් රුපියල් 12.75ට අඩු කරලා තිබෙනවා. මේ කියන්නේ ගෘහස්ථ විදුලි ගාස්තු. ඒකක 61-90 දක්වා රුපියල් 30ට තිබ්ච්ච unit එකක මිල රුපියල් 18.50ට අඩු කරලා තිබෙනවා. රුපියල් 18.50ක් අය කරන්නේ අපිට රුපියල් 19.02ක් වැය වෙද්දී. Units 90ක් කිව්වාම, මුළු customersලා සංඛ්‍යාවෙන් සියයට 70කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. ඒ කියන්නේ මිලියන 5කට ආසන්න ප්‍රමාණයකට අපි විදුලිය දෙන්නේ පාඩුවට. - ලාභ, පාඩු ගැන අහන්න මන්ත්‍රීවරු නැතිවෙයි, මම හිතන විධියට. එතුමන්ලා යනවා. විදුලිබල මණ්ඩලයේ ලාභ පාඩු තීරණය වෙන්නේ එහෙමයි. මොකද, ලක්ෂ 50කට අපි විදුලිය දෙන්නේ පාඩුවට. ඒකකයක් ජනනය කරන්න විතරක් රුපියල් 19.02ක් වැය වෙනවා, transmission costs හැර. නමුත් දෙන්නේ රුපියල් 18.50ට. ඊට පස්සේ ඒකක 91-120 දක්වා unit එකක් රුපියල් 50ට දුන්නේ. නමුත් දැන් අය කරන්නේ රුපියල් 24යි. එතකොට units 121-180 දක්වා රුපියල් 50ට තිබ්ච්ච ඒකකයකට රුපියල් 41යි දැන් අය කරන්නේ. Units 180ට වැඩි නම්, unit එකකට අය කළ රුපියල් 75 වෙනුවට රුපියල් 61යි දැන් අය කරන්නේ. ඉතින්, ඇත්තටම අපි සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් ලෝකයේ අපේ ආසන්න රටවල් ගත්තත්, small household category එක යටතේ පාකිස්තානය, භූතානය ළඟට අපි තමයි තුන්වැනියාට අඩුවෙන් ඉන්නේ. ඒ වාගේම medium-scale category එක ගත්තොත්, අපි 8වැනියාට ඉන්නවා. ඊට පස්සේ large-scale category එකේ domestic පැත්ත ගත්තොත් -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා, ගරු ඇමතිතුමා.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ඊට පස්සේ, commercial category එක ගත්තොත්, අපි ඉන්නේ 12වැනියාට විතර. හැබැයි industry customersලා ගත්තොත්, medium-scale category එකේ අපි 4වැනියාට ඉන්නවා. භූතානය, ඕමානය, නේපාලය, ළඟට ශ්‍රී ලංකාව. ඊට පස්සේ, large-scale category එක ගත්තොත්, භූතානය ළඟට 2වැනියාට ඉන්නේ අපි. Very large-scale category එක ගත්තත්, භූතානය ළඟට 2වැනියා විධියට අපි ඉන්නවා. අපි දැන් යම් ප්‍රමාණයකට අඩු කරගෙන තිබෙනවා. මොකද, ඉදිරියට යාමේ අරමුණෙන් අපි වැඩ කරගෙන යන්නේ.

ඉතින්, අපේ බලශක්ති අමාත්‍යාංශයට රුපියල් බිලියන 23ක් වෙන් කරලා තිබෙනවා. ඒකෙන් ආසන්න වශයෙන් රුපියල් බිලියන 21ක්ම foreign funded loans, project loans ගත්ත ඒවා. ඒ නිසා මම හිතන විධියට ඇත්තටම අපෙන් මහා භාණ්ඩාගාරයට ලොකු බරක් නැහැ. සුළු ප්‍රතිපාදනයක් තමයි අපට සෘජුව හම්බ වෙන්නේ. අනෙක් ඔක්කෝම CEB එකෙන්ම අන්තිමට ගෙවන loans. CEB එකෙන් හෝ CPSTL එකෙන්, CPC එකෙන් ගෙවන loans තමයි තිබෙන්නේ. ඉතින් ඒ loansවලින් තමයි අපි ඉස්සරහට යන්නේ. ඒ අනුව රජයට බරක් නොවී ජනතාවගේ බිලේ මුදලෙන් තමයි අපි යන්නේ. එතැනදී ලාභ පාඩු බලනවාට වඩා service එක තමයි වැදගත් වන්නේ. Quality service එකක් දෙන්න තමයි අපි බලන්නේ. ඇත්තටම වැඩි මිලට අරගෙන

[ගරු කුමාර ජයකොඩි මහතා]

අඩුවෙන් අළෙවි කරන බිස්නස් එකක් විධියට තමයි අපි පවත්වාගෙන යන්නේ. නමුත් අපි ඒක ඉදිරියේදී අනිවාර්යයෙන් වෙනස් කරනවා. මොකද, cost-reflective tariff එකකට ගෙන යන්න ඕනෑ; ටිකෙන් ටික එතැනට ගෙන යනවා. අපි අපේ වියදම් අඩු කරලා, දූෂණය අඩු කරලා, වංචාව අඩු කරලා තිබෙනවා.

අමාත්‍යාංශයේ කටයුතු ඉස්සරහට ගෙන යන්න ලේකම්තුමාගේ ඉඳලා අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය, ඒ වාගේම නියෝජ්‍ය අමාත්‍යතුමා සම්පූර්ණ සහයෝගය ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, CPSTL එක, සුනිත්‍ය බලශක්ති අධිකාරිය, ඒ වාගේම ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය, LECO ආයතනය, Lanka Coal Company (Pvt.) Limited කියන හැම ආයතනයකම පාලන අධිකාරියෙන් අපට සම්පූර්ණ සහයෝගය ලැබී තිබෙනවා. ඉතින්, ඉස්සරහට අපට තවදුරටත් සාර්ථකව කටයුතු කරගෙන යන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. අපට උදව් කළ, සහයෝගය දුන් හැමට ස්තුතිවන්ත වෙනවා.

## බලශක්ති අමාත්‍යාංශය
### வலுசக்தி அமைச்சு
### MINISTRY OF ENERGY

| | |
|---|---|
| පුනරාවර්තන | රු. 1,100,000,000 |
| මූලධන | රු. 22,000,000,000 |

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, බලශක්ති අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"20 වන පිටුවේ, 19 හා 20 පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

| | |
|---|---|
| 'පුනරාවර්තන | රු. 966,000,000 |
| මූලධන | රු. 21,407,000,000' " |

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"පුනරාවර්තන වියදම සඳහා රු. 966,000,000 දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"මූලධන වියදම සඳහා රු. 21,407,000,000 දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"மீண்டுவருஞ் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 966,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"மூலதனச் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 21,407,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the decreased sum of Rs. 966,000,000, for Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the decreased sum of Rs. 21,407,000,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

### 119 වන ශීර්ෂය.- බලශක්ති අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 670,000,000; මූලධන වියදම, රු. 29,000,000

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 430,000,000; මූලධන වියදම, රු. 21,971,000,000

### தலைப்பு 119.- வலுசக்தி அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 670,000,000; மூலதனச் செலவு, ரூபாய் 29,000,000

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 430,000,000; மூலதனச் செலவு, ரூபாய் 21,971,000,000

### HEAD 119.- MINISTER OF ENERGY

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 670,000,000; Capital Expenditure, Rs. 29,000,000

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 430,000,000; Capital Expenditure, Rs. 21,971,000,000

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, 119 වන වැය ශීර්ෂයේ 01 වන සහ 02 වන වැඩසටහන් සඳහා මා සංශෝධන ඉදිරිපත් කරනවා:

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***මතු පළ වන යෝජනාව සහා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"21 වන පිටුවේ, 2 සහ 3 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතු ය:

'වැඩසටහන 01
මෙහෙයුම් වැඩසටහන රු. 706,000,000 රු. 36,000,000

වැඩසටහන 02
සංවර්ධන වැඩසටහන රු. 260,000,000 රු. 21,371,000,000 ' "

[ගරු කුමාර ජයකොඩි මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ, වැය ශීර්ෂ 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුව යටතේ වෙන්කර ඇති ප්‍රතිපාදනයෙන් පුනරාවර්තන ප්‍රතිපාදන රු. 36,000,000ක් සහ මූලධන ප්‍රතිපාදන රු. 7,000,000ක් වැය ශීර්ෂ 119 - බලශක්ති අමාත්‍යවරයා වෙත මාරු කිරීම, සහ

2025.10.18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට ආනුෂංගිකව වැය ශීර්ෂ අංක 119 - බලශක්ති අමාත්‍යවරයා යටතේ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව වෙත සහ ඊට අදාළ කටයුතු වෙනුවෙන් වෙන්කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන රු. 170,000,000ක් සහ මූලධන ප්‍රතිපාදන රු. 600,000,000ක් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත මාරු කිරීමයි.)

" 119වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 706,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

119 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

" 119 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 36,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

119 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

" 119වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 260,000,000 දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

119 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

" 119වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 21,371,000,000 දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

119 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 119, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 706,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 119, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 119, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 36,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 119, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 119, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 260,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 119, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 119, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 21,371,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 119, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 706,000,000, for Head 119, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 119, Programme 01, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 36,000,000, for Head 119, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 119, Programme 01, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the decreased sum of Rs. 260,000,000, for Head 119, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 119, Programme 02, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the decreased sum of Rs. 21,371,000,000 for Head 119, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 119, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයි ද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය" යි ද මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අ.භා. 6.26ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මූලාසනයෙන් ඉවත් විය.***

***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 නොවැම්බර් 21වන සිකුරාදා.***

*பி.ப. 6.26 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும்பொருட்டு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2025 நவம்பர் 21, வெள்ளிக்கிழமை.*

*At 6.26 p.m., the Hon. Presiding Member left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Friday, 21st November, 2025.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ශීර්ෂ අංක 119 සංශෝධන සහිතව කාරක සභාවේදී සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

## ශ්‍රී ලංකා විදුලිබල පනත: නියෝග
## இலங்கை மின்சாரச் சட்டம்: ஒழுங்குவிதிகள்
## SRI LANKA ELECTRICITY ACT: REGULATIONS

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 18(3) වගන්තියේ (ඊ) ඡේදය සමඟ කියවිය යුතු 50 වගන්තිය යටතේ ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමයේ නියම සහ කොන්දේසි සම්බන්ධයෙන් බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අගෝස්තු 26 දිනැති අංක 2451/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. **6.27**ට, **2025** නොවැම්බර් **13**වන දින සභා සම්මතිය අනුව, **2025** නොවැම්බර් **21**වන සිකුරාදා පූ.භා. **9.00** වන තෙක් කල් ගියේය.*

*அதன்படி பி. ப. 6.27 மணிக்கு பாராளுமன்றம், அதனது 2025 நவம்பர் 13ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 நவம்பர் 21, வெள்ளிக்கிழமை மு.ப. 9.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 6.27 p.m. until 9.00 a.m. on Friday, 21st November, 2025, pursuant to the Resolution of Parliament of 13th November, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.